සිළුමිණ

සිළුමින The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 07 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ කුම්භ රවි 9 භාග නවම් පුර නවවක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ පෙබරවාරි මස 21 වැනි ඉරිදා මිල රු 80.00

↘02

හෙළයකු වූ ඉංග්‍රීසි උගතා

↘03

චාල්ස් කුමරා ලංකාව වනසයි

↘05

නුගේගොඩ අනුලාවේ හොර-මගඩි හසු වේ

↘10

ෆේස්බුක් පෙම ගුරුවරයකු බිලි ගනී

↘17

ඇඟිලි සලකුණෙන් ඝාතකයා හසුවූ හැටි

↘25

'අලි නඩු' නිසා අලි ජරමර

පාස්කු ප්‍රහාරයේ 273කට නඩු

දේශපාලඥයන් හා පොලිස් ලොක්කන් රැසකටත් බරපතළ චෝදනා

(තාරක වික්‍රමසේකර)

ප්‍රදේශයන් 359කට මරු කැඳවමින් 2019 වසරේ අප්‍රේල් 21 වැනිදා සිදු වූ පාස්කු ප්‍රහාරය එල්ල කිරීම හා වළක්වා නොගැනීම සම්බන්ධව සැකකරුවන් 273 දෙනකුට එරෙහිව කඩිනමින් නඩු පැවරීමට කටයුතු යොදා ඇතැයි මහජන ආරක්ෂාව පිළිබඳ ඇමැති විශ්‍රාමික රියර් අද්මිරාල් සරත් වීරසේකර සිළුමිණට ඊයේ පැවසීය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විමර්ශනයන්ට අදාළව සැකසුණු ලිපි ගොනු 8ම මේ වන විටත් නීතිපතිවරයාට යොමු කර ඇතැයි පෙන්වා දුන් ඇමැතිවරයා එයින් පුද්ගලයන් 32කට සෘජුවම මිනීමැරීමේ හා ඊට කුමන්ත්‍රණය කිරීම් යටතේ >> 2 වැනි පිටුවට

නෙදුන්කර්හි පුපුරණ ද්‍රව්‍ය හිමිකරු එල්ටීටීඊ ප්‍රබල සාමාජිකයෙක්

(තාරක වික්‍රමසේකර)

වුනියාවේදී පුපුරණ ද්‍රව්‍ය තොගයක් සමඟ පොලිසිය මඟින් අත්අඩංගුවට ගත් පුද්ගලයා මේ වන විට ත්‍රස්ත විමර්ශන ඒකකයට බාර ගෙන රැඳවුම් නියෝග යටතේ ප්‍රශ්න කරන බව එහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සිළුමිණට කීය.

එල්ටීටීඊ පළමු පෙළේ ක්‍රියාකාරිකයකු වන මෙම සැකකරු ජපන් ආධාර සහිතව මෙරට ක්‍රියාත්මක බිම්බෝම්බ ඉවත් කිරීමේ රාජ්‍ය නොවන ආයතනයකට සම්බන්ධව සේවය කර ඇති අතර ඔහු රාජකාරී වේලාවට අමතරවද අදාළ ස්ථානවල සැරිසරා ඇත.

බුද්ධි අංශයට ලැබුණු තොරතුරු මත මේ පුද්ගලයා අත්අඩංගුවට ගෙන පරීක්ෂණ පවත්වද්දී ඔහු සතුව තිබී බිම්බෝම්බ 148ක් හා අධිබල පුපුරණ ද්‍රව්‍ය කට්ටල 24ක්ද හමු වී තිබේ.

අදාළ පුද්ගලයාගේ ඥාතීන් ඇතුළු පිරිස්ද එල්ටීටීඊ ක්‍රියාකාරිකයන් බවට වාර්තා ලැබී ඇති නිසා මේ වන විට ත්‍රස්ත විමර්ශන අංශය මඟින් ඒ සම්බන්ධව විමර්ශනය කරමින් පවතී.

කොවිඩ් 19

මහනුවර රත්නපුර පැතිරීම වේගයෙන්

කොවිඩ් 19 වසංගත රෝග ව්‍යාප්තියේ කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවලට අමතරව මහනුවර හා රත්නපුර දිස්ත්‍රික්කවල වේගවත් පැතිරීමක් සිදුවෙමින් පවතින බව කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පවසයි.

>> 2 වැනි පිටුවට

කොවිඩ් 19 වසංගත රෝගයෙන් මේ වන විට මියගිය සංඛ්‍යාව 450කට ආසන්නය. රෝගය සුවපත්ව නිවෙස් කරා ගිය සංඛ්‍යාව 72,516කි. මෙරට කොරෝනා එන්නත ලබාදීම පෙබරවාරි මස ඇරැඹූ අතර ඒ සඳහා දැනටමත් ලක්ෂ දෙකකට ආසන්න පිරිසකට එන්නත ලබාදී ඇත. එන්නත ලබා ගැනීම සඳහා විවිධ සමාජ තරාතිරම්වල ජනයාගෙන් දැන් ඇත්තේ ඉහළ ප්‍රතිචාරයකි. මේ මීතොටමුල්ල රාහුල විද්‍යාලයේදී සෞඛ්‍ය නිලධාරීන් විසින් පෙබරවාරි 19 වැනිදා එන්නතක් ලබා දුන් අවස්ථාව සිළුමිණ ඡායාරූප ශිල්පී දුෂ්මන්ත මායාදුන්නගේ කැමරාවට හසු වූ අවස්ථාවකි.

"කොවිඩ් වැක්සින් එක ගැහුවොත් අඩියක් ගහන්නත් හොඳ නෑලු, දුමක් අදින්නත් හොඳ නෑලු, අනෙක් ඒවත් හොඳ නෑලු"

"ඒහෙනං ඒ ඉංජැක්ෂන් එක ගහගන්නවට වැඩිය කොවිඩ් හැදිලා මැරෙනවා හොඳයි."

මෙගාවොට් 150ක් දෙන නව සූර්ය බලාගාර 20 ක්

(නිහාල් පී. අබේසිංහ)

නව සූර්ය බලාගාර 20 ක් රටපුරා දිස්ත්‍රික්ක 12 ක පිහිටුවන බවත් එමඟින් ජාතික විදුලි බල පද්ධතියට මෙගාවොට් 150 ක් ලබාදෙන බවත් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම පවසයි.

සෞභාග්‍යයේ දැක්ම ප්‍රකාරව ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තීන්ගේ දායකත්වය වර්ධනය කිරීමේ අරමුණෙන්, දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ස්ථාපිත කර ඇති ග්‍රිඩ් උපපොළ 20 ක් කේන්ද්‍ර කරගනිමින්, නව සූර්ය විදුලි බලාගාර 20 ක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වී ඇතැයි අමාත්‍යවරයා මේ අනුව එක් පැකේජයකට ප්‍රදේශ 04 ක් බැගින් අයත් වූ පැකේජයන් 5 ක් යටතේ මෙම සූර්ය විදුලි බලාගාර ඉදිකිරීමට යෝජිතය. ඒ අනුව A පැකේජය යටතේ අනුරාධපුර, මාදම්පේ, වවුනතිව්, අතුරුගිරිය, බෙලිඅත්ත යන ප්‍රදේශයන්ගේ ද B පැකේජය යටතේ බෙලිඅත්ත, හොරණ, >> 2 වැනි පිටුවට

රටේ ප්‍රශ්නවලට විසඳුම් ව්‍යවස්ථාවට අනුවයි

- ඇමැති දිනේෂ් >> 2 වැනි පිටුවට

අලි මිනිස් ගැටුමට 'කෝපා' අවධානය

(අමිල මලවිසූරිය)

මෙරට අලි මිනිස් ගැටුම පිළිබඳ විශේෂ විගණන වාර්තාව නැවත වරක් ලබන 23 වැනිදා පාර්ලිමේන්තුවේ රජයේ ඟිණුම් කාරක සභාවේදී (කෝපා කමිටුව) කැඳවීමට නියමිතව ඇත.

පසුගිය දෙසැම්බර් 9 වැනිදා කෝපා කමිටුවේදී අනාවරණය වූ ආකාරයට අලි මිනිස් ගැටුම නිසාවෙන් >> 2 වැනි පිටුවට

සියලු පාසල්වලට ස්වයංක්‍රීය 'සැනිටයිසර්'

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

මෙරට සියලු පාසල් සඳහා ස්වයංක්‍රීය 'සැනිටයිසර්' උපකරණ නොමිලේ ලබා දීමට කටයුතු කර ඇතැයි කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත සිළුමිණට කීය.

මෙම උපකරණයට දැත් ළං කළ පමණින් අත් පිරිසිදු කර ගැනීම පිණිස විෂබීජනාශක ස්වයංක්‍රීයව ලැබෙන අතර එම උපකරණය මඟින්ම ශරීර උෂ්ණත්වයද පෙන්නුම් කරන බව ඇමැතිවරයා කීය. >> 2 වැනි පිටුවට

පොදුජන එක්සත් පෙරමුණු පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතාන විජමුගේ දේහයට ගෞරව දැක්වීමට පැමිණි අවස්ථාවේ පවුලේ ඥාතීන්ට ශෝකය ප්‍රකාශ කළ අවස්ථාව

පැය 9ක් රට හෙල්ලූ වි.ජ.මු.

විජමු ලොකු බණ්ඩාරයන්ගේ පුතකු සිය පියාගේ දේහයට අවසන් වශයෙන් ගෞරව දැක්වූ අයුරු

● දයා ලංකාපුර

අමාත්‍යාංශ ඇතුළු රජයේ බොහෝ ආයතනවලට ලැබෙන දුරකථන ඇමැතුම් වලදී දුරකථන ක්‍රියාකාරු පිළිතුරු දෙන්නේ "ආයුබෝවන්........ අමාත්‍යාංශය" යනුවෙනි. එමෙන්ම වර්තමානයේ බොහෝදෙනා සිය හිතමිතුරන් සමඟ කරන දුරකථන කතාබහ අවසන් වන්නේ 'බුදු සරණයි' කියමිනි. මේ සම්ප්‍රදායයන් සමාජයේ භාවිත වන්නට පටන් ගත්තේ අසූව දශකයේදී යයි කීවොත් නිවැරදිය.

මෙම යෙදුම් සමාජයට හඳුන්වා දීමේ ගෞරවය හිමි වන්නේ පසුගිය සතියේ දිවි ගමනට සමුදුන් භාෂා විශාරදයකු, උගතකු, විද්වතකු හා හිටපු කථානායකවරයකු වූ වි.ජ.මු. ලොකුබණ්ඩාර මහතාටය.

දසක හතරකට වැඩි කාලයක් මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා කැබිනට් ඇමතිවරයකු ලෙස විවිධ ඇමැති තනතුරු දරමින් ද පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හා කථානායක වශයෙන් ද කටයුතු කොට ඇති ලොකු බණ්ඩාරයන් දේශීය වෛද්‍ය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශවල කැබිනට් ඇමැති ලෙස සේවය කළ කාලයේ ගනු ලැබූ සමහර පියවරයන් දේශීය සංස්කෘතිය හා සමාජය නව මඟකට යොමු කිරීමට හේතුවූ බව පැහැදිලිය.

මැති ඇමැතිවරුන්, ප්‍රභූන් හා උසස් නිලධාරින්ට 'සර්' වෙනුවට 'ඇමැතිතුමා', 'ඔබතුමා' යනුවෙන් අද බොහෝ දෙනා අමතනු ලබන්නේ ද වි.ජ.මු. ලොකුබණ්ඩාර ඇරඹූ වෙනසෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

● උපත හපුතලේගමදී

බදුල්ල දිස්ත්‍රික්කයේ හපුතලේ ඡන්ද කොට්ඨාසයේ හපුතලේගමදී 1941 අගෝස්තු මස 5 වැනි දින උපත ලැබූ විජේසිංහ ජයවීර මුදියන්සේලාගේ ලොකුබණ්ඩාරයන් බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා උසස් අධ්‍යාපනය සඳහා ඇතුළු වූයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයටය.

එහිදී ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත් ඔහු පසුව ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි පරීක්ෂණයට පෙනී සිට බී.ඒ. ගෞරව උපාධිය ද හිමිකර ගත්තේය.

අනතුරුව ඔහු නීතිය හැදෑරීම සඳහා නීති විද්‍යාලයට බැඳුණි. හෙළ සිරිතට මුල්තැන දෙමින් යුරෝපීය ඇඳුම වෙනුවට ජාතික ඇඳුමින් සැරසී නීතිඥයකු වශයෙන් අධිකරණයේ දිවුරුම් දුන් ඔහු තම නමේ මුල් අකුරු වන ඩබ්ලිව්.ජේ.එම්. වෙනුවට වි.ජ.මු. යනුවෙන් භාවිතා කළේය.

වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කෙළේ රජයේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදකයකු වශයෙනි.

● කොළකැඳ ඔසුපැන් හඳුන්වාදීම

දක්ෂ කථිකයකු වූ වි.ජ.මු. එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනයට පිවිසියේ නීති විද්‍යාලයේ සිටි ආචාර්යවරයකු වූ ලලිත් ඇතුලත්මුදලි මහතාගේ මඟ පෙන්වීම යටතේය. 1977 පාර්ලිමේන්තු මැතිවරණයට සිය උපන් ප්‍රදේශය වන හපුතලේ ආසනයෙන් තරග කොට විශිෂ්ට ජයග්‍රහණයක් ලබාගත් ලොකුබණ්ඩාර මහතා 2010 දක්වා එම ආසනය නියෝජනය කෙළේය.

▶ විජමු මිනිස්කමින් පිරිපුන් මිනිසෙක් බව තිරිකුණාමලේ ආනන්ද මහ නා හිමියෝ පවසති

▶ ඔහු පූර්වාදර්ශයක් නොව පරමාදර්ශයක් බව විපක්ෂ නායක සජිත් කියයි

▶ දැරූ සෑම තනතුරක්ම දෙස බස රැස මෙහෙවර උදෙසා ඔහු යොදාගත් බව හෙළ හවුල පවසයි

▶ විජමු ගුණ සමරු පින්කමක් 22දා සවස 3.00 ට පාර්ලිමේන්තුවේදී

ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවේ වසර 10ක් පසුපෙළ මන්ත්‍රීවරයකු ලෙස සිටි වි.ජ.මු. ලොකුබණ්ඩාරයන්ට සිය දස්කම් පෙන්වීමට අවස්ථාව ලැබුණේ 1988දී ඔහු දේශීය වෛද්‍ය හා සංස්කෘතික කටයුතු පිළිබඳ කැබිනට් අමාත්‍යවරයා ලෙස පත්වූ පසුවයි.

දේශීය වෛද්‍ය ඇමැතිවරයා වශයෙන් සමාජයට කොළ කැඳ හා ඔසු පැන් හුරු කිරීමට මූලික වූ වි.ජ.මු. පාර්ලිමේන්තුවට ද කොළකැඳ හඳුන්වා දුන්නේය.

අද ජංගම රථ මගින් හා මඟ දෙපස තබාගෙන කොළ කැඳ අලෙවි කිරීම සුලභ දසුනක් වී ඇති අතර එය බොහෝ දෙනෙකුගේ ජීවනෝපාය ද වී තිබේ.

පසුගිය ජනාධිපතිවරණයෙන් පසු පාසල් හා තාප්පවල චිත්‍ර ඇඳීමේ රැල්ලක් පැතිර ගියේය. එහෙත් ප්‍රථමයෙන්ම පාසල් තාප්පවල චිත්‍ර ඇඳීම ආරම්භ වූයේ වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් 1988 දී දේශීය වෛද්‍ය හා සංස්කෘතික කටයුතු පිළිබඳ කැබිනට් අමාත්‍යවරයා ලෙස පත්වූ පසුව ඔහුගේ සංකල්පයක් අනුවය.

දරුවන්ට සෞඛ්‍ය පුරුදු හා යහපත් ගුණධර්ම අවබෝධ කරදීම සඳහා එම චිත්‍ර උපයෝගී විය.

සිංහල හා ඉංග්‍රීසි භාෂා විශාරදයකු වූ ලොකුබණ්ඩාරයන්ට සිංහල භාෂාව, සාහිත්‍යය, බෞද්ධ දර්ශනය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ හසල දැනුමක් තිබුණි.

එමෙන්ම ඔහු දක්ෂ චතුර කථිකයෙක් ද වූ අතර ඕනෑම මාතෘකාවක් පිළිබඳව ක්ෂණිකව අදහස් දැක්වීමෙහි සමතෙක් ද විය. ඒ පිළිබඳව මා ලැබූ අත්දැකීමක් මෙහිදී සිහියට නැගේ.

ඒ 1978 වසරේදී මුදල් ඇමැති රොනී ද මැල් මහතා විසින් ඉදිරිපත් කළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ දෙවැනි අයවැය විවාදය පැවැති අවස්ථාවයි.

එකල ගාලුමුවදොර පිහිටි පාර්ලිමේන්තුවේ රැස්වීම රාත්‍රි 8 දක්වා පැවැත්විණි. පාර්ලිමේන්තු මාධ්‍යවේදියකු වශයෙන් මම ද එම විවාදය වාර්තා කරමින් සිටියෙමි. රාත්‍රි 7 පමණ වන විට විවාදය ගෙනයාම සඳහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සභාවේ නොසිටීම එවකට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක වූ වින්සන්ට් පෙරේරා ඇමතිවරයාට බලවත් ප්‍රශ්නයක්වී තිබුණි.

වින්සන්ට් පෙරේරා මහතා සභාවේ එහා මෙහා යමින් ඊළඟ කතාව සඳහා මන්ත්‍රීවරයකු සෙව්වේ කතා කිරීම සඳහා කලින් නම් දී තිබූ මන්ත්‍රීවරුන් සභාවේ නොසිටි බැවිනි. වි.ජ.මු. ලොකුබණ්ඩාර මන්ත්‍රීවරයා පසුපෙළ අසුනකට වී නිදා වැටෙමින් සිටියේය.

අන්තිමේදි වින්සන්ට් පෙරේරා මහතා ඔහු වෙත ගොස් ඊළඟ කතාව කරන ලෙස ඉල්ලා සිටියේය.

එහෙත් වි.ජ.මු.ට කතා කිරීමට තිබුණේ ඊළඟ දිනයේදීය. කෙසේ වුවද වි.ජ.මු. කතා කිරීමට එකඟ වූයෙන් වින්සන්ට් පෙරේරා මහතා මුලසුන වෙත ගොස් ඔහුගේ නම දුන්නේය.

අනතුරුව මුලසුනෙන් නම ප්‍රකාශ වූ සැණෙන් නැගී සිටි ලොකුබණ්ඩාර මහතා කතාව පටන් ගත්තේ අයවැය ලේඛනය සාහිත්‍ය කෘතියක් වශයෙන් හඳුන්වමිනි. මුදල් ඇමැතිවරයා අයවැයෙන් බදු පනවා ඇත්තේ බඹරකු මල නොතලා රොන් ගන්නා ආකාරයෙන් බව පැවැසූ ඔහු උම්මග්ග ජාතකය ඇතුළු බෞද්ධ සාහිත්‍ය කෘතිවලින් ද උපමා ගෙන හැර දක්වමින් චතුර කතාවක් කෙළේ අප ඇතුළු ගැලරියේ සිටි පිරිස් අමන්දානන්දයට

▶ අයවැය ලේඛනය සාහිත්‍ය කෘතියක් බවට පත්කරයි

▶ පැය 9ක් තිස්සේ විවාද කර කථානායක ධූරයට පත්වූ විපක්ෂ මන්ත්‍රීවරයා

▶ හෙළයකු වූ ඉංගිරිසි උගතෙක්

පත් කරමිනි.

වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් දේශීය වෛද්‍ය ඇමැතිවරයා ලෙස සිටියදී පාරම්පරික දේශීය වෙදකම හා ආයුර්වේදය සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීමට හා දේශීය වෙදකම පිළිබඳ ලියැවී තිබූ පුස්කොළ පොත් සිංහලෙන් මුද්‍රණය කිරීමට ද කටයුතු කළේය.

● හිස තෙල් ගෑමේ උත්සවය

එමෙන්ම ප්‍රකට ජ්‍යෝතිර්වේදීන්ගෙන් යුත් කමිටුවක් පත්කොට සිංහල අලුත් අවුරුදු නැකැත් සීට්ටුව සම්පාදනය කිරීමට හා සිංහල අලුත් අවුරුද්දේ හිසතෙල් ගෑමේ චාරිත්‍රය රාජ්‍ය අනුග්‍රහය ලබන උත්සවයක් බවට පත්කිරීමට පියවර ගත්තේ ද වි.ජ.මු. ලොකුබණ්ඩාරයන්ය.

සුභාෂිතය, නම්පොත, නාමාෂ්ඨ ශතකය, සිරිත් මල්දම, ලෝකෝපකාරය ආදී පැරණිපොත් යළි මුද්‍රණය කොට ජනතාව අතට පත්කිරීමට ඒ මහතා කටයුතු කෙළේ ඔහු සංස්කෘතික කටයුතු ඇමැතිව සිටියදීය.

වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් ග්‍රන්ථ කර්තෘවරයකු ද විය. සීගිරි ගී සිරි, රසදීපනි ශාස්ත්‍රීය වාද ලිපි, ඡන්ද දායකයා වෙතටයි, ගරු කථානායකතුමනි (මෙය ඔහු පාර්ලිමේන්තුවේ කළ කතා ඇතුළත් කෘතියකි.) ඔහු ලියූ ග්‍රන්ථ කිහිපයකි. මේ හැර 'THE MYSTQUE OF SIGIRIYA' නමින් ඉංග්‍රීසි භාෂාවෙන් ද සීගිරිය ගැන ඔහු කෘතියක් පළකොට ඇත.

අධ්‍යාපන ඇමැතිව සිටියදී සිංහල භාෂාව නිවැරදිව ලිවීම පිළිබඳව සිසුන් හා ගුරුවරුන් දැනුම්වත් කිරීම සඳහා විද්වතුන් ලවා සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීමට ද කටයුතු කළ වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් සෑම වසරකම මාර්තු මස 2 දින සිංහල භාෂා දිනය ලෙස නම් කොට එම දිනයේදී විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද පියවර ගත් නමුත් මේ වන විට සිංහල භාෂා දිනය අමතක කොට දමා ඇත.

ඒ මහතා 2001 දී අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ හා ජාතික ඒකාග්‍රතා ඇමැති වශයෙන් පත්වූ අතර කාලාන්තරයක් තිස්සේ ඉංග්‍රීසියෙන් පැවැති නව නීති වාර්තා (New law reports) සිංහල භාෂාවෙන් ප්‍රකාශයට පත්කිරීමට පියවර ගැනීමද විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත.

● 16 වැනි කථානායක ලෙස පත්වීම

වි.ජ.මු. ලොකුබණ්ඩාරයන්ගේ දේශපාලන හා පාර්ලිමේන්තු ජීවිතයේ සුවිශේෂම අවස්ථාව වන්නේ 2004 අප්‍රේල් 4 දා පාර්ලිමේන්තුවේ 16 වැනි කථානායකවරයා වශයෙන් පත්වීමයි. විපක්ෂයේ මන්ත්‍රීවරයකුව සිටියදී තියුණු තරගයකින් කථානායකවරයා ලෙස තේරී පත්වීමද විශේෂ සිද්ධියකි.

2004 මහමැතිවරණයෙන් ආණ්ඩු බලය හිමි වූයේ එක්සත් ජනතා නිදහස් සන්ධානයටය. එම සන්ධානය කථානායක ධූරයට ඩිව් ගුණසේකරයන් ඉදිරිපත් කළ අතර විපක්ෂයෙන් ඉදිරිපත් වූයේ වි.ජ.මු. ලොකුබණ්ඩාරයන්ය. ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීන් සංඛ්‍යාවක් සිටි නමුත් කථානායකවරයා තෝරා ගැනීම සඳහා පැවැති රහස් ඡන්ද විමසීමේදී ඡන්ද 110ක් ලබා ගනිමින් ලොකුබණ්ඩාරයන් පත්වූයේ ආණ්ඩු පක්ෂයේ ගාලගෝට්ටි මධ්‍යයේය.

▶ පක්ෂ දේශපාලනයෙන් පාර්ලිමේන්තුවට පත්වී ඇමැති තනතුරු දරමින් විශාල වශයෙන් මුදල් උපයා පරම්පරා ගණනාවකට ධනය රැස්කරන අය සිටින සමාජයක වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් මුදල් පසුපස හඹා ගියේ නැත. ඔහු රැස් කළේ ජනතාව සහ දැනුමයි.

ඩිව් ගුණසේකරයන්ට ලැබී තිබුණේ ඡන්ද 109කි. කථානායක තෝරා ගැනීමට පාර්ලිමේන්තුවට පැය 9ක් ගතවිය. පෙරවරු 10ට ආරම්භ වූ රැස්වීම අවසන් වූයේ පස්වරු 7.15ටය. මෙහිදී මන්ත්‍රීවරුන් අතර ඇතිවූ ගාලගෝට්ටි හා පොර බැඳීම් නිසා එක් මන්ත්‍රී හිමිනමක් රෝහල්ගත කිරීමට ද සිදුවිය.

කථානායක ධූරයට පත්වීමෙන් පසු ලොකුබණ්ඩාරයන් සභාව නිහඬ කිරීම සඳහා කලින් සිට පැවැති "ඕඩර් ප්ලීස්" (Order please) වචනය වෙනුවට "කරුණාකර නිශ්ශබ්ද වන්නැ" යි පැවැසීමට පටන් ගත්තේය. එහෙත් ඇමැතිවරයකු ලෙස දස්කම් දැක්වුවද සභාව මෙහෙයවූ ලිහිල් ආකාරය නිසා ඔහු කථානායකවරයකු වශයෙන් සාර්ථක නොවූ බව කනගාටුවෙන් වුවද සඳහන් කළ යුතුය.

● රැස්කළේ දැනුම හා ජනතාවයි

පක්ෂ දේශපාලනයෙන් පාර්ලිමේන්තුවට පත්වී ඇමැති තනතුරු දරමින් විශාල වශයෙන් මුදල් උපයා පරම්පරා ගණනාවකට ධනය රැස්කරන අය සිටින සමාජයක වි.ජ.මු. ලොකුබණ්ඩාරයන් මුදල් පසුපස හඹා ගියේ නැත. ඔහු රැස් කළේ ජනතාව සහ දැනුමයි. දූෂණ හා වංචාවලට එරෙහිව තදින්ම කටයුතු කළ ලොකුබණ්ඩාරයන් තමන් යටතේ සිටි නිලධාරියා ද එවැනි ක්‍රියාවලින් වළක්වාලීමට කටයුතු කළ බව ඒ මහතා දේශීය වෛද්‍ය ඇමැතිවරයාව සිටියදී එහි සහකාර ලේකම්වරයකු ලෙස සේවය කළ, විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්වරයකු වන අසෝක මාලිමගේ පවසයි. එසේ වුවද එතුමාගේ අභාවය හේතුවෙන්, භාෂාවට, සාහිත්‍යයට, දේශීය සංස්කෘතියට සිදු වූ පාඩුව පියවා ගැනීමට තව බොහෝකල් බලා සිටීමට මෙරට ජනතාවට සිදු වනු ඇත.

1පිටුවෙන්...

පාස්කු ප්‍රහාරයේ...

චෝදනා ගොනු කෙරෙන බවත් රැඳවුම්භාරයේ රක්ෂිත බන්ධනාගාරගතව සිටින 241 දෙනකුටද පාස්කු ප්‍රහාරයට සම්බන්ධව කටයුතු කිරීම වෙනුවෙන් නඩු පැවරෙන බවද ඇමැතිවරයා වැඩි දුරටත් පෙන්වා දුන්නේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වාර්තාවන්ට අනුව 'යහපාලන' රජයේ ප්‍රබල දේශපාලඥයන් කිහිප දෙනෙක්ම මෙන්ම පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ම මෙහි සෘජු චූදිතයන් බවට පත්ව තිබේ. විශේෂයෙන්ම ප්‍රහාරය වළක්වා නොගැනීම සම්බන්ධයෙන් නැඟී ඇති චෝදනා බරපතළ අපරාධ ගණයෙන් යුක්ත බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර තිබෙන බව දැනගන්නට ඇත.

එසේම පාස්කු ප්‍රහාරය ගැන විමර්ශනය පිණිස පත් කළ ජනාධිපති විමර්ශන කොමිසමේ වාර්තාවද ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට ලැබීමෙන් පසු එය පාර්ලිමේන්තුවට යොමු කර අදාළ සාක්ෂි විමර්ශනය කිරීම පිණිස නීතිපතිවරයාට යොමු කරනු ලබන බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ කිසිදු අයකුට නීතියේ රැහැනින් මිදෙන්නට ඉඩ ලබා නොදෙන බවත් තරාතිරම නොබලා අදාළ කටයුතු සිදු කෙරෙන බවත් අගතියට පත් වූ සියලු දෙනා වෙනුවෙන් පූර්ණ සාධාරණයක් සිදු කරනු ලබන බවද ඔහු පෙන්වා දුන්නේය. පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් පුද්ගලයන් 754 දෙනකු අත්අඩංගුවට ගත් බවත් සෙසු පිරිස මේ වන විට ප්‍රශ්න කර මුදා හැර ඇති බවද ඇමැතිවරයා වැඩි දුරටත් පැවසුවේය. මේ අතර පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ විමර්ශන වාර්තාව සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තාව අධ්‍යයනයට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් කමිටුවක් පත් කිරීමට කටයුතු කර ඇති අතර, එහි සභාපති ධුරය අමාත්‍ය චමල් රාජපක්ෂයන් විසින් හොබවනු ලැබේ.

සියලු පාසල්වලට...

මෙම උපකරණ පාසල් වෙත ලබා දීම මේ වන විටත් ආරම්භ කර ඇති බව පැවසූ ඇමැතිවරයා මේ මාසය අවසන් වීමට පෙර මෙරට සියලු පාසල් වෙත ලබා දීමට කටයුතු කරන බව පැවසුවේය. රජයේ මුදල් මේ සඳහා වැය නොවන බවත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන Q.I.B පෞද්ගලික විශ්වවිද්‍යාලයෙන් ලැබී ඇතැයිද ඇමැතිවරයා පෙන්වා දුන්නේය.

මෙගාවොට් 150ක්...

පොළොන්නරුව, හබරණ යන ප්‍රදේශයන්ගේ ද, C පැකේජය යටතේ මාතර, ගාල්ල, මහියංගණය, වේයන්ගොඩ යන ප්‍රදේශයන්ගේ ද, D පැකේජය යටතේ අම්පාර, දෙනියාය, කොස්ගම, මතුගම ප්‍රදේශයන්ගේ ද, E පැකේජය යටතේ පන්නල, මහව, කුරුණෑගල, කොළොන්නාව යන ප්‍රදේශයන්ගේ ද මෙම විදුලි බලාගාර ස්ථාපිත කිරීමට යෝජිතය. එම ව්‍යාපෘතීන් වෙනුවෙන් මේ වනවිට ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රමය අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබේ. ලංසු ඇගයීම් වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටු පහක් පත් කර ඇත.

අලි මිනිස් ගැටුමට...

ලෝකයේ වැඩිපුරම අලි මරණ සිදුවන රට ශ්‍රී ලංකාව වන අතරේ එම ගැටුමෙන් මිනිස් ජීවිත අහිමි වන සංඛ්‍යාව අනුවද ශ්‍රී ලංකාව දෙවැනි ස්ථානයට පත්ව ඇති බවයි. එසේම අලි මිනිස් ගැටුම නිසා වසරකට සාමාන්‍යයෙන් අලි ඇතුන් 272 දෙනෙක් පමණ මියයන අතර මිනිස් ජීවිත 85ක් පමණ අහිමි වන බවත් එහෙත් ගිය වසරේ අලි-මිනිස් ගැටුමෙන් අලිඇතුන් 407 දෙනෙකු මියයද්දී මිනිස් ජීවිතද 122ක් අහිමිවී ඇති බවයි. ඒ අනුව අලි මිනිස් ගැටුම අවම කිරීමට ඉදිරිපත්ව ඇති නිර්දේශ ඉදිරි කෝපා කමිටුවේදී අවධානයට ලක්කිරීමට නියමිතව ඇතැයිද සඳහන්ය.

මහනුවර...

පසුගිය සිකුරාදා වන විට කොළඹ දිස්ත්‍රික්කයෙන් දෙවන රැල්ලේ රෝගීන් 28,440ක් වාර්තා වී තිබූ අතර ගම්පහ දිස්ත්‍රික්කයෙන් රෝගීන් 15,759ක් වාර්තා වී තිබුණි.

කළුතර දිස්ත්‍රික්කයෙන් රෝගීන් 5,982ක් වාර්තා වී තිබුණද පෙර දිනයේ වාර්තා වී ඇත්තේ රෝගීන් 51කි. එහෙත් පෙර දින රෝගීන් 68ක් වාර්තා කරමින් මහනුවර දිස්ත්‍රික්කයේ සමස්ත රෝගීන් ගණන 4,597ක් දක්වා ඉහළ නැග තිබුණි.

රටේ ප්‍රශ්නවලට...

රටේ ප්‍රශ්නවලට විසඳුම් ව්‍යවස්ථාවට අනුවයි. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ප්‍රශ්නවලට විසඳුම් සෙවිය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව බව විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන සඳහන් කරයි. ජිනීවා මානව හිමිකම් සමුළුවට ඉදිරිපත් කර තිබූ මානව හිමිකම් කඩවීම් පිළිබඳ චෝදනා විමර්ශනය සඳහා දැනටමත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුත් ජනාධිපති කොමිසමක් පත් කර ඇති බවත් අමාත්‍යවරයා පෙන්වා දෙයි. යහපාලන රජය අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව ජිනීවා මානව හිමිකම් සමුළුවේ 30/1යෝජනාවට සම අනුග්‍රහය දැක්වීමට එකඟව තිබුණද යෝජනාවේ අන්තර්ගත කරුණු ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන නොමැති බවද ඇමැතිවරයා පෙන්වා දුන්නේය. එම නිසා ඉකුත් වසරේ 30/1 යෝජනාවෙන් ඉවත් වූ බවත් උතුරේ පැවැති ත්‍රස්තවාදී ක්‍රියාවන් මර්දනය කිරීමේ දී අනුගමනය කළ මානුෂීය මෙහෙයුමේදී මානව හිමිකම් කඩවීමක් සිදුව තිබෙනවාද යන්න හා එසේ මානව හිමිකම් කඩ වී ඇත්නම් වින්දිතයන්ට සාධාරණයක් ඉටුකරන බවද ඇමැතිවරයා කීය.

පිහිටවන්න



හැටන් හඟරාපිටිය පදිංචි එම්.කේ. චමිලා දර්ශනීට වකුගඩුවක් බද්ධ කළ යුතුව ඇත. ඇයට A පොසිටිව්, B පොසිටිව්, O පොසිටිව් හෝ AB පොසිටිව් රුධිර කාණ්ඩයේ වකුගඩුවක් ලබාදිය හැකි අයෙක් වෙත්නම් දුරකථන අංක 077 4567303 න් විමසන්න. හැටන් ශ්‍රී නිශ්ශංකමල්ල දහම් පාසලේ ආචාර්යවරියක වන ඇය, සැත්කමට ද ආධාර පතන අතර ආධාර ගිනිගත්හේන මහජන බැංකුවේ ගිණුම් අංක 3022001972160041ට යොමු කළ හැකිය.

කොළඹ 06 පාමංකඩ කවිරත්න පෙදෙසේ 35/3 පදිංචි ඒ.ඩී.ජී. කරුණාරත්නට (63) වකුගඩුවක් බද්ධ කළ යුතුය. ඒ පොසිටිව් හෝ ඕ පොසිටිව් වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයකු සිටී නම් 071 8395288 අංකය අමතන්න.

සෙලාන් බැංකුවෙන් වෙබිනාර් සැසියක්

සෙලාන් බැංකුව, විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීම පිණිස 'බදුකරණය සහ Covid සමයේ ලබාදී ඇති සහන' පිළිබඳ වෙබිනාර් සැසියක් 25 වැනි බ්‍රහස්පතින්දා ප.ව. 7.00 සිට 8.30 දක්වා Zoom මාධ්‍යය හරහා පැවැත්වීමට කටයුතු යොදා ඇත. ආදායම් බදු දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය කොමසාරිස් ජෙනරාල් සහ ප්‍රයිස් වෝටර් හවුස් කූපර්ස්හි (PwC) බදු සේවා ජ්‍යෙෂ්ඨ උපදේශිකාවක වන දීපානි පීරිස් මෙම සැසිය සඳහා සම්පත් දායකත්වය ලබාදෙන අතර බදුකරණ සංකල්පය හැඳින්වීම, ව්‍යවසායකයෙකුගේ මූලික සහ වෙනත් ආදායම් බදු බැඳියාව හමුවේ රජය විසින් ව්‍යවසායකයන් වෙනුවෙන් හිමිකර දී ඇති බදු සහන ආදී වැදගත් අංශ රැසක් මෙහිදී ආවරණය කෙරේ. මෙහි දක්වා ඇති QR කේතය ස්කෑන් කිරීමෙන් වෙබිනාර් සැසියට අදාළ ඇතුළත්වීමේ පත්‍රය සම්පූර්ණ කර ඒ සඳහා සහභාගී විය හැකි ය.

වියපත් පෙම ගැන කතිකාවක්!

ප්‍රවීණ මාධ්‍යවේදී තිලක් සේනාසිංහ ලියූ අලුත්ම නවකතාව "ජ්‍යෙෂ්ඨ පුරවැසියකුගේ ප්‍රේම කතාව" එළි දැක්වීම පෙබරවාරි 25 බ්‍රහස්පතින්දා සවස 4.00 ට බොරැල්ල, කොටා රෝඩ් හි ආචාර්ය ඇන්.ඇම් පෙරේරා කේන්ද්‍රයේ දී සිදු කෙරේ.මෙහිදී "වියපත් බව,ප්‍රේමය සහ සදාචාරය" යන මැයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව විද්‍යා මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර සහ "වියපත් වූවන්ට ප්‍රේමය අකැපද?" යන මැයෙන් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨාධිපති මහාචාර්ය නාමල් විජයසිංහ යන විද්වතුන් කෙටි දෙසුම් පවත්වනු ඇත.

ශ්‍රී ලංකාවෙන් ඉහළම ආගන්තුක සත්කාර ලබා

අපටම හිනැහුණු චාර්ල්ස් කුමාරයා

● බ්‍රිතාන්‍ය ඉංජිනේරු, ගාල්ලේ
දෙව්සිරි පී.හේවාවිදාන
ලන්ඩන් නුවර සිට ලියයි

ශ්‍රී ලංකාවේ' ජීවත්වන සිංහල, දමිළ, මුස්ලිම්' ජනතාව ආගන්තුක සත්කාරයට ලෝක ප්‍රසිද්ධය. ගෙදරට එන අමුත්තන්ට අසල්වාසීන්ට හා නැතිබැරි අයට හැකි පමණින් සංග්‍රහ කොට සතුටු වීම අපගේ සාම්ප්‍රදායික සංස්කෘතික පුරුද්දයි. ලංකාවට පැමිණ ආපසු තම රටවලට ගිය විදේශ සංචාරකයන් ශ්‍රී ලංකාවාසීන් ගේ උසස් ආගන්තුක සත්කාරය ඉහළින් වර්ණනා කරමින් ලියන ලද පොත්පත් හා නිකුත් කරන ලද විඩියෝ දහස් ගණනක් ලොවපුරා පතළ වී ඇත. පසුගිය වසරේ කොරෝනා සමයේ දී ආපසු සිය රටට යෑමට බැරුව අසරණව සිටි යුරෝපා සංචාරයකයන් පිරිසක් ඇල්ල ප්‍රදේශයේ ජනතාව විසින් නොමිලේ කෑම-බීම, ඉඳුම්-හිටුම් ලබාදෙමින් ආදරයෙන් රැක බලාගත් අන්දම යුරෝපයේ රූපවාහිනී වැඩ සටහන් විශාල ගණනක ප්‍රචාරය කෙරුණේ ලංකාවට විශාල කීර්තියක් හා ප්‍රශංසාවක් ලබා දෙමිනි.

නමුත් අවාසනාවකට දෝ යුරෝපයේ බොහෝ රටවල්වල ශ්‍රී ලංකාවේ තරම් හදපුරා සතුටින් කෙරෙන ආගන්තුක සත්කාරයක් නම් දකින්නට නැත.

මේ මා එංගලන්තයේ ජීවත්වන 46වැනි වසරයි. ගතවුණු කාලය තුළ අපේ අසල්වැසි සුදු මිතුරන්ට, කාර්යාලයේ මිතුරු මිතුරියන් හා අපේ දරු පුතුන්ගේ යාළුවන් හා දෙමවුපියන්ට නත්තලට සිංහල අලුත් අවුරුද්දට හෝ උපන්දින උත්සව වලට අපි පන්සිය වරකට වඩා ආරාධනා කර ඇත්තෙමු.

ඔවුන් අපේ නිවසට පැමිණ ("Very nice, Sri Lankan food is delicious") ශ්‍රී ලංකා කෑම හරිම රසයි කියමින් මගේ බිරිඳ රුවිනී සෑදූ කිරිබත්, කැවුම්, කොකිස් රස විඳිති. දුංතෙල් බත් සමඟ පරිප්පු, කුකුල්මස්, බල මාළු හා සිංහල හා එළවළු තලු මර මරා කති. ඒ කන අතරේ ("You must comeand have a meal with us one day") ඔයාලත් ඉංග්‍රීසි කෑමක් රසවිඳින්න දවසක අපේ ගෙදර එන්න ඕනෑයි කියති'

නමුත් මේ සුද්දෝ කවදාක්වත් අපට ඔවුන්ගේ ගෙදර ආහාර වේලකට එන්නට ආරාධනා නොකරති. ආගන්තුක සත්කාරය යන ගුණ ධර්මය ඔවුන්ට අරහන්ය. ඒ ඔවුන්ගේ සංස්කෘතියේ හැටියයි. ඔවුන්ගේ සමාජය හැඩ ගැස්වී තිබෙන්නේ එසේය. (නමුත් මෙහි වසන ඉතාලි, ඉරාන, ග්‍රීක්, රුසියන් ජාතිකයන් ආසියාතිකයන් තරමටම ආගන්තුක සත්කාරයට ළැදිය).

මේ වැරැද්ද වැඩියෙන්ම කරන්නේ ශ්‍රී ලංකාවේ ආරාධනයෙන් වැදගත් උත්සවවලට රාජ්‍ය අමුත්තන් ලෙස සහභාගීවීමට පැමිණෙන බ්‍රිතාන්‍ය දේශපාලන නායකයන්ය; නැතිනම් රාජ කුමාරයන්ය.

මෙයට දිය හැකි ලොකුම උදාහරණය 2013 ශ්‍රී ලංකාවේ පැවති පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක උළෙලට සහභාගී වූ එවකට බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන්ගේ අහුත හැසිරීමයි.

ඩේවිඩ් කැමරන් ලංකාවට පැමිණීමට සති දෙකකට පෙර සුප්‍රසිද්ධ කොටි අනුගාමිකයකු වූ ලයිකා මොබයිල් ටෙලිෆෝන් සමාගමේ අධිපති සුබාකරන් අලි රාජා හා ඊනියා ඊලාම් සිහින රාජ්‍යයේ අගමැති විසුවානාදන් රුද්‍රකුමාර් ඇතුළු ඛයස්පෝරාවේ පචකාරයන් පිරිසක් අගමැති නිල නිවසේ දී ඩේවිඩ් කැමරන් හමු වීය

චැනල් 4 රූපවාහිනී ආයතන විසින් ශ්‍රී ලංකාවට විරුද්ධව අභූත චෝදනා එල්ල කරමින් නිපදවූ Killing Fields නමැති පව චිත්‍රපටය කැමරන්ට පෙන් වූ ඔවුහු අගමැතිවරයා හා ශ්‍රී ලංකාව සාර්ථක ලෙස කෙටවීමට සමත් වූහ.

කොටි බොරු ප්‍රචාරවලට රැවටුණ ඩේවිඩ් කැමරන් ලංකාවට ආවේ අරියාදුවටමය. රාජ්‍යනායකයකු විදේශක සංචාරයක දී හැසිරිය යුතු සාම්ප්‍රදායික හා ආදර්ශවත් පිළිවෙත ඔහු සම්පූර්ණයෙන්ම බැහැර කළේය.

ගුවන් යානයේ සිට පර්යන්ත ගොඩනැගිල්ල දක්වා දෙපස රැස්වී ශ්‍රී ලංකා හා ඉංග්‍රීසි ධජ වනමින් කැමරන් අගමැතිවරයාට චියර් කළ පාසල් ළමුන්ට ඔරවමින් ඇතුළට ගිය ඔහු අමුත්තන්ගේ පොතේ අත්සන් කිරීම තරයේ ප්‍රතික්ෂේප කළේය. ඔහු ලංකාවේදී තනිකරම හැසිරුණේ මදාවිකාරයෙක් ලෙසය.

එපමණක් නොවේ; ගෝඨාභය රාජපක්ෂයන් විසින් රටින් පිටුවහල් කරන ලද චනල් 4 වාර්තාකරුවන් පිරිස් තම නිල ජනමාධ්‍ය කණ්ඩායමට ඇතුළත් කර ගනිමින් තහනම මඟ හරවා ආපසු ඔවුනට ඔහු සමඟ ලංකාවට පැමිණීමට ඔහු ඉඩ සැලසුවේය. (විදේශ රාජ්‍ය නායකයකුගේ නිල මාධ්‍යාධිකාරියකු ඔහු සමඟ ආගන්තුක රටකට පැමිණීම වැළැක්වීමට එම රටට බැරිය) මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් සංවිධානය කරන ලද තරු පහේ භෝජන සංග්‍රහ රස විඳිමින් අපේ වියදමින් ඉහළම හෝටලයක ළැඟුම් ගනිමින් ශ්‍රී ලංකාව දිගින් දිගටම විවේචනය කළ මේ අගමැතිවරයා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධව විදේශ විනිසුරුවරුන් ඉදිරියේ නඩු විභාගයක් පැවැත්විය යුතු යැයිද යෝජනා කළේය.

රාජ්‍ය සම්ප්‍රදාය වලට පයින් ගැසූ ඇගමැති කැමරන් එතනින් නැවතුණේ නැත. ශ්‍රී ලංකා රජයේ විරෝධය නොතකා සුභාකරන් අලිරාජාගේ ආරාධනාවක් අනුව යාපනයේ අතුරුදහන් වුවන්ගේ දෙමවුපියන් හමුවීමට ද

බ්‍රිතාන්‍ය මාධ්‍යයේ එම කතාව ඉකුත් සතියේ පළකළ අයුරු

චාල්ස් කුමරු ආචාර වෙඩිමුර මැද පිළිගැනීම

හිටපු ජනපතිනී චන්ද්‍රිකා සමඟ 1998 නිදහස් දින සමරු උලෙළේදී

ජනපතිනියගේ ප්‍රමාදය නිසා චාල්ස් කුමරු දැඩි අවු රශ්මියෙන් පීඩා විඳියි

කොටි ප්‍රහාර නිසා දළදා මාළිගාව වෙනුවට පිරිමි යට ඇඳුම් කම්හලකටත් එක්ක ගියාලු

කුමරාට ආචාර දැක්වීමට අයාලේ යන සුනඛයෙකුත් එක් වෙලාලු

කුමරා මෙරටට ආවේ ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් දිනය වෙනුවෙනුයි.

ආචාර වෙඩිමුර ගිනි පුළිඟුවකින් තණ බිස්ස ගිනි ගත්තාලු

ගියේය. එතනදීත් ඔහු සත්කාරක ශ්‍රී ලංකාව ලෝකය ඉදිරියේ අවමානයට ලක්කරමින් කථා කළේය. මේ අන්දමට ජාතිද්‍රෝහී වැඩ කරන කොටි අනුගාමික සුබාකරන් අලිරාජාට යහපාලන රජය විසින් රටේ වටිනාම රූපවාහිනී නාළිකාවක් බිලි දුන්නේ මොන හිතකින්ද.

ලංකාවේ ආගන්තුක සත්කාර භුක්ති විඳිමින් ලංකාවට පාට දැමීමට පැමිණි එකම දේශපාලනඥයා ඩේවිඩ් කැමරන් නොවේ. 2009 යුද්ධයේ අවසන් අවදියේ ප්‍රභාකරන් බේරාගැනීමට බ්‍රිතාන්‍ය විදේශ ඇමති ඩේවිඩ් මිලිබෑන්ඩ් ද මෙහි පැමිණියේය. 'යුද්ධය වහාම නොනැවත්වුහොත් හොඳ පාඩමක් උගන්වනවා" යැයි ඔහු ශ්‍රී ලංකාවට තර්ජනය කළේය. වාසනාවට ජනාධිපති මහින්ද රාජපක්ෂයන්ට ඒ මිනිහාගේ පුහු තර්ජන සතයකටවත් ගණන් ගත්තේ නැත. "ගිහින් කැළණි ගඟෙන් නාලා එනවා" යැයි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂයන් දුන් පිළිතුරෙන් පසු බ්‍රිතාන්‍ය විදේශ ඇමතිවරයා වලිගය හකුලා ගෙන ආපසු ගෙදර ගියේය'

ශ්‍රී ලංකාවේ ආගන්තුක සත්කාරය කෙළසමින් අපට හිනැහුණේ බ්‍රිතාන්‍ය දේශපාලනඥයන් පමණක් නොවේ. අතීතයේ ශ්‍රී ලංකාවට වරින් වර පැමිණි බ්‍රිතාන්‍ය රජ කුමාරවරු ද එහි දී හැසිරුණේ මහත්වරුන් ලෙස නම් නොවේ.

1815 දී ශ්‍රී ලංකාව ඉංග්‍රීසි අධිරාජ්‍යයට යටත් වූ පසු මුලින්ම එහි පැමිණි රජ කුමාරයා වූයේ වික්ටෝරියා රැජිනගේ දෙවන පුත් හා එවකට එඩින්බරෝ ආදිපාදවරයා වූ ඇල්බට් කුමාරයාය. 1870 දී දවස් හතකට ලංකාවේ සංචාරයක යෙදුණ ඔහු වෙනුවෙන් වෙනමම දළදා පෙරහරක් සංවිධානය කරමින් නිළමේවරු කුමාරයාට ගෞරව කළහ. නමුත් ඔහු ආපසු එංගලන්තයට ගියවිට තමා මහ නුවරදී "යක්ෂ පුජා" පෙළහරක් දුටුවා යැයි අපේ දළදා සම්දුන්ට අපහාස කළේය.

නමුත් ඇල්බට් කුමාරයා මේ ආගන්තුක සත්කාරය තවදුරටත් කෙළසුවේ මහවැලි ගඟ අසබඩ කොම්පනච්චි නමින් හඳුන්වන කැලයට ගොස් අසරණ අලි රාජයන් දෙදෙනෙකුට විනෝදයට වෙඩිතබා දඩයම් කිරීමෙනි.

1875 දී වික්ටෝරියා රැජිනගේ දෙවු පුත් එඩ්වඩ් කුමාරයා ශ්‍රී ලංකාවේ ජනතාව තමන්ට කළ ආගන්තුක සත්කාරවලට කෙළෙහි ගුණ දැක්වූයේ රුවන්වැල්ලේ කැලෑවක දී ඇතින්නකට වෙඩි තබා මරා දැමීමෙනි. (1902 දී ඔහු හත්වෙනි එඩ්වඩ් නමින් එංගලන්තයේ රජ විය).

අටවෙනි එඩ්වඩ් නමින් වසරක් බ්‍රිතාන්‍යයේ රජ පදවිය දරා දික්කසාද ගැහැනියක් නිසා කිරුළ අතහැර ගිය වේල්ස් කුමාරයා රජකම ලැබීමට පෙර 1922 දී ශ්‍රී ලංකාවට පැමිණියේය ග ශ්‍රී ලංකා ජනතාව දස දහස් ගණණින් ඔහු පිළිගැනීමට කොළඹ වරායට රැස්වුන. ශ්‍රී ලංකාවේ ජනතාවගේ ගෞරව ආදරයට පාත්‍රවෙමින් ඉහළතම ලෙස ආගන්තුක සත්කාරය භුක්ති විඳී කුමාරයා ආපසු එංගලන්තයට ගිය විට උඩරට තේ වතු හිමි බ්‍රිතාන්‍ය වතුකාරයින්ගේ සංගමයට තමාට කරන ලද සත්කාර ගැන බලවත් ස්තුතිය පුද කරමින් දිගු ලිපියක් එවීය. නමුත් සතියක් තිස්සේ ඔහු යන යන තැනට රැස්වෙමින් ඔහුට ගරු බුහුමන් කළ සාමාන්‍ය ලාංකිකයන්ටත් ඔහු වෙනුවෙන් ඉහළ පෙළේ භෝජන සංග්‍රහ පැවැත්වූ සොයිසා වැනි ඉහළතම සිංහල ප්‍රභූවරුන්ට වචනයකින්වත් ස්තුතියක් කෙරීමට මේ අහංකාර සුද්දාට උවුමනාවක් නොවීය.

චන්ද්‍රිකා බන්ඩාරනායක ජනාධිතිනියගේ ආරාධනාවෙන් ශ්‍රී ලංකාවේ 50වෙනි නිදහස් උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් 1998දී බ්‍රිතාන්‍යයේ ඔටුන්න හිමි චාර්ල්ස් කුමාරයා මෙහි පැමිණියේ කොටි විසින් දළදා මන්දිරයට බෝම්බ දමා දින කිහිපයකට පසුවය. චාර්ල්ස් කුමාරයා ආවේ බ්‍රිතාන්‍ය හමුදාවේ ආරක්ෂක සෙබළුන් රැසක් සමගිනි. ශ්‍රී ලංකා රජය ද චාර්ල්ස් කුමාරයාගේ ආරක්ෂාව සඳහා රුපියල් මිලියන 20 ක් වියදම් කර තිබුණි.

නිදහස් උත්සවයේ දී ලස්සන කතාවක් කළ චාර්ල්ස් කුමාරයා කීවේ තමා ලංකාවේ සිටි කාලය ඉතාමත් ප්‍රීතියෙන් ගත කළ බවයි. තමාට ඉහළින් ගරු සත්කාර කළ ජනාධිපතිනියට ද කුමාරයා ස්තුති කළේය. නමුත් චාර්ල්ස් කුමාරයා කීවේ ඇත්තක් ද? ඔහු තමාගේ ශ්‍රී ලංකා සංචාරය සාර්ථක එකක් යයි ඇත්තටම හිතුවාද?

ශ්‍රී ලංකා සංචාරය ගැන ඔහුගේ නියම අදහස් ඔහු පිට කළේ 2019 වසරේ රාජකීය සංචාර නැමති ග්‍රන්ථය ලියූ Robert Hardman නැමති කතෘවරයා ඉදිරියේය. එම පොතට අනුව නම් චාර්ල්ස් කුමාරයාට තම ලංකා සංචාරයත් විහිළුවක් වී ඇත. එම කෘතියේ අඩංගු විස්තර පසුගිය සතියේ ලන්ඩන් Daily Express පත්‍රයේ මෙසේ පළවිය.

Daily Express පෙබරවාරි 16 අපේ චාර්ල්ස් කුමාරයා ලෝකයේ බොහෝ රටවල්වල නිල වශයෙන් සංචාරය කොට තිබේ. නමුත් ඉඳහිට ඔහු විදේශ රටක කරන සංචාරය සම්පූර්ණ විකාරයක් බවට පත්වන අවස්ථා ද නැත්තේ නොවේ.

1998 චාර්ල්ස් කුමාරයා ශ්‍රී ලංකාවේ කළ සංචාරය එයට හොඳම උදාහරණයයි. ශ්‍රී ලංකාව 50 වෙනි නිදහස් උත්සවය සැමරීමට කුමාරයා එහි ගියේ විදේශ අමාත්‍යාංශයේ විරෝධතාවන් නොතකාය. කොටි සංවිධානයේ මිනිස් බෝම්බ ගැහිලි මැද්දේ වුව ද ලංකාවේ සංචාරයේ යෙදීමට චාර්ල්ස් කුමාරයා බියක් පෙන්වුයේ නැත. නමුත් සංචාරය පටන් ගත් වෙලේ සිට අවසානය දක්වා චාර්ල්ස්ට එය ලොකු විහිලුවක් බව ඔහු Robert Hardman කතෘවරයට හෙළි කළේය.

රාජකුමාරයා පිළි ගැනීමට කොළඹදී වෙඩිමුර 21ක් පුපුරවද්දී ගිනි පුපුරක් ඉංග්‍රිසි ගීතය වාදනය කළේය. අවාසනාවට එය මාර දී රජා මැරිල්ලක් වීය' කුමාරයා පසුකලෙක Hardman කතුවරයාට කීවේ හමුදා තූර්ය කණ්ඩායම වරද්ද වරද්දා සින්දුව ගයන විටතමන්ට සිනහ නවත්වා ගැනීමට බැරුව දිව තදින් හපාගත් නිසා තව පොඩ්ඩෙන් ලේත් ගලන බවය.

චාර්ල්ස් කුමාරයාගේ ඊළඟ චාරිකාව වූයේ දළදා මාලිගාව නැරඹීමයි. නමුත් දින කිහිපයකට කලින් කොටින් එයට බෝම්බ ගසා තිබුණි. එනිසා ඒ වෙනුවට බ්‍රිතාන්‍ය පිරිමින්ගේ යට ඇඳුම් නිපදවන Marks & Spencer සමාගම නැරඹීමට රජකුමරු රැගෙන යන ලදී. චාර්ල්ස් කුමාරයාට මෙයත් ලොකු විහිළුවක් වීය.

සංචාරය අවසානයේ දී සේවකයන් අමතා කතා කරමින් ("Thank you 'providing hidden support to substantial parts of the UK population'.") "බ්‍රිතාන්‍යයේ ජනගහනයෙන් විශාල කොටසකට පිරිමින්ට සැඟ වී සපෝට් එකක් දෙන ඇඳුමක් මහන ඔබ සැමට මා මුළු රටම වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා" යැයි කීවේ සැවොම හිනාගස්වමිනි.

ලංකාවේ නිල සංචාරයට එන බ්‍රිතාන්‍ය රාජ කුමාරවරු හා දේශපාලඥයන් ව අපි තොරණ් ගසා පාවාඩ එලා පාරවල් ලස්සනට සරසා හා රතිඤ්ඤා පත්තු කරමින් මහ ඉහළින් පිළි ගන්නෙමු. නමුත් ඊනියා බ්‍රිතාන්‍ය ප්‍රභූවරුන්ගෙන් ඇතැම් අහන්කාරයන් (හැමෝම නොවේ) ආපසු එංගලන්තයට ගිය විට අනිකුත් සුද්දන් ඉදිරියේ අපගේ ඇදකුද කියමින් අපට හිනා වෙති. ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍යයෙන් එන බොහෝ රාජ්‍ය නායකයන් හා රජ කුමාරවරුන්ට අප දක්වන සැලකිල්ල ගෞරවය හා ආගන්තුක සත්කාරය ඔවුනට මාර විහිළුවකි. මෙයාලා හිතන්නේ අපි තවමත් ඔවුන්ගේ කොලනියක සිටින අන්තේවාසිකයන් කියාය. අපිව හාස්‍යයට ලක්කරන මේ අහන්කාර සුද්දන් ඉදිරියේ අභිමානවත් වන අපි ලාංකිකයන් වන අප තව දුරටත් වැඳ වැටිය යුතු නොවේ.

(devsiri@hotmail.com)

අඩු මිලට බෙඩ් ෂීට් රටින් ගෙන්වන ලද ඩිසයින් 50කින් යුත් අලුත් බෙඩ් ෂීට් වර්ග 80ක්, 195 සිට

උදේ 8 සිට රාත්‍රී 8 දක්වා දින 7ම විවෘතයි. (සැමිණ ලබා ගත යුතුයි)

	අපේ මිල	වෙළඳපලේ මිල
සින්ගල් බෙඩ් ෂීට්	රු.195/-	රු.400/-
ඩබල් බෙඩ් ෂීට්	රු.290/-	රු.600/-
ත්‍රිපල් බෙඩ් ෂීට් (කොට්ට උර සමඟ)	රු.490/-	රු.900/-

4800 දක්වා, තුවා රු.130/- සිට, නයිට් රු.290/- සිට, මේස් රු.40/-සිට, සර්වියට් රු.30/- සිට, සරොන් රු.390/- සිට, මෙට්ට කවර සින්ගල්, ඩබල්, ත්‍රිපල්, කින්ග් සයිස් තොග මිලට ලබාගත හැක.
සැමිර්විටා බෙඩ්ෂීට් කොම්පැනි අවුට්ලට් ගුරුගේ ටේවර් පාර්ක් අසල, ජා-ඇල.
0117 902 278 / 0771 964 341

unicef 75 for every child

Request for Expression of Interest (REOI)

Design and Consultancy Services on Construction Management

UNICEF, Sri Lanka Country Office wishes to call for EOI from qualified firms for the services of designing and consultancy services on Construction Management of its Proposed Office Building at Colombo 07.
Interested bidders are requested to submit an EOI including following.

1. Firm shall be an active multi-disciplinary design and consultancy organization with minimum 10 years' experience.
2. Copy of valid Business Registration Certificate in Sri Lanka with Organogram.
3. Should engage key management and technical personnel with minimum 10 years' experience.
4. Provide details of academic & professional qualifications/ experience of following : Team Leader, Architect, Structural Engineer, Service Engineers, Quantity Surveyor.
5. Evidence of similar projects (Construction cost above Rs.150 million) done in last five years. Give details of clients & references.
6. Evidence of similar work in hand. (Construction cost above Rs. 150 million). Give details of clients & references.
7. Evidence of wining any recognized awards in last five years relevant to industry (If any)

EOI should be sent **on or before 28th February 2021 to:**

Supply Officer
'EOI – Designing and Consultancy Services on Construction Management for UNICEF Colombo' should be stated in the subject line.

Via electronic mail to: srilankasupplybids@unicef.org

Please note:

- We do NOT require prices at this stage, and we merely seek your expression of interest in participating in the bid.
- A response to this Request for Expression of Interest does not automatically ensure that you will be selected for Request for Proposal. The evidence/ documents provided by the agency will be used to shortlist firms which fulfil the requirements of the criteria after careful review of the evidence provided an invitation for bid will be sent respectively, hence please submit all relevant documents along with the EOI.
- For any clarification, you may contact Supply Section, UNICEF Office during office hours. Tel:0773710645 (Mr.Kanchana), 0713394959 (Mr. Nalinda)

ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකතනය: 011 460 70 00, 011 232 43 24 ෆැක්ස්: 011 466 94 16
වෙබ්: www.nlb.lk

දියෙස්පෝරාව
DIASPORA

නීතිවේදී හසක රත්නමලල
කැනඩාවේ සිට ලියයි

නැගෙනහිර පර්යන්තය සහ පැට්‍රික් බහායි

ඔන්ටාරියෝ ප්‍රාන්තයේ බ්‍රම්ප්ටන් නගරය විවිධ ජන කණ්ඩායම් වෙසෙන බහුවාර්ගික නගරයකි. 2016 පැවති කැනඩා සංගණනයට අනුව නගරයේ ජනගහනය 593,638 කි. බ්‍රැම්ප්ටන් යනු කැනඩාවේ නවවන වැඩිම ජනගහනය සහිත නගර සභාව වන අතර එය උතුරු ඇමරිකාවේ හැත්තෑ හත්වන විශාලතම නගරයයි. බ්‍රැම්ප්ටන් හි විශාලතම ජනවාර්ගික කණ්ඩායම ජනගහනයෙන් 44.3% නියෝජනය වන දකුණු ආසියානුවන්ය.

සමස්ත ජනගහනය තුළ සියයට 21.46% ක්ම කතා කරන්නේ ඉන්දීය භාෂාවන්ය. එමෙන්ම ජනගහනයෙන් 1.83% දෙමළ භාෂාව කතා කරති. ජනගහනයෙන් 2.79% උර්දු භාෂාව කතා කරන පාකිස්ථානුවන් වන අතර දකුණු ආසියානික ජනගහනයෙන් ඉතිරිවන 18.22% කොටස තුළ අනිවාර්යයෙන්ම සිංහලයන් නියෝජනය වියයුතු අතර අවාසනාවකට මෙන් සිංහලයන් සුපුරුදු පරිදි තම මවු භාෂාව කුමක්ද යන්න හෙළිදරව් කිරීමට ලැජ්ජා වීම නිසා මෙම 18.22% තුල සිංහලයන්ගේ නියෝජනය කුමක්දැයි යන්න සොයා බැලීම මහත් ගැටලුවක් වී ඇත.

මා දන්නා පරිදි දෙමළ කතා කරන ජනගහනයට වඩා වැඩි ප්‍රමාණයක් සිංහලයින් බ්‍රැම්ප්ටන්හි ජීවත්වන අතර සිය නියෝජනය සංගණනයන් තුළ හෙළිදරව් නොකිරීම නිසා සිංහලයන්ට නගර දේශපාලකයන්ගේ විවිධ අකටයුතුකම් වලට මුහුණ දීමට සිදුවී තිබේ.

බ්‍රැම්ප්ටන්හි වත්මන් නගරාධිපතිවරයා වන්නේ සුදු ජාතිකයකු වන පැට්‍රික් බ්‍රවුන්ය. ඔහුට ඉහත දැක්වූ ජනගහන තේරාවලිය තුළ වඩා වැදගත්වන්නේ ඉන්දීය ජනගහනයයි. ඒ නිසා ඔහුගේ විවිධ ක්‍රියාකාරකම් බොහෝමයක් ඉන්දීය කේන්ද්‍රීය වන අතර ඊළඟ කරපින්නාගත් ඔහුගේ ප්‍රධාන දේශපාලන සහායක බාබු නාගලිංගම්ගේ උසිගැන්වීම් මත සමහර දෙමළ කොටස්වල වුවමනා එපාකම් නොවලහා ඉටුකිරීමද ඔහු අතින් සිදු වෙයි. එහෙත් එවැන්නක් සිදුවන්නේ ද ඉන්දීය අවශ්‍යතා අනුවද යන සැකය දැන් බලවත් ලෙස ඇතිවී තිබේ.

වත්මන් ඉන්දීය අගමැතිවරයා සමඟ පැට්‍රික් බ්‍රවුන්ට ඇත්තේ සහෝදරාත්මක බැඳීමක් බව දෙපාර්ශ්වයෙන්ම විටින්විට කරන ලද ප්‍රකාශ වලින් හෙළි වේ. මෝඩි සමඟ පැට්‍රික් බ්‍රවුන් ගේ මිත්‍රත්වය 2009 තරම් ඈතට දිවයන අතර එය ආරම්භ වූයේ කැනඩාවේ සංස්කෘතික ප්‍රජා වෙත ළඟා වීමට ෆෙඩරල් කොන්සර්වේටිව්වරුන් දැරූ උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙනි. කැනඩාවේ වෙසෙන ඉන්දීය ජනගහනයෙන් අතිමහත් බහුතරයක් වන්නේ "සිංග්"ලා වුවද පැට්‍රික් තෝරාගන්නේ ව්‍යාපාරික ප්‍රජාවක් වන බොහෝ අත මිට ඇති "පටෙල්" ලාය. පටෙල්ලා පැමිණෙන්නේ ගුජරාටයෙනි. එවකට ගුජරාට මහ ඇමතිකම දැරුවේ වත්මන් අගමැති මෝඩි ය. විදෙස් කටයුතුවලදී කැනඩාවේ දේශපාලකයන්ට ගුරු හරුකම් දෙන කැනඩා විදේශ අමාත්‍යාංශයට අනුබද්ධ ගෝලීය කටයුතු (Global Affairs) ආයතනයේ විරුද්ධ වීම් නොසලකා. පැට්‍රික් ගුජරාටයට ගොස් එහි මහා ඇමති මෝඩි හමුවෙති. ඒ වනවිට පැට්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වරයකු වූ අතර මෝඩි මහත් ආන්දෝලනයකට ලක්ව සිටි අතර සිය ගණනක් මියගිය කැරලි කෝලාහලයක් නැවැත්වීමට අපොහොසත් වූ බවට චෝදනා ලැබ එක්සත් ජනපදයට යෑමට පවා වීසා අහිමිවී තිබුණු දේශපාලකයකු විය. එසේ තිබියදී මෝඩිගේ ගුජරාට් රජය විසින් පවත්වන ලද වෙළඳ සමුළුවකට පැට්‍රික් සහභාගී විය. එහි ප්‍රථිපලයක් ලෙස පැට්‍රික් මෝඩිගේ හිතවතකු බවට පත්විය. මෝඩි ඉන්දීය අගමැතිවරයා ලෙස කැනඩාවේ සංචාරයක යෙදෙද්දී ඔහු පුද්ගලිකව නිල නොවන මට්ටමින් හමු වූ එකම පුද්ගලයා බ්‍රවුන් ය. දැනටමත් බ්‍රවුන් මෝඩි හමුවීම සඳහා 15 වතාවකටත් වඩා අධික ප්‍රමාණයක් ඉන්දියාවේ සංචාරය කර තිබේ. කොටින්ම මෝඩි ඔහු හඳුන්වන්නේ කැනඩාවේ සිටින පැට්‍රික් සොයුරා හෙවත් "පැට්‍රික් බහායි" යනුවෙනි. ඉන්දියාව සහ කැනඩාව 2015 අත්සන් කළ ඩොලර් මිලියන ගණනක් වටිනා යුරේනියම් සැපයුම් ගනුදෙනුව ක්‍රියාවට නැඟීම සඳහා ප්‍රබල කාර්යභාරයක් පසුබිමේ සිට කර ඇත්තේ පැට්‍රික් බහායි බවද කියවෙයි. මීට අමතරව පැට්‍රික් මැතිවරණයකට ඉදිරිපත්වන සෑම අවස්තාවකදීම මෝඩිගේ ඉල්ලීම මත ඔහුගේ සහයට ඔන්ටාරියෝ ගුජරාටි සංගමයද එලිබසියි. මෙය ඔහුගේ පාර්ලිමේන්තු, ප්‍රාන්ත, සහ දැන් බ්‍රම්ප්ටන් නගරාධිපති මැතිවරණ තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. ඔන්ටාරියෝ කන්සර්වේටිව් පක්ෂ නායකත්ව තරගයේදී පැට්‍රික්ට එරෙහිව ලිංගික අපහරණයක් පිළිබඳ චෝදනාවක් එල්ල නොවන්නට ඔහු අද ඔන්ටාරියෝ ප්‍රාන්තයේ මහා ඇමති වරයාය. ඉන්දීය සම්භවයක් සහිත ඔන්ටාරියෝ ජනතාවගේ ජන්දයෙන් එසේ වන්නට ඉඩ තිබිණ.

මෙලෙස දිග හැල්ලක් පැට්‍රික් බ්‍රවුන් ගැන කියන්නට සිදුවන්නේ මෑතකදී ඔහු විසින් ගන්නා ලද එක ක්‍රියාමාර්ගයක් හේතුවෙනි. ඔහු අපට වැදගත් වන්නේ ඒ හෙයිනි. කැනඩාවේ සුදු ජාතික දේශපාලකයන් අතරින් එල්ටීටීඊයට දරදිය අදින එකම දේශපාලකයා පැට්‍රික් ය. කලක් නිහඬව සිටි පැට්‍රික් බ්‍රවුන් හිටි හැටියේම ලංකාව පිළිබඳ කථාකරන්නට පටන්ගෙන තිබේ. පසුගිය 20 වැනිදා යුද්ධයෙන් අහිමි වූ දෙමළ ජීවිත සැමරීම සඳහා තමන්ගේම ස්මාරකයක් ඉදිකිරීමට පැට්‍රික් නගරාධිපතිධුරය හොබවන බ්‍රැම්ප්ටන් නගර සභාව ඒකමතිකව ඡන්දය ප්‍රකාශ කළේය. යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ පැට්‍රික්ගේ සෙවණැල්ල බඳු ඔහුගේ මිත්‍ර නාගරික මන්ත්‍රීවරයකු විසිනි. ඉන් නොනැවතුණු පැට්‍රික් කැනේඩියානු ගුවන් විදුලියට (CBC) ගොස් ලංකාවට එරෙහිව සම්මුඛ සාකච්ඡාවක්ද ලබාදෙනු ලැබීය. පැට්‍රික් හිටිහැටියේ මෙලෙස හැසිරෙන්නේ ඉන්දියාවේ මෝඩි ලොකු අයියාගේ වුවමනාවටදැයි මට නිකමට සිතෙයි.

ඉන්දියාවට නැගෙනහිර පර්යන්තයේ අවශ්‍යතාව තදින් දැනෙනවිට බ්‍රම්ප්ටන්හි සිටින පොඩි මල්ලිට හිටි හැටියේම මෙතරම් ලංකාව පිළිබඳ වෛරයක් ඇති වන්නට වෙනත් හේතුවක් නම් මට නොපෙනේ. සමහරවිට පැට්‍රික් මලයාගේ මෙම හැසිරීම සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට ලොකු අයියාගේ එකම දුරකථන ඇමතුමකින් කළ හැකිවනු ඇත. ඔවුන් ඒ තරමටම සමීප සහෝදරයන් දෙදෙනෙකු බව ඉහත දැක්වූ විවරණයෙන් පැහැදිලි වනු ඇත.

දැන් බ්‍රම්ප්ටන්හි ශ්‍රී ලාංකිකයෝ පැට්‍රික්ට එරෙහිව නඩු මගට යාමට වුවද සුදානම්ව සිටිති. මුල්ලිවයික්කාල් ස්මාරකයක් බ්‍රම්ප්ටන් හි සෑදීමෙන් සිදුවන්නේ ශ්‍රී ලාංකික ජනකොටස් අතර වෛරය තවදුරටත් උග්‍ර ලෙස වර්ධනය වීමයි. යුද්ධයෙන් මියගියේ දෙමළ අය පමණක් නොවේ සෑම ජනකොටසකටම අයත් ශ්‍රී ලාංකිකයන් යුද්ධය නිසා ජීවිත අහිමි කරගත්හ. බ්‍රම්ප්ටන්හි බදු ගෙවන්නන්ගේ අරමුදල් මෙලෙස ජාති අතර ගිනි ඇවිළීම සඳහා භාවිත කරන්නේ තවත් රටක (ඉන්දියාවේ) අවශ්‍යතා සපුරාලීමට දැයි බ්‍රම්ප්ටන්හි බදු ගෙවන්නන් පැට්‍රික් බහායි ගෙන් විමසති. ශ්‍රී ලාංකිකයන් එකිනෙකා අතර කාකොටා ගැනීමට සලස්වා සිය දේශපාලන වාසි ලබා ගැනීමට විදෙස් රටවල දේශපාලකයෝ මෙලෙස කටයුතු කරන්නේ අපේ රටේ යම් වැදගත්කමක් ඔවුන් සියලු දෙනාටම ඇතිබව නිසා නොවේදැයි තේරුම් ගැනීමට ශ්‍රී ලාංකිකයනට හැකිවන්නේ නම් කිසිවකුට අපේ රට මෙලෙස පහළට ඇදදැමීමට හැකි නොවනු ඇත.

ඔබේ අදහස් යොමු කරන්න:
sldiasporatalks@gmail.com

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නීතීඥ ඩී.කලංසූරිය

ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ සම්මානිත මහාචාර්ය මාලනී ඇඳගම

කැලණි සරසවියේ ආචාර්ය කවිතා රාජරත්නම්

කොළඹ සරසවියේ මහාචාර්ය සඳගෝමී කෝපරහේවා

කොළඹ සරසවියේ මහාචාර්ය දුෂ්ෂන්ති මෙන්ඩිස්

මවු භාෂාව භාවිත කිරීමට ලැබීම ඕනෑම මානව වර්ගයක අයිතියකි!

ලෝක භාෂා දිනය සැප්තැම්බර් 26 දින සමරනවා. නමුත් ජාත්‍යන්තර මවු භාෂා දිනය සැමරීම පෙබරවාරි 21 දිනට යෙදෙනවා. එය ආරම්භ කළබව 1999 පෙබරවාරි 21 දින දැනුම්දෙන ලද්දේ UNESCO ආයතනය විසිනි. මෙම දිනයේ අරමුණ රටක පවතින පැරණිම භාෂා ආරක්ෂා කිරීම. භාෂාව පෝෂණය කිරීමට අනිවාර්යයෙන් පැරණි සාහිත්‍ය හා සම්ප්‍රදාය අවශ්‍යය වෙනවා. එසේත් නොමැතිව කථන භාෂාවෙන් පමණක්ම මවු භාෂාව පෝෂණය අපහසුයි

● සචිනි ඉමල්ෂා

භාෂාමය සංස්කෘතික විවිධත්වය සහ බහු භාෂා භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අන්තර්ජාතික මවුභාෂා දිනය පෙබරවාරි 21 වැනි දින වන සැමරයි. ලෝ වැසියන් විසින් භාවිත කරනු ලබන සියලු භාෂා සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සැමරෙන ජාත්‍යන්තර මවු භාෂා දිනය 2021 වර්ෂයේ තේමාව වන්නේ බහුභාෂා පෝෂණය අධ්‍යාපනයට හා සමාජයට මහඟු ප්‍රවේශයක් යන්නයි. මවු භාෂාව යන්න කුමක්ද ලෙස සරලව අර්ථ ගැන්වුවහොත් භාෂාව තමන්ට උපතින් හිමි වන භාෂාව එසේත් නැතිනම් උපතේ සිට තීරණාත්මක කාලයක් තුළ මුලින්ම ඉගෙන ගන්නා බස සරල වශයෙන් මවු භාෂාව ලෙස අර්ථකථනය කළ හැකිය.

ලොව වැඩිපුරම කතා කරන භාෂාව ඉංග්‍රීසි භාෂාව ලෙස හැඳින්වූවත් ඉංග්‍රීසි භාෂාව කතා කරන ජන සංඛ්‍යාව පසුවන්නේ ලොව තෙවැනි ස්ථානයේයි. ලොව වැඩිපුරම කතා කරන භාෂාව චීන භාෂාවයි (මැන්ඩරීන්). දෙවැනි ස්ථානය හිමි වනු ලබන්නේ ස්පාඤ්ඤ භාෂාවටයි. දෙමළ භාෂාව විසි වන ස්ථානයේ පසුවන අතර සිංහල භාෂාවට හිමි හිමිවන්නේ හැට දෙවන ස්ථානයයි. මෙය ඉතා දුක්ඛිත තත්ත්වයකි. භාෂාවක් ඉදිරියට පවත්වාගෙන යාමේදී වඩාත් වැදගත් වෙනු ලබන්නේ කථනයයි. ලොව භාවිත වන භාෂා සීයට අනූවක් තරම් බහුතර භාෂා ප්‍රමාණයක් ව්‍යවහාර කරන්නේ සමස්ත ලෝක ජනගහනයෙන් සියයට හතරක් තරම් ඉතා සුළු පිරිසකි. ජාත්‍යන්තර භාෂා දිනය සමරනුයේ විශ්ව භාෂා අද මුහුණ පා ඇති අභියෝග හඳුනා ගෙන ඊට විසඳුම් සෙවීමේ අරමුණිනි.

වර්තමාන ලෝකයේ ව්‍යවහාරික භාෂාව පිළිබඳව සිදු කරන ලද පරීක්ෂණයකදී දැනට ලෝකය පිළිගත් භාෂා 6912 ක් ව්‍යවහාර වන බව හඳුනා ගෙන තිබේ. එයින් භාෂා දහයක් පමණ වචන නැති සංඥා භාෂාය. එසේම ව්‍යවහාරයේ පවතින භාෂා තුනෙන් 50% කට වඩා වැඩි ගණනක් ව්‍යවහාරයෙන් ඉවත්ව මළ භාෂා ලැයිස්තුවට එක් වීමේ අවදානමක් පවතියි. වඩාත් භයානකම කරුණ වන්නේ මෙම භාෂා අතරින් එක් භාෂාවක් සෑම සති දෙකක් තුළ ම ලොවට අහිමි වීමයි.

මේ පිළිබඳව හා මෙවර මවුභාෂා දිනයට සමගාමීව රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති නීතීඥ ඩී.කලංසූරිය අදහස් දැක්වූවේ මේ ලෙසිනි.

‘මේක මවුභාෂා දිනය වශයෙන් ප්‍රකාශ කරලා 2000 දී රටවල් 188ක් ජාත්‍යන්තර වශයෙන් මවුභාෂා දිනය සමරනවා. ඒ අනුව තමයි මේ දිනය පෙබරවාරි 21 මවුභාෂා දිනය විදියට යොදා ගත්තේ. ලංකාව තුළත් විවිධ ජාතීන් කුඩා කණ්ඩායම් වශයෙන් ජීවත් වෙනවා. ඔවුන් ඔවුන්ගේ මවුභාෂාව ඔවුන්ගේ ගෘහාශ්‍රිතව, ඔවුන්ගේ ඥාතීන් අතර භාවිත කරනවා.

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අංශ ප්‍රධාන මහාචාර්ය සඳගෝමී කෝපරහේවා මෙවර මවුභාෂා දිනය වෙනුවෙන් තම අදහස් දැක්වූයේ මේ ලෙසිනි.

බහුභාෂිකත්වය ලෝකය පුරාම දකින්නට ලැබෙන සංසිද්ධියක්. ඒ රටවල් වලින් වැඩි ප්‍රමාණයක් බහුභාෂිකයි. ඒකභාෂික කියන රටවල් අද නැහැ. ඒ අතරම තියෙන අනිත් කාරණය තමා ඉංග්‍රීසි වැනි විශ්ව භාෂාවක් ව්‍යාප්ත වෙන නිසා ඒ රටවල තියන මවු භාෂාවලට විශාල බලපෑමක් එල්ල වෙමින් තියනවා. මවුභාෂා දිනයේ තියන වැදගත්කම තමයි ඉංග්‍රීසි වැනි විශ්ව භාෂා හමුවේ මවුභාෂාවට ඇති තර්ජනය.

ස්වදේශී භාෂා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම ඒ භාෂාවල තියන තොරතුරු ලේඛනගත කිරීමේ අවශ්‍යතාවක් තියනවා. අද තියෙන විශේෂ කාරණයක් තමා ලංකාව වැනි රටක සිංහල, දෙමළ රාජ්‍ය භාෂා වශයෙන් භාවිත වුවත් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන වශයෙන් අපේ අධ්‍යාපනය පරිපාලනයට හා වාණිජ වැනි අංශවල වැඩි බලපෑමක් කිරීම.

යම්කිසි ආකාරයකට මවු භාෂාව අතහැර ඉංග්‍රීසි වැනි භාෂාවක් සම්පූර්ණයෙන් අධ්‍යාපනය මාර්ගය බවට පත් වුණොත් ඒ දැනුම ස්වභාෂා වලින් ප්‍රකාශයට පත් වෙන්නෙ නැහැ. එහෙම තත්ත්වයක් ආවොත් සාමාන්‍ය ජනයාගේ එදිනද කතා බහ පමණක් මවුභාෂාවට සීමා වෙන්න පුළුවන්.

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ මහාචාර්ය දුෂ්ෂන්ති මෙන්ඩිස් මවුභාෂාව පිළිබඳවත් එහි වැදගත්කමත් වෙනස් විදියකට ප්‍රකාශ කළේය. ‘මම හිතන විදිහට මේ පාර තේමාව ගොඩක් උචිතයි. මොකද ශ්‍රී ලංකාව බහුභාෂික රටක්.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන භාෂා දෙකක් තියෙනවා. ඒ සිංහල සහ දෙමළ. ඊට අමතරව ඉංග්‍රීසි කතා කරන අයත් ඉන්නවා. ඒ වගේම තවත් භාෂා තුනක් තියෙනවා.

ශ්‍රී ලංකා මැලේ, ශ්‍රී ලංකා පෘතුගීසි, ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ භාෂාව. අඩුම ගානේ ලංකාව තුළ මවු භාෂාව කියලා භාෂා 6 කට අපිට කියන්න පුළුවන්. හැබැයි දැන් අධ්‍යාපනය අතින් බලනකොට ලංකාවේ පාසල්වල උගන්වන්නේ ඔය භාෂා හයෙන් තුනක් පමණයි. ඒ සිංහල, දෙමළ, ඉංග්‍රීසි. අනිත් භාෂා පාසල්වල උගන්වන්නේ නැහැ.

මම ඒ එක්කම භාෂා අයිතිවාසිකම් අතින් බලන විට එතනත් උල්ලංඝණය වෙනවා කියලා මම කියනවා. එයාලගේ මවු භාෂාව අපි අනුමත කරන්නේ නැහැ. මවු භාෂාව කියන්නෙ තමන්ගෙ ආත්මේ වගේ. තමන්ගේ සිරිත් විරිත් තමන්ගේ ආගම තමන් කවුද කියන එක මේ ඔක්කොම දේවල් එක්ක බැඳෙන දෙයක්.ඒ නිසා කාගෙහරි මවු භාෂාව අනුමත කරන්නෙ නැත්නම් තමන්ගෙ මවු භාෂාවට තැනක් දෙන්නේ නැත්නම් මගේ තර්කය එක භාෂා අයිතීන්ට කරන උල්ලංඝනය කිරීමක්.

කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්ය කවිතා රාජරත්නම් මවු භාෂාව වෙනුවෙන් සිය හඬ අවදි කළේ මේ ලෙසය.

ලෝක භාෂා දිනය සැප්තැම්බර් 26 දින සමරනවා. නමුත් ජාත්‍යන්තර මවු භාෂා දිනය සැමරීම පෙබරවාරි 21 දිනට යෙදෙනවා. එය ආරම්භ කළබව 1999 පෙබරවාරි 21 දින දැනුම්දෙන ලද්දේ UNESCO ආයතනය විසින්. මෙම දිනයේ අරමුණ රටක පවතින පැරණිම භාෂා ආරක්ෂා කිරීම. භාෂාව පෝෂණය කිරීමට අනිවාර්යයෙන් පැරණි සාහිත්‍ය හා සම්ප්‍රදාය අවශ්‍යය වෙනවා.

එසේත් නොමැතිව කථන භාෂාවෙන් පමණක්ම මවු භාෂාව පෝෂණය අපහසුයි

මේ දෙයට මම යෝජනා කරන විසඳුම වන්නේ මවු භාෂාව හා දෙවන භාෂාව සෑම දරුවෙකුටම හොඳින් ඉගෙන ගන්න ඕනි. මක්නිසාද යත් මවු භාෂාව ඉතා නිවැරදිව අවබෝධ කර ගත් විට අනෙක් භාෂාවල අත්තිවාරමද පැහැදිලිව අවබෝධ වෙනවා.

ඉහත කරුණු සමඟ මඳක් සිතා බලන විට ඔබ සිතන්න මවුභාෂාවට හිමිවන තැන සහ මවුභාෂාව අද තිබෙන තැන. ජාතිය සිංහල යැයි ආඩම්බරයෙන් කියනවා සේම භාෂාව සිංහල යැයිද ඔබ ආඩම්බරයෙන් කිවයුතුය. ඉතින් ඔබ ඔබගේ සිතින් මඳක් අසන්න; ඔබ ඔබේ භාෂාවට දී තිබෙන තැන.

හරි වහර

● ශ්‍රීනාත් ගණේවත්ත

බසකට හරි වහර ඇවැසි වන්නේ ඇයි දැයි අපි කෙටියෙන් විමසා බලමු. ලොවෙහි සෑම දෙයෙක ම, සෑම කරුණෙක ම හරි වැරැදි යැයි දෙපැත්තක් වේ. අප සෑම විට ම නිවැරැදි කරන්නේ නිවැරැදි ප්‍රතිඵලයක් ලැබෙතියි අපේක්ෂාවෙනි. කලින් ලිපියෙක දී පෙන්වා දෙන ලද පරිදි, භාෂාවේ ප්‍රමුඛ කාර්යය නම් අර්ථ ප්‍රකාශනයයි. හරි වහර ඇවැසි වනුයේ හරි - නිවැරදි - අර්ථ ප්‍රකාශනය සඳහන් ඒ අර්ථය නිවැරැදි ව වටහා ගැනීම සඳහාත් ය. වැරැදි අදහසක් වටහාගෙන වැරදි දැය කොට වැරැදි ප්‍රතිඵලයක් ලබා දුක් වීමට කිසිවකු කැමැති නොවනු ඇත. හරි වහර ඇවැසි වන්නේ ඒ තතුව නැති කොට නිවැරැදි අදහස් නිවැරැදිව වටහාගන්නට ඉඩ සැලැසීම සඳහාය.

බස වනාහි මිනිසුන් ඉතා ම වැඩියෙන් භාවිත කරන්නයි. අපි උදයේ අවදි වූ වේලාවේ සිට රෑ නින්දට යන තෙක් ම භාෂාව භාවිත කරමු. වැඩියෙන් භාවිත කරන්නන් වැඩියෙන් දූෂණය වීම නොවැළැක්විය හැක්කකි. අපේ බස් වහර අද මෙ තරම් දූෂණය වී, වැරදි සහිත වී ඇත්තේ ඒ නිසා ම යැයි සිතිය හැකි ය.

අනෙක් කාරණය නම් භාෂාවට නිවැරැදි සම්මතයක් ඇති නොවීම යි. භාෂාව වනාහි කාගේත් සම අයිතියක් යැයි සැලකෙනුයෙන් දෝ බොහෝ දෙන තම තමනට රිසියෙන ලෙස ලියති. කියති. එයින් වනුයේ වැරැද්ද නිවැරැද්ද තෝරා ගැන්මට ඇති ඉඩ කඩ ඇවිරී යෑම යි. දිගුකලක් තිස්සේ මෙසේ වීම නිසා වැරැදි වහර කුමක් ද, හරි වහර කුමක් ද යන්න පිළිබඳව වියතුන් අතර පවා සම්මතයක් නැති වේ. එයින් භාෂාව අවුලින් අවුලට පත් ව නිවැරැදි අර්ථ ප්‍රකාශ කිරීමේ ශක්තිය නැති වී යයි.

මේ තතුව වළක්වා ගැනීමට නම් භාෂාවට සම්මතයක් තිබිය යුතුය. ඇත්තට ම, බසට සම්මතයක් තිබේ. වරද නම් එක් එක් තැනැත්තා සිතූ මතයට ලියමින් කියමින් සම්මත කඩා බිඳ දැමීම යි. එය වැළැක්වීමට රජයේ මැදිහත් වීමෙකින් හෝ යම් සම්මතයක් ඇති කළ යුතු වේ.

එබඳු සම්මතයක් ඇති කිරීමට ගත් තැත් කිහිපයක් මෑත කල්හි දැකිය හැකි විය.

එකක් 1969 දී එකල අධ්‍යාපන, සංස්කෘතික ඇමැති වැ සිටි ඊරියගොල්ලයන් ගේ පෙලැඹවීම අනුව සකසන ලද ‘සම්මත සිංහලය’ යි. බොහෝ දෙනකුන් එයට එකඟ වුව ද එකල සිටි සරසවි ඇදුරන් ඇතුළු කීප දෙනකුන් ගේ විරෝධය නිසා ද ඇතැමුන් එය ‘දේශපාලන කාර්යයක්’ ලෙස දැකීම නිසා ද සම්මත සිංහලය ලත් තැන ම, ලොප් විය.

ඊළඟ වෑයම වූයේ ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රමුඛත්වයෙන් සකසන ලද ‘සිංහල ලේඛන රීතිය’ යි. එයට පුරෝගාමී වූවෝ නම් මේ නොබෝදා ජාතියෙන් සමුගත් වි.ජ.මු. ලොකුබණ්ඩාරයෝ යි. එකල එතුමෝ අධ්‍යාපන, සංස්කෘතික, ප්‍රවෘත්ති අමාත්‍ය ධුරය හෙබැවූහ. සිංහලය පිළිබඳ මහත් ප්‍රවිණත්වයක් දැරූ විද්වතකු වූ ලොකුබණ්ඩාරයන් ගේ දැඩි වෑයම නිසා ම භාෂාව ගැන නොයෙක් මත දැරූ වියතුන්, සරසවි ඇදුරන් එක් පොදු සම්මතයකට පැමිණ සකස් කරන ලද්දෙකි, ඒ ‘සිංහල ලේඛන රීතිය’.

සිංහලයේ අවාසනාවට මෙන් එය ද ජනයා අතර භාවිතයට නො පැමිණ හමස් පෙට්ටියේ සැඟැවිණ. එහෙත් එය ඇති කිරීමට පුරෝගාමී වූ වි.ජ.මු. ලොකුබණ්ඩාරයනට ජාතියේ ප්‍රණාමය හිමි වන බව එතුමනට ගෞරවයක් වශයෙන් පැවැසිය යුතුය.

දැන් අපි වදන් කිහිපයෙක හරි වහර විමසා බලමු.

අග්‍රේසර - මෙහි අරුත පෙරමුණෙහි යන්නා, පෙරටුව යන්නා යනුයි. මෙහි (දන්තජ) ස යෙදෙන සැටි මනාව විමැසිය යුතු ය.

අග්‍රගණ්‍ය - මෙහි අරුත අග්‍ර ගණයට අයත්, එනම් උසස් ම පෙළේ යනු යි. මෙහි (මූර්ධජ) ණ යෙදෙන සැටි සැලැකිල්ලට ගත යුතු යි.

අග්‍රාමාත්‍ය - මෙය සෑදෙන්නේ අග්‍ර + අමාත්‍ය යන දෙ වදන සන්ධි වීමෙනි. මෙහි ‘ග්‍ර’ අකුරට පසු ඇලපිල්ල යෙදෙන සැටි මනාව සැලැකිය යුතුය. ඇතැම්හු ‘අග්‍රමාත්‍ය’ යැයි වරදවා ලියති.

නුගේගොඩ අනුලාවේ දංගෙඩියට හසුවූ සිසුවියන්

● සුහාෂිණී ජයරත්න

අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ යටතේ දස දහසකට අධික පාසල් ප්‍රමාණයක් ඇති අතර සෑම වසරකම මේ පාසල්වල පළමු ශ්‍රේණියට නවක සිසුන් ඇතුළත් කර ගැනීම සිදු වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දෙවැනි වාර ආරම්භයේද නිකුත් කරන්නා වූ චක්‍රලේඛ විධි විධානයන්ට අනුකූලවය. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවසන් වරට නිකුත් කර ඇති දත්ත සංඛ්‍යාන වාර්තාවට අනුකූලව 10,165 ක් වන රජයේ පාසල්වල සිසුන් 4,061,653ක් අධ්‍යාපනය ලබති. මේ පාසල් අතරින් ප්‍රාථමික අංශය සහිත පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගන්නා පාසල් 9,151 ක් ඇති අතර, සෑම වසරකට පළමු ශ්‍රේණියට ඇතුළත් වන්නා වූ සිසුන් ප්‍රමාණය 333,074 කට ආසන්න වෙයි. එයින් ජාතික පාසල්වලට සිසුන් 26,420 ක් වූ ආසන්න සිසු පිරිසක්ද, පළාත් පාසල්වලට සිසුන් 306,654 ක් වූ ආසන්න සිසු පිරිසක්ද ඇතුළත්ව බව වාර්තා වෙයි.

සෑම වසරකටම පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය ආරම්භ වන්නේ දෙවැනි වාරයේ මැයි මස අගදී හෝ අවසානයේදීය. ඒ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සියලු පාසල් ආවරණය වන පරිදි නිකුත් කරන චක්‍රලේඛයට අනුකූලවය. මේ චක්‍රලේඛයට අනුකූලව පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ පදනම් කිහිපයක් වෙයි. එනම් දෙමවුපියන්ගේ පදිංචිය මත පාසලට ඇති ආසන්නතාව පදනම, එසේම සිය පාසලට ලබා දී ඇති සේවය මුල් කරගනිමින් ආදි සිසු පදනම, පාසලට ඇතුළත් කර ගන්නා දරුවාගේ සහෝදරයකු එම පාසලේ සිසුවකු වීම මත සහෝදර පදනම, අධ්‍යාන, අනධ්‍යාන සේවක පදනම, විදෙස් සිට පැමිණ මෙන්ම රාජ්‍ය සේවයේ ස්ථාන මාරුවීම් යන පදනම් මත මෙසේ පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත වෙයි.

සිසුන් පළමු ශ්‍රේණියට ඇතුළත් වීමේදී දැඩි තරගකාරිත්වයක් උසුලන්නේ ඉතාම සීමිත පාසල් ප්‍රමාණයක් පමණි. ඒ පාසල් නාගරික සීමාවේ පවතින අති ජනප්‍රිය පාසල් කිහිපයක පමණි. ඒ හේතුවෙන් සෑම වසරකම මේ කිසිදු පදනමක් නොමැතිව වුවද බොහෝ දෙමවුපියන් පෙලඹී සිටින්නේ තම දරුවා කෙසේ හෝ ජනප්‍රිය යැයි සැලකෙන පාසලකට ඇතුළත් කරන්නටය. මේ නිසාවෙන් පසුගිය කාලාන්තරයක් පුරා තම දරුවන් ජනප්‍රිය පාසල්වලට ඇතුළත් කිරීමට සමහරක් දෙමවුපියන් කුට ලේඛන සකස් කිරීමේ කාර්යයේ නියැළෙන්නේ කිසිදු බියකින් තොරවය. එපමණක් නොව සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේම මේ කුට ලේඛන සකස් කිරීමේ නිති රීති ඇතුළත් කර තිබෙන අතර එයින් දැඩිව අවධාරණය කරන්නේ එසේ කුට ලේඛන සකස් කිරීම නීතියෙන් දඩුවම් විඳිය හැකි වරදක් වන අතර, එමගින් ඇතුළත් කළ දරුවාගේ ශිෂ්‍යභාවයද අහෝසි වන බවය.

පසුගිය දිනවල නුගේගොඩ අනුලා විදුහලේ සිසුන් හය දෙනෙකුගේ දෙමවුපියන් විසින් මෙසේ කුට ලේඛන ඉදිරිපත් කිරීම නිසා පාසලට ඇතුළත් වූ එම දෙමවුපියන්ගේ දරුවන් අනුලා විදුහලින් ඉවත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වත්මන් විදුහල්පතිනියට දැනුම් දුන් අතර; අධ්‍යාපන ලේකම්වරයාගේ නියෝගය ක්‍රියාත්මක කිරීමට වත්මන් විදුහල්පතිනිය කටයුතු කර ඇත. අනුලා විදුහලේ වත්මන් විදුහල්පතිනිය වැඩබාර ගෙන ඇත්තේ 2020 වසරේ පෙබරවාරි 27 වැනිදාය. මෙම කුට ලේඛන හරහා සිසුන් ඇතුළත් කර ගැනීමේ කටයුතු සිදුවී ඇත්තේ 2019 වසරේ නිටපු විදුහල්පතිනිය විසිනි. මේ වන විට ඊට වගකිව යුතු විදුහල්පතිනියද අධ්‍යාපන අමාත්‍යාංශයට මාරු කර යවා තිබුණි. 2019 වසරේදී මේ සිදුවීම සිදු වී ඇත්තේ 2020 වසරට ආදි ශිෂ්‍ය පදනමින් සිසුවියන් ඇතුළත් කිරීමේදී වන අතර, කිසිදු ආදි ශිෂ්‍ය සම්බන්ධයක් නොමැති දෙමවුපියන්ගේ දරු පිරිසක් ආදි සිසු පදනමින් ඇතුළත් කර ගෙන ඇත. මේ සඳහා එම පාසලේ ආදි ශිෂ්‍ය සංගමයේ ඇතැම් නිලධාරීන්ද හවුල් වී ඇති බව සැලය. අයුතු ආකාරයෙන් සිසුවියන් ඇතුළත් කර ගැනීම් සිදුව ඇති බවට මේ වන විටත් පැමිණිලි රැසක් ලැබී ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් අදාළ ලිපි ගොනු පරීක්ෂාවේදී එවැනි කුට ලේඛනවලින් සිදු කළ ඇතුළත් කිරීම් 6 ක් සොයා ගන්නට හැකිව තිබේ. පසුගිය වසරේ ඔක්තෝම්බර් මස 19 වැනි දින හා දෙසැම්බර් මස 21 වැනි දින මෙම සොයා ගැනීම් සිදුව ඇති අතර අනතුරුව මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පොලිස්පතිවරයාට ලිඛිතව දන්වා යවා ඇත්තේ අදාළ නීති විරෝධී ක්‍රියාව සම්බන්ධයෙන් සි. අයි. ඩී යෙන් විමර්ෂණයක් ආරම්භ කරන ලෙසට ඉල්ලමිනි. කෙසේ වෙතත් පසුගිය කාලයේ මේ සම්බන්ධව සි. අයි. ඩීයට පැමිණිලි කිරීමට යම් යම් අධ්‍යාපන බලධාරීන් පවා පැහැර හැර ඇතැයිද වාර්තා වෙයි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය සඳහන් කරන ආකාරයට මේ සිදුවීම සිදුවී ඇත්තේ මෙසේය.

"2020 වසරේදී නුගේගොඩ අනුලා විදුහලට පළමු වසරට සිසුවියන් ඇතුළත් කිරීම් සම්බන්ධව පැමිණිලි වාර්තා වුණා. ඒ නිටපු විදුහල්පතිනිය යටතේ. ඒ අනුව අදාළ ඇයැදුම්පත් කැඳවීම සිදුවී ඇත්තේ 2019 වසරේදී. ආදි ශිෂ්‍ය පදනමින් සිසුවියන් ඇතුළත් කිරීමේදී යම් අකටයුතු දේ සිදුව ඇතැයි අධ්‍යාපන අමාතංශයට පැමිණිලි ලැබුණේ මෙයින් අසාධාරණයට පත්වූ දරුවන්ගේ දෙමවුපියන්ගෙන්. අධ්‍යාපන අමාත්‍යාංශය අභ්‍යන්තර විගණන ඒකකයේ බලධාරීන් අදාළ පාසලට ගොස් නියැඳි පරීක්ෂණයක් සිදු කළා. එහිදි ආදි සිසු පදනමින් සිදුකළ ඇතුළත් කර ගැනීම් වලදි සිසුන් 6 දෙනෙකුට දෙමවුපියන් විසින් ලබා දී තිබුණේ කුට ලේඛන. ආදි සිසු පදනමින් සිසුන් ඇතුළත් කර ගැනීමට මොවුන් විසින් ඉදිරිපත් කළ යුතු සියල්ල කුට ලේඛන."

මෙම දෙමවුපියන්ට කිසිදු ආදි සිසු පදනමක් නොමැති බවද වාර්තා වෙයි. ඔවුන් අස්වීම් ලේඛන, ඇතුළු අත්‍යාවශ්‍ය ලියවිලි කුට ආකාරයට සකස් කර ඇති බව සැලය. ඒ සියල්ල කළේ දරුවන් වෙනුවෙන්ද? දරුවන් යහපත සලසන්නට සිදු කළා නම් අද මේ සිගිත්තන් ඊට වන්දි ගෙවන්නේ නැත. මේ වන විට අනුලා විදුහලේ වත්මන් විදුහල්පතිනියට අධ්‍යාපන ලේකම්වරයාගේ නියෝගය ක්‍රියාත්මක කරන්නට සිදුවී ඇත්තේය. ඒ අනුව මේ දරුවන්ට වෙනත් පාසලක් ලබා දීමට පළාත් අධ්‍යාපන බලධාරීන් බැඳී සිටින්නේය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ආරංචි මාර්ගයන්ට අනුව මේ සඳහා යම් පිරිසකගේ සහයෝගයක් ලැබී ඇතැයි පැවැසීම කනගාටුදායකය. විශේෂයෙන්ම නිටපු විදුහල්පතිනිය ඇතුළු සම්මුඛ පරීක්ෂණ කමිටුව මේ සහයෝගය වක්‍රව ලබා දී ඇතැයි වාර්තා වන්නේ සම්මුඛ පරීක්ෂණයේදී දෙමවුපියන් විසින් ලබා දෙන තොරතුරු සත්‍යාසත්‍ය බව පිරික්සීමේ වගකීම ඔවුන් සතු වන නිසාය. මේ වන විට මේ සිදුවීම් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්ද විධිමත් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව අධ්‍යාපන ලේකම් කපිල සි පෙරේරා සිළුමිණට පැවැසිය.

"2020 අනුලා විදුහලේ පළමු වසරට සිසුන් 6 දෙනේ ඇතුළත් කර තියෙන්නේ ව්‍යාජ ලේඛන සකස් කිරීමෙන්. ඒ වන විට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මම නෙමෙයි. මේ කුට ලේඛන සකස් කර සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නිටපු විදුහල්පතිනියව අදාළ තනතුරින් ඉවත් කළා. පරීක්ෂණ කිරීම් සම්බන්ධයෙන් පසුගිය කාලයේ විවිධ බලපෑම් ආවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ විනය පරීක්ෂණය නිසියාකාරව සිදු වුණේ නැහැ. අපිට වාර්තා වූ ආකාරයට මේ සමහර දෙමවුපියන් ඒ පාසලේ සිසුන් නොවන අයයි. සමහර අය උසස් පෙළ සහතික පවා වෙනස් කර ගෙන තිබුණා. අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇතැම් බලධාරීන් සි. අයි. ඩී යට පැමිණිලි කිරීම පවා පැහැර හැරියා. මට මේ කිසිවකුත් සමඟ කිසිදු හිතවත් කමක් නැහැ. ඒ නිසා සි.අයි. ඩීයට යවන ලියවිල්ල මම අත්සන් කර යැව්වා. ඒ වගේම මේ නිසා අසාධාරණයට පත්වූ දරුවන්ට සාධාරණයක් ඉටු කරන්නටත් කුට ලේඛන සැකසීම නිසා පීඩාවට පත් වූ දරුවන්ට වෙනත් පාසලක් ලබා දීමටත් වත්මන් විදුහල්පතිනියට අවශ්‍ය නියෝග ලබා දුන්නා...."

මෙම කුට ලේඛන සකස් කිරීමේ වරදට දණ්ඩ නීති සංග්‍රහය යටතේද දැඩි දඩුවම් හිමි වන්නේය. එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේද විනය පරීක්ෂණ හරහා දඬුවම් නියම වන්නේය. මේ පිළිබඳ ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් පවසන්නේ මෙවැනි වැරදිවලට නිසි දඬුවම් ලබා දීම අධ්‍යාපන බලධාරීන්ගේ යුතුකමක් ලෙසය.

"මීට සම්බන්ධ විදුහල්පතිනිය සිය තනතුරින් ඉවත් කර අධ්‍යාපන අමාත්‍යාංශයට ඇතුළත් කර ගත්තා. මේ නිසා අපිට යම් සැකයක් මතුවෙනවා, අධ්‍යාපන අමාත්‍යාංශයේම යම් බලධාරීන් මේ සිදුවීම යට ගහන්න උත්සාහ කරනවා කියලා. මෙවැනි වංචනික ක්‍රියා සිසුන් ඇතුළත් කිරීමට සමහරුන් විසින් සිදු කරනවා. මේ එයින් එකක් පමණයි. මේ නිසා ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවෙන්න මෙය අනිකුත් අයට පාඩමක් විය යුතුයි. ඒ නිසා නීතිය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමට හැමෝම බැඳි සිටිය යුතුයි..."

මේ සිසුන් අදාළ පාසලින් ඉවත් කිරීමේ වගකිම වත්මන් විදුහල්පතිනියට සිදු වන්නේය. එය දරුවන් වෙනුවෙන් ගත යුතු අපහසුම තීරණයක් වන්නේය. නමුත් මෙවැනි වැරදි වලට දඩුවම් නුදුන්නහොත් ඉදිරියේදී සිසුන් ඇතුළත් කිරීම් හරහා මෙවැනි වංචනික ක්‍රියා කොතෙකුත් සිදුවිය හැකිද? තම දරුවන්ට ජනප්‍රිය පාසල් සොයා යන මේ ගමනේ වැරදිකරුවන් කවරහුද? පාසල් අතර විෂමතා ඇති බව කවුරුත් පිළිගනිති. සෑම දෙමවුපියකුගේම බලාපොරොත්තුව තම දරුවාට හොඳට ඉගැන්වීමටය. රටේ හොඳ තැනක් තම දරුවාට ලබාදීමේදී ඔහු හෝ ඇය උගන්නා පාසල ඉතා වැදගත්ය. මේ සියල්ල සත්‍ය වුවත් රටේ නීතියට ගරු කිරීම සෑමගේම වගකීමක්ද වන්නේය. නැතිනම් මින් අසාධාරණයට ලක්වන්නේ අනෙක් දරුවන් ය.

සම්පත් Dream Planner සමඟ ඔබේ සහ ඔබේ දරුවාගේ සිහින සැබෑ කරගන්න.

කාලය (වසර)	පුද්ගලික ආයෝජන සැලසුම් අගය - රු. (අවම) මූලික තැන්පතුව රු.2,000/-				
	50,000/-	100,000/-	500,000/-	1,000,000/-	5,000,000/-
2	2,000	4,000	20,400	40,800	204,100
3	1,300	2,600	13,000	26,000	129,900
4	900	1,900	9,400	18,700	93,700
5	700	1,500	7,200	14,500	72,200

පුද්ගලික ආයෝජන සඳහා 6.25% ක ඉහළම පොලියක්

කාලය (වසර)	ළමා ආයෝජන සැලසුම් අගය - රු. (අවම) මූලික තැන්පතුව රු.2,000/-				
	500,000/-	1,000,000/-	2,000,000/-	5,000,000/-	10,000,000/-
5	7,100	14,300	28,500	71,300	142,600
6	5,700	11,400	22,900	57,200	114,300
7	4,700	9,500	18,900	47,200	94,300
8	4,000	8,000	15,900	39,700	79,500
9	3,400	6,800	13,600	34,000	68,000
10	3,000	5,900	11,800	29,500	58,900

ළමා ආයෝජන සඳහා 6.75% ක ඉහළම පොලියක්

ඉහත දැක්වෙන සම්පත් Dream Planner ඔස්සේ ඔබේ ආදායමට සරිලන ආයෝජන සැලැස්මක් ඔබේත් ඔබේ දරුවාගේත් අනාගතය වෙනුවෙන් අදම තෝරාගන්න. ඉතුරු කරන මුදලට වැඩිම පොලියක් සමඟ කල්පිරීමේදී ඔබේ සිහිනය සැබෑ කරගන්න.

සම්පත් බැංකුව
හෙට දින එළිය කරයි

0112 30 30 50 www.sampath.lk සම්පත් බැංකුව ෆිච් රේටිංස් AA-(lka) ශ්‍රේණිගතයි.

*කොන්දේසි සහිතයි

සම්පත් බැංකුව පීඑල්සී - PQ 144 සම්පත් බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයෙන් යටවරක් මුද්‍රාවලිය වන බළපත්‍රලාභී බැංකුවකි. DentsuGrant

නව දැක්මක් වෙනුවෙන් සරසවි සිසු පරපුරට ලැප්ටොප් පරිගණක

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් ප්‍රතිලාභී සරසවි සිසුවකුට ලැප්ටොප් පරිගණක ලබාදීමේ සංකේතවත් ලිපි බාරදීම සිදුවූ අවස්ථාව. අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් ද මෙහි සිටී.

● නිහාල් පී. අබේසිංහ

වර්තමානයේ ශිෂ්‍යයෙන් රටපුරා පැතිර යන කෝවිඩ් වසංගතය නිසා අද අපේ රටේ මාර්ගගත අධ්‍යාපන ක්‍රම ඉතා ජනප්‍රියවී තිබේ. නමුත් ඒ ක්‍රමයට සම්බන්ධ වීමට අද හොඳ තත්ත්වයේ පරිගණකයක්, හෝ ලැප්ටොප් පරිගණකයක් හෝ ටැබ් එකක් මිල දී ගත නොහැකි අය ද අප අතර සිටිති.

විශේෂයෙන් අද මෙරට සරසවි අධ්‍යාපනය වැඩිපුරම කෙරෙන්නේ මාර්ගගත ක්‍රමයටය. ඒ සඳහා ලැප්ටොප් පරිගණකවල ප්‍රබල අවශ්‍යතාවක් ඇත. ඒත් ගම්බද්දින් අඩු ආදායම් ලාභී පවුල්වලින් සරසවියට එන සිසු සිසුවියන්ට එක්වරම රුපියල් ලක්ෂයක් පමණ දී ලැප්ටොප් පරිගණක මිලදී ගැනීමට අපහසුය.

මේ සිසු සිසුවියන්ට සිදුවන්නේ එක්කෝ පරණ පරිගණකයක් අඩු මිලට මිලදී ගැනීමටය. එසේ නැත්නම් තම මිතුරකුගේ ලැප්ටොප් පරිගණකයකින් උදව් ලබා ගැනීමය. නමුත් මේ ක්‍රියාවන් දෙකම නිසා ඒ දුප්පත් සිසු සිසුවියන්ගේ අධ්‍යාපනයට බහුලව බාධා ඇතිවේ.

ඒ ගැටලුවට තිරසර විසඳුමක් ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ රට හදන 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ප්‍රමුඛ සමස්ත අධ්‍යාපන ක්‍රමය වර්තමාන අවශ්‍යතා අනුව ඩිජිටල් කරණය කිරීම අරමුණු කරගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අලුත් වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේ.

ඒ අනුව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් හා අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා යන අයගේ උපදෙස් අනුව දැන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් විශ්වවිද්‍යාලවලට ඇතුළු වන සිසු සිසුවියන්ට අඩුම පොලී ණය යෝජනා ක්‍රමයක් යටතේ ඉහළ ප්‍රමිතියේ ලැප්ටොප් පරිගණක ලබාගැනීමට පහසුකම් සලසා ඇත.

සාම්ප්‍රදායික අධ්‍යාපනය පිළිබඳ සංකල්පය පසුගිය වසර කිහිපය ඇතුළත හා කෝවිඩ් වසංගතයත් සමඟ විප්ලවීය වෙනසකට බඳුන් වී තිබේ. මාර්ගගත අධ්‍යාපන ක්ෂේත්‍රයේ සැබෑ වෙනසක් සහිතව නව යුගයකට පිවිසෙන සරසවි සිසු සිසුවියන්ට තම අධ්‍යාපන කටයුතු සිදු කිරීමට ලැප්ටොප් පරිගණක නැතිවම බැරි අංගයක් වී තිබේ. ඔවුහු බොහෝ පිරිසක් පන්ති කාමරයක භෞතිකව සිටීම වෙනුවට ඩිජිටල්කරණයට එක්ව සිටිති. මාර්ගගත ක්‍රමයට විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිරත සිසුන්ට ඒ ක්‍රමය කාර්යක්ෂම කිරීම අද කාලීන අවශ්‍යතාවකි. ඒ අයට පූර්ණ සහාය දීම අරමුණු කරගෙන 2019/20 සරසවි අධ්‍යයන වසර සඳහා රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන නව සිසුන්ට ලැප්ටොප් පරිගණක මිලදී ගැනීමට රුපියල් ලක්ෂයක අඩු පොලී ණය මුදලක් ලබාදෙන බව විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග පවසයි.

ඒ අනුව මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂගේ පූර්ණ සහාය ද ඇතිව, විශ්වවිද්‍යාල පද්ධතියේ විද්වත් කමිටුවක් විසින් නිර්දේශ කර ඇති පරිදි සිසුන්ට ඔවුන්ගේ අවශ්‍යතාවට සරිලන පරිදි ලැප්ටොප් පරිගණක තෝරා ගැනීමට විකල්ප තුනක් යටතේ අවස්ථාව ලබාදී ඇතැයි මහාචාර්ය සම්පත් අමරතුංග පවසයි.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති රාජ්‍ය විශ්වවිද්‍යාලයක 2019 උසස් පෙළ Z ලකුණු පදනමට තේරී පත්වී 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රාජ්‍ය වෙබ් අඩවියේ https:www.ugc.ac.lk දක්වා ඇති උපදෙස් අනුව මිලදී ගන්නා ලැප්ටොප් පරිගණකයේ ණය මුදල ආපසු ගෙවීම් සඳහා සිවු අවුරුදු සහන කාලයකින් පසු හය අවුරුදු ආපසු ගෙවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වන බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ ගණකාධිකාරී ආර්.ඒ.යූ. රණවීර පවසයි.

නව වැඩපිළිවෙළට මහජන බැංකුවෙන් කෝටි 300ක්

මෙම ලැප්ටොප් පරිගණක ලබාදෙන ආයතන ඔවුන්ගේ පිරිවිතර සහ ලැප්ටොප් පරිගණකවල විකුණුම් මිල ගණන් ලැයිස්තුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව රුපියල් 80500 සිට රුපියල් 177500 දක්වා වන මිල පරාසයක ලැප්ටොප් පරිගණක මිලදී ගැනීමේ අවස්ථාව විශ්වවිද්‍යාල සිසු සිසුවියන්ට සැලසෙන බවත් ගණකාධිකාරීවරයා පවසයි.

සිසුන් තෝරාගන්නා ලැප්ටොප් පරිගණකයේ මිල ණය සීමාවට වඩා වැඩි නම් සිසුන් ඉතිරි මුදල ගෙවිය යුතුය. සිසුන් විසින් තෝරාගන්නා ලද ලැප්ටොප් පරිගණක ඇණවුම් කර සති 8 ක් ඇතුළත සැපයීම සිදු කිරීමට ද අදාළ සැපයුම්කරුවන් එකඟතා ද පළ කර ඇති බව ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව පවසයි.

මේ වැඩපිළිවෙළ යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශ සිසුන්ට ලැප්ටොප් පරිගණක ප්‍රදානය කිරීමේ නිල උත්සවය පසුගියදා ජනාධිපති කාර්යාලයේදී පැවැත්විණ.

2021 වසර සඳහා විශ්වවිද්‍යාලයට පිවිසෙන නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6 දෙනෙකුට වැඩසටහන සංකේතවත් කිරීමට ලිපි බාරදීම පසුගියදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් අතින් සිදුවූයේ ජනාධිපති ලේකම් කාර්යාලයේදී ය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මහජන බැංකුවේ අනුග්‍රහයෙන් මෙම වැඩසටහන සැලසුම් කර තිබේ. මේ සඳහා මහජන බැංකුව වෙන් කර ඇති මුදල රුපියල් කෝටි 300 කි. අන්තර්ජාල සම්බන්ධතාව, මෘදුකාංග, මෘදුකාංග පැකේජය සහ වසර හතරක වගකීම සහිතව මෙම ලැප්ටොප් පරිගණක ලබාදීම සිදු කෙරේ.

මෙම අවස්ථාවට එක්වූ මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ මෙම වැඩපිළිවෙළට අනුග්‍රහය දැක්වීමට අවස්ථාව සැලසීමට හැකිවීම පිළිබඳව සිය සතුට පළ කළේය.

නිදහස් අධ්‍යාපනයේ උපරිම සරුඵල උදාකර ගැනීමට සරසවි සිසු සිසුවියන්ට මේ මඟින් අවස්ථාව ලැබෙන බව මහජන බැංකු සභාපතිවරයාගේ අදහස විය.

මහ පාරේ උද්ඝෝෂණ කරන සරසවි සිසු පරපුරක් අපට සිටියත් ඔවුන්ට සුදුසු පරිදි මාර්ග ගත පරිගණක ගත අධ්‍යාපන ක්‍රමය මේ කෝවිඩ් සමයේ වුව ද කිසිම අඩු පාඩුවක් තොරව ලබාදීමට මෙම නව ලැප්ටොප් ණය ක්‍රමය ඉවහල් වන බව සරසවි ආචාර්යවරු ද පවසති. සිසු සංවිධාන ද මේ වැඩපිළිවෙළ අගය කරන අතර මෙහිදී විශේෂයෙන් ණය ගෙවීමට වසර 4 සහන කාලයක් ලබාදීම පිළිබඳව ඔවුහු රජයට හා මහජන බැංකුවට ස්තුතිය පළ කරති.

මේ පිළිබඳව සිඑමිණට කරුණු දැක්වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා පැවසුවේ මේ වැඩසටහන මොරටු විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා 2019 දී ආරම්භ කළ බවයි.

"අලුත් වැඩපිළිවෙළ යටතේ මේ ණය මුදල ලබාදෙන සැමට මුලින් ම වසර 4 ක් යන තුරු ගෙවන්න වෙන්නේ පොලිය පමණයි. අපේ රටේ සිසුන් 5000 කට මහපොළ ශිෂ්‍යාධාර ලැබෙනවා. තවත් 4000 කට ශිෂ්‍යාධාර ලැබෙනවා. ඒ අනුව රුපියල් 500 ක් පමණ වන මේ ලැප්ටොප් ණය මුදලට අදාළ පොලිය කරදරයක් නැතිව ගෙවීම අපේ විශ්වවිද්‍යාල සිසු පරපුරට අවස්ථාව ලැබෙනවා. ඒ අයට සම්පූර්ණ ණය මුදල ගෙවන්න වෙන්නේ ස්ථිර රැකියාවක් ලැබුණාට පස්සෙයි" ගණකාධිකාරී ආර්.ඒ.යූ. රණවීර පවසයි. ඒ අනුව මේ වැඩපිළිවෙළ මෙරට සරසවි සිසුන්ගේ අනාගතය සවිමත් කරන ශක්තිමත් අත්වැලක් ලෙස අපට හැඳින්විය හැකි ය.

අඩු පොලී, ණය ගෙවීම් රස්සාවක් ලැබුණාට පසු

ආචාර්ය සංගම් හා සිසු සංගම්වලින් රජයට ප්‍රණාමය

චාර්ය කපිල පෙරේරා පැවසුවේ මේ වැඩපිළිවෙළ තමා මොරටුව සරසවියේ උපකුලපති ලෙස කටයුතු කළ සමයේ ආරම්භ කළ නියාමක වැඩපිළිවෙළක දිගුවක් බවයි.

"2020 දී මා හා දැනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ප්‍රධාන ගණකාධිකාරී රණවීර මහතාත් එක්ව මේ වැඩපිළිවෙළ සුළු වශයෙන් මොරටු සරසවි සිසුන් සඳහා ක්‍රියාත්මක කළා. ඒ අනුව මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ හා වෛද්‍ය පීඨයේ උපාධිධාරීන්ට මේ යටතේ ලැප්ටොප් පරිගණක ලබාදීමට රුපියල් ලක්ෂ 2 ක ණයක් ලබාදෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළා. එය පසුගිය වසරේදී ක්‍රියාත්මක වූයේ මොරටු සරසවියට පමණයි. පසුව එය දැන් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම පිළිබඳව එහි ආරම්භයට එක්වූ පුද්ගලයෙක් ලෙස මට ඉතා සතුටුයි" මහාචාර්ය කපිල පෙරේරා පවසයි.

ඔහු පවසන පරිදි මේ වැඩපිළිවෙළ යටතේ ලැප්ටොප් මිලදී ගැනීමට ඉල්ලන ඕනෑම රජයේ සරසවියක උපාධි අපේක්ෂකයකුට රුපියල් ලක්ෂයක් දක්වා ණයක් ලබාදෙයි. එය වසර 4 ක සහන කාලයක් ලැබෙන අතර ණය ගෙවිය යුත්තේ ස්ථිර රැකියාවක් ලැබුණු පසු වසර 6 ක් ඇතුළත ය. සමාන වාරික 72 කින් ඒ මුදල ගෙවීමට අවස්ථාව සලසා ඇතැයි ද අධ්‍යාපන ලේකම්වරයා පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ ප්‍රධාන ගණකාධිකාරී ආර්.ඒ.යූ. රණවීර පැවසුවේ මේ වැඩසටහන මොරටු විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා 2019 දී ආරම්භ කළ බවයි.

"අලුත් වැඩපිළිවෙළ යටතේ මේ ණය මුදල ලබාදෙන සැමට මුලින් ම වසර 4 ක් යන තුරු ගෙවන්න වෙන්නේ පොලිය පමණයි. අපේ රටේ සිසුන් 5000 කට මහපොළ ශිෂ්‍යාධාර ලැබෙනවා. තවත් 4000 කට ශිෂ්‍යාධාර ලැබෙනවා. ඒ අනුව රුපියල් 500 ක් පමණ වන මේ ලැප්ටොප් ණය මුදලට අදාළ පොලිය කරදරයක් නැතිව ගෙවීම අපේ විශ්වවිද්‍යාල සිසු පරපුරට අවස්ථාව ලැබෙනවා. ඒ අයට සම්පූර්ණ ණය මුදල ගෙවන්න වෙන්නේ ස්ථිර රැකියාවක් ලැබුණාට පස්සෙයි" ගණකාධිකාරී ආර්.ඒ.යූ. රණවීර පවසයි. ඒ අනුව මේ වැඩපිළිවෙළ මෙරට සරසවි සිසුන්ගේ අනාගතය සවිමත් කරන ශක්තිමත් අත්වැලක් ලෙස අපට හැඳින්විය හැකි ය.

කෙරවළපිටියේ ඉදිකළ ශ්‍රී ලංකාවේ පළමු ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සුරතින් පසුගියදා විවෘත විය. ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 10 ක විදුලියක් ජනනය කරන කෙරවළපිටිය ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරය මඟින් දිනකට නාගරික ඝන අපද්‍රව්‍ය ටොන් 600 - 800 ත් අතර ප්‍රමාණයක් දහනය කිරීමට නියමිතය. කොළඹ නගරයේ නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා මෙමඟින් ස්ථිරසාර විසඳුමක් නිර්මාණය වේ. එසේම පුනර්ජනනීය බලශක්තිය උත්පාදනය සඳහා මෙම ව්‍යාපෘතිය තිරසර විසඳුමකි. කොළඹ නගර සභාව, එයිටිකන් ස්පෙන්ස් සමාගම සහ ලංකා විදුලි බල මණ්ඩලය ඒකාබද්ධව මෙම ව්‍යාපෘතියට දායක වී තිබේ.

එහිදී විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම මහතා කළ කතාවයි මේ.

පළාත් නවයටම අපද්‍රව්‍යවලින් විදුලි බලාගාර 9ක් හදනවා

ප්‍රථම ඝන අපද්‍රව්‍ය බලාගාරය ජනගත කිරීමේ උලෙළේදී විදුලි බල ඇමැති ඩලස් අලහප්පෙරුම කියයි

ශ්‍රී ලංකාවේ පළමු ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරය අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන් අතින් විවෘත වූ අවස්ථාව. විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම, පරිසර ඇමැති මහින්ද අමරවීර සහ කොළඹ පුරපතිනි රෝසි සේනානායක ද මෙහි වෙති.

නව ශතවර්ෂයට, නව ලෝකයට, සමාන්තරව රටක් ලෙසට අප යන මේ ප්‍රගතිශීලි ගමනේ තවත් ඉදිරි පියවරක් ලෙසට අද මහින්ද රාජපක්ෂ අගමැතිඳු සුරතින් මේ ආරම්භ කළ ජාතියේ මංගල ඝන කසළ භාවිතයෙන් විදුලිය උත්පාදන බලාගාරය ඉතිහාසයට එකතු වෙනවා.

අප මොහොතකට සිතුවොත්, මෙම විසිඑක්වන ශතවර්ෂය, 3 වන සහස්‍රය ආරම්භ කරන මොහොතේ අප ජලයෙන් සහ පොසිල ඉන්ධන දහනයෙන් පමණක් විදුලිය උත්පාදනය කළ රටක්. නමුත් වසර විස්සක් ගෙවුණු තැන අප ගල්අඟුරු භාවිතයෙන්, දැවීකරණය කළ ස්වාභාවික වායු භාවිතයෙන්, විතරක් නොවෙයි පරිසර හිතකාමී පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයන් වන සූර්යාලෝකයෙන්, සුළං බලයෙන් සහ ජීව වායුවෙන් ද විදුලිය උත්පාදනය කරන තැනකට පැමිණ සිටිනවා.

මෙම ප්‍රවණතාව, මිහිකතට වගකියන, මිහිකතට කෘතවේදී, මිහිකතට ප්‍රතූපකාරී රටක්, ජාතියක් ලෙසට අපි අභිමානයෙන් ඉදිරියට තැබූ දැවැන්ත පියවරක් ලෙසටයි මා දකින්නේ. එය දියුණු වෙමින් පවතින රටකට, දුෂ්කරතා මැද වුවද අනුගමනය කළ හැකි ඉතාමත්ම ප්‍රගතිශීලී ඉදිරි පියවර එකින් එක තබමින් අප බලශක්ති උත්පාදනයෙන් ධනාත්මක දිශානතියකට ගමන් කරන ලකුණු පහළ කර ඇතැයි යන්න මා දැඩි ලෙස විශ්වාස කරනවා.

මෙගා වොට් 10 ක් ජාතික විදුලිබල පද්ධතියට

මිනිසුන් වන අප මිහිකතගේ දරුවෝ. 2020 වසර මුළු ලෝකයටම ස්වභාවධර්මය, මානව ප්‍රගමනය, මානව උන්නතියේ තිරසාරභාවය පිළිබඳව පරම්පරා ගණනකට අමතක නොවන පාඩමක් ඉගැන්වූවා. විශ්වීය මාරයෙකුගේ වෙසින් පැමිණි ව්‍යාධියක්, අපව මිහිකතගේ දරුවන් ලෙසට ප්‍රත්‍යාවලෝකනයක යෙදෙන්නට පෙලඹුවා. එහි ප්‍රතිඵලයක් ලෙස පෘතග්ජන මිනිසුන් ලෙසට හිමිකම් වෙනුවෙන් පමණක් වෙහෙසුනු අපට මිහිකතගේ දරුවන් ලෙසට ඒ හා සමානව යුතුකම් ද ඇති බව ප්‍රත්‍යක්ෂ කළා. එහි ප්‍රතිඵලයක් ලෙස පෘතග්ජන මිනිසුන් ලෙසට හිමිකම් වෙනුවෙන් පමණක් වෙහෙසුනු අපට මිහිකතගේ දරුවන් ලෙසට ඒ හා සමානව යුතුකම් ද ඇති බව ප්‍රත්‍යක්ෂ කළා. එය පොදුවේ අප සැමටම වරදකාරී හෘදය සාක්ෂියක් ඇති කළා යැයි පැවසුවොත් නිවැරදියි. එහි විපාකයක් ලෙසට හෝ මිහිකතට අප ඉටුකළ යුතු යුතුකම් පිළිබඳව සංවේදනීයතාවක් අප තුළ ඇති වුණා නම්, එය මානව වර්ගයාගේම මතු පැවැත්ම ගැන සැලකූ විට භාග්‍යයක්. මන්ද, අපි තවම පරක්කු නැහැ. හැබැයි අපිට තව වැඩි වෙලාවකුත් නැහැ. බාලගිරි දෝෂය අද නෙවෙයි හෙට යනුවෙන් බෝඩ් ලැල්ලක් එල්ලා අනාගත උවදුරින් ගැලවීමට අපට තවදුරටත් බැහැ.

අන්න ඒ හේතුව නිසාමයි අපගේ පාරිභෝජනය වෙනුවෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය කිරීම වැදගත් වන්නේ. එහි වැදගත්කම ඉතාමත් පැහැදිලි ලෙස අවබෝධ කරගත් නිසයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා තමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන සෞභාග්‍යයේ දැක්මට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීමේ ඉලක්කයන් ඇතුළත් කළේ. එය හුදෙක් ප්‍රකාශනයකට සීමා නොකොට ක්‍රියාත්මක කිරීම සඳහා ඒ වෙනුවෙන්ම විශේෂිත රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටවූයේත් එම නිසාමයි. මෙම රජය පත්වී වසරක කාලයක් තුළදී, අනපේක්ෂිත වාගේම පෙර නොවූ විරූ ස්වභාවයේ දැවැන්ත අභියෝගයක් මැද්දේ වුවද, එම ඉලක්කයන් සපුරා ගැනීමේ දිගු ගමනේ සමාරම්භක පියවර එකිනෙක ඉදිරියට තැබීම, විශාල ජයග්‍රහණයක් ලෙසට අප අවිවාදයෙන් පිළිගත යුතුයි. එමෙන්ම, මේ ව්‍යාපෘතිය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා කැප වූ මාගේ පූර්වගාමී අමාත්‍යවරුන්ට ද සියලුම දේශපාලන පක්ෂ වෙත ද නිලධාරීන් වෙත ද පෞද්ගලික අංශය වෙත ද විශේෂයෙන්, තම ලාභාංශවලට වඩා ඉහළින් ජාතික අවශ්‍යතාවයට ගරුත්වයක් ලබාදුන් ලංකා විදුලිබල මණ්ඩලයටCEB) රාජ්‍යයේ ගෞරව ප්‍රණාමය හිමිවිය යුතුවේ.

වැඩිවන ජනගහනයත්, පාරිභෝජනයත් හේතුවෙන් ඇතිවන බලශක්ති අවශ්‍යතාව සපුරා ගැනීමට රටක් ලෙසට අප ඉදිරියෙහි ඇති විශාල අභියෝගයක්, බලශක්තියෙන් ස්වයංපෝෂිත රටක් බිහිකිරීමට අපට රටක් ලෙසට හැකි හැම බලශක්ති ප්‍රභේදයක්ම භාවිතා කිරීමටත්, ඒ අතරින් විශේෂයෙන්ම පරිසර හිතකාමී ප්‍රභේදයන් ප්‍රවර්ධනය කරමින් ඒවා බහුලව යොදා ගනිමින් රටේ විදුලිය උත්පාදනය කරන තැනට අප යායුතුමයි.

එම නිසා කුමන අභියෝගාත්මක තත්වයන් තුළ වුවද, පොසිල ඉන්ධන භාවිතයෙන් විදුලිය ජනනය කිරීම මුළුමනින්ම නැවැත්වීමටත්, ගල්අඟුරු භාවිතයෙන් විදුලිය ජනනය අවම කිරීමටත් අප ප්‍රායෝගිකව ගතහැකි සියලුම ක්‍රියාමාර්ග, කොන්දේසි විරහිතව ක්‍රියාත්මක කිරීමට එකඟතාවයකට පැමිණිය යුතුමයි. නැතිනම් අපට සෞභාග්‍යමත් අනාගතයක් යන්න තවදුරටත් සිහිනයකට පමණක් සීමා වෙනවා. මෙය තමයි සරල සත්‍යය.

අගනගරය කසළ නැති නගරයක් බවට පත්කරනවා

අපද්‍රව්‍ය භාවිතයෙන් විදුලිය ජනනය කිරීම යන සංකල්පය අපේ සමාජයට නුපුරුදු, නුහුරු ක්‍රියාවලියක් වන්නට පුළුවන්. අපද්‍රව්‍ය ප්‍රභේදයන් විවිධාකාර වනවා. නාගරික ඝන අපද්‍රව්‍ය, ජෛව භායනය වූ අපද්‍රව්‍ය, උපද්‍රවකාරී අපද්‍රව්‍ය, කර්මාන්ත අපද්‍රව්‍ය, ඉදිකිරීම් අපද්‍රව්‍ය, ඉලෙක්ට්‍රොනික් සහ රසායනික අපද්‍රව්‍ය වශයෙන් ඒවා වර්ගීකරණයට ලක්වනවා. මෙතැනදී අපට වැදගත් වන්නේ නාගරික ඝන අපද්‍රව්‍යයයි.

එය නම් අපේ සමාජයට නුහුරු දෙයක් නොවෙයි. ඉතාමත්ම සමීප, කටුක අමිහිරි අප්‍රසන්න අත්දැකීමක් තමයි මෙම නාගරික ඝන අපද්‍රව්‍ය. කොළඹ නගරයක් ලෙසට දීර්ඝකාලීනව මුහුණ දෙන දැවැන්තම ගැටලුවක් තමයි මේ දිනකට ටොන් දහස් ගණනින් එකතු වන නාගරික ඝන අපද්‍රව්‍ය ගොන්න. අද මේ විවෘත කරන විදුලි ජනන බලාගාරය ක්‍රියාත්මක වන්නේ එම නාගරික ඝන අපද්‍රව්‍ය භාවිතයෙන්. ලෝකයේ නම්, නාගරික ඝන අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්තිය උත්පාදනය සාපේක්ෂව අලුත් දෙයක් නොවෙයි. නමුත් එම ක්‍රියාවලිය පරිණාමයට ලක්වී ලොව දියුණු රටවල් පරිසරයට මුදාහරින අහිතකර බලපෑම් අවම කරමින් එය ක්‍රියාත්මක කරන්නට සමත් වී තිබෙනවා. අප රටක් ලෙසට පුරවැසියන් ලෙසට මෙහි වැදගත්කම අවබෝධ කරගත යුතුමයි. නාගරික ඝන අපද්‍රව්‍ය භාවිතයෙන් ක්‍රියාත්මක වන මෙම බලාගාරයට විදුලිය ජනනය කිරීම පමණක් නොවෙයි කොළඹ නගරයේ කසළ ප්‍රශ්නයට ද සාධනීය විසඳුමක් ලබා දෙන්නට හැකියාවක් තිබෙනවා. එය මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට අපට ලබාදෙන දිරිගැන්වීමක්. ගෝඨාභය රාජපක්ෂ ජනපතිඳුන්ගේ දිගුකාලීන සංකල්පය වූ අගනුවර "ශූන්‍ය අපද්‍රව්‍ය නගරයක්" (Zero Waste City) බවට පත්කිරීම නුදුරේදීම යථාර්ථයක් වනු නොඅනුමානය. තැබුවේ එහි පළමු පියවරයි.

මෙහි තවත් වටිනාම කරුණක් වන්නේ මෙම ව්‍යාපෘතියට මධ්‍යම රජය, පෞද්ගලික සමාගම් සහ පළාත් පාලන ආයතන යන අංශ ත්‍රිත්වයම අත්වැල් බැඳගැනීමයි. විශේෂයෙන් ප්‍රතිවිරුද්ධ මත දරන දේශපාලන පක්ෂ හා නායකයන් එම සම්ප්‍රදායික "එරෙහි" මතවාදයෙන් බැහැරව ජාතික අභිලාෂයන් ඉදිරිපිට එක්වීමයි. එය අගය කළයුතු ප්‍රවණතාවක්. රටට හොඳ දෙයක් කරන්නට අප වෙන්විය යුතු නැහැ. පිල් බෙදිය යුතු නැහැ. මන්ද අවසානයේ අප සියලු දෙනාම පුරවැසියන් ලෙසට එම යහපත් ක්‍රියාවන්වල ප්‍රතිඵල භුක්ති විඳින නිසා. රටට හොඳක් කරන්නට අපට එකතු විය හැකියි. එකතු විය යුතුයි කියන වැදගත් වටිනා පූර්වාදර්ශය මෙම ව්‍යාපෘතිය ආරම්භයත් සමඟ අප ජාතියට කියා දී තිබෙනවා.

සෞභාග්‍යයේ දැක්මෙන් පුනර්ජනනීය බලශක්තියට ප්‍රමුඛත්වය

ලොව බිහිවූ විශිෂ්ටතම නවෝත්පාදකයෙකු, කර්මාන්තකරුවෙකු වූ හෙන්රි ෆෝඩ් වරක් මෙහෙම කියා තිබුණා. "ප්‍රයෝජනයක් නොවන යම් දෙයක් වේද, එය අපද්‍රව්‍යයකි, කියලා" ඉතින් අපි අපද්‍රව්‍යයෙනුත් ප්‍රයෝජනයක් ගත්තොත්, එය තවදුරටත් අපද්‍රව්‍ය කියා අපට කිව හැකි ද? එසේ නොකිය හැකි තැනට යන්නට මේ පියවරම ඇරඹුමක් කර ගනිමු. රටක් ලෙසට දිනමු.

විදුලිබල අමාත්‍යාංශය, පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යාංශය, නාගරික සංවර්ධන හා අපද්‍රව්‍ය කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය, පාරිසරික අමාත්‍යාංශය සහ පළාත් පාලන හා පළාත් සභා රාජ්‍ය අමාත්‍යාංශය මෙම ජාතික අවශ්‍යතාවය වෙනුවෙන් එක්ව, එක අරමුණකින් සහ සෞභාග්‍යයේ දැක්මෙන් කටයුතු කිරීමට දැනටමත් එකඟවී ඇත. පළාත් මට්ටමින් කුඩා ප්‍රමාණයේ අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ (WTE) බලාගාර නවයක් අරඹා දශක ගණනාවක් මෙරට දේශපාලන ශබ්දකෝෂය අරක්ගෙන සිටි "කුණු කතාවන්ට" නැවතීමේ ලකුණ තැබීම තවත් වසරකට හෝ ප්‍රමාද කළ යුතු නොවේ.

‘කොමියුනිස්ට් ප්‍රකාශනය’ අදටත් වලංගුද?

පෙබරවාරි 21 වැනිදා 173 වැනි විය සපුරන විද්‍යාත්මක සමාජවාදයේ ප්‍රථම සටන් මඟ කොමියුනිස්ට් ප්‍රකාශනය පිළිබඳ විද්වත් විග්‍රහයක්



• හර්ෂා සුගතදාස

වමේ සිට ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් ඩිවි ගුණසේකර, කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශ ප්‍රධානි මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි, ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.ඩී. ලාල්කාන්ත, පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව.

කොමියුනිස්ට් පක්ෂය මිලියනයක් ප්‍රථම සටන් මඟ පෙන්වන ලියැවිල්ල වන්නේ ‘කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයයි. මෙය කොමියුනිස්ට්වාදයේ සංයුක්ත කොටස් තුන වූ දර්ශනවාදය, දේශපාලන ආර්ථික විද්‍යාව සහ සමාජවාදය විස්තර කෙරෙන සංක්ෂිප්ත පූර්ණ මූලධර්ම සහිත ක්‍රමික විස්තරයකි. කොමියුනිස්ට් ප්‍රකාශනය ලියනු ලැබුවේ කාල් මාක්ස් - ෆ්‍රෙඩ්රික් එංගල්ස් විසිනි. ඔවුන් දෙදෙනාට මෙම කාර්යය පවරනු ලැබුවේ 1847 නොවැම්බර් මස පැවැති කොමියුනිස්ට්වරුන්ගේ සංගමයේ දෙවැනි සමුළුවේදී ය. ඊට හේතු වූයේ ඒ වනවිට යුරෝපයේ වර්ධනය වෙමින් පැවැති කොමියුනිස්ට් ව්‍යාපාරයේ සාමාජිකයන් අනාගතයේදී ඇතිවන දේශපාලන සටන්වලට නායිකා හා දේශපාලන වශයෙන් සූදානම් කිරීම ඉතා වැදගත් කාර්ය භාරයක් ලෙස ඔවුන් සැලකීමයි.

1847 දෙසැම්බර් මාසයේ ‘කොමියුනිස්ට් ප්‍රකාශනය’ රචනා කිරීම ඇරඹුණු අතර 1848 ජනවාරි මාසයේ අවසාන වනවිට ලියා අවසන් කර ඇත. මෙය ප්‍රකාශයට පත් කර තිබෙන්නේ 1848 පෙබරවාරි 21 වැනිදා ය. හරියටම අදින් වසර 173 කට පෙරය. මෙය කාල්මාක්ස් සහ එංගල්ස්ගේ නායිකා හා දේශපාලනික වශයෙන් ලැබූ අතිවිශාල ජයග්‍රහණයක් ලෙස සැලකේ.

“ඔය කාලේ මහද්විපික යුරෝපයේ කම්කරුවන්ගේ නැඟිටීම් තිබුණා. ජනතා කම්කරු ව්‍යාපාරයේ නැඟිටීම් එක්කයි කොමියුනිස්ට්වාදය ඇති වුණේ. ඒ ව්‍යාපාරය ඉදිරියට ගෙනයෑම සඳහා ඉදිරිපත් කළ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය තමයි මාක්ස් - එංගල්ස් ලියා පළ කළේ. ලෝකයේ ඉඩම් හිමිකාරිත්වය සහ දරිද්‍රතාව ඇති වනවිට සමානාත්මතාව ගැන දිගටම කතා කළා. එයට වටිනාකමක් ලැබුණා. ඒ නිසා මාක්ස්වාදය ප්‍රචලිත වුණා” යනුවෙන් සඳහන් කළේ කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශ ප්‍රධානි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරිය.

• ලෙනින්ගේ න්‍යාය

න්‍යායක් ලෙස පැවති මාක්ස්වාදය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවූයේ වී.අයි. ලෙනින් විසිනි. ඒ, 1917 දී රුසියාවේ සිදුවූ ඔක්තෝබර් විප්ලවයෙනි.

ඉන් අනතුරුව රුසියාව, සෝවියට් සමූහාණ්ඩුව බවට පත් විය. 2 වැනි ලෝක යුද්ධය අවසාන වනවිට නැඟෙනහිර යුරෝපයේ සමාජවාදී කඳවුර බවට පත් වී තිබුණේ සෝවියට් දේශයයි. ලෙනින් දේශපාලනමය වශයෙන් මාක්ස්වාදියකු වූ අතර ඔහු ඉදිරිපත් කළ සමහර න්‍යායන් හැඳින්වූයේ ලෙනින්වාදය ලෙසිනි.

මාක්ස් - ලෙනින්වාදය, සමාජවාදය සාක්ෂාත් කරගැනීම සහ කොමියුනිස්ට් සමාජයක් කරා ඉදිරියට යෑමේ නිල අරමුණ ඇතිව ක්‍රියා කෙරිණි. කොමියුනිස්ට් ජයග්‍රහණයක් ලද චීන මහජන සමූහාණ්ඩුව කොමියුනිස්ට් රාජ්‍යයක් ස්ථාපිත කළේ 1949 දීය.

එහෙත් අද වනවිට නැඟෙනහිර යුරෝපයේ සමාජවාදී බළකඳවුර වූ සෝවියට් දේශය බිඳ වැටී ධනවාදී රටක් බවට යළි පරිවර්තනය වී තිබේ. ඒ 1991 දී එරට ජනාධිපතිව සිටි මිහයිල් ගොර්බචෝව්ගේ පෙරෙස්තොයිකා ගිවිසුමත් සමඟිනි. ඉන්පසුව සෝවියට් දේශය නැවතත් රුසියාව ලෙස හඳුන්වනු ලැබීය. අද වනවිට කොමියුනිස්ට්වාදය ක්‍රියාත්මක වන රටවල් තිබෙන්නේ අල්ප වශයෙනි. චීනය, කියුබාව, උතුරු කොරියාව, වියට්නාමය, ලාඕසය ඊට නිදසුන් කිපයකි. වසර 173 කට පෙර කාල්මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස් ප්‍රකාශයට පත් කළ කොමියුනිස්ට් න්‍යාය සහ එහි වැදගත්කම පිළිබඳව වර්තමානයේ අගය කළ හැකි වෙන්නේ ලෝකයේ ඇතිවූ වර්ධනයත් සමඟ සසඳා බැලීමෙන් අනතුරුවය.

• ධනපති සූරා කෑම

“ලෝකය ක්‍රියාත්මක වෙන්නේ ප්‍රාග්ධනය මත. ඒ නිසාම ලෝක ආර්ථිකය පාලනය කරන්නේ කොම්පැනිකාරයෝ. ප්‍රාග්ධනය නිසා ඇතිවන ධනපති පන්තිය හේතුවෙන් සූරාකෑම ඇතිවෙනවා. ඒ නිසා ධනපති පන්තිය සහ නිර්ධන පන්තිය බිහිවෙනවා. නිර්ධන පන්තිය තුළින් මාක්ස්වාදය, සමාජවාදී ක්‍රමය ඇති වෙනවා. මේ විදිහට තමයි මාක්ස්වාදී න්‍යායේ සඳහන් වෙන්නේ. යටත්විජිත රටවල් නිදහස ලබා ගැනීම, කාර්මික විප්ලවය ඇති වීම, ලෝක ආර්ථිකය ගෝලීයකරණය වීම වැනි හේතු මත ධනවාදය ලෝකයේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වුණා. ඒ වුණත් මාක්ස්වාදය අදටත් වලංගුයි. ඒ ක්‍රමයට ගමන් කළා නම් රටක ආදායම් සහ සම්පත් බෙදී යෑමේ විසමතාව අවම මට්ටමක තබා ගනිමින් සංවර්ධනය කරා ළඟා වෙන්න තිබුණා.

අදටත් භුක්ති විඳින පැය අටේ සේවය බිහි වුණේ වැඩ කරන ජනතාවගෙන් බිහිවුණ කොමියුනිස්ට්වාදය නිසා. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය කොමියුනිස්ට් ක්‍රමයෙන් බිහිවුණු දේවල්. ඒ දේවල්වලින් සමාජයේ හැමෝටම යහපතක් සිද්ධ වුණා මිසක් අයහපතක් සිද්ධ වුණේ නැහැ. සමාජවාදය ක්‍රියාත්මක වන වියට්නාමය, ලාඕසය කොවිඩ් වසංගතය සාර්ථකව පාලනය කළේ ඔවුන්ගේ ක්‍රමය නිසා. ධනවාදය ඉහළින් ම තිබෙන රටවල්වලට එය තවමත් පාලනය කර ගන්න බැරිව ඉන්නවා. ඉතින් මාක්ස්වාදී න්‍යාය අනුව බිහිවුණු සමාජවාදය, තවමත් වලංගුයි.” යනුවෙන් පැවසුවේ ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් ඩිවි ගුණසේකරය.

කොමියුනිස්ට්වාදය හොඳ නැහැ, රටකට ගැළපෙන්නේ නැහැ කියලා කියන්න බැහැ. ඒකට හොඳම උදාහරණය තමයි චීනය

• අපේ කොමියුනිස්ට් පක්ෂයේ කැලඹීම

එහෙත් මාක්ස් - ලෙනින්වාදය පසුකලෙක මතවාදී වෙනස්කම් අනුව ස්ථාවර්ථ දේශයේ කොමියුනිස්ට්වාදය බිඳ වැටුණාට කොමියුනිස්ට්වාදය හොඳ නැහැ, රටකට ගැළපෙන්නේ නැහැ කියලා කියන්න බැහැ. ඒකට හොඳම උදාහරණය තමයි චීනය.” යනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.ඩී. ලාල්කාන්ත පැවසීය.

• කම්කරු අරගල හා පීඩිත කම්කරුවෝ

මාක්ස් - ලෙනින්වාදයට අදටත් ගරු කරන ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.ඩී. ලාල්කාන්ත අද දවසේ අපේ රට තුළ සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය වශයෙන් ඇති දේශපාලන පක්ෂ තුළ සැබෑ මාක්ස්වාදය නොමැති බවත් එම පක්ෂ ජාතික ධනපති පංතියට අයත් බවත් ඔහු සඳහන් කළේය.

ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ හිටපු ප්‍රධාන ලේකම් ඩිවි ගුණසේකර පැවසුවේ ලංකාව තුළ කොමියුනිස්ට්වාදය ස්ථාපිත කළ නොහැක්කේ දැවැන්ත කම්කරු අරගලයක් කිරීමට තරම් පීඩිත කම්කරුවන් මෙරට ප්‍රමාණාත්මකව නොමැති නිසාය.

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයන අංශ ප්‍රධානි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි සඳහන් කළේ කොමියුනිස්ට්වාදය යන අදහසට වර්තමානයේ පුළුල් අර්ථයක් ඇතිවී තිබෙන බවය.

“Community කියන වචනයේ තේරුම සාමූහිකත්වය. පොදු ඕනෑ එපාකම් මත එක්වූ සමූහය. පොදු අදහසක් දරන කණ්ඩායම. ප්‍රජාවගේ සාමූහිකත්වය, සමානත්මතාව යන අදහසට නය යාවත්කාලීන විය යුතු ද නැතිද යන කාරණය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය.

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ ප්‍රචාරක ලේකම් දුමින්ද නාගමුව පැවසුවේ මාක්ස් - එංගල්ස් රචනා කළ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය එදාටත් වඩා වලංගු වන්නේ අද දවසට බවය.

ඊට හේතුව ලෝක තත්ත්වයන්ට අනුව යාවත්කාලීන වුව ද සියලුම කොමියුනිස්ට් පක්ෂවල මූලික පදනම වී තිබෙන්නේ මෙම ප්‍රකාශනය වන බැවිනි.

පුවත්පත් නියෝජිත සුබ සාධන සමිතියක් ආරම්භය ....

දිවයින පුරා විසිරී සිටින පුවත්පත් නියෝජිතයින්ගේ සුබ සාධනය සහ අන්‍යෝන්‍ය වශයෙන් හඳුනා ගැනීමේ අරමුණින් සුහද එකමුතුවක් ඇති කිරීම මෙහි අරමුණයි.

ඔබ මේ සඳහා උනන්දුවක් දක්වන නියෝජිත මහත්ම, මහත්මියක් නම් පහත අංකයන්ට අමතන්න. ඉදිරි දිනකදී හමුවී අපි අපිම හඳුනා ගනිමු !

077-7327504
චන්දන මුණසිංහ
ගාල්ල-පුවත්පත් නියෝජිත

071-6006472
මානෙල් වීරසිංහ
අම්බලන්ගොඩ - පුවත්පත් නියෝජිත

ගබඩා පහසුකම් අවශ්‍යව ඇත

සීදුව සහ ඒ අවටින් කොළඹ-මීගමුව ප්‍රධාන මාර්ගයට සමීපව වර්ග අඩි 30,000 - 40,000 ප්‍රමාණයේ ගබඩා පහසුකම් අවශ්‍යව ඇත.

ගබඩා පරිශ්‍රය ආරක්ෂක තාප්පයකින් වට වී තිබිය යුතු අතර තෙකලා විදුලිය සැපයුම සහ නිසි සනීපාරක්ෂක පහසුකම් තිබිය යුතුයි.

අඩි 40 කන්ටේනර් රථ හැසිරවීමට හැකි විය යුතුයි.

අමතන්න - 0701 603 336

අනගි ව්‍යාපාරික අවස්ථාවක්

නුගේගොඩ නගරයට ආසන්නයේ මෙල්ඩර් පාරේ
අඩි 2600 ක විශාල කාමර 6 ක් සමග විශාල නිවසක්
බැංකුවකට / කාර්යාලයකට / ආපතශාලාවකට හෝ ළදරු පාසැලකට කුලියට හෝ බදුදීමට තිබේ.
(40m away from High Level Road)
විමසන්න : 0704042772, 0722948774

2021-2030 නිපුණතා සංවර්ධන දශකය

රට හදන සෞභාග්‍යයේ දැක්ම

අතිගරු ජනාධිපතිතුමාගේ අභිලාශය සාක්ෂාත් කරනු පිණිස
සියලු ශ්‍රී ලාංකිකයන් තුළ අභිමානය ඇතිකරන සහ ජාතියේ සංවර්ධනයට උර දෙන මානව සම්පත් බිහි කිරීම සඳහා වූ

නිපුණතාවයෙන් පිරි ශ්‍රම බලකායක්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය හා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිඳුන්ගේ අනුශාසකත්වයෙන්, ග්‍රාමීය නිවාස සහ ඉඳිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ඉන්දික අනුරුද්ධ මැතිතුමන්ගේ උපදෙස් මත සහ තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමන් හා සබැඳි ව ක්‍රියාත්මක

නිපුණතා පිරි ඉඳිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන - 2021

“ශ්‍රම සිකුරු”

අඩු ආදායම්ලාභී පවුල්වල වයස අවු. 18-45 දක්වා සහ තරුණ තරුණියන් සඳහා ද මහඟු රැකියා පුහුණු අවස්ථාවක්

වඩු කාර්මික ශිල්පය, පෙදරේරු ශිල්පය, කම්බි නැවුම් ශිල්පය, ටයිල් ඇතුරුම් ශිල්පය සහ ජලනල කාර්මික ශිල්පය යන ක්ෂේත්‍ර සඳහා වැඩබිම් පුහුණුව

- වැඩබිම් පුහුණුව, නිල ඇඳුම් කට්ටල 2ක් සමග මාස 3 කට රු. 30,000/- ක දිරි දීමනාවක්
- වැඩබිම් පුහුණුවට අවශ්‍ය අත්පොත් සහ මෙවලම් සඳහා රු. 5,000/- ක දිරි දීමනාවක්
- දෙස් විදෙස් පිළිගත් CIDA සහතිකයත් සමග ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයක් (NVQ)

2021 මාර්තු 15ට පෙර අයදුම් කිරීම සඳහා

අයදුම්පත් පහත වෙබ් ලිපිනයෙන් හෝ දිස්ත්‍රික් සම්බන්ධීකාරක වෙතින් ලබාගත හැකිය

"සවිසිරිපාය", විජේරාම මාවත, කොළඹ 07,
දු.අ. :011-2695965 / 2699801 / 2686092 / ෆැක්ස් : 011 2699737
Mobile : 070 2731995 / Email : cidatraining@gmail.com / Web site : www.cida.gov.lk

ඉඳිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
ග්‍රාමීය නිවාස සහ ඉඳිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

සිළුමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2021ක් වූ පෙබරවාරි මස 21 වැනිදා ඉරිදා

ප්‍රෞඪ ඉතිහාසයක උරුමය සොයා යෑම

අතීත මානව වර්ගයාගේ පැවැත්ම හා ක්‍රියාකාරකම් ගැන හා අතීත ස්මරණීය සාධක පිළිබඳව අතීතයෙන් දැල්වෙන ගිනිපුළිඟුව වන්නේ පුරාවිද්‍යාවයි. ප්‍රෞඪත්වය, උරුමය පිළිබඳ කතිකාව ගොඩනැඟෙන්නේ මෙකී සන්දර්භ මත පිහිටමිනි. ලෝකයේ අංක එකේ බලවතා ලෙස ලෝකයම සිය ආධිපත්‍යයට නතු කරගෙන සිටින ඇමෙරිකාවට පවා දිගුකාලීන ඓතිහාසික හා ප්‍රෞඪ ඉතිහාසයක් හිමි නැත. නූතන ඇමෙරිකාව ඓතිහාසික වටිනාකම් පිළිබඳ බලවත් උනන්දුවක් දක්වන බැව් පසුගිය කාලයේ නිරීක්ෂණය විණි. එකරුණ සනාථ වීමට බලපෑම් කළ ප්‍රධානම සාධකයක් ලෙස දැක්විය හැක්කේ; ඇමෙරිකන් ප්‍රකාශන සමාගම් ඓතිහාසික නවකතාවලට වාර්ෂිකව ඇගයීමක් කිරීමය. කෙතරම් බලවත් වුවත් ඓතිහාසික තත්ත්ව කෙරේ වන බලවත් උනන්දුව මෙයින් පැහැදිලි වේ. එනයින් බලන කල අප වැනි ඓතිහාසික ප්‍රෞඪත්වයෙන් අනූන රටවල් කෙරේ ඔවුන්ගේ බැල්ම මෙතරම් වැඩි ඇයිද යන්න පැහැදිලි ය.

සංස්කෘතික උරුමය ඇතුළත ජාතික අනන්‍යතාව හා පෞරුෂත්වය තිබීම මේ වටිනාකමට හේතුවයි. ස්වභාවික උරුම යනු සොබාදහම විසින් නිර්මාණය කරනු ලබන වස්තු ය. ඒවා රැකගැනීම සොබාදහම රැක ගැනීමක් වන්නේ ඒ නිසා ය.

එක්සත් ජාතීන්ගේ යුනෙස්කෝව මඟින් ලංකාවේ ද පුරාවිද්‍යාත්මක ලෝක උරුම නම්කොට තිබේ. ඒ අනුරාධපුරය, සීගිරිය, පොළොන්නරුව, මහනුවර, දඹුල්ල (මෙහි සංස්කෘතික උරුම හා ස්වභාවික උරුම; දෙකක් සේ සැලකේ), ගාලු කොටුව හා සිංහරාජ වනාන්තරයයි. ලෝක උරුමයක් නම් කරන්නේ 1972 යුනෙස්කෝ ප්‍රඥප්තියේ ලෝක උරුමයන්ගේ පැවැත්ම හා සැබැඳි නීතිමය ආරක්ෂක රාමුව ඇතුළත ය. ලෝක උරුමයක් නම් කිරීමේදී නිර්ණායක දහයක් පිළිබඳ සලකා බලන අතර; අද්විතීය ගුණය, නැවත නිර්මාණය කළ නොහැකි ගුණය, යථාරූපී ගුණය, රූපමය ගුණය ආදී කරුණු මෙහිදී පදනම් කරගනී. දැනට ලෝක උරුම ලෙස පුරාවිද්‍යාත්මක බිම්කඩවල් 890 ක් නම්කොට ඇති අතර, ඉන් 689 ක් සංස්කෘතික උරුම ය; 176 ක් ස්වාභාවික උරුම ය; 25 ක් සංයුක්ත උරුම ය.

මේ වැනි වටිනාකමකින් යුතු පුරාවිද්‍යාත්මක උරුම අතරට අපේ උරුම නම් වී තිබුණ ද අපේ පුරාවස්තු ගැන දිනෙන් අපට අසන්නට ලැබෙන ප්‍රවෘත්ති නම් එතරම් සුබදායක නොවේ.

පුරාවස්තු හා කෞතුක වස්තු කොල්ල කෑම, ස්මාරක විනාශ කිරීම, අවිධිමත් ඉදිකිරීම්, සංවිධානාත්මකව සිදුවන පුරාවස්තු ජාවාරම්, අවිධිමත් සංරක්ෂණ ක්‍රියාදාම, දේශපාලන ක්‍රියාකාරකම්, පුරාවිද්‍යා ක්ෂේත්‍ර භූමි ඇතුළත අනවසර පදිංචි වීම්, පුරාවිද්‍යා ස්මාරක සහ ස්ථාන හුදකලා වීම හා වල්වැදීම, ආර්ථික ක්‍රියාකාරකම්හි අවිධිමත් බව, මිථ්‍යා මත හා ආගමික විශ්වාස යන හේතු නිසා අපේ පුරාවිද්‍යාත්මක උරුම දිනෙන් දින විනාශ වෙමින් පවතී. ලෝක උරුම සේම අවශේෂ තවත් බොහෝ පුරාවිද්‍යා උරුම විනාශයේ දොරකඩට ගමන් කරමින් සිටින්නේ මෙවන් පසුබිමක ය.

පුරාවස්තු වැනසීමේ ක්‍රියාවලිය පිළිබඳ බෙහෙවින් ආන්දෝලනාත්මක කරුණක් පසුගියදා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග දේශනයකදී හෙළි කළේය. මේ තනතුරට පත් වීමෙන් අනතුරුව පුරාවස්තු විනාශ කිරීම් පිළිබඳ නඩු ලිපි ලේඛන දහයකට පමණ එක් දිනකදී අත්සන් කිරීමට සිදු වී ඇති බව හෙතෙම කියයි. නොසිතන තරම් වේගයකින් පුරාවස්තු විනාශ වෙමින් පවතින බවත්; ඒවා ආරක්ෂා කරගැනීමට මූලිකත්වය දිය යුතුව ඇති බවත් ඔහු එහිදී අවධාරණය කළේ ය. තමා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත්වන තුරුත් මේ තත්ත්වය හරිහැටි හඳුනා ගෙන නොසිටි බව මහාචාර්යවරයා පැවසීය. මීට පෙර ද මහාචාර්යවරයා පුවත්පතකට ප්‍රකාශ කර තිබුණේ පුරාවිද්‍යාව බේරා ගත යුතු ව ඇත්තේ පුරාවිද්‍යා මහාචාර්යවරුන්ගෙන් කියා ය. එදා ඒ ප්‍රකාශය කරද්දී තිබුණු තත්ත්වයට වඩා දැන් මහාචාර්ය අනුර මනතුංගගේ තත්ත්වය වෙනස් ය; දැන් ඔහු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ය. එනිසා මේ විනාශය නැවැත්වීමේ ලා ඔහුගේ මැදිහත්වීම අත්‍යවශ්‍යය ය. පුරාවිද්‍යාඥයන් වශයෙන් කුරුන්දමලේ විහාරය, මුන්නේශ්වරම් කෝවිල, දළදා මාලිගාව මෙන්ම නල්ලූර් කෝවිල ආදී සියල්ල දෙස ම එක ලෙස බලන බවත්, පුරා විද්‍යාඥයන් යනු විද්‍යාත්මකව යම්කිසි දෙයක් සොයා බලා ඒ අනුව තීරණ දෙන පිරිසක් ලෙසත් ඔහු දරන අදහසට සියල්ලන් ම එකඟ වනු නියතය. අති විශාල පුරාවිද්‍යා ස්ථාන ප්‍රමාණයක් උතුරු නැගෙනහිර ඇති බව ද, එම ස්ථාන වලින් වැඩි ම ප්‍රමාණයක් බෞද්ධ ස්මාරක වන අතර ම කවුරු හෝ පිළිගැනීමට කැමති වුවත්; අකමැති වුවත් සත්‍ය එය බව ද පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා මාධ්‍ය සාකච්ඡාවකදී පැවසූ අයුරු අපට මතක ය. දකුණේ විහාරස්ථානවල ද බොහෝ හින්දු ගොඩනැගිලි ඇති බවත්; ඒවාට හානි සිදු වී නැති අතරම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒවා ආදරයෙන් රැකබලා ගන්නා බව ද; අවාසනාවකට උතුරු නැගෙනහිර සිද්ධස්ථාන වලට හානි වී ඇති බව ද ඔහු වැඩිදුරටත් එහිදී පැවසුවේ ය.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මෙකී ප්‍රමාණාත්මක මැදිහත්වීම ගැන සංශයවාදී සිතිවිල්ලකින් නොව පූර්ණ පැහැදීමකින් ජනතාව බලා සිටී. මුහුදු මහා විහාරයේ හා දෙවනගල පුරාවස්තු භූමීන්හි සිදුවූ අකටයුතුකම් පුරාවිද්‍යාව ගැන සෙනෙහෙසක් ඇති බොහෝ දෙනකුගේ නොසතුටට හේතු වී ඇත. 'යහපාලන' ආණ්ඩු සමයේ උදාගම් යැයි කියමින් විපිතපුර ප්‍රදේශය ඇතුළු පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත පෙදෙස් ඩෝසර් වූ අයුරු තවමත් අමතක නැත.

රටක, ජාතියක අභිමානය රකින්නට නම් ඒ රටේ පුරාවිද්‍යාත්මක වටිනාකම් අගය කළ යුතුය; ජාතියක පැවැත්ම රඳා පවත්නේ ඒ මත ය.

'සංවර්ධන සන්නිවේදනයෙන් ගැටලු විසඳා ගත හැකියි'

ජාතික සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මිලින්ද රාජපක්ෂ

● සුහද්‍රා දේශප්‍රිය

රටක් ලෙස මේ අවස්ථාව වන විට අපට ජයගත යුතු ප්‍රධාන ගැටලු දෙකක් වෙයි. එහි පළමුවැන්න වන්නේ අපේ රටටම ආවේණික වූ කාලාන්තරයක් මුළුල්ලේ අප මුහුණ දෙමින් පවතින විසඳාගත යුතු ප්‍රශ්න තිබීමයි. ඒවා විසඳා ගැනීම සඳහා ගෝඨාභය රාජපක්ෂයන්ට දැවැන්ත ජනවරමක් ජනතාව විසින් ලබාදෙන ලදී.

දෙවැනි ගැටලුව වන්නේ එම ජනවරම ලබා දෙන අවස්ථාවේදී නොතිබූ නව ගෝලීය තත්ත්වයක් නිර්මාණය වීමයි. ඒ කොවිඩ් 19 නව වසංගතයයි. කොවිඩ් 19 වසංගතය ලෝකය පුරා පැතිර යෑම සහ එහි අභියෝගයට රටක් ලෙස අපේ රටටද මුහුණ පෑමට සිදුවේ. එය ලොව පුරාම පැතිරී ගොස් ලෝකයේ ප්‍රබලතම රාජ්‍ය සියල්ලම ආර්ථික වශයෙන් දණ ගැස්වීමට තරම් ප්‍රබල විය. එම රාජ්‍යයන් ආර්ථික වශයෙන් වැටීම හරහා දැනට ගෝලීය ආර්ථික අර්බුදයකට අප සියලු දෙනාම මුහුණ දෙමින් සිටියි.

එවැනි තත්ත්වයක, ආර්ථිකයේ පරිධියේ පවතින අප වැනි කුඩා රටවල් ප්‍රබල බලපෑමකට ලක්වී ඇත. අප කුඩා රටක් ලෙස මෙම සටන ජය ගනිමින් හිටියත් මුළු ලෝකය ම මෙම සටන ජය නොගත්තොත් අපට තනිවම මේ අර්බුදයෙන් නැගී සිටීමට නොහැකි වනු ඇත.

● කොරෝනා එන්නත

කොරෝනා අර්බුදයෙන් ලෝකය මිදීම සඳහා නව එන්නතක් ලෝකය විසින් සොයාගෙන ඇත. ඒ එන්නත් මේ වන විට ලෝකයේ මිලියන ගණනක් දියුණු නොදියුණු සෑම රටකම ලබා ගනිමින් සිටියි. රටක් ලෙස ලංකාව නිවැරදි වේලාවේදී නිවැරදි තීරණය ගෙන , දැනට මේ මොහොත වන විට අත්‍යවශ්‍ය සේවාවල යෙදී සිටින සියලු දෙනාටම එන්නත ලබා දෙමින් සිටී. මේ ආකාරයට ඉදිරියටත් කටයුතු කළොත් අප්‍රේල් මාසය වන විට සම්පූර්ණයෙන්ම එන්නත්කරණයට ලක් වූ රටක් ලෙස අපේ රටද ලෝකයට එක් වනු ඇත.

එසේ නම් මේ මොහොත වනවිට අපේ රටට සංවර්ධනය අංශයෙන් වඩා ඉදිරියට යෑම වඩා වැදගත් වන්නේ ඇයි? ඊට හේතුව වන්නේ දෙවන ලෝක යුද්ධ සමයෙන් පසුව සුවිශේෂී අවස්ථා නිර්මාණය වූවා සේම මෙහිදීද දැවැන්ත ගෝලීය අවස්ථා ලෝකය පුරාම නිර්මාණය වෙමින් පැවැතීමයි. එනම් නව කර්මාන්ත ක්ෂේත්‍ර ඇතුළු ක්ෂේත්‍ර සොයා යෑමයි. විශේෂයෙන්ම විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව ක්ෂේත්‍රයන් මේ වනවිට නිර්මාණය වෙමින් පවතී . එලෙසම ඒ හා සම්බන්ධ නව රැකියා නිර්මාණය වෙමින් පවතී. රැකියා සිදු කරන්නේ නිවසේ සිට ද පිටත සිට ද ආයතනයේ සිටද යන සම්ප්‍රදායික ක්‍රමවේදයන් මේවනවිට යම් වෙනස් වීමකට පත්වී තිබේ. එලෙසම ප්‍රවාහන ක්ෂේත්‍රය ද ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී . මෙලෙස ලෝකයේ සෑම ක්ෂේත්‍රයක්ම මේ වනවිට වෙනස් වෙමින් පවතින බව අපට දක්නට ලැබෙයි. කෙසේ වෙතත් මේ සියලු වෙනස් වීම් හමුවේ අපේ රටද වෙනස් වීම් රැසකට සහ අභියෝගාත්මක කරුණු රැසකට මුහුණ දෙමින් පවතී. එසේ නම් මේ අභියෝගයන් ජයගැනීමට පෙර අපි නව කොවිඩ් 19 නම් වන නව අභියෝගය ජයගත යුතුව ඇත. අප්‍රේල් මස වන විට ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම එන්නත්කරණයට ලක් වූ රටක් වුවහොත් ලෝකයේ මුල්ම එන්නත් කරණය ට ලක් වූ ජාතීන් 5 හෝ 10 අතරට එක්වීමට ලංකාවට හැකිවෙයි. එසේ වුවහොත් මේ වනවිට අපේ රට ආර්ථිකමය වශයෙන් වඩා බිමට වැටෙන්නට ප්‍රධාන හේතු සාධකයන් අතර වන විදෙස් ව්‍යවසායකින් ශ්‍රමිකයන් සහ සංචාරකයන්ගෙන් ලැබුණ විදෙස් විනිමය අහිමි වීම වැනි අභියෝගයන් නැවත ජයගැනීමට හැකියාව ලැබෙනු ඇත. ලෝකය විශාල වශයෙන් මුදල් වැය කරමින් සංචාරය කරන දවසට ඩොලර් 1500/2000 වැයකරමින් සංචාරකයන් රටේ පවතින සෞඛ්‍ය තත්ත්වයන් පිළිබඳව වඩා සැලකිලිමත් වෙයි.

එහිදි අපි නිසි සෞඛ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරමින් නිසි එන්නත්කරණයකට ලක්වූ රටක් වුවහොත් එසේ සංචාරයේ නිරත වන, සෞඛ්‍යය පිළිබඳව, රටේ පහසුකම් පිළිබඳව, ඉතා උසස් මට්ටමින් සලකන සංචාරකයන් අනිවාර්යෙන්ම ලංකාව වැනි රටවල් සංචාරය සඳහා තෝරාගනු ඇත. අපි දැනටමත් පුරෝකතනය කර ඇති ආකාරයට ඇමරිකානු ඩොලර් මිලියන පන්සියයක් අපිට ඒ අය මඟින් උපයා ගැනීමට හැකිවෙනු ඇතැයි අපි උපකල්පනය කර තිබේ.

● ඩොලර් බිලියනයේ ඉලක්කය

එමෙන්ම එන්නත්කරණයට පත් වන දකුණු ආසියාවේ පළමු වැනි රට බවට අපේ රට පත් වුවහොත් අපිට එය ඇමරිකානු ඩොලර් බිලියනයේ ඉලක්කයකට යා හැකි තත්ත්වයකට සංවර්ධනය කර ගත හැකිවෙයි . එය මෙවැනි ලෝක අර්බුදයක් පවතින අවස්ථාවේ අතිවිශිෂ්ට ජයග්‍රහණයක් බවට පත් වෙයි.

පසුගිය වසර පුරාම රටත් ජාතියක් ලෙස එක්තරා ආතතියකට පත් වී සිටියා සේම මේ අර්බුදය හමුවේ අපේ රැකියා අවස්ථා ගිලිහී යාමට සිදුවෙතැයි යන්න මෙන්ම රැකියාවේ වැටුප් අහිමි වෙතැයිද නව රැකියා උත්පාදනයක් නොවෙයි ද යන කාරණා පැන නැඟ තිබුණි. එමෙන්ම බඩු මිල වැඩිවෙයිද බඩු මිල පාලනය කිරීමට ආණ්ඩුවට හැකිවෙයිද යන්න පිළිබඳවද ගැටලු මතු වී තිබුණි. ජනාධිපතිවරණයට පෙර ජනාධිපතිවරයා ජාතික ආරක්ෂාව ගැන පොරොන්දුවක් දී තිබූ නිසා ජනාධිපතිවරයා පැමිණි විගස මූලික ලෙස ම රටේ ජාතික ආරක්ෂාව තහවුරු කරනු ලැබිණි.

නමුත් කොවිඩ් 19 වසංගතය ජාතික ආරක්ෂාවේ එක්තරා පියවරක් වෙතැයි අපි නොදැන සිටිය නමුත් එය අද ජනතාවගේ ජාතික ආරක්ෂාවට ප්‍රබල තර්ජනයක් වී ඇත. ජාතික ආරක්ෂාව ත්‍රස්තවාදය සහ අනෙකුත් දේවල් අද අපි කළමනාකරනය කළද අපි අද මුහුණ දෙන ලද ප්‍රධානතම ජාතික ආරක්ෂාව සෞඛ්‍ය පිළිබඳ ගැටලුවක් බවට පත්වී ඇත.

මේ තත්ත්වයෙන් ගොඩ ඒම සේම සංවර්ධනය පිළිබඳව කතිකාවක් අද නිර්මාණය කිරීමට සිදුව ඇත. මේ සංවර්ධනය නැමැති සංග්‍රාමය ජයගන්නේ කෙසේ ද යන සංවාදයට මේ වන තෙක් අපේ මනස සුදානම් වී ඇතිද යන්න පිළිබඳ ගැටලු පවතී. 'රටක් ලෙස ගොඩ නැඟීමට නම් රට සංවර්ධනය විය යුතුමය' යන කාරණාව පිළිබඳව තවම අපේ රටේ මාධ්‍ය සංවාදය ගොනු වී නැත. විශේෂයෙන්ම වසර තිහක යුද්ධයක් තිබුණ රටක් වන අපේ රටේ මේ වනවිට ප්‍රවෘත්ති වටිනාකමක් ඇතිවීමට නම් මරණයට පත් වීම්, හදිසි අනතුරුවීම් වැනි කාරණාවන් ඉස්මතු විය යුතුය. සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියා පිළිවෙත හා සන්නිවේදනය ඉතා දුර්වල තැනක පවතී.

එය අද සියලු ම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යවලින් දක්නට ලැබෙයි. එහෙත් අපි ඇගැයීමට ලක් කළ යුතු ප්‍රධාන කාරණාවක් සහ ජාතික වගකීමක් ලෙස රටේ සංවර්ධනය හඳුනාගත යුතුයි. ඇතැම් මාධ්‍ය තමන්ගේ ගුවන් කාලයෙන් කොටසක් ද පුවත් පත්වල යම් ප්‍රමාණයක ඉඩක් සංවර්ධනය පිළිබඳව සංවාදයට ඇස යොමු කිරීමට යෙදවීම ඇගැයිය යුතු කරුණකි.

නමුත් තවමත් අපි විස්වාස කරන කාරණාවක් නම් මේ නව සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව කතා කිරීමට කතිකාවක් ඇති කර ගැනීමට ජනතාවගේ අකමැත්තක් පවතින බවයි

එසේ ජනතා අකමැත්ත නිසාම මාධ්‍යවල වැදගත් කොටසක් ලෙස සංවර්ධන සන්නිවේදනය පිළිබඳ සංවාදය ඔවුන් නොසලකයි. එහිදි මාධ්‍යයට වඩා වැදගත් වන කරුණක් ලෙස සඳහන් කළ යුතු කරුණක්ද වෙයි.

එනම් සංවර්ධන පිළිබඳ සමාජයේ ඇති කතිකාව ද්විපාර්ශ්ව ලෙසින් කළ යුත්තේ කෙසේද යන මතු කිරීමයි. සංවර්ධනය පිළිබඳ කතිකාව බොහෝ විට නිර්මාණය වී ඇත්තේ ඒකපාර්ශ්වීය ලෙසයි.

● සන්නිවේදන සංවාදයක්

රටේ සංවර්ධනයේ නියමු කාර්යය කරන්නන් නිසි සංවර්ධන ක්‍රියා දාමයන් සිදුකරන ආකාරය ජනතාව අතරට සන්නිවේදනය නොවෙයි. දෙපාර්ශ්වය අතර ඒ සඳහා සංවාදයක් ගොඩනැඟීමට ජනතාවටද ඉඩක් නොමැති වෙයි. ඒ තුළින් සංවර්ධන ක්‍රියාදාමයේදී ජනතාවගේ මතයන් ඉදිරිපත් කිරීමට සුදුසු වේදිකාවන් ඇහිරී යයි. ජනතාවට තම ප්‍රදේශවල සංවර්ධනය විය යුතු දේ පිළිබඳ අදහස් දක්වන්නට වේදිකාවක් නැති වීම විශාල හානියකි.

නව රජය බලයට පත් වීමෙන් අනතුරුව සෞභාග්‍යයේ දැක්ම වැඩසටහනේ තවත් දැවැන්ත පියවරක් වන 'වැඩ සමඟ යළි ගමට'. වැඩ සටහන යටතේ වැඩ කරන සියලුම දෙනා එකම වේදිකාවක් මත සිට ජනතා ප්‍රශ්න විසඳීමට කටයුතු කරයි.

එහිදී ප්‍රතිලාභ ලබන්නන් සහ අදාළ කටයුතු සිදු කරන්නන් එකම වේදිකාවක හමුවෙයි. එහිදි සංවාදයක යෙදීමක් වෙයි. මාධ්‍ය මේ දෙකම එක තැනකට ගොනු කරනු ලබන තැනක් බවට පත් වෙයි. මෙය ඉතා වැදගත් වැඩසටහනක් වන්නේ මේ දෙපාර්ශ්වයන් අතර සංනිවේදනයයි.

මේ නව සංවර්ධන මානයන් සොයා යෑම පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන වගකීම බවට පත් වී ඇත. සංවර්ධන සංනිවේදන සංවාදයක් ගොඩනැඟීම මෙහිදී වැදගත් වෙයි .

සංවර්ධනය පිළිබඳව සන්නිවේදනයක් පමණක් නොව ඒ පිළිබඳව සංවාදයක්ද ඇති කිරීම මේ මධ්‍යස්ථානයේ අරමුණයි. සංවාදය යනුවෙන් මෙහිදි අදහස් කෙරෙන්නේ අදහස් උදහස් බෙදා හදා ගැනීමයි. අපිට වඩා සුදුසු සංවර්ධන වැඩ පිළිවෙළ කුමක්ද යනුවෙන් කඩිනමින් විසඳාගත යුතු කරුණු ද වෙයි. සංවර්ධනයේ වැඩ පිළිවෙළ රැසක් ඇත. විශේෂයෙන් රටේ සුවිශේෂතා වන අධ්‍යාපනය මෙහිදී මුල් තැනක් ගනී.

අලුත් අධ්‍යාපන ක්‍රමවේදයන්ට අනුව අලුත් ලෝකයට ගෙන යන්නේ කෙසේද යන කාරණාව එහිදී මතුවෙයි. එය වසර හතරක කාලය අවසන් වනවිට නිම කරන්නේ කෙසේද? මාර්ගයේ දැනට ඇති වාහන සීමා කිරීම, පොදු ප්‍රවාහනයට ජනතාව යොමු කිරීම් වැනි කෙටිකාලින සහ දිර්ඝකාලින විසඳුම් ලබා දිය යුතු වේ.

පරිසරය ආරක්ෂා කරමින් අධිවේගි මාර්ග සංවර්ධනය විය ආකාරය පිළිබඳව සංවාදයක් ගොඩනැඟිය යුතුයි. පරිසර හිතකාමී අධිවේගි මාර්ග පුළුල් විය යුතුයි.

පරිසරය සම්බන්ධයෙන් ද කෙටි හා දිගු කාලින සංවර්ධන උපාය මාර්ග සම්බන්ධයෙන් ජනතාවගේ අදහස් ජනාධිපතිවරයා අපේක්ෂා කරනු ලබනවා. අපි කළයුතු වැදගත්ම දේ සංවර්ධනයේ නොයෙක් මානයන් සඳහා නව සංවාදයක් ගොඩනැඟීමයි

> **මේ නව සංවර්ධන මාන සොයා යෑම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සංවර්ධන මාධ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන වගකීමයි**

සංවර්ධනය යනු රජයක් තනියම කරන දෙයක් නොවෙයි.

පරිසරය සම්බන්ධයෙන් ජනතාව ඉතාමත් සංවේදි බව කොළඹට අවශ්‍ය අධිවේගි මාර්ගයක් වන කැලණිය සිට අතුරුගිරිය මාර්ගයේ වැඩ නිර්මාණය විමේදි අපි දුටුවා. එහිදි ඒ මාර්ගයේ වැඩනතර කිරීමට ජනාධිපතිවරයා නියෝග කළ ආකාරයත් අපි දුටුවා.

එයට හේතුව විශාල ජනතා විරෝධයක් පැමිණීමයි.

ඒ විරෝධයට ජනාධිපතිවරයා සංවේදි වුණා.

නිසිලෙස අදහස් හුවමාරුව වැදගත් වන්නේ මෙවැනි සන්නිවේදනය වියයුතු කරුණු පිළිබඳවයි. මේ සමහර සංවර්ධන ව්‍යාපෘති කොතරම් අත්‍යවශ්‍යද යන කාරණාව ජනතාවට දැනුම්වත් කළ යුතුයි.

● ජාත්‍යන්තර අභියෝග

එමෙන්ම ජාත්‍යන්තරය හමුවේ අද අපි මුහුණ දී අභියෝගයන්ද මෙහි ලා සලකා බැලිය යුතු වේ. නිවැරදි තැනකට ඉදිරි පරපුර යවන්නේ කෙසේද ඉදිරි පරපුරට ඇති අනතුරු වළකාලන්නේ කෙසේද යන කාරණාවට නිවැරදි සන්නිවේදන මාධ්‍යයන් තුළින් සිදුවිය යුතුයි.

නිවැරදි ප්‍රචාරණ මාධ්‍ය තෝරා ගත යුතුයි රටක් ලෙස අපිට ඇති ඊළඟ ජාත්‍යන්තර අනතුරු වළක්වාලීමට ඇති විශාලම වගකීම ඇත්තේ නිවැරදි සන්නිවේදනයටයි. නිවැරදි සන්නිවේදන ක්‍රමයන් අනුගමනය කළහොත් අපි හමුවේ ඇති අභියෝගයන් ජය ගත හැකියි. ලංකාවට විරුද්ධව අද මානව හිමිකම් කවුසිලය දැවැන්ත ප්‍රචාරණයක් ගෙනයයි. සන්නිවේදනය භාවිත කරමින් අපි කෙසේද මේ අභියෝගයන් ජය ගනු ලබන්නේ යන කාරණාව මෙහිදී මතුවෙයි. මෙය අලුත් අභියෝගයකි. මේ ජාත්‍යන්තර අවුල නිරාකරණය කරගත යුතුයි.

ඒ සඳහා සන්නිවේදනයන් පුළුල් කර ජාත්‍යන්තරය දැනුම්වත් කළ යුතුයි. හැම අමාත්‍යාංශයන්ට ප්‍රවෘත්ති නිලධාරීන් වෙයි. ඒත් මාධ්‍ය ආයතනයට එක් මධ්‍යස්ථානයකින් සියලු තොරතුරු ලබාගැනීමේ අවකාශය නැත.

ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයේ කාර්යය භාරය වන්නේ සියලු දෙනා එකට එකතු වී සියලු දෙනා එකට සංවිධාන ගතවී සංවර්ධනය පිළිබඳ සන්නිවේදනය කිරීම් සැලසුම් කිරීමයි. අද මාධ්‍ය භාවිත කරන තරුණ පිරිස් විශාල ලෙස මාධ්‍ය අවභාවිත කරයි.

මෙයින් විශාල ගැටුම් ඇතිවෙමින් පවති. මෑත කාලින ගැටලුවලට හේතුව සමාජ මාධ්‍ය මඟින් සාවද්‍ය ප්‍රවෘත්ති නුවමාරු වීමයි. නමුත් මේ ප්‍රවෘත්තියේ නිරවද්‍යතාවය කිසිවෙකු විසින් සොයන්නේ නැත. ඉදිරියේදී මේ සඳහා නිසි ක්‍රමවේදයන් නිර්මාණයකිරීම අපේ අපේක්ෂාවයි. ලංකාවේ විද්‍යුත් මාධ්‍ය සඳහා නීති රීති රෙගුලාසි බොහෝ අවම මට්ටමක පවති.

ඉදිරි වැඩ පිළිවෙළ දැවැන්ත සංවර්ධන ව්‍යායාමයක් වන අතර සියලු දෙනා එකට ඒකරාශී වෙමින් සියලු දෙනා සහාය විය යුතුයි. මේ අභියෝග ජය ගැනීම උදෙසා සියලු දෙනා එක්ව කටයුතු කළ යුතුයි. මෙවැනි මධ්‍යස්ථානයක් මින් පෙර තිබුණේ ජාතික ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය මධ්‍යස්ථානය නමිනි.

ඒ අවස්ථාවේදි රට ජාත්‍යන්තරය හමුවේ අපකීර්තියට අපහසුතාවයට පත් කරන්නට උත්සාහ කරන්නන්ගෙන් රට බේරාගනිමින් ඉතාමත් බුද්ධිමත් ලෙස ඉතාම සුක්ෂම ආකාරයට කටයුතු කරමින් රටේම අරමුණ එකතැනකට ගෙන ඒමට එවකට රජයට හැකිවිය.

අදත් ජනමාධ්‍ය ඇමැතිවරයා වන කෙහෙලිය රඹුක්වැල්ල ඇතුළු සියලු පාර්ශ්වයන්ද ජනතාවට නිවැරදි සංවර්ධනයට තොරතුරු ලබා දීම උදෙසා කටයුතු කරයි. එදා ලබාගත් අත්දැකීම් මේ නව සංවර්ධන වැඩසටහන යායුතු මඟ පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේ වැඩ සටහන සඳහා ද ඒකරාශී කර ගනිමින් සාර්ථක ව කරගෙන යාමට ඒ අයගේ සහය ඉතා වැදගත් වෙයි.

අපේක්ෂා දැල්වමින් කොවිඩ් එන්නත ජනතාව අතරට

● සුරේකා නිල්මිණි ඉලංගකෝන්

ඉකුත් සතිය ආරම්භයේදී සමස්ත ගෝලීය කොවිඩ් 19 ආසාදිතයන් සංඛ්‍යාව කෝටි 11 ඉක්මවා ගියේ 16 වැනිදා පමණක් ලොව පුරා ආසාදිතයන් 336,000කට අධික පිරිසක් හඳුනා ගැනීමත් සමඟය.

ඒ වන විට වාර්තා වූ ගෝලීය කොවිඩ් මරණ සංඛ්‍යාව 2,429,707කි. එහෙත් ලෝක සෞඛ්‍ය සංවිධානය නිවේදනය කළේ ගෙවුණු සතිය තුළදී වෛරස ආසාදනය වීමේ ප්‍රතිශතය සියයට 16කින් පහළ බැස ඇති බවය.

එම සංවිධානයේ වාර්තාවට අනුව ඉකුත් සතියේදී නව ආසාදිතයන් මිලියන 2.7ක් වාර්තා වී ඇති අතර පෙර සතියට සාපේක්ෂව එය ලක්ෂ 5ක අඩුවීමකි. මේ අතර බ්‍රිතාන්‍යයෙන් හඳුනාගත් නව වෛරස ප්‍රභේදය මේ වන විට රටවල් 94කටත් දකුණු අප්‍රිකාවෙන් හඳුනාගත් ප්‍රභේදය රටවල් 46කටත් බ්‍රසීලයෙන් හඳුනාගත් වෛරස ප්‍රභේදය රටවල් 21කටත් ව්‍යාප්ත වී ඇති බව ලෝක සෞඛ්‍ය සංවිධාන වාර්තාවේ වැඩිදුරටත් සඳහන් වේ. කෙසේවෙතත් මේ වන විට ශ්‍රී ලාංකිකයන්ට කොවිඩ් 19 වසංගත බිය වැඩියෙන් දැනෙන්නට පටන් ගෙන තිබේ.

ඊට හේතුව මේ දිනවල කොවිඩ් නව වයිරස් ප්‍රභේදයට අයත් ආසාදිතයන්ද රටේ තැන්තැන්වලින් වාර්තා වෙමින් තිබීමය.

කෝවිඩ්-19 වයිරසය මර්දනය සඳහා ඔක්ස්ෆර්ඩ්-ඇස්ට්‍රාසෙනෙකා එන්නත මහජනතාවට ලබාදීම ආරම්භ කරන බව කෝවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය නිවේදනය කළේ ඉකුත් 15 වැනිදාය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ උපදෙස් පරිදි එය සිදු කෙරෙන අතර එහි මුල් අදියර බස්නාහිර පළාතෙන් ආරම්භ කොට එහි අවදානම් කලාපවල සිටින පිරිස හඳුනාගෙන ඔවුන්ට ලබාදෙන බවද එම මධ්‍යස්ථානය වැඩිදුරටත් සඳහන් කළේය. ඒ අනුව 17 වැනිදා බස්නාහිර පළාතේ පුද්ගලයන් 57,000කට ආසන්න ප්‍රමාණයකට කොවිඩ් එන්නත ලබාදීමට නියමිතව තිබිණ. ඒ, කොළඹ දිස්ත්‍රික්කයේ 27,018ක්, ගම්පහ දිස්ත්‍රික්කයේ 17,622ක් හා කළුතර දිස්ත්‍රික්කයේ 11,710ක් ලෙසය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එම එන්නත ලබාදීම ආරම්භ කළේ පසුගිය 16 වැනිදා නාරහේන්පිට යුද හමුදා රෝහලේදීය. ඉකුත් 16 වැනිදා ආරම්භ කළ එම වැඩසටහන යටතේ මහින්ද අමරවීර, සුසිල් ප්‍රේමජයන්ත, තිස්ස අත්තනායක, පූජ්‍ය අතුරලියේ රතන හිමි, හර්ෂණ රාජකරුණා, පී. දිගම්බරන්, දිලිප් වෙදඅරච්චි, මයන්ත දිසානායක, ඉරාන් වික්‍රමරත්න, සරත් ෆොන්සේකා, මොහොමඩ් මුසම්මිල්, අනුර ප්‍රියදර්ශන යාපා, රාජ්‍ය අමාත්‍ය අනුරාධ ජයරත්න හා ගීතා කුමාරසිංහ යන මන්ත්‍රීවරු එන්නත ලබාගත්හ. කථානායක මහින්ද යාපා අබේවර්ධන එන්නත ලබාගත්තේ ඉකුත් 17 වැනිදා නාරාහේන්පිට පිහිටි යුද හමුදා රෝහලේදීය. එදින පස්වරුව වන විට ආණ්ඩුව

> **ඉන්දියානු සීරම් ලිමිටඩ් ආයතනයේ එන්නත ගෙන්වන්නත් නීතිපති අනුමැතිය**

කොවිඩ් මර්දන එන්නත ලබාගනිමින්

පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 24 දෙනකු එන්නත ලබාගෙන තිබුණි.

බන්ධනාගාර නිලධාරීන් සඳහා කොවිඩ් මර්දන එන්නත ලබාදීමේ කටයුතු ආරම්භ වූයේද ඉකුත් 16 වැනිදාය. බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක පැවසුවේ දිවයින පුරා බන්ධනාගාර නිලධාරීන් 5100ක පිරිසකට එන්නත ලබාදීම සිදු කෙරෙන බවය. මේ අතර ඉකුත් 17 වැනිදා නීතිපති දෙපාර්තමේන්තුවේ 425කටද කොවිඩ් මර්දන එන්නත ලබාදී තිබිණ.

යම් යම් සංශෝධනවලට යටත්ව ඉන්දියාවේ සීරම් ලිමිටඩ් ආයතනයෙන් කෙරෝනා මර්දන එන්නත් මිලදී ගැනීම සඳහා වන ගිවිසුමට එළැඹීමට නීතිපතිවරයා විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට නීතිපතිවරයාගේ අනුමැතිය ලබාදී ඇතැයි වාර්තා වේ.

ශීඝ්‍ර ව්‍යාප්තියක් සිදුවිය හැකි බවට හඳුනාගෙන ඇති නව කොවිඩ් ප්‍රභේදයේ අවදානම සැලකිල්ලට ගනිමින් මහජනතාව අනවශ්‍ය ගමන්බිමන් යෑමෙන් වැළකී සිටිය යුතු බව කොළඹ මහනගර සභාවේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විශේෂඥ වෛද්‍ය රුවන් විජේමුණි පැවසීය. පසුගිය දිනක ශ්‍රී ජයවර්ධන විශ්වවිද්‍යාලයේ චන්දිම ජීවන්දර විසින් සොයාගත් එම නව වයිරස ප්‍රභේදය කොළඹ නගරය තුළ ව්‍යාප්තව ඇතැයිද හෙතෙම පැවසීය. කොවිඩ් වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා සෞඛ්‍ය අංශ ලබාදී ඇති උපදෙස් මහජනතාව නිවැරදිව අනුගමනය නොකළහොත් ඉදිරියේදී දැඩි තීරණ ගැනීමට සිදුවන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන පසුගියදා පැවසීය. කොවිඩ් රෝගීන් වැඩිවෙන විට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මෙය පාලනය නොකරන බවට චෝදනා එල්ලවන බවත් ජනතාවගේ සහයෝගය නොමැතිව මෙය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට හෝ ත්‍රිවිධ හමුදාවට පාලනය කළ හැකි දෙයක් නොවන බවත් හෙතෙම පැවසීය. මෙරටින් වාර්තා වූ සමස්ත කොවිඩ් ආසාදිතයන් ගණන 77,000 සීමාව පසු කරද්දී මෙතෙක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වී ඇති වැඩිම දෛනික කොවිඩ් ආසාදිත මරණ සංඛ්‍යාව පසුගිය 17 වැනිදා වාර්තා විය. ඒ අනුව එම දිනය තුළදී පමණක් වාර්තා වූ කොවිඩ් මරණ සංඛ්‍යාව 13කි. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ නිල දත්ත වාර්තා අනුව පෙබරවාරි 1 දා සිට 17 වැනිදා දක්වා පමණක් කොවිඩ් මරණ 108ක් වාර්තා වී තිබිණ. මේ වන විට මෙරට වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයන් 298ක්, 40-60ත් අතර 92 දෙනකු සහ 10-40ත් අතර 16 දෙනකු මරණයට පත්ව ඇත. මේ අතර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය පසුගියදා මාධ්‍ය හමුවේ ප්‍රකාශ කළේ මෙතෙක් සියයට 40ක් පැවති කොවිඩ් ව්‍යාප්තියේ අවදානම මේ වන විට සියයට 60 දක්වා ඉහළ ගොස් තිබෙන බවයි. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ලබාදී ඇති සෞඛ්‍යාරක්ෂිත උපදෙස් උල්ලංඝනය කරමින් ආසන ගණන ඉක්මවා මගීන් ප්‍රවාහනය කළ බස්නාහිර පළාතේ පෞද්ගලික බස් රථ 51ක දෛනික ගමන්වාර තාවකාලිකව අත්හිටුවීමට සියවර ගත් බව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පසුගියදා 17 වැනිදා නිවේදනය කළේය.

ඒ සමඟ එම බස්රථවල සේවය කළ රියැදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ සේවයද අත්හිටුවීමට සියවර ගෙන තිබේ.

කොරෝනා වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා ආසන ගණනට මගීන් ප්‍රවාහනය කරන ලෙසට සෞඛ්‍ය අංශ මඟින් ලබාදී ඇති උපදෙස් උල්ලංඝනය කරමින් වැඩිපුර මගීන් ප්‍රවාහනය කරන බවට පසුගිය කාලය පුරා බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ පාලනය වන ප්‍රාදේශීය කාර්යාල හතකට පැමිණිලි රැසක් ලැබී ඇත.

ඒ අනුව බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයාගේ උපදෙස් මත මාර්ග පරීක්ෂක නිලධාරීන් යොදවා කොළඹ අංක 4 කාර්යාලය යටතේ පාලනය වන පෞද්ගලික බස් රථ 1078ක් පරීක්ෂාවට ලක් කිරීමේදී ඉහත කී ආසන ගණන ඉක්මවා මගීන් ප්‍රවාහනය කළ පෞද්ගලික බස්රථ 51 හමුවී ඇත. නිවෙස්වල නිරෝධායන සහ ස්වයං නිරෝධායන සඳහා යොමුව සිටින පුද්ගලයන් සෞඛ්‍ය බලධාරීන් විසින් එම නිවසේ අලවා ඇති දැන්වීම ඉවත් කරන තෙක් නිවෙස්වලින් බැහැර යෑම සම්පූර්ණයෙන්ම තහනම් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශන නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ පැවසීය.

නිරෝධායනයට යොමු කර සිටින පිරිස් එම නිවෙස් හා පරිශ්‍රවලින් බැහැරට පැමිණෙන බවට පොලිසිය වෙත තොතුරු ලැබී ඇති බවත් එවැනි පුද්ගලයන් අත්අඩංගුවට ගෙන නිරෝධායන නීතිය යටතේ ඔවුන්ට නීතිය තදින්ම ක්‍රියාත්මක කරන බවද හෙතෙම පැවසීය.

නිරෝධායනයට ලක්කර ඇති නිවෙස් හා එහි පුද්ගලයන් සම්බන්ධයෙන් නිතර විමසිල්ලේ සිටින ලෙස සියලුම පොලිස් ස්ථාන වෙත දැනුම් දී ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

> **එන්නත්කරණ වැඩසටහන සති අන්තයේදිත් අඛණ්ඩව**

මියගිය පසුව කොරෝනා ආසාදිතයකු බවට අනාවරණය වී ඇති පුද්ගලයකුගේ මෘත ශරීරයක් යළි පී.සී.ආර්. පරීක්ෂණයකට යොමු කරන්නැයි නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා මියගිය තැනැත්තාගේ පියා ගොනු කළ පෙත්සමක් විභාගයට නොගෙනම නිෂ්ප්‍රභ කිරීමට අභියාචනාධිකරණය ඉකුත් 18දා තීන්දු කළේය. නීතිමය පදනමක් නැති බවට නීතිපතිවරයා ගෙන ආ විරෝධතාව පිළිගනිමින් අධිකරණය එම පෙත්සම විභාගයට නොගෙනම ඉවත දමන ලදී. ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචි මොහොමඩ් ඊබ්‍රා ලෙබ්බේ මොහොමඩ් හකීම් නැමැත්තකු විසින් එම පෙත්සම ගොනුකර තිබුණි.

මේ වන විට ත්‍රිවිධ හමුදාව මඟින් පාලනය කරනු ලබන නිරෝධායන මධ්‍යස්ථාන 93ක් තුළ පුද්ගලයන් 9,268 දෙනෙකු නිරෝධායනය වෙමින් සිටින බව කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය 19 වැනිදා ප්‍රකාශ කළේය. එන්නත්කරණ කටයුතු සිදුකරනු ලැබූ ප්‍රදේශවල එන්නත ලබා නොගත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා සති අන්තයේද එම වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන බව වැඩබලන සෞඛ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන පැවසීය.

ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව, ගොතටුව, මොරටුව, එගොඩඋයන හා හංවැල්ල යන ප්‍රදේශවලත් කළුතර දිස්ත්‍රික්කයේ අඟලවත්ත, බණ්ඩාරගම, පානදුර, හොරණ හා මතුගම හා ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ, අත්තනගල්ල, මීගමුව, සීදුව, මහර, බියගම, වත්තල, මිනුවන්ගොඩ, මීරිගම, රාගම, ජා-ඇල, කැලණිය, කටාන දිවුලපිටිය හා දොම්පේ යන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසත් ආවරණය වන පරිදි තෝරාගත් ග්‍රාමසේවා නිලධාරී වසම්වල එන්නත්කරණය සිදු කිරීමට නියමිතය.

ඡායාරූප- දුෂ්මන්ත මායාදුන්නෙ

මීතොටමුල්ල රාහුල විද්‍යාලයේදී භික්ෂුන්වහන්සේ නමක් කොවිඩ් මර්දන එන්නත ලබාගත් අයුරු



> **එන්නත ලබානොගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එන්නත් ලබාදීම ලබන 23 සිට 25 දක්වා**

නැවතුණු තැනින් පටන් ගමු ආයෙත්

SRI LANKA

දස ලක්ෂ ගණන් ජීවත්කරවන සංචාරක ක්ෂේත්‍රය නගා සිටුවමින් ඔවුන්ගේ ජීවිත සවිබල ගැන්විය යුතුම බැවින් අපි ලොවට විවෘත වූවෙමු...

එහෙනම් අපි වඩාත් ආරක්ෂිතව ලොවම ආශ්චර්යයට පත්කළ ශ්‍රී ලාංකේය සංචාරක කර්මාන්තය නැවතුණු තැනින් පටන් ගමු.

ජාතික ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය

සංචාරක අමාත්‍යාංශය
சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF TOURISM

සෑම පුද්ගලයකුටම එන්නත ලබාදීම අපේ අරමුණයි

ප්‍රාථමික සෞඛ්‍ය සේවා වසංගත රෝග සහ කොවිඩ් මර්දනය කිරීමේ කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමතිනී විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ

● භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

● කොරෝනා එන්නත ලබා දීම සම්බන්ධව රජයට නොයෙක් චෝදනා එල්ල වෙනවා. ඔබ වෛද්‍යවරියක් හැටියට කොරෝනා එන්නත ලබා දිය යුතු ආකාරය දකින්නේ කෙසේද?

රජයට බොරු චෝදනා නොකර වෛද්‍ය විද්‍යාත්මකව අපි මෙය දැකිය යුතුයි. රටක් හැටියට ජනතාවට මෙය මේ තරම් කෙටි කාලයකදී ලබාදීමට හැකිවීම පිළිබඳව අපි රජයට සහ ජනාධිපතිවරයාට ස්තුති වන්නට ඕන.

මෙම එන්නත ලබාදීම තුළින් රෝගය බෝවීම වළක්වා ගත හැකියි. ඒ වගේම මරණ වාර්තා වීම නතර කර ගත හැකියි. ක්‍රමක්‍රමයෙන් මෙය හැකිතාක් ලබාදීමෙන් රෝගය බෝවීම සම්පූර්ණයෙන්ම පාලනය කර ගැනීමට ද හැකි වෙනවා.

සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රථමයෙන් සැලසුම් කර තිබෙන්නේ ජනතාවට ඉතා සමීපව රැකියාවල නිරතව සිටින ඒ වගේම කොරෝනා මර්දනය සඳහා එක්වී සිටින සෞඛ්‍ය සේවා ආරක්ෂක අංශ ඇතුළු ආයතනවල පුද්ගලයන්ට ප්‍රථමයෙන් මෙය ලබා දීම. ඉන්පසු වයස අවුරුදු හැටට වඩා වැඩි වැඩිහිටි පුද්ගලයන්ට එන්නත ලබා දීම. ඒ වගේම ඉන්පසුව 30 සිට 60 දක්වා සෑම පුද්ගලයෙකුටම මේ එන්නත ලබාදීමට කටයුතු කිරීමයි. ඒ වගේම අවුරුදු 18ට වැඩි සෑම පුද්ගලයකුටම මෙම එන්නත ලබාදීම කෙරෙහි ද රජය අවධානය යොමු කර තිබෙනවා.

● සාමාන්‍ය ජනතාවට කොරෝනා එන්නත ලබා නොදෙන බවත් මේ රටේ සෑම පුද්ගලයෙකුටම එය ලබා දීමට පියවර නොගන්නා බවටත් විපක්ෂය රජයට චෝදනා කරනවා?

අපි පැහැදිලිවම කියනවා මෙය මේ රටේ සෑම පුද්ගලයෙකුටම ලබා දිය යුතුයි. ඒ වයස අවුරුදු දහඅටට වැඩි පුද්ගලයන් සඳහායි. අපිට මෙම එන්නත ලබා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබෙනවා. ඒ වගේම කඩෙකින් ටොෆි චොකලට් ගන්නවා වගේ ෆාමසියකින් බෙහෙත් ගන්නවා වගේ මේ එන්නත ගන්න බැහැ. මේ එන්නත සඳහා මුළු ලෝකයේම දැඩි ඉල්ලුමක් තිබෙනවා. අපි ඇණවුම් කරන ප්‍රමාණයෙන් අපිට ලැබෙන්නේ කොටස් වශයෙන්. මුළු ජනතාවටම මෙය ලබා දීමට හැකිනම් අපි රජයක් හැටියට එය සිදු කරනවා. එහෙත් අපිට එන්නත ලැබෙන ආකාරය අනුව තමයි ජනතාවට එන්නත් කිරීම සිදු කළ හැකි වන්නේ. එය තේරුම් ගත යුතු ක්‍රියාවක්.

● විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ප්‍රකාශයක් නිකුත් කරමින් සඳහන් කරන්නේ රජය මෙරටට ගෙන්වන ඇස්ට්‍රාසෙනිකා එන්නත නුසුදුසු එන්නක් බවයි. මෙය ඇත්තක්ද?

වයිරසයේ ස්වභාවය වෙනස් වන අවස්ථාවල එන්නත් වෙනස් විය හැකියි. නමුත් දැනට ලෝකය පිළිගත් මෙම එන්නත ඉතා හොඳින් ක්‍රියාත්මක වන එකක්. අනෙක් කාරණය තමයි විපක්ෂ නායකවරයා වෛද්‍යවරයෙක් හෝ විද්‍යාඥයෙක් නොවෙයි. ඔහු මෙවැනි ප්‍රකාශ හිතුමතේ ප්‍රකාශ කිරීම ඔහුගේ තනතුරටත් මදිකමක්. වගකිව යුතු තනතුරක් දරන පුද්ගලයකු ඉතා හොඳින් කරුණු දැනගෙන ප්‍රකාශ නිකුත් කරන්න කියන කාරණය මා මේ අවස්ථාවේ විපක්ෂ නායකවරයාට මතක් කර සිටිනවා.

● ආණ්ඩුව අර්බුදයකද තිබෙන්නේ?

ආණ්ඩුවේ කිසිම අර්බුදයක් නැහැ. අර්බුදයක් ඇති බව ප්‍රකාශ කරන්නේ විපක්ෂයට සම්බන්ධ පක්ෂ සහ මේ රටට වින කරන රාජ්‍ය නොවන සංවිධානයි. මේ රජය බිහි කරලා තිබෙන්නේ රටට ආදරය කරන දේශපාලන පක්ෂ රාශියක් එකතු වෙලා. මේ කණ්ඩායම ඇතුළේ පෞද්ගලික කතාබහ, පක්ෂවල ප්‍රතිපත්තිමය කතාබහ සිද්ධ වෙනවා. නමුත් අපි පවුලක් හැටියට ඉඳගෙන තමයි තීන්දු තීරණ ගන්නේ. පවුලක් ඇතුළේ සිදුවන යම් යම් ගැටුම්කාරී මතභේද සාමාන්‍ය දෙයක්. මේ තත්ත්වය පවුලෙන් පිට සිටින අය ගැටුමක් අර්බුදයක් හැටියට මවා පාන්නට උත්සාහ කරනවා. ඒක සම්පූර්ණ වැරැදි ප්‍රචාරයක්. එවැනි ප්‍රචාර තුළින් ශක්තිමත් අපගේ රජය වට්ටන්නට හැකියාවක් නොමැති බව මම පැහැදිලිව ඒ අයට කියන්න කැමතියි. පොඩි පොඩි මත ගැටුම් ආවම අපි ඒවා කතාබහ කරලා විසඳ ගන්නවා.

රජයක් හැටියට අපි දැන් මාස හයකට වැඩි කාලයක් ආණ්ඩුව ක්‍රියාත්මක වෙනවා. කොරෝනා වසංගතයට මුළු ලෝකයම හිරවෙලා තිබෙන අවස්ථාවක අපි හිර නොවී ජනතාව වෙනුවෙන් වැඩ කරනවා. ලබන වසරට අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මකයි. ඒ වෙනුවෙන් සංවර්ධන කමිටු පත්කරලා ඒවා ක්‍රියාත්මක කරනවා. මෙය ඉතා සාර්ථකව මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

● මේ රජයට වැඩක් කරගන්න බැහැ; කරපු වැඩකුත් නැහැ. ජනාධිපති ගෝඨාභය සම්පූර්ණයෙන්ම ෆේල් කියන පාඨය අද විපක්ෂය රටපුරා ප්‍රසිද්ධ කරමින් යනවා. රජය සහ ගෝඨා ඇත්තටම ෆේල්ද?

රජයක් හැටියට අපි දැනට කරගෙන යන සියලුම වැඩසටහන් මේ වන විට ජනතාව හොඳින්ම දන්නවා. ජනතාව එය තේරුම් අරගෙන තිබෙන්නේ. මේ රටේ ලක්ෂ 69ක ජනතාව ජනාධිපති සහ අප පිළිබඳව තබා ඇති ඒ විශ්වාසය අපි රකිනවා. ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා. අපිට ජනතා සහතිකය හොඳටම ඇති. වෙනත් සහතික අවශ්‍ය නැහැ.

ඇත්තම විපක්ෂය මොකක් හරි 'සෝලෝගන්' එකක් අරගෙන යනවා. විපක්ෂය හැමදාම කරපු දෙයක්නේ. අපිට මතකයි 2014 රත්තරන් අශ්වයන් ඉන්නවා කිව්ා. රත්තරන් කඩු තිබෙනවා කිව්වා. ලැම්බෝ ගිනි වාහන තිබෙනවා කිව්වා. හොරකම් කරලා තිබෙනවා කිව්වා. නමුත් යහපාලන ආණ්ඩුව තිබිලා ඔවුන් පත් කරපු පොලිසියට බැරි වුණා. මේ කිසිවක් ඔප්පු කරගන්න. ඒ කියන්නේ ඒ සියලුම චෝදනා බොරු චෝදනා කියන එකයි.

මේ අය ආණ්ඩු කරන කාලේ රැකී රක්ෂා ලබාදීමට කිසිම වැඩපිළිවෙළක් තිබුණේ නැහැ. කොට නම් කම්කරු උස නම් සිකුරිටි කිව්වා. සමෘද්ධිය ලබා දුන්නේ තමුන්ගේ හිතවතුන්ට. අපගේ යූඑන්පී පාක්ෂිකයන්ට අවුරුදු දහයකින් කිසිම දෙයක් ලැබිලා නැහැ කිව්වා. ඒ නිසා අපි ඔවුන්ට තමයි සලකන්නේ කිව්වා. බලයට ඇවිල්ලා දින සියයක් යනකොට මහබැංකුව මංකොල්ල කෑවා. ඔවුන්ගේ ගජ මිතුරන්ට රටේ දේපළ බෙදලා දුන්නා. තවත් පිරිසක් රටින් පිට කෙරෙව්වා. අදාළ නැති අමාත්‍යාංශවලට රුපියල් කෝටි ගණන් දීලා විශාල ගොඩනැගිලි කුලියට ගත්තා. උදාහරණයක් කෘෂිකර්ම අමාත්‍යාංශය. පාස්කු ප්‍රහාරය දැන දැන එය වළක්වා ගන්න බැරි වුණා. අහිංසක ජීවිත ඒ වෙනුවෙන් වන්දි ගෙව්වා. රටේ නීතිය දේශපාලන බවට පත් කරගත්තා. සංස්කෘතිය, ආර්ථිකය, දේශපාලනය මේ සෑම අංශයකින්ම රට විනාශ කරලා දැම්මා. ආණ්ඩුව ඇතුළේම ගැටලු ගොඩයි. ජනාධිපති අගමැති අතර ගැටුම් නට ගත්තා. ඇමතිවරු මන්ත්‍රීවරු කණ්ඩායම් කිහිපයක් බවට පත්වුණා. එහෙම කරපු නිසා ජනතාව රට සංවර්ධනය කරන්න පුළුවන් රටට ආදරය කරන්න පුළුවන් නායකයෙක් හැටියට ගෝඨාභය රාජපක්ෂයන් ජනාධිපති කර ගත්තා.

● පාස්කු ප්‍රහාරයට අදාළව නීතිය ක්‍රියාත්මක වෙනවාද?

පාස්කු ප්‍රහාරයට අදාළව රජයක් හැටියට අපි නීතිය අකුරටම ක්‍රියාත්මක කරමින් සිටිනවා. පාස්කු ප්‍රහාරයට අදාළ නීතිය ක්‍රියාත්මක නොකළේ පසුගිය යහපාලන ආණ්ඩුවයි. ඒ ආණ්ඩුව ඇතැම් සැකකරුවන් නිදහස් කළා. චෝදනා එල්ල කරපු ඇතැම් කණ්ඩායම්වලට සුදුහුනු ගැවා. දැන් තමයි මේ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක වෙන්නේ. මේ වන විට ඒ සඳහා අප රජය පත්කළ ජනාධිපතිතුමා නම් කළ පාස්කු කොමිසම විමර්ශන අවසන් කරලා තිබෙනවා. ඒවා ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වුණා. මේ කොමිසමේ නිර්දේශ ජනාධිපතිතුමන්ට භාර දීලා තිබෙනවා. ඒ අනුව ඉදිරියේදි අදාළ නීතිමය පියවර ගනිවි. මේ වන විටත් ඊට අදාළ සැකකරුවන් කිහිපදෙනකුම අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ. ඉදිරියේදි මීට අදාළ සැකකරුවන් සහ වගකිවයුත්තන් නීතිය ඉදිරියට ගෙන ඒමට දඬුවම් ලබා දීමට හැකි වෙනවා.

● ඇමැති විමල් විරවංශ සහ පොදුජන පෙරමුණ අතර ගැටුමක් හටගෙන තිබෙනවා නේද?

මත භේද තිබෙන අවස්ථාවක ගැටුමක් අර්බුදයක් ලෙස මවා පෙන්වන්නට හදන පිරිසක් සිටිනවා. එහෙම ගැටුමක් නැහැ කියන එක පැහැදිලිව කිව හැකියි. ගැනියි, මිනිහයි අතර අඬබර තිබෙන්නේ බත් හැළිය ඉදෙනකම් කියලා අපි අහලා තිබෙනවා. මේ පවුලේ ප්‍රශ්නයක් කවුරුත් ඒක ප්‍රශ්නයක් කරගන්න එපා.

● ඉන්දීය භාරතීය පක්ෂය ලංකාවේ දේශපාලනයට පැමිණෙන බවට එරට දේශපාලනඥයෙක් ප්‍රකාශ කර තිබෙනවා?

එය අපි හෙළා දකිනවා. එවැනි අවස්ථාවක් කිසිසේත්ම නැහැ. පුද්ගලයකුගේ මතයක් ඉන්දියානු රජයේ මතය නොවෙයි.

ෆේස්බුක් මිතුදමෙන් ජීවිතය අහිමි වූ ගුරුවරයා

ඝාතනය වූ සාමෙන් හිරන්ත

මාතර නගරයේ ගොඩනැඟිල්ලකට වූ ආරවුලක්

පැහැර ගැනීම සීදුවෙන්; මළසිරුර කොටවෙහෙරෙන්

නිලධාරීන්ගේ සූක්ෂ්ම විමර්ශනයකින් සුල-මුල එළියට

● අමිල මලවිසූරිය

අපරාධකාරයන් වෙර දරන්නෙ සිය අපරාධ සඳා වැළලී යන ආකාරයෙන් සැලැසුම් කිරීමටයි. එහෙත් අතිදක්ෂ පොලිස් නිලධාරීන්ගේ සූක්ෂ්ම විමර්ශන නිසාවෙන් බොහොමයක් අපරාධයන්හි සුලමුල දින ගණනාවකින්ම අනාවරණය කරගැනීමට සමත්වන්නෙ සැකකරුවන්ද සමඟිනි. මෙකී අපරාධයද සීදුව පොලිසියේ විමර්ශන නිලධාරීන්ගේ පුළුල් විමර්ශනයක ප්‍රතිඵලයක් නිසාවෙන් සැකකරුවන් සමඟ සුල-මුල අනාවරණය කරගත්තෙ දින සයක් වැනි කෙටි කාලයක් තුළදීයි.

සාමෙන් හිරන්ත ප්‍රනාන්දු 24 හැවිරිදිය. ඔහු මග්ගොන, දියලගොඩ පදිංචි පිරිමි සහෝදරයන් තිදෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමලාය. කලහේ සුමංගලෝදය විද්‍යාලයෙන් සිප්සතර හැදෑරීමෙන් පසු ගණිතය, විද්‍යාව සහ තොරතුරු තාක්ෂණ ගුරුවරයකු ලෙසින් කටයුතු කළ සාමෙන් 'ක්‍රිස්ට්' විනර් අධ්‍යාපන ආයතනය නමින් ආයතනයක්ද පවත්වාගෙන යමින් සිසු දරුවන්ගේ නිවෙස්වලටද ගොස් සිප්සතර ඉගැන්වීම් කළේය. සාමෙන් විවාහ වූයේ මාතර ප්‍රදේශයේ වෙසෙන 21 හැවිරිදි තරුණියක වන රමේෂා සමඟිනි. ඒ මුහුණුපොත මඟින් හඳුනා ගැනීමෙන් පසු මීට වසර දෙකකට පමණ පෙරදීය. සාමෙන් සාමාන්‍ය පවුලක වුවත් ඔහුගේ බිරිය රමේෂාගේ පාර්ශ්වය ධනවතුන්ය.

රමේෂාගේ දෙමාපියන්ට මාතර නගර මධ්‍යයේ නිල්වලා නදිය ආසන්නයේ විශාල තට්ටු ගොඩනැඟිල්ලක්ද තිබුණාය. එම ගොඩනැඟිල්ල කලෙක සිටම කුලී පදනමට දී තිබුණේය. පසුගිය කාලයේ එහි කුලී පදනමට ව්‍යාපාර කටයුතු කළේ චින්තක මධුෂාන්ය. චින්තකට පෙර එම ගොඩනැඟිල්ලෙහි චින්තකගේ පියාණන්ද කුලී පදනම මත ව්‍යාපාර කටයුතු කර තිබිණි. පසුව චින්තකද එම ගොඩනැඟිල්ලෙ පවත්වාගෙන ගිය ව්‍යාපාර කටයුතු දියුණුවට පත්කරමින් යහමින් මුදල් හරිහම්බ කරමින් සුපිරි යානවාහනද සතුව විසුවේය.

ගොඩනැඟිල්ල හිමිකාරිය වූ රමේෂාගේ මව රුවනි ශානිකා 2018 ජනවාරි 12 වැනිදා රාවතාවත්තෙ සිය ඥාතියෙකුගේ නිවෙසට පැමිණ සිටියදී සාහසික පිරිසක් විසින් කුරිරු ලෙස ඝාතනය කර තිබුණාය. තවමත් නොවිසඳුණු එම අපරාධය පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ වන විටත් විමර්ශනයක් සිදුකරමින් සිටී. මවගේ අනපේක්ෂිත ඝාතනයෙන් පසු එම ව්‍යාපාරික ගොඩනැඟිල්ලෙහි හිමිකාරිත්වය පවුලේ එකම දරුවා රමේෂා සතු වූවාය. රමේෂා සහ චින්තක අතර කලක් ප්‍රේම සබඳතාවක්ද තිබී ඇත. ඉන් වෙන්වුණු රමේෂා මුහුණුපොත මඟින් හඳුනාගත් සාමෙන් හිරන්ත හා විවාහ වූහ.

එම විවාහයත් සමඟ මාතර නගර මධ්‍යයේ අනගාරික ධර්මපාල මාවතේ පිහිටි රුපියල් කෝටි 40ක් පමණ වටිනාකමින් යුත් මැදගොඩ ව්‍යාපාරික ගොඩනැඟිල්ලෙ හිමිකාරිත්වයද සාමෙන්ට ලැබිණි. ඒ වන විට එහි කුලී පදනම මත චින්තක ව්‍යාපාරයක් පවත්වාගෙන යමින් සිටියේය. එහෙත් චින්තක නිසි පරිදි කුලී මුදල්ද නොගෙවා තිබූ හෙයින් සාමෙන් අධිකරණයේ නඩුවක් ගොනුකොට කුලී ගිවිසුම් කාලය ඉකුත් වීමටත් මත්තෙන් චින්තක එම ගොඩනැඟිල්ලෙන් ඉවත් කිරීමට කටයුතු කෙරිණි. ඒ, ගිය වසරේදීය. එහිදී නිඟ බදු වාරික මුදල්ද ගෙවීමට වූ හෙයින් චින්තක, ඔහු සතුව තිබූ සුපිරි මෝටර් රථයක්ද විකුණා දමා ඇති බවකි.

මිගමුව කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරා

සීදුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කෝසල ලියනාරච්චි

සීදුව අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුභාෂ් ප්‍රියදර්ශන

එම කෝන්තරයත් සමඟින් චින්තක, සාමෙන් සමඟ බද්ධ වෛරයෙන් පසුවිය. සාමෙන් නැතිබැරි අයවලුන්ට උදවු උපකාර කිරීමට බොහෝ අවස්ථාවල ඉදිරිපත් වූ අයෙකි. මේ අතර සාමෙන් පසුගිය දිනෙක මුහුණුපොතේ සැරිසරද්දී සීදුව ප්‍රදේශයේ ඇගලුම් කම්හලක සේවයෙහි නිරත බවට සඳහන් තරුණියකගෙන් කෙටි පණිවිඩයක් ලැබී තිබුණාය.

"අනේ මගේ තාත්තට අංශභාගේ... අපි හරිම දුප්පත් අය... මම කටුනායක වෙළෙඳ කලාපෙ ගාමන්ට් එකක වැඩ කරන්නෙ..." එම කෙටි පණිවිඩයට සාමෙන්ගෙ හිත උණු වීමත් සමඟින් ඔහු ඇයට උදවු කිරීමට ඉදිරිපත් වෙමින් තරුණියගේ පියාණන් බැලීමටද යාමට සැරසුණේය. ඒ අනුව පසුගිය හත්වැනිදා සාමෙන් එම තරුණියට පවසා තිබුණේ,

"හෙට උදේ මං එනවා ඔයාව මුණගැසෙන්න... ඔයාගේ තාත්තවත් මට බලන්න ඕනෙ..." ඒ අනුව පසුගිය 8 වැනිදා පෙරවරුවේ සාමෙන් මග්ගොන නිවෙස් ආසන්නයේ මිත්‍රයෙක් වන වසන්ත සමඟ ඔහුගේ වෑන් රථයෙන් ඇයව මුණගැසීමට ගියහ. ඒ, රුපියල් දහපහළොස් දහසක වියළි ආහාර මල්ලක්ද රැගෙනයි.

"අයියේ... ඔයා සීදුවේ මුතුවාඩිය පාලම පහු කරලා මීටර් පන්සීයක් විතර එන්න... අපේ ගෙදර ඇතුළට වෙන්න තියෙන්නෙ... මම ප්‍රධාන පාර අද්දර ඉන්නම්..."

අධිවේගී මාර්ගය ඔස්සෙ ගිය දෙදෙනාට පෙරවරු 9.30 පමණ වෙද්දී ඇයකී ස්ථානයේදී ඇයව හමු වූහ. අනතුරුව වසන්ත රථයේ සිටිද්දී සාමෙන් ඇය හා කතාබස් කරමින් සිටියහ. ගතවූයේ නිමේෂයකි. විදුලි වේගයෙන් පැමිණි ප්‍රියස් වර්ගයේ හයිබ්‍රිඩ් රථයක් දෙදෙනා සිටි ස්ථානයේ නතර විණි. කිසිවක් කිසිවකුට සිතා ගැනීමටවත් නොහැකි විණි. රථයෙන් බැසගත් දෙදෙනෙක් සමෙන් සහ තරුණිය එම රථයට දමාගෙන සැණින් පලා ගියහ.

කලබලයට පත් වසන්ත ඒ බව දැන්වූයේ සාමෙන්ගේ මවට සහ බිරියටයි. ඔහු පැහැරගෙන පැය කිපයකට පසු සීදුව පොලිසියට පැමිණිලි කළේ වසන්ත සමඟ සාමෙන්ගේ මවත් බිරියත් පැමිණයි.

සීදුව පොලිසියට ලැබුණු සාමෙන් පැහැරගත් පැමිණිල්ල පිළිබඳව මීගමුව කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරාගේ උපදෙස් මත සීදුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කෝසල ලියනාරච්චිගේ මෙහෙයවීමෙන් එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුභාෂ් ප්‍රියදර්ශන ප්‍රමුඛ කණ්ඩායමක් විමර්ශන ආරම්භ කළහ.

මේ අතර පසුගිය දහවැනිදා සවස් යාමයේ නිකවැරටිය පොලිස් කොට්ඨාසයේ කොටවෙහෙර පොලිස් වසමේ කැලෑ රොදක නිරුවත් මළසිරුරක් තිබෙන බවට කොටවෙහෙර පොලිසියට තොරතුරක් ලැබිණි. එකී මළසිරුර පිළිබඳව පොලිස් මූලස්ථානය දැනුම්වත් කිරීමෙන් පසු එම මළසිරුර සීදුවේදී පැහැර ගැනීමට ලක්වූ සාමෙන්ගේ සිරුර බව ඔහුගේ බිරිය රමේෂා සහ වසන්ත විසින් හඳුනා ගත්හ.

සාමෙන් සහ තරුණිය යන දෙදෙනාගෙන් සාමෙන්ගේ සිරුර පමණක් පැහැර ගැනුණු ප්‍රදේශයේ සිට කිලෝමීටර් සිය ගණනකට ඇතින් හමුවීම පිළිබඳව පොලිසියටද ප්‍රහේලිකාවක් පැන නැඟිණි.

කෙසේ හෝ සීදුව පොලිසිය සිදුකළ සීසීටීවී කැමරා දසුන් දහස් ගණනක තොරතුරු ඔස්සෙ පසුගිය 14 වැනිදා සාමෙන් පැහැරගෙන ඝාතනය කිරීමේ සුල-මුල අනාවරණය කරගත්තෙ සැකකරුවන් සිවුදෙනෙකුද සමඟිනි. ඒ ප්‍රධාන සැකකරු මාතර, මැදගොඩ ව්‍යාපාරික ගොඩනැඟිල්ලෙ කුලී පදනම මත සිටි වීරකැටියේ පදිංචි 29 හැවිරිදි චින්තක මධුෂාන් සමඟ වීරකැටියේම වූ 36 හැවිරිදි චතුරංග හෙවත් කුමාර, මාලිම්බඩ අයෙක් වන 19 හැවිරිදි තුෂාර රාජුබායි සහ හුළංපිටියේ පදිංචි 25 හැවිරිදි ලක්මාල් හෙවත් මීගස්ආර සමඟින් සාමෙන් කුට උපක්‍රමයක් යොදා සීදුවට ගෙන්වාගත් හක්මණ කිරින්ද-පුහුල්වැල්ලෙ පදිංචි 22 හැවිරිදි සජිත්‍රානිය.

"සර්... සාමෙන් නියමිත බදු කාලය ඉක්ම යන්නටත් පෙර මාව කඩෙන් අයින් කළා... ඒකෙන් මාව නැත්තටම නැතිවුණා... ඒ නිසයි මං මේ දේ කළේ..." ගිය වසරේ ව්‍යාපාරික ගොඩනැඟිල්ලෙන් ඉවත් කිරීමත් සමඟ සාමෙන් සමඟ දැඩි වෛරයෙන් පසුවූ චින්තක, වරක් සාමෙන්ව ඔහුගේ මග්ගොන නිවෙසේදීම ඝාතනය කිරීමටද සැලැසුම් කළත් එය ව්‍යර්ථ වී තිබූ බවද අනාවරණය වූහ.

අනතුරුව සාමෙන් කෙසේ හෝ වෙනත් ප්‍රදේශයකට රැගෙන යාමට චින්තක කුට උපක්‍රමයක් යෙදුවේ සජිත්‍රානි මඟින් ව්‍යාජ මුහුණු පොතේ ගිණුමක් අරඹමිනි. සජිත්‍රානි, චින්තකගේ බිරියගේ යෙහෙළියකි. ඇයට සාමෙන් වෙනත් ප්‍රාදේශයකට රැගෙන යාමට ලක්ෂ පහක් දීමට පොරොන්දු වී ඇත. එම උප්පරවැට්ටියට සජිත්‍රානි සීදුවට යවා එම ප්‍රදේශයෙන් රුපියල් දසදහසකට කුලී නිවෙසක්ද රැගෙන දී තිබුණේ චින්තක විසිනි. පසුගිය අටවැනිදා සාමෙන් සහ සජිත්‍රානි කතාබස් කරමින් සිටියදී චින්තක සහ තවත් සිවුදෙනෙකුගෙන් යුත් කණ්ඩායම පැමිණ දෙදෙනා පැහැර ගත්තත් සජිත්‍රානි අතරමගදී රථයෙන් බස්සා තිබුණේ රුපියල් විසිදහසක්ද ලබා දෙමිනි.

පසුව රථය තුළදී සාමෙන්ට දසවධ දී ලණුවකින් ගෙල සිඳ ඝාතනය-කොට ඇඳුම්ද ගලවා දමා සිරුර කොටවෙහෙර කැලෑරොදකට දමා ගොස් තිබුණේ පැහැරගත් දිනමයි. සාමෙන් මියගියේ ද යන්න සැක සිතූ පිරිස මඳ දුරක් ගොස් නැවත පැමිණ සාමෙන්ගේ සිරුරට මන්නයකින්ද කොටා යාමට තරම් සාහසික වී තිබේ.

සාමෙන් පැහැරගත් මොහොතේ ක්‍රියාත්මකව තිබූ අවට සීසීටීවී කැමරා දසුන් දහසකට වඩා නරඹා තිබිණි. එහිදී සාමෙන් පැහැරගත් රථයේ අංකය හඳුනාගැනිණි. ඒ වෙසෙල් වර්ගයේ රථයක් බවයි. එහෙත් ඔහු පැහැරගෙන තිබුණේ ප්‍රියස් වර්ගයේ රථයකිනි. ඉන් පොලිසියට අනාවරණය වූයේ පැහැරගත්තවුන් ව්‍යාජ අංක තහඩුවක් රථයට සවිකොට පැමිණ ඇති බවයි. අනතුරුව එම අංක තහඩුව පිළිබඳව මුලින්ම විමර්ශනයක් සිදු කළේය.

"එම අංක තහඩුවට අදාළ රථය පාණදුරේ රෙදිපිළි ව්‍යාපාරිකයකුගේ බවට අපට හෙළි වුණා. මොහු පැහැරගත් අටවැනිදා අලුයම තුනට විතර එම වෙසෙල් රථයෙන් ව්‍යාපාරිකයා පාණදුරේ වෙළෙඳසලට ඇවිත් තියෙනවා. ඒ අවස්ථාවේ තමයි අංක තහඩු ගලවාගෙන තියෙන්නෙ..." විමර්ශනවලට එක්වූ උසස් පොලිස් නිලධාරියෙක් අපට කිව්වේය. එලෙස සාමෙන් පැහැරගත්තවුන් එම වෙසෙල් රථයෙන් අංක තහඩු ගලවාගෙන යන ආකාරය අසල සීසීටීවී කැමරාවකද මනා ලෙස සටහන් වී තිබිණි. පසුව රථයේ හිමිකරු විසින් ඒ බව පොලිසියටද පැමිණිලි කෙරිණි.

පසුව සාමෙන් පැහැරගත් රථයේ අංක තහඩුව ඔස්සෙ සිදුකළ විමර්ශනවලටද 'තිත' තැබීමට වූයේ තවදුරටත් ඒ ඔස්සෙ විමර්ශන සිදුකිරීමට තොරතුරු කිසිවක් නොවූ හෙයිනි.

එහෙත් එම රථය ගමන් කළ මාර්ගයේ සීසීටීවී කැමරා දසුන් පිරික්සූ නිලධාරීන් අධිවේගී මාර්ගයේ ගැලනිගම පිවිසුමේ සීසීටීවී කැමරාවන්ද පරීක්ෂා කළේය. එහිදී විමර්ශන නිලධාරීන්ගේ ඇස ගැටුණේ සාමෙන් පැහැරගත් රථය, එහි සැබෑ අංකයෙන් එම පිවිසුමෙන් පිටවන ආකාරයයි. එම අංකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂා කිරීමේදී රථයේ හිමිකරු සාමෙන් සමඟ ඉකුත් කාලයේ දැඩි වෛරයකින් සිටි චින්තක මධුෂාන්ට අයත් බවයි.

අනතුරුව චින්තක මධුෂාන් අත්අඩංගුවට ගෙන සිදුකළ ප්‍රශ්න කිරීම් ඔස්සෙ සාමෙන් සීදුවට කැඳවාගත් සජිත්‍රානිද හක්මණ, කිරින්දේදී අත්අඩංගුවට ගත්තාය. සීදුව පොලිසිය පවසන්නෙ මෙකී ඝාතනයට සම්බන්ධ මොරටුව, අඟුලානේ තවත් සැකකරුවෙක්ද අත්අඩංගුවට ගැනීමට නියමිත බවයි. සජිත්‍රානි සහ සෙසු සැකකරුවන් මීගමුව අතිරේක මහේස්ත්‍රාත් චම්පික රාජපක්ෂ මහතාවෙත ඉදිරිපත් කිරීමෙන් පසු සජිත්‍රානි රක්ෂිත බන්ධනාගාරගත කිරීමටත් ප්‍රධාන සැකකරු චින්තක ඇතුළු පිරිස 21 වැනිදා දක්වා රඳවා තබාගෙන ප්‍රශ්න කිරීමට සීදුව පොලිසියට අවසර ලැබිණි.

"සර්... රමේෂාගේ අම්මා මරපු එකනම් මං දන්නෙ නෑ..." චින්තක එසේ කීවද පොලිසිය සාමෙන්ගේ නැන්දම්මාගේ ඝාතනයටද මෙකී සැකකරුවන්ගේ සබඳතාවක් තිබේද යන්න පුළුල්ව විමර්ශනයක් සිදුකරමින් සිටී.

බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ගේ ඍජු අධීක්ෂණයෙන් මීගමුව කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරාගේ උපදෙස් මත සීදුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කෝසල ලියනාරච්චිගේ මෙයෙවීමෙන් එහි අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සුභාෂ් ප්‍රියදර්ශන ඇතුළු උපපොලිස් පරීක්ෂක රණතුංග, කොස්තාපල්වරුන් වන 33256 කුමාරදාස, 60302 මංජුල, 79888 තිලකරත්න, 72566 හේරත් සහ 257323 විතාරණ ඇතුළු නිලධාරිනු විමර්ශන සිදු කරති.

යුද්ධයක් නැතත් අපේ ශක්තිය

නවත් වැඩි කරනවා

ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ

● තාරක වික්‍රමසේකර

රටක ගුවන් හමුදාව යනු ගොඩ බිම මුහුදු හා උඩුගුවනේ ආරක්ෂාව පිණිස කටයුතු කරන ආරක්ෂක හමුදාවකි. එමෙන්ම සෙසු ආරක්ෂක අංශවලද මෙහෙයුම් උදෙසා සහයෝගය ලබා දෙන හමුදාවකි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සැමරුම යෙදී ඇත්තේ මාර්තු 2 වෙනිදාටය. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 18 වන ගුවන් හමුදාපතිවරයා වන එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ මෙවර සිළුමිණ සමඟ අදහස් දක්වන්නේ ගුවන් හමුදාවේ වත්මන් කාර්ය-භාරය ගැන මෙන්ම ඉදිරි ක්‍රියාකාරිත්වයන් සම්බන්ධයෙනි.

■ ඔබ ගුවන් හමුදාපතිවරයා ලෙස පත්වීම් ලැබූ අවස්ථාවේදී පැවසුවා අංශ 4ක් ඔස්සේ ගුවන් හමුදාව ඉදිරියට ගෙන යන බව කොහොමද දැන් එහි ප්‍රගතිය.

මා පැවසූ ලෙසින්ම එම ඉලක්ක 4 කරා යමින් සිටිනවා. එයින් පළමු ඉලක්කය ලෙසින් ගුවන් හමුදා ශක්තිය වැඩි කිරීම පිණිස ගුවන් යානා පූර්ණ නඩත්තුවකට ලක් කරමින් ඉදිරි කටයුතු කරගෙන යනවා. එම ගුවන්යානාවලින් 50%ක් පමණ සංඛ්‍යා-වක් පූර්ණ අලුත්වැඩියා කිරීම පිණිස විදේශ රටවල් සමඟ මේ වන විට ගිවිසුම් අත්සන් කර තිබෙන්නේ. සෙසු ගුවන් යානාත් ඒ ලෙසින්ම පූර්ණ අලුත්වැඩියාවන් සඳහා යොමු කිරීම මේ වසරේදීම සිදුකරනවා.

දෙවැන්න ලෙසින් පැවසූ මුහුදු ආර-ක්ෂණය සම්බන්ධයෙන්ද අපි මේ වන විටත් ආවරණ කටයුතු කරමින් පවතින්නේ. ශ්‍රී ලංකාව දූපතක් නිසා මිත්‍ර රටවල සහයෝ-ගයෙන් එම කටයුතු සිදු කරන්නට අප සැල-සුම් සකස් කර තිබෙනවා. ඒ සඳහා නවීන තාක්ෂණික පහසුකම් පවා අපට හිමිව තිබෙනවා. රජයේත් අවසරය මත විදේශ රටවල් දෙකකින් නවීන පහසුකම් ඇති ගුවන් යානා ලබා ගැනීමට කටයුතු කර තිබෙනවා. ඒ මඟින් ගුවන් ආරක්ෂාව සම්පූර්ණයෙන්ම ආරක්ෂා කර ගන්න පුළුවන් වේවි. තුන්වැන්න ලෙසින් මා පැවසුවේ නවීන තාක්ෂණය යොදා ගැනීමයි, විශේෂයෙන්ම සයිබර් තාක්ෂණය සම්බ-න්ධව අප වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. ඒ කාර්යය සඵල කර ගැනීම පිණිස සයිබර් තාක්ෂණ-යට දක්ෂතා ඇති අය බඳවා ගැනීම් සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසු-කම් ඇති කර තිබෙනවා.

ඊට අමතරව නියමුවන් රහිත යානා භාවිතය යළි ස්ථාපිත කිරීමටත් අප කටයුතු යොදා තිබෙනවා. මෙහිදී විශේෂයෙන්ම පැව-සිය යුතුයි, ආසියාවේ පළමු-වෙන්ම නියමුවන් රහිත යානා භාවිත කෙළේ අපි. අද වන විට අපේ නියමුවන් රහිත යානා භාවි-තය '0' දක්වා පහළට ඇවිත්. මේ තත්ත්වය වහාම නඟා සිටුවීමටයි කටයුතු කරන්නේ.

එසේම ස්වභාවික උවදුරුවලදී රටට අවශ්‍ය සහාය දීමේ ක්‍රමවේ-දය වර්ධනය කිරීම මගේ සිතුවෙනි අරමුණ වුණා. අප විදේශීය තාක්ෂ-ණය හා උපාංගත් ඒ වෙනුවෙන් වැඩියෙන් භාවිත කරනවා.

■ ඔබ පැවසුවා නියමුවන් රහිත යානා යළිත් පණ ගන්වන බවක්. මෙරටදීම එම යානා තැනීමට කටයුතු කරන බවත් මීට පෙර අවස්ථාවකදී ඔබ පැවසුවා.....

අපේ නිෂ්පාදන ක්‍රමවේදය ඉතාම සාර්ථකයි. අපි හදපු නියමුවන් රහිත යානාව මාර්තු මාසයේ ගුවන් හමුදා 70 වන සංවත්සරයේදී එළි දක්වනවා. ඉදිරියේදීත් එම යානා එලෙසින්ම වැඩි දියුණු කරනවා.

■ විදේශීය රටවල් දෙකකින් නවීන පහසු-කම් ඇති යානා ලබා ගන්නා බව ඔබ පැවසුවා, එයින් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන කාර්යයන් ගැන හැඳින්වීමක් කළොත්..

ශ්‍රී ලංකාව දූපතක්. මේ නිසා මුහුදු මඟින් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය හෝ මෙරට කේන්ද්‍රස්ථාන-යක් කරගෙන වෙනත් රටවලට යළි අපනයනය කිරීමට හැකි තත්ත්වයක් තියෙනවා. එමෙන්ම අනවසර සංක්‍රමිකයන් පැමිණෙන්න පුළුවන්. ඒ වගේම මුහුදු මඟින් තහනම් භාණ්ඩ ගෙන එනවා. අපේ මත්ස්‍ය සම්පත විදේශ ධීවරයන් හොරෙන් ලබා ගන්නවා. ඒ සියලු ක්‍රියාදාමයන් වළක්වාලීම පිණිස නවීන පහසුකම් වලින් යුතු යානා හරහා ආවේක්ෂණ කටයුතු සිදු කරන්න පුළුවන්. එසේම නාවික හමුදාව හා වෙරළාර-ක්ෂක බලකාය සමඟ එකතු වී මෙරට සීමාවේ මුහුදෙන් සිදු කෙරෙන සියලු ජාවාරම් මේ හරහා මැඩ පවත්වන්නට පුළුවන් වේවි.

■ කොවිඩ් මර්දනය හමුවේ ගුවන් හමුදාවේ දායකත්වය ගැන පැහැදිලි කළොත්...

කොවිඩ් රෝග ව්‍යාප්තිය මෙරට ආරම්භ වීමටත් පෙර සිටියි අප ඒ සඳහා කටයුතු කෙළේ. වූහාන්වල සිට ශිෂ්‍ය කණ්ඩාය-මක් ගුවන් මඟින් ගෙන ඒමේදී ගුවන් හමුදා ජීව විද්‍යාත්මක රසායනික විකිරණශීලී හා න්‍යෂ්ටික පුපුරණ ද්‍රව්‍ය සඳහා ප්‍රතිචාර දැක්වීමේ පක්ෂාංගය (CBRNE) තමයි ඒ වෙනුවෙන් මුල් වී කටයුතු කෙළේ. අපට බාර දී ඇති රාජ්‍ය ආයතන සම්බන්ධ ක්‍රියාකාරිත්වයන්ට අමතරව අපි මේ වෙනකොටත් කොවිඩ් රෝගීන් වෙනු-වෙන් මධ්‍යස්ථාන 5ක් පවත්වාගෙන යනවා.

එමෙන්ම රජයෙන් අපට දැනුම් දෙන ස්ථාන විෂබීජහරණයටත් අප කටයුතු කරනවා. එහිදී පාසල් මෙන්ම පොදු ස්ථාන රැසක් විෂබීජහර-ණය කළා. ඒ වගේම පසුගිය දිනවල කොවිඩ් මර්දන එන්නත අපේ ඉදිරි පෙළේ හමුදාවන්ට ලබා දී ඒ හරහා ඔවුන්ගෙන් වඩාත් කාර්ය-ක්ෂම සේවාවක් ලබා ගන්නට කටයුතු කරමින් ඉන්නේ.

■ ගුවන් හමුදාවට දැන් වසර 70ක් මේ කාලයේ සේවාව, විශේෂයෙන්ම යුද්ධයේදී කළ සේවාව ගැන ජනතාවට යමක් දැනුම්වත් කළොත්....

වසර 70ක කාලයක් කියන්නෙ සුළු කාලයක් නෙමෙයි. මේ කාලය ඇතුළත ගුවන් හමුදාවේ නිලධාරීන් 4000ක් පමණ හා සෙසු නිලයන් ලක්ෂයකට ආසන්න සංඛ්‍යාවක් සේවය කර තිබෙනවා. මට පෙර ගුවන් හමුදාපතිවරුන් 17 දෙනකු සේවය කර තිබෙනවා. ශ්‍රී ලංකාව ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදාගැන්මට ගුවන් හමු-දාවේ 443 දෙනකු දිවි පුදා තිබෙනවා. එයින් 43ක්ම ගුවන් නියමුවන්. යුද සමයේ ගුවන් හමු-දාවේ නියමුවන් හිටියේ 150ක් වගේ සංඛ්‍යා-වක්. එයින් 43ක් මියගියා කියන්නේ 1/3ක් වගේ සැලකිය යුතු පිරිසක්. ඒ සියලු දෙනාගේ ධෛර්යය කැපවීම මතයි අපි මේ ගමන ආවේ.

■ වර්තමානයේ සමාජ සුබ සාධනය පිණිස ගුවන් හමුදාවේ දායකත්වය ගැන සඳහන් කළොත්.....

ගුවන් හමුදාව කියන්නේ මහජන මුද-ලින් යැපෙන ආයතනයක්. එම නිසා අපි අනිවාර්යෙන්ම ජනතාව වෙනුවෙන් උපරිම වශයෙන් ජනතා සේවාවන් ඉටු කළ යුතු වෙනවා. මෙවර ගුවන් හමුදා 70 වන සංවත්සරය නිමිත්තෙන් අනුරා-ධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑවේ කණුගහවැව කියන ඉතාම දුෂ්කර පිටිසර ගම්මානයක් නඟා සිටුවීමේ වගකීම ජනාධිපතිතුමා අපට පවරා තිබෙනවා. ඒ කටයුත්ත මේ වන විට අප උපරිමයෙන් සිදු කරමින් ඉන්නේ. අපි ගම්මානයේ කුඩාම පැල්පත් 25ක් වෙනුවෙන් නිවාස තැනීමට කටයුතු කළා. එයින් මේ වන විටත් නිවාස 14ක් සම්පූර්ණයෙන්ම නිමකර අවසන්. ඉතිරි නිවාසත් මේ මාසය නිමාවන විට තනා නිම කරනවා.

විශේෂයෙන්ම නාගරික සංව-ර්ධන අධිකාරියේ සැලසුම් අනුව ගම්මානයේ බොහෝ කටයුතු සිදු කරන්නට අප කටයුතු යොදා තිබෙනවා. මේ ගම්මානයේ සංවර්ධන කටයුතු කෙටිකාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ලෙසින් අදියර වශයෙන් අප සිදු කරන්නේ.

ඒ යටතේ ඉදිරියේදී පාසලේ ගුරු නිවාසය, චතුර ටැංකියත් පිළිසකර කෙරෙනවා. ගමේ විහාරස්ථානයක් නවීකරණය කෙරෙනවා. ගමට අත්‍යවශ්‍ය අලිවැටත් අප සාදා අවසානයි.

එමෙන්ම දීර්ඝ කාලීන සැලසුම් යටතේ ගමට බස් රථ නැවතුමක්, බෙහෙත් ශාලාවක්, ප්‍රජාශාලාවක් ඇතුළු පහසුකම් සපයන්නත් අප බලාපොරොත්තු වනවා.

■ මේ වගේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන ගම්මානවල ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය පහළ මට්ටමක තියෙන්නේ. ඒ වෙනුවෙන් යමක් කරන්නට බලාපොරොත්තු වන්නේ නැත්ද?

ඒ වෙනුවෙන් කිසිදු ගම්මානයක මීට පෙර නොකළ ක්‍රියාදාමයක් අපි ආරම්භ කර තිබෙ-නවා. ඒ අනුව නාගරික සුපිරි පෙළැන්තියේ වගේ අපි ඒ හැම කෙනෙකුටම වෛද්‍ය ගොනු-වක් ස්ථාපිත කරනවා.

ඒ අනුව යම් රෝගයක් වැළඳෙන්නට පෙර පවා ප්‍රතිකාර ලබා ගන්නට ඔවුන්ට හැකි වෙනවා. ඒ වගේම රෝග ඉතිහාසය එක්වර වෛද්‍යවරයකුට නිගමනය කර ගන්නත් පුළු-වන්.

■ ගුවන් හමුදාව පසුගිය කාලයේ තණම-ල්විල ඇතුළු ප්‍රදේශවල සිදු කළ කංසා හේන් වැටලීමේ මෙහෙයුම් තවමත් සිදු කරනවාද?

අනිවාර්යෙන්ම ඒ කාර්යයන් දිගටම සිදු කර-නවා. අපි ගුවන් ආවේක්ෂණ කටයුතු සිදුකර අදාළ පුද්ගලයන් මෙන්ම කංසා වගාවන් ගැන නිරීක්ෂණ ලබා ගන්නවා. ඒ මඟින් වැරැදිකරු-වන් නීතියේ රැහැනට හසුකර ගැනීමට පහසුයි.

කොහොමත් පසුගිය දිනවල දිගින් දිගටම කේරළ ගංජා විශාල තොග ඉන්දියාවේ සිට ගෙන ඒමේදී අත්අඩංගුවට පත්වුණේ දේශීය වශයෙන් ගංජා නිපැයුම අඩුව ඇති නිසයි. නීති විරෝධී වගාකරුවන් අත්අඩංගුවට ගැනීම් දිගින් දිගටම සිදු වෙනවා.

■ ගුවන් හමුදාව කාලාන්තරයක් තිස්සේ මෙරට අභ්‍යන්තර ගුවන් ගමන් සිදු කළා. යුද්ධය අවසන් වෙලා සැහෙන කලක් ගතවෙලත් ඇයි තවමත් ඒ සේවාව ආරම්භ කෙළේ නැත්තෙ.

මේ වන විට අප සිවිල් ගුවන් සේවා අධි-කාරියෙන් අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා අනුමැතිය ඉල්ලා තිබෙනවා. ඉතා ඉක්මනින් ඒ සඳහා අනුමැතිය ලැබෙයි කියා හිතනවා.

■ ගුවන් හමුදා කඳවුරු පිහිටා තිබෙන්නේ ඉතාම සශ්‍රීක භූමිවලයි. විශේෂයෙන්ම වීරවිල, අම්පාර, හිඟුරක්ගොඩ වැනි කඳවුරු ආශ්‍රිතව වගා කටයුතු සිදු කිරීම් නොකරන්නේ ඇයි?

ගුවන් හමුදා කඳවුරුවලට ගුවන් යානා ගොඩබැස්සවීම් මෙන්ම ගුවන් යානා ගුවන්ගත කිරීම් සිදුවෙනවා. එවන් අවස්ථාවලදී පලතුරු ආහාරයට ගැනීමට කුරුල්ලන් පැමිණීමේදී ගුවන් යානා අනතුරුවලට ලක්වන්නට පුළු-වන්. එම නිසා කඳවුරු ආශ්‍රිතව යටි වගා සිදු කරන්නට පමණක් අවසර ලබා දී තියෙනවා. එම යටි වගාවන් කඳවුරුවල ප්‍රයෝජනයට ගන්නවා.

'අක්කර 60ක් ගුවනින් වගා කළා'

■ දේශීය වශයෙන් ගුවන් යානා හා ගුවන් හමුදා සේවා ගැන දැනුවත් කිරීමක් නැත්නම් පුනුණුවක් සිදු කරන්නට කටයුතු කළානම් එයට වැඩි විටිනාකමක් ලැබෙනවා නේද?

ගුවන් හමුදාවට, ගුවන් යානාවලට ආද-රය කරන තරුණ කොටස් ඉන්නවා. ඒකට අඩිතාලමක් ලෙස ගුවන් යානා ගැන හොයන පාසල් දරුවන්ට ඒ ගැන 'ඔන් ලයින්' පාඨමා-ලාවක් මේ වන විට ආරම්භ කර තිබෙන්නේ. එය නොමිලේම සිදු කරන සේවාවක්. කොවිඩ් වසංගත තත්ත්වය පහව ගිය සැණින් ගුවන් හමුදා කඳවුරු තුළ ගුවන් පාසල් ආරම්භ කර පාසල් සිසුන්ට ඒ අවස්ථාව නොමිලේම ලබා දෙන්නට අප කටයුතු කරනවා.

ඊට අමතරව කටුනායක තියෙන ගුවන් යානා නඩත්තු අංගණයේ චීනයේ නිෂ්පාදිත ගුවන් යානා සම්පූර්ණයෙන් අලුත්වැඩියා කිරීමට ලක් කරනවා. එහි පුහුණුව වගේම තාක්ෂණයත් ඉතා වටිනවා. එමෙන්ම අපේ කඳවුරුවලට අවශ්‍ය ඇතැම් උපාංග පවා අපි එහිදී නිපදවා ගන්නවා.

■ කෆීර් යානා යුද සමයේ විශාල දායක-ත්වයක් ලබා දුන්නා. දැන් ඒවායේ තත්ත්වය කුමක්ද?

අපි බලාපොරොත්තු වනවා කෆීර් යානා වසර 3ක් ඇතුළත සම්පූර්ණයෙන්ම අලුත්වැ-ඩියා කරන්න. ඒ සඳහා වන ගිවිසුම්වලට අත්සන් කරන්න කටයුතු යොදා තියෙන්නෙ.

■ කෆීර් යානා ශබ්දයේ වේගයටත් වැඩි වේගයකින් ගමන් කරන්නේ. යුද සමයේ අවශ්‍ය වුවත් අතිවිශාල මුදලක් වැය කර එවන් යානා තබා ගැනීමේ තේරුමක් තියෙනවද?

රටක් ලෙස අපේ ප්‍රහාරක ශක්තිය අත්‍යව-ශ්‍යයි. අපිට ඒ සඳහා අතීතයේ හොඳ පාඩම් තියෙනවා. පසුගිය ඊළාම් යුද්ධයේ ආරම්භය වන 1983 වසර වන විට අපට ගුවන් ප්‍රහාරක ශක්තියක් තිබුණේ නැහැ.

අපට ප්‍රහාරක ශක්තිය නිසි පරිදි සකස් කර ගන්නට හැකිවුණේ 1991 වසරේදීයි. ඒ කියන්නේ යුද්ධය ආරම්භ වී අවුරුදු 9ක් පමණ යනතුරු අපට ඒ සඳහා මුහුණ දෙන්න ප්‍රමාණවත් ගුවන් ප්‍රහාරක ශක්තියක් තිබුණේ නැහැ. එයින් සතුරා බලවත් වුණා. ජීවිත විශාල සංඛ්‍යාවක් අහිමි වුණා. එම නිසා මේ වන විටත් මුදල් ගෙවා ලබා ගෙන ඇති කෆීර් යානා නඩත්තු කර තබා ගැනීම අපේ ගුවන් ප්‍රහාරක ශක්තියට අවශ්‍යමයි.

■ එවන් ආකාරයට යුද්ධයේදී ලත් අත්දැකීම් මත ගෙන ඇති වෙනත් පියවර මොනවාද?

යුද සමයේ අත්දැකීම් ලත් නිලධාරී-න්ගෙන් කනිෂ්ඨ නිලධාරීන්ට ඒ අත්දැකීම් ලබා දෙන්නට කටයුතු කර තිබෙනවා. එසේ නොමැති වුවහොත් යම් අත්දැකීමක් ලබා ගන්නට ඒ නිලධාරීන්ටත් සැලකිය යුතු කාල-යක්, එහෙමත් නැත්නම් උවදුරක් පැමිණෙන තුරු බලා සිටින්නට සිදු වෙනවා.

■ දැන් යුද්ධය අවසන්. මේ වන විට ගුවන් හමුදාවේ පුමුඛ කාර්යයන් ලෙස හඳුනාගෙන ඇත්තේ මොනවාද?

ගුවන් හමුදාව ලෙසින් අපට මුහුණ දෙන්නට වන ප්‍රධාන කාර්යය තමයි සමුද්‍රීය ආරක්ෂණය ගුවනින් සිදු කිරීම. විශේෂයෙන්ම ගොඩබිම මෙන් 24 ගුණයක මුහුදක් අපට තිබෙනවා. එය ආවරණය කිරීම සුළු පටු නැහැ. අපේ මත්ස්‍ය සම්පත රැක ගැනීම මෙන්ම සමුද්‍රයට සිදු වන දූෂණ සම්බන්ධව සොයා බැලීමත් සාගරයේ වෙනත් සම්පත් ගැන සොයා බැලීමත් මෙහිදී අපට වැදගත් වෙනවා. එමෙන්ම දූපත් රටක් ලෙස අප නිරතුරුවම ජනතාව හා දේපළ ආර-ක්ෂාව වෙනුවෙන් පෙනී සිටිය යුතු වෙනවා. නාවික හමුදාව හා එක්ව සමුද්‍ර ආරක්ෂණ කටයුතු සිදු කිරීම අපෙන් එදත් අදත් කවදත් සිදුවන්නක්.

■ ගුවන් හමුදාව විසින් සිදු කරන වෙනත් සමාජ සේවාවන් තියෙනවද?

ඔව්, අපි මහජනතාව වෙනුවෙන් පවත්වන සුබසාධක කටයුතු අතර විශේෂයෙන්ම පැවසිය යුතුයි ශ්‍රී පාදස්ථාන මාර්ගය අවට පිරිසිදු කිරීම. අප සෑම වසරකම එය සිදු කරනවා. එමෙන්ම අපි ගුවන් පාපැදි සවාරිය වාර්ෂිකව පවත්ව-නවා. මෙරට ඉතා ජනප්‍රිය වගේම ආදරය දිනා-ගත් සයිකල් සවාරිය එයයි. දින 3ක් වෙනදා ගුවන් පාපැදි සවාරිය පැවැත්වුණත් මෙවර සෞඛ්‍ය ආරක්ෂිත ලෙසින් පැවැත්වීම උදෙසා එය එක් දිනකට සීමා කළා.

එමෙන්ම අපි මේ වසරේ රගර් ක්‍රීඩා තරගා-වලියකුත් පවත්වනවා. මේ ලෙසින් අපි මහජ-නතාව වෙනුවෙන් උපරිම ආකාරයෙන් බාධා මධ්‍යයේ වුවත් කටයුතු කරනවා.

■ ගුවන් මඟින් බීජ රෝපණ කටයුතු සිදු කළා. එය සාර්ථකද?

ඉතාම සාර්ථකයි. අපි බීජ 70,000ක් පමණ අම්පාර ලානුගල ජාතික වනෝද්‍යානයේ අක්කර 60ක පමණ භූමි භාගයකට ගුවන් මඟින් හෙළනු ලැබුවා.

විශේෂයෙන්ම අපට ඉතා වැදගත් ඇහැළ. මී, කරඳ, සියඹළා. කුඹුක්, කෝන්, මදටිය වැනි බීජ එසේ ගුවන් මඟින් හෙළනු ලැබුවා. අපට නිරීක්ෂණය වී තිබෙනවා එය ඉතා සාර්ථක ලෙසින් ඵල දරන බවට.

■ යුද්ධයේදී ඉමහත් මෙහෙයක් කළ ගුවන් හමුදා සේවාවට අන්තර්ජාතික වශයෙන් ඉල්ලී-මක් නැත්ද?

2014 වර්ෂයේ සිට එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාවෙන් ලැබුණු කැඳවීම මත මධ්‍යම අප්‍රිකාවේ සහ දකුණු සූඩානයේ අපේ ගුවන් හමුදා හෙලිකොප්ටර් බළ ඇණි දෙකක් ස්ථාපිත කරා. එයින් අපට විශාල විදේශ විනි-මයක් පවා ලැබුණා.

■ ඔබගේ ධුර කාලයේ ක්‍රියාවට නංවන්න වෙනත් සැලසුම් තියෙනවද?

මා පෙර සඳහන් කළ අපේ ගුවන් ශක්තිය හා ප්‍රහාරක ශක්තිය ඉහළ නැංවීම තමයි ප්‍රධානතම ඉලක්කය වන්නේ. එහිදී තාක්ෂණ-යත් නවීනතම අයුරින් යොදා ගන්නට කටයුතු කරන අතර දේශීය තාක්ෂණයෙන් අප බොහෝ දේ ලබා ගන්නට කටයුතු කරනවා.

සේයාරූ - සමන්ත වීරසිරි

'පාසල් සිසුන්ට නොමිලේ ගුවන් පාඨමාලා ඇරැඹුවා'

ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ

- අධ්‍යාපනය ලත් පාසල - මහනුවර ධර්මරාජ විදුහල
- නාවික හමුදාවට බැඳුණු දිනය 1985 07 02
- ගුවන් හමුදාපති ධුරයට පත්වීම - 2020.11.03

ලැබූ පදක්කම්

- විර වික්‍රම විභූෂණය දෙවරක්
- රණ වික්‍රම පදක්කම දෙවරක්
- රණ ශූර පදක්කම සිවුවරක්

කඩඉම්

- 1987 - අංක 3 සමුද්‍රීය බළඝණයේ නිරීක්ෂණ ගුවන් යානා නියමුවෙකු ලෙස පත්වීම
- 1989 - අංක 2 බළඝණයේ වයි-12 ගුවන් යානා නියමුවෙකු ලෙස පත්වීම
- 1990 - අංක 5 බළඝණයේ එෆ් 7 බීඑස් සුපර්සොනික් ප්‍රහාරක ජෙට් යානා නියමුවන් ලෙස බඳවා ගන්නා ලද පළමු ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් නියමුවන් සයදෙනා අතරටද ඇතුළත් වීම.
- 1995 - අංක 10 ප්‍රහාරක ජෙට් බළඝණයට අයත් කෆීර් ප්‍රහාරක ගුවන් යානා නියමුවෙකු වශයෙන් සේවයට එක් වීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රහාරක ගුවන් යානා බළ-ගණයන් ත්‍රිත්වයටම අණදීම හා 2007 වසර දක්වාම කෆීර් ප්‍රහාරක ජෙට් බළඝණයේ අණදෙන නිලධාරියා වීම
- 2011 - චීනවරාය ගුවන් හමුදා විද්‍යාපීඨයේ පීඨාධිපති ධුරයට පත්වීම

හීය

● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

අලි මදිවට හරක්

මේ වන විට මෙරට විසිරී සිටින කොවිඩ් -19 හෙවත් කොරෝනා ආසාදිතයන්ගේ සංඛ්‍යාව ලක්ෂයේ සීමාවට ආසන්නය. එමගින් සිදුවී තිබෙන මරණ සංඛ්‍යාව ද මේ වන විට 420 ත් ඉක්මවා තිබේ.

මේ අතර මහා බ්‍රිතාන්‍යය ඇතුළු රටවල් 82 ක ව්‍යාප්ත වී ඇතැයි කියන කොරෝනා ප්‍රභේදය ද මෑතකදී සිට ශ්‍රී ලංකාව ආක්‍රමණය කර ඇත. ආණ්ඩුවේ සෞඛ්‍ය බලධාරීන් විසින්ම සඳහන් කරන අන්දමට කොළඹ , බියගම , අවිස්සාවේල්ල සහ වවුනියාව වැනි ප්‍රදේශවලින් කොරෝනා නව ප්‍රභේදය වැලඳී ඇති රෝගීන් කිපදෙනෙකුම හඳුනාගෙන තිබේ. එමගින් පැහැදිලි වන්නේ අලි මදිවට හරක් ද වැට පැන ඇති බවකි.

කොරෝනා දෙවැනි රැල්ල මුලින්ම ඇරඹුණේ සීමිත ප්‍රදේශ කිපයකිනි. එහෙත් ආණ්ඩුවේ සෞඛ්‍ය බලධාරීන් එය කනකටවත් නොගෙන බකංනිලාගෙන සිටි බව පිළිගත යුතු කරුණකි.

ඔවුන් එලෙස තමන්ගේ හැකියාව පිළිබඳව අධි තක්සේරුවකින් පසුවූයේ කොරෝනා පළමු රැල්ල ඉතා කෙටි කාලයක් තුළ යම්තාක් දුරකට පාලනය කිරීමට හැකිවීම ගැන ස්වයං මෝහනයකට පත්වීමෙනි.

කෙසේ වෙතත් මෙරට කොරෝනා පළමු රැල්ල ජයග්‍රහණය කිරීමේ වීරයා වන්නේ යුද හමුදාපති ලුතිනන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වාය.

එතුමා ඇතුළු ආරක්ෂක අංශයේ සෙසු නිලධාරිනුත්, වෛද්‍යවරුන් සහ හෙද කාර්ය මණ්ඩලයත් මහජන පරීක්ෂකවරුන් සහ ග්‍රාම නිලධාරීන් මෙන්ම ගිලන්රථ රියදුරන් ඇතුළු බිම් මට්ටමේ සේවක පිරිසක් විසින් තම ජීවිතය පරදුවට තබා කළ එම උදාර පරිත්‍යාගය නිසා ලැබූ ජයග්‍රහණය වෙනත් පුද්ගලයන් විසින් ලබා ගැනීම ප්‍රශ්නකාරීය.

මේ අතර බරපතළ සිද්ධියක් පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ක්‍රියාකාරිකයකු වූ හරිත අලුත්ගමගේ මාධ්‍යට හෙළිකර තබුණේය.

ඔහු එහිදී කියා තිබුණේ මෙරට කොරෝනා ආසාදනය වීමෙන් මිය ගිය පුද්ගලයන්ගේ ප්‍රතිශතයද ආරම්භයේ පැවති සංඛ්‍යාවට වඩා බොහෝ සෙයින් ඉහළ ගොස් තිබෙන බවයි.

ඒ අනුව මුලින් පැවතුණේ මිලියනයක් පමණ වූ ජන සංඛ්‍යාවක් අතරින් කොරෝනා වයිරසය ආසාදනය වීමෙන් සිදුවන මරණ සංඛ්‍යාව 7ක් හෝ 8 ක් පමණ වීමය.

එහෙත් සති දෙකක් වැනි කෙටි කාලයක් ඇතුළත මිලියනයක් පමණ ජන සන්තතියක් තුළ සිදුවන කොරෝනා මරණ සංඛ්‍යාව 17ක් හෝ 18 ක් පමණ වන තුරු ඉහළ ගොස් ඇත. දැනට රට තුළ කොවිඩ් - 19 හෙවත් කොරෝනා වයිරසය පැතිරෙමින් පවතින වේගය අනුව එම මරණ සංඛ්‍යාව තව දුරටත් ඉහළ යාමට ඉඩ ඇතැයි යන සැකය ඔහුගේ එම විග්‍රහයෙන් පැහැදිලි වේ.

එසේ වුවද මෙම අඩු ලුහුඬුකම් ගැන මුනිවත රකින සෞඛ්‍ය බලධාරීන් ගිරවුන් සේ පුන පුනා කියන්නේ මේ දක්වා සුවය ලැබූ කොරෝනා ආසාදිතයන්ගේ සංඛ්‍යාව දිනෙන් දිනම ඉහළ යාම ගැනය.

ඔවුන් සඳහන් කරන අන්දමට කොරෝනා ආසාදිතයන්ගේ සංඛ්‍යාවත්, දිනෙන් දිනම සුවය ලබා ගෙදර යන අංශයේ සංඛ්‍යාවක් අතර පවතින්නේ ඉතා සුළු පරතරයකි.

ඇතැම්විට ඔවුන් ඒ පිළිබඳව වැඩි වැඩියෙන් හුවා දැක්වීමට උනන්දු වන්නේ ජනතාව කොරෝනා වයිරසයෙන් බේරා ගැනීම සඳහා මෙරට සෞඛ්‍ය බලධාරීන් විසින් යොදා ඇති සේවා කෙරෙහි ජනතාව තුළ යම් විශ්වාසයක් ගොඩ නැංවීමේ අදහසින් විය හැකිය. මෙරට වසංගත රෝග මර්දන ආයතනය සඳහන් වන අන්දමට එම ආසාදිතයන් අතරින් සීයයට 90 කටත් වඩා වැඩි පිරිසක් දැනට සුවය ලබා ඇති බව සත්‍යයකි. එසේ වූ පමණින් කොරෝනා වයිරසයේ පැතිරීම පාලනය කිරීමට හැකිවී ඇති බවක් එමගින් අදහස් නොකෙරේ.

ඒ අනුව කොරෝනා වයිරසයෙන් ජනතාව මුදවා ගැනීම සඳහා බිම් මට්ටමේ සිට අනගි මෙහෙවරක් සිදු කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ සභාපති උපුල් රෝහණ සඳහන් කරන අන්දමට මෙම තත්ත්වය තව දුරටත් පැවතුණ හොත් සිදුවන්නේ කොවිඩ් -19 හෙවත් කොරෝනා වයිරසයේ පැතිරීම වළක්වා ගැනීමේ හැකියාව ඔවුන් වෙතින් ගිලිහී යාමය.

එහෙයින් රජයේ සෞඛ්‍ය බලධාරීන් බේගල් වැපිරීම නතර කර අප හමුවේ පවතින මේ මහා වසංගතයට අධිෂ්ඨානශීලීව මුහුණදීමට දැන්වත් සිතට ගත යුතුය. එසේම අප රටක් වශයෙන් මුහුණ පා තිබෙන මෙම බරපතළ ව්‍යසනයේ බියජනක ස්වරූපය නිවැරදිව වටහා ගෙන රටේ සෞඛ්‍ය සංරක්ෂණ මාර්ගෝපදේශයන් අකුරටම පිළිපදිමින් තම දෛනික දිවි පෙවෙත ගත කිරීමට අප කවුරුත් සිතට ගත යුතුය.

● මංජුලගේ ප්‍රසාද්

එදා වසංගතවලදී අද විපක්ෂය සිටියා නම්..

“මට නම් කොරෝනා එන්නත එපා. මං කොරෝනා එන්නත ගහන්නේ සාමාන්‍ය ජනතාවට දීමෙන් පසුවයි.” යනුවෙන් සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයා පසුගිය දා ප්‍රකාශ කළේය.

ඒ සමගම ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් ප්‍රකාශ කළේ ඔවුන්ගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තිදෙනා ද කොරෝනා එන්නත ලබා නොගන්නා බවයි. නමුත් විපක්ෂයේ ප්‍රබලයකු වන සජිත්ගේ සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක තිස්ස අත්තනායක ප්‍රකාශ කරන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදෙන කොරෝනා එන්නත සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුම ලබාගත යුතු බවයි.

“මහජන නියෝජිතයන් රටේ පොදු මහජනතාව අතරට යන නිසා එම මහජන නියෝජිතයන්ගේ මෙන් ම පොදු මහජනතාවගේ ද ආරක්ෂාව වෙනුවෙන් මෙම එන්නත ලබා ගැනීම ඉතාම වැදගත්” යනුවෙන් තිස්ස අත්තනායක විසින් පෙන්වා දෙන ලදී.

“එක එක්කෙනා කුමන ප්‍රකාශ කළත් පාර්ලිමේන්තුවේ 225 දෙනාට ම එන්නත් ලබාදීම ඉතාම වැදගත්” යනුවෙන් සමගි ජන බලවේගයේ සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා ප්‍රකාශ කළේ පසුගිය 18 වැනි දා පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවති පක්ෂ රැස්වීමේදී ය.

සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රකාශ කරන්නේ කොරෝනා එන්නත මන්ත්‍රීවරුන් ලබාගත යුත්තේ අන්තිමට බවයි. සජිත් එසේ ප්‍රකාශ කරන විට සජිත්ගේ පක්ෂයේ සභාපති සරත් ෆොන්සේකා සහ ජාතික සංවිධායක තිස්ස අත්තනායක ප්‍රකාශ කරන්නේ කොරෝනා එන්නත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදිය යුතු බවයි.

කොරෝනා එන්නත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබා දෙන විට එය මුලින් ම ලබාගත් මන්ත්‍රීවරයකු වනුයේ තිස්ස අත්තනායකයි.

තිස්ස හා සරත්ට තේරෙන යථාර්ථය සජිත් විපක්ෂ නායකයාට නොතේරෙන්නේ ඇයි?

මුළු ලෝකයම මේ අවස්ථාවේ දී දරුණුතම වසංගතයකට මුහුණ පා සිටින අවස්ථාවේදී ඉන් මිදීම සඳහා මුළු ලෝකය ම එකාවන්ව කටයුතු කරන විට මෙවැනි කකුලෙන් ඇදීම් සිදු කරන්නේ මෙරට විපක්ෂයෙන් පමණක්මද යන සැකය මතු වීම සාධාරණය.

මෙරට එන්නත්කරණයේ විශාලත ම ක්‍රියාවලිය මුළු රටපුරා මේ වන විට සිදුවෙමින් පවතී. පසුගිය 17 වැනි බදාදා දිනයේ දී බස්නාහිර පළාත තුළ පමණක් එන්නත් කරන ලද මුළු සංඛ්‍යාව 57,000 කි.

මාර්තු 01 වැනිදා වන විට රටපුරා මධ්‍යස්ථාන 4,000 කදී දිනකට ලක්ෂ 6 බැගින් එන්නත් කිරීම සඳහා සෞඛ්‍ය අංශ දැනටමත් සැලසුම් කර ඇත.

එන්නත් මිලදී ගැනීමට ද ක්‍රියාකර තිබෙන අතර ලැබෙන එන්නත් කඩිනමින් එන්නත් කරන මධ්‍යස්ථාන සඳහා යොමු කෙරේ.

එන්නත්කරණය මීට පෙර ද ඉතා හොඳින් සිදු කරන රටක් වශයෙන් ශ්‍රී ලංකාව ලෝක සෞඛ්‍ය සංවිධානය ද පිළිගැනීමට ලක්ව තිබීම විශේෂත්වයකි. මෙම ලෝක වසංගතයෙන් කඩිනමින්ම මිදීම සඳහා මෙම එන්නත්කරණ ඉතා වැදගත් වන අතර එය ධෛර්යවත් කිරීම කිසිදු බේදයකින් තොරව සිදුකළ යුතු බව සියලුම දෙනාගේ පිළිගැනීමයි.

නමුත් එම වගකීම නිසි පරිදි ඉටු නොකරන සජිත්, අනුර කුමාර ඇතුළු සුළු පිරිසක් රටට ලබාදෙන ආදර්ශය කුමක් ද?

ඔවුන් කොරෝනා පැමිණිය දා සිටම චෝදනා කරන්නේ ආණ්ඩුවටයි. ඔවුන්ගේ එම චෝදනා ඇසෙන විට සිතෙන්නේ කොරෝනා මේ ලෝකයට ගෙනාවෙ රාජපක්ෂවරුන් ද කියාය.

මේ චෝදනාව අවලාද කෙතරම් එල්ල කළ ද වගකිව යුතු රජයක් ලෙස වර්තමාන රජය කොරෝනා වයිරසය පාලනය කිරීම කළමනාකරණය තුළින් ලෝකයේ රටවල්වලින් 10 වැනි ස්ථානය හිමි කරගෙන තිබෙන බව ජාත්‍යන්තරය පිළිගත් සංවිධාන කියයි.

මෙහිදී ඇමෙරිකාව ප්‍රමුඛ බොහෝ රටවල්වලට එම ශ්‍රේණිගත කිරීම් ලේඛනයේ හිමිවී තිබෙන්නේ පසුපෙළ ස්ථානයන්ය.

ලෝකයේ රටවල්වලින් නිරෝධායන ඉතා හොඳින් සිදු වෙන්නේ ශ්‍රී ලංකාව, වියට්නාමය සහ ඊශ්‍රායලය යන රටවල පමණි.

වසංගත තත්ත්වය මැඩලීමට ක්‍රියාකරන ලෝකයේ ආරක්ෂක අංශවලින් ශ්‍රී ලංකාවේ යුද හමුදාවට ලෝකයෙන් ම දෙවැනි ස්ථානය හිමි වී තිබේ.

කොරෝනා මර්දන එන්නත්කරණය ද ඉතා හොඳින් සිදුකර එම එන්නත්කරණයෙන් ද විශේෂ ස්ථානයක් ශ්‍රී ලංකාවට හිමිවනු ඇතැයි කියා බොහෝ දෙනෙක් අපේක්ෂා කරති.

එවැනි තත්වයකදී සජිත්, අනුර කුමාරලා ඇතුළු සුළු පිරිසක් මෙම එන්නත්කරණ වැඩසටහන දිරිමත් කිරීමට ක්‍රියා නොකරන්නේ ඇයි?

“ශ්‍රී ලංකාවට එන්නත් ගේන්නේ නැහැ.” කියමින් මේ කෑගහන අයියලා ටික එම එන්නත් ගෙන්වූ පසුව කියන්නේ තවත් කතාවකි. ඒ මේ රටේ දේශපාලනයේ හැටියටය. සිංහල ශබ්දකෝෂයේ නම් ඊට ලබාදිය හැකි හොඳම හැඳින්වීම “කුහකත්වය” නැතුව වෙන කුමක් ද?

ලෝක වසංගතය කියා දෙයක් නොමැති ආකාරයෙන් විපක්ෂයේ ඇතැමුන් කටයුතු කිරීම පුදුම සහගත ය. ලෝක ඉතිහාසය ගත් විට කලින් කලට ලෝක වසංගත පැමිණ ඇති බව ඉතා හොඳින් පැහැදිලි වේ.

එමනිසා සජිත්ලාට, අනුර කුමාරලාට ලෝක වසංගත ගැන පාඩමක් කියා දුන්නාට ද වරදක් නැත. සමහරවිට එම ලෝක වසංගත තත්ත්වයක් දැනගෙන ඒවා නොදන්නවා සේ සිටින්නේ දේශපාලන කුහකත්වය නිසා විය හැකිය.

“ලෙඩදුක් සාගතයේ මුලින් ම මහලු මහලු උදවිය මරා ගත්හ. පොඩිසිංඤා හා ඔහුගේ පවුල අන්ගෝහාමි ද මැරී ඔවුන්ගේ ගෙය කැලයට යට විය. ඊට අවුරුදු 03 කට පසු තවත් ගෙවල් දෙකක් අතහැර දමන ලදී. ඉන් එකක වාසය කළෝ බාලප්පුත් ඔහුගේ පවුල හා නෑනාත් ළමයින් දෙදෙනෙකුත් ය.

අනික් ගෙයි වාසය කළෝ බස්තියන් අප්පුත් ඔහුගේ පුත්තු දෙන්නාත්, දුවත් ලේලි කෙනෙක් හා මුනුපුරෙකුත් ය. ඔවුන්ගේ හේන්වල වැඩ දීමෙන් ද යන්තම් ලැබෙන අස්වැන්නෙන් අඳයක් දීමෙන් ද ඔවුහු පුංචි මැණිකාට උපකාර කළහ. තමා ඉපදී හැදුණු ගමත් තමාට පුරුදු මිදුලත් අතහැර නොගොස් තමා කෙරෙහි බලපවත්නා දුර්දසාපන්න ඉරණම සමග සටන් කිරීමට ඔහු බොහෝ උත්සාහ ගත්හ. එහෙත් ඔවුන්ගේ හේන් හොඳටම නිසරු විය. ඔවුන්ගේ ගෙවල්වල දරුවෝ නූපන්හ. ගැහැනු ද හේන් මෙන් ම මුඩුව ගොසිනි. උපන් දරුවෝ උණෙන් මළාහ. බැරිම තැන කාලයට පරාජය වී තම තමන් සතු බඩු මුට්ටු ටිකක් පොදිගන්නා ගෙන මහපොතාන කුඹුරුවල කුලියට වැඩ කිරීම සඳහා ඔවුහු සදහටම ගම අතහැරදමා ගියහ.”

ඉහත සඳහන් වූයේ 1913 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය ජාතික ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත බද්දේගම (Village in the jungle) නවකතාවේ කොටසකි.

1908 සිට 1911 දක්වා හම්බන්තොට දිසාපතිවරයා වශයෙන් සිටි ලෙනාඩ් වුල්ෆ් හම්බන්තොට දිස්ත්‍රික්කයේ දුෂ්කර ප්‍රදේශවලට වැඩි වශයෙන් ගමන් කළේය.

ග්‍රාමීය ජනතාවගේ ජීවන අත්දැකීම් තුළින් “බැද්දේගම” නවකතාව ලෙනාඩ් වුල්ෆ් රචනා කළ අතර ඒ කාලයේදීත් වසංගතවලින් මිනිස්සුන්ට හා ජන ජීවිතයට සිදු වූ බලපෑම බද්දේගම තුළින් මැනවින් පෙන්වා දෙයි.

ඈත අතීතයේ දී ඇති වූ වසංගත ලෙස සිරිසගබෝ කාලයේ ඇතිවූ රක්තාක්ෂ රකුස් බය, “රක්තාක්ෂ යයි ප්‍රසිද්ධ වූ එක් යකෙක් මෙහි අවුත් ඒ ඒ තැන මිනිසුන්ගේ ඇස් රතු කෙරයිග උනුන් ඇස් රතු බලා බිය වැද මනුෂ්‍යයෝ නසිතිග යක්ෂ තෙමේ ඒ මිනිස්සු සැක නැතිව කයි. රජ තෙමේ උන් උවදුරු අසා තැතිගත් සිත් ඇත්තේ හුදෙකලා ව අටඟ පෙහෙවස් ඇතිව උපවස් ගෙය තුළ “ඒ යකු නො දැක නොනැගිටින්නේමි”යි හොත්තේය. යක් තෙමේ රජහු දහම් තෙදින් රජහු වෙත ආය. රජ විසින් කවරෙක්දැයි පුළුවස්නා ලද්දා වූ යක් තෙතමේ මම (අසවලැයි) දැන්වීය. “කවර හෙයින් මාගේ ප්‍රජාව කයිද? නොකව” දැන්වීය. යක් තෙමේ “මට දනව්වක මිනිසුන් දෙව” කීය. නොහැක්කැයි කී කල යක් තෙමේ ක්‍රමයෙන් ඉල්වා “එක් මිනිසෙක් දුන මැනව”යි කීය. රජ තෙමේ “අනිකෙක් දෙන්ට බය නොපිළිවන, මා (මස්) කයි” කීයේය. යක් තෙමේ නොහැක්කැයි කියා “ගමක් ගමක් පාසා බිලි දුන මැනව”යි රජුගෙන් ඉල්විය. භූමිශ්වර තෙමේ මැනැවැයි කියා සියලු දිව්හිම ගම්දොර තබ්බවා ඔහුට බලි (බත්) දෙවීය. සියලු සතුන් කෙරෙහි අනුකම්පා ඇති ලක්දිව් පහන්බඳු ඒ මනුසත්හු විසින් හටගත මහාරෝග භය මේ උපායෙන් නසන ලදි.” යැයි මහාවංශයේ 36:82-90 හි සඳහන් වේ. යටත් විජිත සමයේ ඇති වූ වසංගත ලෙස වසූරිය, මහාමාරිය, පරංගි හා වෙනත් රෝග හැඳින්විය හැකිය. වසූරිය ඈත අතීතයේ සිට පැවත එන වයිරස රෝගයකි. වඩාත් බිය වූ රෝගයකි. වෙන්කර තැබීම් හා ගම් අතහැර යෑම මෙහිදී සිදුවිය.

මැලේරියාව උණ රෝගයක් ලෙස සුලභ විය. වාර්තාවල සඳහන් උණ මෙය විය හැකිය. අරිප්පුව නරකම ස්ථානය විය.

මැලේරියාව අතීතයේ සිට ආ රෝගයකි. plasmodium නම් ඒකසෛලික ජීවියාගෙන් පැතිරේ. බරපතළ හා විනාශකාරී විය. රාජධානි මාරු වීමට බලපා ඇත. 1940 ගණන්වල දී ද මරණ ඇතිවීමට ප්‍රධාන හේතුවකි. පරිසර තත්ත්ව සුදුසු වූ විට මැලේරියාව සාමාන්‍යයෙන් නැති ප්‍රදේශවල ද පැතිරී ඇත. ඒ අනුව ගාල්ල 1895 දී පැතිරී ඇත.

මැලේරියාවේ වඩාත් කැපී පෙනෙන වසංගතය ලෙස 1934/35 දැක්විය හැකිය. තවද 1934 නොවැම්බර් සිට 1935 ජූනි පමණ වන විට මරණ 80,000 ක් පමණ විය. එමෙන්ම මහ ඔය ද්‍රෝණියේ දෙපසින් ආරම්භ විය. කුරුණෑගල, කෑගල්ල ප්‍රදේශවල මෙන්ම බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත විය. සමහර ප්‍රදේශ මැලේරියාව එතරම් සුලභ නැති පෙදෙස්ය. ආහාර හිඟයක් ද ඇති විය. සූරියමල් ව්‍යාපාරය ගොඩනැගුණේ ද මැලේරියාවෙන් අසරණ තත්වයට පත් ජනතාවට පිහිටවීමටයි.

මහාමාරිය බැක්ටීරියා රෝගයකි. පැරණි රෝගයකි. වරින්වර විවිධ ප්‍රදේශවල රෝගය ව්‍යාප්ත විය. මීයන් මූලිකව ව්‍යාප්ත විය.

කොලරාව බැක්ටීරියා රෝගයකි (vibrio cholerae). බරපතළ රෝගයකි. අධික බියක් ඇති කළ රෝගයකි. ලන්දේසි සමයේ ද වාර්තා වී ඇත.

1935 වර්ෂය, වාර්තාගත සංඛ්‍යාලේඛන ඇති ලාංකික සෞඛ්‍ය ඉතිහාසයේ අතිශය භයංකාර වකවානුවක් සේ ඉල්පී පෙනෙයි. දිවයින පුරා වේගයෙන් පැතිර ගිය මැලේරියා වසංගතය හට ගත්තේ මෙම වර්ෂයේදී ය. ඉන් සත් මසක් තුළදී ජීවිත 80,000 ක් විනාශ වූ බව වාර්තාගතව තිබේ. මෙම වර්ෂයේ දී වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව වැඩි කරනු ලැබීය. මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 24 දෙනෙක් ද, වරාය වෛද්‍ය නිලධාරීන් 04 දෙනෙක් ද, වතුකරය සඳහා වෛද්‍යවරුන් 05 දෙනෙක් ද පත් කරනු ලැබූහ.

දීප ව්‍යාප්ත මැලේරියා මර්දන ව්‍යාපාරයක් 1936 දී දියත් කරනු ලැබීමට හේතු වූයේ ඉහත සඳහන් වසංගතයයි. ක්ෂේත්‍ර වෛද්‍ය නිලධාරීන් යනුවෙන් හඳුන්වනු ලැබූ වෛද්‍යවරුන් කණ්ඩායමක් පළමු වැනි වරට බඳවාගෙන සේවයට යොදන ලද්දේ මෙම වකවානුවෙහි දී ය. මෙම වර්ෂය තවද අනෙකින් ලංකාවේ වෛද්‍ය ඉතිහාසයෙහි ලා වැදගත් වන්නේ ය. ලාංකිකයන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳ ව 1933 දී දොස්තර නිකුලස් සහ දොස්තර නිමලසූරිය විසින් ආරම්භ කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලද්දේ මෙම වර්ෂයේ දී ය.

ස්පාඤ්ඤ උණ වසංගතය 1918 පෙබරවාරි සිට 1920 අප්‍රේල් දක්වා ව්‍යාප්ත විය. “එකල ලක්දිව මුළුල්ලෙහි මහජනයා තවන්නා වූ, පණ නසන්නා වූ, ඉතා දරුණු වූ (තුන් දා) උණ රෝගයක් හටගත්තේය. පිටරටින් ගෙණෙනු ලබන්නාවූ ද මෙරට හටගන්නා ධාන්‍යයන් අතිශයින් හීන බැවින් දුර්භික්ෂයක් ද හටගත්තේ ය.” යනුවෙන් මහාවංශය 3 භාගය - පරිච්ඡේදය 111 හි සඳහන් වේ.

ස්පාඤ්ඤ උණ වයිරස රෝගයකි. H_1N_1 influenza A යනුවෙන් හඳුන්වනු ලබයි. ලෝක ව්‍යාප්ත වසංගතයකි. මිලියන 500 කට වැළඳී ඇති අතර මිලියන 30 - 100 ත් අතර ගණනක් මිය ගියහ. පළමුවන ලෝක සංග්‍රාමයෙන් මියගියේ ද මිලියන 20 කි.

ලංකාවේ ස්පාඤ්ඤ උණ රෝගය ද 1918 පෙබරවාරි සිට 1920 අප්‍රේල් දක්වා ව්‍යාප්ත විය. පළමු රෝගීන් මතුවීම 1918 ජූනි හා ජූලි මාසවල වාර්තා වූ අතර වරායේ යාත්‍රා ආශ්‍රිතව සේවය කරන්නවුන් හට වැළඳුණි. කොළඹ වරාය හරහා මේ රෝගය ලංකාවට පිවිස ඇත. රජයේ හා පුද්ගලික අංශයේ කාර්යාල වල සේවකයන්ගේ පැමිණීම ද අඩුවූ බවට වාර්තා වේ.

රෝගය මර්දනය සඳහා කළ කාර්යභාරයට දැනුම්වත් කිරීම සඳහා දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීන් හා සනීපාරක්ෂක පරීක්ෂකයන්, පණිවුඩය වැසියන් වෙත දැනුම්දෙන ලද්දේ ගම්මුලාදෑනීන්ය. තවද උපදෙස් සහිත පත්‍රිකා දහස් ගණනින් නිකුත් කර ඇත. මේ පත්‍රිකාවලින් රෝගය පිළිබඳව හා ප්‍රතිකාර ගැන විස්තර කර ඇත. බොහෝ ඒජන්තවරු මේ ගම් මට්ටමේ නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය ගැන ප්‍රශංසා කළහ. ප්‍රතිකාර සඳහා විශේෂ වෛද්‍ය කණ්ඩායම් බරපතළ පෙදෙස්වලට යොමු කෙරිණ.

ආපදා සහන සඳහා රජය මැදිහත්වී ආපදා සහන ලබා දී ඇත. එමෙන් ම මහජන රැස්වීම් තබා, පරිත්‍යාගශීලීන්ගෙන් මුදල් එකතු කිරීම. ඒ මුදල්වලින් පීඩාවට පත් ජනතාවට සහන සපයා තිබේ. මේ සඳහා පිහිටු වූ සහන කමිටු හරහා පීඩාවට පත් ජනතාවට අවශ්‍ය ආහාර, ඖෂධ හා ඇඳුම් ලබා දී ඇත. පුද්ගලිකව සංවිධාන ලෙස උපකාර කිරීම සුලභය. සහන සැපයීමට ජනතාව ස්වෙච්ඡාවෙන් ඉදිරිපත්ව ඇත. සමහර ප්‍රදේශවල මෙසේ ආධාර සැපයීම පවා අසීරු වූ අවස්ථා සඳහන් වේ. නැගෙනහිර පළාතේ ආණ්ඩුවේ ඒජන්ත සඳහන් කරන පරිදි ඒ පළාතේ ගම් හා හේන් ඈතින් පිහිටා තිබීම සහන සැපයීමේ දී බාධාවක් විය. (මඩකලපු දිස්ත්‍රික්කයේ හා ත්‍රිකුණාමලයේ) සෞඛ්‍ය වාර්තා අනුව මේ රෝගයෙන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ හා ඔවුන්ගේ පවුල්වල අය මරණයට පත්ව ඇත. ඈත ඒ අතර වෛද්‍යවරුන් ඇපොතිකරිවරුන් මෙන්ම හෙදියන්ද වේ. මෙහිදි මියගිය වෛද්‍යවරුන් ලෙස රක්වාන රෝහලේ වෛද්‍ය ඩබ්ලිව්. එස්. තිරිමාන්න සහ නිකවැරටිය රෝහලේ වෛද්‍ය එස්. ජේ. එච්. එල්. ඩී. හීර් දැක්විය හැකිය.

පාසැල් ද වසා දැමුණු අතර ළමුන්ගේ පැමිණීම ද බෙහෙවින් අඩු වී ඇත. මහජන වැඩ දෙපාර්තමේන්තුව ද, පොලිසිය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතනවල සේවකයන්ට ද මෙම වසංගතයෙන් දැඩි බලපෑම් එල්ල වී ඇති බව වාර්තා වේ.

මෙයින් සිදු වූ බලපෑම දිළිඳු ජනතාවට සහ කෘෂිකර්මය හා කම්කරු රැකියා කළ අයට විය. ඒ අනුව එදිනෙදා කටයුතුවලින් සිය ජීවිකාව සපයාගත් ගැමියන්ය. රෝගය වැලඳී සුව වුව ද ඔවුන්ගේ වැඩ කිරීමේ හැකියාව අඩුවී මහන්සි වී කටයුතු කළ නොහැකි වී ඇත. 1918-19 මහ කන්නය වගා කටයුතු අඩාළ වී ඇත. මේ අතර හම්බන්තොට හා අනුරාධපුරය ගැන විශේෂයෙන් සඳහන් වේ. 1919 වර්ෂයේ දී ඇති වූ ආහාර හිඟය සඳහා මේ තත්ත්වය බලපා ඇති බව සිතිය හැකිය.

මෙම වසංගත තත්ත්වය හේතුවෙන් ආගමික උත්සව ද නියාමනය කර ඇත.

1919 කතරගම උත්සව දෙකම නවත්වන ලදී - කොලරා වසංගතය නිසාය. එමගින් එය ඌව හා දකුණු පළාතට සැලකිය යුතු බලපෑම් විය. ඌව පළාතෙන් වාර්තා වූ රෝගීන් 131 දෙනාගෙන් 92 ක් පමණ මියගොස් ඇත. එසේම පළාතේ දකුණු ප්‍රදේශය ගැන සැලකූ විට කොටමුදුන, බුත්තල, වැල්ලවාය හා තෙලුල්ල දක්වා ද එදා රෝගය තදින් ව්‍යාප්ත විය. මේ බව තහවුරු වන්නේ කතරගමට නුදුරින් පිහිටා ඇති හම්බන්තොට, තිස්ස යන ප්‍රදේශවල ද මේ කාලයේදී ම රෝගය ඉතා තදින් ව්‍යාප්ත වූ නිසාය.

1914 කතරගම ඇසළ උත්සවය තහනම් කරන ලදී - වසූරිය වසංගතය නිසා බදුල්ලේ නමුණුකුල වතුයායක ඇති වී බදුල්ල, පස්සර, ලුනුගල හා කතරගම දක්වා ම ව්‍යාප්ත වී ඇත. රෝගීන් 87 ක් හමු වූ බවක් හා මරණ 224 ක් වාර්තා විය.

1914 අනුරාධපුරයේ පැවති පොසොන් උත්සවය - සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධව ගත් ඉතා දැඩි ආරක්ෂක පියවර කොළඹ තවත් ප්‍රදේශවල බරපතළ මහාමාරිය වසංගතයක් තිබීම.

උණ හා වෙනත් රෝග ලක්ෂණ සහිත පිරිස් නිරීක්ෂණය කිරීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායම් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ද, අනුරාධපුර ‘ලෝකල් බෝඩ්’ හෙවත් පළාත් මණ්ඩලයේ නිලධාරීන් ද, ගම්මුලාදෑනීන් ඇතුළු දේශීය නිලධාරීන් ද මෙසේ වන්දනාකරුවන් අතර ගැවසෙමින් රෝගීන් සිටී දැයි පරීක්ෂා කර තිබේ.

සනීපාරක්ෂක පහසුකම් ද වෙනදාට වඩා සපයා තිබිණ. වන්දනා සමය අවසන් වූ වහාම නගරය මුළුමනින් ම පවිත්‍ර කර තිබේ.

වන්දනා සමයේ දී කිසිදු මහාමාරියා රෝගියෙකු වාර්තා නොවූ බව ද පවසයි.

1914 දී ශ්‍රී පාද වන්දනා සමය ද නියාමනය කෙරිණ. කොළඹ සිට පැමිණෙන වන්දනාකරුවන් මඟින් මධ්‍යම පළාතට ද රෝගය ව්‍යාප්ත විය හැකි යැයි සැකයක් විය. වෙනත් වන්දනාගමන් මෙන් වන්දනාකරුවන්ගේ සංඛ්‍යාව සීමා කිරීම ද කළ නොහැකි බව සඳහන් කරන සබරගමු පළාතේ ආණ්ඩුවේ ඒජන්තවරයා ඒ සඳහා වෙනත් පියවරක් ගෙන ඇත.

ඒ අනුව, විවිධ ස්ථානවලදී වන්දනාකරුවන් වෛද්‍ය පරීක්ෂණවලට ලක්කිරීම.

වැඩි පිරිසක් දුම්රියෙන් පැමිණ බසින ස්ථාන වූ කුරුවිට හා රත්නපුරයේදී හා රත්නපුර රෝහලේදී ය. මේ වන විට සබරගමුව හෙවත් රත්නපුර දුම්රිය මාර්ගය ලෙස හැඳින්වෙන දුම්රිය මාර්ගය රත්නපුරය දක්වා දිගු කර තිබිණ.

මේ සඳහා ම කුරුවිට නුදුරු හිග්ගස්හේන ප්‍රදේශයේ මාර්ගයේ පොලිස් ආරක්ෂක මුරපොළ පිහිටුවන ලද අතර, එමගින් මහා මාර්ගය ඔස්සේ පැමිණෙන වන්දනාකරුවන් වන්දනා මාර්ගවලට යොමු කිරීමට හා වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමට යොමු කරන ලදී. ඒජන්තවරයා පවසන ආකාරයට, මහාමාරිය පැතිර තිබූ කොළඹ හා ආශ්‍රිත ප්‍රදේශවලින් පැමිණි වන්දනාකරුවන් ගණන සැලකූ විට මේ වන්දනා සමය තුළ මහාමාරිය හෝ වෙනත් බරපතළ වසංගතයක් හමු නොවීම සතුටු විය හැකි කරුණක් විය.

කොවිඩ් - 19 තවම ලෝකයේ වසංගත තත්වයෙන් පවතින්නේ 06 වැනි 07 වැනි ස්ථානවලය. ස්පාඤ්ඤ උණ වසංගතය ඇතුළු අනෙකුත් ලෝක වසංගත තත්වයන් පැවති කාලයේ දී සජිත්ලා, අනුර කුමාරලා හිටියා නම් කොහොම හිටිවී ද? එදා අද වාගේ සමාජ මාධ්‍ය ජාලා තිබුණා නම් මිනිසුන් කෙතරම් කලබලයට පත්කරනු ඇත් ද?

ඒ නිසා ඉතිහාසය හොඳින් අධ්‍යනය කරන කෙනෙකුට දේශපාලන බේදයකින් තොරව වර්තමාන යථාර්ථය තේරුම් ගැනීමට හැකිවනු ඇත.

සමගි ජන බලවේග ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක එන්නත විදගත් අවස්ථාව

මාර්තු 01 වැනිදා සිට රටපුරා මධ්‍යස්ථාන 4,000 කදී දිනකට එන්නත් ලක්ෂ 6ක්

අපේ දේ නංවා රටේ සන්නාමය බබළුවන Made in Sri Lanka

ඇමැති විමල් වීරවංශ ව්‍යවසායකයකුගෙන් කරුණු විමසද්දී... ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුශ්ක ගුණසිංහ ද, ජාතික ශිල්ප සභාවේ සභාපති සුදත් අබේසේකර ද මෙහි වෙති.

අගමැති මහින්ද රාජපක්ෂයන් ප්‍රදර්ශනය විවෘත කිරීමෙන් පසු දේශීය නිපැයුම් කුටි නිරීක්ෂණය කළ අවස්ථාව. ඇමැති විමල් වීරවංශ හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුශ්ක ගුණසිංහ ද මෙහි සිටිති.

● නිහාල් පී. අබේසිංහ

සියරට දේ සිරි සැප දේ' මේ අනුව යමින් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ප්‍රථම වරට ආරම්භ කළ 'Made in Sri Lanka' වෙළෙඳ ප්‍රදර්ශනය මෙරට නිෂ්පාදන ක්ෂේත්‍රයේ අලුත් පිබිදීමක් ඇති කිරීමට ඉවහල් වූ බව දේශීය ව්‍යාපාරිකයන්ගේ අදහසයි.

පසුගිය පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු මෙන් ම මේ වනවිට වසංගත තත්ත්වයෙන් ව්‍යාප්තව යන කෝවිඩ් 19 ව්‍යසනය මෙරට ආර්ථිකයේ කොදු නාරටියට දැඩි ලෙස බලපෑම් කරමින් සිටී. අප රටේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මඟින් ආර්ථිකයට දක්වන දායකත්වය සමස්ත දළ දේශීය නිෂ්පාදනයෙන් 50% - 60% ක් අතර වුවත් එහි සමස්ත ආනයන පරිමාණය 5% - 10% අගයකට සීමා වේ. එවන් පසුබිමක් තුළ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එළි දැක්වූ සෞභාග්‍යයේ දැක්මට අනුගතව යමින් ආනයන සීමා පනවමින් දේශීය ව්‍යවසායකයා රැක ගැනීමට බොහෝ පියවර රැසක් ගනු ලැබීය. ඒ අනුව කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ සංකල්පයක් අනුව ආරම්භ වූ Made in Sri Lanka සන්නාමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීමේ අරමුණ ඇතිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් සංවිධානය කරනු ලැබූ Made in Sri Lanka වෙළෙඳ ප්‍රදර්ශන මාලාවේ පළමුවැන්න අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් හා ජපන් තානාපති අකිරා සුගියාමා මෙන් ම ප්‍රංශ තානාපති එරික් ලැවර්ටෝගේ සහභාගීත්වයෙන් පසුගියදා කොළඹ 07 පදනම් මාවතේදී උත්කර්ෂවත් ලෙස ආරම්භ විය.

ජාතික මට්ටමේ වෙළෙඳ ප්‍රදර්ශනයක් ඔස්සේ මෙරට ව්‍යවසායකයන් සවිබල ගැන්වීමේ ජාතික ක්‍රියාවලියකට මුල පිරීම සතුටට කරුණක් බව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන් මෙහිදී පැවසීය.

එහිදී කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ සහාව අමතමින් කියා සිටියේ වත්මන් රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව Made in Sri Lanka සන්නාමය ලොව පුරා බලවත් කිරීම කර්මාන්ත අමාත්‍යාංශයේ අරමුණ වන බවයි. එහිදී මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව යමින් දේශීය නිෂ්පාදකයන්ට කළ නොහැක්කක් නොමැත යන විශ්වාසය ඇති කිරීම හා ඒ සඳහා දිරි ගැන්වීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ හා කර්මාන්ත අමාත්‍යාංශයේ මූලික වගකීමක් ලෙස හඳුනාගෙන ඇති බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

එසේම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ ප්‍රකාශ කර සිටියේ Made in Sri Lanka සන්නාමය ලංකාවේ ප්‍රධානම සන්නාමය බවට පත් කරන බවයි. මීට අමතරව ජපාන තානාපති අකිරා සුගියාමා මහතා සහාව අමතමින් ශ්‍රී ලංකා ජපන් විදේශ සබඳතා තහවුරු කර ගැනීමේ වැදගත්කම හා ඒ හරහා මෙරට කුඩා හා මධ්‍යම ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ජපන් රජයේ පූර්ණ අනුග්‍රහය සලසන බවට ද ප්‍රකාශ කළේය.

වසර පුරාම අඛණ්ඩව ඉදිරියටත් පැවැත්වීමට නියමිත මෙම වෙළෙඳ ප්‍රදර්ශනය දින දෙකක් පුරා උදැසන 10 සිට රාත්‍රී 8 දක්වා විවෘතව පැවැති අතර ව්‍යාපාර හා පාරිභෝගික මෙන්ම ව්‍යාපාර සුසංයෝග නිර්මාණය කරලමින් Made in Sri Lanka සන්නාමය ඉදිරියට තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට වේදිකාවක් තනනු ලැබීය.

වෙළෙඳ ප්‍රදර්ශනය අවසන් වීමට පෙර එහි සපැමිණි කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ එහි සිටි සියලු ව්‍යවසායක මහත්ම මහත්මීන් සමඟ මෙන් ම පැමිණ සිටි ව්‍යාපාරික හා පාරිභෝගික පිරිස් සමඟ ද සුහද කතාබහක නිරත විය. එහිදී පවතින කොවිඩ් වසංගතය හමුවේ වුව ද බිඳ වැටී ඇති කුඩා හා මධ්‍ය පරිමාණ දේශීය කර්මාන්ත හා දේශීය ව්‍යවසායකයා යළි පණගන්වන්නට Made in Sri Lanka සන්නාමය යටතේ පුළුල් අවස්ථා විවර කරදීම පිළිබඳ පැමිණ සිටි සියලු ව්‍යවසායක හා පාරිභෝගික පිරිසගෙන් අමාත්‍යවරයාට නොමඳ අගය කිරීමක් හිමි විය. කෙසේ වුවත් ඉදිරිපත්වූ බොහෝ යහපත් ප්‍රතිචාර හා ඉල්ලීම් මත මෙම ප්‍රදර්ශනය මෙතෙක් මාස දෙකකට වරක් පැවැත්වීමට ගෙන තිබූ තීරණය වෙනස් කරමින් සෑම මසකටම දෙවරක් පැවැත්වීමට තීරණය කරනු ලැබීය.

මෙම ප්‍රදර්ශනය හරහා බොහෝ ව්‍යාපාරික අවස්ථා රැසක් ව්‍යවසායකයන් වෙත විවෘත විය.

මසකට දෙවරක් ප්‍රදර්ශන

ඒ යටතේ බොහෝ විදේශ අපනයන අවස්ථා පුළුල් වීම, සුපිරි වෙළෙඳසල් හා හෝටල් ඇතුළු ව්‍යාපාරික ප්‍රවේශ රාශියක් හඳුන්වාදීම සිදුවූ අතර මෙහි සුවිශේෂී අවස්ථාවක් වූයේ ව්‍යාපාර - ව්‍යාපාර අතර සංවිධානය කළ හමුවයි. එහිදී මින් පෙර ව්‍යවසායක මහත්ම මහත්මීන්ට හිමි නොවූ අවස්ථා රැසක් මේ ප්‍රදර්ශනය නිසා හිමිවීමයි.

වමේ සිට දකුණට, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුරුසිංහ, 'හෙළ කොකෝ' ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ හරින්ද්‍ර මහකුමාර, 'රන්බත්' කාබනික ආහාර සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ජානකී කත්‍රිආරච්චි හා 'රත්න බතික්' ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ රත්න විමල් අලුත්ගේ.

මේ පිළිබඳව සිළුමිණට විශේෂයෙන් කරුණු දැක්වූ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ ප්‍රකාශ කර සිටියේ මේ ප්‍රදර්ශනය මඟින් ජපන්, ප්‍රංශ හා බ්‍රිතාන්‍ය රටවල ව්‍යාපාරිකයන් රැසක් අපේ රටේ නිපැයුම් මිලදී ගැනීමට අපේ රටේ දේශීය නිපැයුම්කරුවන් සමඟ සම්බන්ධ වූ බවයි.

"මාර්තු අග අපි කොළඹදී තවත් ප්‍රදර්ශනයක් කරනවා. සැප්තැම්බර් මාසේ අපි දිස්ත්‍රික්ක 20 ක දින දෙකකදී Made in Sri Lanka ප්‍රදර්ශන මාලාවක් පවත්වනවා. ඇමැති විමල් වීරවංශගේ උනන්දුව නිසා අපිට මේ කටයුතු නුඟක් පහසුවී තිබෙනවා."

"අපේ රටේ සමහර නිපැයුම් ලොව ඒ සමාන අනෙක් නිපැයුම්වලට වඩා ඉහළයි. ඒත් ඒවා පිළිබඳව රට රටවල දන්නේ නෑ. මෙවර ප්‍රදර්ශනය බැලීමට රටවල් ගණනාවක තානාපතිවරු පැමිණියා. ඒ අය අපේ නිපැයුම් අගය කළා. ඒ අනුව අපේ නිපැයුම්කරුවන්ට හොඳ හෙටක් උදා වෙනවා ස්ථිරයි. මේ සඳහා අපට දිය හැකි සියලුම සම්බන්ධීකරණ කටයුතු ලබාදෙන්න අපි සූදානම්" යැයි ද සභාපති අනුෂ්ක ගුණසිංහ පවසයි.

ප්‍රදර්ශනයට එක්වූ ව්‍යවසායකයෙක් වන පාණදුර 'හෙළ කොකෝ' අධිපති හරින්ද්‍ර මහකුමාර පවසන්නේ ඉතා හොඳින් සංවිධානය කර තිබූ Made in Sri Lanka ප්‍රදර්ශනය තමා වැනි දිගු කලක් Made in Sri Lanka සන්නාමය පාවිච්චි කරන ව්‍යවසායකයන් හොඳ සවිමත් අත්වැලක් බවයි.

"අපි රටවල් 8කට තැඹිලි වතුර යවනවා. රටවල් 3 කට දොඩම්, ඉඟුරු, කොත්තමල්ලි හා පැෂන් ටින් යවනවා. ව්‍යවසායකයන් 10 දෙනකුට මේ යටතේ දැනටම Made in Sri Lanka නම පාවිච්චි කිරීමට අවස්ථාව ලැබුණා. ප්‍රදර්ශනය බැලීමට ආපු විදේශිකයන් නුඟක් අපේ නිපැයුම් අගය කළා. දේශීය අය කිව්වේ මේක නුඟක් කලින් කරන්න තිබූ වැඩක් බවයි.

විමල් වීරවංශ අමාත්‍යවරයා මේ ප්‍රදර්ශනය ඉතා හොඳින් සංවිධානය කිරීම හා මේ සංකල්පය ඉදිරියට ගෙන යාම ගැන ස්තුතිවන්ත වෙනවා" යැයි ද හරින්ද්‍ර මහකුමාර පවසයි.

සියයට සියයක් ශාකමය ආහාර පමණක් නිපදවන කොළඹ තුන්මුල්ලේ සම්බුද්ධ ජයන්ති මන්දිරයේ 'රන්බත්' කාබනික ආහාර සමාගමත් මේ ප්‍රදර්ශනයට එක් විය.

එහි කළමනාකාර අධ්‍යක්ෂිකා ජානකී කත්‍රිආරච්චි පවසන්නේ අපේ රටේ නියම ශාකමය දේශීය ආහාර අපේ රටේ නාගරික ජනතාවටත් මෙරට පදිංචි හා යන එන විදේශික සංචාරකයන්ටත් හඳුන්වා දීමට මෙම ප්‍රදර්ශනය තමන්ට ලොකු අනුබලයක් ලබාදුන් බවයි.

"අපි කරන්නේ සියයට සියයක් ශාකමය ආහාර නිපැයුම් සතුන්ගෙන් ගන්නා කිරිවත් අපේ ආහාරවලට දාන්නේ නැහැ. අපි හදන කාබනික ආහාර අනුභව කිරීමට සංචාරකයන් කැමැතියි. ඒ අයට ඒ අවස්ථාව වැඩිපුර ලබාදෙන්න අපිට මේ ප්‍රදර්ශනය නිසා අවස්ථාව ලැබුණා.

විමල් වීරවංශ ඇමැතිවරයා මේ ප්‍රදර්ශනය මනාව සංවිධානය කර තිබුණා. ඔහු හැම කුටියටම ගිහිල්ලා නිපැයුම් පිළිබඳව සොයා බැලුවා. අපිව උනන්දු කළා. ඒක අපිට ලොකු ශක්තියක් අපේ කුටිවලට පවා ශතයක්වත් ගත්තේ නෑ. ඒ අනුව මේ ව්‍යායාමය රටේ දේශීය කාබනික නිපැයුම් ජනප්‍රිය කිරීමට අනුපමේය මෙහෙයක් ඉටුවෙනවා" යැයි ජානකී කත්‍රිආරච්චි පවසන්නීය.

හොරණ ගුරුගොඩ රත්න විමල් අලුත්ගේ මෙම ප්‍රදර්ශනයට එක්වී ඇත්තේ රත්න බතික් ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසයි.

"අපි දැනට බතික් සාරි, ගවුම් හා කමිස නිපදවා රට යවනවා. මේ ප්‍රදර්ශන නිසා අපිට එතෙර ඇණවුම් ලබා ගැනීමට අලුත් සම්බන්ධතා ඇති කරගැනීමට අවස්ථාව ලැබුණා. මගේ නිෂ්පාදන විකුණා ගැනීමට අලුත් ආයතන හතරක් මේ ප්‍රදර්ශනය නිසා හමු වුණා. මෙහිදී අපට ලැබුණු ප්‍රතිචාර ඉතා ඉහළයි. සංකල්පයක් ලෙස අලුත් ගමනක ආරම්භයක් පෙන්නුම් කරන මෙම ප්‍රදර්ශන මාලාව නිසා Made in Sri Lanka තේමාවට ලොකු අභිමානයක් ලැබෙනවා. මෙතෙක් කල් පිටරටවලට අපේ නිෂ්පාදන යැව්වත් Made in Sri Lanka නාමයෙන් ඒවා යවන්න අවස්ථාවක් තිබුණේ නැහැ. නමුත් රාජ්‍ය අනුග්‍රහය ඇතිව පවත්වන මේ වැඩසටහන් නිසා මා ඇතුළු දේශීය නිෂ්පාදකයන් රැසකට Made in Sri Lanka ලාංඡනය යටතේ ශ්‍රී ලාංකික අභිමානයෙන් අපේ නිපැයුම් ඉදිරිපත් කරන්න හැකියාව ලැබුණා. ඒ ගැන විමල් වීරවංශ ඇමැතිවරයා ඇතුළු රජයට ස්තුතිවන්ත වනවා" යැයි අලුත්ගේ පැවසීය.

හම්බන්තොට උඩමලල මහා විද්‍යාලයෙන් රටටම ආදර්ශයක්

● ලලිත් චාමින්ද- ගාල්ල

හම්බන්තොට උඩමලල මහා විද්‍යාලයේ ලොකු ඉස්කෝල හාමිනේ වූ කලී අමාලි එරංගිකායි. ඇය පාසලේ මුල් පුටුවට පත්වීමට පෙර මේ පාසලේ මාස හයක පමණ කාලයක් නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙස රාජකාරී කළාය. පාසලේ ලොකු ඉස්කෝල හාමිනේ බවට පත්වීමෙන් පසු ඇය අලුත් වැඩකට අත ගැසුවාය. වර්තමානයේ පාසල් දරුවන් වැඩි පිරිසක් කියවීමෙන් හා ක්‍රීඩාවෙන් ඈත්ව සිටින අයුරු අමාලි ලොකු ඉස්කෝල හාමිනේ අත්දැකීමෙන් දැන සිටියාය. අමාලි ලොකු ඉස්කෝල හාමිනේ නිර්මාණශීලි විදුහල්පතිවරියකි. පාසලේ දරුවන් කියවීමට හා ක්‍රීඩාවට යොමුකරගත යුතු ආකාරය පිළිබඳ ඇය පාසලේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් සමඟ සාකච්ඡා කළාය.

'දරුවන්ට කියවීම සඳහා පැයක් වෙන්කරලා දෙමු. අපි එක කාලපරිච්ඡේදයකින් විනාඩි 05ක් අඩුකරමු. ඒ තුළින් අපිට පැයක කාලයක් පහසුවෙන්ම නිර්මාණය කරගන්න පුළුවන්; අමාලි ලොකු ඉස්කෝල හාමිනේ යෝජනා කළාය. සතියේ සිකුරාදා දින හය ශ්‍රේණියෙන් ඉහළ දරුවන්ට කියවීම සඳහා පැයක පමණ කාලයක් ලබා දෙමු. නියෝජ්‍ය විදුහල්පති හා පුස්තකාලාධිපති ඩබ්ලිව්.ජී. කැළුම් තරංග ගුරුතුමා යෝජනා කළේය. එම යෝජනාවට ගුරුභවතුන්ගේ ද එකඟතාව හිමිවිය. පාසලේ සංවර්ධන සැලැස්මට ද කියවීම හා ක්‍රීඩාව යන සංකල්පය අපි ඇතුළත් කරලා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමු... අමාලි ලොකු ඉස්කෝල හාමිනේ කීවාය. අමාලී ලොකු ඉස්කෝල හාමිනේ පාසලේ මුල්පුටුවට පත්වීමත් සමඟ පාසල තුළ කියැවීමේ පැයක් වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. 'කියැවීමේ පැයක්' වැඩසටහන ආරම්භ වීමට පළමුව පන්ති භාර ගුරුභවතුන් පුස්තකාලයට ගොස් දරුවන් සඳහා කියවීමට දිය යුතු පොත් තෝරා ගනිති. ඉන්පසු කියැවීමේ පැය තුළ එම පොත් දරුවන්ට බෙදා දෙති. පැයක කාලයක් තුළ ලබා දුන් පොත කියවීමට නොහැකි වුවහොත් ඊළඟ සතියේ කියැවීමේ පැයේ දී එම පොත කියවා අවසන් කිරීමට දරුවන්ට අවස්ථාව ලැබේ. පාසල් දරුවන් විසින් පොත කියවා අවසන් වීමෙන් පසු ඒ පිළිබඳ සාරාංශයක් ද සකස් කොට පන්තිභාර ගුරුතුමාට ලබාදිය යුතුය. කියවීමට දැඩි ඇල්මක් නොදක්වන දරුවන් මෙකී වැඩසටහන ආරම්භයේ දී ඒ සඳහා සම්බන්ධ වූයේ දැඩි කැමැත්තකින් නොවේ. මේ වනවිට උඩමලල මහා විද්‍යාලයේ පාසල් දරුවන් අතර කියැවීමේ පැය ඉතා ආකර්ෂණීය තත්ත්වයට පත්ව ඇත. දරුවන් ඉතා ඕනෑකමින් මෙකී ව්‍යාපෘතියට එක්ව සිටිති.

අමාලි ලොකු ඉස්කෝල හාමිනේ මුල්ගුරු පුටුවට පත්වීමට පෙර පාසලේ බාහිර ක්‍රියාකාරකම් ඉතා පහත් මට්ටමකට පත්ව තිබුණි. එපමණක් නොව ක්‍රීඩා කටයුතු ද පැවතියේ ඉතා පහළ මට්ටමක වන අතර; කියවීමට අමතරව පාසල් දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය වැඩිදියුණු කිරීම සඳහාද වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. කර්කශ දේශගුණික කලාපයක පිහිටි මෙකී පාසලේ දරු දැරියන් ජව සම්පන්න දරුවන් වූහ. ජානවලින්ම දරුවන්ට ජව සම්පන්න බව උරුමවී තිබුණි. එහෙත් ඒ සඳහා නිසිමඟ පෙන්වීමක් ලැබී නොතිබුණි. ඒ අනුව පාසලේ ගුරුභවතුන්ගේ හා දෙමවුපියන්ගේ ආධාර උපකාර මත පාපන්දු හා අත්පන්දු කණ්ඩායමක් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබීය. දරුවන්ට පාපන්දු පුහුණු කිරීම සඳහා ගමේ තරුණයෙක් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය.

කියවීම හා ක්‍රීඩාව යන සංකල්පය පාසල තුළ ක්‍රියාත්මක වෙමින් තිබියදී මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීමට සබුද්ධි පදනම ද ඉදිරිපත් විය. සබුද්ධි පදනම මඟින් පොත්ගුල් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මෙකී පාසල තෝරාගනු ලැබිය. ඒ විතරක් නොව පාසලේ දරුවන් 100 දෙනෙකු සඳහා පොත් කට්ටල් බෙදා දිමටද කටයුතු කරනු ලැබීය.

විදුහල්පතිනී අමාලි එරංගි (වමේ) ආරාධිත අමුත්තන් උත්සව සභාවට කැඳවාගෙන එමින්

'ඇත්තටම පාසල් දරුවන්ගෙන් වැඩි පිරිසක් ජංගම දුරකථන ඇතුළු තාක්ෂණික මෙවලම් සමඟ තමයි ගනුදෙනු කරන්නේ. විෂය කරුණුවලට අදාළව පොත්පත් පරිහරණය කළත් අමතර පොත්පත් කියවන්නේ නැහැ. ඒ නිසා මේ පාසල තුළ කියැවීම හා ක්‍රීඩාව යන සංකල්පය අරමුණු කරගෙන ව්‍යාපෘතියක් ආරම්භ කළා. නාමල් රාජපක්ෂ ක්‍රීඩා ඇමතිතුමාගෙත් මෙවැනි වැඩසටහනක් තියෙනවා. අපි මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුරේදි සබුද්ධි පදනම අපිත් සමඟ සම්බන්ධ වෙනවා. අපේ අරමුණ හා ඒ පදනමේ අරමුණ එක සමානයි. සබුද්ධි පදනම මඟින් අපේ පාසලේ දරුවන් 100 දෙනෙකුට පොත් බෙදා දුන්නා.

ඒ විතරක් නෙවෙයි; ඒ පදනමේ සමාරම්භක වැඩසටහන පැවැත්වීමට තෝරා ගත්තේත් අපේ පාසල. ඇත්තටම ඒ සඳහා මැදිහත් වෙලා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කරලා දුන්නේ හම්බන්තොට නගරාධිපති එරාජ් ප්‍රනාන්දු. සබුද්ධි පදනම මඟින් ක්‍රීඩාව සම්බන්ධයෙන් ලියැවුණු පොත්පත් තමයි අපිට ලබා දුන්නේ. සමාරම්භක උත්සවයේදි 'කියවීම තුළින් පෞරුෂය වඩවමු' පිළිබඳ දේශනයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති සේපාල ගුණවර්ධන විසින් සිදු කළා. 'ක්‍රීඩාවට හිත යවමු' යන මැයෙන් දේශනයක් වෛද්‍ය ලාල් ඒකනායක විසින් සිදු කළා. 'පොතක් නිවැරදිව කියවමු' යන තේමාව යටතේ දේශනයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂක මිහිර අරවින්ද විසින් සිදු කළා. මෙකී පදනමේ විධායක අධ්‍යක්ෂ සිරිනාම රාජපක්ෂ, සභාපති තමිර මංජු යන අය ද මෙහිදී සිහිපත් කළ යුතුයි.

සබුද්ධි පදනම මඟින් ලබා දුන් පොත් 100 සෑම දරුවකුට කියවන්න පුළුවන් ආකාරයට ක්‍රමයක් අපි සකස්කොට තියෙනවා.

එක පොතක් ආරම්භක ළමයාගේ සිට රෝටරි ක්‍රමයට කියවලා යළි ඔහුට ලැබෙන පරිදි ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. ඉදිරියේ දි මේ තුළින් දරුවන්ගේ නිර්මාණ ශක්තිය වැඩි දියුණු කිරීමට ද අපි බලාපොරොත්තු වෙනවා. ඇත්තටම මෙකී වැඩ සටහන සඳහා නියෝජ්‍ය විදුහල්පතිවරුන් වන චමිලා තුෂාරි, ඩබ්ලිව්.ජී. කැළුම් තරංග ,පාසලේ ගුරුභවතුන් සියලු දෙනා සහයෝගය ලබා දෙනවා යැයි විදුහල්පතිනි අමාලි එරංගිකා පැවසීය.

හම්බන්තොට උඩමලල පාසල වූ කලී හම්බන්තොට නගරසභා බල ප්‍රදේශය තුළ පිහිටි අඩු පහසුකම් සහිත පාසලකි. මෙකී පාසලේ දරු දැරියන් 500කට ආසන්න පිරිසක් ඉගෙනුම ලබන අතර ගුරුභවතුන්ගේ සංඛ්‍යාව 30 දෙනෙකි. කියවීම හා ක්‍රීඩාව යන සංකල්පය පාසල තුළ ආරම්භ කිරීමත් සමඟ මෙකී පාසලට ඇතුළත් වීම සඳහා දරුවන් අතර තරගයක්ද නිර්මාණය වී තිබේ. පාසලේ නියෝජ්‍ය විදුහල්පති හා පුස්තකාලාධිපති ඩබ්ලිව්.ජී. කැළුම් තරංග ගුරුතුමා ද පාසල තුළ ක්‍රියාත්මක වන මෙකී වැඩසටහන ගැන විස්තර කළේය.

"මේ පාසලේ දරුවන්ට මේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර පොත පත ගැන එතරම් ඇගයීමක් තිබුණේ නැහැ. පුස්තකාලයෙන් ප්‍රයෝජන ගත්තේ නැහැ. පුස්තකාලයෙන් පොතක් රැගෙන ගියවිට එක ගෙන්වා ගැනීම සඳහා විශාල වෙහෙසක් දැරීමට සිදු වුණා. අපේ පාසලේ පුස්තකාලයේ පොත් 2300ක් විතර තියෙනවා. පරිවර්තන පොත් අඩුයි.

දරුවන් කියවීමට ඇදබැඳ ගන්න පොත් අඩුයි. පුස්තකාලයේ පහසුකම් ප්‍රමාණවත් නැහැ. එක මේසයක් හා පුටු 06ක් විතර තමයි තියෙන්නේ. ඇත්තටම අපේ අරමුණ වුණේ පොත් කියවීමට උනන්දුවක් නැති දරුවන් ඒ සඳහා යොමු කිරීමයි.

පොත ගැන හිතන දේ දරුවන්ට කියන්න දෙනවා. ඉදිරියේ දි අපි හොඳම පොත් කියවන දරුවන් වෙනුවෙන් ත්‍යාගයක් ලබාදීමට සැලසුම් කරලා තියෙනවා. පාසලේ පහසුකම් අඩුයි. ඉඩකඩ ප්‍රමාණවත් නැහැ. පාසලට දෙමහල් ගොඩනැගිල්ලක් ලබාදෙන්න කියලා දේශපාලන අධිකාරිය දැනුම්වත් කරලා තියෙනවා. ක්‍රීඩා පිටිය සංවර්ධනය කළ යුතු වෙනවා. ඇත්තටම අපේ පාසල කෙරෙහි කොයි කාගෙත් අවධානය දැන් යොමුවෙලා තියෙනවා යැයි ඩබ්ලිව්.ජී. කැළුම් තරංග ගුරුතුමා කීවේය.

'කියවීම' ජීවිත සාර්ථකත්වයට බෙහෙවින් රුකුල් දෙන්නක් බවට ලෝකය ම විශ්වාස කරන බවක් පෙනේ. සැබවින්ම හම්බන්තොට උඩමලල පාසලෙන් අනික් පාසල්වලට ලබා දී ඇත්තේ ආදර්ශයකි. සැබවින්ම මෙය හරි අපූරු සංකල්පයකි. කියවීමේ පැයේ දි පාසල් දරුවන් ඒ සඳහා සමවැදී සිටින අයුරු බලන්නට ලස්සනය.

පාසලට පොත් කට්ටල ලබාදෙමින්

ලග්න පලාපල

(2021 පෙබරවාරි 21 සිට 27 දක්වා)

මේෂ ලග්නය

කැපවීමේ තරමට ප්‍රතිඵල

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව ධන සම්පත් යෝගයක් උදා කරමින් සතිය ආරම්භ වෙයි. ඒ අනුව ඉඩම් ලාභ - වාහන ලාභ හෝ නිවසක ලාභ හිමිකම් ලෙසින් කාලය සුබවාදී වෙයි. තමා අපේක්ෂා කළ ණය මුදලක් කාලයකට පසු තම අතට පත්වන තත්ත්වයක් ද පෙනෙන්න තිබේ. වෙහෙසේ තරමට ප්‍රතිඵල උදා කරන අතර තම දරුවකුගේ විශේෂ අවස්ථාවක් වෙනුවෙන් කැපවීමට සිදුවන අතර ඒ සඳහා තව බොහෝ දෙනෙකු ඒකරාශි වනු ඇත.

වෘෂභ ලග්නය

ගෘහ ජීවිතය සතුටු දායක වෙයි

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව සිතට දැඩි අධිෂ්ඨානයක් ඇතිවීම තුළ විවිධ කටයුතු රැසක් ක්‍රියාවට නංවන සතියකි. නිර්මාණශීලී බව සිතේ සතුට සමඟ ආරම්භ වන සතිය අවසානය දක්වා සිය මානසික සුවය රැඳෙනු ඇත. උරහිස ආශ්‍රිත හදිසි ආපදා පෙනෙන්නට තිබේ.

මිථුන ලග්නය

ආත්ම විශ්වාසය දැඩි වේ

මිථුන ලග්නයට අනුව ඔබගේ කේන්ද්‍රය සුබදායක වන අතර විදේශගත හිත මිතුරකුගේ පැමිණීම නිසා තමාට අතපසු වී තිබූ කටයුත්තක් සාර්ථක කර ගැනීමට හැකි වේ. තම ව්‍යාපාරයක් සඳහා සේවකයන් පිරිසක් සම්බන්ධ කර ගැනීමට හැකි වේ. ඒ නිසාම සතිය මැද භාගයේ සිට තම කටයුතු ශීඝ්‍රතාවකින් යුතුව කරගෙන යෑමට අවස්ථාව උදා වේ.

කටක ලග්නය

උසස් ආර්ථික ප්‍රතිලාභ

කටක ලග්නයේ අධිපති චන්ද්‍රයා 11 වැන්නෙන් ගමන් ආරම්භ කරන මේ සතිය ආර්ථික වාසියකට හේතු වෙයි. නොසිතූ අවස්ථාවක තමාට ලැබුණු මෙම ආර්ථික ප්‍රතිලාභයෙන් උද්දාමයට පත්ව තම නිවැසියන් සමඟ සතුටුදායක ගමන් බිමන් ආරම්භ කෙරෙනු ඇත. තම මවු පාර්ශ්වයෙන් හා මවු පාර්ශ්වයේ අය වෙතින් ලැබෙන සහයෝගය ඉතා උසස් එකක්වේ.

සිංහ ලග්නය

විදේශ ආයෝජනයකට ඉඩ

සිංහ ලග්නයට අනුව ඔබේ කේන්ද්‍රයේ චන්ද්‍රයා 10 වැන්න වන රැකියා ස්ථානයේ බලවත්ව සිට ගමන් ආරම්භ කෙරෙන නිසා රැකියාවේ උසස් වීම් හා ස්ථාන මාරු යහපත් කෙරෙයි. ආර්ථික වශයෙන් ද සුබවාදී සතියකි. සතිය මැද භාගයේ තම විදේශ ආයෝජන කෙරේ සිත යොමු කරන අතර ඒ තුළින් උසස් ආර්ථික ප්‍රතිලාභ හිමි වනු ඇත.

කන්‍යා ලග්නය

රැකියාවේ උසස් වීම්

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 09 වැන්නෙන් පටන් ගෙන 10, 11, 12 යන ස්ථාන පසු කිරීම සතිය පුරාවටම සුබ ඵල ගෙන දෙන්නකි. රැකියා ආදායම් උසස් වන අතර ව්‍යාපාර ප්‍රතිලාභ ඉහළ යාමට ද හේතුවෙයි. තම රැකියා ස්ථානගත උසස් වීමක් හෝ රැකියාවේ ස්ථාන මාරුවක් සුබවාදී ලෙස ඇතිවේ.

තුලා ලග්නය

අන් අයගේ ඇප උපකාර

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව සතිය ආරම්භය කනගාටුදායක ආරංචියක් නිසා බොහෝ කලබලකාරී මානසිකත්වයකට පත්වීමට ඔබට සිදු වේ. ආර්ථික වශයෙන් බිඳ වැටීමකට හේතු වුවත් චිත්ත ශක්තිය ඉහළ නංවා ගැනීම තුළින් එබඳු පාඩු ද අවම කරවා ගත හැකිය. තමා කරගෙන ආ ව්‍යාපාර කටයුත්තක් සාර්ථක ලෙස පවත්වාගෙන යාමට අවකාශ සැලසේ.

වෘශ්චික ලග්නය

සතුට අභිවෘද්ධිය උදා වේ

වෘශ්චික ලග්නය හිමි ඔබට මෙම සතිය ආරම්භයත් සමඟ විවාහ ඵල හා මංගල උත්සව වලට සහභාගි වීමට අවස්ථාව උදාවේ. අවිවාහක අයට ආදර සබඳතා ගොඩ නැගෙන අතර දුරස්ථ සිටි අය තමාට යළි ළංවන ලකුණු මතු කෙරේ. සිතේ සතුට අභිවෘද්ධිය ඇති කරන අතර අසල්වැසියන්ගේ නොමඳ ආදර ගෞරවයට පත්වන වකවානුවකි. දේපළ පිළිබඳව තමාට තිබූ ගැටලු රැසක් නිමාවනු ඇත.

ධනු ලග්නය

සමීපතමයන්ගෙන් සහයෝගය

ධනු ලග්නය හිමි ඔබට මෙම සතිය ආරම්භය වියදම් මට්ටම ඉහළ ගිය ද සතිය මැද භාගයේ සිට යළි උසස් ආදායම් උදාවනු ඇත. තමා වෙතින් ඇත්ව සිටි බොහෝ දෙනෙකු යළි තමා වෙත පැමිණ සිය ව්‍යාපාර කටයුතු වලට අත් උදව් දෙනු ඇත. දරුවන්ගේ හා විවාහ සහකරු හෝ සහකාරිය කෙරෙන් වැඩි සැලකිලි ලබන වකවානුවකි. ඒ නිසාම තමා කාර්ය බහුලතාවයට පත් වේ.

මකර ලග්නය

දරු සම්පත් හිමි වේ

මකර ලග්නයට අනුව මෙම සතිය ඔබට සුබ අසුබ දෙකම භුක්ති විඳීමට සිදු වේ. යටි බඩේ අපහසුතාවක් හෝ මූත්‍රා අමාරුවක් නිසා පීඩාකාරී වෙයි. එහෙත් දරුඵල අපේක්ෂාවෙන් සිටි අයට දරු සම්පත් ද ආර්ථික වශයෙන් බලාපොරොත්තුව සිටි උසස් දියුණුව ද පෙන්වයි. කොයි හැටි වෙතත් සකසුරුවම් ලෙස කටයුතු කළ යුතුවෙයි. නොඑසේ නම් හදිසි කලබල තීන්දු තීරණ නිසා හදිසි අත්වැරදීම් මත ආර්ථික පාඩු සිදුවීමට බොහෝ දුරට ඉඩ තිබේ.

කුම්භ ලග්නය

නීති ගැටලු ලිහිල් වේ

කුම්භ ලග්නයට අනුව ඔබගේ කේන්ද්‍රයේ චන්ද්‍රයා 04 - 05 - 06 - 07 යන ස්ථානවල ගමන් ඇරඹීම භෞතික සම්පත් උරුමකම් සහිතයි. ඒ අනුව වාහන, ඉඩම්, නිවාස හිමිකම් ද රැකියා උසස්වීම් ද විශේෂයෙන් ආර්ථික සුබ සාධනය ද සහිතයි. තම මවුපිය පාර්ශ්වයෙන් වැඩි කැපවීමක් මත තමාට ඉඩම් ලාභයකට ද හේතුයි.

මීන ලග්නය

උෂ්ණ ආහාරපානවලින් ගැටලු

මීන ලග්නයට අනුව චන්ද්‍රයා 03 - 04 - 05 - 06 යන ස්ථානවල පසුකර ගමන් කිරීම ඉතා සුබවාදී ආර්ථියකට ඔබ රැගෙන යයි. තමාගේ සිතේ අන් අය පිළිබඳව තිබූ අවිශ්වාසය දුරුව ඒ අය සමඟ සුහදශීලීව කටයුතු කිරීමට හැකි වේ. යටි බඩේ අසාත්මිකතාවක් නිසා පීඩාවක් ගෙන දුන්න ද සැර උෂ්ණ ආහාර පානවලින් බොහෝවිට දුරස්වූ විට මෙම තත්ත්වයෙන් මිදීමට ඔබට හැකි වේ.

ශ්‍රී ලාංකික එකමුතුව හා කොටි ඛයස්පෝරාව අතර සීතල යුද්ධයක්

රැකියා හැල්ල
සාක්ෂි බෙන්ඩිස් කියයි... ejournalists@gmail.com

මානව හිමිකම් උල්ලංඝනය කළ බව පවසමින් මෙරට රණවිරුවන්ට නැවත බොරු චෝදනා එල්ල කිරීමට කොටි ඛයස්පෝරාව කටයුතු කරමින් සිටිති. ඉකුත් සතිය පුරා මේ පිළිබඳව නොයෙක් කතා බහ සිදු කෙරිණි.

වසර තිහක ඉතිහාසයකට දිව ගිය මෙරට ත්‍රස්තවාදය වසර තුනක් වැනි කෙටි කාලයකින් අවසන් කර දැමීමට හැකි වූයේ මහින්ද රාජපක්ෂ නම් අතීත එඩිතර නිර්භීත නායකයා නිසාවෙනි.

මාවිල්ආරු සොරොව්ව වසා දමමින් අහිංසක ගොවි ජනතාවට පානය කිරීමට වතුර බිඳක් නොමැති අවස්ථාවක එය ලබාදීම වෙනුවෙන් කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව ත්‍රිවිධ හමුදාව ආරම්භ කළ මානුෂීය මෙහෙයුම පිළිබඳව මුළු මහත් ලෝකයම කතා කළේය.

එවකට ජනාධිපතිවරයා වශයෙන් සිටි මහින්ද රාජපක්ෂ හට ඇමෙරිකාව, ජර්මනිය, කැනඩාව ඇතුළු ලෝකයේ ප්‍රබල රටවල් රැසක්ම යුද්ධය නතර කරන ලෙසට දැඩි බලපෑම් එල්ල කරනු ලැබීය. එහෙත් "මේ මගේ රටේ ප්‍රශ්නයක් මේක මට විසඳන්න පුළුවන් විසඳා ගැනීමෙන් පසුව අපි මේ ගැන කතා කරමු යැයි එඩිතර නායක මහින්ද එදා ලෝකයේ ප්‍රබල රටවල්වලට නොබියව කිව්යේය.

මානව හිමිකම් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන මෙන් ම ත්‍රස්තවාදීන්ගේ මුදල් මත යැපෙමින් ජීවත්වූ ඇතැම් කණ්ඩායම් යුද්ධය නැවැත්වීමට දැඩි උත්සාහයක නිරත වූයේය.

එහෙත් සතුරා සතුව තිබූ භූමිය

• කෝවිඩ් එන්නත රටටම දෙන්න සෞඛ්‍ය ලේකම් මේජර් ජනරාල් මුණසිංහ සමඟ රාජ්‍ය ලේකම් වෛද්‍ය අමල් හර්ෂ දිගටම වැඩ

කොටසින් කොටස අත්පත් කර ගනිමින් කොටි ත්‍රස්තවාදීන්ගේ ග්‍රහණයේ වසර ගණනාවක් නොයෙක් දුක් විඳි ලක්ෂ තුනකට ආසන්න ජනතාව ඉන් මුදාගෙන ඒ පිරිසට නිදහස ලබාදීම පිළිබඳව අද ඔවුන් මහින්ද රාජපක්ෂ නායකයා වෙත දක්වන්නේ අසීමිත ස්නේහයකි. අහිංසක දෙමළ ජනතාව අද උතුරු, නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන්නේ මහින්ද රාජපක්ෂ නායකයාණන්ට පිංසිදු වන්නට ය. එමෙන්ම බැසිල් රාජපක්ෂයන් ක්‍රියාවට නැංවූ උතුරු වසන්තය වැඩසටහනින් උතුරේ විශාල සංවර්ධනයක් ඇති විය.

යුද්ධය අවසන් කළ 2009 වසරේ සිට ජිනීවා මානව හිමිකම් කොමිසම නොයෙක් ආකාරයෙන් මෙරට රණවිරුවන්ට දඬුවම් කිරීමට සැරසෙයි. එදා කොටි ත්‍රස්තවාදයට ගිනි අවියෙන් දෙකඩ කරන්නට නොහැකි වූ මේ රට අද ජාත්‍යන්තර බලය යොදවමින් දෙකඩ කිරීමට කොටි ඛයස්පෝරාව උත්සාහ දරති.

ලබන මාර්තු මාසයේදී ජිනීවා මානව හිමිකම් සැසියේදී මෙරටට නැවත වතාවක් යුද අපරාධ චෝදනාව එල්ල කිරීමට සූදානම් වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් මිෂෙල් බැචලේට විරුද්ධව නැගී සිටීමට විදේශගතව සිටින සිංහල එකමුතුවන් රැසක් කටයුතු ආරම්භ කර තිබේ.

ද්විඛ සිවිල් වැසියන් එක්ලක්ෂ හතළිස් දහසක් මෙරට හමුදාව විසින් ඝාතනය කළ බවට නගන චෝදනා සම්පූර්ණ අසත්‍ය ඒවා බවට සාක්ෂි සහිත වීඩියෝ පට ප්‍රදර්ශනය කරමින් ඉකුත් සතිය පුරාවටම ප්‍රංශයේ පැරිස් නුවර එංගලන්තයේ ලන්ඩන් නුවර ඉතාලියේ මිලානෝ නුවර ඇතුළු යුරෝපයේ රටවල් රැසකදීම විරෝධතා ව්‍යාපාරයන් පැවැත්වීමට යුරෝපයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් එකමුතුව ක්‍රියා කරනු ලැබීය. ඉදිරි සති කිහිපය තුළදීත් මෙවැනි විරෝධතා පවත්වමින් ශ්‍රී ලංකා රණවිරුවන් ආරක්ෂා කිරීමට කටයුතු කරන බව රටවල් රැසකම සිටින ශ්‍රී ලාංකික එකමුතුවේ සාමාජිකයෝ පවසති.

මේ වෙනුවෙන් මෙරට සිටින සංවිධාන කිහිපයක් ද

• මානව හිමිකම් ගැටලුව ගැන මහා සංඝරත්නයෙන් අගමැතිට උපදෙස්

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයට විරෝධ දක්වමින් රටවල් කිහිපයකම තානාපතිවරුන්ට සංදේශ භාරදීමට සැලසුම් කර තිබේ.

කොටි ත්‍රස්තවාදීන් විසින් සිදු කරන ලද මිලේච්ඡ ප්‍රහාර 150 ක තොරතුරු සහිත පොතක් ලබන මාර්තු පළමු වැනිදා ස්විස්ටර්ලන්ත තානාපති කාර්යාලය සහ එක්සත් ජාතීන්ගේ කාර්යාලය වෙත භාරදීමට ශ්‍රී ලාංකික එකමුතුවේ මෙරට සාමාජිකයන් පිරිසක් තීරණය කර ඇත.

මේ අතර ඉන්දියාවේ භාරතීය පක්ෂයේ ප්‍රබල දේශපාලනඥයකු විසින් මෙරට තුළ එම පක්ෂය ස්ථාපිත කරන බවට සිදු කළ ප්‍රකාශය සම්බන්ධව මෙරට ඇමැතිවරු ද මන්ත්‍රීවරු ඇතුළු නොයෙක් පාර්ශ්වයන් සිය අදහස් ප්‍රකාශ කරනු ලැබීය.

පෞද්ගලිකව පුද්ගලයෙකු ඉදිරිපත් කරන මතයක් ඉන්දීය රජයේ මතය නොවන බව රජයේ මැති ඇමැතිවරු සඳහන් කරන අතර පිටරටක දේශපාලන පක්ෂයකට කිසිසේත්ම මෙරට දේශපාලනයට පැමිණීම සඳහා හැකියාවක් නොමැති බව මැතිවරණ කොමිසම හිටපු සභාපති මහින්ද දේශප්‍රිය අවධාරණය කළේය.

ශ්‍රී ලංකා පොලිස් ඉතිහාසය තුළ නියෝජ්‍ය පොලිස්පති ධූරයට පත් බිම්ශානි ජාසිංහ ආරච්චිගේ පත්වීමට විරෝධය පාමින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් පිරිසක් කටයුතු කිරීමට එරෙහිව පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියෝ පිරිසක් පෙළ ගැසී තිබේ.

ඇයගේ අයිතිවාසිකම් සහ රැකියාවේ සුරක්ෂිතභාවය වෙනුවෙන් තම සංසදය පක්ෂ භේදයකින් තොරව පෙනී සිටින බවත් ඇය වෙනුවෙන් සාධාරණය ඉෂ්ඨ වන තෙක් සටන් කරන බවත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන්ගේ සංසදය ප්‍රකාශ කර සිටියි. මේ අතර සෞඛ්‍ය රාජ්‍ය ඇමැති ලෙස කටයුතු කළ මහාචාර්ය චන්න ජයසුමන වැඩබලන සෞඛ්‍ය ඇමැති ලෙස ජනපති ඉදිරියේ දිවුරුම් දුන්නේය.

මේ අතර රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයා ලෙස සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා ලෙස චමල් රාජපක්ෂ ඉකුත් (18) වැනිදා ජනාධිපති කාර්යාලයේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඉදිරියේ දිවුරුම් දෙනු ලැබීය.

මෙතෙක් පැවැති රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ සහ ස්වදේශ කටයුතු ලෙස රාජ්‍ය අමාත්‍යාංශ දෙකක් යටතට පත් කිරීමත් සමඟ මෙම නව දිවුරුම් දීම සිදු කෙරිණි.

"විශේෂයෙන් ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා පැය 15 ක් විතර වැඩ කරන නායකයෙක්.

එතුමා මෙලෙස වැඩ කරන්නේ සෑම දෙයක් පිළිබඳව හොඳ අවබෝධයකින්" යැයි අගමැති මහින්ද රාජපක්ෂ කිව්යේය.

"අපි ගමකට සේවය කරනවා නම් එම සේවය ලබා ගන්නා තැන හොඳට තියෙන්න ඕන. එයයි අපි විශ්වාස කරන්නේ. සේවයක් කරන්න නම් සේවය කරන ස්ථානය බලපානවා. හොඳ පරිසරයක් ලබාදුන්නාම සේවකයන්ට එහි සේවය කරන්න හිතට ආශාවක් දැනෙනවා. අපි අද මේ ඇති කරලා තිබෙන්නේ එම පරිසරයයි" ද හෙතෙම සඳහන් කළේය.

"ආණ්ඩුවක් පිහිටුවලා ඒ ආණ්ඩුවෙන් පුළුවන් තරම් ප්‍රයෝජන ගැනීම ජනතාව සතු වගකීමක් අද විශේෂයෙන් ම නගරයට වඩා ගම පිළිබඳව කටයුතු කරන්න අපි සියලු දෙනා මහන්සි වෙනවා. ගමට නගරයේ තිබෙන පහසුකම් ලබාදීම අපගේ වගකීමක් මෙන් ම යුතුකමක්" යැයි ද අගමැතිවරයා කිව්යේය.

රුපියල් කෝටි 14 ක වියදමකින් මහල් හතරකින් යුතුව ඉදි කළ බේරුවල ප්‍රාදේශීය සභා බහුකාර්ය ගොඩනැගිල්ල විවෘත කරමින් අගමැතිවරයා ඉකුත් දා මෙම කරුණු අවධාරණය කළේය.

මේ අතර ජනපතිගේ උපදෙස් පරිදි ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රා සෙනිකා එන්නත රටටම ලබාදීමේ කටයුතුවල දැන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ බලධාරීහු ලති ලහියේ නිරතවෙති. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් මේජර් ජනරාල් සංජීව මුණසිංහ හා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා ද මේ දිනවල එම කටයුතුවල පෙරමුණ ගෙන සිටිති.

ජිනීවා මානව හිමිකම් සැසිවාරයේදී ශ්‍රී ලංකාවට එරෙහිව ලබන මාර්තු මාසයේ ඉදිරිපත් වන යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා මහා සංඝරත්නය හා අගමැතිවරයා අතර සාකච්ඡාවක් ද අරලියගහ මන්දිරයේදී පැවැත්වුණි.

ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් වන යෝජනා ඇතුළත් වාර්තාව සහ ඒ සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් පිළිබඳව ගරුතර සංඝරත්නය මෙහිදී අගමැතිවරයාට උපදෙස් ලබාදුන්නේය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ඉකුත් බදාදා උදෑසන සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග ඇතුළු සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රධානීන් රැසක් ජනාධිපති ලේකම් කාර්යාලයට කැඳවූයේය. ඉකුත් ජනවාරි 21 දින සිට සංචාරකයින්ට රට විවෘත කිරීමෙන් පසු එහි ප්‍රගතිය සහ අඩුපාඩු ගැන සාකච්ඡා කිරීමට ය. එහිදී ඇමැති ප්‍රසන්න ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කළේය.

"මම මේ ඉල්ලීම අගමැතිතුමන්ටත් කිව්වා. සංචාරක ක්ෂේත්‍රයේ ලක්ෂ 30 ක් විතර යැපෙනවා. මේ අංශයේ සෘජුවම ගැටෙන පිරිසට කොවිඩ් එන්නත දෙන්න පුළුවන් නම් ගොඩාක් හොඳයි. විශේෂයෙන් ම රියදුරන් හොටෙල් සේවකයන්ට, ගයිඩ්ලා වගේ අයට ප්‍රසන්න ජනාධිපතිවරයාට කිව්යේය.

• ජනපති ගැන අගමැතිගෙන් ලොකු සහතිකයක්

"ඔව් එක හොඳ යෝජනාවක් මේ වනකොට අපි කොහොමත් රටේ සියලු දෙනාට එන්නත දෙන්න තීරණය කරලා ඉවරයි" ජනාධිපතිවරයා කිව්යේය.

"සර් මම ඉල්ලන්නේ සංචාරක ක්ෂේත්‍රයේ නියුතු අයට ප්‍රමුඛතා දෙන්න කියලයි. ප්‍රසන්න පැහැදිලි කළේය.

"අපි කොවිඩ් 19 නිසා මහජන ආරක්ෂාවට පනවා ඇති සෞඛ්‍ය සීමා හැර සංචාරකයන් සඳහා සියලු පහසුකම් සැලසීමට කටයුතු කරලා තිබෙනවා.

සංචාරකයන් මෙරටට පැමිණීම රටේ ආර්ථිකයට ඉතා වැදගත්" ජනාධිපතිවරයා කිව්යේය. ග්‍රාමීය ආර්ථිකය නංවාලීමේ ජාතික වැඩසටහන යටතේ සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුවේ ගම්පහ දිස්ත්‍රික් කමිටුව ඉකුත් අඟහරුවාදා ගම්පහ නයිවලදී පැවැත්වූයේ තරුණ සහ ක්‍රීඩා කටයුතු ඇමැති නාමල්ගේ ප්‍රධානත්වයෙනි. ඇමැති ප්‍රසන්න රණතුංග රාජ්‍ය අමාත්‍යවරුන් වන සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, සිසිර ජයකොඩි, නිමල් ලන්සා, සහන් ප්‍රදීප්, මිලාන් ජයතිලක මේ සඳහා එක්වූහ. රැස්වීම අවසානයේ මැති ඇමැතිවරුන්ට දිවා ආහාරය යාබද ශාලාවක සූදානම් කර තිබුණේය.

සත්කාරය විපක්ෂ නායක ජංගම සේවයට සජිත් තවත් නැවුම් වැඩසටහනක් සූරියවැවදී ආරම්භ කළේය. ඒ සෑම ජංගම සේවයකදීම පැළයක් රෝපණය කිරීමයි.

"ඒක ඉතා හොඳ වැඩක් විපක්ෂ නායක තුමා හිමිනමක් සජිත්ට ප්‍රකාශ කළහ.

"අපි සෑම වැඩසටහනකදීම අගයක් එකතු කරනවා" ජංගම සේවා 500 ක් කරලාත් පැළ 500 ක් රට පුරා නිකම්ම හැදිලා අපේ හාමුදුරුවනේ යැයි සජිත් කිව්යේය.

"අපි ප්‍රතිලාභ දෙන දරුවන්ටත් කියනවා පැළයක් හදන්න කියලා. දන්නවද මොනතරම් දුප්පත් වුණත් භූතානය කියන්නේ කාබන් අඩුම රටක්. පිරිසිදුම වාතය තියෙන රටක් වන ගහනය සියයට හැත්තෑවයි. ඔවුන්ගේ ව්‍යවස්ථාවේ තිබෙනවා සියයට හැට පහට වඩා වන ගහනය තියෙන්න ඕන කියන එක" සජිත් කිව්යේය.

දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිසම් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස විපක්ෂය දිගින් දිගටම ඉල්ලා සිටියත් ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ආණ්ඩුව සූදානම් වන බවක් පෙනෙන්නට නැත. සමගි ජනබලවේගයේ පක්ෂ නායකයන් අතර හමුවේදී මේ පිළිබඳව දැඩි අවධානය යොමු විය.

"මේ ආණ්ඩුවට විපක්ෂයේ දේශපාලන නායකයන්ගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමේ ලොකු වුවමනාවක් තිබෙන බව පේන්න තිබෙනවා. මීට එරෙහිව අපි හැමෝම එකතුවෙලා ක්‍රියාමාර්ග ගත යුතුයි" විපක්ෂය මර්දනයට එරෙහිව මුස්ලිම් කොංග්‍රසයේ පූර්ණ සහය ලබාදෙමින් රවුෆ් හකීම් මන්ත්‍රීවරයා කිව්යේය.

• ගැටලුව ගැන සොයා බැලුවට මනෝ ගනේෂන්ගෙන් සජිත්ට තුති

මේ අතර විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම පාර්ලිමේන්තුවේදී පැවැත්වුණි. එහිදී විශේෂ අවධානයට ගනු ලැබුවේ ආණ්ඩුවේ ජනාධිපති කොමිසම වාර්තාව පිළිබඳවය.

"විශේෂයෙන් ම කියන්න ඕන අපගේ ගරු මන්ත්‍රීතුමන්ලාට අධිකරණමය කටයුත්තකට මුහුණ දෙන්න වුවහොත් කරුණා කරලා ඒ ගැන මාව දැනුම්වත් කරන්න. මොකද ඒ සියලු ම දෙනා වෙනුවෙන් මම පක්ෂයේ වගේ ම විපක්ෂ නායකයා ලෙස මැදිහත් වෙනවා. මගේ මන්ත්‍රී කණ්ඩායම ආරක්ෂා කරගන්න මම ඕනෑම මොහොතක ඉන්නවා. රාජ්‍ය අක්‍රමිකතා වංචා දූෂණ හෙළිදරව් කරන විපක්ෂයේ දේශපාලකයන් ගණනාවකගේ ක්‍රියාවලිය නතර කිරීමට මොවුන් දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් සිටිනවා. රජයේ වංචා පෙන්නුම් කරන එම දේශපාලනඥයන්ගේ සිවිල් මානව සහ දේශපාලන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ වැයමක රජය මේ වන විට නතර වී සිටිනවා."

සජිත් එහෙම කිව්යේ මනෝ ගනේෂන්ට වූ සිදුවීමක් ද පාදක කරගෙනය. මනෝට ගැටලුවක් ආ බව සැලවූ වහාම සජිත් ඔහුට කතා කළේය.

"ඔබතුමාට මේ ගැන කියන්න බැරි වුණා. සොයා බැලුවාට බොහොම ස්තුතියි" මනෝ කිව්යේය.

මහජන නියෝජිතයන්ගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමට නිවට බියගුලු ක්‍රියාවලියකට රජය පිඹුරුපත් සකසන බව මෙහිදී සාකච්ඡාවට ගැනිණි. එම තත්ත්වයට එරෙහිව පොදු ශක්තියක්, බලවේගයක් එකතු කිරීමේ වැදගත්කම පිළිබඳව ද දැඩි අවධානය යොමු විය.

ජීවිතය පුරා හැමදාමත් මම බාලදක්ෂයෙක්මයි

– සම්පත් බැංකුවේ MD

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ජාතික පුහුණුකිරීමේ කොමසාරිස් හා සම්පත් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂ, නන්ද ප්‍රනාන්දු

මෙරට සුවිසල් බැංකු ජාලයක් වන සම්පත් බැංකුවේ වත්මන් කළමනාකාර අධ්‍යක්ෂ නන්ද ප්‍රනාන්දු මහතා, කලෙක කුඩා බාලදක්ෂයෙකි. ඒ ජීවිතය තුළම හැදී වැඩුණෙකි.

ඒ ජීවිතය තුළ ගොඩනගාගත් බොහෝ දෑ ඔහුගේ නායකත්ව ජීවිතයට එල්ල කළ සාධනීය බලපෑම අතිමහත්ය. මේ කතා බහා, බාලදක්ෂ ජීවිතය හා බැඳුණු ඔහුගේ අත්දැකීම් අරභයාය.

ඔබේ බාලදක්ෂ ජීවිතයේ ආරම්භය කොතැනද....

ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ හත් දෙනකුගෙන් යුත් කුඩා කණ්ඩායමක නවක බාලදක්ෂයකු ලෙසින් මා බලදක්ෂ ව්‍යාපාරයට එක්වූයේ වයස අවුරුදු දහයේදී. කෙතරම් උනන්දුවෙන් මා ඒ තුළ නියැලුණාද කීවොත්, ඉතා කෙටි කාලයකින් එම කාණ්ඩායමේ නායකයා වන්නට මට හැකිවුණා. එතැන් සිට ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයකු ලෙසත්, 75 දෙනකුගෙන් යුත් කණ්ඩායමක නායකයා ලෙසත්, වගකීම් දරමින් ඉදිරියට එන්නට මට හැකිවුණා. මගේ බාලදක්ෂ ජීවිතයට ආරම්භක රුකුල වූයේ, මාගේ බාලදක්ෂ නායකයා සහ ගුරු උපදේශක වූ ඩැනියල් එදිරිසිංහ මහතායි.

ඒ කුඩා කාලයේ බාලදක්ෂ ව්‍යාපාරයෙන් ජීවිතයට එකතු කරගත් දේ මතකද...

හොඳින් මතකයි. ව්‍යාපාරයේ සාමාජිකයකු ලෙස බාලදක්ෂ පොරොන්දුව, නීතිය, අරමුණු අවබෝධ කරගැනීම, අභියෝගවලට මුහුණ දීම සහ ඒවාට විසඳුම් සොයා ගන්නා ආකාරය, ඒ සඳහා පුරුදු පුහුණු විය යුතු ආකාරය මෙන්ම, අත්දැකීම් රැස්කර ගැනීමට එළිමහන් ජීවිතය අවස්ථාවක් කර ගන්නා ආකාරය මා ඉතා හොඳින් ජීවිතයට එක් කර ගත්තා.

ඒ අනුව, සෑම සති අන්තයකම සහ ලැබෙන නිවාඩු කාලවල මා කාලය ගත කළේ එළිමහනේ. වනාන්තරයේ. එසේත් නැතිනම් කඳු තරණය කරමින්. ඒ වගේම, ගං ඉවුරුවල කඳවුරුලමින්, කණ්ඩායමක් සේ එක්ව මේ ලබන අත්දැකීම් කුඩා දරුවන් වූ අප ගොඩනැගූ සහ පෝෂණය කළ ඉතා සාර්ථක ජීවිත අත්දැකීම් බවට පත්වුණා.

එවැනි ගමනකින් බාලදක්ෂයකු ඉගෙන ගන්නා දේ මොනවාද....

එවැනි ගමනක් යාමට පෙර අරමුණ පිළිබඳ අවබෝධයක් තිබිය යුතු අතර, සැලසුමක් සහ සැලසුම ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවත් සූදානමක් තිබිය යුතුයි. තමාට යාමට අවශ්‍ය ස්ථානය, ඒ තැනට යාමට ගතවන කාලය, යා යුතු මාර්ගය, ඒ තැන වටා ඇති අවදානම් සොයා බැලීම, කඳවුරු ලා සිටින කාලය තුළ කරන වැඩසටහන් තුළ ප්‍රයෝජනවත්, ඵලදායී, ආරක්ෂාකාරී සහ විනෝදකාමී ලෙස යෙදෙන ආකාරය මෙන්ම, කඳවුර අවසානයේ හෝ පා ගමනක් අවසානයේ කළ යුතු වැඩ කොටස පිළිබඳවත් මේ තුළ බාලදක්ෂයකු ඉතා හොඳින් ඉගෙන ගන්නවා. ඒ වගේම, එවැනි ව්‍යාපෘතියක් සඳහා අරමුදල් සොයා ගන්නා ආකාරය, මුදල් වියදම් කරන ආකාරය හා ඒවා ගිණුම්ගත කිරීම පිළිබඳ බොහෝ කරුණු කාරණා මගේ ජීවිතයට එක්වූයේ මේ ගමන්වලින්.

ළමයකු හැටියට මේ දේවල් බර වැඩි වුණේ නැද්ද....

කිසිසේත් නැහැ. ගංගාවක් මත පාරුවකින් ගමන් කරන බාලදක්ෂයා, ඒ ගමන් කිරීමේ ආස්වාදය පමණක් නෙවෙයි, එසේ දිය මත යනවිට මුහුණ දිය හැකි අනතුරු සහ අභියෝග පිළිබඳවත් අවධියෙන් සිටිය යුතුයි. කැලෑවේදී සතුන්ගේ අඩි සලකුණු දිගේ නිරීක්ෂණය කරමින් ගමන් කිරීම, ලංකාවේ සියලුම ආකාරයේ කඳු තරණය කරන්නට ලැබීම සහ මහා වනාන්තර තුළ ගං ඉවුරුවල කඳවුරුලන්නට ලැබීම තුළ මා බාලදක්ෂයකු ලෙසින් වඩාත් සුපෝෂණය වුවා.

මේ අත්දැකීම් වර්තමානයේ කුඩා දරුවන් සහ තරුණයන් අතර වඩ වඩාත් ප්‍රචලිත විය යුතුයි. එසේම ලොව පුරා රටවල් සියයක පමණ විහිදී සිටින මිලියන පහළොවක පමණ බාලදක්ෂයින් අතරේ අප රටේ ළමා සහ තරුණ පරපුරත්, සිය ජීවිත හැඩගස්වා ගැනීමට මේ බාලදක්ෂ ව්‍යාපාරයේ ප්‍රයෝජනය ලබාගත යුතුයි. මේවා ළමයකු සහ නව යොවුන් තරුණයකු ලෙස ජීවිතයට අනිවාර්යයෙන් එක්කර ගත යුතු වටිනා අත්දැකීම්.



පිංතූරඃ නන්ද ප්‍රනාන්දු මහතාගේ බාලදක්ෂ ජීවිතයේ විවිධ යුග

මෙවැනි දුෂ්කර කටයුතු සඳහා බාලදක්ෂයින් මුදල් උපයා ගන්නේ කෙසේද....

බාලදක්ෂයා කිසිවිටෙකත් නිකම් ආධාර මුදල් ලබාගන්නා කෙනෙක් නෙවෙයි. මහන්සියෙන් වැඩක් කොට (Chip a Job), ඊට සරිලන මුදලක් උපයාගැනීමයි, ඔහුගේ විදිය. ඒ සඳහා වැඩකිරීමට වැඩ සතියක් ලෙස සතියක කාලයක්, (Job Week) සංගමයෙන් නම් කර තිබෙනවා. ඒ වැඩ සතිය වඩාත් අර්ථවත්ව සිදු කිරීම අරභයා දැන් හඳුන්වන්නේ, 'බාලදක්ෂ සේවා සතිය' නැතහොත් 'සේවා මාසය' ලෙසින්.

ඒ තුළ, දැන් ඔහු යම් සේවාවකට යෑමට පෙර වේලාවක් වෙන් කරගෙන, පෙර සූදානමක් ඇතිව රටේ පවතින අවදානම් තත්ත්වය පහ වූ පසු, පෙර සේම ඔවුන්ට මේ කාර්යයයේ නියැළෙන්නට හැකියි. කුඩා බාලදක්ෂයින් හෝ පෝතක බාලදක්ෂයන් තමන්ගේ නිවහනට හෝ ආයතනයට පැමිණි විට, ඔවුන්ට කළ හැකි මට්ටමේ ආරක්ෂාකාරී වැඩකොටසක් පැවරීමයි, සමාජයේ අප සියලුදෙනාගේ වගකීම. ඒ වගේම, කරන වැඩ කොටසට සාධාරණ මුදලක් ගෙවීමට ද ඔවුන් අවංක විය යුතුයි. මොකද, මේ කුඩා බාලදක්ෂයින් එසේ මහන්සි වී මුදල් හොයන්නේ, ව්‍යාපාරයේ උනන්තිය උදෙසා වන නිසා.

අද අපේ රටේ බාලදක්ෂ ව්‍යාපාරය තිබෙන්නේ කෙබඳු තැනකද.....

ඉතාමත් තීරණාත්මක අවධියක. කොවිඩ් වසංගතය නිසා අපේ පරිසරය සහ අපේ රටේ ආර්ථිකය බොහෝ වෙනස්වීම්වලට බඳුන් වී තිබෙනවා. ඒ අනුව, අනාගතයේ අපට මුහුණ දෙන්නට සිදුවන දුෂ්කරතා පිළිබඳ මෙන්ම, රටට අවශ්‍ය දේ රට තුළම නිපදවන සංස්කෘතියකට අනුගතවිය යුතු බව බාලදක්ෂයාද වටහා ගත යුතු වනවා.

විනය සහ සාරධර්ම එලෙසම තිබියදී ශ්‍රී ලාංකේය බාලදක්ෂ ව්‍යාපාරයේ රාමුගත සම්ප්‍රදාය ද අනිවාර්යයෙන් වෙනස් විය යුතු කාලය එළැඹෙමින් පවතිනවා. එහිදී බාලදක්ෂයින් බිහි කරන වැඩිහිටි නායකයන් හිතන පතන ආකාරය, ක්‍රියාත්මක විය යුතු ආකාරය මෙන්ම, පුහුණුව ලබන ආකාරය ද වෙනසකට බඳුන්විය යුතු වනවා. එසේම, බාලදක්ෂ ව්‍යාපාරය පිළිබඳ සමාජය තුළ එය ඇනුම තව තවත් පුළුල් විය යුතු යුගයක් එළැඹෙමින් පවතිනවා. මගේ හැඟීම නම්, ලෝකයේ වෙනස්වීමට වඩා වැඩි වේගයකින් බාලදක්ෂ ව්‍යාපාරයේ වෙනස්වීම සිදුවිය යුතු බවයි. එසේ නොවුණහොත් ලෝකයාට තබා බාලදක්ෂ ව්‍යාපාරයටවත් මෙහි වටිනාකම සහ වෙනස දැනෙන්නේ නැහැ.

බාලදක්ෂ ව්‍යාපාරයට ලොව හොඳම පිළිගැනීම තිබෙන්නේ කොහේද....

අපේ රටේ වසර සියයක් පුරා මේ ව්‍යාපාරය පැවත ආවත්, එය ආරම්භ වූ එංගලන්තය ඇතුළු ඕස්ට්‍රේලියාව, මැලේසියාව, සිංගප්පූරුව, ඇමෙරිකාව සහ පිළිපීනය යන රටවල බාලදක්ෂ ව්‍යාපාරයට විශාල පිළිගැනීමක් සහ තැනක් තිබෙනවා. එයට හේතුව වන්නේ, එම රටවල මෙම ව්‍යාපාරය ඉතාමත් හොඳ ක්‍රමවේදයක් අනුව ක්‍රියාත්මක වීම. ඒ උද්දීපනය අප රටටත් ළඟා කරගත යුතු බවයි, මගේ හැඟීම.

ඒ කියන්නේ, අපේ මේ බාලදක්ෂ ව්‍යාපාරය දැන් සිටින්නේ හැරවුම් ලක්ෂ්‍යයක් අභියසයද....

ඔව්. තරුණ ප්‍රජාව මෙම ව්‍යාපාරයට ආකර්ෂණය කර ගැනීමේ කඩිනම් වැඩපිළිවෙළකට යා යුතු කාලය උදා වී තිබෙනවා. ඒ සඳහා මෙම ව්‍යාපාරයත්, වැඩිහිටි ප්‍රජාවේත්, වෙනත් පුද්ගලික හා රජයේ ආයතනත් සිය උපරිම දායකත්වය ලබා දීම, අතිශය වැදගත්. මොකද ,හරි වේලාවේදී ගන්නා හරි තීන්දු, යම් සමාගමක හෝ ව්‍යාපාරයක අභිවෘද්ධිය උදෙසා සෘජුවම බලපානවා. ඇත්තටම, බාලදක්ෂ ව්‍යාපාරය තුළ ගොඩනැගෙන දරුවන් සහ තරුණයන් මේ සමාජය තුළ තව තවත් බහුල විය යුතුය. මොකද, කුඩා කල සිට යහපත් පුරවැසියන් සමාජගත කිරීමේ දැනට තිබෙන සාර්ථකම ක්‍රියාදාමය සහ වැඩපිළිවෙළ වන්නේ බාලදක්ෂ ව්‍යාපාරයයි. ඒ තුළින් ලබන විනය හා පන්තරයයි. ඒ නිසා මහජනතාව මූලික කරගත් ආයතන සහ සමස්ත සමාජයේම සහය මේ සඳහා අත්‍යවශ්‍යයි.

වේගවත් වර්ධනයක් කරා ගමන් කරන පෞද්ගලික විසල් බැංකු ජාලයකට නායකත්වය දෙන ඔබ, තවමත් බාලදක්ෂයෙක් කියන්නේ, අභිමානයෙන් ද...

ඇත්තටම ඔව්. 'වරක් බාලදක්ෂයකු වූ තැනැත්තා, සැමදා බාලදක්ෂයෙකි...' යන ප්‍රකට කියමනට මං හොඳම උදාහරණයක්, යහපත් පුරවැසියන් සහිත සමාජයක් රටේ ඵලදායි ආර්ථිකයට විශාල රුකුලක් සපයනවා. වැඩිහිටියකු වූ පසු විවිධ මාධ්‍ය ඔස්සේ පෝෂණය වුවත්, නායකත්වය පිළිබඳ සරල වුත්, ගැඹුරු වුත්, බොහෝ සාර්ථක අත්දැකීම් මා ජීවිතයට උකහා ගත්තේ ගල්කිස්සේ ශාන්ත තෝමස් විදුහලේ බාලදක්ෂයකු ලෙස ඇරැඹි මාගේ බලදක්ෂ ජීවිතයෙන්.

ව්‍යාපාරයට එක්වන සෑම බාලදක්ෂයෙක්ම, 'මාගේ ආගමට සහ රට වෙනුවෙන් යුතුකම් ඉටුකිරීමටද , සෑම කල්හිම අනුනට උපකාරී වීමටද, බාලදක්ෂ නීතියට කීකරු වීමටද...' යන කරුණු තුනට, මාගේ අවංක විශ්වාසය හා මාගේ සම්පූර්ණ උත්සාහය යොදවමි....' යනුවෙන් පොරොන්දුවක් ලබා දෙනවා. ඒ තුළ බාලදක්ෂයා, සිය ව්‍යාපාරයේ යෙදී සිටින ළමා සහ තරුණ වියේදී පමණක් නෙවෙයි, ඔහුගේ ජීවිත කාලය පුරාම මේ පොරොන්දුව තුළ ජීවත්වන්නට වෙර දරනවා. ඒවා ආකල්ප තරමට ළමයකුගේ ජීවිතයට කාවද්දන්න බාලදක්ෂ ව්‍යාපාරයට හැකියාව තිබෙනවා. මගේ ජීවිතය පුරා තවමත්, ඉදිරියටත් මං බාලදක්ෂයෙක්මයි.

මොනවද ඔබ අදත් සුරකින ඒ පොරොන්දු...

බාලදක්ෂයා විශ්වාසවන්ත අයෙකි. පක්ෂපාතී අයෙකි. බාලදක්ෂ හිතෛෂීය. කාරුණිකය. සෑම බාලදක්ෂයෙක්ම සහෝදරයෙකි. බාලදක්ෂයා සත්ව කරුණාව ඇත්තෙකි. ඔහු ධෛර්ය සම්පන්නය. සහයෝගයෙන් කටයුතු කරන්නෙකි. සොමිනස් සහගත පුද්ගලයෙකි. සකසුරුවම් අයෙකි. සිත කය හා වචනයෙහි පිරිසුදු අයෙකි... යන පොරොන්දුව අනුව, ජීවිත කාලය පුරාම මේ යහපත් ගුණධර්ම එක්ක ජීවත්වෙන්න බාලදක්ෂයා ක්‍රියා කරනවා. අදටත්, මගේ ජීවිතය හැඩගැස්වූ ප්‍රබල සාධකය ලෙස මා හඳුන්වන්නේ, මා බාලදක්ෂයකු වීමයි. වැඩිහිටියන් ලෙස අපේ දරුවන් බාලදක්ෂ ව්‍යාපාරයට වඩ වඩාත් යොමු කළ යුතු වන්නේ මෙන්න මේ කරුණු නිසයි.

රැකියාවකට යෑමේදීත් බාලදක්ෂයකුට විශේෂ තැනක් හිමි වනවාද...

ඔව්. බොහෝ සමාගම් කැමැතියි බාලදක්ෂ ව්‍යාපාරයේ අත්දැකීම් ඇති පුද්ගලයින් සේවයට බඳවා ගන්න. මොකද, ඔවුන් හොඳින් කාලය කළමනාකරණය කරන පුද්ගලයින්. වැඩි ඵලදායිතාවක් ලබා දෙන්න සූදානම්. ඔවුන් ලබා තිබෙන බාලදක්ෂ පුහුණුව, අධ්‍යාපන සුදුසුකම් හා සම්මිශ්‍රණය වූ විට, සාමාන්‍ය තරුණයකුගේ ඵලදායිතාවට වඩා බොහොම ඉහළින් තිබෙන, වෙනස් එකක්. පසුකාලීනව ඔවුන් නායකත්වයට පත් වූ විට, ඔවුන් නායකත්වයෙන් හිස උදුම්මවා ගන්නේ නැහැ. ඒ නායකත්වය භාවිත කරන්නේ කණ්ඩායම් හැඟීමෙන් යුතුව තව තවත් හොඳින් තම වැඩකොටස ඉටුකිරීම සඳහායි. බාලදක්ෂයන් ආයතනවල නායකයන් වූ විට, සැබවින්ම ඔවුන් කැපී පෙනන පුද්ගලයින් බවට පත්වන්නේ, මේ සදාචාරාත්මක හැදියාව තුළ ඔවුන් ගොඩනැගී ඇති නිසා.

පුංචි දරුවකු මෙසේ ගොඩනගන, බාලදක්ෂ ව්‍යාපාරය සතු සුවිශේෂී ක්‍රමවේදය කුමක්ද...

අවුරුදු හතේදී ව්‍යාපාරයට ඇතුළු වන පෝතක බාලදක්ෂයකු, වයසින් මුහුකුරා යනවාත් සමගම විවිධ පදක්කම් ඉලක්ක කොටගත්, ඒවා දිනාගන්නට වෙහෙස මහන්සි වී වැඩ කළ යුතු ක්‍රමවේදයකුයි, මේ තුළ ක්‍රියාත්මක වන්නේ. ඒ සෑම පදක්කමක් වෙනුවෙන්ම බාලදක්ෂයා කළ යුතු වැඩකොටසක් තිබෙනවා. එම වැඩකොටස කිරීමට සහ අධ්‍යයනය කිරීමට ඔහුට සිදුවනවා. එවිට කුඩා බාලදක්ෂයා වැඩ අරඹන්නේම සැලසුමකට අනුවයි. ඉදිරියේදී විවිධ අංශ සඳහා දිනාගත යුතු පදක්කම් සඳහා ඔහු සැලසුමකට අනුව ඉගෙන ගන්නවා. එනම්, ප්‍රථමාධාර සඳහා වූ පදක්කම තුළ, වෛද්‍යවරයකු මුණගැසෙන තුරු ජීවිතයක් බේරාගැනීමට ක්‍රියාත්මක විය යුතු ආකාරය ඔහු ඉගෙන ගන්නා අතර, විවිධ සිතියම් අධ්‍යයනය තුළින් සිතියම් ශාස්ත්‍රයට අදාළ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ඔහු උගනිනවා. මෙවැනි ආකාරයේ විවිධ පැතිකඩයන් 100 කට වැඩි සංඛ්‍යාවක් කරා හඹා යෑමට අවස්ථා, මේ පදක්කම් ඔස්සේ බාලදක්ෂයින්ට ලැබෙනවා.

ඒ අතරතුර ජීවිතය හා බැඳුණු බොහෝ සංවර සහ විනය මූලික කාරණාත්, සාමූහිකව ජීවත්වීමේ අගයත් කුඩා බාලදක්ෂයා ජීවිතයට එක් කරගන්නවා. කුඩා කල පටන් බාලදක්ෂයකු වූ මා, වසර 40 කට ආසන්න කාලයක් නියැළී සිටින මගේ බැංකු ජීවිතයට, බාලදක්ෂ ජීවිතයෙන් ලද පන්නරය සහ අත්දැකීම් අනේක වාරයක් ප්‍රයෝජනවත් වී තිබෙනවා.

අද සම්පත් බැංකුවේ කළමනාකාර ලෙස ඉහළම තනතුරේ සිටියදීත් ඒ ප්‍රයෝජනය එලෙසමද...

අනිවාර්යයෙන්. ශ්‍රී ලංකාව පුරා පැතිර ඇති ගනුදෙනුකාර ජාලයක් තුළ යහපත් පාරිභෝගික සහ මානව සබඳතා ජාලයක් ඇති කරගැනීමටත්, පන්දාහක් තරම් වන සේවක පිරිසකට නායකත්වය ලබාදීමටත්, ඒ අයගේ වෘත්තීය ජීවිත ඉහළට ඔසවා තබන්නට ඔවුන් දිරිමත් කරමින්, පාරිභෝගිකයන්ට ඉහළම සේවාවක් සපයන්නටත් බැංකුවේ ආයෝජකයන්ගේ අරමුණු සහ අභිලාෂයන් මුදුන්පමුණුවා ගැනීමටත් අදාළව විශාල මෙහෙයුම් කාර්යයභාරයක් සහ වගකීමක් දරන මා, ඒ සඳහා සෑම දිනකම ප්‍රබෝධවත්ව කටයුතු කරන්නේ තවමත් ක්‍රියාකාරී බාලදක්ෂයකු නිසයි.

ඔබට අනුව, අපේ රටේ බාලදක්ෂ ව්‍යාපාරයේ සිදු විය යුතු වෙනස්කම් මොනවාද...

තාක්ෂණය සහ ඉංග්‍රීසි භාවිතය තව තවත් වර්ධනය විය යුතුයි. මේ කාරණා දෙකම, බාලදක්ෂ කටයුතු සඳහා මුසුකළ යුතු කාලය එළැඹී තිබෙනවා. එයින්, ලෝකයේ සිදුවන දේ පිළිබඳ දැනුම ලබාගැනීම සහ බෙදාගැනීම මීට වඩා වේගවත් කළ හැකියි. කුඩා කල සිට ඒ නැඹුරුතාව වර්ධනය කරගැනීමට රුකුල් දීම තුළ, වැඩිහිටි බාලදක්ෂයකු වූ පසුත් ඔහුගේ ඉදිරි කටයුතු සඳහා විශාල පහසුවක් සපයනවා.

මේ අනුව බාලදක්ෂ ව්‍යාපාරයේ ඉහළ කළමනාකාරිත්වය දරන එම නිලධාරීන් සෑම දෙනාගේම දැනුම වැඩිකිරීම අද දිනට ගැළපෙන පරිදි පරිපාලන කටයුතු වෙනස් කිරීම ඉතාම වැදගත්.

විශේෂයෙන්, පරිපාලනයේ විවිධ කටයුතුවලට සහභාගී වන නිලධාරීන් හට ඒ අයගේ වගකීම් ලිඛිතව, පැහැදිලිව දැනුම් දීම ඉතා වැදගත්. ඒ වගේම ඒවාට අදාළ බලතල පැවරීම ඊටත් වඩා වැදගත්. වගකීමක් දරන්නාවූ කෙනකු, ස්වාධීනව බලතල ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලැබුණේ නැතිනම් ඒ අයට තමන්ගේ දැක්ම අනුව වගකීම් ඉටු කිරීමට හැකියාව ලැබෙන්නේ නැහැ.

ඒ අනුව, ලේඛනගත කළ වගකීම්වලට නොපෙනෙන බලතල ක්‍රියාත්මක කිරීම සුදුසු වන්නේ නැහැ. මෙවැනි දේ නොදැනුවත්කම නිසා ක්‍රියාත්මක වුවත් එය ව්‍යාපාරයේ ප්‍රවර්ධනයට බාධාවක් වන්නට පුළුවන්.

ඒ නිසා අද ලෝකයේ භාවිත තාක්ෂණය, කළමනාකරණ ක්‍රම, විවිධ රටවල බාලදක්ෂ ව්‍යාපාරය සංවර්ධනය කිරීමට කටයුතු කළ ආකාරය ද සොයා බලා, ශ්‍රී ලංකාවට සුදුසු එවැනි කළමනාකරණ ක්‍රම ආදේශ කිරීම බාලදක්ෂ ව්‍යාපාරයේ ඉදිරිය සාර්ථක කර ගැනීම උදෙසා අතිශය වැදගත්. අද ශ්‍රී ලංකාව බාලදක්ෂ සංගමයේ ඉහළ නිලතල දරන්නේ විශේෂයෙන්ම අධ්‍යාපනික සහ පරිපාලනමය වශයෙන් ඉහළම තැනක සිටින සහ අත්දැකීම් ලද පුද්ගලයන්.

උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ බාලදක්ෂ සංගමයේ ප්‍රධාන බාලදක්ෂයා වන්නේ, ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතායි. සභාපතිවරයා වන්නේ ඉංජිනේරු මෙරිල් ගුණතිලක මහතායි. ඒ වගේම විධායක කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන්නේ නීතිඥ කපිල කල්‍යාණ පෙරේරා මහතායි. සංගමයේ ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස් ලෙස කටයුතු කරන්නේ මේජර් ජෙනරාල් මිලින්ද පීරිස් මහතායි.

ඒ අයුරින් මේ පුද්ගලයින්ගේ අත්දැකීම් සහ දැනුම බාලදක්ෂ ව්‍යාපාරය සඳහා ඔවුන් කැප කරනුයේ පෞද්ගලික ආස්වාදය උදෙසාම නෙවෙයි. කුඩා කල සිට මේ අය සහ මා මේ අයුරින් කටයුතු කරන්නේ, ශ්‍රී ලංකාවේ යොවුන් පරපුර යහපත් පුරවැසියන් කිරීමට මහත් රුකුලක් වනු බව අප සෑම දෙනාම තරයේ විශ්වාස කරන නිසයි.

එම නිසා, මෙම ව්‍යාපාරයේ වටිනාකම අවබෝධ කරගෙන, රාජ්‍ය සහ පුද්ගලික ආයතන සහ සමස්ත රටවැසියන් ලෙස ඔවුන් ඔවුන්ට හැකි අයුරින් සහයෝගය දැක්වීමෙන්, මතු පුරපුර දක්ෂ ව්‍යාපාරිකයින්, ව්‍යවසායකයින් සහ වෘත්තිකයින් බවට පත් වීමට අප සෑම දෙනා අවස්ථා උදා කර දෙනවා. අපේ රටේ අනාගතය දීප්තිමත් කිරීමට බාලදක්ෂ ව්‍යාපාරය තුළින් හැකිවේවා! කියලයි, මං සැමදා ප්‍රාර්ථනය කරන්නේ.

ඉනෝකා පෙරේරා බණ්ඩාර



වැඩිම පළිබෝධ නාශක කොළ එළවළුවල!

● නිහාල් පී. අබේසිංහ

ඇතුවත් බැරි නැතුවත් බැරි පළිබෝධ නාශක අවභාවිතය හා ඉවක් බවක් නැතිව භාවිතය හා කෘෂි නිලධාරීන්ගේ උපදෙස් නැතිව භාවිතය නිසා පාරිසරික ගැටලු රැසක් ඇතිවී තිබේ.

ලොව පාරිසරික විද්‍යාඥයන් කළ අලුත්ම පර්යේෂණ අනුව විසිරී යන ලෙස විදින පළිබෝධ නාශක මඟින් සියයට 95 - 98 ප්‍රමාණයක්ම ඉලක්කගත සත්ව හෝ ශාක විශේෂ වෙත නොයන බව හෙළිවී තිබේ. ඒ වෙනුවට ඒ පළිබෝධ නාශක දියර ඒ අවට ඇති සත්ව හා ශාඛ විශේෂ වෙත ළඟාවී ඒවාට අහිතකර බලපෑම් ඇති කරන බව හෙළිවී ඇතැයි අන්තර් ජාතික පර්යේෂණ වාර්තා පෙන්වා දෙයි.

මේ පිළිබඳව කරුණු දක්වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ ගර්භ විද්‍යා සම්මානිත මහාචාර්ය සී.බී. දිසානායකයන් පවසන්නේ මේ අයුරින් භාවිත කරන පළිබෝධනාශක නිසා ජලය දූෂණය වීම නවත්වා ගැනීම අත්‍යවශ්‍ය බවයි. ජලය සියලු ජීවීන්ට අත්‍යවශ්‍ය දෙයක්.

එය දූෂණය වීම වැළැක්වීමට මේවා භාවිත කරන හා ඊට උපදෙස් දෙන අය කටයුතු කළ යුතුයි. පළිබෝධ නාශක පාවිච්චි කරන විට ඉන් සිදුවන දූෂණය හා එහි හිස් බෝතල් ජල මාර්ගවලට දැමීම නැවැත්විය යුතුයි.

එසේම මේවා භාවිතය පිළිබඳ කෘෂිකර්ම නිලධාරීන් ගොවීන්ට නිවැරදි උපදෙස් ලබාදිය යුතුයි. ගොවීන් ඔවුන්ගෙන්ම ඒ උපදෙස් ලබාගත යුතු යැයි ද මහාචාර්යවරයා කියයි.

අපේ රටේ පළිබෝධ නාශක පාලනය කිරීමට 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලන පනත අනුව බලය දී ඇත්තේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගැටබේ පිහිටි පළිබෝධ-නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයටයි.

පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සංඛ්‍යා ලේඛන අනුව පසුව වසර 7 ඇතුළත මෙරටට ගෙන්වා ඇති මුළු පළිබෝධ නාශක ප්‍රමාණය මෙට්‍රික්ටොන් 38 214 කි.

කෙසේ වුවත් පසුගිය කාලයේ අනුගමනය කළ පරිසර හිතකාමී කෘෂිකර්ම වැඩපිළිවෙළ නිසා මෙරටට ගෙන්වන පළිබෝධ නාශක ප්‍රමාණය 2019 දී සියයට 45 කින් පමණ අඩුවී ඇතැයි පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පවසයි.

වමේ සිට දකුණට පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්මානිත භූ ගර්භ විද්‍යා මහාචාර්ය සී.බී. දිසානායක, විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න සහ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් ආචාර්ය සුමිත් ජයකොඩි.

● පසුගිය වසර හත ඇතුළත පළිබෝධ නාශක මෙට්‍රික් ටොන් 38284ක් අපේ රටට ගෙනත්

● කල්ඉකුත් වූ පළිබෝධනාශක කිලෝග්‍රෑම් 24153 ක් රජයේ ගබඩාවල

පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් ආචාර්ය සුමිත් ජයකොඩි මහතා පවසන්නේ 2013 දී මෙරටට පළිබෝධ නාශක මෙට්‍රික් ටොන් 8100 ක් පමණ ගෙන්වුවත් 2019 දී ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4299.5 ක් දක්වා අඩුවී ඇති බවයි. 2018 දී පළිබෝ-ධ නාශක මෙට්‍රික් ටොන් 5325 ක් ගෙන්වා ඇති අතර 2016 දී ගෙන්වා ඇති පළිබෝධ නාශක ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4253 කි.

2015 දී අවසානයේදී පමණ පාර්ලිමේන්තු මන්ත්‍රී අතුර-ලියේ රතනහිමිපාණන්ගේ බලවත් උනන්දුව මත වස විස නැති රටක් හැදීම පිණිස 'ග්ලයිපොසෙට්' (රවුන්ඩ් අප්) වැනි පළිබෝධ නාශක රැසක් මෙරට භාවිතය තහනම් කෙරිණි.

මේ නිසා 2016 - 2017 වසර වලදී මෙරටට ගෙන එන පළිබෝධ නාශක ප්‍රමාණය තරමක් අඩුවිය. නමුත් පසුව 2018 දී පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් මේ පළිබෝධ නාශක තහනම් ඉවත් කෙරිණි. ඒ නිසා 2018 දී මෙරටට ගෙන්වූ පළිබෝධ නාශක ප්‍රමාණය යළි වැඩිවී ඇත. නමුත් 2019 දී ඒ ප්‍රමාණය අඩුවී ඇත්තේ කෘෂිකර්ම දෙපා-ර්තමේන්තුව ක්‍රියාත්මක කළ පළිබෝධ නාශක පිළිබඳව දැනුම්වත් කිරීම්, ඒකාබද්ධ පළිබෝධ නාශක වැඩපිළිවෙළ හා ජෛව පාලන වැඩපිළිවෙළ නිසා බව කෘෂි විද්‍යාඥයෝ පවසති.

මේ පිළිබඳව අදහස් දක්වන පාර්ලිමේන්තු මන්ත්‍රී අතුර-ලියේ රතන හිමියන් පවසන්නේ 2018 දී පමණ පසුගිය යහ-පාලන රජය තවත් විෂ පළිබෝධ නාශක 3 කගේ තහනම ඉවත් කළ බවයි. ඒ අනුව ක්ලෝරෝෆයිරිපොස්, කාබ්රිල් හා කාබොෆියුරාන් ඒ අතර වන බව ද උන්වහන්සේ පවසති. 2017 සිට මේ වර්ග තහනම් කර තිබූ බවත් කැබිනට් අනු-මැතිය නැතිව මෙම තහනම පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් ඉවත් කළ බවත් උන්වහන්සේ පවසති. මේ නිසා 2018 දී පළිබෝධ නාශක වැඩි වශයෙන් මෙරටට ගලා ආ බව සංඛ්‍යා ලේඛන පෙන්නුම් කරයි.

පළිබෝධ නාශක පාලනය පිළිබඳ කරුණු දක්වන කෘෂි-කර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා පුහුණු) ජේ.ආර්. සුබසිංහ මහතා පවසන්නේ අපේ රටේ දැනට එළවළ වර්ගවලට සිදුකරන පළිබෝධ නාශක භාවි-තය වැඩි බවයි. කෙසේ වුවත් එළවළු වගාවේදී පළිබෝධ නාශක භාවිතය අවම කිරීමට යහපත් කෘෂිකාර්මික වත්පිළි-වෙත් ක්‍රමය (GAP) ක්‍රියාත්මක කිරීම දැන් අරඹා ඇති බවත් ඔහු පවසයි. ඊට පෙර ක්‍රියාත්මක කළ ඒකාබද්ධ පළිබෝ-ධ නාශක වැඩපිළිවෙළට වඩා මේ වැඩපිළිවෙළ සාර්ථක වෙමින් පවතී.

"ඉස්සර හුගක් අය එළවළුවලට ඉවක් බවක් නැතිව පළිබෝධ නාශක පාවිච්චි කළා. නමුත් දැන් අපි ක්‍රියාත්මක කරන GAP වැඩපිළිවෙළ නිසා පළිබෝධනාශක භාවිතය තරමක් අඩුවෙලා. ඒ නිසාම ගොවියන්ට ලැබෙන ආදායමත් වැඩිවෙලා තිබෙනවා. අපි දැනට ගොවිජන සේවා මධ්‍ය-ස්ථානවල කෘෂිකර්ම උපදේශකවරුන් මගින් මේ යහපත් කෘෂිකාර්මික වත් පිළිවෙත් වැඩපිළිවෙළ ගම් මට්ටමට ගෙන ගොස් තිබෙනවා. එය බොහෝ දුරට සාර්ථකයි. මේ වැඩපි-ළිවෙළට ගොවි ජනතාව ක්‍රමයෙන් නැඹුරුවීමත් සමඟ අපේ රටේ පළිබෝධනාශක භාවිතය තවත් අඩුවේවි." කෘෂිකර්ම අධ්‍යක්ෂ සුබසිංහ මහතා පවසයි.

1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලන පනත මගින් පළිබෝධනාශක ආනයනය, ඇසිරීම, ලේබල් කිරීම, ගබඩා කිරීම, සංයෝග සකස් කිරීම, ප්‍රවාහනය කිරීම, විකිණීම හා බෙදා හැරීම පාලනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විධිවි-ධාන සැපයීම සිදු කෙරේ.

එම කටයුතු නියාමනය සිදු කරන්නේ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයයි. පළිබෝධ නාශක භාවිතය පිළිබඳ අදාළ නියාමන ආයතන මගින් ඉටුවිය යුතු කාර්ය භාරය පිළිබඳව හා බල පැවැත්වෙන රෙගුලාසි නියමයන්ට හා ප්‍රමි-තීන්ට අනුව ඒවා භාවිතා වන්නේ ද යන්න පිළිබඳව මෙන්ම එමගින් ඇතිවිය හැකි සෞඛ්‍යමය හා පාරිසරික ගැටලු අවම කිරීම පිළිබඳව ඉහත ආයතන මගින් ඉටුවිය යුතු කාර්ය භාරය පිළිබඳ සෙවීමට ජාතික විගණන කාර්යාලයේ පරිසර විගණන අංශය මගින් 2020 දී පරිසර විගණන වාර්තාවක් සකස් කර ඇත.

● පළිබෝධ නාශක වලින් සියයට 95ක් අපතේ?

එමගින් හෙළිවී ඇත්තේ 2013 සිට 2017 දක්වා ශ්‍රී ලංකාවට පළිබෝධ නාශක මෙට්‍රික් ටොන් 28,640 ක් ගෙන්වා ඇති බවයි. ඒ සඳහා ඩොලර් මිලියන 225 ක් හෙවත් රුපියල් කෝටි 4500 ක් වැය කර තිබිණි. 2019 ජූනි 30 වැනි දින වන විට ශ්‍රී ලංකාවට ආනයනය කර තිබූ මුළු පළිබෝධ නාශක වලට අඩංගු සක්‍රීය සංඝටක ප්‍රමාණය 200 කි. නමුත් පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් එහි භෞතික සම්පත් හා මානව සම්පත් උපයෝගී කර ගනිමින් වර්ත-මානයේ පරීක්ෂා කරනු ලබන්නේ පළිබෝධ නාශක සක්‍රීය සංඝටක 200 කින් සංඝටක 18 ක් පමණක් බව එම විගණ-නයේදී පැහැදිලි වී ඇත.

රට තුළට ආනයනය කරනු ලබන පළිබෝධ නාශක වල යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා වර්තමානයේදී එම පළිබෝ-ධනාශක නිෂ්පාදන රටවලින් නිකුත් කරන තත්ත්ව සහතිකය පමණක් පාදක කරගනු ලැබේ. ඒ අනුව 100% ක්ම දේශීය රසා-යනාගාර පරීක්ෂාවන් තුළින් පළිබෝධ නාශක පරීක්ෂා කිරී-මක් සිදු නොවන බව මෙහිදී පැහැදිලි විය. මෙම විගණන ගවේෂණය මගින් පළිබෝධ නාශක අලෙවි සහතික ලබා දීමේ කාර්ය භාරය පරීක්ෂාවේදී විධිමත් ආකාරයෙන් එය ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වී ඇත. පළිබෝධ නාශක අලෙවි සැල් නියාමනය ද ප්‍රමාණාත්මකව හා අඛණ්ඩව සිදු නොවන බව මෙම විගණයේදී පැහැදිලි වී තිබේ.

● මැහිතෙල් පාලනය අවධිමත්; සත්ව ශාක විශේෂ අනතුරේ; විගණකාධිපතිගෙන් බය හිතෙන වාර්තාවක්

මෙහිදී කල්ඉකුත්වූ පළිබෝධ නාශක පරිසර හිතකාමී ලෙස අපහරණය කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය වූ බවත් 2019 සැප්තැම්බර් 30 වන විට කල්ඉකුත්වූ පළිබෝධ නාශක ද්‍රව ආකාරයෙන් ලීටර් 2057 ක් හා ඝන ආකාරයෙන් පළිබෝධනාශක කිලෝග්‍රෑම් 24153 ක් රාජ්‍ය අංශයට අයත් ස්ථාන කිහිප-යක ගබඩා කර තිබූ බවත් මෙම විගණනයේදී හෙළිවී ඇත. මෙම කල්ඉකුත් වූ පළිබෝධ නාශක පරිසර හිතකාමී ලෙස අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගැනීමක් සිදු නොකර ඉතා දීර්ඝ කාලයක් අනාරක්ෂිතව ගබඩා කර තිබූ බවද මෙහිදී පැහැදිලි විය.

ආනයනය කරනු ලබන පළිබෝධ නාශක නියැදි රසාය-නාගාර පරීක්ෂණයකට භාජනය කිරීමට අවශ්‍ය මානව හා භෞතික පහසුකම් රේගුවේ ස්ථාපිත කර නොමැති අතර ආනයනකරු විසින් ඉදිරිපත් කරන තත්ත්ව සහතිකයට අදා-ළව මෙම පළිබෝධ නාශක නිෂ්කාශනය සිදුකරන බවත් මෙම විගණනයේදී හෙළිවූ බව විගණකාධිපති ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න මහතා හෙළි කර තිබේ. ආනයනය කරනු ලබන සියලුම පළිබෝධ නාශක නියැදි රසායනාගාර පරීක්ෂණ සිදු කිරීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් පරිදි පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ස්ථාපිත කර නොතිබුණු බවද විගණකාධිපතිවරයා පවසයි.

අම්පාර, කළුතර, මාතර, ගම්පහ, කුරුණෑගල, පුත්තලම, නුවරඑළිය දිස්ත්‍රික්කවල වී, කොළ එළවළු, අන්නාසි, අඹ, ගස්ලබු, මිරිස් හා එළවළු සම්බන්ධ සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී ගොවීන් විසින් පරිසරයට හා මානව සෞඛයට හිතකර ආකාරයට පළිබෝධ නාශක භාවිතය සිදු නොකරන බවද නිරීක්ෂණය විය.

පළිබෝධ නාශක භාවිතය හා පසුභාවිතය නියාමනය කිරීමට හා පාලනය කිරීමට අවශ්‍ය නිලධාරීන්ට පුහුණුව හා අඛණ්ඩව දැනුම යාවත්කාලීන කිරීමට වගකිව යුතු ආය-තන කටයුතු කළ යුතු බවද මෙහිදී පැහැදිලි වී ඇත. මෙම අධ්‍යයනය අනුව හෙළි වූ තවත් කරුණක් වූයේ 2018 වර්ෂය වන විට දිවයින පුරා පළිබෝධ නාශක අලෙවිසැල් 2094 ක් තිබුණත් ඉන් අලෙවි සහතික ලබා ගෙන තිබුණේ 1079 ක් පමණක් බවයි. මෙම විගණන වාර්තාවට අනුව පළිබෝධ නාශක ආනයනය, භාවිතය, කල් ඉකුත්වූ පළිබෝධ නාශක හා පලිබෝධනාශක හිස් බහාලුම් පරිසර හිතකාමී ලෙස ඉව-තට දැමීම යන කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු ආයතන-වල කාර්යක්ෂම බව වර්ධනය කර නොගතහොත් එමඟින් මානව සෞඛ්‍යයටත් සතා සිවුපාවාටත් ස්වාභාවික පරිසර-යටත් අහිතකර ප්‍රතිවිපාක සිදුවිය හැකි බව විගණකාධිපති-වරයා පෙන්වා දෙයි.

මෙම විගණන අධ්‍යයනයේදී අස්වැන්න නෙළීමට ආසන්න එළවළු හා පලතුරු නියැදි 340 ක් පරීක්ෂාවට ලක්කර ඇත. ඉන් නියැදි 89 කම ජගත් ප්‍රමිති හා මෙරට ප්‍රමිති අනුව තිබිය යුතු උපරිම පළිබෝධ නාශක ප්‍රතිශතයට වඩා පලිබෝධ-නාශක අන්තර්ගතව තිබී ඇත. කොළ එළවළු නියැදි 124 න් නියැදි 56 ක් එනම් 46% කම පමණ පළිබෝධ නාශක බහුලව තිබී ඇත. ඊට අමතරව එළවළු නියැදි 186 න් 29 කම ප්‍රමිතිය ඉක්මවූ මට්ටමින් පළිබෝධ නාශක අන්තර්ගතවී තිබූ බව විගණකාධිපතිවරයා නිකුත් කළ විගණන වාර්තාවෙන් හෙළිවී තිබේ.

● භාවිතය අවම කිරීමට කෘෂි දෙපාර්තමේන්තුව සූදානම්

වයඹ විශ්වවිද්‍යාලය හා පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය 2016 - 2917 වසරවලදී කළ පර්යේෂණයක් අනුව වාණිජ ලෙස වගා කරන කොළ එළවළුවල 100% ක්ම වාගේ පළිබෝධ නාශක අන්තර්ගත බව හෙළිවී තිබේ. පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් ආචාර්ය සුමිත් ජයකොඩි පව-සන්නේ පුත්තලම, නුවරඑළිය, කළුතර දිස්ත්‍රික්කවල නියැදි 700 ක් යොදාගෙන එම පර්යේෂණය කළ බවයි.

ඒ අනුව වාණිජ ලෙස මහා පරිමාණයෙන් වගා කරන අස්වැන්න නෙළීමට ආසන්නව තිබූ ගොටුකොළ, මුගු-ණුවැන්න හා කතුරුමුරුංගාවල අන් එළවළුවලට වඩා පළිබෝධ නාශක අඩංගුව තිබූ බව මේ පර්යේෂණය මගින් හෙළිවී ඇත. ඒ සමඟම ගෝවා, තක්කාලි වැනි එළවළු වලත් අනෙක් එළවළු වලට වඩා පළිබෝධ නාශක අන්ත-ර්ගත බව මින් අනාවරණය වී ඇත. මේ අනුව මෙරටට පසුගිය වකවානුවේ විවිධ වසරවලදී අඩු වැඩි වශයෙන් පළිබෝධ නාශක ගෙන්වා ඇත. ඒ අනුව වසරකට පළිබෝ-ධ නාශක මෙට්‍රික් ටොන් 4000 සිට 8000 දක්වා ගෙන්වා තිබේ.

අපේ රටේ පාරම්පරික කෘෂිකර්මය හා කාබනික කෘෂික-ර්මය මෙන්ම වාණිජ කෘෂිකර්මය මගින් රට ස්වයංපෝෂිත කිරීමට උත්සහ දරන මේ වකවානුවේ ඇතුවත් නැතුවත් බැරි පළිබෝධ නාශක පාවිච්චිය තීරසර ලෙස කළමනාක-රණය කිරීම ජාතික කර්තව්‍යයක් බවට පත්ව තිබෙන බව කිව යුතුය. ඒ සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් කෘෂි විද්‍යා-ඥයන් කෘෂි උපදේශකවරු හා ගොවි ජනතාව එක්වී පරි-සර හිතකාමී කාර්යක්ෂම වැඩපිළිවෙළක් වහාම සකස් කළ යුතුව ඇත.

ධර්මාලෝකය ශාස්ත්‍රාලෝකය හා විද්‍යාලංකාරය

● රත්මලානේ ධම්මාලෝක හිමි

එකුන්විසි වන සියවසේ දැල්වුණු ධර්ම ශාස්ත්‍ර දීපාවලියේ ආලෝකය මෙතෙරින් එතෙරටද ගලා ගියේය. එමතු නොව අලුතෙන් බිහි වුණු ඇතැම් ශාස්ත්‍ර ගුරුකුල මනුෂ්‍යයාගේ ලෝකෝත්තර විමුක්ති මාර්ගය මෙන්ම ලෞකික විමුක්තිමාර්ග පොහොණි කිරීමට තරම් නවීකාරක ආය-තන බවට පත් විය. පසු ගිය සියවසේ මෙරට සමාජ විපරිවර්තන ක්‍රියාවලියට සෘජු ලෙස දායක වූ විද්‍යාලංකාර පිරුවන එබඳු කීර්තිමත් විද්‍යාස්ථානයකි. මේ යුග කාරක විද්‍යාස්ථානය ස්ථාපනය කිරීමට පුරෝගාමී වූවානු රත්ම-ලානේ ධර්මාලෝක යතිනිද්‍රයෝය.

ධර්මාලෝක හිමියන්ගේ උපත සිදුවී තිබෙන්නේ 1828 වර්ෂයේ මැයි මස 28 වෙනි දිනය. රත්මලානේ විසූ රයිගම විදානෙලාගේ දොන් කොර්නේලිස් අප්පුහාමි සහ අඹේ-පිටියගේ දෝන අදියානා හාමිනේ උන්වහ-න්සේගේ දෙමවුපියෝය. ඔවුනු අකුරුකරණය සඳහා තම දරුවා රත්මලාන පුරාණ විහාරයේ වැඩවිසූ තලන්ගම සෝභිත ස්ථවිරයන්ගේ ශිෂ්‍ය වූ අඹුපේ සෝනුත්තර හිමියන් වෙත භාර කළහ. ඉගෙනීම සම්බන්ධයෙන් මේ කුමරුන් දැක්වූ බලවත් උද්‍යෝගය හඳුනා ගත් සෝනු-ත්තර හිමියෝ දෙමවුපියන්ගේ කැමැත්ත ලබා ගෙන ඔහු සසුන්ගත කළහ. ධර්මාලෝක නමින් සසුන් බිමට පිවිසි සාමණේර හිමියෝ කෝට්ටේ රාජ මහා විහාරයෙහි වැඩ විසූ නව කෝරලයේ නායක පදවිය දැරූ මලිගස්පේ මංගල හිමියන් වෙත වැඩි දුර අධ්‍යාපනය සඳහා යොමු කෙරුණහ.

එකල වස් පින්කම් පැවැත්වීමේදී පිටස්තර විහාරස්ථානයක වැඩ වාසය කරන ධර්මධර භික්ෂූන් වහන්සේ නමකට තම විහාරස්ථා-නයේ වස් විසීමට ආරාධනා කිරීමේ චාරිත්‍ර-යක් පැවතිණ. ඒ අනුව මලිගස්පේ නා හිමියෝ රත්මලාන විහාරස්ථානයේ වැඩ විසූ වලානේ සිද්ධාර්ථ හිමිපාණන්ට කෝට්ටේ රාජ මහා විහාරයේ වස් විසීමට ඇරයුම් කළහ. ඇරයුම පිළිගත් සිද්ධාර්ථ හිමිපාණෝ 1838 වර්ෂයේ වස් විසීම සඳහා කෝට්ටේ රජ මහා විහාර-යට වැඩම කළහ. සිද්ධාර්ථ හිමියන්ගේ පාණ්ඩි-ත්‍යය කෙරෙහි ප්‍රසාදව සිටි අඹුපේ සෝනු-ත්තර ස්ථවිරයෝ ධර්මාලෝක සාමණේර නම වලානේ සිද්ධාර්ථ හිමියන් වෙත භාර කළහ. වසර නවයකට අධික කාලයක් ධර්මාලෝක සාමණේරයෝ සිද්ධාර්ථ හිමියන් ඇසුරේ ශාස්ත්‍ර හදාළහ.

විවිධශාස්ත්‍ර හැදෑරීමෙහි අභිලාෂ ඇති ධර්මා-ලෝක සාමණේරයෝ 1849 වර්ෂයේ සත් කෝරලයට අයත් බඹරගල විහාරස්ථානයේ වැඩ විසූ බෝගහවත්තේ ස්ථවිරයන් කරා එළඹ ජ්‍යෝතිශ්ශාස්ත්‍රය හැදෑරීමේ කැමැත්ත පළ කළහ. ජ්‍යෝතිශ්ශාස්ත්‍රයෙහි හසළ දැනු-මක් ඇති පල්ලේවත්තේ මහා ස්ථවිරයන් වෙත යොමු කෙරුණු ධර්මාලෝක සාමණේරයෝ උන්වහන්සේ වෙතින් මනා ලෙස ජ්‍යෝතිශ්ශා-ස්ත්‍රය උද්ග්‍රහණය කළහ. පල්ලේවත්තේ ස්ථවි-රයන් ජ්‍යෝතිෂය හදාරා ඇත්තේ පටිටියේගම මහවාසල ගණිතාචාර්යයන් වෙතිනි.

ඔහුගේ පරපුර ජ්‍යෝතිෂයෙහි මෙන්ම විහාර සිතුවම් කර්මයෙහිද හසළ නිපුණත්වයක් ලැබ සිටි බව ප්‍රචලිතය. විහාර සිතුම් කලාව කෙරෙහි ඇදී ගිය සිතැති ධර්මාලෝක හිමියෝ කලක් සත් කෝරලයේ භායනයට ලක්වෙමින් පැවති විහාරාමවල කටුකොහොල් අරවා තමන් විසින්ම චිත්‍ර කර්ම කළහ. ධර්ම ශාස්ත්‍ර නිපුණ-ත්වය ලැබ සිටි සාමණේරයෝ දුර්ලභ ග්‍රන්ථ පිටපත් කිරීමේ සත් ක්‍රියාවටද සක්‍රීයව දායක වූහ. ධර්මාලෝක සාමණේරයෝ සත් කෝර-ලයේ වැඩ වාසය කළ කාලයේ ශිෂ්‍ය හින්ෂූ-න්වහන්සේට ශාස්ත්‍ර ඉගැන්වීමෙහිද නිමග්න වූහ.

ලෝ සසුන් වැඩ පිණිස කාලය කැප කිරීම නිසා ධර්මාලෝක හිමියන්ට නිසි වයසේදී උප-සම්පදාව ලැබීමට තිබූ අවස්ථාව ප්‍රමාද විය. 1860 වර්ෂයේදී උන්වහන්සේ පරණකුඹුරේ සර-ණංකර හිමියන් වෙතින් උපසම්පදාව ලදහ.

උපසම්පදාවෙන් පසු නැවතත් රත්මලානේ පුරාණ විහාරස්ථානට වැඩම කළධර්මාලෝක හිමියෝ ගිහි පැවිදි ශිෂ්‍යපර්ෂදයන්ට ධර්ම ශාස්ත්‍ර ඉගැන්වීමෙහි නිමග්න වූහ. මෙසේ ශාස්ත්‍ර ඉගැන්වීම ආරම්භ කෙරුණු පසු දිව-යිනේ නොයෙක් ප්‍රදේශවලින් ගිහි පැවිදි බොහෝ පිරිස් ශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා රත්ම-ලාන පුරාණ විහාරස්ථානය කරා ඇදී එන්නට පටන් ගත්හ. ඉතා කෙටි කලකින් රත්මලාන පුරාණ විහාරය දිවයිනේ ප්‍රසිද්ධ විද්‍යා-ස්ථානයක් බවට පත් විය. රජයේ භාෂා පරිවර්තක තනතුර දැරූ සයිමන් ද සිල්වා සෙනෙවිරත්න මුදලිතුමා, වෛද්‍ය අඟුලානේ වී. ඒබ්‍රහම් ප්‍රනාන්දු ධර්මාලෝක හිමියන් වෙතින් රත්මලානේදී ශාස්ත්‍ර උගත් ගිහියෝ වෙති. එවක සිටි ප්‍රසිද්ධ ජ්‍යෝතිශ්ශා-ස්ත්‍රඥයකු වූ දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි ද ජ්‍යෝති-ශ්ශාස්ත්‍රය පිළිබඳ ගැටලු තැන් පැන නැඟුණු කල ධර්මාලෝක හිමියන්ගෙන් විචාරා නිරාකර-ණය කර ගෙන තිබේ.1864 වර්ෂ-යේදී ධර්මාලෝක හිමියන් වෙත එළඹ ප්‍රව්‍රජ්‍යාව ලද කලපලුවාවේ (රත්මලානේ) ධර්මාරාමහිමියෝ මේ හිමියන්ගේ අග්‍රේසර පැවිදි ශිෂ්‍ය ශිෂ්‍ය රත්නය වූහ.

ධර්මාලෝක හිමියන්ගේ පාණ්ඩිත්‍යය රටෙහි පතළ වීමත් සමඟම බෞද්ධ අධ්‍යාපනය නඟා සිටුවීම කෙරෙහි ප්‍රෝත්සාහී වූ කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල වාසය කළ ප්‍රභූවරු මේ හිමියන්ගේ මාර්ගෝපදේශකත්වය පැතූහ. 1874 වර්ෂයේදී කැලණි රජමහ විහාරාධිපතිව වැඩ විසූ මාපිටිගම ධම්මරක්ඛිත ස්ථවිරයන් හා උන්වහන්සේගේ ශිෂ්‍ය සංඝරක්ඛිත හිමියන් ප්‍රමුඛ පෙතියාගොඩ දායක පිරිස පෙතියාගොඩ විහාරයෙහි වස් විසීමට ධර්මාලෝක හිමියන්ට ඇරයුම් කළහ.

1875 වර්ෂයේදී උන් වහන්සේට දළුගම වස් විසීමට ඇරයම් කෙරිණි. මේ ආරාධනයන්හි පරමාර්ථය වූයේ ධර්මාලෝක හිමියන්ගේ මූලි-කත්වයෙන් බෞද්ධ අධ්‍යාපනය ඒ ප්‍රදේශයේ ව්‍යාප්ත කිරීමට පදනම සකස් කර ගැනීමය. දොන් ඒබ්‍රහම් සමරතුංග රන්දුණු බස්නායක මුහන්දිරම්තුමාගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලංකාර දායක සභාව නමින් සංවිධානයක් පිහිටුවා ගත් ප්‍රදේශවාසී බෞද්ධයෝ ඒ ප්‍රදේශයේ ශාස්ත්‍රශා-ලාවක් පිටුවීමට ධර්මාලෝක හිමියන්ට ඇරයුම් කළහ.

1875 වර්ෂයේ පැලියගොඩ විද්‍යාලංකාර පිරු-වන ආරම්භ වන්නේ මේ පරිශ්‍රමයේ ප්‍රතිඵලය ලෙසිනි. රත්මලානේ ධර්මාලෝක හිමියන් සහ උන්වහන්සේගේ අග්‍ර ශිෂ්‍ය (කලපලුවාවේ) රත්මලානේ ධර්මාරාම හිමියන් පැලියගොඩ ඉදි කෙරුණු පොල්අතු සෙවෙණි කළ මඩුවක පිරුවන අරඹා ඉගැන්වීම් කටයුතු ඇරඹූ පසු නන් දෙසින් ශිෂ්‍ය ගණයා ශාස්ත්‍රෝද්ග්‍රහණයට ඇදී ආහ.

ධර්මාලෝක හිමියන් කෙරෙහි වූ උතුම් ගුණාං-ගයක් මූර්තිමත් වන්නේ ජීවිතාන්තය තෙක් කඩ නොකළ එක් පැවැත්මක් මගිනි. සතියේ දිනවල විද්‍යාලංකාර පිරුවනේ ඉගැන්වීමේ කටයුතුවල නිරත වන ධර්මාලෝක හිමියෝ සිකුරාදා සවස කැලණිය දුම්රිය ස්ථානයෙන් රත්මලානට වැඩම කොට සති අන්ත දින දෙක ප්‍රදේශවාසී දායක කාරකාදීන්ගේ සුබසිද්ධිය උදෙසා පුරාණ විහාරස්ථානයේ වැඩ වාසය කරති.

යළි පැලියගොඩ බලා වැඩම කරන්නේ සඳු දින උදයේය.

සිවු පසයෙන් තමාට උපකාරී වූ දායක පින්-තුන් හා නිජ ග්‍රාමය අමතක නොකිරීමේ උතුම් ගුණාංගයයි ඒ පැවැත්මෙන් මූර්තිමත් වූයේ. කෙටි කලක් ගත වන විට විද්‍යාලංකාර පිරු-වන නවීන ගොඩනැගිලි ඉදි වී භෞතික සහ ශාස්ත්‍රීය යන උභය පාර්ශ්වයෙන්ම දියුණුවෙන් දියුණුවට පත් වුවද ධර්මාලෝක හිමියෝ මුලින් ඉදි කෙරුණු පොල් අතු නිවහනෙහිම වාසයට රුචියක් දැක්වූහ.

නැණ නුවණින් කෙතරම් අග්‍රස්ථානයක වැජඹුණද සරල නිරහංකාර දිවි පැවැත්ම අත් නොහළ ධර්මාලෝක නා හිමියෝ ලෝ දහමට අවනතව 1887 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින සැට විය සපිරෙන්ම ආයු සංස්කාරය හළහ.

ඉන්දියාවේ BJP ලංකාවට එයිද

පිටුව 18

කැරලිකරුවන් හමුදාවෙන් ආයුධ පැහැරගත් හැටි

පිටුව 20

ලංකාවේ දවසකට දික්කසාද 400ක්

පිටුව 22

වීසා නැතිව එන කුරුල්ලන්ට මුද්දක්

පිටුව 23

පරිවේෂණාත්මක සාක්ෂි හා විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව පසුගිය දශක තුනක කාලයක් ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න නමි වූ ඔහු ලංකාවේ මෙතෙක් ආන්දෝලනයකට තුඩු දුන් නඩු බොහෝමයක රජය වෙනුවෙන් පැමිණිල්ල මෙහෙය වූ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකි. තවත් විටක ඔහු ජූරි සභාව ඇමතීමේ විශිෂ්ටයකු විය. මිරුසුවිල් නඩුව, ඇඹිලිපිටිය සිසු ඝාතනය, කොබෙයිගනේ අවුරුදු කුමාරි ඝාතනය, රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතනය, හෝකන්දර සය පුද්ගල ඝාතනය, බටලන්ද කොමිසම, විනිසුරු සරත් අඹේපිටිය, කටුනේරිය ප්‍රදේශයේ සිදු වූ ද්විත්ව ඝාතන වැනි රට හෙල්ලූ නඩු වෙනුවෙන් ඔහු දැක්වූ දායකත්වය විශිෂ්ටය. සිළුමිණ ඔබ වෙත ගෙන එන්නේ හිටපු ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතීඥ සරත් ජයමාන්නගේ ඒ මතකාවර්ජනයයි.

ටෝනි මාටින් ඝාතනයේ සුලමුල

අවසන් කොටස

ඇඟිලි සටහන් ඔස්සේ ඝාතකයා හසුකර ගත්තේ මෙහෙමයි

ටෝනි මාටින් නඩුවේ විත්තිකරුවන්ගේ ඉල්ලීම පිට මහාධිකරණ නඩුව විභාග කළේ ජූරි සභාවක් නැතිව විනිසුරුවරයා ඉදිරිපිටදිය. පැමිණිල්ලේ සාක්ෂි ඉදිරිපත් කිරීමට කිසිදු ඇසින් දුටු සාක්ෂියක් නොතිබුණු අතර සියලු සාක්ෂි රැඳි තිබුණේ පරිවේෂණීය සාක්ෂි මත පමණි. පැමිණිල්ල තම නඩුව අවසන් කිරීමෙන් අනතුරුව විනිසුරු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 200 වගන්තියට අනුව විත්තිකරුවන්ට විත්ති කූඩුවේ සිට කැමති නම් ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දුන් අතර 1 හා 2 වැනි විත්තිකරුවෝ විත්ති කූඩුවේ සිට තමන් නිර්දෝෂී බව පවසමින් මිනි මැරීමේ චෝදනාව ප්‍රතික්ෂේප කළ ආකාරය පසුගිය ලිපියේ අවසානයේ සනිටුහන් විය. මෙහිදී දෙවැනි විත්තිකරු කියා සිටියේ අදාළ ඝාතනය සිදු වූ දින තමා කොළඹ ප්‍රදේශයේ ක්ලබ් එකට ගිය බවත්, අනතුරුව තම කාරයෙන් නිවසට පැමිණි අවස්ථාවේ නිවසේ සුරතලයට ඇති කරන බල්ලා තම ඔඩොක්කුවට පැන්න බවත්, බල්ලාගේ නිය පහරින් තම අත තුවාල වූ බවත්ය. ඔහු විත්ති කූඩුවේ සිට සාක්ෂි ලබාදීමෙන් පසුව පැමිණිල්ලේ නීතීඥවරයා වූ එවකට රජයේ අධි නීතීඥ සරත් ජයමාන්න සිය අවසන් දේශනයේ තර්ක ඉදිරිපත් කළේ මේ ආකාරයෙනි.

'2 විත්තිකරුගේ අත බල්ලා සපා කෑවා නම් මේ තුවාල බල්ලාගෙන් සිදුවිය හැකිදැයි මහාචාර්ය සල්ගාදුගේ සාක්ෂියේදී හරස් ප්‍රශ්න නොඇසුයේ ඇයි? ඒ නිසා මෙම තර්ක මත 2 විත්තිකරු විත්ති කූඩුවේ සිට කළ ප්‍රකාශය බොරුවක් බව ප්‍රකාශ කරනවා....' යැයි

අපරාධකරුවන් ඇතුළු වූ ස්ථානය

පැමිණිල්ල මෙහෙය වූ රජයේ අධි නීතීඥ සරත් ජයමාන්න සිය දේශනයේදී අධිකරණයට අවධාරණය කර සිටියේය. අනතුරුව විත්තියේ නීතීඥයාගේ තර්කය මහාධිකරණය පිළිගත්තේය.

ටෝනි මාටින් නඩුවේ තවත් වැදගත් සාක්ෂියක් වූයේ 2 විත්තිකරුගේ ප්‍රකාශය මත වැල්ලවත්ත ධර්මාරාම පාරේ ඇළක තිබී සොයාගත් ජැකට්ටුවේ සියයට සියයක් නිවැරදිව ප්‍රකාශ කළ නොහැකි වුවත් පරිවේෂණාත්මක වශයෙන් මෙය වැදගත් සාක්ෂියක් විය.

ටෝනි මාටින් නඩුවේ වැදගත්ම සාක්ෂිය වූයේ ඇඟිලි සටහන් සාක්ෂියයි. මෙහිදී යළි සිහි කැඳ වෙන්නේ අපරාධය සිදුවූ ස්ථානයේ ටෝනි මාටින්ගේ කාමරයේ බිත්තියේ තිබී හමු වූ තෙත ලේ යැයි සැක කළ හැකි පැල්ලමයි. ඇඟිලි සටහන් පරීක්ෂකවරුන්ට මෙය හමුවන්නේ අපරාධය සිදුවී පැය 6 කට පමණ පසු ඔවුන් එතැනට පැමිණීමෙන් පසුවය.

යමකුගේ ඇඟිලි සටහනක් වැඩෙන්නේ මවු කුසේ කළල අවස්ථාවේදී ම ය. ඕනෑම කෙනකුට නිශ්චිත වූ හා අනන්‍ය වූ ඇඟිලි සලකුණු රටාවක් ඇති අතර ඇඟිලි, අත්ල, පතුල වැනි මේ ඕනෑම ස්ථානයක මෙම රටා දැකිය හැකිය. ලොව කෙනකුගේ ඇඟිලි සලකුණු රටාවක් තවත් කෙනකුට කිසිදා සම වන්නේ නැත. තවත් ආකාරයකින් සංඛ්‍යානමය හා විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව නම් විවිධ ඉරිවලින් සමන්විත මෙම රේඛා අතර එක ළඟ පිහිටි රේඛා කැබලි 12 ක එකතුවක් ලොව තවත් එකෙකුට සම වන්නේ නැත. මේ නිසා අපරාධකරු කවරහුද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට මෙම එක ළඟ පිහිටි ඉරි කැබලි 12 ක්වත් සොයා ගැනීම විද්‍යාත්මක පරීක්ෂණයකට හොඳටම ප්‍රමාණවත්ය. දහඩිය සිදුරු



තෙත ලේ සලකුණු ඇඟිලි සටහන

විත්තියේ නීතිඥවරයාගේ හරස් ප්‍රශ්නවලින් මහාචාර්ය සාක්ෂිය බිඳ වැටුණු හැටි

10 ක් පමණ ගත වී ඇත. ඉන් වසර දෙකකට පසු සුප්‍රසිද්ධ මොනාලිසා සිතුවම සොයා ගත්තේ පැරිස් නුවර විසූ පෙරුගියා නම් සැකකරුවකු විසින් එය ඉතාලියේදී විකිණීමට තැත් කරද්දීය. පෙරුගියා ජීවත්ව සිට ඇත්තේද ප්‍රංසයේ පැරිස් නුවර වන අතර මුල්ම ඇඟිලි සටහන් පරීක්ෂාවේදී විදුරුවේ වූ සලකුණු සමඟ දත්ත ගබඩාවේ වූ පෙරුගියාගේ ඇඟිලි සලකුණු සමඟ නොසැසඳුණේ මන්ද? දත්ත ගබඩාවේ වූයේ පෙරුගියාගේ දකුණු මහපටැඟිල්ලේ සලකුණය. නමුත් විදුරුවේ තිබුණේ වම් මාපටැඟිල්ලේ සලකුණය. මෙයින් ඇඟිලි සලකුණු පිළිබඳ වැදගත් තොරතුරක් ඉස්මතු වන්නේය. එනම් යමකුගේ එක් ඇඟිල්ලක ඇඟිලි සලකුණ අනිත් ඇඟිල්ලේ සලකුණට වඩා වෙනස් වන බවකි. ටෝනි මාටින්ගේ ඝාතන අනාවරණයේදී ඇඟිලි සටහන් හබය විසින් කැඳවූ මෙම විශේෂඥයාගේ මතය වූයේ රුධිරය පැයකින් වේළෙන්නක් බවත්, එමගින් ඇඟිලි සටහන් පරීක්ෂකවරුන්ගේ සාක්ෂි අසත්‍ය බවත්ය. මෙහිදී මහාචාර්යවරයා 1 විත්තිකරුගේ නීතිඥයා වන ජනාධිපති නීතීඥ ආර්. අයි ඔබේසේකරගේ කිරීම්වලට පිළිතුරු දුන්නේ මේ ආකාරයෙනි.

"මම අපරාධ වූ ස්ථානයට ගියේ නැහැ. නමුත් විත්තිය වෙනුවෙන් සාක්කි දෙන්න කී විට මම මාගේ විද්‍යාගාරයේ මේ සම්බන්ධ පරීක්ෂණයක් කළා. මෙහිදී මම මගේ ඇඟිල්ලෙන් ලේ ටිකක් සිරින්ජයකට ගෙන ඇඟිල්ලක ගා එය බිත්තියේ තැන්පත් කළා. සාම්පල දෙකක් එසේ කළා. මේ ලේ වේළෙන්න ගියේ පැයක් වැනි කාලයක්. එමනිසා රුධිරය වේළෙන්න ගතවන්නේ පැයක් වැනි කාලයක් බව මම තීරණය කරනවා. පැය 6 ක් ගතවීම බොරු. .."

අපරාධකරුවන් දෙදෙනාටම මරණ දඬුවම

අධිකරණයේදි දිග හැරුණේ මේ ආකාරයෙනි. ඝාතනය වූ ටෝනි මාටින්ගේ කාමරයේ බිත්තියේ වූ ඇඟිලි සලකුණ 1 විත්තිකරුගේ ඇඟිලි සටහන් හා මනාව ගැළපිණ. කෙසේ වෙතත් අපරාධයට පෙරදින මේ විත්තිකරුවන් දෙදෙනා මේ නිවසට ආගිය නිසා මේ සාක්ෂි ගැළපීම සිදු කළ යුතු වූයේ ඉතා ප්‍රවේසමිනි. නමුත් ටෝනිගේ සේවක ජයසේනගේ සාක්ෂියේ 1 විත්තිකරු කාමරයට නොගිය බව පැවැසීම පැමිණිල්ලට වාසිදායක විය. බිත්තියේ වූ ලේ

පැල්ලමේ ලේ; ටෝනි මාටින්ගේ ද? නැතිනම් විත්තිකරුවන්ගේද? ඇත්තෙන්ම මෙය මිනිස් ලේද? මේ වන විට ඩී.එන්.ඒ තාක්ෂණය නොතිබුණු හෙයින් ඔප්පු කිරීම උගහට විය. තවත් පැත්තකින් මෙම සාම්පල රජයේ රස පරීක්ෂකට යවන අවස්ථාවේදීද එය වියෝජනය වී තිබුණි. ඇඟිලි සටහන් පිළිබඳ සාක්ෂි විභාගයේදි අතිරේක රජයේ රස පරීක්ෂක ඒ.ආර්.එල් විජයසේකර ගෙන් රජයේ අධිනීතීඥ සරත් ජයමාන්න හරස් ප්‍රශ්න කිරීම් කළේ මේ ආකාරයෙනි.

'පැය 6 ක් යද්දි ලේ තෙත වශයෙන් තිබිය හැකිද?'

'එසේ තිබිය හැකියි'

පැමිණිල්ලේ නඩුව අවසන් වීමෙන් පසුව විත්තිය විසින් අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රසිද්ධ මහාචාර්යවරයකුව අධිකරණයට කැඳවූ අතර පැමිණිල්ල මෙහෙය වූ සරත් ජයමාන්නයන්ගේ වගකීම වූයේ විශේෂඥවරයාගේ සාක්ෂිය විද්‍යාත්මක අභියෝගයට ලක් කොට එය ප්‍රතික්ෂේප වන තත්ත්වයකට පත් කිරීමය. මෙහිදී විත්තිය විසින් කැඳවන ලද විශේෂඥවරයා හරස් ප්‍රශ්නවලට භාජන වූ ආකාරය මෙසේය. විත්තිය

ඉන්පසු සරත් ජයමාන්නයන්ගේ හරස් ප්‍රශ්න කිරීම් විය.

"ඔබ පරීක්ෂණයට භාවිත කළේ හැන්ද, සිරින්ජය හා වේලාව බැලීමට ඔරලෝසුව පමණි. නමුත් ඔබ වෙන කිසිම දෙයක් නිගමනයට ඒමට භාවිත කළේ නැහැ නේද?,"

" නැහැ"

"නිගමනයට ඒමට භාවිත කළේ සාම්පල දෙකක් නේද? ලෝකයේ මෙවැනි පරීක්ෂණ කර නිගමන වලට එළැඹීමට සාම්පල දෙතුන් සියයක් භාවිත කරනවා නේද?"

"ඔව්"

"ඔබ දන්නවාද, වාතයේ ජල වාෂ්ප මැනීමේ සොපේක්ෂ ආර්ද්‍රතාව) උපකරණ තියෙන බව? ඔබ පරීක්ෂණාගාරයේ මෙය මැන්නේ නැහැ නේද?"

"ඔව්"

"ඔබ භාවිත කළේ රුධිරය කුඩා ප්‍රමාණයක්, එය ඉතා සිනිදු පටලයක්. රුධිරයේ ඝනකම මනින්න වර්නියර් කැලිෆර් එක භාවිත කළේ නැද්ද?"

"නැහැ"

"අපරාධ වූ ස්ථානයට ගියාද? බිත්තියේ තීන්තවල ස්වභාවය දැක්කේ නැහැ නේද??"

"නැහැ"

"අදාළ නිවසේ වායු සමීකරණය දාලා තිබුණා. දැක්කද?"

"නැහැ"

"ඔබ විද්‍යාගාරයේ ෆෑන් 8 ක් දාලා තිබුණා නේද?" (මේ වන විට සරත් ජයමාන්න අදාළ විද්‍යාගාරය කලින් නිරීක්ෂණය කර තිබුණි)

"ඔව්"

"මේ තුළ අධි ශීතකරණ 4 ක් තියෙනවා නේද? මේ නිසා ඔබ විද්‍යාගාරය රත් වෙනවා"

"ඔව්"

"ජනේල 12 ක් විද්‍යාගාරයේ තියෙනවා නේද? ඒවා තුළින් හිරු එළිය වැටෙනවා නේද?"

" ඔව්"

"මින් පෙර අවස්ථාවලදී ඔබ රුධිරය ගැන පරීක්ෂා කරන විට රජයේ රස පරීක්ෂකගෙන් මතයක් ලබා ගත්තා නේද? ඔබ මහාචාර්යවරයකු විය හැකියි. නමුත් ඔබ රුධිරය සම්බන්ධ විශේෂඥවරයකු විය නොහැකියි"

රජයේ අධි නීතීඥ සරත් ජයමාන්නගේ අවසන් ප්‍රශ්නය වඩාත් තියුණු ආකාරයේ එකක් විය.

"ඔබ නීතීඥවරුන්ට හා විශ්වවිද්‍යාල සිසුන්ට පාඩම් පවත්වනවා නේද? (මේ වන විට සරත් ජයමාන්නද ඔහුගෙන් මේ සම්බන්ධව උගත් අයකු විය) සමහර විට රුධිරය ගැන දේශනත් කළා. එහිදි ඔබ මේ දේ කිව්වා. (සටහනක් ඇඳ පෙන්වමින්) ඔබ දුන් සටහනක මෙහෙම දෙයක් තියෙනවා. 'රුධිරය වේළීමට ගත වන කාලය සම්බන්ධයෙන් නිශ්චිත මතයක් ලොව කිසිම විද්‍යාඥයකුට ප්‍රකාශ කළ නොහැකි බව ඔබ ඉගැන්වුවා නේද?"

මහාචාර්යවරයා ජනාධිපති නීතීඥ සරත් ජයමාන්නයන්ගේ ප්‍රශ්න කිරීම් වලින් නිරුත්තර වූ අතර විත්තිවාචකය නැමැති මිනි පෙට්ටියේ ගැසූ ඇණද ටිකෙන් ටික තදවෙන්නට විය.

ටෝනි මාටින් නඩුවේ විත්තිකරුවන්ට එරෙහි පරිවේෂණීය සාක්ෂි ගෙතුණේ මේ අයුරිනි. අපරාධය වූ ස්ථානයේ තිබී හමු වූ 1 විත්තිකරුගේ ඇඟිලි සටහන්, 1 විත්තිකරුගේ

පිහිටි සිය මිතුරාගේ නිවසට යාම මෙන්ම එහිදි කාන්තාවක විසින් මරණය සම්බන්ධයෙන් පුවත්පතේ පළ වූ වාර්තාව විත්තිකරුට පෙන්වීම හා ඔහු නොහඳුනන බවට හැසිරීම ආදිය මෙහිදි එකතු කර ගත් පරිවේෂණීය සාක්ෂි වෙයි.

ටෝනි මාටින් ඝාතනය සම්පූර්ණයෙන්ම පරිවේෂණීය සාක්ෂි මත රැඳුණු නඩුවක් බව මුලින්ම පැවසුවෙමු. නඩුවේ විවිධ ප්‍රභවලින් එන නානාප්‍රකාර සාක්ෂි කැබලි වැනි තන්තුවලින් එකතු වූ කඹයකින් මිස පරිවේෂණීය සාක්ෂි සියල්ලේම එකතුවෙන් මිස තනි සාක්ෂි කැබැල්ලකින් පමණක් විත්තිකරු වැරදිකරු කිරීමේ හැකියාවක් නොමැත්තේය. පරිවේෂණීය සාක්ෂි ගැළපීමේදී එක දෙයක් කෙරෙහි පමණක් අවධානය යොමු කරමින් කටයුතු කිරීම නොකළ යුතු වන්නේ එමගින් අධිකරණය නොමඟ යා හැකි නිසාය. සෑම දෙයක් සම්බන්ධයෙන් පුළුල් විමසීමක් සිදුකළ යුතුමය.

පරිවේෂණීය සාක්ෂි සම්බන්ධ මූල්ම හා හොඳම උදාහරණය සපයන්නේ චුල්ලහත්ති පදෝපම සූත්‍රයෙන් බව රජයේ අධි නීතීඥ සරත් ජයමාන්න පවසයි. පා සලකුණින් පමණක් ඇතුන් සොයා ගැනීම උගහට බව කියා දෙන එම ජාතක කතාව පරිවේෂණීය සාක්ෂි සම්බන්ධව ඇති හොඳම පාඩමකි.

මහාධිකරණ විනිසුරු ජේ. ජයවික්‍රම නඩුව අවසන් කළේ විත්තිකරුවන් දෙදෙනා මිනි මැරීමේ චෝදනාව යටතේ වරදකරුවන් කර මරණීය දණ්ඩනය නියම කරමිනි. අනතුරුව 1988 දී මෙම නඩු තීන්දුවට එරෙහිව විත්තිකරුවන් අභියාචනයක් ගොනු

රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතන නඩුව

ටෝනි මාටින් මරා දැමීමට තබා එසේ සිතීමටවත් වුවමනාවක් තිබුණේ නෑ

චිත්තිකූඩුවේ සිට දෙවැනි චිත්තිකරු ප්‍රකාශයක් කරයි

අභිසෙල්ලම්කර

විත්තිවාචකය

නිවසේ වූ කනප්පුවේ අතුරුදන් පාදය අපරාධ බිමෙන් කැබලි තුනකට කැඩී හමු වීම, අපරාධ ස්ථානයේ තිබී හමු වූ ලී හිස සහිත මිටිය හා විත්තිකරුගේ ප්‍රකාශය මත සොයාගත් මල්ල තුළ වූ මිටියේ ඉතුරු ලී කැබැල්ල, මේ දෙදෙනාටම එරෙහිව ජයසේන විසින් ඉදිරිපත් කළ එනම් කලින් දින රාත්‍රියේ ටෝනි හමුවීම සඳහා 1 හා 2 විත්තිකරුවන් පැමිණීම, ඔවුන් පැමිණියේ ටෝනි මාටින් ළඟ තිබූ වාහනයේ පොත ඉල්ලීමට බව තමන්ට ටෝනි පැවසූ තොරතුරු, එසේම මල්ලේ තිබී හමුවූ ටෝනි මාටින්ගේ තොප්පිය, 2 විත්තිකරුගේ අතේ ඇඟිලි අතර වූ තුවාලය, 2 විත්තිකරුගේ ප්‍රකාශය මත සොයා ගත් මල්ලේ වූ ඉස්කුරුප්පු ඇණ, දෙවැනි විත්තිකරු කැඟල්ලේ

ලේ පැල්ලමක් පැයකින් වේළෙයිද?

වූ ඉස්කුරුප්පු ඇණ කිහිපයය. මෙම ඇණ හමුවීමේ මතකය දිග හැරෙන්නේ අපරාධය සිදු වූ ස්ථානය හා එහි ගලවා බිමට දමා තිබූ ජනේල යකඩ රාමුවය. එම ඇණ රජයේ රස පරීක්ෂකවරයාට යැවෙන අතර එහිදි හෙළි වූ සාක්ෂි මෙසේය. මේ පිළිබඳ අධ්‍යයනය කළ මූට්ටු සාක්ෂි විශේෂඥයන්ට අනුව " යකඩ රාමුවේ කළු පාට තීන්ත ගාලා තිබුණේ. සොයා ගත් ඇණ හිස් කළු පාටයි. නමුත් කඳ කොටස මලකඩ කාලා. වතුරේ තිබූ පසු මලකඩ කෑමේ වේගය වැඩියි. ඇණ හිසේ පරිධිය, සංයුතිය, ස්වභාවය හා භෞතික ලක්ෂණ අනුව අපරාධය වූ ස්ථානයේ ලී රාමුවට මේවා හොඳින්ම ගැළපෙනවා.."ඒ අනුව මේ සාක්ෂිය ඇඟිලි සටහන් මෙන් නිසා පෘෂ්ඨය මත රැඳුණු සමහර ඇඟිලි සටහන් පියවි ඇසට නොපෙනුණ ද, ඇඟිලි සලකුණු විශේෂඥයන් මෙවා මතුකර ගන්නට පවුඩර් වැනි කුඩක් එක් කරති. විද්‍යාඥයන් පෙන්වා දී ඇත්තේ යම් හෙයකින් යමකුගේ ඇඟිලි සටහන් පිලිස්සි ගියද, යළි වර්ධනය වූ පසුවද එම ඇඟිලි සටහන් නොවෙනස්ව පවතින බවකි.

ලියනාඩෝ ඩාවින්චිගේ විස්මිත මොනාලීසා රුව හා ඇඟිලි සලකුණු

1911දි ප්‍රංස ජාතික අපරාධ විද්‍යාඥයකු වූ ඇල්ෆොන්සු බර්ටිලන් පැරිස් නුවර පුද්ගලයන්ගේ ඇඟිලි සලකුණු එකතු කොට දත්ත ගබඩාවක් පවත්වාගෙන ගියේය. කෙසේ වෙතත් එම වසරේ ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ තැන්පත් කර තිබූ ලියනාඩෝ ඩාවින්චිගේ විස්මිත මොනාලීසා රුව අතුරුදහන් වූ අතර චිත්‍රයේ ආරක්ෂාවට තිබූ වීදුරු ආවරණයේ සැක කටයුතු ඇඟිලි සටහන්

තිබුණ ද එවා බර්ටිලන්ගේ දත්ත ගබඩාවේ ඇඟිලි සලකුණු සමඟ නොගැළපෙන්නට විය. මේ වන විට ඇඟිලි සලකුණු විද්‍යාව සොයා ගෙන වසර

ඉන්දිය මධ්‍යම රජයේ නිවාස ඇමති අමිත් ෂා

ඉන්දියාවේ සමාජ මාධ්‍යවල හාස්‍ය උපදමින් හුවමාරු වන සිතියමකි. මෙහි දැක්වෙන්නේ නේපාලය, භූතානය, මියන්මාරය සහ ශ්‍රී ලංකාව අත්පත් කර ගත් පසු ඉන්දියාවේ සිතියම දැක්වෙන අන්දමයි.

ත්‍රිපුර ප්‍රාන්ත ඇමති බිප්ලාප් ඩෙබ්

ලංකාවේ පිහිටවන්නට යන බීජේපී ආණ්ඩු කතාව

මහා කුමන්ත්‍රණයක හෙළිදරවිවක්ද?

ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ බීජේපී ආණ්ඩු පිහිටවිය යුතුය යන ප්‍රකාශය අසන්නට ලැබීමත් සමඟ බොහෝ දෙනා කලබලයට පත්ව තිබේ. එය ඉන්දියානු ව්‍යප්තවාදය යැයි ඇතැමෙක් කියන අතර තවත් අය පෙන්වා දීමට උත්සාහ කරන්නේ නරේන්ද්‍ර මෝදිගේ භාරතීය ජනතා පක්ෂය තම අක්මුල් ආසියාව පුරා විහිදවීමට උත්සාහ දරමින් සිටින බවයි. එහෙත් ඇතැම් දෙනා පවසන්නේ මේ ප්‍රකාශය සිදු කර ඇති පුද්ගලයා සහ ඔහු පවසන මේ කතා කිසිවක් හරයක් නොමැති නිකම් විහිළු කතා සේ සැලකිය යුතු බවයි.

මේ කතාව පවසා සිටියේ ඉන්දියාවේ ඊසාන ප්‍රදේශයේ පිහිටා ඇති ත්‍රිපුර ප්‍රාන්තයේ ඇමතිවරයකු වන බිප්ලාප් ඩෙබ්ය. ඒ පසුගිය පෙබරවාරි 15වැනිදාය.

ඔහු භාරතීය ජනතා පක්ෂයේ රැස්වීමක් අමතමින් පවසා සිටියේ භාරතීය ජනතා පක්ෂය වඩාත් ව්‍යාප්ත කිරීම සම්බන්ධව තමන් මධ්‍යම රජයේ නිවාස අමාත්‍ය අමිත් ෂා සමඟ අදහස් හුවමාරු කර ගත් බවයි. එහිදී ඔහු වැඩිදුරටත් පවසා සිටි අදහස් මෙසේය.

“රජයේ නිවාඩු නිකේතනයේ දී අපි අදහස් හුවමාරු කර ගනිමින් සිටියා. එහිදී අපේ ජම්වාල් (භාරතීය ජනතා පක්ෂයේ ඊසාන දිග ප්‍රදේශයේ ලේකම්වරයා) පවසා සිටියේ භාරතීය ජනතා පක්ෂය තවත් රාජ්‍යයන්වලද බලය තහවුරු කර ගත යුතු බවයි. එයට පිළිතුරු ලෙස අමිත් ෂා පවසා සිටියේ ශ්‍රී ලංකාව සහ නේපාලය තවමත් ඉතිරිව ඇති බවයි. අපි එහිදීත් ජයග්‍රහණය කළ යුතුයි.”

ඔහු මේ අදහස් ප්‍රකාශ කිරීමත් සමඟම ලොව පුරා ඔහුගේ මේ ප්‍රකාශය පැතිරී යෑමට පටන් ගත් අතර, එයට ප්‍රතිචාරද හිමිවන්නට විය. මෙහිදී විශේෂත්වය වූයේ ඉන්දීය ජනතාවම බොහෝ සෙයින් මේ ප්‍රකාශය විහිළුවක් සේ දකිමින්, එය විහිළුවට ගැනීමට කටයුතු කිරීමයි.

ඇතැම් දෙනා පවසා සිටියේ දැන් ඉන්දීය රජයක් ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ පිහිටුවීමටත් පසුව එය ක්‍රමයෙන් මියන්මාරය, චීනය දක්වා ගෙන ගොස් එතනින් රුසියාවේ සහ ඇමරිකාවේද ඉන්දීය ආණ්ඩු පිහිටුවීමට කටයුතු කරනු ඇති බවයි. තවත් පුද්ගලයන් ප්‍රශ්න කර තිබුණේ බිප්ලාප්ට පකිස්තානය මග හැරුණේ ඇයිද යන්නයි?

ඇතැම් දෙනා සමාජ මාධ්‍යවල මේ ප්‍රකාශය උපුටා දක්වා තිබුණේ බිප්ලාබ් ඩෙබ්ගේ තවත් පිස්සු ප්‍රකාශයක් යනුවෙන් දක්වමිනි.

සැබවින්ම ඉන්දීය සමාජ මාධ්‍ය තුළ ත්‍රිපුර ප්‍රාන්ත ඇමතිවරයාගේ මේ ප්‍රකාශය විහිළුවට ලක් වනු දැක ගත හැකි විය. එයට ප්‍රධාන හේතුවක් වී තිබුණේ ඔහු මීට පෙරද මෙවන් විහිළු සහගත සේ පෙනන ප්‍රකාශ කර තිබීමයි.

වරක් ඔහු ප්‍රසිද්ධ වේදිකාවකදී පවසා තිබුණේ පන්ජාබ්වරු ශරීර ශක්තියෙන් වැඩි වුවද බෙන්ගාලිවරුන්ට වඩා බුද්ධියෙන් අඩු බවයි. ඔහුගේ මේ ප්‍රකාශයද ඉන්දියාවක්ම හිනැස්සීමට සමත් විය. පසුව තවත් අවස්ථාවකදී ඔහු පවසා සිටියේ අන්තර්ජාලය සහ චන්ද්‍රිකා තාක්ෂණය ඉන්දියාවට කිසිසේත්ම අලුත් නොවන බවයි. ඒවා අද්දින් වසර 3000කට පෙර රාමාගේ පාලන සමයේ සිට ඉන්දියාවේ පැවති බවද ඔහු වැඩිදුරටත් පවසා සිටි අතර එවරද මුළු ඉන්දියාවම ඇති වන තුරු හිනාවුණේය.

දැන් ඉන්දියානුවන් පවසා සිටින්නේ බිප්ලාප් ඩෙබ් ඉන්දියාවේ සිතියම වැරදියට තේරුම් අරන් සිටින බවයි.

ඔහුගේ මේ ප්‍රකාශය විහිළුවක් සේ ඉන්දීය ජනතාව සලකන අතර ඉන්දීය විපක්ෂය නම් එය කිසිසේත් විහිළුවක් සේ නොසලකන බව පෙනී ගොස් ඇත්තේ ඔවුන් එයට ලබා දී ඇති ප්‍රතිචාර හේතුවෙනි.

ත්‍රිපුර ප්‍රාන්ත ඇමතිවරයාගේ මේ ප්‍රකාශය හොඳින් ග්‍රහණය කර ගත් විපක්ෂ කොංග්‍රසය එයින් බීජේපීයට හොඳහැටි තැලීමට පටන්ගෙන තිබේ. ත්‍රිපුර ප්‍රාන්තයේ විපක්ෂ මන්ත්‍රී තපාස් දේව් පවසා සිටියේ බිප්ලාප්ගෙ මේ ප්‍රකාශය ජාතික විරෝධී, ප්‍රජාතන්ත්‍ර විරෝධී බවයි. තමන් දේශපාලන පක්ෂයක් ලෙස අසල්වැසි රටවලට ගෞරව කරන බවත් එම රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීම කිසිසේත් සාධාරණීකරණය කළ නොහැකි බවත්ය.

කෙසේ වුවද බිප්ලාප්ගේ මේ ප්‍රකාශය විහිළුවක් සේ දිස් වුවද ඔහු තමා සමඟ සාකච්ඡාවට එක් වූ බවට නම් සඳහන් කළ අමිත් ෂා ඇතුළු සෙසු පිරිසද මේ දක්වා මුනිවත රකිමින් සිටීම ද නොසලකා හැරිය නොහැකිය.

ඉන්දියාව ලෝක බලවතකු ලෙස කලාපීය දේශපාලනයට සිදු කරන බලපෑම අතිමහත් බව අමුතුවෙන් කිව යුතු නොවේ. විශේෂයෙන්ම අසල්වැසි කුඩා රටවලට ඉන්දියාව නොයෙක් ආකාරයෙන් බලපෑම් කරමින් තමන්ට හිතවාදී පාලනයක් ඇති කර ගැනීමට කටයුතු කරන බව ඉතිහාසගත උදාහරණ බොහෝය.

පකිස්තානය ආර්ථික අතින් බිමටම පහත් වීමට පෙර ඉන්දියාව සතුවූ ප්‍රබලතම විරුද්ධවාදියා වූ අතර ඉන්දියාවට කරටකර තරගයක් ලබා දීමටද සමත්විය. අමතරව බංග්ලාදේශය, නේපාලය, භූතානය වැනි රටවල් ඉන්දීය පාලන පීඩනයෙන් නිතර පෙළුණුබව සිහිපත් කර දිය යුතුය.

මේ සියල්ලේ වඩාත් කනගාටුදායක සිදුවීම වාර්තා වන්නේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙනි. එය කොතරම්ද යත් ශ්‍රී ලංකාවේ ගුවන් සීමාව උල්ලංඝනය කරමින් යාපනයේ ජනතාවට ආහාර ලබා දීමට තරම් එවකට සිටි ඉන්දීය පාලකයෝ හිතුවක්කාරී වූහ. ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දීය ද්‍රවිඩ ජනතාව සම්බන්ධ කර ගනිමින් ඉන්දීය පාලකයෝ ශ්‍රී ලංකාවේ පාලනයට නොයෙක් ආකාරයෙන් මැදිහත් වූ අවස්ථා ඕනෑ තරමිය. ස්වකීය ද්‍රවිඩ ඡාතීන් අදාළ කරගනිමින් තමිල්නාඩුව ශ්‍රී ලංකාවේ පාලනයට ඇඟිලි ගැසීම් කළ අවස්ථා ගණනය කළ නොහැකි තරමිය. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදීව පත්වූ පාලකයන්ගේ ක්‍රියාවන්ට බලපෑම් කිරීමට තමිල්නාඩු පාලකයෝ උපවාස කළ අතර, මධ්‍යම රජයට බලපෑම් කරමින් ශ්‍රී ලංකා රජයට පීඩනය එල්ල කිරීමට කටයුතු කළ අවස්ථා ද රාශියකි.

ඉන්දීය දේශපාලනයේ මේ මැදිහත්වීම් සම්බන්ධව හිටපු ඉන්දීය දේශපාලනඥයකු වූ නට්වාර් සිං වරක් One Life is not Enough නම් වූ තම කෘතියෙන් පැහැදිලිව ප්‍රකාශ කර සිටියේය. ඔහු එහිදී තමා ලැබූ අමතකම නොවන අත්දැකීමක් වශයෙන් පවසා සිටියේ ගිනි ගෙන දැවෙන කොළඹ නගරයේදී පළාත් සභා ගිවිසුම අත්සන් කිරීමට රජීව් සමඟ පැමිණි අවස්ථාවයි.

මේ සියල්ල ඉන්දියාව ශ්‍රී ලංකාවේ පාලනයට මැදිහත් වූ අවස්ථාවන් මිස අන් කිසිවක් නොවේ. ඇතැම් විට යම් යම් මන්ත්‍රණ, කුමන්ත්‍රණ සමාජගත වූ අවස්ථාවේදී එය විහිළුවක් සේ පෙනී ගියද එය සැබෑවක් වන විට පුදුම වනු හැර විකල්ප ඉදිරි වී නොතිබෙනු ඇත.

මෙහිදී සාකච්ඡාවට බඳුන් වී ඇත්තේ අසල්වැසි රටවල පක්ෂ කාර්යාල පිහිටුවීම බවටද මතයක් සමාජ ගත වෙමින් තිබේ. එයට පිළිතුරු ලබා දී ඇති ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමසාරිස් නිමල් පුංචිහේවා පවසා ඇත්තේ ශ්‍රී ලංකාවේ නීතිය අනුව වෙනත් රටවල දේශපාලන පක්ෂවලට රටතුළ ක්‍රියාත්මක වීමට අවසර නොලැබෙනු ඇති බවයි.

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල සාමාජිකයන්ට වෙනත් රටවල සිට ක්‍රියාත්මක වීමේ අවසරය හිමි වුවද විදෙස් දේශපාලන පක්ෂවලට රටතුළ ක්‍රියාත්මක වීමේ අවසරයක් නොමැති බව මැතිවරණ කොමසාරිස්වරයා මාධ්‍ය හමුවේ පෙන්වා දී තිබේ.

මේ අන්දමින් නොයෙක් ආකාරයෙන් බිප්ලාප්ගෙ මේ ප්‍රකාශය අර්ථ ගන්වා ගත හැකි වුවද, තලියේ කිඹුලන් නොදැකිය යුතුවා වුවද ඉන්දීය බීජේපී පක්ෂය යනු කිසිසේත් සුළු කොට නොතැකිය යුතු පක්ෂයක් බව අපගේ වැටහීමය. එයට බලය ලබා ගැනීමට අවශ්‍ය වූ විට කුමන අන්දමේ නැටුමක් වුව නටන්නට පසුබට නොවන බව එහි අතීත උදාහරණවලින් පැහැදිලිය. අනික් අතට චීනය සමඟ කරටකර තරඟ වැදීමට සමත් ශක්තිමත් පක්ෂය බීජේපීය බව එය මේ වන විට එරට ජනතාවට ඉතා සූක්ෂ්මව, හෙමින් සීරුවේ තහවුරු කර ගනිමින් පවතින බව පැහැදිලිය. ඒ අනුව ඔවුන්ගේ යටිපෙළේ අසල්වැසි රටවල් සම්බන්ධව යම් යම් සැලසුම් පවතින බව ද නිශ්චල දිය සේ පැහැදිලිය.

අප රටේ ඉතිහාසය සලකන විට ඉන්දියාව දේශපාලනිකව අපට මැදිහත්වීම් සිදු කර ඇත්තේ වරක් හෝ දෙවරක් නොවන්නේය. ඉන්දියාව ගැසූ පළාත් සභා ගැටය තවමත් ලෙහා ගැනීමට අපට හැකියාව ලැබී නැත. වතුකරයේ රජුන් තනන්නන් බිහි කරවූයේ ඉන්දියාව බව දන්නෝ දන්නේය. අප රටේ සිවිල් යුද්ධයේ අවස්ථා කියකදී ඉන්දියාව මැදිහත් වූවාද යන්න බොහෝ දෙනාට දැන් මතක නැත.

අනික් අතට නේපාලයේ නමද මෙහිදී ගැවීම සුළු කොට තැකිය නොහැකිය. නේපාලයේ දේශපාලන අවුල් ඇති වීමේදී චීනය මෙන්ම ඉන්දියාවද දෙපස සිට නූල් අදින බව සක්සුදක් සේ පැහැදිලිය.

මේ වන විටත් නේපාලය ඉදිරියට හෝ පසුපසට යෑමට නොහැකිව එකතැන සිරවී සිටීමට මේ දෙරට අතර දේශපාලන බර අරගලය සහ අසල්වැසි රාජ්‍යය තමන් වෙත නතු කර ගැනීමේ නවතම උත්සාහය ප්‍රබල හේතුවක් වී ඇත්තේය. එබැවින් ත්‍රිපුර ප්‍රාන්ත ඇමතිවරයාගේ මේ ප්‍රකාශය කිසිසේත් සුළු කොට තැකිය නොහැකි වන්නේය.

සක්වළගල

• ටිරෝනි වැවලගේ

බයිඩන් ට්‍රම්ප්ගේ පිට කසයි: දෙවැනි දෝෂාභියෝගයෙන් ට්‍රම්ප් නිදහස්

“ඇමරිකානු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව සතු බලයෙන් ජනාධිපතිවරයා සතු බලය පාලනය වන ලෙස නිර්මාණය කර තිබුණද මේ වන විට පාර්ලිමේන්තුව ඉක්මවමින් ජනාධිපති ඒකාධිපතියකු සතු බලතල අත්පත්කර ගෙන අවසන්ය.”

හිටපු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තමන්ට විරුද්ධව එල්ල වී තිබූ දෙවැනි දෝෂාභියෝගයෙන් නිදොස් වූ බව පසුගියදා එරට සෙනෙට් සභාව නිවේදනය කර සිටියේය. ඔහුට මේ දෝෂාභියෝගය එල්ල කරනු ලැබුවේ ජනතාව කුපිත කරවීමේ චෝදනා සමඟිනි. පසුගියදා පැවති ඇමරිකානු ජනාධිපතිවරණය ජයගත් ජෝ බයිඩන්ගේ දිවුරුම් දීමේ උත්සවයට පෙර සිට රිපබ්ලිකන් පාක්ෂිකයන් වොෂිංටන් නගරයේ කළහකාරී ලෙස හැසිරීමට පටන් ගත් අතර, අවසානයේ ඔවුන් දිවුරුම් දීම පැවැත්වීමට නියමිත කැපිටල් ගොඩනැගිල්ලද ආක්‍රමණය කළහ. මේ සිදුවීම් සිදුවන අතර ට්විටර් මාර්ගයෙන් මේ කළහකාරීන් උද්දාමයට පත්වන අන්දමේ පණිවිඩ දිගින් දිගටම එවකට ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගෙ ට්විටර් ගිණුමෙන් නිකුත් වන්නට වූ අතර බලය අත්හැර යෑමට දින කිහිපයක් පමණක් ඉතිරිව තිබියදී ඔහුට දෙවැනි දෝෂාභියෝගය එල්ල කෙරුණේ මෙලෙස ජනතාව කුපිත කිරීමේ චෝදනාව යටතේය.

ධූරයෙන් නික්ම යෑමට පැය ගණනක් තිබියදී එල්ල වූ දෝෂාභියෝගය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත වූ අතර සෙනෙට් මණ්ඩල විභාගය පසුවට කල් තැබුණේ ඒ අතර බයිඩන්ගේ දිවුරුම් දීමේ උත්සවය පැවතීම හේතුවෙනි. කෙසේ වුවද ඒ වන විට ට්‍රම්ප් යනු හුදෙක් අහෝසි වූ දේශපාලනඥයකු පමණක්ම විය. ඔහුට විරුද්ධව රිපබ්ලිකන් පක්ෂය අභ්‍යන්තරයෙන්ම බලවේගයක් ක්‍රියාත්මක වූ අතර ඔහුගේ උප ජනාධිපති මයික් පෙන්ස් කල්තබාම ට්‍රම්ප් විරෝධියකු බවට පත්ව සිටියේය. තවත් රිපබ්ලිකන් සෙනෙට්වරුන් පිරිසක් ට්‍රම්ප්ගේ වැඩපිළිවෙල විවේචනය කරමින් ට්‍රම්ප් නොමැති රිපබ්ලිකන් ජයග්‍රහණයක් සම්බන්ධව අනාවැකි කියන්නට වූහ.

ඇමරිකාවේ බොහෝ දුරට පරාජිත දේශපාලනඥයන් පරාජිතයන් පමණක්මය. ඔවුන් ජනාධිපතිවරණ අපේක්ෂකත්වය පරාජයට පත්වූයේ නම් හෝ ජනාධිපතිවරණය පරාජයට පත්වූයේ නම් හෝ ඔවුන්ට යළිත් දේශපාලනයේ රැඳී සිටීමට ලැබෙන අවස්ථා අවමය. මෙහිදී බොහෝ දුරට සිදුවන්නේ මෙවැනි පරාජිත දේශපාලනඥයන් තමන් විසින්ම දේශපාලනයෙන් සමුගැනීමය. ඒ සඳහා හොඳම උදාහරණයද හොඳම ව්‍යතිරෝකයද හමුවන්නේ ඩිමොක්‍රටික් පක්ෂයෙනි. ඒ සඳහා හොඳම උදාහරණය ලෙස හිලරි ක්ලින්ටන් දැක්විය හැකිය. ඇය එක් අවස්ථාවකදී ජනාධිපති අපේක්ෂකත්ව තරගයෙන් පරාජයට පත්වූයේ බරක් ඔබාමාටය. දෙවැනි අවස්ථාවේදී ඇය ජනාධිපති අපේක්ෂකත්වය දිනාගන්නා අතර ඇය ජනාධිපතිවරණයේදී ට්‍රම්ප් හමුවේ පරාජයට පත්වූවාය. යළිත් ඇය දේශපාලනයේ නොයෙදුණු අතර අපේක්ෂකත්වය අත්හරිමින් ඩිමොක්‍රටික් ක්‍රියාකාරිනියක් ලෙස පමණක් කටයුතු කරමින් සිටින්නිය.

එහෙත් මේ සඳහා හොඳම ව්‍යතිරේකය ලෙස දැක්විය හැකි වන්නේද ඩිමොක්‍රටික් පක්ෂයේ ජෝ බයිඩන්ය. ඔහු අවස්ථා කිහිපයකදීම ජනාධිපති අපේක්ෂකත්වය ලබා ගැනීමට අපොහොසත් වූ නමුත් ඔහු දේශපාලනයෙන් බැහැර වූයේ නැත. ඒ වෙනුවට ඔහු ඇමරිකාවේ වියපත්ම ජනාධිපතිවරයා ලෙස වයස අවුරු 78දී ජනාධිපති ලෙස ජයග්‍රහණය ලැබුවේය.

කෙසේ වුවද හිටපු ජනාධිපති ට්‍රම්ප්ට පෙර දිගින් දිගටම ජනාධිපතිවරුන් ධූර කාල දෙකම සම්පූර්ණ කිරීමට සමත් වූ අතර ට්‍රම්ප් ජනාධිපතිවරයා ජනතාව අතර අප්‍රසාදයට ලක් වූ බැවින් ඔහුට පළමු ධූරකාලයෙන් පසු සමු ගැනීමට සිදුවිය. එහෙත් ඔහු සමුගැනීමට පෙර ඉඟි කර සිටියේ තමන් යළිත් වරක් බලයට පැමිණෙන බවයි. කෙසේ වුවද ඔහුගේ දේශපාලන අනාගතයට පහර වැදෙනු ඇත්තේ ඩිමොක්‍රටික් පක්ෂයෙන් නොව ඔහුගෙ රිපබ්ලිකන් පක්ෂය අභ්‍යන්තරයෙන්ම බව මේ වන විට පැහැදිලිය.

ඒ අනුව යළිත් වරක් ට්‍රම්ප් කිසිදින බලයට පත් නොවන බව නිශ්චිත වීමට මෙලෙස දෝෂාභියෝගයෙන් ට්‍රම්ප් ජය ගැනීමට හේතුවක් වන්නටද ඇත. ඒ මන්ද යත් බලයේ පවතින ඩිමොක්‍රටික් පක්ෂ ආණ්ඩුවක පාර්ලිමේන්තු බලට ලබා ගැනීම එතරම් විශේෂ දෙයක් නොවන බැවිනි. ගතවන මොහොත වන විට සෙනෙට් මණ්ඩලයේ ආසන දෙකක වැඩි බලයක් රිපබ්ලිකන් පක්ෂයට පැවතියද එම පක්ෂයේම කොටසක් ට්‍රම්ප්ට එරෙහිවූ බව අමතක කළ යුතු නැත. එහෙත් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බලය පවතින්නේ ඩිමොක්‍රටික් පක්ෂය සතුවය.

ඇමරිකානු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව සතු බලයෙන් ජනාධිපතිවරයා සතු බලය පාලනය වන ලෙස නිර්මාණය කර තිබුණද මේ වන විට පාර්ලිමේන්තුව ඉක්මවමින් ජනාධිපති ඒකාධිපතියකු සතු බලතල අත්පත්කර ගෙන අවසන්ය.

ඒ අනුව සැමවිටම ඇමරිකානු පාර්ලිමේන්තුව යටපත් වන අතර ජනාධිපතිවරයා හැමවිටම ඉස්මතු වේ. කෙසේ වුවද දෝෂාභියෝගයන් වැනි අවස්ථාවලදී යළිත් යටපත්ව පැවති පාර්ලිමේන්තුව අවධානයට ලක් වුවද පාර්ලිමේන්තු සාමාජිකයන් කටයුතු කරන්නේ ද ජනාධිපති අභිලාෂයන් අනුව බව අමතක කළ යුතු නැත.

ට්‍රම්ප් බලයට පැමිණි දින සිට කකුලෙන් ඇදීමේ නිතර වූ කතානායිකා නැන්සි පෙලෝසි ට්‍රම්ප්ට එල්ල වූ ප්‍රථම දෝෂාභියෝගය සඳහා පෙරමුණ ගත් අතර එහිදී ට්‍රම්ප් ඉතා සැහැල්ලුවෙන් එයට මුහුණ දුන්නේ සෙනෙට් සභාව සතු බලය පිළිබඳ විශ්වාසයෙනි. එවරද ඔහු දෝෂාභියෝගය ජය ගත්තේය.

මෙවර ඔහුට විරුද්ධව ඡන්ද සෙනෙට් සභාවේදී ඡන්ද 48ක් ලැබෙන්නේය. ඒ ඩිමොක්‍රටික් ඡන්ද 47ක් සහ එක් රිපබ්ලිකන් ඡන්දයක් වශයෙනි. එහෙත් ඔහුට පක්ෂව ලැබෙන සෙසු රිපබ්ලිකන් ඡන්ද 52 හේතුවෙන් ට්‍රම්ප් දෝෂාභියෝගයෙන් නිදහස් වන්නේය.

ඩොනල්ඩ් ට්‍රම්ප් මේ වන විට දේශපාලන පරාජිතයෙකි. ව්‍යාපාරිකයකු වශයෙන්ද ඔහු පරාජය වෙමින් සිටින බවට පසුගිය වසර පුරා වරින්වර වාර්තා විය. එවැනි පරාජිතයකු තවදුරටත් පරාජය කිරීමට දෙයක් නැත. තරගය පැවතියේ දෝෂාභියෝගයේ නොව ජනාධිපතිවරණයේදීය. ඒ අනුව ජනතාවට සිතා ගත යුතුව ඇත්තේ කැපිටල් ගොඩනැගිල්ලට සිදුකළ පහර දීමේදී ට්‍රම්ප්ගෙ ට්විටර් ගිණුම තමන්ම පණිවිඩ ඉබේ නිකුත් කරගත් බවය. නැතහොත් ජනතාව නිකම්ම කුපිත වූ බවය.

දේශපාලන යනු එසේය. එය ඇමරිකාවේද, ආසියාවේද කියා වෙනසක් නැත. අනික් අතට ට්‍රම්ප් වැනි තරමක් වෙනස් මිනිසකු බලයට පැමිණ ක්‍රමයේ යම් යම් වෙනස්කම් කිරීමට උත්හාස දැරීම මිස ඇමරිකාවේ ප්‍රධාන පක්ෂ දෙකද එකම කාසියේ දෙපැත්ත වැනිය.

දැන් තවදුරටත් ට්‍රම්ප් නැත. සිටින්නේ ප්‍රතිසංවිධානය වෙමින් තිබෙන රිපබ්ලිකන් පක්ෂය පමණි.

අති සාර්ථක බුෂ් පාලනයෙන් පසු රිපබ්ලිකන් පක්ෂය සාර්ථක වූයේම නැත. යම් තරමකට හෝ සාර්ථක වූ ට්‍රම්ප්ට හැකියාව ලැබුණේද එක් ධූරකාලයක් පමණක් අසීරුවෙන් ගෙවා දැමීමටය. එසේ නම් තවදුරටත් ගියවුන්ට පහර එල්ල කිරීමේ වැදගත්කමක් නැත. තවත් වසර හතරකට බයිඩන් රිපබ්ලික් පක්ෂය අමතක කර දමා ඇති බවට මේ උදාහරණය හොඳටම ප්‍රමාණවත්ය.

මේවසරේ දැනට වැඩිම ජීවිත හානි වාර්තා කළ ඉන්දුනීසියානු භූමිකම්පාව

ළඟ ළඟ සිදුවන භූමිකම්පා මහා විනාශයක පෙරනිමිත්ද?

මේ වසර ආරම්භයේ සිට නිතර අසන්නට ලැබුණු දෙයක් වූයේ වරින් වර සිදුවූ භූමිකම්පා පිළිබඳ විස්තරයි. පෘථිවියේ භූ තැටිතල එකිනෙක ගැටීම මත සිදුවන භූමිකම්පා යනු සාමාන්‍ය දෙයක් වුවද මැග්නිටියුඩ් මාපකයේ ඉහළ අගයක් ගන්නා භූමිකම්පා වාසනාවට මෙන් එතරම් සුලභ නොවේ.



ෆුකුෂිමා භූමිකම්පාවේ අපිකේන්ද්‍රය. 2011 වසරේ භූමිකම්පාව වාර්තා වූයේද මේ ප්‍රදේශයෙන්මය.

සියලු කරුණු පෙළට එක් කළ විට පෙනී යන්නේ ඔස්ට්‍රේලියාවත්,ජපානය සහ ඉන්දියාවත් යා කරමින් ත්‍රිකෝණයක් නිර්මාණය කරන්නේ නම් එම ප්‍රදේශයේ භූමිකම්පාවල වඩා සක්‍රීය බවක් දක්නට ලැබෙන බවයි. එසේ සක්‍රීය බවක අවසාන ප්‍රතිඵලය ප්‍රභලත්වයෙන් වඩා වැඩි භූමිකම්පාවක් වීමට විශාල ඉඩක් පවතින බව ඉතිහාසය පෙන්වා දී ඇත්තේ එක් අවස්ථාවකදී පමණක් නොවේය.

ලොව පුරා සිදුවන භූමිකම්පා වාර්තා කිරීමට දියුණු තාක්ෂණය ඔස්සේ ක්‍රම කිහිපයක් දියත් කර තිබෙන අතර එම භූමිකම්පා පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට නිරතුරුව සැදී පැහැදි සිටින වෙබ් අඩවිද කිහිපයක්ම වේ. මේ වෙබ් අඩවි නිරීක්ෂණය කරන්නේ නම් සාමාන්‍යයෙන් මැග්නිටියුඩ් දෙකට අඩු භූමිකම්පා වසරකට සිය ගණනින් ලොව පුරා වාර්තා වන බව හඳුනාගත හැකි වනු ඇත. එහෙත් 2021 වසර ආරම්භයේ සිට මේ වන විට මැග්නිටියුඩ් ඒකක හතට වැඩි භූමි කම්පා දෙකක් පමණද, ඒකක පහට වැඩි භූමිකම්පා කිහිපයක්මද වාර්තා වී තිබේ. මෙය එතරම් හොඳ තත්ත්වයක් නොවන බව අනුමාන කළ හැකි වන්නේ දරුණු භූමිකම්පාවකට පෙර පෙර කම්පන සිදුවන බව අවස්ථා කිහිපයකදීම මීට පෙර නිරීක්ෂණය වී ඇති බැවිනි.

මේ වසර උදාවී මේ වන විට ගත වී ඇත්තේ දින පනහකට ආසන්න කාලයක් වුවද මේ දක්වා ඒකක හතට වැඩි භූමිකම්පා තුනක් වාර්තා වී තිබේ. වාර්තා වී ඇති ඒකක හයත් හතත් අතර ප්‍රබලතාවෙන් යුතු භූමි කම්පා සංඛ්‍යාව 22කි. ඒකක පහත් හයත් අතර ප්‍රබලතාවෙන් යුතු භූමිකම්පා 277ක් ද, ඒකක හතරත් පහත් අතර ප්‍රබලතාවෙන් යුතු භූමිකම්පා 1200ක් පමණද සිදුවී තිබේ. යළින් මේ භූමිකම්පා සියල්ල සිදුවී ඇත්තේ මාස එකහමාරක පමණ කාලයක් තුළ බව අමතක කළ යුතු නැත.

ගතවූ දින පනහක කාලය තුළ සිදු වී ඇති ප්‍රභලතම භූමි කම්පාව වාර්තා වී ඇත්තේ පෙබරවාරි 10වැනිදාය. ඒ නව කැලිඩෝනියා දූපත් ආසන්නයේය. මේ නව කැලිඩෝනියාව පිහිටා ඇත්තේ ඔස්ට්‍රේලියාව ආසන්නයේ එයට බටහිර දෙසිනි. එම භූමිකම්පාව මැග්නිටියුඩ් මාපක 7.7ක ප්‍රභලත්වයෙන් යුක්ත වූ අතර වාසනාවකට මෙන් එකද මරණයක් හෝ වාර්තා වූයේ නැත.එයට හේතුව වූයේ භූමිකම්පාව ගැඹුරු මුහුදේ සිදුවීම, එහි අපිකේන්ද්‍රය ආසන්නයේ රටවල් පිහිටා නොතිබීම සහ ආසන්න රටවල් වූ කැලිඩෝනියානු දූපත්ද අවම ජනගහනයකින් යුක්ත වීමය.

භූමිකම්පාව වාර්තා වීමෙන් පසු නවසීලන්තය ප්‍රධානව අවට දූපත් රාජ්‍ය කිහිපයකටම සුනාමි අනතුරු ඇඟවීම් සිදුකළද සුනාමි රළ කඩාවැදීමක් වාර්තා වූයේ නැත. දැනට වාර්තා වූ දෙවැනි ප්‍රබලතම භූමි කම්පාව පෙබරවාරි 13වැනිදා ජපානයෙන් වාර්තා විය. ඒ එරට මියාගි හි ෆුකුෂිමා ප්‍රදේශයෙනි.

මේ ප්‍රදේශයේ 2011 වසරේදී ඉතා බිහිසුණු භූමිකම්පාවක් සිදු වූ අතර එය මැග්නිටියුඩ් මාපක 9.0ක් විය. එහි දී අඩි 46ක් උසට නැඟුණු සුනාමි රළ පහර හේතුවෙන් ෆුකුෂිමා න්‍යෂ්ටික බලාගාරයට හානි සිදුවූ අතර එය චර්නොබිල් බේදවාචකයට පසු පෘථිවිය මත වාර්තා වූ බිහිසුණුම න්‍යෂ්ටික බලාගාර අනතුර විය.

පසුගියදා වාර්තා වූ භූමිකම්පාවද එම අතීත බිහිසුණු භූමිකම්පාව සිදුවූ අපිකේන්ද්‍රයට ආසන්නයේ සිදු වුවද එය එතරම් හානිකර වූයේ නැත. එහෙත් වඩා වැඩි මරණ සංඛ්‍යාවක් වාර්තා කළ භූමිකම්පාවක් පසුගිය ජනවාරි 14වැනිදා ඉන්දුනීසියාවෙන් වාර්තා විය.

එරට බටහිර සුලවෙසි ප්‍රදේශයෙන් වාර්තා වූ මේ භූමිකම්පාව මැග්නිටියුඩ් 6.2ක ප්‍රබලත්වයකින් යුක්ත විය. එහෙත් මරණ සියයකට වඩා වාර්තා වූයේ භූමිකම්පාවට ලක්වූ ප්‍රදේශය අධික ජනගහනයකින් යුක්ත වූ නිසාය. පසුගිය ජනවාරි 21වැනිදා ද මැග්නිටියුඩ් 7-0ක භූමිකම්පාවක් පිලිපීන මුහුදෙන් වාර්තා වුවද එයද ජීවිත හානිවලින් තොර විය.

පසුගිය 13වැනිදා පැපුවා නිව්ගිනියා ප්‍රදේශයෙන්ද ඒකක 6.0ක භූමිකම්පාවක් වාර්තා වූ අතර පසුගිය 14වැනිදා ඉන්දියාවේ අම්රිත්සාර් නගරයටද භූකම්පනයක ප්‍රබලතාව අත්විඳීමට ලැබුණා. එය මැග්නිටියුඩ් 6.1ක ප්‍රබලත්වයෙන් යුත්ක බව වාර්තා විය. පසුව උස්බෙකිස්තානයටද මේ භූමි කම්පාව අත්විඳීමට ලැබුණු බව වාර්තා වූ අතර එම භූමිකම්පාවේ අපිකේන්ද්‍රය උස්බෙකිස්තානය ආශ්‍රිතව සිදුවී ඇති බව තහවුරු විය.

මේ සියලු කරුණු පෙළට එක් කළ විට පෙනී යන්නේ ඔස්ට්‍රේලියාවත්,ජපානය සහ ඉන්දියාවත් යා කරමින් ත්‍රිකෝණයක් නිර්මාණය කරන්නේ නම් එම ප්‍රදේශයේ භූමිකම්පාවල වඩා සක්‍රීය බවක් දක්නට ලැබෙන බවයි. එසේ සක්‍රීය බවක අවසාන ප්‍රතිඵලය ප්‍රබලත්වයෙන් වඩා වැඩි භූමිකම්පාවක් වීමට විශාල ඉඩක් පවතින බව ඉතිහාසය අපට පෙන්වා දී ඇත්තේ එක් අවස්ථාවකදී පමණක් නොවේය.

මැග්නිටියුඩ් ඒකක නවය ඉක්මවූ භූමිකම්පා ඉතිහාසයේ මේ දක්වා වාර්තා වී තිබෙන්නේ අතේ ඇඟිලි ගණනටත් අඩුවෙනි. එහෙත් ඒ වාර්තා වී ඇති භූමිකම්පා ප්‍රමාණයද හොඳටම ප්‍රමාණවත් යැයි හැඟෙන තරමට විනාශකාරී විය. මේඅන්දමින් එක් කලාපයක භූමිකම්පා සක්‍රීය වීම එක් ප්‍රබල භූමිකම්පාවක පෙර කම්පන වීමටද සැලකිය යුතු ඉඩක් තිබේ. යම් අන්දමකින් එවැනි විනාශයක් වූයේ නම් එය මේ මොහොතේ කොවිඩ් වයිරසයෙන් බැටකමින් සිටින ලෝකයට දරා ගත නොහැකි තරමේ ප්‍රහාරයක් වනු ඇති බව අමුතුවෙන් කිව යුතු නොවන්නේය.

මේ වන විට අපේ රටේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතවද මැග්නිටියුඩ් 3ට අඩු භූමිකම්පා කිහිපයක් වාර්තා වී ඇති බවද අමතක කළ යුතු නැත.

සාමාන්‍යයෙන් වසරක තුළ පෘථිවිය තුළ භූමිකම්පා 12,000- 15, 000ත් අතර ප්‍රමාණයක් සිදු වන අතර මෙවැනි සුළු කම්පන සැලකිය යුතු නොවන බවට වුවද තර්ක ඉදිරිපත් විය හැකිය. එහෙත් මේ සම්බන්ධව අවධානය යොමු කරන කවරෙකුට වුවද මේ වසරේ ආරම්භයේ සිට ෆැසිපික් සහ ඉන්දියන් සාගර කලාපයේ භූමිකම්පාවල වර්ධනයක් පවතින බව පැහැදිලිව දැකිය හැකිය.

කෙසේ වුවද සොබාදහම මිනිසාට පාලනය කළ නොහැකි බැවින් කළ යුතු හොඳම දෙය වඩාත් සැලකිල්ලෙන් පසුවීම සහ අනතුරකදී විය හැකි හානිය අවම කිරීමට සැලසුම් සකස් කිරීමය.

2011 භූමිකම්පාවේදී සුනාමි රළ ජපානයට කඩා වදිමින්

සමාජයෙන් දුරස්ව දෙවියන්ට ළංව

මේ තරුණිය දෙවියන් නමදින්නේ තායිලන්තයේ බැංකොක් නුවර හින්දු දේවස්ථානයකදීය. ඇය වටා රතු පැහැති කොටු සලකුණු කර ඇති අතර ඇයද එම කොටුවක් තුළ රැඳී සිටින්නීය. මේ කොටු දේවස්ථාන තුළ මින් පෙර නොවූ නමුත් කොවිඩ් වසංගත ව්‍යප්තියන් සමඟ දැන් දෙවියන්ට ළං වීමට පෙර සමාජයෙන් දුරස් වීමට වන්දනාකරුවන්ට සිදුවන්නේය.



සක්වළගල

● ටිරෝනි වෑවලගේ

2011 භූමිකම්පාවේ විනාශය

2011 වසරේ භූමිකම්පාවේ දී න්‍යෂ්ටික බලාගාරය ගිනිගනිමින්

රජ පවුල සතුටු කළ හැරී ගේ ප්‍රකාශය

පසුගිය ආදරවන්තයන්ගේ දවසේ හැරී කුමාරා සිදු කළ ප්‍රකාශයක් හේතුවෙන් බ්‍රිතාන්‍ය රජ පවුල ප්‍රීතියෙන් ඉපිලී ගොස් ඇති බවක් වාර්තා වනවා. මෙතෙක් දිනක් හැරීගේ ප්‍රකාශ හේතුවෙන් කනගාටුවට පත් වූ රජ පවුල ප්‍රීතියට පත් කිරීමට හේතුවූ මේ ප්‍රකාශයත් හැරී සිදු කර තිබුණේ තමන්ගේ දරු පවුල සම්බන්ධයෙන්ම තමයි.

හැරීගේ මේ ප්‍රකාශයෙන් කියවුණේ තමන්ගේ සහ මේගන්ගේ පවුලට තවත් සාමාජිකයකු එක් වීමට යන බවයි. මේ පුවත රජ පවුලේ මහ රැජින, පිලිප් කුමරා සහ චාල්ස් කුමරා තම සතුට ප්‍රකාශ කරමින් වෙන වෙනම නිවේදන නිකුත් කර ඇති බවත් සඳහන්.

මේ වන විට හැරී කුමරා 36වැනි වියේත්, මේගන් 39වැනි වියේත් පසුවනවා. ඔවුන් දෙදෙනාගේ වැඩිමහල් පුත්‍රයා වන ආචි ගේ වයස මාස 13ක් පමණයි.

රුසියානු ජනතාවගේ ප්‍රේමය නවල්නිට

පසුගිය පෙබරවාරි 14වැනිදාට යෙදී තිබුණු පෙම්වතුන්ගේ දිනය රුසියානු ජනතාව සැමරුවේ වඩා වෙනස් අන්දමකින්. විශේෂයෙන් මොස්කව් සහ සෙන්ට් පීටර්ස්බර්ග් ජනතාව එදින රාත්‍රියේ තම නිවෙස්වලින් පිටතට පැමිණ තම ජංගම දුරකතනවල ආලෝක දල්වමින් දැනට සිරගතව සිටින එරට විපක්ෂ ක්‍රියාධර ඇලෙක්සි නවල්නිට සහය දක්වමින් හඬ නගා තිබෙනවා.

එදින රාත්‍රියේ මේ නගරවල සෙල්සියස් අංශක සෘණ පහළවක පමණ දැඩි ශීතලක් පැවතියත් ජනතාව මෙලෙස පිටතට පැමිණ ඇත්තේ ඒ බව නොතකමින්.

ජනතා උද්ඝෝෂණ කොතරම් ක්‍රියාත්මක වූවත්, විදෙස් බලපෑම් කොතරම් එල්ල වුවත්, මේ දක්වා රුසියානු නායකයා ඇලෙක්සි නවල්නි නිදහස් කිරීම සම්බන්ධව කිසිඳු අදහසක් ප්‍රකාශ කර නැහැ.

දත්ත හිඟවීම නිසා අප්‍රිකාවට එන්නත ප්‍රමාදයි

කොවිඩ් සම්බන්ධව අප්‍රිකාවෙන් නිශ්චිත නිවැරදි දත්ත වාර්තා නොවන නිසා එන්නත ලබා දීම ප්‍රමාද විය හැකි බවට පුවත් වාර්තා වනවා. අප්‍රිකානු රටවල කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව මෙන්ම මරණ සංඛ්‍යාවද නිශ්චිතව වාර්තා නොවන බවයි ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන්නේ.

කොවිඩ් සම්බන්ධව ආරම්භයේ සිටම නිශ්චිත දත්ත වාර්තා පවත්වාගත් ජෝන් හෝකින්ස් විශ්වවිද්‍යාලය පවසන්නේ අප්‍රිකා මහාද්වීපයේ දිනකට ආසාදිතයන් මිලියන 3ත් 7ත් වාර්තා විය යුතු බවත්, දිනකට මරණ දහස් ගණනක් වාර්තා විය යුතු බවත්.

එහෙත් බොහෝ අප්‍රිකානු රටවල්වලින් නිශ්චිතව ආසාදිතයන් වාර්තා නොවන බවක් තමයි කියවෙන්නේ.

අප්‍රිකානු රටවලට පීසීආර් පරීක්ෂණ පැවැත්වීමේ අපහසුතා පැවතීමත් එසේ වීමට එක් ප්‍රධාන හේතුවක්. ඒ හේතුවෙන්ම ඔවුන් වෙත නිශ්චිත ප්‍රමාණයෙන්ගෙන් එන්නත් ලබා දීම ප්‍රමාද විය හැකි බවට අනාවැකි පැවසෙනවා.

ඇමරිකාවෙන් කොටසක් හිමෙන් වැසෙයි

තම රටේ විශාල ප්‍රදේශයක් දරුණු හිම කුණාටුවකට මුහුණ දී සිටින බව පසුගිය සතියේදී ඇමරිකානු ජනාධිපති ජෝ බයිඩන් නිවේදනය කර සිටියා. වැඩි දුරටත් වාර්තා වූ තොරතුරුවලින් ප්‍රකාශ වූයේ එරට ටෙක්සාස් ප්‍රාන්තය දරුණු හිමපතනයක් හේතුවෙන් ගැටලු රැසකට මුහුණ දී ඇති බවයි. එම ප්‍රාන්තයේ ජනතාව මිලියන එකහමාරක් පමණ විදුලි බලය අහිමි වීමෙන් පීඩාවට පත්වූ අතර ඔවුන්ට නිවෙස්තුළම කොටුවී සිටින්නටද සිදුව තිබුණා. බයිඩන් ජනාධිපතිවරයාගේ ප්‍රකාශය සනාථ කරමින් එරට කාලගුණ වාර්තා පෙන්වා දුන්නේ රටේ ප්‍රධාන නගර බොහොමයක දැඩි ශීත කාලගුණයක් පවතින බව. ඒ අනුව ඔක්ලහෝමා නගරයේ සෙල්සියස් අංශක සෘණ 15ක් ලෙසත්, ඩලාස් හි සෘණ 12, කැන්සාස් සිටිහි සෘණ 22ක් යනාදී වශයෙන් සහ තවත් නගර රැසක දැඩි ශීත කාලගුණ තත්ත්වයන් වාර්තා වී තිබුණා.

නවසීලන්තයත් ලොක්ඩවුන්

බ්‍රිතාන්‍ය වයිරස ප්‍රභේදය හමුවීමත් සමඟම නවසීලනත්යේ විශාලතම නගරය වන ඔක්ලන්ඩ් නගරය වසා දැමීමට එරට බලධාරීන් තීරණය කළා.

මේ දක්වා මුළු ලෝකයෙන්ම කොවිඩ් ඉතාම හොඳින් පාලනය කළ රට වශයෙන් සම්මානයට පාත්‍රව සිටියේ නවසීලන්තයයි. එහෙත් කොවිඩ් වයිරසයෙන් බේරීමට එරටටද හැකියාවක් ලැබුණේ නැහැ.

බ්‍රිතාන්‍ය වයිරස් ප්‍රභේදය ඔක්ලන්ඩ් නගරයෙන් වාර්තා වීමත් සමඟම නගරය වසා දැමීමට නවසීලන්ත බලධාරීන් කටයුතු කළ අතර මිලියන දෙකක ජනතාවට නිවෙස්වලට වී සිටින ලෙස නියෝග ලබා දුන්නා. මේ අතර නවසීලන්ත අගමැතිනිය පවසා සිටියේ ඇණවුම් කළ කොවිඩ් එන්නතේ ප්‍රථම තොගය තම රටට ලැබී ඇති බවයි.

ජවිපෙ 2 වැනි කැරැල්ලේදී පොලිසියේ හා හමුදාවේ ආයුධ පැහැරගත් හැටි

ඉකුත් දශක පහක් ඇතුළත කැරලි දෙකකට ජවිපෙ නායකත්වය දුන්නේය. ප්‍රථම කැරැල්ල 1971 අප්‍රේල් ක්‍රියාත්මක වූ අතර එහිදී ඝාතනයට ලක් වූ සංඛ්‍යාව 5,000කට ආසන්නය. ජවිපෙ 2වැනි කැරැල්ල 1986න් ඇරඹී 1990 න් අවසන් වූ අතර එහිදී 60,000කට අධික පිරිසක් ඝාතනයට ලක් වූහ. සිළුමිණෙහි පළවන මෙම ලිපි මාලාව එම කැරලි දෙක ඇතුළත ජවිපෙ නායකත්වයේ දෘෂ්ටිමය මඟ පෙන්වීමකට යටත්ව, එහි ප්‍රායෝගිකත්වය ක්‍රියාවට නැඟූ කැරලි නායකයන්ගේ සත්‍ය කතාවයි.

19 කොටස

අවි පැහැරගැනීමට නායකත්වය දුන් මුල්පෙළේ කැරලිකරුවන් කිහිපදෙනෙක්ය. වමේ සිටය, පන්නල ප්‍රහාරයේ නායක හිටපු කෝප්‍රල් ජයන්ත සිරිපාල හෙවත් පීටර් හෙවත් නන්දන, පනාගොඩ හමුදා කඳවුරේ ප්‍රහාරයේ දී එහි සැලසුම් සකස් කර අවසානයේ දී මරුමුවට පත්වූ මාතර වැටගෙදර පදිංචි කෝප්‍රල් එස්. ඒ. කුමුදු කුමාර, කටුනායක ප්‍රහාරයේ නායකයකු වන මධ්‍යම කාරක සභික සහ හිටපු කොස්තාපල් ඊශ්වරගේ ආරියසේන, ගුවන් හමුදා හිටපු කාර්මික නිලධාරි කඩුවෙල පිට්ටුගල පදිංචි කෙහෙල්වත්ත ගමරාලලාගේ සිරිපාල සහ හිටපු හමුදාභට වනවාසල පදිංචි ආනන්දපාල ගෙදර සරත් ගුණරත්න.

අවි පැහැරගැනීමට නායකත්වය දුන් මුල්පෙළේ කැරලිකරුවන් කිහිපදෙනෙක් මෙහි වෙති. වමේ සිට මධ්‍යම කාරක සභික රාගම හලන්දාරුවේ උපන් සමරජ්පුලිගේ සෝමසිරි හෙවත් රාගම සෝමේ, හම්බන්තොට ගුණසේන වර්ණපටබැදි, වැලිසර යූස්ටස් දිලිප් චන්ද්‍ර ප්‍රනාන්දු හෙවත් පතී, ලබුකැලේ කළුආරච්චි ටී. එස්. දේවානන්ද හෙවත් මහේෂ් සහ ගම්පහ ෂෙල්ටන් රාජපක්ෂ.

සිසු විරු සමරුවක දී මෙලෙස ශෝක වන මෙම පියාගේ පුත්‍රයා වනුයේ කැලණි සරසවි මානව ශාස්ත්‍ර පීඨයේ 85/86 කණ්ඩායමේ බදුල්ලේ ජයසේන දිසානායකය. සපුගස්කන්ද පොලිසියට 1989 ජූලි 16 ප්‍රහාරයක් එල්ලකර ආයුධ පැහැරගත් කැරලිකාර කණ්ඩායමේ මරුමුවට පත්වූ එක් අයකු වූයේ ජයසේනය. පොලිස් පරීක්ෂක මහානාම සහ උපසේවා කොස්තාපල්වරුන් 2ක්ද කැරලිකරුවන් අතින් එහි දී මරුමුවට පත්විය. සේයාරූවේ කොටුකර ඇති ඡායාරූපය ජයසේනගේ ය.

සංවිධානයේ පැවැත්ම සහ ප්‍රවීණත්වය සඳහා ජවිපෙ විසින් දෙමළ බෙදුම්වාදීන් ගේ ශක්තිය ලබාගත් නමුත් ඔවුනට හීලෑ නොවූවකු බව ප්ලොට් සංවිධානයේ නායක උමා මහේෂ්වරන් 1988 අප්‍රේල් මස 16 වැනිදා වැල්ලවත්ත රොක්සි සිනමාහල අසල නිවසක දී මෙම ලේඛකයා සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදි ප්‍රකාශ කළේය. විදේශීය වශයෙන් කැරලිකරුවන් දෙදෙනකු ලෙබනන්හි පලස්තීන විමුක්ති සංවිධානයේ පුහුණුව එතෙර දී 1985 දී ලබාගත් බව කියනු ලැබේ. ඉන් එක් අයකු ලෙස එච්. බී. හේරත් හැඳින්වේ. පිලිපීනයේ මින්දානෝ දූපත්වල සන්නද්ධ කණ්ඩායම් යටතේ පුහුණුවට 1989 සහ 1995 නොවැම්බර් කැරලිකරුවන් කණ්ඩායම් 2ක් ගිය අතර මෙය සෝමවංශ අමරසිංහ ගේ මැදිහත්වීම මත සිදුවූවකි.

ජවිපෙ සන්නද්ධ අංශයේ පුහුණුව, ශක්තිය, උපක්‍රම සහ ඇතැම් ආරක්ෂක භටයන් සමඟ ගොඩනඟා ඇති සබඳතා පිළිබඳව බොහෝ දෙනා මවිතයට පත් වූහ. හමුදා කඳවුරු මෙන්ම පොලිස් ස්ථානවලටද කඩා වැදුණු ජවිපෙ කැරලිකරුවෝ ඒවායේ අවි ආයුධ රැසක් පැහරගැනීමට සමත් වූහ. හමුදා කඳවුරු සහ පොලිස් ස්ථානවලින් මෙසේ පැහැරගත් අවි ආයුධ අතර ටී 81, ටී 56 ස්වංක්‍රීය රයිෆල්, උප යාන්ත්‍රික තුවක්කු, අර්ධ ස්වයංක්‍රීය රයිෆල්, මැෂින් තුවක්කු, එල්.එම්.ජී. බැරල්, 303 රයිෆල්, රිපීටර් තුවක්කු, මිලි මීටර් 60 මෝටාර් තුවක්කු, ක්ලේමෝ බෝම්බ, එස්.එම්.ජී ගිනි අවි, පිස්තෝල සහ රිවෝල්වර, සාමාන්‍ය තුවක්කු, පතරොම්, පතරොම් පටි, දුම් බෝම්බ ඇතුළු අවි ආයුධ ගණනාවක්ම විය. ආරක්ෂක අමාත්‍යාංශය 1988 අගෝස්තු නිවේදනය කළේ කැරලිකරුවන් විසින් පැහැරගත් හෝ තබාගෙන සිටින අවි ආයුධ සහ වෙඩි බෙහෙත් සොයාගැනීමට ඉවහල්වන තොරතුරු සපයන්නන්ට මුදලින් ත්‍යාග පිරිනමන බවය.

මෙවර ජවිපෙ කැරැල්ලට ආරක්ෂක අංශ සහ පොලිසියේ 1, 200කට ආසන්න පිරිසක් ඝාතු සහ වක්‍ර ලෙස එක්වී තිබිණි. ඇතැම් සෙබළුන් හමුදාව හැර කැරැල්ල වෙත පැමිණියේ තමාගේ ගිනි අවියද රැගෙනය. එමෙන්ම ජවිපෙ සමඟ නීතවත්කම් පැවැත්වූ පොලිසිය සහ ත්‍රිවිධ හමුදාවේ පිරිස 5, 000කට ආසන්නය. හමුදාපති හැමිල්ටන් වනසිංහ 1989 මුල් භාගයේ දී ජාතික ආරක්ෂක මණ්ඩල රැස්වීමේ දී බුද්ධි සේවා අංශයෙන් ලබාගත් තොරතුරුවලට අනුව කියා සිටියේ ප්‍රචණ්ඩ ක්‍රියා ව්‍යාප්තවීමෙන් පසු යුද හමුදාවේ සියයට 6ක් පමණ සෙබළුන් අවි සමඟ පැනගොස් කඩාකප්පල්කාරීන් සමඟ එක්විය හැකි බවය. තත්ත්වය තවත් උත්සන්න වූවහොත් සති ගණනාවකින් පසු එම අනුපාතය සියයට 16 දක්වා වැඩිවිය හැකි බව ද ඔහු පෙන්වා දුන්නේය.

ජවිපෙ ඔත්තු සේවාවන් අනුව ත්‍රිවිධ හමුදාවේ සියයට 30ක් කැරැල්ලට සහාය දක්වන අතර සියයට 50ක් නිහඬව සිටිනු ඇත. කැරැල්ලට එරෙහි වන්නේ ඉතිරි සියයට 20ක පමණ ප්‍රතිශතයකි. 1971 අප්‍රේල් කැරැල්ලේදි ගුවන් හමුදාවේ 25ක්, නාවික හමුදාවේ 200ක්, යුද හමුදාවේ 100 සහ පොලිසියේ 50කට ආසන්න පිරිසක් සමඟ සබඳතා පැවැත්වීමට ජවිපෙ සමත්වූවද අප්‍රේල් කැරැල්ලට සම්බන්ධ වූයේ ඉතාමත් සුළු පිරිසකි. එහෙත් ජවිපෙ 2වැනි කැරැල්ලේ දී ත්‍රිවිධ හමුදාවෙන් පැමිණි සිය ගණනක් ඉන් ඉවත්ව සූර්ණකාලීනව කැරැල්ලේ වගකීම් දැරූහ.

1987 ජූලි මස ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ඉන්දීය හමුදා උතුරු නැගෙනහිරට පැමිණීමත් සමඟම දකුණේ කැරැල්ල මැඩ පැවැත්වීමට එවන ලද පළමු හමුදා භට පිරිස 1 ගැමුණු හේවා බළ ඇණියට අයත් විය. ඔවුන් දකුණු ආඥා ප්‍රදේශ භාර මූලස්ථානය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව පසුදා උදෑසන ඉන් නිලධාරියකු ඇතුළු 10 දෙනකු වඩාත්ම ප්‍රචණ්ඩකාරී ප්‍රදේශයක් වූ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්ගස්වලට යැවිණි. රාජ්‍ය තේ වතු වගා කිරීමේ සංවර්ධන මණ්ඩලයට අයත් තේ වතුයායක පිහිටි ගොඩනැගිල්ලක ඔවුනු ස්ථානගත වූහ.

පසුව උතුරු නැගෙනහිරින් පැමිණි අනිකුත් කණ්ඩායම් අම්පාර, බදුල්ල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කයන්හි ස්ථානගත විය. ඒ අනුව උතුරු ප්‍රදේශයෙන් ඉවත්කර ගත් ගජබා, සිංහ, පාබල යන සෙසු බළඇණිද දකුණේ විවිධ ප්‍රදේශයන්හි ස්ථානගත කරන ලදී. උතුරු නැගෙනහිර තමන් සමඟ සටන්වැදි ප්‍රතිවාදීන් වූ දෙමළ බෙදුම්වාදීන් ත්‍රිවිධ හමුදාව විසින් හැඳින්වූයේ ත්‍රස්තවාදීන් ලෙසය. එහෙත් උතුරේ කැරලිකරුවන් සතු හැසිරීම් රටාව සහ ඔවුන් විසින් ගෙන යන ලද සටන් ස්වභාවයට වඩා දකුණේ ඇතිවූ ප්‍රචණ්ඩත්වය වෙනස් ස්වරූපයක් ගත් හෙයින් ඊට යොමු වූ ක්‍රියාකාරීන් යුද මූලධර්මයන්ට අනුව කඩාකප්පල්කාරීන් වශයෙන් සලකන ලදී. මෙසේ හැඳින්වීමට හේතු වූයේ දකුණේ කැරලිකරුවන් විසින් යොදාගනු ලබන සමස්ත උපායශීලිත්ව අරමුණ මුල් කරගත් සටන් ස්වභාවය මිස අනෙකක් නොවේ.

ත්‍රිකුණාමලයේ කල්ලාර් හමුදා කඳවුරට 1987 ඔක්තෝබර් 4 කඩාවැදී එහි සියලු ආයුධ පැහැර ගැනීමටද කැරලිකරුවන් සමත්වූ අතර එයට නායකත්වය දුන් ගුවන් හමුදාවේ සෙබළ වනවාසල ලොකු මහින්ද ඇතුළු කැරලිකරුවන් තිදෙනෙකු ඝාතනයට පත්විය. මීගස්වැව කුඹුකුණාවල සිට කල්ලාර් ප්‍රහාරයට කැරලිකරුවන් ගියේ බෙරවිල කැලේ හරහා කිලෝ මීටර් 15ක් පමණ පා ගමනකිනි. දිවා ආහාරයෙන් පසු වියළි ආහාර ද්‍රව්‍ය සහ ජලය රැගෙන එයට එක්වූහ. ප්‍රහාරයෙන් පසු අවි රැගෙන එන විටද ඔවුන් යළි පා ගමනින් පැමිණියේ වෙඩි වැදුණු කැරලිකරුවන් දෙදෙනෙකුද ඔසවාගෙනය.

පන්නල ජාතික සහායක බළකා පුහුණු කඳවුරට 1988 නොවැම්බර් 1 අලුයම 1.25ට ප්‍රහාර එල්ල කිරීමේ දී 9 දෙනකු මිය ගිය අතර ඉන් 4 දෙනෙක් ජවිපෙ කැරලිකරුවන් විය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල පිහිටි මෙම ජාතික සහායක බළකායේ යුද පුහුණු කඳවුරේ ඒ වන විට 250ක් පුහුණුව ලබන සෙබළුන් සිටියහ. කැරලිකරුවන් ටී. 56 තුවක්කු 19, 303 වර්ගයේ තුවක්කු 178, රිපීටර් වර්ගයේ තුවක්කු 21, එල්. එම්. පී වර්ගයේ තුවක්කු 8 සහ පතොරම් 30, 000ක් පැහැරගත් අතර මෙය කැරලි සමයේ එක් ප්‍රහාරයකින් ලබාගත් විශාලතම අවි ආයුධ තොගය විය.

පනාගොඩ යුද හමුදා මූලස්ථානය 1989 මැයි 2 අලුයම 1.30ට කැරලිකරුවන් ප්‍රහාරයක් එල්ල කළ අතර එය ව්‍යර්ථ කිරීමට හමුදාව සමත් විය. එහෙත් අවි කිහිපයක් පැහැර ගැනීමට කැරලිකරුවන් සමත් විය. කඳවුරේ සේවය කළ හමුදා කෝප්‍රල් එස්. ඒ කුමුදු කුමාරද කැරලිකරුවන්ට එක්වූ අතර එහි දී ඔහුද තවත් කැරලිකරුවන් දෙදෙනකු මූලටියන සීනිපැල්ලේ දනනායක සහ මහරගම දඹහේන පාරේ සුගත් පුෂ්පකුමාර හෙවත් රංජිද ඝාතනයට පත්විය. මාතර වැටගෙදර පදිංචි සුදුවැල්ල කංකානම්ගේ කුමුදු කුමාර ගේ පියා කච්චේරියේ ලිපිකරුවෙකි. මව නාදුගල මහා විද්‍යාලයේ ගුරුවරියකි. සිවුදෙනෙකු ගෙන් යුත් පවුලේ වැඩිමලා කුමුදුය. මාතර ශාන්ත තෝමස් විදුහලේ 1983 උප ප්‍රධාන ශිෂ්‍ය නායකයාද වූ කුමුදු 1963 දෙසැම්බර් 12 උපන්නෙකි. අපොස උසස් පෙළ දී නන්දරත්න මඟින් ජවිපෙට එක්වූ කුමුදු 1982 ධවල පත්‍රිකා විරෝධයේ දී ගැමුණු නමින් මාතර දිස්ත්‍රික් සංවිධායකවරයකු ලෙස කටයුතු කළේය. කෝප්‍රල් කුමුදු කුමාර සමඟ ජවිපෙ සබඳතා පැවැත්වූ නාදුගල විමලාරාමයේ පොඩි හාමුදුරුවන්ද 1989 අගභාගයේ දී ඝාතනයට පත්විය. කැරලිකරුවන් ආයුධ ලබාගැනීමට කළ ප්‍රහාරයන් කිහිපයක් අවසාන මොහොතේ අසාර්ථක විය. එවැනි එක් ස්ථානයක් වූයේ වැලිකන්ද කන්දකාඩුව හමුදා කඳවුරට කඩා වැදී අවි ආයුධ පැහැර ගැනීමේ ප්‍රහාරයයි. අවි ගබඩා භාරකරු බව කියන සාමාන්‍ය සෙබළ අම්පාරේ බණ්ඩාර විසින් සියලු අවි ගෙනයෑමට පහසුවන සේ දරමිටි සේ බැඳ තිබූ අතර එහෙත් හදිස්සියේ සැලැස්ම අවුල් වූයේ රාත්‍රී 10ට පෙර කැරලිකරුවන් ඇතුළුවීමට තිබුණද විනාඩි 15ක් පසුවී ඇතුළුවීම හේතුවෙන් වෙනත් අය මුරසේවාවල යෙදීම නිසා බව කියති. මුර සේවයේ යෙදී සිටි වෙනත් හමුදා භටයෙක් විසින් කැරලිකරුවකු දැක වෙඩි තබා නළාව නාදකිරීමෙන් පසු හමුදාව ප්‍රතිප්‍රහාර එල්ල කළ අතර කැරලිකරුවන්ට පසු බසින්නට සිදුවිය.

අවි පැහැරගැනීමට එක්වූ මුල් පෙළේ කැරලිකරුවන් කිහිපදෙනෙක් මෙහි වේ. වමේ සිට ත්‍රිකුණාමලය කල්ලාර් හමුදා කඳවුරෙන් අවි පැහැරගැනීමේදී ඝාතනයට ලක්වූ මිගස්වැව කුඹු කුණාවල පදිංචි වර්ණපුර හෙවත් තඩි මහින්ද, රද්දොළුගම කේ. ආර්. ශාන්තිකුමාර්, මිගමුව කුරණ වික්‍රමසිංහ ආරච්චිගේ ජුස්ටින් පෙරේරා. කෑගල්ලේ දිසානායක මුදියන්සේලාගේ ගුණරත්න සහ පිළියන්දල ආගිරිස් කොස්තා.

අවි පැහැර ගැනීමේ ප්‍රහාරයන්ට සම්බන්ධ වූ කැරලිකරුවන් සති තුනක හෝ දෙසතියක රහසිගත පුහුණුවක් ජවිපෙ විසින් රක්ෂිත වනයන්හි තාවකාලිකව ඉදිකරන ලද අවි පුහුණු කිරීම් කඳවුරු 100ක දී පමණ සිදුකරන ලදී. එහි පුහුණුව භාරව බොහෝ විට කටයුතු කළේ ආරක්ෂක අංශ වෙතින් පලාවිත් ජවිපෙට සම්බන්ධ වූ හමුදා භට පිරිස්ය. පුහුණු කඳවුරු මොනරාගල, පොතුවිල්, අම්පාර, ත්‍රිකුණාමලය හම්බන්තොට, රත්නපුර, දඹුල්ල, මාතලේ, සිංහරාජ, හම්බෙගමුව ඇතුළු ප්‍රදේශ ගණනාවක ක්‍රියාත්මක විය. විශේෂයෙන් දකුණේ කැලැබඳව රජරට රක්ෂිතයන්හිදීද, ශ්‍රීපාදයේ එරත්න දිසාවේද සහ මාතලේ නකල්ස් පිහිටා තිබූ කඳවුරු වඩාත් හොඳින් ක්‍රියාත්මක විය. පුහුණු කඳවුරු භාරව වික්‍රම, ආතර්, දිනේෂ් ඇතුළු කිහිප දෙනෙක්ම විය.

ජවිපෙ කැරලිකරුවන්ට එම වකවානුව තුළ දී විදේශ රටවලින් පුහුණුවක් ලැබූ බවට නිල වාර්තා නොතිබුණද රහස් තොරතුරුවලින් හෙළිවිය. දේශීය වශයෙන් මාන්කුලමේ සිට මන්නාරම් පාරේ යනවිට කුංජිකුලම් එල්.ටී.ටී.ඊ කඳවුරේද, ප්ලොට් සංවිධානයේ වව්නියාවේ ඇතුළු කඳවුරු 2කද ජවිපෙ කැරලිකරුවන් පුහුණුව ලබාගෙන තිබුණේ මුදල් ගෙවමිනි. විශේෂයෙන් බිම් බෝම්බ තාක්ෂණය මෙහි දී හැදෑරූ බව කියති.

සංවිධානයේ පැවැත්ම සහ ප්‍රවීණත්වය සඳහා ජවිපෙ විසින් දෙමළ බෙදුම්වාදීන් ගේ ශක්තිය ලබාගත් නමුත් ඔවුනට හීලෑ නොවූවකු බව ප්ලොට් සංවිධානයේ නායක උමා මහේෂ්වරන් 1988 අප්‍රේල් මස 16 වැනිදා වැල්ලවත්ත රොක්සි සිනමාහල අසල නිවසක දී ලේඛකයා සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදි ප්‍රකාශ කළේය. විදේශීය වශයෙන් කැරලිකරුවන් දෙදෙනකු ලෙබනන්හි පලස්තීන විමුක්ති සංවිධානයේ පුහුණුව එතෙර දී 1985 දී ලබාගත් බව කියනු ලැබේ. ඉන් එක් අයකු ලෙස එච්. බී. හේරත් හැඳින්වේ. පිලිපීනයේ මින්දානෝ දූපත්වල සන්නද්ධ කණ්ඩායම් යටතේ පුහුණුවට 1989 සහ 1995 නොවැම්බර් කැරලිකරුවන් කණ්ඩායම් 2ක් ගිය අතර මෙය සෝමවංශ අමරසිංහ ගේ මැදිහත්වීම මත සිදුවූවකි.

ජවිපෙ සන්නද්ධ අංශය මගින් 1989 අගෝස්තු 22න් පසු හමුදා සෙබළුන් ගේ පවුල් ඝාතනය ඇරැඹීය. රට පුරා එක් සතියක් තුළ ස්ථාන 25ක දී සිදුවිය. හමුදාවේ ඉතා සුළු පිරිසක් ඉල්ලා අස්වූවද සියයට 99ක පමණ පිරිසක් සේවයේ නිරතව සිටියහ. ආරක්ෂක හමුදාවන්හි පවුල් ලොකු කුඩා බේදයකින් තොරව ඝාතනි නිවෙස්වලට සහ ආරක්ෂක හමුදාව මඟින් විශේෂ ස්ථානවල පිහිටුවන ලද හමුදා කඳවුරුවලට යොමුවිය. මෙය ජවිපෙට මෙතෙක් අනුකම්පාවක් දැක්වූ බහුතර හමුදා සෙබළුන්ගේ ප්‍රබල කෝපයට ලක්වූ අතර ඔවුන් ජවිපෙ මරාගෙන මැරෙන මෙහෙයුමකට ඉඹීම තල්ලු වී යන්නට විය. ජවිපෙට සම්බන්ධ බවට සැක කරමින් ආරක්ෂක අංශවල සහ පොලිසියේ හට පිරිස්ද අත්අඩංගුවට ගෙන හමුදාව මඟින් විශේෂිත රැඳවුම් කඳවුරුවල රඳවාගෙන තිබිණි.

හමුදා භටයන් සඳහා එවැනි කඳවුරු 2ක් පනාගොඩ හමුදා කඳවුරේ ගල් පල්ලියේ සහ මින්නේරිය හමුදා කඳවුරේ විශේෂ රැඳවුම් ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වූ මින්නේරියේ වසා දැමූ ජේෂකර්ම ආයතනයේ පිහිටුවා තිබිණි. එහි සැකපිට රඳවා සිටි හමුදා භටයන් ගණන 121කි.

එසේ අත්අඩංගුවට ගත් හමුදා භටයන්ට තාඩන පීඩන සිදුකිරීම සම්බන්ධයෙන් මින්නේරිය හමුදා කඳවුරේ ඇතැම් නිලධාරීන් සහ භටයන්ට එරෙහිව කැරලිකරුවන් ගෙන් චෝදනා එල්ල විය. එවැනි චෝදනාවට ලක්වූ මින්නේරිය හමුදා කඳවුරේ භටයන් දෙදෙනකු වූ බී.එස්. එස් පෙරේරා (25) සහ ඩබ්ලිව් ධර්මපාල (21) 1989 දී කැරලිකරුවන් විසින් මින්නේරිය නගරයේ දී රාත්‍රී 8.30ට පමණ කළ වෙඩි තැබීමකින් මරුමුවට පත්විය. ඒ පිළිබඳව මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කරන ලද්දේ පොළොන්නරුව දිසා විනිසුරු රංජිත් සිල්වා විසිනි. ජවිපෙ යැයි සැකකළ හමුදා භටයන් රඳවූ මින්නේරිය යුද හමුදා කඳවුරේ විශේෂ ඒකකය 1990 ජූනි 18 දින වසා දමා එහි සිටි ඇතමුන්ට එරෙහිව හමුදා නීතියට අනුව කටයුතු කරන ලද අතර සෙසු අය පනාගොඩ හමුදා මූලස්ථානයට එවන ලදී. එම කාලය තුළ ජවිපෙට සම්බන්ධයැයි චෝදනා ලැබූ ත්‍රිවිධ හමුදාවේ 174 දෙනෙක් පමණ සේවයෙන් පහකර තිබිණි.

ජවිපෙ කැරලිකරුවන්ට සහාය දැක්වූ බව කියමින් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් අත්අඩංගුවට ගත් ඉහළම නිලධාරියකු වූයේ යුද හමුදාවේ කපිතාන් ධර්මසිරි නිශ්ශංකය. කොළඹ තර්ස්ටන් විදුහලේ අධ්‍යාපනය ලත් නිශ්ශංක 1961 අප්‍රේල් 23 උපන්නෙකි. සෝමවංශ අමරසිංහට රැකවරණය දුන් බවට සහ ඉන්දියාවට පලායෑම සඳහා උදව් කළ බවට ඔහුට එල්ල වූ චෝදනාව විය. වසර 4කට ආසන්න කාලයක් අත්අඩංගුවේ සිටි කපිතාන් ධර්මසිරි නිශ්ශංක 2017 වනවිට ජෝර්දානයේ ඇගලුම් කම්හලක විධායක රැකියාවක නිරත විය. කැරැල්ල නිමාවෙන් පසු එනම් 1990 මාර්තු වන විට ආරක්ෂ අංශවලින් කැරලිකරුවන් පැහැර ගන්නා ලද ටී 56 ගිනි අවි 172ක්, එස්.එම්.ජී අවි 2, රිපිටර් තුවක්කු 162, පතොරම් තුවක්කු 250, ගල් කටස් 1, 257, පිස්තෝල 63ක් රිවෝල්වර 54ක් සොයා ගත් බව ආරක්ෂක අමාත්‍යාංශය හෙළි කළේය.

ආරක්ෂක අමාත්‍යාංශ තොරතුරු අනුව කැරලිකරුවන් විසින් පැහැරගත් සොයා ගැනීමට නොහැකි වූ විශාල අවි ප්‍රමාණයක්ද 1990 අවසානය වන විට විය. එසේ සොයා නොගත් අවි අතර ටී56 අවි 78, එස්. එල්. ආර්. 60, එස් 84 අවි 36, එස්. එම්. ජී. 13, ටී 81 අවි 8, එල්. එම්. ජී අවි 11, එෆ්. එන්.සී 6, එම්.පි. 5 අවි 3, එස්. ඒ. ආර්. 4, පිස්තෝල 2, රිවෝල්වර 31, 22 රයිෆල් 11, 303 රයිෆල් 360, රිපීටර් 305, ෂොට්ගන් 223ක් ඇතුළු අවි 2, 136ක් විය. බොහෝ විට සිදු වූයේ අත්අඩංගුවට පත් කැරලිකරුවන් ගේ තොරතුරු මත අවි ආයුධ සැඟවූ තැන්වලින් සොයාගැනීමය.

අවි පැහැරගැනීමට නායකත්වය දුන් මුල්පෙළේ කැරලිකරුවන් කිහිපදෙනෙක් පෙළ ගස්වා ඇත. වමේ සිට කරාටේ ශූරයකු වන කුලියාපිටියේ දණ්ඩගමුවේ පදිංචි ජාතික සහායක බළකායේ හිටපු සෙබළ ඩබ්ලිව් .පී එමානුවෙල්, රාගම ඇල්පිටිවල පදිංචි කොන්ගනිගේ ඩග්ලස් ඇන්තනි. කෑගල්ලේ අජිත් ප්‍රේමසිරි, හම්බන්තොට පන්නගමුවේ ප්‍රේමචන්ද්‍ර කොඩිතුවක්කු සහ රත්නපුරයේ සමන් වීරරත්න.

අවි පැහැරගැනීමට එක්වූ මුල්පෙළේ කැරලිකරුවන් කිහිපදෙනෙක් වමේ සිටය. මහරගම දඹහේනේ සුගත් පුෂ්පකුමාර, හෝකන්දර හඳගම තිලක් කුමාරතුංග, සූරියවැව ගුණේ, කළුතර පයාගල ටායන් වීරසිංහ හෙවත් හේරත් සහ අකුරැස්සේ ආරියපාල කොඩිතුවක්කු.

සිංගප්පූරුවෙන් ලැබුණු සහනිකය

● ප්‍රේමසර ඇපාසිංහ

සිංගප්පූරුව ලෝකයේ ප්‍රධාන නැව් තොටුපළක් ලෙස ද සිංගප්පූරුව ජාත්‍යන්තර කීර්තිය දිනාගෙන ඇත. අග නගරය ද සිංගප්පූරුව යි.

වර්ෂ 1299 දී සිංගප්පූරුව සොයාගත් අතර, එය එදා හැඳින්වූයේ සිංගප්පුරා - සීතනගරය ලෙසිනි. ඈත අතීතයේදී මෙම දිවයින සුමත්ත්‍රාන් ශ්‍රී විජය රාජධානිය නමින් හැඳින්විණි.

මෑත යුගයේදී - 1959 වසරේ සිට සිංගප්පූරුව පාලනය කරන ලද්දේ ජනතා ක්‍රියාකාරී පක්ෂය යි. 'සිංගප්පූරුවේ ජාතියේ පියා' යන විරුදය ලබන කෘතහස්ත, උගත්, වියත් නායක ලී - ක්වාන් - යූ සිංගප්පූරු අගමැතිවරයා විය. කුඩා නැව් තොටක්, ලොව ප්‍රධාන රටක් බවට පත් කළ ලී - ක්වාන් - යූ ගේ නාමය, සිංගප්පූරු ඉතිහාසයේ රන් අකුරෙන් සටහන් වේ. ලෝකයේ ආකර්ෂණය දිනාගෙන ඇති සිංගප්පූරුව, විනයගරුක සමාජයක් ජීවත්වන රටක් ලෙස හැඳින්විය හැකි ය. ශ්‍රී ලාංකිකයන් ද සෑහෙන පිරිසක් සිංගප්පූරුවේ විවිධ රැකියාවල යෙදෙන අතර, ඔවුන් සතුටින් සමාදානයෙන් එහි ජීවත්වේ.

ලී - ක්වාන් - යූ කවුදැයි අපි විමසා බලමු.

ලී - ක්වාන් - යූ උපත ලැබුවේ 1923 සැප්තැම්බර් 16 වැනිදා ය. චීනයේ ගුන්ග් - ඩොන්ග් ප්‍රදේශයේ සිට සිංගප්පූරුවට පැමිණි පරපුරකින්ය මොහු පැවත එන්නේ.

මොහු, සිංගප්පූරුවේ සුප්‍රසිද්ධ රාෆ්ලස් අධ්‍යාපන ආයතනයේත් (1936 - 39) සහ රාෆ්ලස් කොලිජියේ ද (1940 - 1942) අධ්‍යාපනය ලැබූ අතර, 1946 - 1950 කාල පරාසය තුළදී එංගලන්තයේ සුප්‍රසිද්ධ කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාල උපාධිය ලබා නීතිඥයෙක් විය. ප්‍රසන්න, ක්‍රියාශීලි ක්වා - ගෙඔක් - චූ KWA GEOK CHOO සමඟ මොහු විවාහ විය. ඇය, ලී - ක්වාන් - යූ ට විශාල පිටුවහලක් දායකත්වයක් සැපයූ අතර, ඔහුගේ සෙවණැල්ල බඳු විය.

පොදු ජනතාව වෙනුවෙන් අවෘත සේවය කළ මේ උතුම්, ශ්‍රේෂ්ඨ, අද්විතීය නායකයා ලී - ක්වාන් - යූ, නිදහස් සටන දියත් කිරීම නිසා බ්‍රිතාන්‍ය පාලකයන් විසින් සිරගත කරන ලදී. උගත්, වියත් ලී - ක්වාන් - යූ 1950 - 1959 කාල පරාසය තුළදී නීතිවේදියෙක් ලෙස කටයුතු කළ අතර, වෘත්තීය සමිතිවලට අතහිත දෙමින් ඔවුන්ගේ නීතිවේදියා ලෙස ද සේවය කළේය.

1956 ඔක්තෝබර් මාසයේදී, ලිම් - චින් - සියෝන්ග් - ෆොන්ග්ස්වී - සුඅාන් - ඩෙවන් නයාර් සමඟ නායක ලී - ක්වාන් - යුද අත්අඩංගුවට ගනු ලැබීය. වර්ෂ 1959 මැයි මාසයේදී පවත්වන ලද සිංගප්පූරු මැතිවරණයෙන් විශිෂ්ට ජයක් ලී - ක්වාන් - යූ ලබාගත්තේය.

සිංගප්පූරුවේ සුප්‍රසිද්ධ රාෆ්ලස් ආයතනයේත්, රාෆ්ලස් කොලිජියේත් - විදුහලෙන් ඉගෙනුම ලබාගෙන, එංගලන්තයට ගොස් කීර්තිමත් කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයයේ 1946 - 1950 දී අධ්‍යාපනය ලැබීය. ඒ අතර, ක්වා - ගෙඔක් - චූ සමඟ විවාහ විය. පසුකාලීනව, ලී - ක්වාන් - යූ ගේ දේශපාලන ක්‍රියාකාරිත්වයට චූ මහත්මිය විශාල පිටුවහලක් ලබාදුනි.

මෙම අද්විතීය නායකයා ලී - ක්වාන් - යූ, 1959 ජූනි 05 වැනිදා සිංගප්පූරුවේ අග්‍රාමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන්නේය.

මොහු ගේ පාලන තන්ත්‍රය යටතේ සෞභාග්‍යවත් රටක් බවට සිංගප්පූරුව පත්වුණු අතර, විශේෂයෙන් ම ආසියාකරයේ දක්නට ලැබෙන ආකර්ෂණීය සංචාරකයන්ගේ කේන්ද්‍රස්ථානයක් බවට අද පත්ව ඇත.

වර්ෂ 1999 නොවැම්බර් මාසයේදී ලී - ක්වාන් - යූ අගමැති පදවියෙන් ඉල්ලා අස් විය. කෙසේ වුව ද, ජනතාවගේ බලවත් ඉල්ලීම පරිදි 2011 මැයි මාසයේදී දේශපාලන දිවියෙන් සමුගන්නා තෙක් ම ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක් ලෙස කටයුතු කළේ ය.

ලී - ක්වාන් - යූ නම් මෙම ශ්‍රේෂ්ඨ ජනනායකයා 2015 මාර්තු 23 වැනිදා සඳහටම දෙනෙත් පියා ගත්තේ ය. මෙවන් අවංක, තමාගේ පෞද්ගලික කිතු ඝෝෂා ලාභ ප්‍රයෝජන පසෙකලා රට නංවාලීමට කැපවන ශ්‍රේෂ්ඨ නායකයන් සොයා ගැනීම කළු නික සොයා ගන්නා වැනි අසිරු කාර්යයකි.

ලී - ක්වාන් - යූ චරිතාපදානයට අදාළව ලියන ලද මෙම ලිපිය මා අවසන් කරන්නේ යස ඉසුරින් සපිරි සෞභාග්‍යවත් - සිංගප්පූරුව නිර්මාණය කළ අද්විතීය, විශිෂ්ට නායක ලී - ක්වාන් - යූ විසින් අපේ ජේ.ආර්. ජයවර්ධනට හා ජනහද දිනූ ඩඩ්ලි සේනානායකට ලබාදුන්න චරිත සහතික CHARACTER CERTIFICATES දෙක කෙටියෙන් දක්වමින් ය.

ලී - ක්වාන් - යූ ගේ චරිතාපදානයේදී ශ්‍රී ලංකාවට අදාළ කොටස එතුමා අවසන් කරන්නේ මෙසේය.

'සෙරන්ඩිපිටිය - SERENDIPITY - ලංකාව (ශ්‍රී ලංකාව) - නමින් හැඳින්වෙන මනස්කාන්ත - සුන්දර - අපූරු දිවයින, ගැටුම් - වේදනාව - ශෝකය - කණස්සල්ල - බලාපොරොත්තු සුනුවිසුනු කෙරුණු රටක් බවට, ජේ.ආර්. ජයවර්ධන පත් කරන ලදී යනුවෙනි.

ශ්‍රී ලංකාවේ ජනාදරයට පත්වුණු අද්විතීය අගමැති ඩඩ්ලි සේනානායකගේ සේවයට හදවතින්ම කැපවූ, අගමැතිවරයෙක් ලෙසත්, අතිවිශිෂ්ට නායකයෙක් බවත්, නූතන සිංගප්පූරුවේ නිර්මාතෘ ලී - ක්වාන් - යූ අගමැතිතුමා පවසා ඇත.

මගේ ජීවිතයට අරමුණක් ගෙනාවේ "මහ දිසාපති සහ පොඩි දොස්තර" කියන කෙටිකතාව

හිමාලි රත්නවීර තමාට හොඳම රාජ්‍ය සේවකයාට හිමි සම්මානය; සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය අතින් ලබාගත් මොහොත

● කරාපිටිය සමූහ -
එස්. ලොකුකරවිට

මම අහිංසක තැන්පත් ගෑනු ළමයෙක් නම් නෙවෙයි. පොඩි කාලේ ඉඳලම හොඳට දඟ කළා. ක්‍රීඩා කළා. නිතරම බැණුම් ඇහුවා. මේ නිසාම මට පිරිමි අයත් එක්ක හරි හරියට වැඩ කරන්න ශක්තිය ලැබුණා. දවසක් ඉස්කෝලේ ඇරිලා ගෙදර යද්දී පාරේ වැටිල තිබුණු පොල් ගෙඩියක් අහුලගෙන ගිහින් තාත්තාගෙන් හොඳටම බැණුම් ඇහුවා. ඒක නැවත තිබුණු තැනම ගෙනිහින් තියන්න කිව්වා. කාගෙවත් ඉඳිකට්ටක් තරම් දෙයක්වත් ගන්න එපා කිව්වා. මට එදා තාත්තා දුන් අවවාදය අදටත් මතක් වෙනවා. ඒ අවවාදයම තමයි මට මේ වගේ සම්මානයක් ලැබෙන්න හේතු වුණේ." යැයි ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් ඉනෝකා හිමාලි රත්නවීර පවසයි.

ඇය 2020 වර්ෂයේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් පැවැත්වූ සුපිළිපන් රාජ්‍ය නිලධාරියා තේරීමේ දී හොඳම රාජ්‍ය නිලධාරීන් 05 දෙනා අතරින් වැඩිම මහජන ප්‍රසාදයක් දිනාගත් සුපිළිපන් රාජ්‍ය නිලධාරී සම්මානය දිනාගත්තාය.

ඇය ඒ තත්ත්වයට ගෙන ආවේ ඇයගේ සේවය ලබාගත්, ඇගේ කාර්යක්ෂම සුපිළිපන් සේවය හොඳින් දන්නා ජනතාවයි.

1975 දී බදුල්ලේ පදිංචිව සිටි සෝමපාල රත්නවීර හා කරුණා ද සිල්වා යුවළගේ වැඩිමහල් දරුවා ලෙස මෙළොව එළිය දුටු ඉනෝකා හිමාලි සහෝදරයන් දෙදෙනකු සහ සහෝදරියන් තිදෙනකුගේ ලොකු අක්කා වූවාය. ඇය හල්ලුම්මුල්ල කනිෂ්ඨ විද්‍යාලය, හම්බන්තොට ප්‍රාථමික විද්‍යාලය, ශාන්ත මේරි විද්‍යාලය සහ තංගල්ල බාලිකා විද්‍යාලය යන පාසල්වල අධ්‍යාපනය හදාරා, 1994 වර්ෂයේ උසස් පෙළ සමත්වී ලිපිකරු විභාගය ලියා 1996 දී හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලිපිකාරිනියක ලෙස සේවය ආරම්භ කළාය. ඒ ඇගේ පළමු රැකියාවයි.

"තාත්තා නම් පොඩ්ඩක්වත් කැමති වුණේ නැහැ මම රස්සාවට යනවට. කිව්වේම නැවත ඒලෙවල් කරන්න කියලා. නමුත් මට ආසාවක් තිබුණා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩ කරන්න. මේ හිතුවක්කාරකම නිසාම තමයි අද මම මෙතැනට ඇවිත් ඉන්නේ."

තමන්ට රාජ්‍ය සේවයට පැමිණීමට මඟ පෑදුවේ "මහ දිසාපති සහ පොඩි දොස්තර" නමැති කෙටිකතාවක් බව ඇය පවසයි. දොස්තර මහත්මයකු තම පන්ති සඟයෙක් මහ දිසාපතිවී ගමට පැමිණෙන උත්සවයක් දැක ලියූ සටහනක් ලෙස රචනා කර තිබූ ඒ කෙටිකතාව කියවූ තමන්ට රාජ්‍ය සේවයට පැමිණීමේ ආශාවක් ඇති බූ බව හිමාලි කියයි.

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලිපිකාරිනියක ලෙස කටයුතු කරමින් සිටින අතරම විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණ කරගැනීමට ඇය සමත්වූවාය. යහළු යෙහෙළියන්ගේ උදව් මැද අධ්‍යාපනය සම්පූර්ණ කරගත් ඇය ක්‍රීඩාව සඳහා තිබූ උනන්දුව අතහැරියේ නැත.

පාසල් කාලයේ සිට ම වොලිබෝල්, නෙට් සඳුණු ගැටලු සොයා ළඟාට විසඳුම් ලබාදීමේ ජනපති ජංගම සේවයට විශාල දායකත්වයක් දක්වන ඇය බද්දේගම ප්‍රාදේශීය ලේකම් වරිය ලෙස පත්වීම් ලැබුවාය. ඇය එම තනතුරේ සිටිය දී පැමිණි 2017 මහා ගංවතුර හේතුවෙන් සිදුවූ විනාශය අතිමහත්ය.

"මහා ගංවතුර සියල්ල විනාශ කළා. ගම් බිම් උන් හිටිතැන් නැති කළා. දහස් ගණනක් අවතැන් වුණා. බොහෝ දෙනෙක් හිතුවා කාන්තාවකට මේ වෙලාවේ වැඩ කරන්න අමාරු වේවි කියලා. අපේ සමාජයේ දැක්ම ඒක. නමුත් මට හැමදෙනාගෙන් ම විශාල සහයෝගයක් ලැබුණා. ගිං ගඟේ බද්දේගම නගරය ආසන්නයේ තියෙන ගංවතුර පාලන වේල්ලෙන් වතුර කාන්දුවෙන්න ගත්තා. බද්දේගම නගරය යටවීමේ අවදානමක් තිබුණු වෙලාවක වැලි කොටට කරගහන්න පවා අපේ නිලධාරීන්ට සිදුවුණා. අපිට ත්‍රිවිධ හමුදාවෙන් විශාල සහයෝගයක් ලැබුණා. ඇතැම් දවස්වල විනාඩි 05ක්වත් නිදාගන්න වුණේ නැහැ. ගෙදරට යන්නේ ඇඳුමක් මාරුකරගන්න විතරයි. ගැහැනියකටත් ඕනෑම අභියෝගයක් හමුවේ කටයුතු කරන්න පුළුවන් කියන එක මට සනාථ කරන්න හැකියාව ලැබුණා."

සේවයේ ඉහළම තනතුරු දැරීම පුරුෂයන්ට පමණක් සීමා වී තිබූ යුගය දැන් අවසන් බවයි.

"ජනතාවගේ පොදු ප්‍රශ්න විතරක් නෙවෙයි පුද්ගලික ප්‍රශ්න පවා කියන්නේ ප්‍රාදේශීය ලේකම්ට. කාන්තාවක් ජනතාවගේ ප්‍රශ්න දිහා බලන්නේ මවක්, සොහොයුරියක්, මිතුරියක් විදියට, පිරිමි කෙනෙකුට වඩා සෞම්‍ය බවක්, කරුණාවන්ත බවක් එතැන තිබෙනවා. මම මේ බව හොඳින් තේරුම් ගෙන ඉන්නේ. මගේ කාර්යාලයේ හැමෝටම සොහොයුරියක් වගේ සලකන අතර මගේ ළඟට සේවය ලබාගන්න එන හැමෝටමත් මම මවක් හැටියට, දුවෙක් හැටියට, සහෝදරියක් හැටියට සලකන්න පුරුදුවෙලා ඉන්නවා. ඒ තමයි මේ සාර්ථකත්වයේ රහස."

ඇය පවසන්නේ මේ ගමනේ දී තමන්ගේ සාර්ථකත්වය පසුපස සිටි අයෝමය ශක්තිය වූයේ තම සැමියා බන්දුල ලියනගේ බවයි. සංචාරක හෝටලයක සාමාන්‍යාධිකාරීවරයකු ලෙස කටයුතු කරන ඔහු තම රාජකාරී පවා පසෙක දමමින් ඇගේ අවශ්‍යතා වෙනුවෙන් සෑම විටම කැපවූයේය. ඔහු නොවන්නට ඇයට මෙවන් ගමනක් යාම අසීරුවනු ඇත.

"ප්‍රාදේශීය ලේකම්වරයෙක් හැටියට අපිට හැමදේටම යන්න වෙනවා. දිවා රාත්‍රී කියලා වෙනසක් නැහැ. සමාජයේ දේශපාලනඥයාගේ සිට සියලු දෙනා සමඟ කටයුතු කරන්න වෙනවා. ඒ සෑම අවස්ථාවක දී ම අපේ ආත්ම ගරුත්වය ඉතාමත් වැදගත්. මගේ සැමියා නිතරම මාත් එක්ක සිටීමත්, සෑම අවස්ථාවක දී ම ඔහු මා සමඟ එක්ව කටයුතු කිරීමත් නිසා මගේ රාජකාරී කරගෙන යන්න ඉතා පහසු වුණා. ගෙදර තුන්වේලටම වෙන වෙනම කෑම සකස් වෙන්නේ මගේ අතින්. උදවුවට කෙනෙක් හිටියත් අම්මා කෙනෙක් හැටියට ඒ දේවල් අතපසු කරන්න මම කැමති නැහැ.

නමුත් දරුවන්ගේ අධ්‍යාපන හා ක්‍රීඩා කටයුතු ගැනනම් හොයා බලන්නේ මහත්තයා. පුතයි දුවයි මේවා තේරුම් අරගෙන ඉන්නේ. ඒ අයගේ සහයෝගය නොවන්නට මට මේ වගේ සේවයක් ජනතාව වෙනුවෙන් කරන්න ලැබෙන්නේ නැහැ." ඇය පවසයි.

බදුල්ලේ උපත ලබා එහි ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ නිසාම දෙමළ භාෂාව හොඳින් කතා කිරීමේ හැකියාව ද හිමාලිට ඇත. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන් ම වැඩ කිරීම ජනතාවට වඩාත් පහසුවක් වී තිබේ. ඇය පවසන්නේ ද මේ නිසා තමන්ට රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි බවයි. එසේ වුව ද තම සැමියාගේ උපන් ගම වූ ගාල්ලට ඇය වඩාත් ආදරය කරයි.

"අපිට රජයෙන් වැටුප් ගෙවන්නේ මේ රටේ දුප්පත් අහිංසක මිනිසුන්ගේ දාඩිය කඳුළුවලින්. මගේ එකම බලාපොරොත්තුව හැකිතාක් ඒ අහිංසක ජනතාවට සේවය කිරීම. නෑ බෑ වචන මගේ ළඟ නැහැ. නමුත් බැරි දේකට බැහැ කියන්නත් නැති දේකට නැහැ කියන්නත් මට පුළුවන්. ඒ නිසා කවදාවත් දේශපාලන බලපෑම්වලට මම යටත් වෙලා නෑ. දේශපාලකයන් කරන හැම යෝජනාවක්ම අපිට ඉෂ්ට කරන්න බැහැ. නමුත් අපි සංවර්ධන කටයුතුවලට ජනතාවට සේවයක් වෙන වැඩවලට නිලධාරීන් විදියට විරුද්ධ විය යුතුත් නැහැ. කිසිම බලපෑමකට යටත් නොවී ජනතාවට සේවය කිරීම තමයි එකම පරමාදර්ශය විය යුතු. එවිට ජනතාව අපි සමඟ සිටිනවා. මේ අවස්ථාවේ සියලු දෙනා මා සමඟ සිටීමින් ඒ බව සනාථ කළා."

ඇය පවසන්නේ වරදාන වරප්‍රසාදවලට යටත් නොවී දේශපාලන බලපෑම්වලටත් නතු නොවී ජනතාව වෙනුවෙන් උපරිම සේවය කිරීමට නිරන්තරව කැපවී සිටීම නිසා මේ සම්මානය තමන්ට ජනතාව විසින් ලබාදුන් සම්මානයක් බවයි.

"මේ සම්මානය ලැබුණේ මට වුණාට ඇත්තටම ඒක ජනතාවට ලැබුණු සම්මානයක්. මහජනතාව සමඟ සමීපව වැඩ කිරීමෙන් ලැබුණු දෙයක්. මෙය අයිති මට නෙවෙයි. මගේ සේවය ලබාගත් ජනතාවට, යැයි ඇය අවසන් වශයෙන් කීවාය.

ගමට රටට අභිමානයක් වූ ගාල්ලේ කඩවත්සතර ප්‍රා:ලේ

ඉනෝකා හිමාලි රත්නායක

විපතට පත්වූවන්ට ගංවතුර ආධාර බෙදන්නට ගිය අවස්ථාවක්

හිමාලි රත්නවීර සිය සැමියා හා දුව පුතා සමඟ

ඇය ඉල්ලා සිටියේ වනජීවී දෙපාර්තමේන්තුවේ තනතුරකි. වසර 05ක් පුරප්පාඩු වී තිබූ වනජීවී සහකාර අධ්‍යක්ෂ (පාලන) තනතුරට පත්වූ හිමාලි රත්නවීරට දැවැන්ත අභියෝගයක් ඉදිරියේ විය. වසර 05ක් පුරා සේවක කාර්යක්ෂමතා කඩඉම් සකසා නැත. බඳවාගැනීම් සහ උසස්වීම් සිදුකර නැත. මේ සියල්ල සම්පූර්ණ කරන්නට ඇයට සිදුවූවාය.

"ඒක වෙනස්ම අභියෝගයක් වුණා. නමුත් අදටත් මගේ රාජ්‍ය සේවා ජීවිතයේ ලැබූ ලොකුම අත්දැකීමක්. පරිපාලන සේවයට ආපු පළමු අවස්ථාවේ දී ම වනජීවී දෙපාර්තමේන්තුවේ වැඩ කරන්න ලැබීම වාසනාවක් කියා හිතනවා. ඵලදායීතා ක්‍රමවේදය හඳුන්වාදෙන්නත් මම එහි දී කටයුතු කළා."

රාජ්‍ය පරිපාලන පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගන්නා හිමාලි රත්නවීර මහත්මිය ජපානයේ ටෝකියෝ නුවර පිහිටි වසේඩා විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පුහුණු ශිෂ්‍යත්වයක් ලැබ එහි ගියාය. ඇය පවසන්නේ ජපානයේ රැඳී සිටින කාලයේ දී සිදුවූ ස්වභාවික ව්‍යසනවල දී එරට ජනතාවට කටයුතු කරන ආකාරයත්, රජයේ සේවාවන් සිදුකරන ආකාරයත් අධ්‍යයනය කිරීම තමන්ට විශාල අත්දැකීමක් වූ බවයි. ජපානයේ වේල්ලක් කඩාගෙන යෑමෙන් ආපදාවට පත්ව සිටි ලක්ෂ සංඛ්‍යාත ජනතාවට උදව් කරන්නට ද ඇයට එහි දී අවස්ථාව ලැබී ඇත. යළි ශ්‍රී ලංකාවට පැමිණෙන ඇය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ නිල මෙහෙවර සම්බන්ධීකරණ නිලධාරිවරිය බවට පත්වන්නීය. නොවිත් පසු ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් ධූරයට පත්වන ඇය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මුළුමනින්ම ඩිජිටල් තාක්ෂණයට අනුගත කිරීමට කටයුතු කළාය. මේ වනවිට එහි පැමිණෙන ඕනෑම පුරවැසියකුට ක්ෂණිකව සේවාවන් ලබා ගැනීමට හැකි අයුරින් එය නවීකරණය වී තිබේ. කොරෝනා වසංගතය හමුවේ ඇය ක්‍රියාකළ ආකාරය ද ගාල්ලේ පමණක් නොව අන් ප්‍රදේශවල ජනතාවගේ ද පැසසුමට ලක්විය.

රටම වසා දමා තිබිය දී ප්‍රදේශයේ ඕනෑම නිවැසියෙකුට ඇය අමතා අවශ්‍යතා ඉටුකරගත හැකිවන පරිදි කාර්යක්ෂම යාන්ත්‍රණයක් ගොඩනැඟීමට ඇය කටයුතු කළාය.

රටටම ආදර්ශයක් වූ රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරිනියක වන ඇය පවසන්නේ රාජ්‍ය

දැන ගියොත් කතරගම, නොදැන ගියොත් අතරමග

දික්කසාද වැඩිවීමට හේතු මෙන්න!

ශ්‍රී ලංකාවේ දිනකට පවුල් 400ක් දික්කසාදවෙයි

● නිලංකා ජයසූරිය

දැන ගියොත් කතරගම, නොදැන ගියොත් අතරමඟ යන කියමන විවාහය යන්නට ද අදාළ වූවකි. දුකේදීත්, සැපේදීත්, මරණයෙන් වෙන්වන තුරුත් එක්ව වසන්නට ගිවිස ගත්තද; වර්තමානයේදී විවාහ ජීවිත කෙටි කලකින් බිඳ වැටීමේ ප්‍රවණතාවය සමාජයෙහි බිඳ වැටීමක් කෙරෙහි බලපෑම් කරනු ලබන, මතුපිටින් නොපෙනන, එහෙත් ප්‍රබල කාරණාවක් බවට පත්වී ඇති බව පෙනෙයි.

"කේන්දරේ බලලා, පොරොන්දම් ගළපලා, පෝරුවේ නැග, අෂ්ටක කියා කළ කසාදය කෙටි කලකින් කැඩී බිඳී යාම කනගාටුවට කරුණකි. එහෙත්; ජ්‍යෝතිෂ්‍යවිදීන්ට අනුව පොරොන්දම් වලින් 100%ක් විවාහ තීරණය නොකරන අතර කේන්දරය යනු සියල්ලම තීරණය කළ හැකි වූවක් නොවේ.

විවාහය යන්න තුළ ඇති වගකීම්; යුතුකම්, කැපකිරීම් පිළිබඳ අවබෝධයකින් තොරව එය ඇතැම් චිත්‍රපටයක පෙන්වන අන්දමේ "සුන්දර සිහිනයක්" යන මුළාවීමම, එම විවාහයෙහි 'මරණ සලකුණු' පෙන්නුම් කරන්නකි.

විවාහ බිඳ වැටීම් ගැන මඟුල් පින්තූර ගන්න ඡායාරූප ශිල්පීන් පවසන්නෙ පුදුම හිතෙන කතාවක්. වෙඩින් ෆොටෝ ඇල්බම් එක බාරදෙන්න මනාල ජෝඩුව හම්බවෙන්න යන කොටත් සමහරු වෙන්වෙලා; "ඩිවෝස් ෆයිල්" කරලත් ඉවරයි.

මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර පවසන අන්දමට වර්තමානයේ විවාහ සංස්ථාවෙහි එවැනි දෙදරායාම් සිදුවන්නේ මංගල යහනෙහි උණුසුම වියැකී යන්නටත් ප්‍රථමයෙනි.

"ඇත්තටම විවාහ සංස්ථාව දෙදරා ගිහින් ද?"

ඇතැමුන් තුළ මේ පිළිබඳව කුකුසක් පැවතුණත් මෙම තත්වය පිළිබඳව ආචාර්ය උපාලි සේදර විසින් 'ශ්‍රී ලංකාවෙහි දිනකට පවුල් හාරසියයක් දික්කසාද වන බවට කරන ලද ප්‍රකාශය බොහෝ දෙනෙකුගේ ඇස් අරවන්නක් වූ බැව් නම් නිසැකය.

එසේ වුවද, මෙම පුවත සමාජ සේවා අමාත්‍යාංශ වාර්තාවෙන් අසන්නට ලැබුණේ 2014 වසරේදීය. එහෙත්, එයට වගකිවයුතු කිසිවකුගේ අවධානය යොමු වූයේ නැත.

අප රටේ 76% දෙනෙකු විවාහ වන්නේ අවුරුදු 20 - 30 අතරදියි. එමෙන්ම බොහෝ විට දික්කසාද වන්නේ විවාහ වී පළමු වසර තුන අතර වූ කාලය තුළදියි. ආචාර්ය උපාලි සේදර අනාවරණය කරනුයේ වර්තමානයේ විවාහය යන්නට ලැබී ඇති වටිනාකම පිළිබඳ කටුක යථාර්ථය හුවා දක්වමිනි.

අනෙක් අතට දික්කසාදයන් වැඩිම වශයෙන් වාර්තා වන්නේ ලංකාවේ ජනගහනයෙන් 40%ක් සිටින බස්නාහිර පළාතෙන් වන අතර; මේ වන විට රටෙහි වාර්තාවන දික්කසාද නඩු (Devorce cases)සංඛ්‍යාව දෙලක්ෂ පනස් දහසක් පමණ (250,000) වීම තුළින්ම 'අසතුටින් දිවිගෙවන' පවුල් සංඛ්‍යාව අධික බැව් නම් පැහැදිලිය.

පවුල් සංස්ථාවෙහි බිඳ වැටීම යන්න මේ වන විට ලෝකයේ බොහෝ රටවල් මුහුණ දෙන සමාජ ගැටලුවකි. කැලණිය විශ්ව විද්‍යාලයෙහි මහාචාර්ය කරුණාතිලක විසින් කරන ලද සමීක්ෂණයකට අනුව ලෝකයේ අනෙකුත් රටවල් දෙස බැලුවත් සෑම පවුල් තුනකින් එකක් 'දික්කසාදය' සඳහා වැඩි අවදානමක් දරන බැව් පෙනෙයි.

කෙසේ වුවද වර්තමානයේදී විවාහයට ඇතුළත් වන ඇතැමුන් එසේ විවාහ වනුයේ ඒ පිළිබඳ අවබෝධයකින් තොරව බැව් විවාහ රෙජිස්ට්‍රාර්වරයෙකු ලෙස දහඅට වසරක සේවයේ නිරතව සිටින එස්.එම්.එස්. පෙරේරා මහතා පවසන්නේ තම අත්දැකීම්වලට අනුවය.

"කසාද බඳින්න වැඩිපුර එන්නෙ බොහෝවිට අවුරුදු දහනවය, විස්සෙ, විසිපහේ තරුණ පිරිස්. ඒත් ඒ අතර යාන්තම් දහඅට පිරෙද්දි එන අය වගේම, අවුරුදු දහසයෙදි ගැබ්බර වූ දැරිවියන් ද සිටින අවස්ථා තිබෙනවා."

විවාහයකදී විවාහ අපේක්ෂිත යුවළගේ පූර්ණ කැමැත්ත ඒ සඳහා අත්‍යවශ්‍යය. එහෙත්, දෙමාපියන්ට හොරෙන් පැනගොස්, නැවත හසුවීමෙන් පසු පොලිසියට රැගෙන යාමෙන් පසු විවාහය ලියාපදිංචි කොට විවාහ සහතිකය පොලිසියට පෙන්වීමට උපදෙස් ලැබීම හේතුවෙන් විවාහ වන්නන් මෙන්ම; මරන්නට අරන් යන හරක් මෙන් කට්ටි පැනීමට ඉඩ නොදී විවාහ වීම සඳහා ඇතැමුන් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ගෙන ගොස් එම විවාහ ලියාපදිංචි කරන තෙක්, පොලිස් නිලධාරීන් රැඳී සිටින අවස්ථාවන් පිළිබඳව ද ඔහුට අත්දැකීම් ඇත. මේ තුළින් පෙන්වන යථාර්ථය නම්, බලපෑම් හේතුවෙන් 'නොබැඳ කර හරින්නට' නොහැකි කම හේතුවෙන්, අකමැත්තෙන් සිදුකරන මෙවැනි විවාහයන්හිදී, විවාහ අපේක්ෂිත යුවළ අතර ඇතිවන බහින් බස්වීම්, සණ්ඩු දබරයන්, මෙවැනි විවාහයන් ලත් තැනම ලොප් වන සලකුණු මොනවට පෙන්නුම් කරන බවකි.

මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර පවසන අන්දමට දැන්, දැන් විවාහ බිඳ වැටීම් කොතරම් වේගයෙන් සිදුවන්නේ දැයි පැවසුවහොත් කලා ලෝකයේ නළු නිළියන්ගේ විවාහ ජීවිත අභියෝගයට ලක්වන අතර දික්කසාදයන්ගෙන් කෙළවර වන මෙම අත්දැකීම් ඇතැමුන් තනිව, නිහඬව විඳ දරා ගනිද්දී, සමහරෙක තම ජංගම දුරකථනය හරහා එසැණින් තම දික්කසාදය පිළිබඳව 'මුහුණු' පොතට හා සමාජ මාධ්‍යයන්හි ප්‍රසිද්ධියට පත්කරති.

සමාජය දෙස අප ආපසු හැරී බැලුවහොත් වඩාත් පැහැදිලි වන කරුණක් නම්, අතීතයෙහි පැවති සංවෘත සංස්කෘතියෙහි පවුල් වලද මෙවැනි ගැටලුන් ඕනෑ තරම් තිබුණද විවාහ සංස්ථාව බිඳ නොවැටී රැක ගැන්මෙහි අවශ්‍යතාවය මත ඔවුන් ගෙතුළ වන සිදුවීම් පිටතට යාමට ඉඩ නොදී නිහඬව දරා සිටි බවකි.

විවාහයක් බිඳ වැටීම අඹු සැමි යුවළකට පමණක් නොව, දෙපාර්ශ්වයෙහිම ඥාතීන්ට පවා අපකීර්තියක් ලෙස සැලකීම තුළ පවුල් ආරවුල් විසඳා ගැන්මට උසාවි ගාණේ ගොස්, 'දික්කසාදය' තෙක් දුරදිග ගිය සිදුවීම් අද මෙන්ම එදා සුලබ වූයේ නැත.

කෙසේ වුවද මේ වන විට දිනකට දික්කසාද හාරසියයක් සිදුවන බව ඇසීම එක්තරා අන්දමක 'කම්පනයක්' ඇති කරවන සුළු ප්‍රවෘත්තියක් බවට පත්වෙද්දී, මෙම දික්කසාද පිළිබඳ මෙතක් නොදුටු පැත්තක් මතු කර දක්වන නීතිඥ සජීවනී අබේකෝන් පවසන්නේ අප රටෙහි උසාවි එකසිය ගණනක් තිබෙන අතර සාමාන්‍යයෙන් එක් දිස්ත්‍රික් උසාවියක දිනකට දික්කසාද නඩු පහක් පමණ පැවරෙන බවත් ඒ අනුව බැලුවහොත් දිනකට දික්කසාද වන සංඛ්‍යාව හාරසියය ඉක්මවනු විනා අඩුවීමක් නම් සිදු නොවිය හැකි බවකි.

එහෙත් ඇය මතු කරන වැදගත් තර්කය නම් සමාජයක පවුල් සංස්ථාව තුළ ඇති බිඳ වැටීම් හා පවුල් ආරවුල් දික්කසාද වලින් මැනීමට නොහැකි බවයි.

වමේ සිට ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය ලේකම් ආචාර්ය උපාලි සේදර, නීතිඥ සජීවනී අබේකෝන් සහ විවාහ රෙජිස්ට්‍රාර්වරයකු ලෙස දශක දෙකක අත්දැකීම් ඇති එස්. එම්. එස්. පෙරේරාය.

දික්කසාදය යන්න යමෙකු තුළ තැති ගැන්මක්, කම්පනයක් ඇතිකරවන මුත් පවුල් තුළ ඇති අඬදබර ගෘහස්ථ හිංසනය නොසලකා හැරීම් ඕනෑම පවුලක සිදුවිය හැකි සිදුවීම් ලෙස සැලකීමට බොහෝ දෙනෙකු පුරුදුව සිටිති. එහෙත් එම පවුල තුළ ඇති අවුල් සහගත තත්වය කිසියම් දිනෙක ඔවුන් 'දික්කසාද පෝලිමට' තල්ලු කර දමන්නට හේතු විය හැකි බැව් මොහොතකට නොසිතුවා වන්නට පුළුවන. රටේ ජනගහනයෙන් රැකියා නියුක්ත කාන්තාවන් 35%ක් පමණ වන අතර සේවා වියුක්ති විවාහක කතුන් බොහෝ විට යැපෙනුයේ තම ස්වාමි පුරුෂයාගෙනි. මෙවැනි ඇතැම් පවුල්වල පුරුෂයන් තම බිරිඳ හා දරුවන් නඩත්තු කිරීම පැහැර හැරි විටදී, සැමියාගෙන් නඩත්තු ඉල්ලා නඩු පැවරීම සිදුවන අතර එයින් පැහැදිලි වන්නේ එම අඹුසැමියන් දික්කසාදය තෙක් දුර නොගියද, පවුල් තුළ ආරවුලක් පවතින බවකි.

නීතිඥ සජීවනී අබේකෝන් පවසන අන්දමට හිංසනය වැළැක්වීම පනත යටතෙහි තමන්ට සිදුවන හිංසනයන් පිළිබඳව ස්වාමි පුරුෂයන්ට ද නඩු පැවරිය හැකියි. එහෙත් අප රටෙහි වැඩිපුර ගෘහස්ථ හිංසය පිළිබඳව නඩු තම ස්වාමි පුරුෂයාගෙන් සිදුවන කායික හිංසනය ඉවසා ගත නොහැකිව භාර්යාවන් විසින් පවරනු ලබන නඩු වන අතර, මෙම තත්ත්වයන්ගෙන් ද පෙන්නුම් කරනුයේ එවන් පවුල්වල පවත්නා 'ආරවුල්' බව පැහැදිලිය.

විවාහය තුළ රැඳුනද, කායිකව මෙන්ම මානසිකව වෙන්වී සිටින අඹු සැමියන්ගේ පවුල් ආරවුල් මෙහිදී වාර්තා නොවන තරමය. කෙසේ වුවද, බිඳ වැටුණු පවුල් (Broken Families) වැනි විවිධ පුවල් ආරවුල් පිළිබඳ නඩු සංඛ්‍යාවන් දෙස බලද්දී ඒ උසාවිවල ඉඩම් හා බූදල් නඩුවලට වඩා ඉහළ ගොස් ඇති බැව් පෙනේ.

පවුල් සංස්ථාව යන්න මෙවැනි බිඳ වැටීමකට ලක්වී තිබියදී, අප කළ යුත්තේ සංඛ්‍යා ලේඛන දෙස බැලීමට වඩා විවාහ බිඳ වැටීම් මෙතරම් වේගයෙන් සිදුවීමට බලපෑ හේතූන් පිළිබඳ සොයා බැලීමය.

දික්කසාදය සඳහා යොමුවූ වැඩිදෙනෙකුම පාහේ පාසැල් අධ්‍යාපනය එමෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා ලැබූවන්ය. එහෙයින් අපගේ අධ්‍යාපන ක්‍රමයෙහි කොතැනක හෝ ගැටලු සහගත තත්වයක් ඇතැයි සිතීම වැරැද්දක් වන්නට නුපුළුවන.

"කල්ගත වන විට තම අවශ්‍යතා පිළිබඳව බිරිඳගේ නොසැලකිලිමත්කම, අපිරිසිදුකම, අපිළිවෙළ, තොර තෝංචියක් නැතිව මැසිවිලි නැඟීම ගැන විවාහ බිඳ වැටීමට හේතූන් ලෙස ඇතැම් පුරුෂයන් තම භාර්යාවන් දෙසට ඇඟිලි දිගු කරද්දී, ඇතැම් භාර්යාවන් අසන්නේ එළිවූ මොහොතේ පටන් බැණුම්, ගෙරවුම්, අපහාස වලට මුහුණ දී යහනේදී සබඳතාවක් ඇතිකර ගැන්මට තරම් මානසික සූදානමක් ඇතිකර ගන්නේ කෙලෙසින්ද යනුවෙනි."

ආචාර්ය උපාලි සේදර පවසන අන්දමට තරුණ දරුවන් පසුගිය කාලය තුළ විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයට යොමුවීම තුළ දෙමාපියන් දරුවන්ට පවසන එකම දේ පාඩම් කරන්න පමණක් වන අතර, ළමුන්ගේ ජීවන කුසලතා ඇතිකරලීම සිදුනොවීම මෙන්ම ඔවුනට තම පවුල සමඟ ගත කිරීමට ද ලැබෙනුයේ ඉතාමත් අඩු කාලයකි. පාසලෙන් ටියුෂන් පන්තියට යන දරුවා එතැනින් නිවසට පැමිණි පසු නැවතත් හිඳ ගන්නේ පාඩම් කරන්නයි.

අවම වශයෙන් තම දෙමාපියන්ගේ ජීවිත ගැනවත් නොදන්නා මෙම දරුවන් පවුලට හැඩගැසීම නිසි අන්දමින් සිදු නොවන්නාක් මෙන්ම ළමුන්ගේ චිත්තවේගී සංවර්ධනයක් ද දැකිය නොහැකිය. අනෙක් අතට පවුලක දරුවන් එක් අයෙකුට හෝ දෙදෙනෙකුට පමණක් සීමා වීම රණ්ඩු වන්නට, යාළු වන්නට, බෙදා ගැන්මට දරුවනට ඇති ඉඩකඩ සීමා වීමෙන් දරා ගැනීම, ඉවසීම වැනි ගුණාංග නුහුරු දරුවන් ඇතැම්විට තමන්ට දෙමාපියන් විසින් උපදෙස් ලබා දුන් විටෙක පවා ඊට ප්‍රතිචාර දක්වන්නේ නොරිස්සුම පෙන්වන්නට 'දඩාස්' හඬින් දොර වසා දැමීම වැනි දෙයකිනි. ඔවුන් පවුල තුළ, සමාජය තුළ ඇති ප්‍රශ්නවලට මුහුණ දීමට හැඩගැහෙන්නේ නැත. ජීවන කුසලතා, හසුරු කුසලතා නොමැතිවීම හේතුවෙන් තම ඇඳුමක් සෝදා ගැන්මට, පොත් මේසය පිළිවෙළට තබාගැන්ම, ගේ දොර පිරිසිදු කිරීමට මේවාට දරුවන්ට දැනුමක් නැත.

එවැනි දරුවකු 'විවාහය' නැමති ජීවිතයේ මල්ඵල හටගන්නා සමයට ඇතුළු වීමෙහිදී ජීවිතය හරි හැටි ගෙනයාමට නොදත්කම හේතුවෙන් විශාල ගැටලුන්ට මුහුණ පෑම පුදුම විය යුතු කරුණක් නොවෙයි.

දික්කසාදය සම්බන්ධ කටයුතු කරන උපදේශනයෙහි නියුතු නිලධාරිනියක් වරක් පවසා තිබූ අන්දමට ඇගේ අත්දැකීමට අනුව දික්කසාදය ඉල්ලා නඩු පවරන්නට වැඩිපුරම පැමිණෙන්නේ පුරුෂයන්ය. එලෙස දික්කසාදය ඉල්ලූ එක් තරුණ සැමියකු පවසා තිබුණේ අපූරු කතාවකි.

"අපේ දෙමව්පියෝ අපි ගෙවල්වල ඉද්දි හොඳ රහට උයලා අපිට කන්න දුන්නා. නමුත් අද එහෙම දෙයක් නැහැ. කසාදයක් බැන්දට මොකද? තුන්වේලම කන්නෙ කඩෙන්"

තවත් විවාහක පිරිමියෙකු පවසා තිබුණේ ඊට නොදෙවනි කතාවකි. "අපේ ඇඳ මතක ඇති කාලෙකින් අස්කරල නැහැ. උදේ පාන්දර වැඩට යනව, රෑට ගෙදර ඇවිත් ඇඳ උඩ ඉඳගෙන කාල, එතනම නිදා ගන්නව. අඩු ගාණෙ ඇඳ ඇතිරිල්ලක් මතක ඇති දවසකින් මාරු කරල නැහැ."

'පවුල' යන ඒකකය තුළ, නිවසේ වැඩ කටයුතු සඳහා දරුවන් තම දෙමාපියන්ට සහය ලබා දිය යුතු වුවද, මේ තුළින් පෙනෙනුයේ පවුල තුළ සහයෝගයෙන් යුතුව ජීවත් වීමට ඔවුන් තුළ ඇති නොහැකියාවයි.

එහෙත්, දරුවන් තුළ ඇති නොදැනුවත්කම පිළිබඳ වැරැද්ද තනිකරම ඔවුන් පිට පැටවීම සාධාරණ නොවේ.

මෙම විශ්වයෙහි ඇති බලවත්ම ආයතනය 'පවුල' වන අතර, යමෙකු ආපදාවකට මුහුණ පෑ විට ඔහුට ඇති ලොකුම ශක්තිය වන්නේ ද 'පවුල' ය.

එහෙත් වර්තමානයේදී කනගාටුදායක අන්දමින් සමාජයේ වෙසෙන දරුවන්ට මෙම 'පවුල' තුළින් ඇති විය යුතු ශක්තිය නැති වී යාම තුළ එය සමාජ ධර්මතා බිඳ වැටීම කෙරෙහිද බලපා ඇත. විශේෂයෙන් තරගකාරී අධ්‍යාපනය තුළ දරුවන්ට මෙන්ම ඔවුන්ගේ මවුවරුන්ට අවශ්‍ය වන්නේ කෙසේ හෝ අන් දරුවන් පරදා ඉස්මතුවීමය. දෙමාපියන් වැඩි දෙනෙකුට අවශ්‍ය වනුයේ තම දරුවා වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවෙකු කිරීමට මිස ජීවන කුසලතා, හසුරු කුසලතා අත්පත් කරගත්, සාර්ධර්ම අගයන දරුවකු දක්නට නොවන බැව් ආචාර්ය උපාලි සේදරගේ අදහසයි.

පවුල් බිඳවැටීම් පිළිබඳ සැලකුමේදි විවාහකයන් සමාජ මාධ්‍යයන් ඔස්සේ අනියම් සබඳතාවන් ගොඩනඟා ගැන්ම වර්තමානයේ වඩාත් සුලබව දක්නට ලැබෙන්නකි. අනෙක් අතට පුද්ගලයන් තුළ ඇති අසීමිත අපේක්ෂාවන් මත, අධි සුඛෝපභෝගී දිවි පෙවෙතක් වෙනුවෙන් වූ පරිභෝජන රටාවක් වෙනුවෙන් ණය වී හෝ වාහන, ගෘහ භාණ්ඩ ආදී දේ අත්පත් කර ගැන්මට පෙලඹීමෙන් කල් යාමේදී ණය බර හේතුවෙන් ඇතිවන පීඩනය පවුල් දෙදරා බිඳ වැටීම කෙරෙහි දැවැන්ත බලපෑමක් ඇති කරන අන්දම පිළිබඳව ඇතැම්විට කිසිවෙකු නොසිතුවා විය හැකිය.

විවාහ බිඳ වැටීමට බලපාන විවිධ හේතූන් අතර සහකරුවන්ගේ නොගැළපීම, දෙදෙනාම ආර්ථිකයට දායක වන පවුල්වල රැකියාව නිමවා නිවසට පැමිණෙන සැමියා මිතුරන් සමඟ මත් පැන් තොල ගාමින් සතුටු සාමීචියෙහි යෙදෙද්දී දරුවන්ගේ කටයුතු, ඉවුම් පිහුම් වැනි කටයුතු රැසක බරින් මිරිකුනු බිරිඳ දැඩි වෙහෙසකර තත්වයකට පත්වෙද්දී, එම වෙහෙස, කලකිරීම තුළ විවාහය අමුතු තැනකට තල්ලුවන්නේ ඉබේමයි. මෙවැනි තත්වයක් තුළ කුටුම්භය රැකගෙන, දරුවන් හදාගෙන මේ ගමන යා යුතුයි යන ධර්මතාවය රැකගෙන යාමට වඩා දක්නට හැක්කේ කුටුම්භය බිඳ වැටීමක් යයි මහාචාර්ය ප්‍රනීත් අබේසුන්දර ගේ අදහසයි.

ඇත ගම් පළාත් ගැන සැලකුවිට කසිප්පු, මත්පැන් ආදියට ඇබ්බැහි වූ පිරිමින්ගේ කෘශ වූ සිරුරු, තැම්බුණු මුහුණු හරියට ඔවුන් ජීවයක් නොමැතිව ජීවත්වන්නවුන් මෙන් වන අතර මෙවැනි පවුල්වල බිඳ වැටීම් ගැන තවත් අටුවා ටීකා ඇවැසි නැත.

'බැඳගත්ත බෙරේ ගහන්න ඕනේ' යැයි පවසා ඇතැමුන් බොහෝවිට දික්කසාදය අනුමත නොකළද, 'බෙරේ පැළුනට පස්සෙ බැඳගෙන ඉඳල වැඩක් නියනවා දැයි' සිතන ඇතැමුන් බිඳුනු විවාහය තුළ රැඳී සිටීමට වඩා දික්කසාදයකින් විවාහ අවලංගු කර දැමීමට කල්පනා කරති.

අතීතයේදී තාත්තාට බිය ලැජ්ජාව හේතුවෙන් සියල්ල නිහඬව දරා සිටියද, අනෙක් අතට සමාජ වෙනස්වීම තුළ ඇය අධ්‍යාපනික වශයෙන් ඉහළ සාධනීය තත්වයන් අත්පත් කරගෙන සිටින අතර, ඔවුන් වර්තමානයේදී තම පෞරුෂය, ආත්මාභිමානය පිළිබඳ සිතීම හේතුවෙන් තවදුරටත් නිහඬව විඳ දරා සිටින්නේ නැත.

එමෙන්ම ලිංගික කාර්යය පිළිබඳ අඹු සැමියන් අතර නිසි සන්නිවේදනයක් නොවීම මෙන්ම ලිංගික වශයෙන් පීඩා කිරීම්, අස්වාභාවික ලිංගික ක්‍රියාකාරකම් සඳහා තම භාර්යාවන් යොදවා ගැනීම වැනි දෑ ද පවුල් අවුල් වීමට බලපා ඇති කරුණු අතර වන බැව් නීතිඥ සජීවනී අබේකෝන් අදහස් දක්වන්නීය.

කල්ගත වන විට තම අවශ්‍යතා පිළිබඳව බිරිඳගේ නොසැලකිලිමත්කම, අපිරිසිදුකම, අපිළිවෙළ, තොර තෝංචියක් නැතිව මැසිවිලි නැඟීම ගැන විවාහ බිඳ වැටීමට හේතූන් ලෙස ඇතැම් පුරුෂයන් තම භාර්යාවන් දෙසට ඇඟිලි දිගු කරද්දී, ඇතැම් භාර්යාවන් අසන්නේ එළිවූ මොහොතේ පටන් බැණුම්, ගෙරවුම්, අපහාස වලට මුහුණ දී යහනේදී සබඳතාවක් ඇතිකර ගැන්මට තරම් මානසික සූදානමක් ඇතිකර ගන්නේ කෙලෙසින්ද යනුවෙනි. විවාහය තුළ ගැටලු පැන නැඟී තිබියදී එම ගැටලු නොලිහා ඉදිරියට යාම දුෂ්කර වුවද, කොතරම් 'පවුල් උපදේශන සේවා' තිබුණ ද තම පවුලේ ආරවුල ලිහා ගන්නට සිතා එවැනි සේවාවක පිහිට ලබා ගැන්මට සිතන්නේ ඉතාමත් සුළු සංඛ්‍යාවකි.

ඇතැම්විට තම විවාහ කඩා වැටීමට ලක්වී ඇති බවත්, එම විවාහය තුළ රැඳී සිටීම ප්‍රතිඵල රහිත බව හොඳින් අවබෝධ කර ගත්තද, අනෙක් පාර්ශ්වයෙන් පළි ගැන්මේ අපේක්ෂාව හේතුවෙන් එම ගැටලුව ලිහන්නට දික්කසාදයකට එකඟ නොවීමට හිතනවුන් හේතුවෙන් බිඳුණු විවාහයක් තුළ ඔවුන් සදාකාලික සතුරන් බවට පත්වෙති.

ඇමරිකාව, නෝර්වේ වැනි රටවල දික්කසාද පිළිබඳ ප්‍රතිශතය 36%ක් පමණ වුවත් එවැනි සමාජයක දික්කසාද වීම බරපතළ ගැටලුවක් නොවන්නේ, දික්කසාදය වූවන්ට දෙවෙනි, තෙවෙනි විවාහ කර ගැන්මට හැකි සංස්කෘතියක් එම සමාජයන්හි පවතින බැවිනි.

එහෙත් අප රටෙහි දෙවෙනි විවාහයකට යෑම පහසු වූවක් නොවන අතර, එය සෑහෙන කාලයක් ගතවන අනුමාන සහගත තත්වයකි. එහෙයින් එවැනි අවස්ථාවන්හිදී දික්කසාද වූවන් අසරණ වන අතර, එකී පීඩනය වඩාත් දැරීමට සිදුවනුයේ දික්කසාදය වූවන්ගේ වයස්ගත දෙමාපියන්ටය. ආචාර්ය උපාලි සේදර පවසන්නේ අධ්‍යාපන ක්‍රමය තුළ ළමයාට තම පවුල පිළිබඳව මෙන්ම අන් අයට ගරු කිරීම, හසුරු කුසලතා ඇති කර ගැන්මට උගැන්වීම නොකළහොත් ඔහු ලබන අධ්‍යාපනය ප්‍රතිඵල රහිත විය හැකි බවකි.

පවුල් සංස්ථාව දෙදරා යාම තුළ සමාජයක් ගරා වැටීමට ලක්වන බැවින් තම අධ්‍යාපන ක්‍රමය තුළ 'සතුටු පවුල්' යන්න ඇතුළත් කර තිබෙනුයේ එම බිඳ වැටීමේ අවදානමින් වළකා ගැන්මටය. ඒ කෙසේ වුවත් කක්කුටිටා ඇදයට යන අතර, කක්කුටු පැටවුන් කෙළින් යැවීමට උත්සාහ දැරීම නිරර්ථකය. දරුවන් බොහෝවිට උගනින්නේ වැඩිහිටියන්ගෙනි.

එහෙයින් පවුල තුළ බිරිඳ හා සැමියා උනුනුන්ට දක්වන සැලකිල්ල, ගෞරවය, අවධානය, කථා විලාශය වැනි මේ සියල්ල දරුවන් නිතැතින්ම උගනිත බැව් අමතක නොකළ යුත්තකි.

කොළඹ විශ්වවිද්‍යාලයේ
සත්ව විද්‍යා
අධ්‍යයනාංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සම්පත් සෙනෙවිරත්න

වීසා නැතිව එන කුරුල්ලන්ට කකුලට මුදුවක්

● ටෙක්ලා පද්මිණී කාරියවසම්

සංචාරක කුරුල්ලන්ගේ අභිජනනය ඉහළ දේශාන්තර වල හෝ ආක්ටික් හිමාල කලාප වල සිදුවේ. තවත් පිරිසක් ඉරාන කාන්තාරවල බිත්තර දමන කුරුල්ලන්ය. උන් මාස හයක් එම ප්‍රදේශවල වෙසේ. උන් මාස හයක් මෙහි සිට බිත්තර දාන රට වලට ගමන් කරයි. සංචාරක පක්ෂීන් ලංකාවට එන මාර්ග තුනකි. මේ කුරුල්ලන්ට පියඹා ඒ මට හැකියාව තිබුණ ද, උන් මුහුදු උඩින් පියඹා එන්නේ නැහැ. උන්ට නිශ්චිත පියසැරිය ගමන් මාර්ගයක් තියෙනවා උන්ගේ ගමන් මාර්ග නිර්මාණය වී ඇත්තේ ගංගා ද්‍රෝණි දිගේ හා මුහුදු වෙරළ තීරය දිගේය.

මේ දින වල ලංකාවේ අති විශාල කුරුලු ගහනයක් දක්නට ලැබේ. පරිසරයේ සුන්දරත්වය වශී කරවන කුරුල්ලන් මියුරු නදින් අපේ දෙසවන් සනහයි.

කුරුල්ලන් මිනිස් නෙත සිත වශී කරන සත්ව විශේෂයකි. උන්ගේ ඇවැතුම් පැවැතුම් පියාසර රටා මියුරු නාදය මිනිස් සිත ආනන්දයෙන් පුරවයි.

පරිසරයේ රමණීයත්ත්වය වර්ධනයට පක්ෂීහු උපකාරී වේ. අප වෙසෙන පරිසර පද්ධතියේ නිරෝගී භාවය වෙසෙන පක්ෂී ගණත්වය අනුව තීරණය කළ හැකි බව පරිසර විද්‍යාඥයන්ගේ අදහසකි. සෑම වසරකම අගෝස්තු මාසයේ සිට මාර්තු මාසය දක්වා කාලය තුළ ලංකාව කුරුලු පරාදීසයක් බවට පත් වන්නේය. ලෝවටා සිටින සංචාරක කුරුල්ලන් උණුසුම් දේශගුණයේ සුව විඳීමට සමකය ආසන්න ප්‍රදේශ කරා පැමිණෙන බැවිනි.

ඒ කුරුල්ලන්ගෙ වගතුග සොයා ගන්නට අපට ක්‍රමයක් නොවූ බැවින් අපි උන්ගේ සොඳුරු බව දැක සැනැසුනෙමු. එත් දැන් එසේ නොවේ. උන්ගේ වගතුග අපට කොළඹ විශ්ව විද්‍යාලය මඟින් කියනු ඇත.

ශීත ඍතුවට මුහුණ දීම සඳහා සැතපුම් දහස් ගණනක් ගෙවා එන මානව නොවන සංක්‍රමිකයන් මිලියන දහස්

ගණනක් අගොස්තු සිට මාර්තු දක්වා කාලයේ ලංකාවට පැමිණේ. රංචු වශයෙන් මේ රැම්සා භූමියට පැමිණෙන

කුරුල්ලෝ රංචු ලෙස ම පිටව යති. මේ අතර දුර්ලබ පක්ෂීහුද වෙති. තාරාවන් විශේෂ, රතුපැහැ නළාපිඹින්නා, කළු කුරුල්ලා, ෆ්ලැමින්ගෝ, ලිහිණි වර්ග බිලැක් හෙඩ් උකුස්සන් විශේෂ, හා පෙලිකන් වර්ග කුරුල්ලන් මේ අතර වේ.

ලංකාවේ කුරුල්ලන් වර්ග 503ක් දක්නට ඇත. මේ රැම්සා භූමියෙහි 2017 වසරේදී පමණක් කුරුලු විශේෂ 433ක් වාර්තාවී තිබේ. ඉන් 26 ක් ලංකාවට ආවේනික කුරුල්ලන් ය.

බඩගිනි කාරයන්ගේ ගමනාන්තය ලෙස හැඳින්වෙන ලංකාවේ භූවිෂමතාව හා වෙනස් පරිසර පද්ධතීන් මේ

කුරුල්ලන්ගේ ජීවන තත්ත්වය උසස් කරන හොඳම සාධකයයි.

මන්නාරම - වන්කාලෙල බුන්දල වනෝද්‍යානය, මාදු ගඟ ආශ්‍රිත උද්‍යානය, ආනවිලුන්දාව අභය භූමිය, කුමන ජාතික වනෝද්‍යානය, විල්පත්තු ජාතික වනෝද්‍යානය වශයෙන් ලංකාවේ රම්සා තෙත් බිම් හයක් වේ.

සංක්‍රමණික කුරුල්ලකුගේ පාදයකට මුදුවක් පළඳවමින්

2019 වසරේ සිට කොළඹ හා ශ්‍රී ජයවර්ධනපුර ආශ්‍රිත නාගරික ප්‍රදේශය රම්සා තෙත් බිම් නගරයක් ලෙස නම් කර තිබේ. තෙත් බිම් ආශ්‍රිත පක්ෂීන් රැසක් මේ ප්‍රදේශ කරා වාර්ෂිකව ඇදී එයි.

වියළි කලාපයේ කටු පදුරු සහිත තෘණ භූමි සහිත ජල පෝෂක වැටි, මුහුදු තෘණ පාත්ති, කඩොලාන, නොගැඹුරු මුහුදු ආශ්‍රිත තෙත් භූමිය ලුණු වගුරුබිම් වැලි වැටිල කලපු ආදී පරිසර පද්ධති කිහිපයක් සහිත මේ භූමිය කුරුල්ලන්ගේ වාසයට අතිශයින් යෝග්‍ය වේ. ලොව සියලු ජීවීන්ගේ පැවැත්ම උදෙසා තෙත් බිම් පරිසර පද්ධතිය මඟින් වන මෙහෙය මහඟුවේ. මේ පරිසර පද්ධතිය මඟින් සිදුවන ජෛව විද්‍යාත්මක විද්‍යාත්මක, ආර්ථිකල සමාජීයමෙන්ම සංස්කෘතික වටිනාකම අමිල වේ.

මිනිසාට මේ ස්වභාවික අමිල වටිනාකමින් යුත් භූමිය පිළිබඳ මනා වැටහීමක් ඇතැයි සිතිය නොහැකිය. එහෙත් ඉහළ විවිධත්වයකින් යුතු විශේෂිත පරිසර පද්ධතිය මසුන්ගේ මෙන්ම කුරුල්ලන්ගේ වාසයට වර්ගයා බෝකර ගැනීමට උපකාරී වේ.

වාර්ෂිකව සංක්‍රමණයවන කුරුල්ලන් විශේෂ ගණනාවක් සඳහා මේ උද්‍යානය සුරක්ෂිත ජීව මාන වාසස්ථානයකි.

වන්කාලෙ හා බුන්දල හා කලමැටියමෙන්ම සියලු රම්සා බිම් ලංකාවේදී එක සමානවම පක්ෂීන් හට අභය භූමියක් සේ කියා කරයි.

මේ පරිසර කලාප පක්ෂීන් සඳහා සුදුසු ආහාරයෙන් පෝෂිත ය. මේ බඩගිනිකාරයන්ට මේ භූමියෙහි ඓතිහාසික හෝ මූල්‍යමය අගනාකම් අවැසි නැත. අවශ්‍ය වන්නේ රැකවරණය හා ආහාර පමණි.

ඒ දෙක සිතූ ලෙස රැදි මේ භූමියට වසර සිය දහස් ගණනක් තිස්සේ පැමිණෙන මේ පක්ෂීහු මෙහි මාස කිහිපයක් වෙසෙමින් තම සහකරුවන් සමඟ පෙමින් වෙළෙමින් සිට බිජුලා පැටවුන් ලැබ උන් උස්මහත් කොට ගෙන මේ භූමියෙන් නික්ම යන්නේ ඊළඟ ශීත ඍතුව තෙක් තම මවුබිමේ වෙසෙන්නට ය.

ලෝකයේ ඇත කෙළවරේ සැවනා තෙත් බිම් වල, කඳුකර බිම් වල, වානාන්තර වල, තෘණභූමිවල සිට එන මේ කුරුලු වර්ග යන්ගේ හැසිරීම් නිරීක්ෂණය සඳහා GPS තාක්ෂණය භාවිත කරමින් තොරතුරු නිරීක්ෂණය කිරීමට කොළඹ විශ්ව විද්‍යාලයෙ සත්ව විද්‍යා අධ්‍යයන අංශයේ ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා කවය හා චිනයේ චයිනිස් ඇකඩමිය එක්ව සාමූහ පර්යේෂණයක් සිදුකරනු ලබයි.

බඩගිනි කාරයන්ගේ ගමනාන්තය ලෙස හැඳින්වෙන ලංකාවේ භූවිෂමතාව හා වෙනස් පරිසර පද්ධතීන් මේ කුරුල්ලන්ගේ ජීවන තත්ත්වය උසස් කරන හොඳම සාධකයයි. මන්නාරම- වන්කාලෙල බුන්දල වනෝද්‍යානයල මාදු ගඟ ආශ්‍රිත උද්‍යානය, ආනවිලුන්දාව අභය භූමිය, කුමන ජාතික වනෝද්‍යානය, විල්පත්තු ජාතික වනෝද්‍යානය වශයෙන් ලංකාවේ රම්සා තෙත් බිම් හයක් වේ.

ඒ සඳහා ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය සම්පත් සෙනෙවිරත්න, යොමි පනාගොඩ හා සම්මානිත මහාචාර්ය සරත් කොටගම චිනයේ චයිනිස් ඇකඩමි හි miliecao , යන පිරිස මේ පර්යේෂණය සඳහා එක්ව සිටී.

රටවල් තිහකින් පමණ ලංකාවට පැමිණෙන කුරුල්ලෝ අතරින් කුරුල්ලන් 35 දෙනෙකුට පමණ මේ වසරේ චන්ද්‍රිකා පර්යේෂණ සැටලයිට් ටැග් සවි

කිරීමට අපේක්ෂිතයි. මේ ටැග් එකක් ග්‍රෑම් හයක් බරින් යුතු වේ. එය අඟලක් දිගුවන අතර අඟල් බාගයක්

පළලින් ද අඟල් භාගයක් උසින් ද යුතුය. පොඩි ඇන්ටනාවක් ද සවි කර ඇත. එය සූර්යා ලෝකයෙන් ආරෝපණය වේ. එකක මිල ඇමරිකන් ඩොලර් 200 කි. එ උපකරණය කුරුල්ලාගේ තටු අතරින් පිටේ රඳවනු ලබනවා.

මේ රැඳවීම හේතුවෙන් කුරුල්ලන්ගේ ජීවන රටාවට කිසිදු බාධාවක් සිදුවන්නේ නැත. ප්‍රජනන කාර්යයට බාධා පමුණුවන්නේ ද නැත. උන්ගේ ජීවන ක්‍රියා කාරිත්වයටද පියාසර හැකියාවට ද එයින් කිසිදු බාධාවක් නොවේ.

අන්තර්ජාතික ප්‍රමිතියට අනුව මේ උපකරණය පැළඳවීමේ දී උපකරණය කුරුල්ලාගේ බරින් 3 න් 1 පමණක් විය යුතුය. ඒ හේතුවෙන් අවම වශයෙන් ග්‍රෑම් 200කට වඩා බරින් යුත් කුරුල්ලන් සඳහා පමණක් මේ උපකරණය පැලඳවිය යුතුය. කේතය පැළඳවූ කුරුල්ලන් හට කකුලට මුදුවක් ද පලඳවන අතර මෙහි සටහන් විශේෂිත අංකයෙන් ඒ කුරුල්ලා කොතැනක සිටියද හඳුනා ගැනීම පහසු වේ.

පර්යේෂණ කේත මඟින් නිකුත් කරනු ලබන දත්ත පැය දෙකකට වරක් නිරීක්ෂණය කළ හැකි අතර කුරුල්ලා සිටින ස්ථානයල පිහාඹනවා දල ආහාර ගන්නවා ද එසේත් නැතිනම් බිම ඇවිදිනවා ද, ඌ ගේ ගමන් මාර්ගය, ශරීර උෂ්ණත්වය මෙ මඟින් හඳුනා ගත හැකිය. ලංකාවේ දක්නට ලැබෙන පක්ෂී විශේෂ අතරින් 250 ම ලංකාවේ ඉපදී මෙහි බිත්තර දමා මෙහි ජීවත් වේ.

ලෝකයේ ඇති පියසැරි මාර්ග අටෙන් එකක් වන්නේ ලංකාව අයිති මධ්‍යම ආසියානු පර්යාතනික පියසැරි මාර්ගයයි. එය ත්‍රිකෝණාකාර වේ.

ආක්ටික් කලාපය රුසියාව, ඇලස්කාව, චීනය, මොංගෝලියාව, සයිබීරියාව, හිමාලයේ නැගෙනහිර ඉන්දියාවේ නැගෙන හිර බැවුම ඔස්සේ එක් පිවිසුම් මාර්ගයකින් මේ විසා නැති සංචාරකයෝ ලංකාවේ යාපනයට ඇතුලු වේ.

අනෙක් කණ්ඩායම නොර්වේ ස්වීඩන්ල කැස්පියන් මුහුද, රුසියාවේ බටහිර කසකස්තානය, හිමාලය, ඉන්දියාවේ බටහිර බැවුම හරහා වීසා අයදුම් නොකරම අනෙක් සංචාරක පිරිස වසර සියදහස් ගණනක් තිස්සේ මන්නාරමින් ලංකාවට ඇතුළු වේ.

ලංකාව බලා පියාසර කරන කුරුල්ලන්ගෙන් කොටසක් දකුණු ඉන්දියාවෙන ගමන අවසන් කරයි. මේ ගමන් මගේ අවසන් නැවතුම ලංකාව වේ.

ස්වභාවිකව මඟ නවතින කුරුල්ලන් හැරුණු විට ලෙඩ වන සතුන්, මිය යන සතුන් මෙන්ම මඟ නවතින කුරුල්ලන් ද වේ.

මේ පර්යෙෂණ ක්‍රමවේදය මඟන් අපිට උන් ඉන්නා තැන යැම් ඊම්, ශරීරයේ උෂ්ණත්වය ආදි නොයෙන් දේ පැය දෙකෙන් දෙකට අපට දැනගත හැකිවේ, මේ වසරේ උපකරණ පැළඳවීමේ දී කකුලු ඔලෙවියා, තාරාවා, කළු පෙඳ ගොහොඳවිත්තා වැනි විශාලත්වයෙන් වැඩි සතුන් කෙරෙහි අවධානය යොමු කර තිබේ.

මන්නාරම බුන්දල හා රටවටා කුරුලු අභය භූමි කුරුල්ලන් ගෙන් පිරී තිබේ. කුරුලු රෑන් තුරු හිස් මත මඩවගුර මහුදු

දිය මත ඉගිළෙමින් පිහිනමින් රටා මවන අයුරු නිදහසේ දැක ගැනීමට ඔබටත් වන්කාලෙ හෝ බුන්දල රම්සා භූමියට යා හැකිය.

එහි ඇති ශුෂ්ක කටුක දේශගුණික තත්තවයන් ඔබ පීඩාවට පත් කරනු ඇත. එහෙත් භාවනාවකින් මෙන්සිත සනසා ගැනීමට කුරුල්ලන්ගේ ගමන් රටා පියාසර රටා මියුරු හඬ ඔබට උදව්වෙනු ඇත. කුරුල්ලන් දැක ගැනීමට ඔබ යා යුත්තේ අලුයමෙහිය. නැතිනම් සැඳෑ සමයෙහිය.

සේයාරූ- කීර්ති ජයලත්

එදා මෙදා

● සංවාදයට විවෘතයි

දිළිඳු ජනයාට කොකා පෙන්වන අලි සංරක්ෂණය හා කළමනාකරණය

දිනපතා ජන මාධ්‍යයන්හි අබණ්ඩව පළ වන මිනිස් / අලි ගැටුම නිසා ශ්‍රී ලංකාවේ අවාසනාවන්ත ලෙස සිදුවන අසරණ ,දිළිඳු මිනිසුන්ගේ සහ වන අලින්ගේ ජීවිත විනාශය, ඉමහත් සංවේගයෙන් හා කලකිරීමෙන් යුතුව සටහන් කරමු. මිනිස් හා වන අලි ජීවිත ආරක්ෂා කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් වහාම කටයුතු කළ යුතු බව ගරු ජනාධිපතිතුමාද විටින් විට අවධාරණය කර ඇත. තවද, ගොවිතැන තම එකම ජීවනෝපායය කර ගත් අසරණ, දිළිඳු ගොවීන්ගේ දේපළ, අස්වනු හා දැඩි ශ්‍රමයෙන් වගා කරන ලද බිම් කැබලි වලට සිදුවන හානිය දැකීමද එවන් ශෝකයක් හා දැඩි කලකිරීමක් දනවන්නකි. අලි වෙඩි සහ විදුලි වැටවල් මෙම කුසගින්නෙන් පෙළෙන, නුවණැති, වල් අලි, හමුවේ වේගයෙන් නාස්ති වන ආයෝජන බවට පත්වෙමින් තිබේ. ඒනිසා,මෙම දිළිඳු ගොවීන්ගේ හා වන අලින්ගේ බේදවාචකය බලධාරීන්ගේ ක්ෂණික අවධානයට ලක්විය යුතුය.

2019 වසරේදී, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජන අදහස් ඉල්ලා ඉහත විෂය පිළිබඳව ප්‍රතිපත්ති ප්‍රකාශයක් පුවත්පත්වල පළ කරන ලදී.

ඊට මවිසින් දෙපාර්තමේන්තුවට දැක්වූ ප්‍රතිචාරය බිහිරි කන් මත වැටී ඇති බව පෙනී යන හෙයින් එහි අඩංගු අදහස් හා යෝජනා, අදාළ බලධාරීන්ගේ හා මහජනතාවගේ දැනගැනීම සඳහා නැවත උපුටා දක්වමි.

"දෙපාර්තමේන්තුවේ මාර්ග සිතියම සකස් කිරීමේදී පහත දැක්වෙන පොළවේ යථාර්ථයන් සහ දීර්ඝ කාලීන ප්‍රතිකර්ම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් යයි හඟිමි .

1) ශ්‍රී ලංකාව ඉතා කුඩා දූපත් රටක් වීම නිසා, උපත් පාලන ක්‍රියාවලියකින් තොරව සිදුවන මිනිසුන්ගේ හා වන ජීවීන්ගේ අඛණ්ඩ වර්ධනය මෙන්ම ශාක ව්‍යාප්තිය සඳහා එහි ඇති ඉඩකඩ ශීඝ්‍රයෙන් අඩුවෙමින් පවතියි .

2) එම තිත්ත යථාර්ථයට සමගාමීව, ජීවීන්ගේ පරිභෝජනය සඳහා මෙම කුඩා භූමිය සතු ආහාර හා පාරිසරික සම්පත්ද ක්ෂය වීම නිසා, මිනිස් අලි ගැටුම (HEC) නොවිසිඳෙන ගැටලුවක් ලෙස ඔඩු දුවමින් පවතියි.

3) එලෙසම,අලි සංරක්ෂණය (EC) ද පැහැර හැරිය නොහැකි වැදගත්කමක් උසුලන හෙයින්, මිනිසුන් සහ අලි ඇතුන් ගහනය අතර සියුම් තුලනයක් ඇති කිරීම අනිවාර්ය වී ඇත .

4) එනිසා, පර්යේෂණ ප්‍රමුඛතාවය විය යුත්තේ වර්තමාන අලි ගහණය (හීලෑ හා වන අලීන්) ඇති ප්‍රදේශ නිශ්චිතව හඳුනා ගෙන, ඉන්පසු උන්ගේ ආහාර,වාසස්ථාන,දේශගුණික හා පරිසරාත්මක සාධක වැනි ප්‍රධාන විචල්‍යයන් සැලකිල්ලට ගනිමින්, භූගෝලීය වශයෙන්,රටතුළ ස්ථානගත කළහැකි පූර්ණ වන අලි ධාරිතාව(Total carrying capacity)තීරණය කිරීමය.මෙහිදී, අනාගත අලි සහ මිනිස් ප්‍රවර්ධනය, මරණ අනුපාතය, මිනිස් වාසස්ථාන වැඩි කිරීම සඳහා වනාන්තර ඉවත් කිරීම සහ නැවත වනවගාව ඇතුළු ආහාර වගාව වැනි සාධකද සැලකිල්ලට ගැනීමද අනිවාර්යය .

මෙම පර්යේෂණ සොයා ගැනීම් තුළින්, අවම වශයෙන් අවුරුදු 10 ක කාල පරාසයක් සඳහා, රටේ EC අවශ්‍යතාවය සපුරාලන උපරිම වන අලින්ගේ සංඛ්‍යාව තීරණය කිරීමට හැකි විය යුතුය. අලි ගහනය මෙම නියතය ඉක්මවා ගියහොත්, අතිරික්ත සංඛ්‍යාව, අවශ්‍යතා ඇති රටවලට අපනයනය කළ හැකි අතර එමඟින් දිගු කාලීනව රටේ ණය ආපසු ගෙවීමේ ගැටලුව සමනය කිරීමටද උපකාරී වේ. "

පහත සඳහන් ප්‍රතිලාභද ජනතාවට සහ රටට වැදගත්ය.

1) පර්යේෂණ කටයුතුවල මූලික පියවරක් වශයෙන්, අලි ඇතුන් කෙටිකාලීනව හෝ නැවත ස්ථානගත කිරීම තුළ, අසරණ,දුප්පත් ගොවීන් ඔවුන්ගේ වර්තමාන දුබිත තත්වයෙන් මුදවා ගැනීමට හැකි වීම .

2) මධ්‍යම හා දිගු කාලීනව වැඩිවන ජනගහනයට, ආරක්ෂිත වාසස්ථාන හා වගා කළ හැකි ඉඩම් ලැබීම.

3) වන ආවරණය විධිමත්ව ආරක්ෂා වීම.

4) විද්‍යාත්මකව ආහාර බෝග නිෂ්පාදනය සඳහා ඉඩකඩ පුළුල් වීම හා බෝග විනාශය අවම වීම තුළින්, රටෙහි හා ග්‍රාමීය දුප්පතුන්ගේ ආර්ථිකය වැඩි දියුණු වීම.

5) විදුලි වැටවල්, අලි වෙඩි, නිර්වින්දන ද්‍රව්‍ය හා ආම්පන්න හා මිනිස් ශ්‍රමය ආදියෙහි නාස්තිය වැළකී, විදේශ විනිමයද ඉතිරි වීම.

6) වන අලි අල්ලා ගැනීම(Catch), හීලෑ කිරීම(Tame) සහ අපනයනය(Export)- (CTE) අභ්‍යාසය සඳහා මෙම ඉතිරිකිරීම් භාවිතා කිරීමට හැකිවීම.

ඉහත සඳහන් අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමෙන් , මධ්‍යම හා දිගු කාලීනව HEC සහ EC හි බොහෝ ගැටලු ප්‍රායෝගිකව විසඳිය හැකි බව අවධාරණය කරමු..

බර්නාඩ් ප්‍රනාන්දු,
මොරටුව.

තරංග

කෙළිමඬල චිත්‍රපටයේ එච් ඒ පෙරේරා සමඟින්

සෙයිලම චිත්‍රපටයේ රවීන්ද්‍ර රන්දෙනිය සමඟින්

සිංහල සිනමාවේ යකඩ ගැහැනිය අනෝජා වීරසිංහ

● ඒ.ඩී. රන්ජිත් කුමාර

"මා මේ දක්වා ආ ගමනේ මඟ දෙපස ආපසු හැරී බලද්දී, චිත්‍රපටයක සිතුවම් පෙළක් සේ, මට මැවී පෙනෙන්නේ මගේ කුඩා අවදියයි. බදුල්ලේ සහ මොනරාගල ගත කළ අවදියයි. එකල ඈත අහසේ පියාසර කරන අහස් යාත්‍රාවලට අත්පුඩි තලමින් කෑ ගැසූ අයුරු මතක් වන විට අද දක්වා පැමිණ ඇති ගමන් මඟ මා ආවේ කෙසේදැයි මට සිතා ගැනීමට පවා අසීරුයි. එහෙත් ගමෙන් ලැබුණ පන්නරය, ගැමියන්ගෙන් දැක ගත් මිනිස්කමේ සුවඳ, ඔවුන්ගේ නිර්ව්‍යාජ බව, අහිංසක බව, නිහතමානි බව සියලු දුක් කරදර හමුවේ මහා පර්වත මෙන් නොසැලී ඉඳීමේ ගුණය, මගේ ජීවිතයට ද විශාල වශයෙන් බලපාන්නට ඇති."

හොඳම නිළිය ලෙස 1987 වසරේ නව දිල්ලියේ ජාත්‍යන්තර සම්මාන උලෙලේදී රජත මයුර (Silver Peacock) සම්මානය "මල්දෙනියේ සිමියොන්" දිනාගත් අනෝජා වීරසිංහ 1990 වසරේ තමිල්නාඩු ප්‍රාන්තයේ ආණ්ඩුකාර ශ්‍රී භිෂ්ම නාරයන් සිං වෙතින් කොහිනූර් රත්න රජත සම්මානය හිමි කර ගත්තාය.

"මොනරාගල සිනමාහලක පොල් කොටන් වලින් සාදා තිබුණු බංකු මත ඉඳගෙන නිහාල්සිංහ ගේ වැලිකතර නැරඹූ මට ආදරණීය නිහාල් අයියාගේ ම 'මල්දෙනියෙ සිමියොන්' චිත්‍රපටය සඳහා අන්තර් ජාතික සම්මානයක් ලැබෙයි කියලා හීනෙකින්වත් හිතුවද?

"ඒ කාලේ මම චිත්‍රපට බලන්න හරි ආසයි. මගේ ප්‍රියතම නළුවා විජය කුමාරතුංග. නිළිය පුණ්‍යා හීන්දෙනිය සහ මාලිනී ෆොන්සේකා. අපේ ගෙදර වියන් ඇඳක් තිබුණා. චිත්‍රපට බලලා ගෙදර ඇවිත්, අම්මගේ සාරිවලින් අර වියන් ඇඳ වට කරලා අක්කලා එක්ක බලපු චිත්‍රපටවල කෑලි රඟපානවා. ඒක ලස්සන ලෝකයක්."

අනෝජාගේ මුල්ම රංගනය මොණරාගල තිබුණ මොන්ටිසෝරි පාසලේ ප්‍රසංගයක ජපන් ඇඳුමින් සැරසී කඩදාසි කුඩයක් අරන් ජපන් කුමාරිකාවක් ලෙස රඟපෑමය. පුංචි අනෝජාට එදා තෑග්ගකුත් ලැබුණලු. ඊට පස්සේ ඇය අක්කලා ගිය බදුල්ලේ උසස් බාලිකා විද්‍යාලයටත්, මොනරාගල මහානාම විද්‍යාලයටත් ගියාය.

ඇගේ අම්මාටත්, තාත්තාටත් හොඳට සින්දු කියන්න පුළුවන් වීම, වඩාත් බලපා ඇත්තේ තමා ළඟම වූ සොහොයුරිය මායා දමයන්තිට ය. (පසුව ජනප්‍රිය චිත්‍රපට පසුබිම් ගායිකාවකි) මායා අක්කාත්, අනෝජාත් පාසල් වේදිකාවේ දක්ෂතම ගායිකාව හා නර්තන ශිලිපිනියන් වූවාය.

අනෝජාගේ පියා වූ ජෙල්ඩීන් බදුල්ලේ රක්ෂණ සංස්ථාවේ දිස්ත්‍රික්ක කළමනාකරු වූ අතර, හොඳ කලාකරුවකු විය. 'ඌව කලා කවය' තාත්තගේ සභාපතිත්වයෙන් ආරම්භ කොට නාට්‍ය නිෂ්පාදනය කොට රඟපෑ 'බැරිස්ටර් හාමු' - 'හිඟන කෙල්ල' ආදි නාට්‍යය අනෝජා තම සොහොයුරු සොහොයුරියන් සමඟ නැරඹූහ. අනෝජාට යාන්තම් මතක ඇත්තේ පියා බැරිස්ටර් හාමු ලෙස රඟ පෑ ප්‍රතාපවත් කොටසලු. මේ නාට්‍යය බලන්න අම්මා පුංචි අනෝජා ගිය දවසක් තාත්තට වෙඩි තියෙන දර්ශනය දැකලා කෑ ගසා අඬා තිබුණාය.

ලකී සෙවන් කෙල්ල

"මගේ ප්‍රියතම චිත්‍රපට නිළියක් වූ පුණ්‍යා හීන්දෙනිය ජීවමානව දුටු දවස මට කිසිදා අමතක වෙන්නේ නෑ. පුණ්‍යා විවාහ වුණේ මොනරාගල රෝහලේ ප්‍රධානියා ලෙස සිටි දොස්තර මිල්රෝයි නානායක්කාර සමඟ. වෛද්‍ය මිල්රෝයි හා පුණ්‍යා විවාහ වී රෝහලේ නිල නිවසට පැමිණියදා ජයමංගල ආසිරි ගී ගයා පිළිගත් සිසුවියන් අට දෙනාට මමත්, මායා අක්කාත් සිටීම තවත් විශේෂ දෙයක්."

පුංචි කාලයේ සිටම අනෝජා දඟකාරියක් වූවාය. ඇය නැඟ නැති ගහක් ගමේ නොතිබූ අතර ගස්වලින් වැටී තුවාල වූ අවස්ථා ද හිඟ නොවීලු. ඒ කාලේ මොනරාගල කුඩාරම් ටියටර්ස්වල තිරගත වූ 'ටාසන්' චිත්‍රපට 'හූ' තිය තියා නැරඹූ අනෝජාට නරඹන්නන් බැණ වැදුණ අවස්ථා තිබුණි. ටාසන් මෙන් බදුලු ඔයේ ඉවුර අසල ගසක අතුවල එල්ලී වතුරට පැනීම දැකලා ඇය හැඳින්වූයේ 'ටාසන් කෙල්ල' ලෙසය.

"බදුල්ලේ කයිලගොඩ ඔයේ එගොඩ මෙගොඩ පීනන්න මම දස්සයි. ඒ කාලේ මම පිරිමි ළමයි එක්ක ඔයේ ඔට්ටුවට පීනනවා. අද ලංකාවේ ප්‍රවීණතම කැමරා ශිල්පියකු වූ ප්‍රසන්න හෙන්නායක ඉන් එක ළමයෙක්. ඒ කාලයේ ඔය විදිහට සමනල්ලු වගේ ගත කරපු ජීවිතයක් තිබුණේ.

බදුල්ලේ උපන් සිනමාවට සම්බන්ධ කැමරා ශිල්පී තිමති වීරරත්න හා චිත්‍රපට නළු රෙක්ස් කොඩිප්පිලි තාත්තගේ යාළුවෝ. තිමති අන්කල් ගෙදර ආවාම මට කතා කරන්නේ "ආ කෝ මේ කෙල්ල ලකී සෙවන්." මම පවුලේ හත්වෙනියා නිසා මට කවුරුත් කතා කරන්නේ ඒ නමින්."

බදුල්ලේ කයිලගොඩ දී 1955 ජනවාරි 21 වෙනිදා උපන් පරණපල්ලිය ගුරුගේ අනෝජා කාන්ති සිරිවර්ධන දොළොස් දෙනෙකුගෙන් යුත් පවුලක හත්වැනියාය. පියාගේ නම ජෙල්ඩීන් සිරිවර්ධන ය. විජයසිංහ ආරච්චිගේ සීලවතී මවගේ නම ය. අනෝජාට වැඩිමහල් ශාන්ති, සුනේත්‍රා, අසෝකා, සුනිල්, මායා දමයන්ති සහෝදර සහෝදරියන් වූහ. අනුර, ශියන්, ලේඛා, සන්ධ්‍යා, සුදත් නංගිලා මල්ලිලා ය.

දිනක් අනෝජා ගේ පියා හමුවීමට පැමිණි චිත්‍රපට අධ්‍යක්ෂ කැමරා ශිල්පී තිමති වීරරත්න (ප්‍රවීණ නිළි සංගීතා වීරරත්න පියා) මෙසේ අසා සිටියේය.

"ජෙලඩීන්, මම කරන්න යන "මේ දැස් කුමට ද?" පික්චර් එකට මේ 'ලකී සෙවන්' කෙල්ල දීපල්ලකෝ"

"තරහවෙන්න එපා තිමති, ඒ කෙල්ල තව ටිකක් ඉගෙන ගත්තාවේ."

තිමති ගොස් ඇත්තේ හොඳ හිතින් නොවේ.

"උඹව කැලි කපල ගගේ මුහුදේ දැම්මත් පික්චර්වල රඟපාන්න යවන්නේ නෑ." පියා අනෝජාට කියා ඇත්තේ ඇය රඟපානවාට තිබූ බලවත් අකැමැත්ත නිසාය.

"අපරාදේ මට විජය කුමාරතුංග එක්ක ඇට් කරන්න තිබුණ චාන්ස් එක..." හැඬූ කඳුළින් අනෝජා අම්මාට කීවාය.

මේ අතර අනෝජා 9 වැනි ශ්‍රේණියේ ඉගෙන ගන්නා කාලේ මොනරාගල මහානාම විද්‍යාලයේ යෝගා බාලසූරිය, නිව්ටන් ගුණරත්න ගුරු මහතුන් නිෂ්පාදනය කළ "අඳුරෙන් එළියට" නාට්‍යයේ රඟපෑවාය. එදා මේ නාට්‍යය බලන්න ප්‍රධාන අමුත්තා විදිහට ආවේ මොණරාගල මහා දිසාපති පී.ජී. පුංචිහේවා මහත්තය (අමාත්‍යාංශ ලේකම්වරයකු වූ ඒ මහතා ලේඛකයෙකි) නාට්‍ය අවසානයේ වේදිකාව පිටුපසට ඇවිත් රඟපෑ අයට සුබ පැතුවේය. අවසන තිබුණේ ත්‍යාග ප්‍රදානෝත්සවයයි.

"ඔබේ රඟපෑම විශිෂ්ටයි. අනාගතේ ඔබ දක්ෂ කලාකාරියක් වෙනවා. මගේ සුබ පැතුම්" කියලා දිසාපතිතුමා මුල්ම සහතිකය දීලා මට සුබ පැතුවා. මගේ රංගන කුසලතාව මුලින්ම දැක්කේ එතුමා." අනෝජා කීවාය.

අනෝජා රඟපෑමට, නර්තනයට මෙන්ම මලල ක්‍රීඩාවට ද කුසලතා දැක්වූ අතර පාසලේ ක්‍රීඩා නායිකාව ද, නෙට්බෝල් කණ්ඩායමේ නායිකාව ද වූවාය.

"මගේ ප්‍රථම ප්‍රේමය ඇති වුණේ පාසලේදී. පන්තියේම ළමයෙක් මට "මධු මල ඔබයි" කියලා පෙම් හසුනක් දුන්නා. මිල්ටන් මල්ලවාරච්චි ගැයූ 'මධු මල' ගීතය මුලින්ම ගුවන් විදුලියේ යන කාලේ. මමත් පිළිතුරු ලිපියක් ලිව්වා. තරගෙට ලියුම් ලිව්වා. ලැව් ගින්නක් වගේ අපේ ආදරය පාසලේ පැතිර ගියා. ඒක 'ආව ගියෝ' වාගේ ආදරයක්. අපේ පාසලේ හිටිය තරුණ ගුරුවරයෙක්. හරියට විජය කුමාරතුංග වගෙ. පන්තියට ඔහු ආවාම මම භාවනා කරනව වගේ බලන් ඉන්නවා. ඒත් ගුරුවරයගෙන් කිසිම ප්‍රතිචාරයක් නැහැ. මම එයාට ආදරය කරන බවවත් ඔහු නොදැන ඉන්න ඇති." අනෝජා තම ප්‍රේම පුරාණය වරක් හෙළි කළාය.

"මට නිළිවරමක් ලැබුණේ අහසින් මොකක්ද වැටුණ වගේ. එතකොට මම 1974 දී විවාහය වෙලා. මගේ සැමියා ග්‍රෑන්ඩ්පාස් කොස්ගස් හන්දියේ සිංගර් ශාඛාව භාර සිටි කඩවසම් තරුණයෙක්. මම ඒ කාලේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය කළේ. මම සංස්ථාවේ නෙට්බෝල් කණ්ඩායමට ක්‍රීඩා කළා. අපිත් එක්ක සේවය කළා චන්ද්‍රා පෙරේරා. ඔහු ජනප්‍රිය චිත්‍රපට අධ්‍යක්ෂ කේ.ඒ.ඩබ්ලිව්. පෙරේරාගේ පුතෙක්. "තාත්තා මේ දවස්වල "ආදර රත්නේ" චිත්‍රපටයේ වැඩ. අනෝජා කැමති නම් රඟපාන්න පුළුවන්." චන්ද්‍රා ඇසුවේ දවල් කෑම විවේක කාලයේය.

"චන්ද්‍රා, මම රඟපානවට වඩා ස්පෝට්ස්වලට කැමති." මම කිව්වා. මේ අතර සංස්ථාවේ මා සමඟ සේවය කළ චන්ද්‍රිකා කාරියවසම් දවසක් යෝජනාවක් කළා.

"අනේජා බැහැ කියන්න බැහැ හොඳේ. අපේ තාත්තා 'ටක් ටික් ටුක්' කියලා ෆිල්ම් එකක් කරවා. ඔයා පුංචි චරිතයක් කරන්න ඕනැ."

මට මේ යෝජනාව ප්‍රතික්ෂේප කරන්න බැරි වුණා.

නවදිල්ලි සිනමා උලෙළ

අනෝජා තම ප්‍රථම සිනමා රංගනය ගැන කතා කළාය.

"ටක් ටික් ටුක්" චිත්‍රපටයේ අනෝජා රඟපෑවේ එංගලන්තයේ හැදී වැඩී ලංකාවට එන තරුණියක් ලෙස ජෝ අබේවික්‍රම සමඟ රඟපෑවාය. තමාට ආලේප කළ 'මේකප්' සහිතව එදා රූපගත කිරීම් අවසානයේ කොළොන්නාවට යන බස් රථයක ගමන් ගන්නා විට කවුදෝ කෙනෙක් "කවුද බං මේ හොල්මන" කියා ඇත. හැමෝම සිනා සිනාසෙන විට ඇය අසල බස් නැවතුමින් බැස ලේන්සුවෙන් මුහුණ පිසදමා ගත්තාය.

අනෝජාගේ සිත ටික ටික සිනමා රංගනයට යොමු වෙද්දී 'ටක් ටික් ටුක්' චිත්‍රපටයේ සහාය අධ්‍යක්ෂවරයකුව සිටි සුනිල් සෝම පීරිස් පැමිණ කතා කළේය.

"අනෝජා යසපාලිතගේ මොනරතැන්න ෆිල්ම් එකේ සුරංජිගේ චරිතයට තෝරා ගත්තා."

අනෝජාගේ රංගන ජීවිතය එතැන් සිටය. එය - "අම්මේ මට සමාවෙන්න, ගීතිකා, දයාබර නිලූ, කැලෑමල්, සාරංගා, කලියුගය, හස්ති වියරුව, මොනරතැන්න - 2, මුහුදුලිහිණි, නිවන් දක්නා ජාති දක්වා, අනුරාගම් හිතවතිය, බට්ටි, මිහිඳුම් සිහින, අරලිය මල්, ඔබට දිවුරා කියන්නම් චිත්‍රපට දක්වා දිගුවක් විය. ඇගේ චිත්‍රපට ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ ඩී. බී. නිහාල්සිංහයන්ගේ මල්දෙණියේ සිමියොන් චිත්‍රපටයේ මව (ජේන්) හා දියණිය (සෝමා) යන ද්විත්ව චරිතයයි.

"මල්දෙනියේ සිමියොන් චිත්‍රපටයේ ද්විත්ව චරිතයට මාව නිහාල් අයියා (නිහාල්සිංහ) හැමෝම විරුද්ධ වෙද්දී තෝරා ගැනීමෙන් මා වෙනුවෙන් කළ පරිත්‍යාගය මම කෙසේ අමතක කරන්නද? එතෙක් වාණිජ චිත්‍රපට රඟපා හෙම්බත්ව සිටි මම මෙලහකටත් සිනමාවෙන් සමුගෙන තිබෙන්න ඇති. ඔහුගේ ගුරු හරුකම් මැද මා කළ ඒ ද්විත්ව චරිත නිරූපණයට 11 වෙනි නවදිල්ලි ජාත්‍යන්තර චිත්‍රපට උලෙළේදී හොඳම නිළියට හිමි සම්මානය ලැබීම දැනුදු මට දැනෙන්නේ සිහිනයක් ලෙසින්. මගේ රංගනය මූර්තිමත් කිරීමට මගේ පියා (සිමියොන්) ලෙස රඟ පෑ ජෝ අබේවික්‍රමගෙන් ලැබූ අනුබලය, රවීන්ද්‍ර, ස්වර්ණා, සනත් ගේ රංගන දායකත්වය මට මහත් පිටුබලයක් වුණා.

මල්දෙනියේ සිමියොන්

එදා මගේ උපන් දිනය. 1987 ජනවාරි 21 වෙනිදා. ඒ වගේම මගේ ජීවිතයේ අමතක නොවන දවස. උදේ 7 ට පමණ චිත්‍රපට උලෙළ නියෝජනය කළ නළු නිළියන් නවාතැන් ගත් හෝටලයේ මගේ කාමර දොරට කිසිවෙකු තට්ටු කරනු ඇසුණා. ලස්සන මල් කළඹක් සහිතව රවි මලික් මහතා (සම්මාන උලෙළේ ආගන්තුක සත්කාර භාර නිලධාරි) මා ඉදිරියේ පෙනී සිටියා. "සුබ උදෑසනක් මිස්ටර් මලික්."

"සුබ උදෑසනක් ඔබටත්. අද හවස ඔබට තියෙන ලස්සනම ඇඳුම ඇඳගෙන ඉන්න. සවස 6ට පමණ මම කාර් එකක් එවනවා. සිරිෆෝට් සිනමාහලට එක්ක යන්න."

මට ආයෙත් විමතියක් ඇති වුණා. "මට මොකටද කාර් එකක්. අපි ඔක්කොම ගෙනි යන්නේ ලොකු බස් එකකින්නේ. මිස්ටර් මලික් ඇත්ත කියන්න. මොකක්ද මේ විශේෂය?" "දැනට ඔය ඇති. අපි කාරණේ කියන්නම් හවසට." "කියන්න ඇත්ත මිස්ටර් මලික්...."

"හොඳම නිළියට හිමි සම්මානය ලැබෙන්නේ ඔබට. මේක රහසක්. ඔබ මගේ හොඳම මිතුරිය නිසා කිව්වේ."

මම ඇඬුවේ මා අත වූ මල්කළඹ අතහැර මලික්ව බදාගෙන. මලික් හරියට ගිරයට අහුවෙච්ච පුවක් ගෙඩිය වගේ. අන්ද මන්ද වූ මම මහ හයියෙන් "හූ" කිව්වා. ඒ ශබ්දෙට අල්ලපු කාමරේ හිටපු නිහාල් අයියා කලබල වී මගේ කාමරේට එනකං මලික්ව බදාගෙන ම හිටියෙ. නිහාල් අයියාට කාරණය කිව්වාම සතුටින් පිනා ගියා."

අනෝජා මෙයට වසර 34කට එපිට ඉන්දියානු නවදිල්ලි අන්තර්ජාතික සිනමා සම්මාන උලෙළේ සම්මාන රාත්‍රියේ විසිතුර අපට විස්තර කළාය.

මේ උලෙළේ දී හොඳම චිත්‍රපට නිළියට හිමි සම්මානය රටවල් 56 ක චිත්‍රපට 480ක් හා තරගකොට අනෝජාට ජය අත්වීමට අවස්ථාව ලැබිණ. මුලින්ම සම්මානය ලැබුවේ ඉන්දීය චිත්‍රපට නළු වූයේ රඝුවීර් යාදේව් ය. ඊළඟට නිවේදකයා හොඳම නිළියගේ නම නිවේදනය කළේය. මුළු ශාලාවම මීයට පිම්බා වගේය.

"Silver Peacockaward of the best actress goes to the sinhalese actress Anoja Weerasinghe for portrayal of exploitive Mother and daughter in Sri lankan film Maldeniye Simiyon Deirected by D.B. Nihalsinghe"

"ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ ඩී.බී. නිහාල්සිංහ විසින් අධ්‍යක්ෂණය කළ "මල්දෙණියේ සිමියොන්" චිත්‍රපටයේ සමාජ විෂමතාවන්ට ගොදුරු වූ මවක සහ දියණියක ලෙස අනෝජා වීරසිංහ ඉදිරිපත් කළ තීව්‍ර ද්විත්ව චරිත රංගනය උදෙසා මෙම රජත මයුර සම්මානය පිරිනැමේ." "මල්දෙණියේ සිමියොන්" නවකතාව ලියූ ඇරැව්වල නන්දිමිත්‍ර පවසා තිබුණේ අනෝජා මා මැවූ ජේන් හා සෝමවතී ගේ චරිත දෙකේම හැබහින් ජීවත් වූ බවය.

80 දශකයේ සිනමාවේ ස්ථාවරය ගොඩනගා ගත් අනෝජා ජනප්‍රිය සිනමාවේ ජය කෙහෙලි නැංවූයේ "ඔබට දිවුරා කියන්නම්" චිත්‍රපටයෙනි. අරලිය මල්, චන්නයි කෙල්ලො දෙන්නයි, පෙරළිකාරයෝ, මමයි රජා, සිනාසෙන්න රත්තරන්, යුක්තියට වැඩ, චිත්‍රපට වලිනි. කෙළිමඬල, ගුරුගෙදර, සුරබිදෙන, ජුලියට භූමිකාව, මුහුදුලිහිණි, සෙයිලම, සිරි මැදුර, ජනේලය, ආදි කලාත්මක ධාරාවේ චිත්‍රපටවල රඟපෑ අනෝජා හොඳම නිළිය ලෙස සරසවිය, ජනාධිපති, OCIC, ස්වර්ණසංඛ සම්මාන ලැබුවාය.

අනෝජා "කෙළිමඬල" චිත්‍රපටයේ රඟපෑ රංජනී ගේ චරිතය ද ඇගේ රංගන ජීවිතයේ හරස්කඩකි. එසේම 'සිරි මැදුර' හි ලීලා ද, 'සුරබිදෙන' සෝමා, 'ගුරු ගෙදර' විශාඛා, සෙයිලමේ සිරියා, රංගන සමකාලීන ලාංකික සමාජ සන්දර්භය තුළ නිර්මිත ස්ත්‍රීත්වයේ විවිධ පැතිකඩයන් බවත්, සමාජයක් තුළ ස්ත්‍රිය උග්‍ර ආර්ථික ලිංගික වැනි අනේක විධ සූරාකෑම් වලට, පුරුෂාධිපත්‍යයක බල රටාව විසින් අනාවරණ පීඩනයට හා අවමානයටත් භාජනය කර ඇති බව විචාරක පියල් සෝමරත්න කියා ඇත.

'කෙළි මඬල' චිත්‍රපටයේ රූපගත කිරීමක් සඳහා 1989 ජේ.වී.පී. කැරැල්ල උත්සන්නව තිබූ බව අනෝජා කීවාය.

"ඒ අස්සේ ඇඳිරි නීතිය, නිෂ්පාදක හැටියට මගේ සූට් කේස් එක ඇතුළේ නිෂ්පාදනයට අවශ්‍ය සල්ලි තිබුණේ. චිත්‍රපටයට අවශ්‍ය සෝමදාස මල්දෙණියගේ පොලිස් නිල ඇඳුම් හා නිල ඇඳුම් හා බොරු තුවක්කුත් ඒ අතරේ තිබුණා. හිටි ගමන් රෑ කිතුල්ගල තානායමේ කෑම ගනිමින් ඉන්න කොට තුවක්කු අරන් ජේ.වී.පී. සහෝදරයන් සමූහයක් ආවා. නිහාල් අයිය (නිහාල්සිංහ) මෙය සත පහකටවත් මායිම් නොකර කෑම කනවා. මං ඔවුන්ට පැහැදිලි කළා. තුවක්කු ගැන ඔවුන් ඇහුවා.

මේවා චිත්‍රපටයට ගෙනාපුව. ලී වලින් හදල පේන්ට් කරපු බොරු තුවක්කු කියලා. නමුත් ඔවුන්ට ඒවා බලන්න අවශ්‍ය වුණා. "මේ කාමරවල ඉන්නේ කවුද?" ඔවුන් ඇසුවා. "නළු නිළියෝ." එයාලා දැන් නිදාගෙන ඉන්නේ. ඇහැරවන්න බැහැ." කී විට ඔවුන්ට ඒවා පරීක්ෂා කරන්න අවශ්‍ය වුණා. ඔවුන් අපිව උඩු මහලට අඬගහගෙන ගිහිල්ලා දේශනයක් පැවැත්වූවා.

අපි කට ඇරගෙන අහන් හිටියා. හැබැයි ඔවුන් සල්ලි, රත්තරන් බඩු කිසිවක් ගත්තේ නැහැ. පසුව යන්න ගියා. නිහාල් අයියා කිසිදේකට කලබල වුණේ නැහැ. මේ අවස්ථාව මට කිසිදාක අමතක වන්නේ නෑ."

අනෝජාට ඕස්ට්‍රේලියානු ජාතික පොල් කොක්ස් අධ්‍යක්ෂවරයාගේ "අයිලන්ඩ්" (Island)හි ප්‍රධාන චරිතය රඟපෑමට ලැබීම ඇගේ ජීවිතයේ සුවිශේෂ අවස්ථාවක් ලෙස සලකන්නිය. එපමණක් නොව ඇය Raththathin Rath thame (ඉන්දියා - ශ්‍රී ලංකා සම නිෂ්පාදනය) Hum se na Takrana - Agartumnahote, Suraj Bhi Tamasha, Miss Lanka, Naadani, Do Haath වැනි පකිස්තානු උර්දු චිත්‍රපටවල ද රඟපෑවාය.

එපමණක් නොව ඇය උත්සාහයෙන් ගොඩ නඟා ගත් තම රංගනය ප්‍රතිභාව ප්‍රගුණ කරනු සඳහා බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර Lamda (London Academy of Music and Dramatic Art) ආයතනයට බැඳී සංගීතය, රංගනය, හඬ පාලනය හැදෑරුවාය. ඇගේ උපදේශිකාව වූ සුවෙස්ටන් මෙරටට ගෙන්වා අවසෙස් රංගන ශිල්පි ශිල්පිනින් දැනුවත් කිරීමට උත්සුක වූවාය. ඇය බෙල්ලන්විල රජමහා විහාර යාබද විහාරස්ථානයට අයත් ඉඩමේ "අභින ප්‍රාසාංගික කලා අධ්‍යයන ආයතනය" අරඹා තරුණ පරපුරට තම ලත් ඥානය, දැනුම, පරිචය බෙදා දෙන්නිය.

මානසික උපදේශිකාව

අනෝජා දැන් උත්සව හා ප්‍රසිද්ධ ස්ථානවල දකින්නට නොලැබෙයි. තමා දැන් අනුනට දැනුම ලබා දෙමින් ද, තම දියණිය ඩිලිකිගේත් සමීන් බෑණනුවන්ගේ දරුවන්ගේ ආදරය ලබමින් නිස්කාන්සු ජීවිතයක් ගත කරන්නිය. තරුණ පරපුරේ බොහොමයකට ඇතිවන ජීවන ගැටලු, මානසික ආතතියට උපදෙස් දෙමින් ඔවුන්ට සහන ලබා දෙන උපදේශිකාවක් ද වන්නිය.

මීට වසර කිහිපයකට ඉහත තම හද බැඳි කලාකරුවන්ගේ ග්‍රන්ථ දොරට වඩින උත්සවවලදී ඇය අදහස් දක්වමින් තමා ජීවිතයෙන් ලද කටුක අත්දැකීම පළ කර සිටියාය. ප්‍රීති රන්දෙනිය විසින් ලියන ලද 'කැටකිරිල්ලි' කෘතිය ගැන අදහස් දක්වන අවස්ථාවේ අනෝජා සංවේදි කතාවක් කළාය.

"මම හත් වතාවක් දිවි නසා ගැනීමට ගියා." අනෝජා කියන විට පැමිණ සිටි පිරිස ද ගල් ගැසී සිටියහ.

"මගේ දෙවන විවාහය අසාර්ථක වීමත් සමඟ ප්‍රශ්න කිහිපයකට මට මුහුණ දෙන්න සිදු වුණා. මේ ප්‍රශ්න වුණේ මම "ජුලියට්ගේ භූමිකාව" චිත්‍රපටයේ රඟපාන කාලෙ. මම වරෙක නිදි පෙති අහුරක්ම ගිල්ලා. මෙයට හේතුව ආතතිය, විශාදය, (depression) යන දේවල්. මට මතක් වුණා ඇන්ජලිනා ජොලි (Angelina Jolie) කියන ලෝකයේ විශිෂ්ට ශිල්පිනිය පිළිකා රෝගයෙන් පෙළුණ විට අභීතව ජීවිතයට මුහුණ දුන් ආකාරය. ඇය පිළිකා සැත්කමට අභීතව මුහුණ දුන්නා. මටත් හිතුණා ඇන්ජලිනා වගේ යකඩ ගැහැනියක් වගේ ජීවිතයට මුහුණ දෙන්න."

එතැන් සිට ඇය අභීතව ජීවිතයට මුහුණ දුන්නාය. මම ඉගෙන ගත් දේ ආබාධිත රණවිරුවන්ට, හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට, උතුරු නැගෙනහිර කුරිරු යුද්ධයෙන් පීඩාවට පත්, මානසික ආතතියෙන් පෙළෙන දරුවන්ට හා වැඩිහිටියන්ට මම යෝග පන්ති කළා. එපමණක් නෙවෙයි නෝර්වීජියානු තානාපති කාර්යාලයේ අනුග්‍රහය ඇතිව රජයේ පාසල්වල නාට්‍ය හා රංග කලාව, නිරූපණ කලාව ආශ්‍රිත පුහුණුව ලබා දුන්නා. එංගලන්තයේ දී ඉගෙන ගත් හැම දේම මගේ රටේ දරුවන්ට දායාදය කළා."

ඇය දැන් ජීවිතය දෙස උපේක්ෂාවෙන් බලන්නීය. නිස්කාන්සුවේ ජීවිතය ගැන භාවනා කරන්නීය. පින්බර බෙල්ලන්විල රජ මහ විහාරයෙන් ඇසෙන සිල් සුවඳ, හේවිසි හඬ, සසර දුක නැති කරන්න මාර්ගය හොයා ගැනීමට ඇය ඉදිරි කාලය කැප කරන්නීය.

පෙලඹවීමෙන් සිදු වන්නේ කුමක්ද?

● මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

'සන්නිවේදනාත්මක පෙලඹවීම අද සන්නිවේදන අධ්‍යයනයේ ප්‍රධාන පෙළේ සංකල්පයක් බවට පත් වී තිබෙනවා. ඉන් අදහස් කරන්නේ කෙනෙකු කියවන සන්දේශයකින් හෝ ඇහෙන් සන්දේශයකින් හෝ දැනෙන හා හිතෙන හෝ දකින සන්දේශයකින් කිසියම් ප්‍රමාණයක් පෙලඹවීමක් ඇති වීම යි. එය වටහා ගැනීමට භාවිතයට ගැනෙන යෙදුම හඳුන්වන්නේ සන්නිවේදනාත්මක පෙලඹවීම යනුවෙන්. ඉංග්‍රීසියෙන් ලියැවී තිබෙන්නේ පර්සුවේෂන් (persuasion) නැතිනම් මෝටිවේෂන් (motivation) යනුවෙන්. වෙනත් යෙදුම් වලිනුත් ඇතැම් විටෙක හඳුන්වන්නට බැරි නැහැ.'

'අපූරු සිත් ඇද බැඳගන්නා කවියක් හෝ කතාවක් කියවන කෙනෙකුට ඒ කවියේ හෝ කතාවේ හරය හා රසය ඉක්මවා කසියම් මානසික පෙලඹවීමක් ඇති වෙන බව වචන වලින් පැවසීම අපහසුයි.

ඒ නිසා එය හඳුන්වන්නේ කෙනෙකු තුළ ඇති වන පිබිදීමක් (awakening) ලෙස ය. මේ පිබිදීම හුදු උත්තේජනයක් ද? උත්තේජනයක් : (stimulus) සමඟ හෝ එම උත්තේජනයේ ප්‍රතිඵලයක් හෝ අතුරු ඵලයක් ලෙස අත්පත් වන මානසික ප්‍රතිචාරයක් (response) මේ නිසා පෙලඹවීම එක්තරා පිබිදීමක් වශයෙන් සලකන්නට බාධාවක් නැහැ.'

'ඒ වාගේම තමයි අපට මධුර ස්වරයෙන් ඇසෙන ගීතයක්. ගීතයක පද වලට අතිරේක උපතක් ලබා දී එය හුදු පදමාලාව ඉක්මවූ නාද මාලාවක් වීමෙන් ශ්‍රාවකයාට (listener) අත්පත් වන්නේ හුදු නාදා මාලාවක් නොවේ. එසේ නම් එය කුමක්ද?'

එය වදනින් විස්තර කළ නොහැකි අභ්‍යන්තර පෙලඹවීමක් ලෙස සැලිය නොහැකි ද? මේ තත්වය ගීතයකට පමණක් සීමා කිරීම අපහසු යි. අප ප්‍රිය කරන කතින් ඇසෙන වෙනත් සන්දේශ රැසක් ඇති බව අමතක නොකළ යුතු යි.

හිත් ඇද බැඳගන්නා කනට ඇසෙන් දේශනයකින්, කතන්දරයකින් ඒ ටික සිදු වෙනවා.

'මේ කියන පෙලඹවීම අපේ ඉඳුරන් මඟින් අපට අත්පත් කර දෙන්නේ අපේ චර්යාවන් (behaviour) තිබූ තත්වයෙන් වෙනස් කරවීමක් බව අපට මතුපිටින් වටහා ගන්න බැරි වෙනවා.

ඒත් නොදැනීම හෝ අපේ චර්යාව වෙනස් වෙන බවක් අපට දැනෙනවා. ඇතැමුන්ට තම චර්යාවන් වෙනස් කරගැනීමට හේතුකාරක වන්නේ තමන්ගේ ගුරු හෝ දෙගුරු ඇසුර වෙන්නට පුළුවන්. පාසැලේදී හෝ විශ්වවිද්‍යාලයේ දි හෝ වෙනත් විද්‍යා පීඨයකදී හෝ තමන් ඇසුර ලබන්නේ ගුරුවරුන්ගේ. ඔවුන් කරන කියන දේවල් වලින් බලපෑමක් ඇති වෙනවා. එය ගුරු ඇසුරේ ප්‍රතිඵලයක්.'

'අනිත් අතට තම නිවසට පැමිණි විට දෙගුරු ඇසුර ලැබෙනවා. අම්මලා, තාත්තල, කරන කියන දේවල් වෙනත් අයුරකින් බලපානවා. එමගිනුත් කිසියම් පෙලඹවීමක් ඇති වෙනාව.

මේ පෙලඹවීමත් විටෙක වදනින් ප්‍රකාශ කිරීම අපහසු යි. මේ නිසා ඒ සාධක දෙකම සැලකිය යුතු වන්නේ සන්නිවේදනාත්මක පෙලඹීම් (persuasion through communication) යන දෙසුමෙන්. මේ සාධක දෙකත් තවත් වෙනස් ආකාරයකින් වුවද වෙනස් වන්නට බැරි නැහැ. තමන් රැකියාවේ නියුතු තැන් වලින්. තමන්ට නිතර නිතර හමු වන පුද්ගලයන්ගෙන් මේ වෙනස්කම් සිදු වන්නට පුළුවන් බවත් වටහා ගත යුතු යි.

'ගුරුන්ගෙන් ඇසෙන දේ
කෙරෙහි සිත් යොමු කරන සිසුන් ඇතුළත් පෙලඹුමක්
ඇති කෙරේ.
වෙදුන්ගෙන් ඇසෙන දේ
ගිලනුන්ට යොමු කෙරේ.
එයත් ගිලනුන් සිතේ
පෙලඹුමක් ඇති කෙරේ.
ගිලන්ගත නොවී ගිය සමාජය බිහි කෙරේ.
සිත්තරුන් අඳින දේ
රසික සිත් ඇද බැඳේ.
රූපණය, ගායනය රසික සිත් මත් කෙරේ.
ආගමට, ධර්මයට, භක්තියට, නැමුණු සිත
යහපතට පෙලඹීම ඉගැන්වේ සදාතන.'

'මේ නිසා සන්නිවේදනාත්මක පෙලඹවීම විටෙක යහබත් ය. විටෙක අයහපත් ය.

එහෙත් පෙලඹවීමකින් තොරව සන්නිවේදනයක් නොපවතින බව ද වටහා ගත යුතු ය.'

මත ගැටෙන තැන

පිටුව 28

කොවිඩ් 19 පාලනය ගැන විද්වතුන් කියන මත

වසර ගණන් හීන බලා පොත් ලියන ලේඛකයෙක්

පිටුව 29

නිවන් දක්නා ජාති දක්වා කවියම පතන 'කුමාරයෙක්'

පිටුව 30

'මුක්ති' ලියූ මහාචාර්ය බාලේ කියන දේශපාලන කතාව

පිටුව 32

● සටහන හා ඡායාරූප-
ඔස්වල්ඩ් ගොඩකුඹුර, රඹුක්කන විශේෂ

පින්නවල අලි අනාථාගාරය ආරම්භ කර ඉකුත් 16 වැනි දිනට වසර 46ක් සැපිරිණි. ගතවූ වසර හතළිස් හයක කාලය තුළ එය දේශීය මෙන්ම විදේශීය සංචාරකයන්ගේද ආකර්ෂණය දැඩි ලෙසින් දිනා ගත් සංචාරක මධ්‍යස්ථානයක් බවට එය පත්ව ඇත.

මෙම අලි අනාථාගාරය 1975 පෙබරවාරි මස 16 වැනි දින ආරම්භ වූයේ එවකට නාවික හා සංචාරක ඇමැතිවරයාව සිටි දිවංගත පී.බී.ජී. කලුගල්ලගේ අදහසකට අනුවය.මේ වන විට පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන් අසූ හය දෙනෙක් (86) සිටිති. අලි අභිජනන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ මෙහිදී අලි පැටවුන් හැත්තෑවකට වඩා උපත ලබා තිබීමද විශේෂත්වයකි.

අලි රැලෙන් අතරමංව වනයේ තනිවූ අලි පැටවුන් වෙනුවෙන් අනාථාගාරයක් ලෙස 1975 වර්ෂයේදී ආරම්භ වූ පින්නවල අලි අනාථාගාරයට 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අධිකරණ නියෝග මත අලින් 19 දෙනකු බාර දී තිබේ.

එම අලින්ගෙන් 17දෙනකු මේ වන විටත් පින්නවල අලි අනාථාගාරයේ රඳවා සිටිති. අත්තනගල්ල, කඩුවෙල, කොළඹ, කැස්බෑව, මාතලේ, රත්නපුර හා දඹුල්ල අධිකරණ බල ප්‍රදේශවලින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගෙන 'යහපාලන' ආණ්ඩු කාලයේ අධිකරණයට ඉදිරිපත් කළ අලි ඇතුන් මෙලෙස ගෙන ආ බව කියති.

පින්නවල අලි අනාථාගාරය

'අලි නඩු' නිසා පින්නවල අලි ඵරමර

අධිකරණ නියෝග මත ගෙන ආ අලි කිහිප දෙනෙක්

මාඔයෙන් දිය නා එන අලි

> අධිකරණ නියෝගයකින් පින්නවල අලි අනාථාගාරයට ලබාදුන් නඩු වැටුණු අලින් නිසා මේ සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමුකර කටයුතු කරනවා. මේ එක් අලියෙක් වෙනුවෙන් සමහර අවස්ථාවල ඇත්ගොව්වන් තුන් හතර දෙනෙක් යොදවන්නත් සිදුවෙනවා. අලින්ට තුවාල නොවෙන්න රැකබලාගැනීම අපිට තිබෙන විශාල වගකීමක්. අලි අතර තරමක් සැර අලිත් ඉන්නවා. ඔවුන් අනෙක් අලින්ට ගහන්නත් පුළුවන්. ඒ වගේම අනෙක් අලින්ගෙන් මේ අලින්ට අනතුරක් වෙන්නත් පුළුවන්. ඒ තත්වයන් වළක්වා ගන්න අපි දිවා රාත්‍රී විශේෂ අවධානයකින් කටයුතු කරනවා.

අලි බලා ගැනීමේ වගකීම

අත්අඩංගුවට ගන්නා අලි ඇතුන් වෙනුවෙන් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව හීලෑ අලි ඇතුන් බලාගන්නා පළපුරුද්ද නොමැතිවීමත්, අවශ්‍ය ඇත්ගොව්වන් නොමැතිවීමත් මෙම අලි රඳවා තබාගැනීමට සුදුසු ස්ථාන හා පහසුකම් නොමැතිවීමත් මත මෙම අලි, නඩුව අවසන් වනතුරු රැකබලා ගැනීමේ වගකීම ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අධිකරණය මඟින් පවරා ඇත. ඒ අනුව අලින් සඳහා ස්වභාවික පරිසරයක සැකසුණු පහසුකම් මෙන්ම හීලෑ අලි බලන්නන් සිටින පින්නවල අලි අනාථාගාරයට මෙම අලි රැකබලා ගැනීමේ වගකීම අධිකරණයෙන් පැවරී ඇතැයි පැවසේ.

ඒ අනුව 2014 වසරේ අප්‍රේල් මාසයේදී 'මිහිල' නමැති අලියා මෙලෙස ප්‍රථමයෙන්ම පින්නවලට ගෙනැවිත් ඇත. ඉන් අනතුරුව 2015 වසරේ පෙබරවාරි මාසයේදී 'කණ්ඩුල' හා 'කදිරා' ද, එම වසරේම අප්‍රේල් මාසයේදී 'චූටි මැණිකේ' කෙනරද, මැයි මාසයේදී 'චූටි මහත්තයා', 'වස්තු' හා 'සාලිය'ද, අගෝස්තු මාසයේදී 'සුද්දි' හා 'සිඟිති' ද, ඔක්තෝබර් මාසයේදී 'සහයෝග' හා 'චිලිමා 'ද, දෙසැම්බර් මාසයේදී 'පාරමී' හා 'සුදුමැණිකේ'ද ලෙසින් 2015 වසර තුළ අලින් 13 දෙනකු පින්නවලට ගෙනවිත් ඇත. 2016 වසරේදී තවත් අලින් තුන් දෙනකු පින්නවලට අධිකරණ නියෝග මත ගෙනවිත් ඇති අතර, ඒ මැයි මාසයේදී 'සීදේවී',හා ජූලි මාසයේදී 'සමාධි' හා 'සුමන' ලෙසිනි.

අධිකරණයෙන් මෙම අලි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව භරහා පින්නවල අලි අනාථාගාරයට ලබාදෙන විට ඔවුන්ගේ සියලු තොරතුරු ඇතුළත් 'චිප්' එකක් බැඟින් එක් එක් අලියාගේ කන්පෙත්තේ සවිකර ඇත. ඊට අමතරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මෙම අලින්ට ලියාපදිංචි අංකයක්ද ලබා දී තිබේ.ඒ අනුව කදිරා - 147, සාලිය - 148, චූටි මැණිකේ - 163, චිලිමා - 164, සහයෝග - 202, සීදේවී - 203, සංඛ -207, සුද්දි - 209, වස්තු - 230, පාරමී - 332. සමාධි - 333, චූටි මහත්තයා - 334, සුදු මැණිකේ - 335, සිඟිති -350 හා සුමන - 347 යනාදී පරිද්දෙනි.

වයස අවුරුදු 4 සිට අවුරුදු 36 දක්වා අලින් 2014, 2015 හා 2016 වසර තුන තුළ අධිකරණයෙන් පින්නවල අලි අනාථාගාරයට යොමුකර ඇත. මෙලෙස මෙම අලි, අධිකරණ නියෝග මත ලබාදී ඇති අලි බැවින් මෙම අලි රැකබලා ගැනීම පින්නවල අලි අනාථාගාරයේ වගකීමක් බවට නිරායාසයෙන්ම පත්ව ඇත. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන පින්නවල අලි අනාථාගාරයේ පාලක (සත්ව) ප්‍රධානී සංජය රත්නායක මෙසේ පැවසීය. 'අධිකරණ නියෝගයකින් පින්නවල අලි අනාථාගාරයට ලබාදුන් අලින් නිසා මේ සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමුකර කටයුතු කරනවා.

මේ එක් අලියෙක් වෙනුවෙන් සමහර අවස්ථාවල ඇත්ගොව්වන් තුන් හතර දෙනෙක් යොදවන්නත් සිදුවෙනවා. අලින්ට තුවාල නොවෙන්න රැකබලාගැනීම අපිට තිබෙන විශාල වගකීමක්.

අලි අතර තරමක් සැර අලිත් ඉන්නවා. ඔවුන් අනෙක් අලින්ට ගහන්නත් පුළුවන්. ඒ වගේම අනෙක් අලින්ගෙන් මේ අලින්ට අනතුරක් වෙන්නත් පුළුවන්. ඒ තත්වයන් වළක්වා ගන්න අපි දිවා රාත්‍රී විශේෂ අවධානයකින් කටයුතු කරනවා.' පින්නවල අලි අනාථාගාරයට 2019 හා 2020 වසරවල ප්‍රවේශපත්‍රවලින් ලැබූ ආදායම හා මෙම අලි රැකබලාගැනීම සම්බන්ධයෙන් දරන්නට වන වියදම පිළිබඳ අප කළ විමසුමට පිළිතුරු දුන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ මිහිරාන් මැදවල මෙසේ පැවසුවේය.

2019 ආදායම මිලියන 436

'පින්නවල අලි අනාථාගාරය 2019 වර්ෂයේදී දේශීය සංචාරකයන්ගෙන් රුපියල් මිලියන තිස් නවයකට අධික ආදායමක් හා විදේශීය සංචාරකයන්ගෙන් මිලියන හාරසිය තිස් හයකට අධික ආදායමක් ලැබුවා. 2020 වර්ෂයේදී කොරෝනා වසංගත තත්ත්වය මත එම ආදායම පහළ ගියා. කෙසේ වෙතත් 2020 වර්ෂයේදී දේශීය සංචාරකයන්ගෙන් රුපියල් මිලියන එකොළහකට අධික මුදලක් හා විදේශීය සංචාරකයන්ගෙන් රුපියල් මිලියන එකසිය දෙකකට අධික මුදලක් අප උපයාගෙන තිබෙනවා.

නඩුවලට සම්බන්ධ අලින් වෙනුවෙන් වන වියදම අපට කියන්න බැහැ. සාමාන්‍යයෙන් අලියකුට දිනකට රුපියල් හය දහසත්, පහළොස් දහසත් අතර මුදලක් වැයවෙනවා. දළ වශයෙන් දිනක වියදම රුපියල් එකොළොස් දහස් පන්සියයක් පමණ ලෙසින් දැක්විය හැකියි. අලින් නඩු අලිද, අපේ අලිද කියලා බලන්න තරම් ලොකු අවශ්‍යතාවයක් නැහැ. මේ අපේ සම්පත්.අපේ රටේ සම්පත්.' අලි අනාථාගාරයේ අලින් සඳහා දිනක වියදම අලියාගේ වයස, හීලෑ බව හෝ සැරපරුෂ බව, සෞඛ්‍ය තත්ත්වය වැනි කරුණු මත වෙනස් වන්නකි. සැරපරුෂ අලියකු සඳහා ඇත්ගොව්වන් තුන් හතර දෙනකු යෙදවීමේදී ඒ වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදුවේ. එසේම අලියකු රෝගී වීමේදී ලබාදෙන පලතුරු, විටමින්, බෙහෙත් වැනි ද්‍රව්‍ය සඳහා අමතර මුදලක් දැරීමට සිදුවේ.

සැර අලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේදී පශු වෛද්‍යවරුන්ට හා සේවකයන්ට විශේෂ අවධානයකින් කටයුතු කිරීමට සිදුවේ. ඔවුන් බොහෝ විට කෑමට දෙන ද්‍රව්‍යවලින් පවා පහරදීමෙන් ඇත් ගොව්වන් තුවාල ලැබූ අවස්ථා රැසකි. අධිකරණ නියෝග මත පින්නවලට ගෙන එන ලද 'සාලිය' නමැති අලියා පහරදීමෙන් එහි අලි බලන්නෙකු මාස දෙකකට අධික කාලයක් රෝහල්ගතව ප්‍රතිකාර ලබා ඇත. අධිකරණ නියෝග මත පින්නවල අලි අනාථාගාරයට ගෙන එන ලද පිරිමි අලි හැමෝම සැර අලින් යැයි පැවසෙන අතර, 'සීදේවී' නමැති කෙනර එහි ගෙන ඒමට පෙර ඇත්ගොව්වා මරා දැමූ ඇතින්නක බවද පැවසේ. මේ අතර, අලින් සම්බන්ධ නඩු කටයුතු දිනෙන් දින ප්‍රමාදවීමෙන් පින්නවල අලි අනාථාගාරයට තවදුරටත් අමතර වගකීමක් දැරීමට සිදුව ඇති බව පිරිසක් පෙන්වා දෙති.

අලියකුගේ දත්ත පරීක්ෂා කරන අයුරු

අලියන් චිප්එක මඟින් හඳුනා ගනිමින්

අලි නඩු නිසා කරදර ගොඩක්

අක්කර විසිපහක භූමියක් පුරා විහිදුණු පින්නවල අලි අනාථාගාරය අලින් සඳහා ප්‍රමාණවත් වුවද, බාහිරින් රැගෙන ආ අලින් නිසා අලි අනාථාගාරයේ අලින්ගේ ඉඩකඩ සීමාවී ඇති බව එම පිරිස් පවසති. විශේෂයෙන්ම නඩු භාණ්ඩ ලෙසින් ගෙන එන ලද මෙම අලින් සෙවණේ රඳවා තැබීමට අලි මඩු භාවිතා කෙරෙන බැවින් පින්නවල අලින්ට සිදුව ඇත්තේ එම ආගන්තුක අලින්ට ඉඩකඩ ලබාදී එළිමහනේ අව්වට වැස්සට නිරාවරණය වෙමින් රැඳී සිටීමට බව ඔවුහු කියති. අලි අනාථාගාරයේ මෙම අඩු පහසුකම් මත අලින් රැඳිසිටීමෙන් පසුගිය වසර ගණනාවක් තුළ අනාථාගාරයේ කෙනරක විසින් පැටවකු බිහි නොකිරීමද අවධානය යොමුවිය යුතු කරුණක් බව මෙම පිරිස් පෙන්වා දෙති.

එසේම අලින්ට අදාළ නඩු කවදා හෝ නිමාවන තුරු එම අලි නිරෝගීව තබාගැනීම සඳහා විටමින්, පලතුරු, බෙහෙත් යනාදිය වෙනුවෙන් අමතර මුදලක් වැයකිරීමටද අලි අනාථාගාරයට සිදුව ඇති බව බැවින් නඩු තීන්දුවකින් මෙම අලි අයිතිකරුවන්ට නැවත භාරදීමට තීරණය වන්නේ නම් ඔවුන් මෙතෙක් නඩත්තු කිරීම සඳහා රජයෙන් වැයකළ මුදල් එම අයගෙන් යළි අයකරගැනීමට කටයුතු කළ යුතු බවද ඔවුහු අවධාරණය කරති.

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි.
ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ඡායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න.
සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි.
සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ.
සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

කරවල හා උම්බලකඩ නිෂ්පාදකයන්ට අත හිත

● චන්දිමා එදිරිමාන්න

සෑම පැත්තකින්ම වටවුණු ඉතා සරුසාර මත්ස්‍ය අස්වැන්නක් ඇති සාගර කලාපයක් තිබුණත්; අපේ රටේ ජනතාවට අවශ්‍ය නිසි සැපයුම ලබා දෙන්නට තවමත් මෙරට ධීවර ජනතාවට නොහැකි වී තිබේ. කරවල වලට මෙරට ජනතාව අතර විශාල ඉල්ලුමක් තිබුණත්; මෙරට අලෙවි වන කරවල නිෂ්පාදන අතරින් 65 % කටත් වඩා ඇත්තේ ආනයනික කරවලයි.

බහුදින ධීවර යාත්‍රා උපයෝගී කර ගනිමින් ධීවර කර්මාන්තයේ නිරත වන බේරුවල, මීගමුව, හලාවත ආදී ප්‍රදේශවල ධීවරයන් බොහෝ විට මාස දෙක තුනක් නැවුම් මත්ස්‍ය අස්වැන්න නෙළමින් මුහුදේ ගත කරයි.

මෙම බෝට්ටු කරවල වලට අමතරව කරවල නිෂ්පාදනය සාමාන්‍යයෙන් සිදු කෙරෙන්නේ එම කරවල නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ධීවරයන් විසින් මහ මුහුදේදී නෙළා ගත් මත්ස්‍ය විශේෂ ලුණු දමා තම්බා අව්වේ වියළා ගැනීමෙනි.

කෙසේ වුවත් පසුගිය කාලය පුරා මෙරට කරවල, උම්බලකඩ හා වියළි හාල්මැස්සන් නිෂ්පාදනයේ ප්‍රමිතිය පිළිබඳව පාරිභෝගික ජනතාව අතරින් චෝදනා එල්ල වූ අතර ඇතැම් පාරිභෝගිකයන් ආනයනික නිෂ්පාදන සඳහා වැඩි වශයෙන් නැඹුරු වන ආකාරයක්ද දක්නට ලැබුණි. එම තත්ත්වය හමුවේ මෙරට කරවල, උම්බලකඩ හා වියළි හාල්මැස්සන් නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයට බරපතළ උවදුරු හා අපල උපද්‍රව ඇති වුණු අතර බොහොමයක් ධීවරයන් එම කර්මාන්තයෙන් ඈත් වෙන තරමටම වැඩ කටයුතු සිදු විය.

මේ තත්ත්වය හමුවේ මෙම සුවිශේෂී කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා වත්මන් රජය සුවිශේෂී වැඩසටහන් කිපයක්ම ආරම්භ කරන ලදී. ඒ අනුව ප්‍රමිතිය, ගුණාත්මකභාවය සහ සෞඛ්‍ය ආරක්ෂිතව කරවල, උම්බලකඩ සහ දුම් කරවල (smoked fish) නිෂ්පාදනය මෙරට තුළ සිදු කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ආරම්භ කර ඇත. විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය කංචන විජේසේකරගේ උපදෙස් පරිදි නාරා ආයතනයේ මුලිකත්වයෙන් දෙවුන්දර ප්‍රදේශය මුල්කරගනිමින් ආරම්භ කරන ලද එකී වැඩපිළිවළ නාරා ආයතනය විසින් මේ වන විටත් ක්‍රියාත්මක කරමින් සිටී. එහි එක් අංගයක් ලෙස නියමිත ප්‍රමිතියකින් උම්බලකඩ - කරවල නිෂ්පාදනය කිරීමට අවශ්‍ය විද්‍යාත්මක දැනුම හා තාක්ෂණික දැනුම ව්‍යවසායකයන් වෙත ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය විය. තවද සුළු හා මධ්‍යම මෙන්ම මහාපරිමාණ ව්‍යවසායකයන් වශයෙන් හඳුනා ගනිමින් ඔවුනට අවශ්‍ය මූල්‍ය ආධාර ලබාදීම සඳහා ලෝක බැංකුවේ කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතියද කටයුතු යොදා ඇති අතර; සමුපකාර

ධීවර සමිති වශයෙන් ලියාපදිංචි වී ඇති ව්‍යවසායකයන් හඳුනා ගනිමින් ඔවුනට අවශ්‍ය ණය ආධාර ලබාදීම සඳහා සමුපකාර දෙපාර්තමේන්තුවද පියවර ගෙන තිබේ.

එසේම දේශීය කරවල හා උම්බලකඩ නිෂ්පාදන දිරිගැන්වීම අරමුණු කර ගනිමින්ම පසුගිය කාලයේදී ආනයනික කරවල හා උම්බලකඩ, කරවල සඳහා අය කෙරුණු ආනයනික බද්ද රුපියල් 52 සිට රුපියල් 127 දක්වා රුපියල් 75කින් ඉහළ දැමීමටද පියවර ගැනුණු අතර ආනයනික මාළු සඳහා වූ රුපියල් 150 බද්ද රුපියල් 200 දක්වා රුපියල් 50කින් ඉහළ දැමීමටත් උම්බලකඩ ආනයනයේදී පනවා තිබූ රුපියල් 102ක බදු මුදල රුපියල් 302 දක්වා රුපියල් 200කින් ඉහළ දැමීමටද පියවර ගැනුණි.

මේ වන විට මෙරට කරවල හා උම්බලකඩ නිෂ්පාදකයන් මුහුණ දී තිබෙන ගැටලු හා එම ව්‍යාපාරයේ වත්මන් තත්ත්වය පිළිබඳව මීගමුව සින්දාත්‍රි මාතා කරවල සමිතියේ සභාපති පී.එම්.එම් අප්පුහාමි "සිළුමිණ" සමඟ මෙසේ අදහස් දක්වන ලදී.

බල,කට්ටා,කෙලවල්ලා, මුහුදු කුකුළා,හාල්මැස්සා වැනි කරවල වර්ග අපේ ධීවරයින් තොග වශයෙන් වෙළෙඳපොළ වෙත ලබා දෙනවා.ඒ තලපත් කිලෝව 1100,බල 450-500, මුහුදු කුකුලා 500 හා හාල්මැස්සන් 550 ආදී මිල ගණන් වලට අනුවයි. ඒත් තවමත් ආනයනික නිෂ්පාදන අපගේ කර්මාන්තයට ඉතා බරපතළ ලෙස පහර දෙමින් තිබෙනවා. උදාහරණයක් ලෙස දේශීයව නිෂ්පාදනය කෙරෙන වියළි හාල් මැස්සන් කිලෝව අපි වෙළෙඳපොළ වෙත කිලෝව රු.550/- වැනි මිල ගණනකට ලබා දෙන විට ආනයනික වියළි හාල්මැස්සන් කිලෝව වෙළෙඳපොළ වෙත ලැබෙන්නේ කිලෝව රු.350/-ක් වැනි මිලකටයි. එය එසේ වන විට පාරිභෝගිකයන් නිරායාසයෙන්ම ආනයනික නිෂ්පාදන වෙත පෙලඹීම සිදු වෙනවා.

පාරිභෝගිකයා කරවල,හාල්මැස්සන්,උම්බලකඩ රසවත් ලෙස ආහාරයට ගත්තත් අපගේ නිෂ්පාදන ක්‍රියාවලිය ඉතාම සංකීර්ණ කටයුත්තක්. අපි ඉතා වෙහෙසවී එම කටයුත්තේ නිරත වෙනවා. ධීවරයන් දියඹට ගොස් අල්ලා ගෙන එන මත්ස්‍ය අස්වැන්න යොදා ගෙන අපගේ ධීවරයන් ඉතා මහන්සියෙන් කරවල, හාල්මැස්සන් හා උම්බලකඩ නිෂ්පාදන සිදු කරනවා. ඒ සඳහා ගිනි ගහන අව්වේ දවස් ගණන් ගත කරනවා. ඒ නිසා මෙම කර්මාන්තයේ නිරතවන ධීවරයන් හා නිෂ්පාදකයන් පිළිබඳව රජය හා බලධාරීන් මීටත් වඩා අවධානය යොමු කළ යුතුයි. පුද්ගලික බැංකු හා මූල්‍ය ආයතන වලින් අප ධීවරයන් හා නිෂ්පාදකයන්ට ණය ලබා දුන්නත් රාජ්‍ය බැංකුවලින් කිසිදු අනුග්‍රහයක් කරවල වෙළෙඳුන්ට මේ දක්වාම හිමි වී නොමැති බවත් කනගාටුවෙන් වුවත් සඳහන් කළ යුතු වෙනවා.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පාරිභෝගිකයන්ට වෝග් ජුවෙලර්ස් ප්‍රතිලාභ



ශ්‍රී ලංකාඉන්ෂුවරන්ස් මෝටර් Ladies Only පාරිභෝගිකයන් සඳහා සුවිශේෂී ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් ලොයල්ටි රිවෝර්ඩ්ස් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ස්වර්ණාභරණ ආයතනයක් වන වෝග් ජුවෙලර්ස් සමඟ එක්වූ අතර මෝටර් ප්ලස් පූර්ණ රක්ෂණ ආවරණ හිමිපාරිභෝගිකයන් විසින් සිදුකරනු ලබන රු. 100,000/- ට වඩා වැඩි ස්වර්ණාභරණ මිලදී ගැනීම් සඳහා 10% ක වට්ටමක් හිමිවෙනු ඇත. මෙම දීමනාව 2021 මාර්තු 30 වනදින දක්වා වලංගු අතර පූර්ණ රක්ෂණ කාඩ්පත සහ තැගී වවුචරය ඕනෑම වෝග් ශාඛාවක් වෙත ඉදිරිපත් කිරීමෙන් මෙම දීමනාව ලබාගැනීමේ හැකියාව තිබේ. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් Ladies Only ශ්‍රී ලංකාවේ කාන්තාවන් සඳහා විශේෂ ප්‍රතිලාභ සහිතව හඳුන්වා දුන් ප්‍රථම සුවිශේෂී මෝටර් රථ රක්ෂණයක් වන අතර අනතුරකදී සවස 6 සිට පසුදින උදෑසන 6 දක්වා Call & Move පැය 24 පුරාක්‍රියාත්මකයි.

AIA ඉන්ෂුවරන්ස් 8 වැනිවරටත් GPTW වෙතින් ඇගයීමට

AIA ඉන්ෂුවරන්ස් 8 වැනි වතාවටත් මෙරට රැකියාව කිරීමට හොඳම සේවා ස්ථානයක් ලෙස GPTW® වෙතින් ඇගයීමට පාත්‍ර වූ අතර කාන්තාවන්හට රැකියාව කිරීමට හොඳම සේවා ස්ථානයක් ලෙසද අඛණ්ඩව 3 වැනි වසරටත් ඇගයේ!

AIA ඉන්ෂුවරන්ස් අඛණ්ඩව 8 වන වතාවටත් මෙරට රැකියාව කිරීමට හොඳම සේවා ස්ථානයක් ලෙස GPTW® වෙතින් ඇගයීමට පාත්‍රවීම මහත් අභිමානයෙන් සමරයි. එමෙන්ම කාන්තාවන්හට රැකියාව කිරීමට හොඳම සේවා ස්ථානයක් ලෙසද අඛණ්ඩව තෙවන වසරටත් AIA ඇගයීමට ලක්වී ඇත.

2020 වසර සඳහා සිදුකරන ලද Great Place to Work® Trust Index© සමීක්ෂණය සහ Culture Audit© ප්‍රශ්නාවලිය සඳහා මෙරට සමාගම් අතරින් ඉහළ ලකුණු ලබාගනිමින් AIA ඉන්ෂුවරන්ස්, මෙම ජාත්‍යන්තර සම්මානයට හිමිකම් කියන්නට සමත් විය.

AIA ඉන්ෂුවරන්ස් හී මානව සම්පත් අධ්‍යක්ෂිකා තුෂාරි පෙරේරා සිය අදහස් දක්වමින් "මෙම සම්මානයට නොකඩවා හිමිකම් කීමට හැකිවීම මගින් අප සමාගම, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඇති කැපවීම මැනවින් පිළිබිඹු වෙනවා. ජනතාවට සුවපත්, සැපවත්, දිගුකල් ජීවිත ගත කිරීමට සහාය වීමේ අපගේ සන්නාම ප්‍රතිඥාව හා බැඳෙමින් අපගේ සේවක මණ්ඩලයේ සෞඛ්‍ය, සතුට සහ සුභසිද්ධිය ප්‍රමුඛත්වයේලා ක්‍රියා කිරීමට අප සැමවිටම උත්සාහ ගන්නවා.

රැකියාව කිරීම සඳහා විශේෂකොට සැලකෙන, විශිෂ්ට සේවායෝජක සමාගමක් බවට AIA තේරී පත්වීමට හේතුව මෙයයි"

පෞද්ගලික අංශය සවිබල ගැන්වීම SLT- MOBITEL, 'mPower' හඳුන්වා දෙයි

ශ්‍රී ලංකාවේ ජාතික තොරතුරු සන්නිවේදන තාක්ෂණ හා ජංගම දුරකථන ජාලය වන SLT-MOBITEL, මෙරට ප්‍රථම වරට පෞද්ගලික අංශය වෙනුවෙන් සැකසූ සුවිශේෂීප mPower දුරකථන දීමනාව ජාතික නිදහස් දිනයට සමගාමීව එළිදැක්වීම පසුගියදා සිදුවිය.

SLT-MOBITEL විසින් වසර කිහිපයකට පෙර රාජ්‍යසේවකයන් වෙනුවෙන් හඳුන්වාදුන් දුරකථන පැකේජවල සාර්ථකත්වයත්, සහනදායි මිල ගණන්යටතේ වෙළඳපොළට පැමිණෙන ස්මාර්ට් ජංගම දුරකථන සහ දුරකථන සබඳතා කෙරෙහි වර්ධනය වෙමින් පවතින ඉල්ලුමත් mPower දුරකථන පැකේජය හඳුන්වාදීමට හේතුවිය. නව පැකේජය හරහා අඩුම මිලකට උසස් තත්ත්වයේ ස්මාර්ට් දුරකථන මිලදී ගැනීමට මෙන්ම ඊට සමගාමීව ආකර්ෂණීය දුරකථන සබඳතාවක් හිමිකර ගැනීමේ අවස්ථාව ද පෞද්ගලික අංශ සේවකයන්ට උදාවේ. මොබිටෙල් වෙතින් mPower හඳුන්වා දෙන්නේ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ඩිජිටල්කරණ සූදානම හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ජාතික දැක්මට අනුව යමිනි. ආකර්ෂණීය පසු-ගෙවුම් දුරකථන පැකේජ හඳුන්වාදීමේ ප්‍රමුඛයා වන මොබිටෙල් සිය mPower දුරකථන පැකේජය හරහා නව ප්‍රතිලාභ රැසක් පෞද්ගලික අංශ සේවකයන් වෙනුවෙන් හඳුන්වා දී ඇත.

Caltex Havoline තෑගි එන්ජිම ඇරඹේ

මෙරට ලිහිසි තෙල් වෙළෙඳපොළ ප්‍රමුඛයාවන Chevron Lubricants Lanka සමාගම

සිය පාරිභෝගිකයන් ඇගයීම සඳහා.Caltex Havoline තෑගි එන්ජිම. දැවැන්ත ප්‍රවර්ධන වැඩසටහනේ දෙවන අදියර මේ වසරේ පෙබරවාරි මස සිට අප්‍රියෙල් මාසය දක්වා දියත් කරන බව නිවේදනය කළේය.වර්තමානයේ පවතින අභියෝගාත්මක ආර්ථික වාතාවරණය හමුවේ වුවද මෙම ප්‍රවර්ධන වැඩසටහන දිවයින පුරා ක්‍රියාත්මක කෙරෙන අතර, මාස දෙකක කාලය පුරා රු. මිලියන15ක වටිනාකමකින්යුතු රීලෝඩ් ප්‍රමාණයක් පිරිනැමීමට නියමිතය. මෙහිදී සෑම පාරිභෝගිකයෙකුම ජයග්‍රාහකයෙකු වනඅතර ඔවුන් කළයුත්තේ ප්‍රවර්ධන පැක් සමඟ ඇති සූරනකාඩ්පතේ ඇති රහස් අංකය කෙටි පණිවිඩයක් ලෙස'2343' අංකයට SMS කිරීම පමණි.

PickMe නැණ පහනින් පොත් පත් ලබා දෙයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම දේශීය මඟී සහ භාණ්ඩ ප්‍රවාහන සේවා සපයන්න වන PickMe සිය ආයතනික සමාජ වගකීම් වැඩසටහන වන PickMe නැණපහන යටතේ ලංකාව පුරාම සිය හොඳම රියදුරු සාමාජිකයන්ගේ දරුවන්ට මේ වසරේදීද නව පාසල් වාරය සඳහා අවශ්‍ය පාසැල් උපකරණ සහ පොත් පත් නොමිලයේ ලබාදීම පසුගිදා දියත් කරන ලදී.

නැණපහන වැඩසටහන මඟින් පස්වන වරටත් පැවැත්වුණු මෙම උත්සවයේදී පාසල් සිසුන් 1600 දෙනෙකුට රුපියල් ලක්ෂ 40ක් වටිනා පාසල් උපකරණ සහ පොත්පත් ලබාදෙනු ලැබීය. මෙම උපකරණ කට්ටල හොඳම රියැදුරු සාමාජිකයන්ගේ නිවෙස්වලටම ඉතාම දැඩි සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේද සහ නීතිරීති යටතේ ලබා දුන් අතර PickMe ප්‍රධාන කාර්යාලයේ සරල උත්සවයක්ද පැවැත්විණි.

"අපගේ රියැදුරු සාමාජිකයන් PickMe හි ජීව රුධිරයයි. මෙම සරල අගය කිරීම මෙම වසරේදීත් ඔවුන් ඉතා දක්ෂ ලෙස සේවාවන් සැපයීමට මහඟු උත්තේජනයක් වනු ඇත. පසුගිය වසරේදී කෝවිඩ් වසංගත තත්වයේදී ඔවුන් සැලසූ සේවය අපි විශේෂයෙන් අගය කරනවා. ඔවුන්ගේ කැපවීම සහ උනන්දුව අපි ඉතා ආදරයෙන් අගය කරනවා" යනුවෙන් PickMe ප්‍රධාන විධායක නිලධාරී සුල්ෆර් ජිෆ්රි ප්‍රකාශ කළේය.

ලිලී චීස් සමාගම වේප්‍රෝටීන් පානයක් හඳුන්වා දෙයි

වේප්‍රෝටීන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ටත්,දරුවන්ටත් විවිධාකාරයෙන් පෝෂණය ලබාදෙන ජනප්‍රිය පෝෂණ මූලාශ්‍රයකි. වේප්‍රෝටීන් පානයක වැදගත්කම අවධානයට ගනිමින් ක්ෂණිකව පානය කළහැකි වේප්‍රෝටීන් පානයක් ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළට හඳුන්වා දීමට මෙරට චීස් නිෂ්පාදනයේ පුරෝගාමියකු වන ලිලීචීස් සමාගම ජාතික විද්‍යාපදනමත් සමඟ කළ පර්යේෂණයකින් අනතුරුව පියවර ගත්තේය. මේ පර්යේෂණයේ අරමුණ වූ යේ විවිධ වයස් කාණ්ඩවල පෝෂණ අවශ්‍යතාවන්ට ගැළපෙන ස්වභාවික දියරමය තත්ත්වයේ ඇති වේප්‍රෝටීන් සහිත ස්වභාවික නැවුම් පලතුරු යුෂමිශ්‍ර පානයක් සැදීමය. විධිමත්පුළුල් වෙළෙඳපොළ ඇගයීමකින් පසු සුදුසු වට්ටෝරුව සිරුරේ ප්‍රෝටීන සමබරතාව සුරැකීමටත්, ශාරීරික අභ්‍යාස හා ක්‍රියාකාරකම්වලින් ගෙවී යන ශක්තිය නැවත ලබාගැනීමටත්, මස්පිඩු වර්ධනයටත් එය උපකාරීවෙයි.

60 රස මිහිරැ Uswalle සිළුමිණ

උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි

මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 78

දෙවු ප්‍රවීණ චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මඟින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංඡන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය.

තැපැල්පත් 2021 මාර්තු 10 වැනිදාට පෙර ගුරුගෝල වෙනස, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10 ලිපිනයට එවිය යුතු ය. ගුරු ගෝල වෙනස ජයග්‍රාහකයන්ට රුපියල් 2,500 බැගින් මුදල් ත්‍යාග 09 ක් පිරිනැමේ. ත්‍යාග පිරිනැමීම උස්වත්ත කන්ෆැක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි.

රුපියල් විසිපන්දහසක තෑගි



සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කළ යුතුය.

සිංගර් වෙතින් නවතම Sony උපාංග පෙළක්

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම පාරිභෝගික භාණ්ඩ අලෙවිකරු වන සිංගර් විසින් ඉහළ විනෝදාස්වාදයක් සඳහා වූ Sony නිෂ්පාදන පෙළක් වෙළඳ පොළට හඳුන්වා දී ඇත. පසුගියදා අන්තර්ජාලය හරහා සිදු කෙරුණු දැවැන්ත නිෂ්පාදන දියත් කිරීමේ වැඩසටහනකින් මෙම උපාංග හඳුන්වා දීම සිදු විය.

4K UHD ඇන්ඩ්‍රොයිඩ් රූපවාහිනී මාදිලි, Sony ඕඩියෝ සිස්ටම්ස්, ඇක්ටිව් නොයිස් කැන්සලේෂන් පවර්ඩ් හෙඩ්ෆෝන්ස් සහ Sony සවුන්ඩ් බාර්ස් මාදිලි රැසක් මෙලෙස හඳුන්වා දුන් නව නිෂ්පාදන අතරට එක් වේ.

මෙම නිෂ්පාදන හඳුන්වා දීමේ වැඩසටන අන්තර්ජාලය හරහා ඔන්ලයින් ක්‍රමයට පැවැත්වුණු අතර, එය සිංගර් සහ Sony සමාජ මාධ්‍ය ගිණුම් තුළ, Chanux Bro ඇතුළු තවත් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් කිහිපදෙනෙකුගේ සමාජ මාධ්‍ය ගිණුම් තුළ විකාශනය වූයේ විශාල ප්‍රේක්ෂක ප්‍රමාණයකගේ ආකර්ෂණය දිනා ගනිමිනි. මෙම වැඩසටහන තුළදී සමාජ මාධ්‍ය තුළ ප්‍රසිද්ධ Chanux Bro විසින් නවතම උපාංග පිළිබඳ පුළුල් විස්තරයක් නරඹන්නන් හට ලබා දුන්නේ, ප්‍රේක්ෂකයන්ට මෙම නවතම නිෂ්පාදන සහ ඒවායේ සුවිශේෂී විශේෂාංග පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙමිනි.

ශ්‍රී ලංකා මාධ්‍ය අධීක්ෂණ සේවාව නීල්සන්ගෙන් කැන්ටාර්ට

නීල්සන් සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන ගිය මාධ්‍ය අධීක්ෂණ සේවාවන් (Media Monitoring Services) පවරා ගැනීමට කැන්ටාර් (පෙර LMRB ලෙස හැඳින්වූ) ආයතනය එකඟ වී තිබේ.

දශක දෙකකට අධික කාලයක් කැන්ටාර් ආයතනය විසින් ශ්‍රී ලංකාවේ රූපවාහිනී ප්‍රේක්ෂක මිනුම්කරණය පවත්වාගෙන යනු ලබයි. මෙම වෙළඳ දැන්වීම්කරණ අධීක්ෂණ ව්‍යාපෘතිය තම සේවා කලඹට එකතුකර ගැනීමෙන් ශ්‍රී ලංකාවේ මාධ්‍ය කර්මාන්තයේ ප්‍රධාන හවුල්කරුවකු ලෙස කැන්ටාර් ආයතනය තම සේවාදායකයන් අතර ලබා ඇති ස්ථානය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

කැන්ටාර් ප්‍රධාන විධායක හිමාලි මධුරසිංහ

මාධ්‍ය ප්‍රචාරණ වියදම් යනු ඕනෑම වෙළඳ සන්නාමයක අලෙවිකරණ ආයෝජනයට අදාළවන තීරණාත්මක සාධකයකි. මෙම ආයෝජනය සාධනීය ලෙස භාවිතය මගින් ඉතා සාර්ථක ව්‍යාපාරික ප්‍රතිඵල කරා ළඟා විය හැකි බව වර්තමානයේ තහවුරු වී ඇත. වෙළඳ සන්නාම අලෙවිකරුවන් විසින් තම මාධ්‍ය ප්‍රචාරක වැඩසටහන්හි සාර්ථකත්වය මෙන්ම කාර්යක්ෂම පිරිවැය භාවිතය තහවුරු කරනු සඳහා, ස්වාධීන පර්යේෂණ ආයතනයන් හි දත්ත විශ්ලේෂණය මගින් තහවරු වූ, ඉතා සංකීර්ණ සැලසුම්සහගත වූත් මාධ්‍ය සහ කාලය මිලදී ගැනීමේ ක්‍රමවේද භාවිත කරනු ලැබේ. අලෙවිකරණ ආයෝජනවල ප්‍රතිලාභ තක්සේරු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම තුළ මාධ්‍ය ප්‍රචාරක වියදම්වල කාර්යක්ෂම භාවිතය, බොහෝ සමාගම් සහ වෙළඳ සන්නාම සඳහා වූ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් (key performance indicator) ලෙස වර්තමාන වෙළඳ ප්‍රජාව පිළිගනු ලබයි.

කැන්ටාර් යනු දත්ත මත පදනම් වූ තීක්ෂණ අවබෝධයක් සහිත ලොව ප්‍රමුඛතම උපදේශන සමාගමකි (Leading evidence-based insights and consulting company).

කෙල්සි හෝම්ස් සෙන්ට්‍රල් පාර්ක් ජාඇල දී ආරම්භ කරයි

කෙල්සි හෝම්ස් සෙන්ට්‍රල් පාර්ක් ජා ඇල ව්‍යාපෘතියේ පළමු සහ දෙවන අදියරයන් සාර්ථකව නිම කර පළමු පස් පිඩැල්ල කැපීමේ උත්සවය උත්කර්ෂවත්ව පවත්වයි කෙල්සි හෝම්ස් සිය නවතම ව්‍යාපෘතිය වන සෙන්ට්‍රල් පාර්ක් ඉදිකිරීම් අරඹයි.

සෙන්ට්‍රල් පාර්ක් ජා ඇල නිවාස ව්‍යාපෘතිය නිවාස ඒකක 350ට අධික විවිධ පහසුකම් 40කටත් වඩා වැඩි නව්‍යකරණය හා සබැඳුනු නිවාස ව්‍යාපෘතියක් වීම එහි විශේෂත්වයයි. MICD Associates හි සුප්‍රසිද්ධ ගෘහ නිර්මාණ ශිල්පී මුරාඩ් ඉස්මයිල් මහතා විසින් මෙම නිවාස ඒකක සැලසුම් කර ඇති අතර දීපාල් වික්‍රමසිංහ ඇසෝසියේට්ස් (පුද්) සමාගම මෙම ව්‍යාපෘතියේ ව්‍යුහාත්මක ඉංජිනේරුවන් වශයෙන් කටයුතු කරයි. මෙරට ප්‍රධාන නගරයක් වන ජා ඇල නගරාසන්නයේ අක්කර 15ක සශ්‍රීක භූමියක මෙම සෙන්ට්‍රල් පාර්ක් ජා ඇල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

මෙම ව්‍යාපෘතියේ පළමු සහ දෙවන අදියරයන් අති සාර්ථකව ක්‍රියාත්මක කෙරිණි. එහිදී ඉතාමත් කෙටි කාලයක් තුළ නිවාස හා මහල් නිවාස ඒකක වලින් 50% කට වඩා අලෙවි විය. විශේෂයෙන්ම පළමු අදියරේ මහල් නිවාස 70ක ප්‍රමාණය දියත් කරන ලද දින සිට දින 30ක් ඇතුළත අලෙවි වී අවසන් විය. ලෝකයම වසංගතයකින් වෙළාගෙන තිබූ මොහොතක අප රට ද අක්‍රිය අන්දමේ පවතිද්දී පවා ඒවැනි සාර්ථකත්වයක් හිමිකර ගැනීම සමාගම ලද සුවිශේෂී ජයග්‍රහණයකි. දෙවන අදියර 2020 සැප්තැම්බර් මාසයේදී දියත් කරන ලද අතර මේ වන විට මෙම ව්‍යාපෘතියේ නිවාස ඒකක 356 කින් ඒකක 190 කට වඩා අලෙවි වී තිබේ. අභියෝගාත්මක ආර්ථික වාතාවරණයක් පවතින මොහොතකදීත් ගනුදෙනුකරුවන්ගෙ ඇති සැලකිය යුතු ඉල්ලුම සමාගම කෙරෙහි ඇති විශ්වාසයත් ශ්‍රී ලංකා දේපළ වෙළඳාම් ක්ෂේත්‍රය තුළ සමාගම තබා ඇති සලකුණ පිළිබඳවත් පිළිබිඹු කෙරෙන සත්‍ය ප්‍රතිමූර්තියකි.

සෙලින්කෝ ලයිෆ් SLIM රිදී සම්මානය දිනයි

ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය පැවැත්වූ 2020 සන්නාම විශිෂ්ටතා සම්මාන ප්‍රදානෝත්සවයේදී සෙලින්කෝ ලයිෆ් විසින් අඛණ්ඩවම සිදුකරන සමාජ සත්කාරක යුතුකම ඇගයීමට ලක්කරමින් 'වසරේ ආයතනික සමාජ වගකීම් සන්නාමය' යන අංශය යටතේ රිදී සම්මානය මෙරට ජීවිත රක්ෂණ අංශයේ ප්‍රමුඛයා වෙත පසුගියදා පිරිනමන ලදී.

සමාගම විසින් 2019 වසරේදී සම්පූර්ණ කරන ලද ආයතනික සමාජ වගකීම් වැඩසටහන් සඳහා මෙම සම්මානය පරක දානය කර තිබේ. පන්ති කාමර 07 ක් ඉදිකිරීම, 'වෛද්‍ය හමුව' නැමති නොමිලේ සෞඛ්‍යයම කඳවුරු 12 ක් පැවැත්වීම, සමාගම විසින් ලබාදුන් පස්වන දැඩි සත්කාර ඒකකය (HDU) මහනුවර ශික්ෂණ රෝහලට පරිත්‍යාග කිරීම, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2030 වසර වෙනුවෙන් සකස්කර තිබෙන තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) වලට අනුගත වෙමින් සමාගම විසින් පරිත්‍යාග කර තිබෙන රෝහල් දැඩි සත්කාර ඒකක නඩත්තු කිරීම යන කරුණු මෙම සම්මානය ලබාදීම සඳහා සැලකිල්ලට ගෙන ඇත.

මෙම සම්මානය පිළිබඳව සෙලින්කෝ ලයිෆ් සමාගමේ සාමාන්‍යාධිකාරී - අලෙවිකරණ, සමිත හේමචන්ද්‍ර මහතා මෙසේ අදහස් දැක්වීය. 'අපගේ සමාජ වගකීම් වැඩසටහන් නිර්මාණය වන්නේ සත්‍ය වශයෙන්ම ජනතාව මුහුණ දෙන අභියෝග සහ ගැටලු නිරාකරණය කිරීමේ අභිලාෂයෙන් මිස සන්නාමය ගොඩනැගීමේ උපාය මාර්ගයක් ලෙස නොවේ. එනමුත් ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් සිදුකළ ස්වාධීන තක්සේරුවක් මගින් අපට ලබාදුන් මෙම සම්මානය අප අගය කරන අතර ඒ තුළින් යහපත් සමාජ පුරවැසියෙකු ලෙස තවත් අවස්ථාවන් සොයා බලමින් අඛණ්ඩවම මෙම සත්කාරක වැඩසටහන් කිරීමට සමාගමේ සමස්ත කණ්ඩායමටම දිරියක් ලබාදෙනවා.'

සෙලාන් නව ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා රමේෂ්

සෙලාන් බැංකුව,පසුගිය ජනවාරි 1 වැනිදා සිට සිය ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තනතුර සඳහා ජ්‍යෙෂ්ඨ බැංකුකරුවෙකු වන රමේෂ් ජයසේකර මහතා පත් කර තිබේ. ජාත්‍යන්තර අත්දැකීම් සම්භාරයකින් හෙබි ජයසේකර මහතා, සෙලාන් බැංකුවට එක්වීමට පෙර, ප්‍රංශය කේන්ද්‍ර කරගත් විශාලතම බැංකු සමාගමක් වන BNP Paribas හි මැද පෙරදිග කලාපයේ නියෝජ්‍ය මූල්‍ය පාලක තනතුර හෙබවීය. 2011 වසරේදී ප්‍රධාන මූල්‍ය නිලධාරියා ලෙස සෙලාන් බැංකුවට බැඳුණු ඒ මහතා, එතැන් පටන් බැංකුවේ

විවිධ ඉහළ නිලතල දැරීය. ඊට ප්‍රධාන ණය අවදානම් නිලධාරි (2016), ආයතනික බැංකු අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (2018) මෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (2019) යන තනතුරු ඇතුළත්ය. සෙලාන් බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා ලෙස නව ධූරයේ වැඩ භාරගැනීමත් සමඟ, සමස්ත බැංකු ශාඛා පද්ධතිය, Credit Hubs ඇතුළු බැංකු ශාඛා ණය අංශය, ණය අධීක්ෂණය, සාමාන්‍ය බැංකුකරණය, ණය ආපසු අයකරගැනීම, නීති, වගකීම් නිෂ්පාදන කළමනාකරණය, සෙලාන් කාඩ්පත් මධ්‍යස්ථානය, ආන්තික වෙළෙඳාම් සහ ඉස්ලාමීය බැංකුකරණ යන අංශවල වගකීම් ජයසේකර වෙත පැවරී තිබේ.

ඉන්ධන දහනය කාර්යක්ෂම කරන ECO Tablets

සී/ස සිලෝන් ග්‍රීන් ප්‍රොඩියුස් සමාගම වාහනවල එන්ජින් ක්‍රියාකාරීත්වය ඉහළ නංවන ඉන්ධන දහනය කාර්යක්ෂම කරන නමින් නිෂ්පාදනයක් වෙළෙඳපොළට නිකුත් කර ඇත. මෙම ECO Tablets (www.ecotablets.lk) නැනෝ තාක්ෂණය ඇසුරින් කාබනික ද්‍රව්‍ය පමණක් යොදා නිපදවයි. මෙය ඉන්ධන සමඟ මුසු කළයුතු අතර පෙට්රල් වාහන සඳහා ECO Racing නමින්ද,ඩීසල් වාහන සඳහා ECO Diesel නමින්ද දෙවර්ගයකින් මිලට ගත හැකිය.ECO Tablets භාවිතය එන්ජිමේ ආයුකාලය දෙගුණයකින්

වැඩිවීමට සහ ස්පාර්ක් ප්ලග්, දහන කුටීර හා ඉන්ධන ටැංකිය පිරිසිදු වීමට හේතු වේ.

ECO Tablets භාවිතයෙන් 20% ත් 50% අතර ඉන්ධන ඉතිරියක්ද සිදුවේ. ECO Racing ඔක්ටේන් අගය 5ත් 10ත් අතර වැඩි කරයි. ECO Diesel සීටේන් අගය 2ත් 5ත් අතර වැඩිකරයි. එමගින් ඉන්ධන දහනයේ ක්‍රමවත් බව, කාර්යක්ෂමතාව සහ එන්ජිමේ ක්‍රියාකාරීත්වය වැඩිකරයි.එසේම කාබන් මොනොක්සයිඩ් පිටවීම100%ක් හා සල්ෆර් ඩයොක්සයිඩ් පිටවීම 99%ක් අඩුකරයි.

නිදහසේ උපතට මහජන බැංකුවෙන් වැඩසටහනක්

සෑම වසරකම නිදහස් දිනයට සමගාමීව මහජන බැංකුව ක්‍රියාත්මක කරනු ලබන නිදහසේ උපත වැඩසටහන වෙනුවෙන් උත්සවයක් රජයේ නිරෝධායන නීති රීති වලට අනුකූලව නාවලපිටිය, දිස්ත්‍රික් මහ රෝහලේ දී පැවැත්විණි. මෙහිදී අලුත උපන් බිළිඳුන් වෙනුවෙන් එම දෙමාපියන් වෙත ඉසුරු උදාන තෑගි සහතික හා ත්‍යාගයන් පිරිනමන ලදී. මෙම අවස්ථාවට මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ශාඛා කළමනාකරණ) මහින්ද ප්‍රේමනාත්, මහනුවර ප්‍රාදේශීය කළමනාකාර බුද්ධික රණතුංගගේ යන මහත්වරුන්, සහකාර ප්‍රාදේශීය කළමනාකාරිනි අනූෂා අලහකෝන් මහත්මිය, නාවලපිටිය ශාඛා කළමනාකාර ඉසුර දිසානායක මහතා ඇතු කාර්ය මණ්ඩලය සහභාගි වූහ.

කොවිඩ් 19ට oDoc විසඳුමක්

oDoc වෙතින් කොවිඩ් වලින් පෞද්ගලික අංශ සේවකයන් ආරක්ෂා කරගැනීමට නව විසඳුමක්

ශ්‍රී ලංකාවේ පළමු සුවසේවා ඇප් එක වන oDoc, පසුගියදා පෞද්ගලික ආයතන හා ව්‍යාපාරික ස්ථාන වෙත උසස් තත්ත්වයේ ඔන්ලයින් (online) සෞඛ්‍ය සේවා පිරිනැමීමේ නව සේවාවක් ආරම්භ කළේය.

පෞද්ගලික ආයතන හා ව්‍යාපාරික ස්ථාන ඉලක්ක කරගනිමින් හඳුන්වා දී ඇති මෙම නවතම වැඩපිළිවෙළ යටතේ එක් සේවකයෙකු සඳහා මාසයකට රුපියල් 60ක් තරම් අවම මුදලකට තමන් හා පවුලේ සාමාජිකයන් තිදෙනෙකුට සීමා රහිතව සෞඛ්‍ය උපදෙස් ලබාගැනීමේ හැකියාව පවතී.

2017 වසරේදී හේෂාන් ප්‍රනාන්දු, වෛද්‍ය ජානක වික්‍රමසිංහ, සොහාන් ධර්මරාජා සහ කීත් ද අල්විස් යන ව්‍යවසායකයෝ මෙම ඇප් එකනිර්මාණය කළහ. වර්තමානය වනවිට oDoc හි සක්‍රිය පරිශීලකයන් දෙලක්ෂය ඉක්මවා ගොස් ඇති අතර, එය එහි විශ්වාසනීයත්වය හා සේවා විශිෂ්ටත්වයට කදිම සාක්ෂියකි.

කොවිඩ්-19 වසංගත කාලය තුළ මෙම ඩිජිටල් පහසුකමේ වැදගත්කම වඩාත් පැහැදිලි විය. එම කාලය තුළ ලියාපදිංචි වූ නව පරිශීලකයන් සංඛ්‍යා ව 474%කින් ඉහළ ගිය අතර, වෛද්‍ය උපදේශන සේවා වාර ගණන 296%කින් වර්ධනය විය. එමෙන්ම ඖෂධ ඇණවුම් සංඛ්‍යාව 107%කින් හා සමස්ත ව්‍යාපාර-ව්‍යාපාර අතර ආදායම 100%කින් වැඩිවිය.

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 119 රුපියල් 50,000 ක තෑගි

කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5,000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 119 යනුවෙන් සඳහන් කර ඩේන්ටි මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 මාර්තු 10 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් අංකයක් ඇත්නම් එයද ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

උපකාරක පද

හරහට....

1 පෙර'පර දෙදිග සංස්කෘතිය හා කලාව පිළිබඳ මෙරට විසූ පණ්ඩිරයෙකි
6 සන්ධ්‍යාව/ සැඳෑව
7 ජාලය
8 නැහැයෙන් ගලන මල
9 නැම
11 භික්ෂූන් වහන්සේ
13 දහය
14 අලුත්
15 ජම්බු ගස
16 රාවණාගේ සිරුර ඇතැයි කියන කන්ද
18 පාරේ ඇවිද යන්නා
20 රතු/ රක්ත
21 ක්‍රිකට් මෙන් ම රගර් ක්‍රීඩාවෙන් ද ලොව දිනූ සීතල රටකි

පහළට....

1 සිබිල් නැන්දාගේ සම්මානනීය ළමා කෘතියකි
2 දිවට දැවෙන සංවේදනය
3 හිට්ලර් ද භාවිතයට ගත් ඉපැරැණි ලාංඡනය
4 භාග්‍යය
5 සොබාවික මිරිදිය ජලාශය
7 ජාතිය
10 මිනිස්
11 අයස නොවේ
12 ස්ත්‍රීන් අරභයා යෙදෙන පදයකි
13 බුදුන් උපන් දේශය
14 සිදාදිය/ සෙයිලම
15 වසඟ කිරීම/ වසඟවීම
17 ලියුම්/ ලිපි
19 මේ සළු මිල අධික බව කියැවේ

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 119

නම: ....

ලිපිනය: ....

අත්සන: ....

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරු මාධ්‍ය සේවා

වගකීම් බාර ගන්න කෙනෙක් නැති නිසයි මේ ප්‍රශ්නය

රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ සභාපති
පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

කොරෝනා ව්‍යසනය පිළිබඳව යථාර්ථය සඳහන් කරනවා නම් මුලින්ම මෙය ශ්‍රීලංකාවට පැමිණි වෙලාවේ ජනාධිපතිවරයා ආරක්ෂක අංශ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එකතු වෙලා ගත්ත ක්‍රියාමාර්ග යම් කිසි ප්‍රමාණයකට පැතිරීම අඩුවුණා. නමුත් දෙවැනි රැල්ල අවස්ථාවේ දි මේ සම්බන්ධයෙන් සැලකිල්ලක් වුණේ නැති නිසයි රටපුරාම මෙය පැතිරිලා ගියේ. එක එක තර්ක කළා මිසක රෝග නිවාරණය පිළිබඳව බැලුවේ නැහැ. උපදෙස් ලබා දෙමින් කටයුතු කළා පමණයි. මුල් වතාවේ මේ වයිරසය පැතිරිලා ගිය අවස්ථාවේ විදියට කටයුතු කළා නම් මෙය මෙතරම් උග්‍ර වෙන්නේ නැහැ. මෙය පිළිබඳව සැලකිල්ල අඩු නිසා බෝවීම, පැතිරීම වැඩිවෙලා තියෙනවා. රෝග නිවාරණ පැත්ත පිළිබඳව නිසි වැඩපිළිවෙළක් මේ වෙනතෙක් තවමත් අරගෙන නැහැ.

අපි කියන්නේ මේ පිළිබඳව උගන්වලාවත් මේ ගැන දැනුම්වත් වෙන්න කියලා. අපි කියන්නේ මුඛ ආවරණ, අත් සේදීම කොතෙක් කළත් අපි නිසි ආකාරයෙන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි. වගකීම් බාරගන්න කෙනෙක් නැති නිසා අද මෙය පැතිරිලා තියෙනවා. දැන් වුණත් මෙහි වගකීම් බාර අරගෙන උපදෙස් දෙන්න කෙනෙක් ඉන්නවා නම් බොහෝ දුරට වළක්වා ගන්න පුළුවන්. මාධ්‍ය සන්දර්ශනය කරනවා මිසක කළ යුත්තේ කුමක්ද; විය යුතු වන්නේ කුමක්ද කියලා සෞඛ්‍ය බලධාරීන් නිසි ලෙස සඳහන් කරන්නේ නැහැ.

තාක්ෂණික තීරණ ගැනීමේ ගැටලු වැඩියි

වෛද්‍ය රසායනාගාර වෘත්තියවේදී සංගමයේ සභාපති රවි කුමුදේශ්

කොවිඩ් මර්දන වැඩ සටහන ආරම්භ කරපු දවසේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ කළමනාකාරීත්වයේ ගැටලු තිබුණා. ඒ අය විශ්වාස කරන කිහිපදෙනෙක් සමඟ අතිශයින්ම වැදගත් තාක්ෂණික කරුණු ගැන තීරණ ගැනීම සහ ඒ තීරණ ගැනීමට ප්‍රමාදවීම ගැටලුවක්. විවිධ පාර්ශ්වයන්ගේ නිපුණතාව කුසලතාවය විශේෂඥතාවය ඒ අය පිළිගන්න අකමැතිකම තවත් හේතුවක්. උඩ සිට පහළට තීරණ ක්‍රියාත්මක විමේදී ගන්නා තීරණවලයි මේ ගැටලුව පවතින්නේ. එක එක්කෙනාගේ නිපුණතාවය එක් එක් ආකාරයට වැදගත්. රසායනාගාර සේවාවේ හැමදාම තීරණ ගන්නේ සියලු දෙනා එකඟතාවය අනුවයි. නමුත් අපි දැක්කේ නැහැ කොරෝනා ආරම්භයේ සිටම එවැනි තත්ත්වයක්.

මේ වනවිට රසායනාගාර සේවාවේ දැඩි අවශ්‍යතාවයක් තියනවා. නමුත් ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියාපිළිවෙතක් අපි දැක්කේ නැහැ. අපි දකින ප්‍රධාන අඩුපාඩුව නිසි තීරණ නොගැනීමත් අවශ්‍ය තීරණ මාසයක් දෙකක් පමණ ප්‍රමාද වී ලබා ගැනීමත්ය.

ඒ පරක්කුව ඇතුළේ විශාල ගැටලු ඇති වෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය ඒ ප්‍රමාදයෙන් පසුව මේ වන විට හරි පීල්ලේ යනවා. කොවිඩ් සම්බන්ධයෙන් වැඩ කරනවා මහන්සි වෙනවා, නමුත් ප්‍රමාදය ඇතුළේ වූ අඩුපාඩු වහන්න බැහැ. මේ වෙලාවේ නව ප්‍රභේද හඳුනා ගැනීම සඳහා ජාතික වැඩපිළිවෙළක අවශ්‍යතාවයක් තිබිය යුතුයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ එකම රසායනාගාරයකවත් ජාන අනුක්‍රමික යන්ත්‍රයක් නැහැ. අපි මෙය කියන කොට සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙන් සියලු දේ ලෑස්ති කරලා පසුව නැවැත්වූවා. රසායනාගාර සේවාව ලෝකයේ තියන විදිහට නෙමෙයි ලංකාවේ තියෙන්නේ. හැම එකකටම විශේෂඥ වෛද්‍යවරයෙක් අත ගහනවා, ඒ අයගේ දැනුමේ ප්‍රමාණයටයි සියල්ල තීරණය වන්නේ. කොරෝනා සම්බන්ධයෙන් ලෝකයේම පර්යේෂණ කරනවා, ජාන අනුක්‍රමණ විශ්ලේෂණයක් කරලා ප්‍රභේද සොයාගැනීම ජාතික වගකීමක්. එය ප්‍රාථමික පර්යේෂණ අවස්ථාවක්. ඒ සඳහා උරදෙන්න පුළුවන් වෛද්‍යවරුන් හිටියත් ඒ අයට ඉඩ ලැබෙන්නේ නැහැ කියලා අපි දන්නවා. මේ අනුක ජීවික්ෂේත්‍රයේ නිපුණතාවයන් තිබෙන වෛද්‍ය නොවන විශේෂඥයන් ඕන තරම් ඉන්නවා .

වෛද්‍ය පීඨවල මේ සඳහා ඉන්න විශේෂඥයන් යොදවලා මේ දේවල් කළ යුතුයි. ඒත් ඒ දේවල් කරන්න ඉඩ ලැබෙන්නේ නැහැ. අපිට වාසනාවකට උනන්දුවෙන් විශේෂඥ වැඩ කරන වෛද්‍ය වෘත්තිකයන් ඉන්නවා. ඒ අයට ජාතික වශයෙන් පරීක්ෂණ කරන්න බැහැ ප්‍රභේද පැතිරුණා කිව්වාට පර්යේෂණ ජාතික වශයෙන් නොකරන නිසා පැතිරුණු දිස්ත්‍රික්ක ප්‍රමාණයවත් අප හරියට දන්නේ නැහැ.

එමෙන්ම ඒ ප්‍රභේද හැරුණු විට අනෙක් ප්‍රභේද ගැන පර්යේෂණ කරලත් නැහැ. එන්නත් ශරීරය ඇතුළේ ක්‍රියාකාරීද නැද්ද කියලා අපි හොයලා නැහැ. ජාතික රසායනාගාරයක් ඇති කර මේ සම්බන්ධයෙන් පර්යේෂණය කරන වෛද්‍යවරුන්ට සහය දීමට අපිට ඉඩ ලබාදිය යුතුයි. හුදකලා නිරෝධායන කිරීම් ක්‍රමවේදයන් අලුත් වෙන්න ඕන කියලා තමයි මම හිතන්නේ නිරෝධායන මධ්‍යස්ථාන වැඩිය නැහැ. නීතිය එක විදිහකට ක්‍රියාකාරිත්වය තව විදිහකට තිබිය යුතු නැහැ.

විශේෂයෙන් ක්ෂේත්‍රය ඇතුළේ සිට තීරණ ගත යුතුයි. එයින් බැහැර ඉන්න අය නොවෙයි තීරණ ගත යුතු වන්නේ. පළමුවැනි දේ තමයි අපිට ඇති පහසුකම් ගැන ජනතාව දැනුම්වත් කළ යුතුයි.

කොරෝනා මර්දනය බිම්මට්ටමින් ක්‍රියාත්මක වීම ශක්තිමත් නැහැ

රජයේ පවුල් සෞඛ්‍ය සේවා සංවිධානයේ සභාපතිනී දේවිකා කොඩිතුවක්කු

පොදුවේ ගත් විට කොරොනා පාලනයට අරගෙන තියන ක්‍රියාමාර්ග ශක්තිමත් මදි. සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දුන්නත් ක්‍රමවේද පිළිබඳව හඳුන්වා දුන්නත් ඒවා බිම්මට්ටමට යද්දි ක්‍රියාත්මක් වෙන්නේ නැහැ. ඒ නිසා අද කොරෝනා ප්‍රශ්නය ගැන කතා කරන්න පත් කළ සියලුම කාර්යය සාධක පිරිස් ඉන්නේ ඉහළ පෙළේ අයයි. ඒ අය ඉහළ පෙළේ දේවල් විතරයි වාර්තා කරන්නේ.

අපි වගේ බිම් මට්ටමේ තොරතුරු වාර්තා කරන්නේ නැහැ. පළමු වැනි භයානක කාරණාව කොරොනා වලට ජනතාව බය නැහැ. ඒ නිසා අසාදිතයන් වැඩිවෙමින් පවතිනවා. එමෙන්ම මේ රෝගය වැලඳුණ අයව නිරෝධායන මධ්‍යස්ථානවලට නිසි වැඩ පිළිවෙළක් නැහැ.

උඩ ඉඳගෙන නීති පැනවුවාට වැඩක් නැහැ. ඒවා ක්‍රියාත්මක විය යුතුයි.

ඒ සඳහා වැඩපිළිවෙළක් තියෙන්න ඕන . එමෙන්ම කොරොනා වලින් මිය ගිය අයට නීතිය එක විදිහට ක්‍රියාත්මක විය යුතුයි. ඒ නිසා බිම්මට්ටමින් කොරෝනා මර්දනය ක්‍රියාත්මක වීම ශක්තිමත් නැහැ.

ඒ නිසා මේ වැඩපිළිවෙළ සාර්ථක නැහැ. මීට වඩා අවධානය යොමු කරන්න අවශ්‍යයි.

ජනතාවගේ සහය අත්‍යවශ්‍යයි

ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ සුදත් සමරවීර සෞඛ්‍ය අමාත්‍යාංශය

කොවිඩ් පාලනය සඳහා ගත්ත තීරණ තීන්දු සාර්ථක වූ නිසා මේ තරමට රෝගීන් වාර්තා වීමෙන් පාලනය වී පවතින්නේ. ලෝකයේ වෙනත් රටවල රෝගීන් වාර්තා වීමේ අනතුරුව ශිඝ්‍ර වර්ධනය වීමක් පවතිනවා. අපේ රටේ ඔක්තෝබර් මාසයේ සිට මේ වන විට දිනපතා රෝගීන් වාර්තා වීම දහසකට අඩු මට්ටමින් පවත්වා ගෙන යාමට සිදු වෙනවා. ඒ මට්ටමින් පවත්වා ගෙන යාමට හැකිවෙලා තියෙන්නේ නිසි සෞඛ්‍ය ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම තුළිනුයි. රටක් ලෙස මීටත් වඩා මේ රෝග වාර්තා වීම අඩු කරගැනීමට හැකියාව ලැබෙනවා; ජනතාව සහය තියෙනවා නම්. අධික ලෙස පැතිරීමට ඇති අවස්ථා අවම කරගැනීමට ජනතාව සහය දිය යුතුයි. විශේෂයෙන් පොකුරු ඇතිවීමට හේතු වන්නේද නොයෙක් ආකාරයේ උත්සව, මංගල්‍ය, අවමංගල්‍ය, ප්‍රිය සම්භාෂණ පැවැත්වීමයි. නිසි සෞඛ්‍ය පුරුදු එවැනි අවස්ථාවල පිළිපදින්නේ නැති නිසයි, මේ තත්ත්වය ඇතිවෙන්නේ. මේ තරම්වත් රෝගීන් වාර්තා වෙන්නේ නැහැ; ජනතාවගේ පැත්තෙන් එම සහය තියෙනවා නම්. ඒක තමයි වැදගත්ම දේ. අත්‍යවශ්‍ය මූලික කරුණු ටික කෙරෙනවා නම් මෙය වළක්වා ගැනීමට හැකියාව තියෙනවා.

මත ගැටෙන තැන

● සුභද්‍රා දේශප්‍රිය

කොවිඩ් 19 පාලනයට ගෙන ඇති ක්‍රියාමාර්ග සාර්ථකද?

මෙරට කොවිඩ් 19 වසංගතය පාලනය කිරීම සඳහා රජය විසින් විවිධ පියවර රැසක් ගෙන තිබේ. ඒ අනුව ලෝකයේ අනෙක් රටවලට සාපේක්ෂව රෝගය පැතිර යාමේ සහ රෝගීන් වාර්තා වීමේ අඩු ප්‍රවණතාවක් පවතී. කොරෝනා දෙවැනි රැල්ල නිර්මාණය වීමත් සමඟ කොරෝනා මර්දනය කිරීමට රජය විසින් විවිධ ක්‍රියාමාර්ග රැසක් ගනු ලැබීය. මේ වනවිට රටපුරා නව වයිරසයක් පැතිරීමත් සමඟ වයිරසය පාලන කිරීමට රට වසා දැමීමක් සිදු නොකරන බව කොවිඩ් 19 පාලනය කිරීමේ ජාතික මධ්‍යස්ථාන ප්‍රධානී යුද හමුදාපති ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි.

මේ අභියෝගය පාලනය කිරීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ කැපවීම් අත්‍යවශ්‍ය කරුණකි. කෙසේ වෙතත් මෙරට ප්‍රදේශ හතරකින් හමුවූ වැඩි ප්‍රවාරණ ශීඝ්‍රතාවයක් ඇති කොරෝනා වයිරසය මෙරට නිර්මාණය වී ඇත.

එමෙන්ම සියයට පනහකට වඩා ශීඝ්‍රයෙන් පැතිරීමේ ප්‍රවණතාවක් එහි පවතින බව සඳහන් කරයි. කෙසේ වෙතත් ශීඝ්‍රයෙන් පැතිර යන වයිරසයක් වුවද දිනකට රෝගීන් දහසකට අඩු ප්‍රමාණයක් වාර්තා වීම දක්වා පාලනය කරගැනීමට මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සියලු අංශයන්ට හැකියාව ලැබී ඇත. මේ රෝගය පාලනය කිරීම සඳහා නිසි සෞඛ්‍ය පුරුදු පිළිපදිමින් ජනතාවගේ පාර්ශ්වයෙන් ද විශාල සහයෝගයක් ලැබිය යුතුය.

රෝගීන්ට අසාධාරණයක් වන්නේ නැහැ

කොළඹ ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා විශේෂඥ වෛද්‍ය සමිද්ධි සමරකෝන්



වසංගතය සම්බන්ධයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල මෙහෙවරක් කරලා තියනවා. දිනපතා සෞඛ්‍ය නිලධාරීන්ගේ රැස්වීම් පැවැත්වෙනවා. රෝගීන් සඳහා වෙනම රෝහල් පවත්වා ගෙන යාමක් සිදුවෙනවා, එමෙන්ම නිරෝධායනය සඳහා රජයේ නිරෝධායන මධ්‍යස්ථානවලට යොමු කිරීම් ක්‍රියාත්මක වෙනවා.

කොවිඩ් 19 රෝගීන් සඳහා විශේෂිතම ප්‍රතිකාර කිරීම් රැසක් සිදුවෙනවා. උදාහරණ ලෙස ජාතික රෝහලේ විශේෂිත ප්‍රතිකාර අවශ්‍ය එවැනි රෝගියෙකුට මේ වයිරසය ආසාදනය වීඇති අවස්ථාවලදී කොවිඩ් 19 වැලඳී සිටියාට වෙනත් දරුණු රෝගාබාධ ඇති අවස්ථාවලදී අපි වෙනම රජයේ රොහල්වල ඒ අය සඳහා කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යනවා.

ඒ අතර සෞඛ්‍ය නිලධාරීන් ආරක්ෂා වෙමින් කටයුතු කිරීමට අපි සියලු කටයුතු සිදු කරනවා. ජාතික රෝහලේ සහ අනෙක් රෝහල්වලදී ලබාදිය හැකි ස්ථර අනුව ලබා දෙනවා.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැනුවත් කිරීම් මෙන්ම ඇතුළත් වන සියලු රෝගීන්ට ඇන්ටිජන් පරීක්ෂාවට ලක් කරනු ලබනවා. එහිදී කොවිඩ් රෝගීන් බවට තහවුරු වන රෝගීන් වෙනම වාට්ටුවකට යොමු කරනවා. අනෙක් රෝගීන්ගෙන් ඒ අය වෙන් කිරීමට ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කරනවා. ඒ සඳහා විශේෂිත සෞඛ්‍ය නිලධාරීන් සේවයේ යොදවා තියෙනවා. ජාතික රොහලෙන් විශේෂ ප්‍රතිකාර ලබාදුන් පසු මාරු කර යැවීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරනවා.

එමෙන්ම හුදකලා ප්‍රදේශවල සාමාන්‍ය වෛද්‍යවරු සහිත කණ්ඩායම් පමණක් නොවෙයි කායික රෝග විශේෂඥ වෛද්‍යවරුන් කණ්ඩායම් පිටත් කර හැරීම් කරනවා.

රට වහගෙන ප්‍රශ්නය විසඳන්න බැහැ

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සංස්කාරක
වෛද්‍ය හරිත අලුත්ගේ

අපට තිබෙන අත්දැකීම් අනුව පසුගිය කාලයේදී ලෝකයේ සමහර රටවල් භාවිතා කරන ක්‍රමවේදය සලකා බලමින් ඒවා අපේ රටට ගළපා ගනිමින් ඒවා අනුගමනය කරමින් තමා අපි ඉස්සරහට යන්නේ. කොරෝනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ප්‍රධාන විකල්ප ක්‍රම තුනක් තිබෙනවා.

පළවෙනි එක කොරෝනා එලෙසම පවතින්න ඉඩ හැරීම. මෙහිදී විශාල ප්‍රමාණයක් මරණයට පත් වූවත් රටක් වශයෙන් ඉදිරියට යෑමට හැකි වෙනවා. නමුත් රටක් ලෙස අපි එසේ කරන්නේ නැහැ. මරණයට පත් වීමට යන එක් රෝගියෙක් පවා සුවපත් කිරීමයි අපේ අරමුණ වී තිබෙන්නේ. එම නිසා අපි කටයුතු කරන්නේ මෙම විකල්පය අනුව නොවෙයි.

දෙවන විකල්පය වන්නේ රට සම්පූර්ණයෙන්ම වසා දමා, රටේ ආර්ථිකය පිළිබඳ නොතකා සියලු ගුවන් තොටුපළවල්, පාසල් ආදිය වසා, රට තුළට කිසිවෙකුට ඒමට හෝ රටින් යාමට නොහැකි වන පරිදි පාලනය කිරීමයි.

අභියෝගාත්මකම සහ අමාරුම තුන්වන විකල්පයයි මෙහිදී තෝරා ගෙන තිබෙන්නේ . මෙහිදී සිදු වන්නේ කොරෝනා පාලනය කරන අතරතුර අප රටේ ජන ජීවිතය සාමාන්‍යකරණය කරමින් රට ඉදිරියට ගෙන යාමයි. මෙම විකල්පයට අනුව සාමාන්‍යකරණය යටතේ ලෝක සෞඛ්‍ය සංවිධානය, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, සෞඛ්‍ය අමාත්‍යාංශය එක් වී සාදන ලද මාර්ගෝපදේශ වලට අනුගත වෙමින් මූලික සෞඛ්‍යය හුරු පුරුදු සමඟ ජීවත් වීම අත්‍යවශ්‍ය වෙනවා.

අවුරුදු 60ට වැඩි පිරිස්, දියවැඩියා අධි-රුධිර පීඩනය පිළිකා වකුගඩු රෝග ආදී වෙනත් රෝගවලින් පීඩා විඳින අය මෙම අවදානම් කාණ්ඩයට අයත් වෙනවා. පසුගිය කාලයේදී සිදු වූ මරණවලින් වැඩි ප්‍රමාණයක් මෙම අවදානම් කාණ්ඩයේ සිදුවුණේ. මේ තුළින් අවදානම් කාණ්ඩය ආවරණය කරගත හැකි වුවහොත් එය වඩාත් සාර්ථකයි.

සියලුම පාසල්වල අමතර උත්සව නවතා දමන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම් දෙනු ලැබුවා. මෙවැනි ස්වයං විනයක් සියලු ස්ථානවල සාදාගත යුතුයි. මංගල සහ අවමංගල උත්සව පවා පනවන ලද සීමා තුළ සිටිමින් සිදු කළ යුතුයි. ඊට අමතරව පවත්වන උපන්දින සාද වැනි අමතර දෑ අනිවාර්යයෙන්ම රටේ පවතින නිරෝධායන නීති වලට පටහැනියි. ඒවා වහාම නතර කළ යුතුයි.

තවත් වැදගත් වෙන කාරණාවක් වන්නේ නගර අතර සංචරණ සීමා පිළිබඳ සොයා බැලීමයි. සාමාන්‍යයෙන් රෝගීන් ගලා යන්නේ අවදානම වැඩි තැන සිට අඩු තැනටයි. එම නිසා මේ පිළිබඳව මීට වඩා ආරක්ෂක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක විය යුතු බව අප විශ්වාස කරනවා. විශේෂයෙන්ම මෙම අලුත් වයිරස ප්‍රභේදය බලපෑම් කර ඇති ලෝකේ අනිත් රටවල් ක්‍රියාත්මක වී ඇති ආකාරය සහ අපේ රටට ඇති අවදානම තක්සේරු කර මේ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග මොනවාදැයි රජය දැනුම්වත් විය යුතුයි. එවිට රජයට මේ සම්බන්ධව ක්‍රියා කළ හැකියි. මේ රෝගය පිළිබඳ සමහර දත්ත පවතින්නේ වසංගත රෝග විද්‍යාඥයන් සතුව පමණයි. එම දත්ත මත පදනම්ව රජය ගතයුතු ක්‍රියාමාර්ග මොනවාදැයි වහාම නිර්දේශ ලබා දිය යුතුයි.

මාර්ගෝපදේශවලත් ගැටලු තියෙනවා

ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ
සංගමයේ සභාපති උපුල් රෝහණ

සමස්ත ලෙස ගත් විට අපේ රටේ කොවිඩ් 19 පාලනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයන් හොඳයි. බෝවන රෝග පාලනය සඳහා නිසි ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබනවා. බෝවීම් පාලනය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගවල ප්‍රතිපත්තිමය ගැටලු තිබුණා. නිසි වෙලාවට රටේ සංචරණ සීමා පැනවූවත්, රට වසා දැමුවත් රට යළි විවෘත කිරීමේදී දෙන ලද උපදෙස් සහ ආයතන ඇතුළේ හැසිරීම් පිළිබඳව නිසි ලෙස ක්‍රියාත්මක වුණාද යන කරුණ මතුවෙනවා. ඒ ක්‍රියාමාර්ග සාර්ථක වුණාද යන කාරණාව සම්බන්ධයෙන් යම් ගැටලු තියනවා. එහි මාර්ගෝපදේශවල විශාල ගැටලු තිබීම නිසා ජනතාව ඉක්මනින්ම සාමාන්‍යකරණය වුණා. දෙවැනි රැල්ල හරහා විශාල අර්බුදයක් නිර්මාණය වීමට හේතුව එයයි. අනෙක් කාරණාව අපේ රට රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනයවල කොවිඩ් පාලනය සඳහා දෙන ලද ක්‍රියාමාර්ග ක්‍රමවේද අසාර්ථක වෙලා තියෙනවා. ආයතනවල ක්‍රමවේදයන් අනුගමනය කිරීම් අඩු සේම කොවිඩ් පාලනය කර ගැනීමට නොහැකි ක්‍රමවේදයන් ඇතැම් රැකියා ආශ්‍රිතව තියෙනවා. පළමුවැනි රැල්ල පාලනයට ගත් ක්‍රියාමාර්ග හොඳයි. ඉන් අනතුරුව දෙවැනි රැල්ල පාලනය කිරීමට ගත් ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් නිසා දෙවැනි රැල්ල මේ තරම් ව්‍යාප්ත වුණා. අපි දුන් උපදෙස් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට ජනතාවට නොහැකි වෙලා තියනවා.

රටක් විදිහට කොතරම් හොඳ ක්‍රියාමාර්ගයන් අනුගමනය කළත් දෙවැනි අදියරේදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛ නිකුත් කර නිරෝධායනය කිරීම් වැනි පාලනය කිරීම් කළා. ඒ පාලනය කිරීම්වලදි නිරෝධායනය කරන්න පුළුවන් පළමු පෙළ ආශ්‍රිතයන් පමණයි.

දෙවැනි පෙළ ආශ්‍රිතයන් අපිට නිරෝධායනය කරන්නට බැහැ.

ඒවගේම පීසීආර් ප්‍රතිඵල ප්‍රමාදය සාම්පල අස්ථාන ගතවීම් වැනි කරුණු දැඩි ලෙසින් මේ සඳහා බලපා තියනවා. ප්‍රතිකාරක මධ්‍යස්ථානවල ඇති යම් යම් ගැටලු නිසා ජනතාව අතර විශ්වාසය පළුදුවීම් තියනවා. කලින් කලට ගන්නා ක්‍රියාමාර්ගවල තීන්දු තීරණවල ද අඩු පාඩු තියනවා.

ආසාදිතයන් ප්‍රතිකාරක මධ්‍යස්ථානවලට යවාගන්න දින කිහිපයක් නොහැකිවීම, ප්‍රතිකාර මධ්‍යස්ථානවල ඉඩ මදිකම වැනි ගැටලුත් තියෙනවා. මේ නිසා ජනතාවගේ විශ්වාසය බිදි තියනවා. එහිදී පීසී.ආර් සඳහා යොමු නොවීමට පෙලඹෙන්න පවා පුළුවන්.

රජය නිරෝධායන මධ්‍යස්ථානවලට විශාල වියදමක් කර තියනවා. අපි අනෙක් රටවල්වල නැති විදිහට සම්පූර්ණයෙන්ම ආසාදිතයන් සියල්ල රෝහල් ගත කළා. ඒ කැපකිරීම්වල නිසි අවසන් ප්‍රතිඵලයක් දැන් නැති වෙමින් තියෙනවා. එන්නත තාම ලබා දුන්නා පමණයි. එය කොතරම් දුරට සාර්ථකද කියන්න කල් තියනවා. නමුත් අපිට ඇති එකම විකල්පය එන්නත පමණයි.

ඇතැම් අරමුණු පැහැදිලි නැහැ

ප්‍රජා වෛද්‍ය විශේෂඥ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන

කොවිඩ් පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්යන්නි සාර්ථක සහ අසාර්ථක තැන් තියෙනවා. පාලනය කිරීමේ ක්‍රමවේදය අතරින් සියලුම සමාජ කොටස් එකරාශී කර කරමින් කරනු ලබන ක්‍රියාදාමයන් සාර්ථකයි. නමුත් සෞඛ්‍ය අංශයේ නායකත්වයක් තිබිය යුතුයි. එහි නායකත්වයේ සහ වැඩපිළිවෙළේ දුර්වලතාවයක් ඇති බව අපිට දක්නට ලැබෙනවා. ඇතැම් අරමුණු පැහැදිලි නැහැ. පාලනයට අරමුණක් තබාගන යායුතු සේම ඒ අරමුණට යායුතු ක්‍රමවේදයන් උපායමාර්ගයන් තිබිය යුතුයි. ඒ උපායමාර්ග සහ අරමුණුවලට වැඩපිළිවෙළක් තිබිය යුතුයි. මෙතෙක් පැවැති වැඩ පිළිවෙළ නොව පොදු සෞඛ්‍ය ක්‍රමවේදයන්ට එහා ගිය ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි. සම්බන්ධීකරණයට නිසි ක්‍රමවේදයක් නොවන අතර නිසි සන්නිවේදනයක්ද සිදු නොවෙයි. උඩින් අනුගමනය කරන ක්‍රියාමාර්ගයන් පහළට ගලා ඒමේදී යම් යම් අඩු පාඩු දක්නට ලැබෙනවා .තාක්ෂණික තීරණ ගැනීමට නිසි වැඩපිළිවෙළක් නැහැ. ජාතික මට්ටමින් දිස්ත්‍රික් මට්ටමින් තියනවාද කියන කරුණ ගැන ගැටලු තියනවා.

ජාතික මට්ටමින් පමණක් නොවෙයි දිස්ත්‍රික් මට්ටමින්ද තාක්ෂණික කමිටුවලට වැඩි අවධානයක් යොමු විය යුතුයි. එසේ වැඩ පිළිවෙළක් නිසි ලෙස ක්‍රියාත්මක වෙනවාද කියලා ගැටලු තියනවා. මෙහිදී විශේෂිත කරුණක් වන්නේ ඇතැම් අවස්ථාවලදී බලය තියන අයට තාක්ෂණය නැහැ තාක්ෂණය තියන තැන බලය නැහැ. බලය තියන තැන තාක්ෂණික දැනුම නැහැ. මේ ගැටලු නිරාකරණය කරගත යුතුයි. නිසි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුයි. තාක්ෂණික කමිටු දාලා තිබුණාට නිසි ලෙස ක්‍රියාත්මක වෙනවා ද කියන ගැටලුව තියෙනවා. ඒ අය නිසි පර්යේෂණ කරලා දෙන සමහර අවසන් වාර්තා පුස්කනවා. ඒවා ක්‍රියාත්මක වෙනවා ද කියන ගැටලුව තියනවා. නිරෝධායනයට වෙනම ආයතනයක් තිබෙනවා. නමුත් එහි යොමු වීම් අඩුයි. අනිවාර්යෙන්ම සෞඛ්‍යයට අදාළ දේවල් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සිදු කළ යුතුයි. ආරක්ෂක අංශවල සේවය අපි අගයනවා. මේ වනවිට හුදකලා කිරීම් ප්‍රාදේශීය මට්ටමින් සිදුවෙනවා.

පොත් පුවත්

● පුෂ්පා තිලකරත්න

අලුතින් ජනගත වන පොත් පිළිබඳව පාඨකයන් දැනුම්වත් කිරීමේ අරමුණින් මෙම 'පොත් පුවත්' පිටුව සැකසේ. ඒ සඳහා 2020/21 වර්ෂ තුළ පළ කළ කෘතිවල මුද්‍රිත පිටපතක් සිළුමිණ පොත් පුවත්, ලේක්හවුස්, කොළඹ 10 ලිපිනයට යොමුකළ හැකිය.

කෘතිය- ශ්‍රී ලාංකේය පුරාණ ආරාම ආශ්‍රිත බෞද්ධ ස්වස්ථතාව
කර්තෘ- උල්පතගම අමිතරතන හිමි
ප්‍රකාශක- සමයවර්ධන පොත්හල
මිල- රුපියල් 490 පිටු ගණන- 136



අනුරාධපුර ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ උපශාලාධිපති ගෞරව ශාස්ත්‍රවේදී උල්පතගම අමිතරතන හිමියන් විසින් රචිත මෙම කෘතියෙහි අනුරාධපුර නගරය තදාශ්‍රිත ප්‍රදේශයන්හි පිහිටුවන ලද ආරාමවල සෞඛ්‍ය සංරක්ෂණීය පහසුකම් සහිත වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි රාශියක් පිළිබඳ ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක තොරතුරු රැසක් ඇතුළත්ය. මෙය උල්පතගම අමිතරතන හිමියන්ගේ ප්‍රථම පර්යේෂණ කෘතියයි.

කෘතිය- නිමැවුම් විමසුම්
කර්තෘ-උදේනි සරත්චන්ද්‍ර
ප්‍රකාශක- සරසවි ප්‍රකාශකයෝ
මිල- රුපියල් 450 පිටු ගණන- 194
විමසීම්- 071 8033290

ප්‍රවීණ සාහිත්‍යධර උදේනි සරත්චන්ද්‍ර විසින් විවිධ සාහිත්‍ය ශානර යටතේ රචනා කරන ලද සාහිත්‍ය විචාර දාමයක් මෙම කෘතියට ඇතුළත්ය. මෙම සාහිත්‍ය විචාර ලිපි දාමය තුළින් එම කෘතීන්හි තේමාත්මක ගැඹුර, ආකෘතිය, සන්දර්භය, භාෂා විලාසය වැනි සාහිත්‍යයික අංග ලක්ෂණ විමර්ශනය සහ රසාස්වාදනය තුළින් පාඨකයා තුළ පුළුල් රසවින්දන ශක්තියක් ජනිත කිරීමට කතුවරයා ගත් උත්සාහය අගනේය.

කෘතිය- බස් දොස් දැක්ම 2
කර්තෘ- ගලගම හී.ග. පියතිස්ස
ප්‍රකාශක- සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
මිල- රුපියල් 300 පිටු ගණන- 80
විමසීම්- 071 8374478

විශ්‍රාමලත් විදුහල්පතිවරයකු, කිවියකු මෙන්ම විද්වතකු වන කතුවරයා මෙම කෘතිය තුළින් සිංහල භාෂාවේදී අප වැරදි ලෙස භාවිත කරන අවස්ථා සහ ඒවා නිවැරදි විය යුතු ආකාරය පිළිබඳව මැනවින් ඉදිරිපත් කර ඇත. එකවර කියවාගෙන යා හැකි තරම් රසවත්ව රචනා කර ඇති මෙම කෘතියෙන් නොදැනුවත්කම හේතුවෙන් භාෂාව වැරදි ලෙස භාවිත කරන අවස්ථා මැනැවින් අවබෝධ කර ගත හැක.

කෘතිය- චමත්කාරයි මේ රාත්‍රිය
කර්තෘ- පියසිරි කොඩිතුවක්කු
ප්‍රකාශක- නලින් ප්‍රකාශකයෝ
මිල- රුපියල් 550 පිටු ගණන- 188



ගමේ සිට අර්ධ නගරයක පදිංචියට පැමිණි කතුවරයා අත්විඳි සත්‍ය අත්දැකීම් කිහිපයක් ඇසුරින් නිර්මාණය කරන ලද මෙම නවකතාව කතුවරයාගේ 17 වැනි කෘතියයි. නාගරීකරණය හමුවේ නැසෙන පරිසරයේ සුන්දරත්වයත් ඒ විනාශකාරී දොරටුවෙන් මිදෙන්නට උත්සාහ කරමින් චමත්කාරජනක පරිසරයක් පතන තරුණියකගේ පැතුම් මනාව විදහා දක්වන්නට කතුවරයා මෙම කෘතිය තුළින් උත්සාහ දරා ඇත.

සමහර පරිකල්පන ලෝකවල මම අවුරුදු ගාණක් ජීවත් වුණා

- ටෙනිසන් පෙරේරා

නිර්මාණකරුවාට ස්වකීය නිර්මාණ වස්තුබීජය උත්පාදනය වීමෙහි ලා කාලය, දීපය, දේශය බලපාන්නේ නැත. සිරියලතාලා, ධනපාලලා, සුගත්ලා, දම්මිලා මෙන්ම පිටරටක ජීවත් වෙන චරිතයකට වුව ද; විදේශිකයකුට වුව ද නිර්මාණකරුවාගේ නිර්මාණාවේශය අවුළුවාලන්නට හැකිය. ලෝකය පුරා සියලු මිනිසුන් මුහුණ දෙන ප්‍රශ්න හෝ ගැටලු එක ම ආකාරයේ වුණත් ඒවා පැමිණෙන වේශය වෙනස් ය. ගැටලුව එක ම ය; මුහුණ දෙන ආකාරය හෝ ප්‍රතික්‍රියාව විවිධාකාර ය. නිර්මාණකරුවාට මේ සියල්ල සිය නිර්මාණ සඳහා විවිධ ප්‍රවේශ සපයන්නේ ය. ඒ සියල්ල දෙස පොදු දෘෂ්ටිකෝණයෙන් බලන්නට ඔහුට හැකි ය. ටෙනිසන් පෙරේරා නිර්මාණකරුවා ද විවිධ අත්දැකීම් හඹා යන්නෙකි. ඔහු ජීවන තක්සලාවෙන් ම උගත් හා විඳි දෑ පාඨක සමාජය වෙත තිළිණ කරන්නේ විවිධ නිර්මාණ ප්‍රවේශ ඔස්සේ ය. ඒවා කෙටිකතා, නවකතා ආදී නිර්මාණ ප්‍රවර්ග මඟින් ඔහු විදාරණය කරන්නේ ය.

ටෙනිසන් පෙරේරාගේ 'දණ්ඩ භූමි' නවකතාවට වස්තුවිෂය වෙන්නේ ද විදේශික කතකි. මුම්බි නම් ඇමරිකන් නිර්මාණ ශිල්පිනියක වටා ගෙතෙන මේ නවකතාව ලොව කොතැන වුව ද නිර්මාණ ලෝකය එකක් බව සනාථ කරන්නේ ය.

'මම අවුරුදු 3ක් වගේ කාලයක් ඇමෙරිකාවෙ ජීවත් වුණා. ඒ කාලය ඇතුළත මම උදේ සිට සවස් වනතුරු පුස්තකාලයට ගොස් විවිධ පොත් කියවන්නත්, අධ්‍යයනය කරන්නත් පුරුදු වී සිටියා. මේ පුස්තකාලය පරිහරණය කරන්න මුම්බි කියන කාන්තාවත් ආවා. මම ලංකාවේ කෙනෙක් කියල දැනගත්තම ඇය මා සමඟ කතා කළා. නර්තනය ඉගෙන ගත් ඇය ආධ්‍යාත්මික දේ ගැන සැලකිල්ලක් දැක්වූ කාන්තාවක්. ඇය මට ඇගේ කතාව කිව්වා. ඇය විවාහ වී සිට ඇත්තේ ලංකාවේ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ කෙනෙක් සමඟ. ඔහු දියුණු වීමේ නොතිත් ආශාවෙන් යුත් තරුණයෙක්. ඔහුගේ ව්‍යාපාර දියුණුව දකින තරගකාරී අනෙක් ව්‍යාපාරිකයන් ඔහුව මරණයට පත් කරනවා.මා සාරාංශ කළ මේ කතාව ඇය මුළුමණින් ම මට කිව්වා. 'දණ්ඩ භූමි' නමින් මා ලියූයේ ඇගේ කතාවයි'.

ලේඛකයන්, නිර්මාණකරුවන් සිය අත්දැකීම් නිසි පරිදි නිසි තැනට යෙදිය යුතු ම ය. නැත්නම් ඒ අත්දැකීම් පොදු අත්දැකීම් බවට පත්වී පොදු පාඨකයාට සෙවණ සලසා දෙන්නේ නැත. තේක්ක ගසෙන් ලබාගත යුත්තේ ගසේ කඳ ය. කෙසෙල් ගසෙහි කඳෙන් ප්‍රයෝජනයක් නැත. කිතුල් ගසෙහි කිතුල් ගෙඩිවලින් ඇති ඵලක් නැත. එලෙසම නිර්මාණයට උචිත අත්දැකීම ඒ ඒ අවස්ථානුකූලව යෙදිය යුතු ය. නොගැළපෙන තන්හි යෙදුවාට නිර්මාණයෙන් පලක් වන්නේ නැත. අත්දැකීම් නමැති ගබඩාවෙන් අත්දැකීම් තෝරා බේරා ගත යුත්තේ උචිත අනුචිත බව හෝ නිර්මාණකරුවා භාෂාව ගැන දරන අදහස සහ භාෂාව භාවිතයේ වන නෛපුණ්‍ය බව ඊට එක්කරන ආලෝකයේ ප්‍රභාව සුළුපටු නොවේ. කෙතරම් හොඳ වස්තු බීජයක් වුව ද; කෙතරම් අපූරු පරිකල්පනයක් වුව ද; කෙතරම් අර්ථපූර්ණ රූප රචනයක් වුව ද භාෂාව නමැති දවටනයේ සුමිහිරි ව දවටා නැත්නම් ඒ නිර්මාණය ප්‍රතික්ෂේප වන්නේ ය. ටෙනිසන් පෙරේරා අප ජ්‍යෙෂ්ඨ නිර්මාණකරුවා ද භාෂාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නෙකි. මැටි බෝලයක් විවිධ නිර්මාණ සුරුකම් සඳහා යොදන්නේ යම් සේ ද එපරිද්දෙන් නිර්මාණයට උචිත අයුරින් ඔහු අත භාෂාව පෙළ ගැසෙන්නේය.

'මහා රාවණා' මා ලියූ 114ක් නිර්මාණ කෘති අතර, මා වඩාත් ම සිත්ගත් නිර්මාණයයි. මේ අත්දැකීමේ ස්වරූපය මට දැනෙන්නේ ද්විතීය ලෙස. මා කොහොමත් රාවණා චරිතයට කැමතියි. ඒ ගැන මූලාශ්‍රය අධ්‍යයනය කළ කෙනෙක්. සප්තකන්‍යා කඳු ආශ්‍රිත සංචාරයකදී මට මේ ගැන විශේෂිත ආශාවක් හා ඇල්මක් ඇති වුණා. මගේ මනසේ පරිකල්පනීය සිතුවම් ඇතුළෙ මම වෙනම ලෝකයක් දුටුවා. ඒ සාරය තමයි මාව මේ කෘතිය ලියන්න සක්‍රිය තත්ත්වයට පත් කළේ. ගොඩක් කල් ඉඳන් මේ මූලාශ්‍රය මගේ මනසේ වස්තුබීජයක් සේ වැඩුණා. සිහින ලෝකයක් වැනි දෙයක්. මේ පරිකල්පනයේ මා අතරමං වුණා'.

ලේඛකයා කියන්නේ යථාව හා පරිකල්පනීය ඉසව්ව අතර පාර සොයන්නා ය. ඔහුගේ මනසේ මැවෙන විචිත්‍රත්වය කෙතරම් ආනන්දනීය ද යන්න සාමාන්‍ය අපට තේරුම් ගත නොහැකි තරම් ය. ඒ පරිකල්පනීය ඉසව්වේ නැති දෙයක් නැත. රාවණා නම් පුරාවෘතය ටෙනිසන් නම් නිර්මාණකරුවා සොඳුරු ඉසව්වකට කැඳවා ගෙන යන්නේ ය. ඒ පරිකල්පනීය ඉසව්ව කෙතරම් විචිත්‍රවත් ද යත් නිර්මාණකරුවා පවා ඉඩ ලද විගස කියවන ස්වකීය නිර්මාණ අතර කැමැති ම නිර්මාණය මහා රාවණා වන්නේය.

නිර්මාණකරුවා කාලාත්‍රය අතරෙන් ගමන් කරන්නෙකි. ඔහුට අතීතය, වර්තමානය හෝ අනාගතය යන කාලාත්‍රයම සිය නිර්මාණකරණයට මූලාශ්‍රය වෙයි. පුංචි වයිරසයක් ලොවක් හොල්ලද්දී

ඇතුළෙ මම වෙනම ලෝකයක් දුටුවා. ඒ සාරය තමයි මාව මේ කෘතිය ලියන්න සක්‍රිය තත්ත්වයට පත් කළේ. ගොඩක් කල් ඉඳන් මේ මූලාශ්‍රය මගේ මනසේ වස්තුබීජයක් සේ වැඩුණා. සිහින ලෝකයක් වැනි දෙයක්. මේ පරිකල්පනයේ මා අතරමං වුණා'.

ලේඛකයා කියන්නේ යථාව හා පරිකල්පනීය ඉසව්ව අතර පාර සොයන්නා ය. ඔහුගේ මනසේ මැවෙන විචිත්‍රත්වය කෙතරම් ආනන්දනීය ද යන්න සාමාන්‍ය අපට තේරුම් ගත නොහැකි තරම් ය. ඒ පරිකල්පනීය ඉසව්වේ නැති දෙයක් නැත. රාවණා නම් පුරාවෘතය ටෙනිසන් නම් නිර්මාණකරුවා සොඳුරු ඉසව්වකට කැඳවා ගෙන යන්නේ ය. ඒ පරිකල්පනීය ඉසව්ව කෙතරම් විචිත්‍රවත් ද යත් නිර්මාණකරුවා පවා ඉඩ ලද විගස කියවන ස්වකීය නිර්මාණ අතර කැමැති ම නිර්මාණය මහා රාවණා වන්නේය.

නිර්මාණකරුවා කාලාත්‍රය අතරෙන් ගමන් කරන්නෙකි. ඔහුට අතීතය, වර්තමානය හෝ අනාගතය යන කාලාත්‍රයම සිය නිර්මාණකරණයට මූලාශ්‍රය වෙයි. පුංචි වයිරසයක් ලොවක් හොල්ලද්දී සසල වෙන නිර්මාණකරුවා එය සිය අත්දැකීම් පරාසයට එක් කර ගන්නේ නවමු ප්‍රවේශයකිනි. විද්‍යාවට නතු නොවන බොහෝ දැ ගැන මිනිසා නැවතත් සිතන කලකදී ටෙනිසන් නිර්මාණකරුවා මේ දෙක අතර පාලමක් තනයි. ඒ නව දැක්ම සහිත නිර්මාණය ඔහු විසින් රචිත ' කොරෝනා කාලේ අබිරහස් කතාව' යි.

'ගොඩක් අයට ප්‍රශ්නයක් මතු වුණා මම කොරෝනා ගැන අත්දැකීම් එච්චර ඉක්මනට ලිව්වෙ කොහොමද කියලා. කතාවේ වස්තුවිෂයය කොරෝනා තමයි. නමුත් මුළු කතාව ම එය නොවෙයි; චරිත ඉන් පරිබාහිරයි. කොරෝනා කාලෙ වුණත් ගැහැනියට, පුරුෂයාට යන්නේ ය. ඒ පරිකල්පනීය ඉසව්ව කෙතරම් විචිත්‍රවත් ද යත් නිර්මාණකරුවා පවා ඉඩ ලද විගස කියවන ස්වකීය නිර්මාණ අතර කැමැති ම නිර්මාණය මහා රාවණා වන්නේය.

නිර්මාණකරුවා කාලාත්‍රය අතරෙන් ගමන් කරන්නෙකි. ඔහුට අතීතය, වර්තමානය හෝ අනාගතය යන කාලාත්‍රයම සිය නිර්මාණකරණයට මූලාශ්‍රය වෙයි. පුංචි වයිරසයක් ලොවක් හොල්ලද්දී සසල වෙන නිර්මාණකරුවා එය සිය අත්දැකීම් පරාසයට එක් කර ගන්නේ නවමු ප්‍රවේශයකිනි. විද්‍යාවට නතු නොවන බොහෝ දැ ගැන මිනිසා නැවතත් සිතන කලකදී ටෙනිසන් නිර්මාණකරුවා මේ දෙක අතර පාලමක් තනයි. ඒ නව දැක්ම සහිත නිර්මාණය ඔහු විසින් රචිත ' කොරෝනා කාලේ අබිරහස් කතාව' යි.

'ගොඩක් අයට ප්‍රශ්නයක් මතු වුණා මම කොරෝනා ගැන අත්දැකීම් එච්චර ඉක්මනට ලිව්වෙ කොහොමද කියලා. කතාවේ වස්තුවිෂයය කොරෝනා තමයි. නමුත් මුළු කතාව ම එය නොවෙයි; චරිත ඉන් පරිබාහිරයි. කොරෝනා කාලෙ වුණත් ගැහැනියට, පුරුෂයාට තියෙන පොදු ගැටලු ම තමයි මේ කතාවේ චරිත වලටත් තියෙන්නෙ. කොරෝනා දොස්තර මම නිර්මාණය කරන්නෙ යම්කිසි අබිරහස් ආකාරයකට. එයයි මෙහි විශේෂත්වය. අනීස් මෙහි කේන්ද්‍රීය චරිතය. ඔහු තමයි මේ දොස්තර කවුද කියන එක පාඨකයාට පෙන්නුම් කරන චරිතය. මට ඕන වුණේ මේ අපි හැමෝම අත්විඳින දේ විශ්වීය වින්දනයක්, විශ්වසනීය ප්‍රවේශයක් සේ නිර්මාණකරණයට ගන්න. ඒක සාහිත්‍යමය රූපකයක් ලෙස භාවිතයයි මට අවශ්‍ය වුණේ. දළ සිතිවිලිවලට වඩා පරිකල්පනයට ප්‍රධාන තැනක් ආවෙ එහෙමයි. අපේ ජීවිත ඇත්තෙන් ම ඔක්කොම අබිරහස්. ඒ කොරෝනා නිසා නෙවෙයි; මිනිස් ජීවිත කියන්නෙ කොහොමත් අබිරහස් දෙයක්'.

නිර්මාණකරණය, නිර්මාණකරුවා තරම් ලෝකය හා ලෝකයේ සංසිද්ධි සුන්දරව දකින වෙනත් පාර්ශ්වයක් නැති තරම් ය. පරිකල්පනයෙහි මුල් හට ගන්නේ ස්මෘතියෙහි ය; ස්මෘතිය මතු වෙන්නේ මානුෂීය සත්තාවන්ගෙනි. නිර්මාණකරුවාගේ සිතේ නිමක් තෙරක් නැතිව මතුවෙන කල්පනා; ජීවිතය විවර කරන කල්පනා ය. ඒ කල්පනා ජීවත් වීමේ ආශාව අවුළුවාලයි. නිත ප්‍රේමයෙන් පුරවයි. එවිට ජීවිතය තනිකමෙන් පිරෙන්නේ, ඔද්දල් වෙන්නේ නැත. ඒ සිතිවිලි නිර්මාණකරුවා මතු නොව පාඨකයා ද රැගෙන මුළු මහත් විශ්වය පුරා සරන්නේ ය. ටෙනිසන් පෙරේරා ද එකී විශ්වීය පරිකල්පන ලෝකයේ නිරන්තර සැරිසරන්නෙකි. දශක අටක දිවි සැරිය ඇතුළත ශතක කිහිපයක වැඩ කරන්නට ටෙනිසන් පෙරේරා අප ජ්‍යෙෂ්ඨ ලේඛකයාට හැකි වන්නේ මෙකී පරිකල්පනාත්මක ඉසව් ස්පර්ශයේ ලා දක්වන අපූර්ව කුසලතාව නිසා ය.

පිපෙන්නට හැක්කේ මල් වලට පමණක් නොවේ; පියාඹන්නට හැක්කේ කුරුල්ලන්ට පමණක් නොවේ. හදවත මෘදු කළ හැක්කේ සඳවතියට පමණක් නොවේ. නිමක් නැති සිතිවිලි පිරි චමත්කාරජනක අපූර්ව හදවතක් හිමි ඕනෑ ම කෙනකුට ඒ පරිකල්පනීය ලෝකයේ සැරිසරන්නට තහනමක් නැත.

නිමැවුමක පෙරනිමිත්ත

● සුමුදු චතුරාණී

ආලේ කොරෝනා

● සුරේඛා සමරසේන

එය 'කාමරයක්' තුළින් පටන් ගෙන එය තුළ ම අවසානයට පත්වන කතාව කි. ඔවුන් එකිනෙකා ආමන්ත්‍රණය කරනු ලබන්නේ සුජාන් සහ ටෙක්ලා යන නම් වලිනි.

ඔහු සහ ඇය අතර සම්බන්ධය ඇරඹී තිබෙන්නේ, 'කෙහෙල්මල් කොරෝනාව' රට තුළට ඇතුළුවන්නට කලිනි. මාතර කොල්ලකු වන සුජාන් කොළඹ සිටියදී, හදිසියේ ම එය ලොක්ඩවුන් කරන අතර දිස්ත්‍රික්ක අතර ගමනාගමනය ද වහා ම ක්‍රියාත්මක වන පරිදි අත්හිටවේ. ඉන් අනතුරුව, පූර්ව සැලසුමක් නැතිව ම සුජාන් ට ටෙක්ලා ගේ කාමරයේ නවතින්නට සිදු වේ. එමෙන් ම එතැන් සිට, දින 46 ක් ඔවුන් දෙදෙනාට එකට ජීවත්වන්නට ද සිදු වේ.

එහෙයින් චිත්‍රපටය පුරාවට ඇත්තේ, ඔවුන් දෙදෙනා අතර වන සංවාද, සංවාස සහ ගැටුම් ය. ඒ අනුව සාර්ව අර්ථයෙන්, එය කොරෝනා වසංගතය තුළ පොදුවේ අප සියලු දෙනාට ම විඳින්නට වූ ක්ෂතිමය අත්දැකීම් ප්‍රමාණයක් ප්‍රතිනිර්මාණය කරන ගමන් ක්ෂුද්‍ර අර්ථයෙන්, 'X සහ Y නම් වූ පෙම් යුවළක ගේ' (සුජාන්-ටෙක්ලා) ජීවිත වලින් 'පෙත්තක්' ද අන්වික්ෂණය කරයි.

මේ ආකාරයට චිත්‍රපටය යෝජනා කරන්නේ, බොරුව , පශ්චාත් නූතන ප්‍රේම සම්බන්ධතා වල අනිවාර්ය කොන්දේසියක් හැටියට බාරගැනීමට තරම් නම්‍යශීලී වන ලෙස යි.

චිත්‍රපටය තුළ අපට හමුවන සුජාන් සහ ටෙක්ලා යනු, බොරුකාරයන්-කාරියන් නොගිනිය හැකි ප්‍රමාණයක් අතර සිටින තවත් එක් පිරිමියෙක් සහ තවත් එක් ගැහැනියක පමණි. ඔවුන්ගේ විශේෂත්වය වන්නේ, කොරෝනා ලොක්ඩවුන් එක විසින් ඔවුන්ගේ සම්මත සහ අසම්මත සම්බන්ධ දෙක මාරු කරගැනීම සඳහා අතිශයින් ම දුර්ලභ වූ අවස්ථාවක් ලැබීම නිසා ය. එනම් දෙදෙනා කාමරය තුළ අලුතින් ජීවිතය පටන්ගන්නේ, අනාගතයේ විවාහ වන්නට පෙරුම්පුරන පෙම් යුවළක් මෙනි. එහිදී ඔවුන්ට තම තමන්ගේ 'විවාහකයන්' ට දුරකතන ඇමතුම් ගන්නට සිදුවන්නේ හොර රහසේ ය. එය ඉතාම නාටකීය උත්ප්‍රාසයකි.

ඊට අමතරව මේ දෙදෙනා ට ම සම්බන්ධතා දෙකකුත් ප්‍රමාණවත් නොවී තව තවත් හොර චැට් කිහිපයක් නඩත්තු කිරීම සඳහා ද කැලි අහුලන්නට සිදුවී තිබේ.

මෙම චිත්‍රපටය තුළ බොරුව අති විශිෂ්ට ලෙස වැඩ දමයි.

ටෙක්ලාගේ කාමරයට පැමිණි මුල් ම දවසේ සුජාන් ට ටෙක්ලාගෙන් ග්‍රීන් ටී එකක් ලැබෙයි. සුජාන් එය බොන්නේ රසයි කියමිනි. එහෙත් සුජාන් කියන්නේ, පට්ටපල් බොරුවකි.

''බොරු කියන්න එපා මිනිහෝ... ග්‍රීන් ටී රස නෑ....''

ටෙක්ලා ඇත්තක් කියන්නී ය. සමහර විට චිත්‍රපටය පුරාවට ම ඇය විසින් කියන ලද එකම ඇත්ත එය පමණක් ම විය හැකි ය. ඉන්පසුව ඇගේ මුවින් නික්මෙන්නේ ම අන්දෝ සංසාර බොරු ය.

බොරු කීමෙන් සුජාන් ද ටෙක්ලා ට දෙවැනි වන්නේ නොවේ.

ඔහු මාස්ක් බිස්නස් එක ගැන ටෙක්ලාට කියා තිබුණේ බොරු ය. එහෙයින් කම්මැලි නැති ධෛර්යවන්ත දකුණේ කොල්ලකු බවට සුජාන් පිළිබඳව ටෙක්ලාගේ මනසේ සැදී තිබුණු බබල් එක බිඳී යන්නේ ය.

මේ අතර ටෙක්ලා, සිය සැමියා (අප්පච්චි) සමඟ දුරකථන සංවාදයක සිටින අවස්ථාවක සැමියාට 'විසිල් හඬක්' ඇසේ.

''කවුද ඔය පිරිමි කෙනෙක් විසිල් කරනවා ඇහෙන්නේ...?'' ඔහු අසයි.

''ටී.වී. එකේ ෆිල්ම් එකක් යනවා අප්පච්චි. ඉන්න මං ඕෆ් කරන්නං. '' ඇය කියයි.

මේ අතර ටෙක්ලාගේ ෆෝන් එකට සිග්නල් මදි වන අතර ඇගේ බඩ ද හදිසියේම අප්සෙට් වී, ටොයිලට් යාමට ද සිදු වෙයි. මේ සියල්ල ම පට්ටපල් බොරු ය.

මේ ආකාරයට ටෙක්ලාට සුජාන් නිසා බොරු කියන්නට සිදුවන්නේ, සිය සැමියාට පමණක් නොවේ. ඇයට සිය ගෙහිමි කාන්තාවට ද බොරු පිට බොරු කියන්නට සිදු වේ. ඒ මුලින් ම සුජාන් ව තම ඇනෙක්ස් එකේ නවත්වා ගැනීම වෙනුවෙනි. ඇය කිව්වේ, සුජාන් ඇගේ මල්ලි කෙනෙකු වන බව ය.

සුජාන් ට සහ ටෙක්ලා ට ලොක්ඩවුන් දින 46 ගත කරගැනීමට අවශ්‍ය කෑම බීම ටික උපයා සපයාගැනීම වෙනුවෙන් දහ අතේ බොරු කියන්නට සිදුවීම බේදජනක ය. සුජාන් ට ඒ වෙනුවෙන් කී දෙනෙකුට නම් බොරු කියන්නට සිදුවීද? මේ අතර ලක්ෂ 15 ක් මුදල් වංචා කළ සුජාන් ගේ හවුල්කාරයා ද සුජාන්ට බොරු කීවේ ය. ඒ වෙනුවෙන් පොලිකාරයන්ට බොරු කියන්නට සිදුවූයේ සුජාන් ට ය.

මෙහිදී අපට පෙනෙන්නේ බොරුව ප්‍රේම සම්බන්ධතා වල සිට මිත්‍ර සම්බන්ධතා වෙත ද ආසාදනය වන ආකාරයකි.

මේ අකාරයට චිත්‍රපටය සිය කතා ශරීරය ම වසාගෙන සිටින්නී, බොරුව නම් වූ හැවෙනි. දර්ශනයෙන් දර්ශනයට කරනු ලබන්නේ ඒවා එකින් එක ගලවා ඉවත්කර දැමීමයි.

චිත්‍රපටය තුළ බොරුව මොන තරම් සූක්ෂමව විග්‍රහ වී තිබෙන්නේද යත්, එකිනෙකාට ප්‍රේම කරන්නේ යැයි කියන ගැහැනියක සහ පිරිමියකු නිදාගන්නා කාමරයක් තුළ දින ගණනාවක් ම කොන්ඩමයක් පවා විශාල රැවටීමකට ලක්වේ. මන්ද ඔවුන් දෙදෙනා කොන්ඩමයෙන් ලබා ගන්නේ එයින් ගැනීමට නියමිත සේවය නොව, වෙනස් ම ආකාරයේ සේවයකි. එනම් එම කාමරය තුළ පැස්සවීම සඳහා සූදානම් කර තිබෙන වයින් බෝතලයේ කට සීල් කිරීම ය. මෙය නම් ඉතා ම සූක්ෂම වූ උත්ප්‍රාසයකි.

කෙසේවෙතත්, එක්තරා රාත්‍රියක දී, එනම් වයින් බෝතලය පාවිච්චියට පත් කරයි.

''තක්ෂිලා - තකී වුණා; තකී - ටකී වුණා; ටකී - ටෙකා වුණා; ටෙකා - ටෙක්ලා වුණා...'' ටෙක්ලා උඩ බිම බලමින් සිටින සුජාන් ට පැහැදිලි කර දෙයි.

මෙහිදී 'බොරුවෙහි තිබෙන තර්කානුකූල භාවය' විස්මය සහගතය.

අවසානයේ දී දෙදෙනා ම තමන් විවාහකයන් බව එකිනෙකාට පවසා ගැනීමේ 'උච්ඡතම අවස්ථාවට' එළැඹෙයි. එහිදී දෙදෙනා ම පසුතැවෙන්නට පටන්ගන්නේ, තම තමන්ගේ විවාහක අනෙකා රැවටීම සම්බන්ධයෙනි. විශේෂයෙන් ම සුජාන් හැසිරෙන්නේ හංස විලේ නිශ්ශංක හැසිරුණු ආකාරයට සෑම අතින් ම සමාන වූ ආකාරයට ය.

මේ අවස්ථාවේ දී, ව්ලැදීමීර් නබකොව්ගේ 'ලොලිටා' හි එන (ප්‍රේමයෙහි රැවටීම පිළිබඳ) අපූරු දෙබස සිහිපත් වේ. එනම්, තමා රැවටුණු බව කියමින් හඬ හඬා සිටින ලොලිටා ට හම්බර්ට් කියන දෙයයි.

''ඕ... ලොලිටා... ඔයා අඬන්න එපා... මට සමාවෙන්න... මම ඔයාව ගොඩක් රැවැට්ටුවා... ඒත් ඒක ම තමයි ආදරේ හැටි...''

රූපරාමුවෙන් රූපරාමුවට නොව, බොරුවෙන් බොරුවට ඡේදනය වන රූපරාමු අතර තමන්ගේ ජීවිතය ද, තමන්ගේ ජීවිතය නම් වූ බොරුව ද අලුතින් නරඹන්නට ප්‍රේක්ෂකයා පොලඹවයි.

මේ අතර මෙම චිත්‍රපටිය 'නැරඹීමට අසීරු' චිත්‍රපටියක් වන බව ඇතැමකු ලියා තිබුණි. එය සැබෑ ය. චිත්‍රපටයේ රූප රාමු වලින් 90% ක් පමණ ම රුගත වී ඇත්තේ, එකම කාමරයක ය. බොහෝ විට එහි රඟපාන්නේ ද දෙදෙනෙකු පමණි. කාමරය තුළ තිබෙන කුඩා මාළු ටැංකියෙහි සිටින මාළුවන් දෙදෙනා මෙන් නළුවා ද නිළිය ද කාමරය තුළ අඩස්සි ගතකර කොරෝනා කාලයේ දීම තැනූ චිත්‍රපටයක් වන නිසා නැරඹීමේ අපහසුව දරාගත යුතු බව සිතේ. එහෙත්, නිර්මාණකරුවන්, තව ටිකක්වත් නිර්මාණශීලී වෙමින්, එකී අපහසුව යම් පමණකටවත් ඉවත් කර තිබුණේ නම් මැනැවි.

දීපානි

(නො)දුටු සිහිනය

අඳුරත් නිදියන මොහොතේ
තුන් යම අලුයම සිහිනේ
මටම නොතේරෙන සිහිනය
ආයෙත් දුටුවා ....

යෞවනයම දොර මුල්ලේ
අතීතයම ගෙයි සාලේ
කළ යුතුකම් වක්කඩයේ
හරි වේගෙන්
ලොව කැරකෙනවා....

සෙවණැල්ලයි පසුපස්සේ
අවුරුදු යයි හැටට හැටේ
ආපස්සට ගිය දින ගන්නට
හරි හයියෙන්
මහපොළව කැරකුවා...

කවුරුත් කොපමණ හිටියත්
මටවත් මා නොමැති වෙලේ
ගියහැම ගෙන්වනු කුමටයි
මගේ හිත මට සැරකෙරුවා..

සැමදේ අස්ථිර ලෝකේ
විමසා කුමටද සිහිනේ
අලුත් දිනක් පැමිණේදැයි
අනේ ඇත්තට සැක සිතුණා..

● ප්‍රියානි. පී. රණසිංහ

අපේ ගෙදර

ඔබේ විසල් මාළිගයේ
පුංචිම කුටියටත් වඩා
හරිම පුංචි අපේ ගෙදර
දවසක ඔබ එන්න හොඳේ.

ඔබෙ සැප වාහනය ගන්න
පාරක්වත් නැහැ හරියට
ඒක පාර අයිනෙ තැනක
නවත්තලා එන්න වේවි.

ඔබෙ ලස්සන සපත්තුවල
උඳුපියලිය තණපත්
අපෙ මිදුලේ ඇති
දිය මඩ දූවිලි තවරා
කැත කරන්න
ඉඩ තියෙනව...

අතු ඉති හුළඟට වැස්සට
තාප්පයට ඉහළින් පැන
අනුන්ගෙ වතුවලට වැටී
ගසක් පවා බැණුම් අසන
පොඩි ඉඩමක...

අපේ ගෙදර බලා ගන්න
නිවාඩුවක් ලැබුණොත් ඔබ
නිකමට මෙන් එහේ එන්න....

● කේ.පී.ඩබ්ලිව් ප්‍රියන්ත ජයලත්.

පිරිමි හිත්

තලාවක ගොරෝසුව මරන්න ම බැරි තැනක
ලියැලුනේ කොහොම දෝ ලතාවක මුල් පුරුක
හෙණ ඇදෙන ගිරි පවුර මත ඇදුන ලේ දමක
තෙත කිරට සිදනු බැරි , මට නුඹට කිසි දිනක

පිරිමි හිත මැද එබුන තුන් කුලේ ප්‍රේමයට
කප්පරක් ඉඩ තියේ අවැසි තැන මතුවෙන්ට
හිස් අහස සිබ ගලෙක තුරුලතට මැදිවෙන්ට
ලියතුඩක් පාරමී පුරන්නැති ගව් දුරට

දැඩි බවින් ඔද වඩන ඔහු හදේ සිතිවිල්ල
තුන් වරක් තුන් විටෙක පසා වෙයි වී මෙල්ල
මවු, බිරිද , දූ නමින් හිතේ මැද ළතැවිල්ල
ළගදී උණුවේ හිතත් නොදෙඩුවත් වැලපිල්ල

● අමාදි සංජනා දසනායක

ඔබ සොයන්නෙමි

දූවිලි රුදුණ ගිනියම් අහස යටට...
වරින් වර ඔබ එයි අලුත් හුස්මක්ව...
සිප ගන්න සිතුණත් වැළඳගෙන ඔබව..
හඳුනන්නත් බැරිවෙයි ඔබට දැන් මාව...

ලා දලුත් පිරුණු තුරු ලතා අතර
රහසෙ තුරුලු වුණ වාර අනන්තය..
ගසාගෙන ගියත් කාලයේ සුළඟට
තාමත් ඔබ මගෙ හිතට සමීපය..

අවසාන නැවතුම කොතනද නොදැන
අපේ සබන්ධකම් රකින්න අසීරුය...
දාහක් දෙනා සිටියත් පෙනෙන්නට
ඔබව සෙවීම නතර නොවෙයි හෙටද....

● සඳරුවන් කරුණාතිලක

පුර සඳ පාමුල

කණමැදිරි එළියකි පවතින
නිවී නිවී යළි දැල්වෙන
සියක් තරු මල් සොඳුරු පුරහඳ
අසල සැඟවී පවතින

නමුත් තත්පරයකුදු වැඩකින්
තොරව ඉවතට නොමලන
පුංචි තනි තරුවක් දිටිමි
එක රැක පුරහඳ නැතිවුණ

අමාවක උව සිනාසෙන
තරු පොකුරු මට එල නැත කිසිත්
අහස් ගැබ කිසි කෙනෙක් නොදකින
පුංචි තරුවකි මහ මෙරක්

දිනක අහසම එළිය කරවන
මහා තරුවක් වන තුරුත්
පුංචි තරුවම ලුහු බදිමි
පුර සඳම පාමුල වැතිරුණත්

● පියුමි මදුභාෂිණී

ඔබේ කවි නිර්මාණ
පහත ලිපිනයට එවන්න
කවි සිළුමිණ,
ලේක්හවුස්, කොළඹ 10.
විද්‍යුත් තැපෑල -
edmediaunit@gmail.com

කවි සිළුමිණ
සංස්කාරක - ඉනෝකා සමරවික්‍රම

උපැස් යුවළ

ඔබ පැළැන්දූ
අපූරු උපැස් යුවළ
ගලවා තබමි පසෙක
බලමි දැසින්
මෙතෙක් නුදුටු දැ දෙස

● සංජය ප්‍රියදර්ශන

කඳුළෙන් උපන් ගැහැනිය

මරා දමන මිනිසත්කම දැක දැක ම
සරාගික ම මරු අබියස කෙළින් සිට
දරා නිබඳ දුක් දොම්නස් සැඩ පහර
පෙරා ගත්තෙ කෝ මැයි ඔය ඉවසීම..

පිදුරු වෙවී ගිය ගැමිකම දැන හැඳින
මිතුරු කළා සිනමාවට පියාපත
ඉතුරු කළා ලේ නැකම් කලාවට
අතුරු කතා තව මොටදැ ස්වර්ණාට..

සිතේ තිබුණු දුක අඹරා සයිමන් ද
වතේ ඇඳුණු දම්සිරිගේ සිතුවම් ද
අතේ තිබී දුන් ගානයි රඟපෑම
පතේ බෙදා ගත් බත දුන්නේ දුකට...

කින්නරාව කිඳුරා නැති පැල්පතක
බින්න බහින්නට දුන්නේ නෑ යකුට
කන්න නැතත් ගේ හරියක වේලකට
දන්න දේ තමයි දහදිය වැපිරීම...

අගල්වලට නොවැටී යන බව සසර
දවල් රෑත් ගෙයි ඇතුළත එළිය කළ
දවුල් ගසා පවසන්න ද නෙක වරුණ
විසල් කරළියෙහි නම තැබූ විට මුලට

● ආරියපාල රත්නායක

අහසත් හැඬුවා

සීතලට ගුලි ගැහුණු
අඳුරු සෙවණැලි එක්ක
තෙතම තෙත පිණි කඳුළ
ගලන ඒ මඟ තොටක

සුපුරුදුම උණුසුමක්
ළෙන්ගතුම සෙනෙහසක
මඟ හැරුණ එක දිනෙක
පා වුණා සුසුම් පොද

මලානික සිතක් තුළ
දියාරුම හීනයක
නිදන් ගත නිධානය
මිය ගියා නොසිතුයුර

ලැබුණු අත් තවු එක්ක
පියඹලා දුර ඇත
නිමක් නැති අනන්තෙක
සැඟවිලා තිතක් ලෙස

සැඟව ගිය ප්‍රේමයක
මලගමේ මතක බණ
කියා නිමවන විටෙක
හඬා වැටුණා අහස

● තුෂාරි ජයසිංහ

අප බාලෙ පැතූ සිහින

ගැට පිච්ච මල් පොකුරු දිග කොණ්ඩෙ දවටා
ගඳපාන මල් කළඹ මගෙ දෑතෙ රන්දා
සේපාලික මල් ඉඟි බිඟි කරද්දි
ඔබ මාගෙමයි කිව්වා....

පැතූ අයුරු දෙදෙනාම ප්‍රේමෙන් වෙළා
අවුරුද්ද අවුරුද්ද ගෙවිලා ගියා
අප අතර අඬදබර වැස්සක් ගෙනා
මගෙ මිතුරි ඔබේ හදට එබිකම් කළා...
....
මට අහිමි රන් මුදුව ඇගෙ සුරතෙ පලඳා
සුදු රෝස මල් කළඹ ඇගෙ දෑතෙ රන්දා
සිහින විසිරී මගෙ හද අඬද්දි
ඔබ මගෙන් වෙන් වූවා....

අප බාලෙ පැතූ සිහින පොඩිකර දමා
මගෙ ලෝකෙ සඳ ඇත නොපෙනී ගියා
හද මාගෙ තනි වේවි ජීවිතෙ සදා
හැමදාම මම ඔබට ආදරෙ නිසා

● ශ්‍යාමලී ඇල්විටිගල

අනිත්‍ය

හැරෙන හැරෙන අත නැවෙන
පොල් අතු කොයිද සම බර
වැටුන විට අත්තක් බිමට
ගොක් අතු සිනාසෙයි
රගය නොම දැන...

බැබළි බැබළි දිස්නෙ දුන්නට
ලිපට අළු වී
පොළවට පස් වන දාට
කැටයම් ගැලවී
මෝස්තර ලෙහෙන කොට
ආ මඟ දුර වෙයි
ආපසු හැරෙන්නට...

● සවී ජයතිලක

වැලන්ටයින්

තෑගි කිසිවක්ම එපා මට මේ සැරේ
හැකිනම් විතරක් කියා දියන් මට
කැඩෙන හිත් හදන මන්තරේ
ආලවන්තකම් කොහෙත්ම නෑ
දැන්නම් නුඹ කෙරේ
වාසගම තිබුණොත් ඇති මට
කට වහන්න මගෙ සනුහරේ

● ඒ.ඒ. බදුර්නිශා

පහම සීයයි

තවමත් අක්කණ්ඩි
මං උඹේ පාරෙම
යනවා ඔරු කඳට
සීපද කිය කිය ඒ

සුදු නෙලුම් අරගෙන
තාමත් වැවේ නෙලුම්
පිපිනෙවා නෑ ලස්සන
හබල් පාරට මාළුවෝ
නුඹෙ රුව මවනවා
අඳුරෙම

කියක් වටිද? මගේ හදවත
අක්කණ්ඩි උඹ හින්දා
විකුනුණා සීයට
අතේ තිබ්බ මල් මිට
උඹට මතකද? අපේ නංගිව

අකුරු හොයනවා දැන් තනියම
සුදු ගවුම මං ඇට තෑගි කෙරුවා
අප්පච්චි මැරුණු දවසෙම
ගන්නකො "මේ පහම සීයයි"
ඔන්න එතකොට රව රව
"උඹත් ගිලෙන්නද? හදන්නේ"
අහනවා මගෙන් සොරබොර වැව

● නදූෂ මදුරංග

විදෙස් කවිය

ගිනි සහ හිම..

ලෝකය වැනසී යන්නේ
ගින්නෙන් යැයි අයෙක් කියති
හිම සිසිලෙන් වැනසේ යැයි
කියනා තව පිරිසක් වෙති...

සිත් තුළ ගිනි සේ දැවෙනා
ක්‍රෝධය ,තණ්හා,ආශා
ගැන මෙතුවක් අත්විඳි දේ
පසක් කරයි මා හට -එය
ඒ ගින්නෙන් වැනසෙන බව...

ඉනුත් නොසැහී ලෝකය
දෙවරක් වැනසී යා නම්
සැඟවුණු සීතල වෛරය
තැවුල් රිදුම් නොහැඟෙන සේ
උදාසීන නොරිදෙන සිත්
සැහෙයි හොඳටම හෙමිහිට
ගැඹුරට ,ඉහළට මිදෙමින්
ග්ලැසියර වී වනසන්නට
ලෝකය හිම යායක් යට...!

ඇමෙරිකානු ජාතික කවියා ලෙස සැලකෙන Robert Frost (1874-1963) විසින් 1920 දී පළ කළ Fire and Ice කවියේ සිංහලානුවාදය .

පළමු ලෝක යුද්ධය ආසන්නයේ දී ලියැවුණු මෙය ලෝක විනාශය පිළිබඳ කතා කරයි. යුද ගිනි උපදින්නේද මිනිස් සිත් තුළින්මය. එනිසාම සිත් තුළ උපදින උණුසුම් හෝ සීතල සිතිවිලි ලෝකය වනසන්නට හේතු විය හැකි බව කවියා දකියි . භෞතිකව සිදු වන ලෝක විනාශය ට එහා ගිය ගැඹුරු දහමක් පිළිබඳව මින් කියැවෙයි.

කුමුදිනී වේලාරත්න

සතියේ කවිපොත

කෘතිය- නිස්සංක බස් එකෙන් බහින්නෑ මිරැන්ඩා "මොකද කියලා හැබැයි කියන්නෑ"
කර්තෘ - කුමාර හෙට්ටිආරච්චි
විමසීම් 077 2362222
මිල රු: 500 පිටු 160
සන්ථව ප්‍රකාශනයකි

"නිවන් දක්නා ජාති දක්වා අපි කවිත් එක්කම හමුවෙමු." කලක පටන් ඒ කුමාරගේ එකම ප්‍රාර්ථනයයි. කවි ලියන්නට උපන් හපන්කම් තිබේ යැයි කිසිත් නොසිතාම කිව හැකි කුමාර හෙට්ටිආරච්චි කවියාගේ මුල්ම කවි පොත එළිදකින්නේ 1985 වසරේදීය. ඒ සක්මන් මළුව කාව්‍ය සංග්‍රහයයි. දෙවැනි කාව්‍ය සංග්‍රහය භෂ්මාවශේෂ ය (1986). තුන්වැන්න රුවන් සක්මන ය (1989). හතරවැනි කාව්‍ය සංග්‍රහය වන මහද්වීපය (1990) වසරේ රාජ්‍ය සාහිත්‍ය උලෙළේදී විශිෂ්ටතම කාව්‍ය සංග්‍රය වෙනුවෙන් සම්මානයට පාත්‍ර විය. ඉන් පසු එළිදක්වන ලද සදාකාලික මධ්‍යාහ්නය කාව්‍ය සංග්‍ය 1992 වසරේදී රාජ්‍ය සාහිත්‍ය උලෙළේදී සම්මානයට පාත්‍ර විය. සම්මානගත් පමණින් නොනැවතුන කුමාර හෙට්ටිආරච්චි කවියාගේ කවි මඟ අද නව මඟක් ගෙන ඇතැයි ඔහුගේ කවි කියවීමේදී විඳීමේදී සිතේ.



වර්ණනා, ප්‍රශස්ථි නොව සමාජ යථාර්ථය සමාජ පීඩිතයන්ගේ දුක කඳුළ ඔහු තම කවියට අනුභූතිය කොටගෙන ඇත.

පසුගිය කාලයේ එළි දැක්වූ ඔහුගේ කවි පොත් අතර අලුත්ම කාව්‍ය සංග්‍රහය වන්නේ නිස්සංක බස් එකෙන් බහින්නෑ මිරැන්ඩා... "මොකද කියලා හැබැයි කියන්නෑ". යන්නය. දැන් දැන් ඔහුගේ කවි පොතේ නමද එක් කවි පෙළක කවි පදයක් වැනිය.

අද වන විට අපට බොහෝ නව කවියන් හමුවන්නේ මුහුණු පොතෙනි.

ඒ කවි සාර්ථක ද නැද්ද,,, එහෙමත් නැත්නම් මේ කවි නැවත නැවතත් කියවා බලා ලියැවෙනවාද, තමා විසින්ම සංස්කරණය කරනවා වෙනමම කතාවකි. කොහොම නමුත් කුමාර ලියන ඇතැම් කවි වල ඇත්තේ වචන පමණක් ද , එහෙමත් නැත්නම් ඔහු වචන වලින් හරඹ කරන්නෙක් පමණක්ද යන සිතුවිල්ලක් ද සිත ඇති වේ. ඒ කෙසේ වෙතත් අද වන විට වචන වලින් අපූරු හරඹ කිරීමේ අත්දැකීමට ගැළපෙන අයුරින් එහි අර්ථය මතුකර දක්වන්නට ඔහු තුළ ඇති හැකියාව කෙබඳුදැයි දැන ගන්නට නම් කුමාරගේ කවි කියවිය යුතුමය. සීගිරියට එන්නේ දේශීය සංචාරකයන් පමණක්ම නොවේ. විදේශිකයෝද වේ. ඒ එන්නේද මුදල් ගෙවාය.

ඊයේ අද පමණක් නොව සියවස් ගණනක් තිස්සේ මේ ලාලනියෝ ඉන්නේ නිරුවතිනි. එක් වරක් නොව ගැනිය නොහැකි තරම් වතාවක් ඔවුහු නිරුවත් වී ඇත සිය දහසක් දහ දහසක් මිනිසුන් ඉදිරියේ. කුමාර කියන්නේ සීගිරි ගලේ ඇඳි ස්ත්‍රී රුවටත් පණදෙන කතාවකි.

සැබැවින්ම පණ ලද්දේ නම් ඔවුන් කාශ්‍යපගෙන් ඉල්ලනු ඇත්තේ මෙවැනි ඉල්ලීමක් ම වනු ඇත. මේ කියන්නේ අප එකල සිට අද දක්වා සිතිය යුතු කරුණකි.

කුමාර හෙට්ටිආරච්චි

මාතෘකාව සීගිරි අප්සරාවන්ගේ බැගෑපත් ඉල්ලීම.

ඉතිං දැන්වත් අපිට
ගෙදර යන්න දෙන්න
අම්මා අප්පා නැතත්
පැල්පතෙන් පැල්පතට
තාම ඇති අපේ උන් මඟ බලන්...

අපට රන් රිදී මසුරන් එපා
පැළැන්දූ ආභරණ ඔබ ගන්න
කුදලගෙන ආ දවසේ අපෙන් උදුරා ගත්ත
රෙද්ද විතරක් දෙන්න
අවසරයි රෙදි ඇඳන් අපට ගම රට යන්න..

කාලය වෙනස් වූවාට මිනිස්සුන්ගේ දුක්ඛ දෝමනස්සයන් එමටය. බුදුන් දවස සිටි කිසාගෝතමීලා, පටාචාරලා ජනපද කල්‍යාණිලා අදත් මේ සමාජයේ වෙසේ. ඒ යුගයේ හැටියට වෙසස් වූ අය වුවද මේසැවොම දවස ගෙවන්නේ වැලපෙන්නේ ජීවිතය වෙනුවෙනි.

ගමනක් බිමනක් යාමට ප්‍රයිවෙට් බසයකට ගොඩ වූ විට මේ සියල්ලෝම අපට මඟතොටේදී හමු වේ.

ඇතැමෙකුගේ අහිංසකකම, වේදනාව, කපටිකම, බොළඳකම මේ සියල්ල කවියා මෙසේ ලියයි. මාතෘකාව කිඹුල්වත් පුරෙන් මටබහින්නත් හිතෙනවා. මේ එහි අවසන් කවියයි.

ජනපදේ කල්‍යාණි මගෙ ළඟම ඉන්නවා
නන්ද කුමරුගෙ සෙල්පි බල බලා අඬනවා
මෙතෙක් නොකියූ දෙයක් කියන්නත් තියෙනවා
කිඹුල්වත් පුරෙන් මට බහින්නත් හිතෙනවා..

මිනිසුන් බොහෝ දේ කරන්නේ අත මිට මුදල් ගැවසුනාටම නොවේ. බොහෝ වියපැහැදැම් කර තබන මංගල උත්සව වල නෙක විසූක දස්සන ගැන කවියා ලියන්නේ කියවන්නා තුළ සංකල්ප රූප මතුවන අයුරැනි. මාතෘකාව මංගල සාජ්ජේ.

ලියුම් කවර තුළ මොනරුන් ඔබාගෙන
පවුම් වටින අභරණ උඩ දමාගෙන
රවුම් ගසා කැරකෙති දිව විකාගෙන
ගවුම් නටයි රණතිසරුන් වඩාගෙන..

කුමාරගේ කවි කවදත් අපූරුය. ඔහු මුල් යුගයේ සිටම ඒ කවි මඟ ඔස්සේ යමින් පාඨක විචාරක අවධානය දිනාගත් අයෙකි. ඔහුගේ කවි පොතකින් මෙසේ දකින විට සතියට තුන් හතර වතාවකටත් වැඩි වාර ගණනක් ඔහු ලියන අලුත් කවියක් මුහුණු පොතෙන් දකින්නට ලැබෙයි. ඒ කවි ද කෙටි කවි නොවේ.

අනේ මන්දා මටත් හිතා ගන්නබෑ... මට කවි ලියැවෙන වේගය.. හිතට එනවා මම ලියනවා" කුමාර එසේ පවසන්නේ මහ හඬින් හිනැහීය. ඉදින් එවැනි කවියෙක් මෙවැනි පැතුමක් පැතිමද අරුමයක් නොවේ. **" නිවන් දක්නා ජාති දක්වා අපි කවිත් එක්කම හමුවෙමු."**

මුහුණු පොතෙන් කවියක්

නන්දාටත් වඩා....

නන්දාටත් වඩා බරපතළව
අල්මාරියට ලියුම් විසි කළ
ටැල්කම් පුයර ඉස ඉස ඒවාට
නිරතුරු සුවඳ පැතිරුව
කෙසඟ අතක රැදි වළල්ලක් මෙන්
සියලු රහස් දනිමි මම...

ඔබ ඉකිබිඳින වේලාව
ඔබ දුම්බොන වේලාව
මාව මඟ හරින හෝරාව
පරණ කඳුළු වේළන්නට
කණ්ණාඩිය පිසින ඡායාව
සියලු දේ මායාකර්මයක් සේ
පෙනෙනවා මට....

අල්මාරියේ ලූ
පසුව පුලුස්සා
අමතක කර දැමූවා යැයි සිතූ
නන්දා ලැබූ ලිපිය වාගේ
හැමදේම පවතින්නේ
නොපිටට ම නේද?....

මම; අර රන් වළල්ල
කෙසඟ අත; ඒ මගේ අත
ඔබ
කියවා; නොකියවූවා සේ හැසිරෙන ලියුම.
ආහ්!!! ඒ පියල්ගේ අත් අකුරු.....

● කාංචනා අම්ලානි

● රත්නා ලංකා අබේවික්‍රම

මෙවර කෙටිකතාව ලියන්නේ ප්‍රවීණ ගුවන්විදුලි රූපවාහිනී නිවේදිකාවක මෙන්ම රංගන ශිල්පිනියක වන රත්නාලංකා අබේවික්‍රමය. 1964 වසරේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට එක් වූ ඇය දකුණුලකෙන් බිහි වූ පළමු ගුවන්විදුලි නිවේදිකාවද වන්නීය. කිවිඳියක සහ ගී පද රචිකාවක ලෙසින් සිය නිර්මාණ කෞශල්‍ය පෙන්වා ඇති රත්නා විසින්, සුවඳ කැකුළු, සමනල සිතුවිලි හිතක පිපුණු සුවඳ මල්, උදුල සිත් රූ, මන්දාකිණීය යන කාව්‍ය සංග්‍රහ සහ, දයාබර භාග්‍යා (කෙටිකතා), හිරු සිසිල සහ ගිමාරා යන නවකතා ද ලියා පළකර ඇත.

කෙටිකතාව

පුතාලා

විජේපාල මුදලාලිගේ මිනිය උස්සන්න පැයකට පමණ කලින්, ඔහුගේ ලොකු පුතා සිරිනාථ ගෙට ගොඩ වූයේ, සිය සුදු ජාතික බිරිය රෝස්මරීද සමඟය. සාලය මැද්දේ තබා තිබූ පියාගේ නිසල දේහය ඉදිරියේ, දෑත් එක්කොට වැඳගෙන මඳ වේලාවක් බලා සිටි ඔහු, මිනියට ආචාර, කරන්නැයි තුෂ්ණීම්භූතව සිටි රෝස්මරීටද ඉඟි කළේය. රෝස්මරී තම පපුවට අත තියා, කුරුසය ඇඳ, හිස පහත් කළාය. අනතුරුව, සිරිනාත ආසන්නයේ පුටුවකට බරදී, කඳුළු සලමින් සිටි, සිය මැණියන් වන, සිරියලතාගේ හිස අත ගැවේය.

"මක්කරන්නද අම්මේ.. ජීවිතේ හැටි ඔහොම තමා.. මරණය වළක්වන්න අපි කාටවත් බෑ .. ඒක අපි අමුතුවෙන් අම්මට කියල දෙන්න ඕන නැහැනේ.. අප්පච්චි තමුන් ගෙනා පූර්ණ ආයුෂ විත්දා.. හැම යුතුකමක්ම ඉෂ්ට කළා.. පළාතෙ හොඳ නමක් තියාගෙන ජීවත් වුණා.. ඊට වැඩිය මක්කද.."

සිරියලතා ඉකිගැසුවා මිස කිසිවක් දෙඩුවේ නැත.

මිනියට අන්දවා තිබූ, ළා පැහැති ටුවිට් රෙද්දත්, ඊටම කැපෙන කර වැසූ කෝට් එකත්, මනාව පීරා සකස් කර තිබූ උඩු රැවුලත් නිසා, විජේපාල මුදලාලිගේ මිනිය, දකින්නට ප්‍රිය මනාපව තිබිණ. පෙට්ටියද මිල අධික එකක් විය. මිනිය වටා තබන ලද මල් වඩම් නිසා වට පිටාව ශෝකී ස්වභාවයක් ඉසිලීය.

"වටිනා විල්ලුද කාපට් වලට... මැහෝගනි ලීයෙන් හදාපු පෙට්ටියට.. අලුත් මල් වලින් හදාපු මල් වඩම් වලට ලොකු වියදමක් කරන්න වේවි... මේවයින් සීයට දෙසීයක් ලාබ ගන්නෙ මල් ශාලාවෙ අයිතිකාරයොා... අවමංගල කටයුතු කරන සමහර මල් ශාලා... මිනිස්සු හූරගෙන කනවා.. හැමෝම නෙවෙයි සමහර උදවිය..."

සිරියලතාගේ නුරුස්නා බැල්මට කලබලවූ සිරිනාත, කතාව වෙනත් මඟකට යොමු කළේය.

" මුදල් ප්‍රශ්න ඉහටත් උඩින් තිබුණ නිසා... අපට වෙලාවට ටිකට් බුක් කරගන්න බැරිවුණා... අලි මදිවට හරක් කියන්නැහේ... ප්ලේන් එකත් පැය දහ අටක් විතර පරක්කු වුණා... එයාපෝර්ට් එකේ එහාට මෙහාට ඇවිදලාම කකුල් කඩුත්තුවයි... වැඩිපුර සල්ලි ටිකක් අතේ තිබුණනං... මට අප්පච්චි පණ පිටින්ම බලා ගන්න තිබුණ.. "

සිරිනාත තම ප්‍රමාදයට හේතු කියා පෑවේය.

සිරියලතා, අත එහා මෙහා වනමින්, මිනිය මත වහන්නට ආ මැස්සෙක් එළවා දමන්නට තැත් කළාය.

"ෆැන් එකක් දැම්මනං ..මැස්සෝ එන්නෙ නෑ .."

"ෆැන් එකට මිනිය කළු වෙනව කියන්නෙ .."

සිරියලතා උත්තර බැන්දේ සිරිනාතටය.

" අනේ මැරුණට පස්සේ ..කළු වුණත් සුදු වුණත් මොකටද ..?"

සිරිලතාගේ නිශ්ශබ්ද තාවය නිසාම, සිරිනාත කතාව, වෙනස් මඟකට යොමු කළේය.

"මේ ගැනිත් කරේ එල්ලුනා.. ඒකිටත් ලංකාවට එන්න ඕනමයි කියල.. මට බැහැයි කියන්න බැරිවුණේ.. වියදම් කරන හැම සතයක්ම ඒකිගෙ නිසා.."

රොස්මරී කට ඇරගෙන, සිරිනාත දෙසත්, සිරියලතා දෙසත්, මාරුවෙන් මාරුවට බැලුවද, ඔවුන් කතා කරන කිසිම දෙයක් ඇයට තේරුම් ගත නොහැකි විය. මියුලා රෝස්මරී සමඟ සුහදව සිනාසුනද, කතාවට නොගියේ භාෂා ප්‍රශ්නය හරස්වූ නිසාය. කෑම කන්නැයි මියුලා තම දකුණත මුවට ළං කර ගොළු භාෂාවෙන් කී විට, එය තේරුම් ගත් රෝස්මරී, සිනාසී හිස වනා, තම කෘතඥතාවය පළ කරන්නට තරම් කාරුණික වූවාය.

ගමේ කෑම නුහුරු රෝස්මරීට, එළවළු ටිකක්, බිත්තරයක් තම්බා දෙන්නට, බටර් ගෑ පාන් පෙති දෙකක් දෙන්නට, මියුලා අමතක කළේ නැත. මියුලා රෝස්මරී වෙනුවෙන් තැඹිලි වල්ලක්ද, කප්පවා තැබුවාය. "

මකුළු දැල් කඩල... අලුතෙන් ඇඳ රෙදි දමල.. ලොකු අයියගෙ කාමරේ අස්පස් කරලයි තියෙන්නේ.. එළියෙ කුස්සි කාමරේ කෑම මේසෙත් ලෑස්තියි. තව පැයකින් හාමුදුරුවෝ වඩිනවා පාංශුකුලෙට. ඊට කලින් කාල බීල හිටියොත් හොඳයි "

මියුලා ඇත සිට උස් හඬින් කීවාය.

සිරිනාත නැසුනා සේ සිටියද, රෝස්මරී විමසිල්ලෙන් අවට විපරම් කළාය.

"වටේ පිටේ ඉන්න ඔක්කෝටම කෑම කන්න කියාපන් දරුවෝ. යන එන කාටත් කන්න දෙන්න ඕන."

"හරි..හරි ඒ හැම දෙයක්ම සේනක බලනවා..බෙර කාරයන්ටත් ඉන්න තැන් වලටම කෑම ගිහින් දුන්නා.. තුන්වෙනි පාරට මළබෙරේ ඇහෙනකොට කවුරු කවුරුත් එකතුවේවි කැරකෝප්පුවට යන්න."

අවමංගල උත්සවයේ සියලුම කටයුතු බාර වූයේ, මියුලාගේ සැමියා වන සේනකටය. පාංශුකුලය සඳහා, හාමුදුරුවන් හය නමක් වැඩම කළහ. පැන් වඩන්නට, පැදුරේ ඉඳගත්තේ, සිරියලතාත්, මියුලාත් විජේපාල මුදලාලිගේ නැගණිය වන කරුණාවතීත් පමණි.

"යථාවාරි වහා පුරා - පරිපුරෙන්ති සාගරං.. වැස්සෙන් වැටුණු ජලධාරාවෝ පිරී ඉතිරී ගලා ගොස්, සයුර පුරවන්නාසේ, මේ පිං මළගිය ඥාතියාට අත්වේවා!. "

පැන් වැඩූ භාජනය පිරී ඉතිරී ගිය පසු, හාමුදුරුවන් සෙමෙන් එළියට වැඩියේ, මිනියේ ඉතිරි කටයුතු නිදහසේ කරගැනීමට ඉඩ සලසමින්ය. පෙට්ටිය වහද්දී සිරියලතා මහා හයියෙන් හඬා වැටුණාය.

" මේ ලෝකෙට එන කවුරුත් ආපහු යනව තමයි. ලෝකෙ හැටි එහෙම වුණත්. මම කොහොමද දෙයියනේ. හිත හදාගන්නෙ"

සිරියලතා දෑත් බැඳගෙන කෑ ගැසුවාය.

"කැරකෝප්පුවට යන උදවියට අපි බස් එකක් ලෑස්ති කරල තියෙනවා. පයින් යන්න අපහසු කෙනෙකුට බස් එකේ යන්න ඇහැකි. එනකොටත් ඒකෙම එන්න බැරිය "

සිය මව වත්තම් කරගෙන මියුලා බසයට ගොඩවෙද්දී, ගම්මු කිහිප දෙනෙක් ද, ඔවුහු අනුගමනය කළහ. සොහොන් බිමට වැඩි දුරක් නොවූවද, පයින් යන්නට නොහැකි අයට එය ලොකු සහනයක් විය.

විජේපාල මුදලාලි අවසන් ගමන් ගියේ, බෙර කරුවන් පෙරටු කරගත්, ගමේ ඉළන්දාරි ගැටවුන්ගේ කරපිටින්ය. පැය බාගයකටත් අඩු කාලයකදී ඔවුන්ට සොහොන් බිමට යන්නට හැකිවිය.මිනිය දවන සොහොනට ගින්දර දැම්මේ, හිස වටා සුදු ජටා බැඳ ගත් බෑණාවරුන් දෙදෙනෙකි. දල්වන ලද පන්දම් දෙකක් පිටුපසට කරගෙන, දරසෑය වටා රවුම් තුනක් ඇවිද ගිය ඔවුහු, සෑය දෙස නොබලාම එයට ගින්දර දැම්මේ, කාගෙත් සුසුම් මැද්දේය.

විජේපාල මුදාලාලිගේ බාල පුතා, ගුවන් තොටුපලේ සිට, කෙළින්ම පැමිණියේ සොහොන් පිටියටය. තම පියා දැවෙන සොහොන දෙස මඳ වේලාවක් බලා සිටි ඔහු, පුටුවකට බරවී කඳුළු සලන සිය මවගේ පිටට අත තබා කතා කළේය.

"අම්මේ මං ආවා.."

හිස ඔසවා පුතා දෙස බැලූ සිරියලතා, ඉවත බලා ගත්තේ දැඩි සංවේගයෙනි.

නෑ දෑ හිතවතුන් සිරියලතා වට කරගත්තේ, සමු ගන්නටය. බොහෝ තැන් වලදී මෙන්, සොහොන් බිමකදී, ගිහින් එන්නම් කියා, කිසිවෙක් කියන්නේ නැත. සොහොන් බිමට නැවත එන්නට කිසිවෙක් කැමති නැත.

" අපි යන්නම් කියා. සැවොම සමුගත්හ.."

"ඉතිං අපිත් යමු අම්මේ... අඬාගෙන මේ ලෝකෙට ආව වගේම.. අඬාගෙන මේ ලෝකෙන් පිටවෙනව කියල අම්මම නේද අපිටත් කියල දුන්නෙ.."

මවගේ හිස පිරිමදිමින්, මියුලාද කඳුලු පිස දා ගත්තාය. සිරියලතාගේ දෑත් සීතලව තිබිණ.

"කවුරු කවුරුත් ගෙදර ඇවිත් බත් කටක් කාලා... මුදාලාලි මහත්තයට පිං දීල යන්න කියල... පවුලේ අය වෙනුවෙන් මම ඉල්ලීමක් කරනවා.."

අවමංගල උත්සවයේ සියලුම කටයුතු බාරව සිටි සේනක, පැමිණි සිටි අමුත්තන් ඇමතීය.

" කොහොමද සඳමාලි.."

සිරිනාතගේ හඬ ඇහුනද, ඊට කන් නුදුන් සඳමාලි, සිරියලතා ළඟට ගියාය.

සඳමාලි පෙරටත් වඩා රුමත් වී ඇතැයි සිරිනාතට සිතිණ. නිල්පැහැති ඇස්, වාත්තු කළා වැනි නැහැය කට, ඔහු බොහෝ වේලා ඈ දෙස බලා සිටියද, ඇය නිකමට හෝ ඔහු දෙස හැරී බැලුවේ නැත.

"අපි මළ බතට එන්නෙ නෑ නැන්දේ..අමනාප වෙන්න එපා. පිටරට ඉඳන් ආපු. ලොකු මහත්තුරු ආපහු ගියාම .. අපි එන්නම්කො නැන්දා බලන්න.."

" මට තේරෙනව දුවේ..මට තේරෙනව.."

සිරියලතා සඳමාලිගේ දෑත් අතගාමින් කීවාය.

විජේපාල මුදලාලිගේ නැගණියගේ දියණිය වූ සඳමාලි, සිරිනාත හා කුලුපගව සිටියේ වැලිකෙළියේ පටන් මය. සිරිනාත එංගලන්තයේදී සුදු ගැහැනියක් විවාහ කරගත් බව දැනගන්නට ලැබුණ මොහොතේ හඬා දොඩා කම්පා වුවද, පසුව ඇය හිත හදා ගත්තාය.

නෑ, දෑ, හිතවතුන් කීප දෙනෙක් සමඟ, ගෙට ගොඩවූ මියුලා, සිරියලතා පුටුවක වාඩි කරවූවාය.

"අම්ම මූණ කට හෝදල.. සැහැල්ලු ඇඳුමක් ඇඳගන්න.."

මියුලා දිග ගවුමකුත්, තුවායත්, මව අත තැබුවාය.

"මම කෑම මේසෙ අඩුපාඩු බලලා එන්නං.."

වට්ටක්කා කළුපොලත්, කරවල හොද්දත්, තක්කාලි සම්බෝලයත්, උණු උණු...සුදු කැකුළු බතත්, මේසය මත විය. පිඟන් තට්ටුවත්, හැඳිත්, වතුර වීදුරු කිහිපයත්, ළඟම වූ තවත් මේසයක විය. හැඳි අග්ගිස්සෙන් අල්ලට දමා එළවළු වල ලුණු ඇඹුල් බැලූ මියුලා, කුස්සියේ දොරකඩ, කෑම බාරව සිටි සිමෝනා දෙස බලා රහසි කීවාය.

"මළබතට කොතැනත් හදන්නෙ වට්ටක්කයි කරවලයි.. අඬල වැලපිල නොකා නොබී ඉන්න කාටත්.. වට්ටක්කා පපුවට ගුණයි.. කන්නෙ බොන්නෙ නැතුව හාමත්වෙලා ඉන්න අයගෙ දිවට රසයි කරවල.. ඒකයි මළබතට මේ දෙවර්ගයම හදන්නේ.. "

" ඇත්ත නේද මියුලා නෝනා.. "

" ඇත්ත නේන්නං ..සිමෝනා .."

සිරියලතාගේ පිඟානට බත් හැන්දක් බෙදූ මියුලා, කරවල කෑල්ලකුත්, වට්ටක්කා හොදි ටිකකුත්, ඊට එක්කළාය.

" ඉතින් කන්න අම්මේ.."

පිඟාන දෙස බලා සිටි සිරියලතා, දිග සුසුමක් හෙළුවාය.

"අප්පච්චිට නොදී මම ..කවදාවත් කෑම කාල නෑ.. අනේ දුවේ .. මීට වැඩිය හොඳයි මට කහට උගුරක් තිබුණනං.."

"බත් කටක් දෙකක් කන්නකෝ.. මම තේ එකක් හදා ගෙන එන්නම් .."

මළ බත කෑ, නෑ දෑ හිතවතුන් පිටව යන්නට පෙර, මියුලාටත්, සේනකටත්, තුනි පුදන්නට අමතක කළේ නැත.

"දුවේ අයියල දෙන්නත් හෙට අනිද්දා යන එකේ .. උඹේ ඇස් බැල්ම තමයි.. තනිවෙච්ච සිරියලතාට තියෙන්නෙ .." "අනේ ඔව් ඇලන් නැන්දේ...මටත් දැන් කොයිදේටත් ඉන්නෙ.. අම්ම විතරයි.. සේනක ඇරුණම.."

මියුලා සමුගන්නා හැමටම පිං දුන්නාය.

ගමේ හිතවත් පිරිමි කිහිප දෙනෙක්, ඉස්තෝප්පුවේ බිම දිගාවී සිටියහ.

"හත් දා බණ..අහවර වෙනකං.. තනි නොතනියට අපි මෙහේ ඉන්නම්.."

ඔවුන් කීවේ සේනකටය.

"අනේ කොච්චර එකක්ද..එළියෙ කුස්සියෙ.. අඩුවැඩිය තියෙනවා.. ඕන වෙලාවක තේ හදාගෙන බොන්න ඇහැකි.."

සේනක හිතවත් ගම්මුන්ට කීවේය.

සිමෙන්ති පොළොවේ සීතලේ, රැය ගතකිරීම, ඔවුනට අපහසු නොවේදැයි කල්පනා කළ සේනක, නිදා ගන්නට පැදුරු කිහිපයකුත්, කැමතිනම් සෙල්ලම් කරන්නට කාඩ් කුට්ටමකුත්, දාම් ලෑල්ලකුත් ගෙනැත් දුන්නේ සිනාසෙමිනි.

"මම අපේ ගෙදර යනවා.. ඇබිත්තක් ඇහැ පියාගන්න.. දැන්නම් පාන් කියාගන්නත් බැහැ.. ඒ තරමටම තෙහෙට්ටුයි.. කී දවසක් නං නිදිමැරුවද.. අම්මගෙ තනි නොතනියට.. මියුලා අම්ම ළඟ උන්නාවේ..මම හෙට උදෙන්ම එන්නම් .."

මියුලා විසින් තමන් වෙනුවෙන්ම පිළියෙල කර දුන්, තම්බන ලද එළවළු, රාත්‍රී ආහාරය පිණිස ගත් රෝස්මරී, තම අත් බෑගයේ වූ ඡායාරූප කිහිපයක් මියුලාට පෙන්වූවාය. "දිස් ඉස් මයි එක්ස් හස්බන්ඩ් ..ඇන්ඩ් දිස් ඉස් මයි වන් ඇන්ඩ් ඔන්ලි චයිල්ඩ් .."

රෝස්මරී කී කිසිවක් නොතේරුණද, ඒ පින්තූරයෙ සිටියේ ඇගේ කලින් සැමියා සහ පුතණුවන් විය හැකියයි මියුලා සිතුවාය.

"..රෝස්මරී ..වෙයර් ආර් යූ .."

ඇත සිටම සිරිනාත ගොරවන හඬ ඇසූ රෝස්මරී, කලබලයේම අත තිබූ පින්තූර බෑගයට ඔබන්නට සැරසුනාය.

"වට් ආර් දෝස් ෆොටෝස් ..ටෙක් ඕල් යුවර් තින්ග්ස් ..ගෝ ටු යුවර් රූම් .."

රෝස්මරී බිම බලාගෙනම කාමරයට ගියාය.

"නල්ලමලේ මිනිහ ..ප්‍රදර්ශනය කරන්න ..අපේ උනුත් කට බලියගෙන ඉන්නවා .. ඕප දූප හොයන්න.. "

මියුලා නිශ්ශබ්දව සිටියා මිස කිසිවක් කතාකළේ නැත.

"රෝස්මරීගෙ සල්ලි වලින් උපරිම ප්‍රයෝජන අරගෙන, ලොකු අයිය එයාට සලකන විදියනම්..අන්තිමයි අම්මේ .. කළගුණ නොදන්න නූගත් මිනිහෙක් වගේ ලොකු අයිය හැසිරෙන්නේ .. මම නං ..ඕවට කට දාන්න යන්නෙ නෑ ..අම්මවත් ටිකක් සැරෙන් කතා කරල..හොඳ නරක කියල දෙන්න මේ ගැන .."

සාලයේ පුටුවක නිදි කිරමින් සිටි අම්මාට, මියුලා කීවාය.

රෝස්මරීගේ කරපිටින් ගොස්, ඒරටේ වීසා හදාගෙන රැකියාවක් ලබා ගත් පසු, ඇය එළවා දමා, පුංචි සන්දියේ සිට පෙම් කළ සඳමාලි, එම රටට ගෙන යන්නට සිත තුළවූ ආශාව ඉටුකර ගත හැකියයි සිතූ සිරිනාත, ඒ බව සිය මවටද කියන්නට සිතා ගත්තේය.

"මේ වැඩ කටයුතු ඉවර කර ගත්තට පස්සේ.. මම මේකි කුණු මාළු කැල්ලක් වගේ වීසි කරල දානවා .. ඊට පස්සේ සඳමාලි ඒ රටට එක්ක යනවා.."

" මෝඩ තකතිරු ගොන් කතා කියන්න එපා .. කරන්න ඇහැක් දෙයක් ගැන කතාකරපන් .. මේ ආත්මේ නං උඹට.. සඳමාලි ලැබෙන්නෙ නැහැ.. ඒක සහතිකයි.."

සිරියලතා, සිරිනාතට බැණ වැදුණාය.

සිරිනාත කුඩා කාලයේ ඉගෙනුම ලැබූ පාසලේ ලොකු ඉස්කෝලෙ මහත්තයා මළ ගෙදරට එනවිට රෑ බෝ වී තිබිණ.

" සමාවෙන්න හාමිනේ.. මම ගමේ හිටියෙ නෑ..මේ දැන් තමා ගෙදර ආවේ .. මුදලාලි මහත්තයගෙ මළ ගම ආරංචි වුණ හැටියෙමයි මේ ආවෙ .."

සිරියලතා මඳ සිනහවකින් ඔහුට සංග්‍රහ කළා මිස, වැඩියමක් කතා කරන්නට ගියේ නැත. මියුලා ගෙනැවිත් දුන් තේ කෝප්පයකින් සප්පායම් වූ ඔහු, දෙවෙනුව කතා කළේ සිරිනාතටය.

"කොහොමද ඉළන්දාරියා ..දැන් පදිංචිය එංගලන්තෙලු නේද?. හිරු නොබසින අධිරාජ්‍යයේ..? ..ඒ පළාතෙන්ම පෙළවාසියක් කරගත්තයි කියලත් ආරංචියි .. හොඳා ..හොඳා .. දැන් ඉතින් ලොකු මහත් වෙච්ච මිනිස්සු නෙව.. සන්තෝසය තමා ජීවිත වලට ඕන කරන්නෙ .. ජාති භේද ..වර්ණ භේද.. කුළ භේද.. මොකටද .. සතුට තියේ නං ..ඒ ඇති .."

"අනේ ලොකු මහත්තය.. ගියාට ඔහෙ ඉන්නවා මිසක් .. කැමැත්තකින් එහෙම නෙවෙයි .."

සිරිනාත උදාසීනව පිළිතුරු දුන්නේය.

"ඒ මොකද හත්දෙයියනේ.. එංගලන්තෙ කියන්නෙ හොඳ දියුණු රටක් නෙව .. ඉංගිරිසි කාරයා අපේ රටට වින කෙරුවා වගේම .. ලොකු සේවයකුත් කෙරුවා .. අපේ සිංහල රජ්ජුරුවොා පන්නල .. රටේ බලය අල්ල ගත්තත් .. උන් පාරවල් හැදෙව්ව. පාලං හැදෙව්ව. මුවු බිම් වල තේ වැව්වා. ඒකම කොච්චර වටිනවද ..අදටත් අපට විදේශ ආදායම ලැබෙනව තේ වලින්.. ඒ වගේම තමයි අපට රට එළවළු ලැබුණෙත් සුද්දන්ගෙන් තමයි.."

"මට මතක්වෙන්නෙ .. ඒ කාලේ ඉස්කෝලෙ මහත්තය අපට පාඩම් කියල දීපු හැටි .."

සිරිනාත යට ගියාව සිහිකළේය.

"ඉංගිරිසි කාරයෝ අපට ඕන තරන් වැරදි කෙරුවා. ඒ වගේම හොඳත් කෙරුවා. ඒ වැරදි අමතක කරල. හොඳ ටික විතරක් මතක තියාගැනීම තමයි අපේ යුතුකම .. කාගෙ වුණත් වැරදි මතක තියාගෙන ඉඳල අපට වැඩක් ඇතෙයි .." නින්දට පෙර සිරිනාතත්, රවිනාතත්, සිය මව හා කතා කරන්නට මඟ පාදා ගත්හ.

"අනිද්දා උදේ අපි යනවා අම්මේ.. හත් දවස වෙනතුරු අපිට ඉන්න බෑ.. එහෙම වුණොත් අපට අපේ රස්සාවල් නැතිවෙන්නත් ඉඩ තියෙනව.. අපට එහේ කිසිම නිදහසක් නැහැ..ජීවත්වෙන්නෙ පරෙයි කුඩු වගේ .. පුංචි ඉඩක.. මම මේ ගැනි කරගහ ගත්තෙත් .. ඒ රටේ වීසා ගන්න ඕන නිසා.. ගැනිට සල්ලි තියෙනවා.. කලින් මිනිහ මැරෙද්දී .. ඒකා මේකිට මුළු සේසතම පවරලා.. ඒ සල්ලි වලින් තමයි අපි ටිකට් ගත්තෙත්.. ඒ වාසි බලාගෙන මිසක්.. නැත්නං මේ කුණු ගොඩට.. මම කරගහන්නෙ නැහැ.. කීයටවත් .."

සිරියලතා විමතියෙන් සිරිනාතගේ මුහුණ බලා සිටියාය.

" සත්තයි අම්මෙ.. අපි එහේ ජීවත්වෙන්නෙ.. හිඟන්නො වගේ.."

ලොකු විභාග පාස් කළ දරුවන්ට වෙවන් විපතක් සිදුවෙයැයි සිතිනෙන්වත් නොසිතූ, සිරියලතා ඉකිබින්දාය.

"ඉතිං මම මක්කරන්න ද දරුවෝ .. උඹලයි කැමත්තට නෙව ඔය ගමන ගියේ.. අප්පච්චියි මායි කොච්චර විරුද්ධ වුණත්.. උඹල ඇහුන්කං දුන්නයි.. උඹ සුද්දියක් සහේට ගත්ත කියල දැනගත්ත දවසෙ තමයි.. ගහක් ගලක් වගේ හිටිය අප්පච්චි ඇඳට වැටුණේ.. පොඩි එකත්, උඹේ අඩිපාරෙම යයි කියල අප්පච්චි හිටියෙ බොහොම දුකෙන් .. රට සල්ලියි; රට ගැනුයි ඉන්න උඹලට, ගමේ ඉඩ කඩම් වලින් තියෙන පලේ මොකක්ද?. උඹලට නොකිව්වට.. උඩහ පොල්වත්ත විකුණල ගත්ත සල්ලි තමයි.. පහු ගිය අවුරුද්දේ අප්පච්චිගෙ අසනීපෙට වියදම් කෙරුවෙ.."

දරු සෙනෙහසත් ස්වාමි භක්තියත්, සිරියලතාගේ හදවත කම්පනයට පත් කළද, ඇය හඬමින්ම නැවතිල්ලේ දිගටම කතා කළාය.

"දොස්තර මහත්තයට වියදම් කරල බැරි තැන තමයි .. සිංහල බෙහෙත් කරන්න පටන් ගත්තෙ .. වෙද රාලහාමිත් නොසෑහෙන්න බෙහෙත් කෙරුවා .. ඒ වෙන කොටත් .. අප්පච්චිගෙ කකුල් දෙක පණ නෑ ..ඇඳෙන් නැගිටින්න තියා හෙල්ලෙන්නවත් බෑ .. ඔක්කොම ආව තේව කම් කෙරුවේ උඩහ ගෙදර සියාතු.. කුඹුරු කෑලි ටික අඳේට දුන්නා.. බලා කියා ගන්න කෙනෙක් නැති නිසා.. කජු වගේම අඹ වතුවලත් ආදායමක් අපට නෑ.. ඒව හොරු කඩාගන්නවා.. අන්තිමට ඉතුරුවුණේ මේ ගේයි ඉඩමයි විතරයි.. "

රවිනාතත්, සිරිනාතත් මුහුණෙන් මුහුණ බලා ගත්හ.

"අපි දෙන්නත් ලංකාවෙ පදිංචියට එන්න, අදහසක් නැති එකේ, මේ ගෙවල් දොරවල් වලට, මක් කරන්නද අම්ම හිතා ගෙන ඉන්නෙ.

"මක්කරන්න හිතාගෙන සිටියත්, උඹලට වැඩක් නෑ.. අප්පච්චි මායි; උඹල දෙන්න ලොකු කොලීජ් වලට දමල ඉගැන්නුවා නොසෑහෙන්න සල්ලි වියදම් කරලා. විශ්ව විද්‍යාලයෙන් පිටවුණ දවසේ.. ඒ සන්තෝසෙට.. පොල්වතු දෙකක් දෙන්නගෙ නමට පවරල දුන්නා.. තමුන්ගෙ රටේ ඕනතරම් රස්සාවල් තිබුණත්.. පිටරට රස්සාවල් වලට කෑදර වෙලා.. තමන්ට ලැබුණු පොල් වතු දෙකත් හොරෙන්ම විකුණගෙන රට පැන්නා .. ඔක්කොම සුන්නත්දුලි කරලා .. දැන් එනවා ඉතුරු හරියත් විනාස කරන්න.."

සිරියලතා කතා කරේ වේදනාවෙනි .

"මගේය කියල වැලිඇටයක්වත් දැන් නෑ.. අප්පච්චි මැරෙන්න සුමානෙකට විතර කලින්.. මේ ගේයි ඉඩමයි මියුලගෙ නමට පවරල දුන්නෙ.. මගෙත් අනුදැනුම ඇතුව.."

සිරිනාත කලබල විය. උන්නිටි තැන්ද අමතකව ගියාසේ ඔහු අතීතය සිහිපත් කරමින් විලාප නැගීය.

"සේනකය ලොකු කරගෙන .. කාටත් හොරෙන් ඌත් එක්ක, ගෙදරින් පැන්න දවසේ.. ඒකි ආයෙ පවුලට වැද්දගන්නෙ නෑ කියල අප්පච්චිම නේද කිව්වෙ.."

සිරිනාත වියරුවෙන් කෑ ගැසුවේය. කාමරේ සිටි රෝස්මරී එළියට දුවගෙන ආවේ සිරිනාතගේ කෑගැසීමටය.

"වට් ආයූ ඩුයින් හියර් ..ගෝ ටු රූම් ඇන් ස්ලීප්.. ගෝ ..ගෝ .."

සිරිනාත රෝස්මරිටද සැර දැම්මේය. ඇය බිම බලා ගෙනම, කාමරයට රිංගුවාය. රවිනාත ද එතැනින් පිටව ගියේ කෝපයෙන් පුපුරමිනි. ඉඳගෙන සිටි පුටුව පෙරළා දමා සිරිනාත කාමරයට වැදී දඩස් ගා දොර වසා ගත්තේය. සෙමෙන් සෙමෙන් කාමරයට ගිය සිරියලතා, ඇඳේ වැතිරී ඒ මේ අත පෙරෙළෙමින් කල්පනා කළාය.

රාත්‍රිය නිශ්චල වුවද, සිරිනාතගේත්, රවිනාතගේත් සිත් චංචලව තිබිණ.

" මහත්තයල යන්නද? මේ මහරෑ ?.."

" හ්ම් .. ඔව්.."

සූට්කේස් ඔසවාගෙන මිදුලට බහින සිරිනාතගෙන් හා රවිනාතගෙන් ඇසුවේ, යහළුවන් හා ඉස්තෝප්පුවේ කාඩ් සෙල්ලම් කරමින් සිටි රට උළු ගෙදර මුනිදාස ය.."

" ඔව් .. අපි කුලීකාර් එකකට කතා කරා .. මෙලහකටත් මඟ එනවා ඇති.." රවිනාත වට පිටාව සෝදිසියෙන් බැලීය. " දන්නවද ?.. මහ රෑ තුන් වතාවක්ම මම ඇඳෙන් බිමට වැටුණා .. එක බින්දුවක්වත් ඇහැ පියන්න ලැබුණේ නැහැ.. කාගෙදෝ හෙවණැල්ලක් ඇඳ වටේ එහාට මෙහාට යනවා වගේ දැනුන .."

සිරිනාතගේ කට හඬ වෙව්ලමින් තිබිණ.

" මක්කද මහත්තය මේ දොඩවන්නේ .."

මුනිදාසගේ පැනයට, සිරිනාත මුනිවත රැකිය, ඔහු වට පිටාව බැලුවේ සැකයෙනි.

රවිනාත කළුවරේම මිදුලේ වූ රුස්ස ගස් මුඳුන් දෙස, කල්පනාවෙන් බලා සිටියේය.

" කවදාවත් නැතුව ..අද හුළඟ සැරයි මහත්තයා.. මහ කුණාටුවක් වගේ .. ගස් වල කරටි කඩා ගෙන යන්නත් බැරි නෑ .. ලොකු අනතුරක් අත ළඟයි .. මට මහ අමුත්තක් දැනෙනවා.. "

රවිනාත කලබලයේම, මිදුලේ නැවැත්වූ කාරයට ගොඩවිය.

" හරිඅප් ..ලෙට්ස් ගෝ..රෝස්මරී.. හරිඅප් .."

ඔවුන් රැගත් මෝටර් රථය, ඇත නොපෙනී යන තුරුම, මුනිදාස කුතුහලයෙන් බලා සිටියේය.

නින්දත් නොනින්දත් අතරේ, ඇඳේ එහා මෙහා පෙරළෙමින් සිටි, සිරියලතා, හිටිවනම හිස ඔසවා බැලුවේ, ළඟ ළඟ ඇසුණු අඩි ශබ්දයක් නිසාය.

කාමරයේ දොර රෙද්ද මෑත් කර, එබී බැලූවේ මියුලා ය.

" අයියලාට තේ වතුර ඩිංගක් දුන්නද දුවේ.. උදේට කන්න මක්කද හැදුවේ.. "

"උදේ පාන්දරම .. මම ඇහැරෙන කොටත්.. එයාල පිටවෙල ගිහිල්ල අම්මෙ.."

මියුලා හැඬුම් ස්වරයෙන් කීවාය.

ඔබේ කෙටිකතා පහත ලිපිනයට යොමුකළ හැකිය.
සිළුමිණ කෙටිකතාව,
ලේක්හවුස්, කොළඹ 10.
දුරකතනය 011 2429264
විද්‍යුත් තැපෑල:features.sil@lakehouse.lk

මිනිස් සිත කියවීමට ගත් සාහිත්‍යමය වෑයමක්

- මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රගේ නවතම ග්‍රන්ථය

කෘතිය: **නිර්මෝහනය**
කර්තෘ: **සුනන්ද මහේන්ද්‍ර**
මිල: **රු 350**
ප්‍රකාශනය: **දයාවංශ ජයකොඩි සහ සමාගම**
විමසීම්: **071 1808697**

මිනිස් සිතක පවත්නා යම් අත්දැකීමක සංකීර්ණතාව විමසීම සාමාන්‍ය නුවණකින් කළ හැක්කක් නොවේ. එය සංකීර්ණ මනෝ ව්‍යාකුලත්වයක් නිර්මාණය කිරීමක් දක්වා වැඩී ගිය තැන දී මනෝ විද්‍යාඥයන් විසින් යොදා ගන්නා ක්‍රමවේදයක් ලෙසින් මෝහනය නම් ක්‍රමවේදය හඳුනා ගැනෙයි.

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර විසින් රචිත ඔහුගේ අලුත්ම කෘතිය වන "නිර්මෝහනය -මනෝ විද්‍යාඥයෙකුගේ සටහන් පෙළක්" යන්න අර කියන්නට යෙදුන තත්වය සිහි ගන්වන්නේ මුත් එවැනි නිර්දිෂ්ට මගක ම නොගිය එහෙත් ඒ හා සමාන අත්දැකීම් සිහිගන්වන සුළු නිර්මාණාත්මක ආඛ්‍යානයක් වේ. ඔහු විසින් ම පෙන්වා දී ඇති ආකාරයට අපට එය මෙසේ ද හඳුනාගත හැක.

"ඇතැම් සියුම් වුත්, සංකීර්ණ වුත් ජීවන අත්දැකීමක් කිසියම් ක්‍රමයකින් ප්‍රකාශ කිරීමෙන් පුදුමාකාර අස්වැසිල්ලක් ලද හැකි ය. මෙහිලා කලක් මුළුල්ලේ අත්දැකීම් වලට පසුබිම් වන්නා වූ බොහෝ මතක සටහන් ලියා තැබීමට මම මගේ හිත මිත්‍ර මනෝ වෛද්‍ය විශේෂඥ පද්මන් ද සිල්වාගෙන් උගත්තේ යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ." ඒ අනුව යමින් ඔහු විසින් තමන් ට කියන ලද ඇතැම් අත්දැකීමක් ජීවිතයට ඉතා සමීප වූ බවත්, එය විශ්ව විද්‍යාලයිය මට්ටම ද ඉක්මවා පවතින්නේය යන අයුරිනුත් තමන්ට දැනුණේ යැයි කතුවරයා පවසයි. එම පසුබිමේ ගොඩ නැගෙන මේ කෘතිය තමන් අතින් හත් අට වතාවක් ම සංස්කරණය වුයේ යැයි ද හෙතෙම වැඩිදුරටත් පෙන්වා දෙයි. ඒ අනුව යමින් කෙටි නවකතාවක් බවට පත් වන මෙම මනෝ විද්‍යාඥයෙකුගේ සටහන් පෙළ ඒවායේ පවත්නා මිනිස් ජීවිතයට සමීපස්ථ හේතු වූ බව පැහැදිලි ය. අවසානයේ දී එය ජීවිතය ම ස්පර්ශ කරමින් නව කතාවක් ලෙසින් ගොඩ නැගීමේ වුවමනාව මත වෙසෙස් ආඛ්‍යායන ලතාවකට හසුරුවා ගනිමින් කතුවරයා එය නිර්මාණය කොට ඇති බවක් පෙනී යයි. බොහෝ වාරයක් එම ලිවීම සංස්කරණය කිරීමට සිදු වන්නේ ද ඒ නිසා ම බව ද පැහැදිලි වෙයි. ඉදින් එය එසේ නොවුණා නම් මෙ හුදෙක් මනෝ විද්‍යාඥයෙකුගේ අත්දැකීම් පවසන වාර්තාමය රචනයක් වීමට ඉඩ තිබුණි යැයි සිතන්නට පුළුවන්කමක් තිබේ.

"නුඹ ලියූ සිද්ධි සමුදාය කිසිවෙකුට පෙන්වන්නේ නැද්ද?"

-ප්‍රතාප්ගේ යටි සිත අස යි.

"පෙන්වන්න තරම් හිතක් තවම පහළ වුණේ නැද්ද?"

"සටහන් කරන හැම දෙයක් ම අනුන්ට පෙන්විය යුතු ම ද?"

"ඒකෙ පොඩි ඇත්තක් තිබෙනවා. ඒත් ඒවා ඵලදායක අත්දැකීම් බවට පත් වේවි ද?"

"එය නිගමනය කරන්නේ මම නෙමේ"

"එහෙනම් කවුද?"

"කාලය"



ඉහත උද්ධෘතය අප එසේ දක්වන්නට යෙදුණේ අර කිව අත්දැකීම් කෘතියක් වශයෙන් ගොඩ නැගෙන ආකාරය පිළිබඳව පාඨකයාට යම් අවබෝධයක් ලබා දෙනු පිණිස ය. නමුත් එය අත්දැකීම් වශයෙන් ම නොව ඊට එහා ගිය ජීවන වෘත්තයක් බවට ද ක්‍රමයෙන් පත්වෙනවා ද දකින්නට පුළුවන. මිනිසෙකුගේ ජාගර සිත තුළ පවත්නා ඇතැම් කල්පනාවන් එසේ ම නිද්‍රාවට පත් වී ඒ නිසා ම ඔහු හෝ ඇය තුළ ආකුල ව්‍යාකුලතා මතු වෙද්දී අර නිදිගත් කල්පනාවන් හෝ සංවේදි ආශාවන් අවදි කොට එළියට ගැනීම මනෝවිද්‍යාඥයෙකුගේ කාර්යභාරය යි. කෙසේ වුව එවැන්නක් තුළින් කතා කලාවක් ගොඩ නැගීමට මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර ගත් උත්සාහය විමසීමේ අවස්ථාව සාහිත්‍ය විචාරකයෙකුට ලැබෙන වෙසෙස් අවස්ථාවක් වේ. අනිත් අතට මනෝ විද්‍යාඥයින්ගේ ඇසුර, ඔවුන්ගේ අත්දැකීම් හා ලියවිලි ඉවසිල්ලෙන් කියවීමට යොමුවන සාහිත්‍යකරුවෙකුට ඉන් ලද හැකි ප්‍රතිලාභ කවරේද යන්නත් මෙයින් පෙන්වා දී අතැයි සිතමි. එසේ ගත් කල වඩාත් නිර්මාණශීලි සාහිත්‍ය නිර්මාණකරුවෙකුට මේ කෘතියෙන් මතු නිර්මාණකරණයකට අදාළව යම් හෝ අවබෝධයක් ලැබීමට ද පුළුවන්කම තිබේ.

"නිර්මෝහනය" නම් මෙම කෘතියේ එන එක් කොටසක් "විඥාන ධාරා" නමින් හඳුන්වා දී තිබේ.

"මේක අපූරු කල්පනාවක්. අපි ඒ වගේ දේවල්වලට කියන්නේ යම් යම් නිමැවුම්කරුවන් මවන මල් වර්ග කියලා. අපේ සිත් වශී කරන්නට පුළුවන් මුහුණු අපට එදිනෙදා ජීවිතයේ දී මුණ ගැහෙනවා. ඒ මුහුණු ගැහැනු මුහුණු වෙන්ට පුළුවන්. පිරිමි මුහුණු වෙන්ටත් පුළුවන්. ඒත් ඒ මුහුණු දැක්ක ම සිත් වශී වෙනවා. ඒවා සංඥ මනෝ සංඥා Mental Images අපි ඒවා අපේ සැබෑ ජීවිතයේ දී නොදැක්කත් අපේ හීන වල දී දැක ගන්නවා."

මනෝ විද්‍යාව විෂයක් වශයෙන් හැදෑරීම හා ඉන් ආභාසය ලැබීම සාහිත්‍යකරුවෙකුට කොතරම් ප්‍රතිඵලදායි වන්නේ ද යන්න දුටු මෙන් ම ඉන් නොවක් ආභාසයක් ලද කීර්තිමත් ලේඛකයෙකු හැටියට ජී. බී. සේනානායක හඳුන්වා දිය හැක. විශේෂයෙන් ම ඔහුගේ නවකතාවන්හි එන ප්‍රබල චරිත ඇතැම් අවස්ථාවල දී සිය යටි සිත හා උඩු සිත අතරට මැදි වී සිදු කරන්නා වූ අරගලය ම එම කතාවන්ට අදාළව ගැටුම්කාරී ලෙස සිද්ධි ගලනයට මහත් සේ උපකාර කරන අයුරු පැහැදිලිව ම දැකිය හැක. එසේ බලන කළ මිනිස් විඥානය යන්න අසීමිත ක්‍රියාකාරීත්වයක්ය යන්න පැහැදිලි ය.

කාලයත් සමඟ යමෙකුගේ යටි සිත්හි සැඟවී යන සංවේදි අත්දැකීම් එම චරිතයට ලබා දෙන වේෂ නිරූපණ වැනි හැසිරීම් සියුම් ලෙසින් හඳුනාගැනීමක් විශිෂ්ට වූ සාහිත්‍යකරුවෙකු ලබන්නේ එය විෂයබද්ධව අවබෝධ කරගන්නා මනෝ විද්‍යාඥයකුටත් වඩා ජීවිතය තුළට ගමන් කරමින් යැයි සිතේ.

සාහිත්‍යකරුවෙකු ඇතැම්විට තමන්ව ද උපමාවට ගනිමින් අනිකෙකුගේ සැඟවුණ චිත්තයක් විමසන අයුරු අතිශය සංවේදිතාවකින් සිදු කිරීම ඊට හේතුව යි.

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රගේ උක්ත කෘතිය මුල් කොටගෙන මෙවැනි විමසීමක් කිරීමට අප කල්පනා කළේ එය, පොදුවේ අප සාහිත්‍යකරුවන්ට වෙසෙස් පසුබිමක් සපයා දෙනු ඇත යන අපේක්ෂාවෙනි.

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

'පොළොවේ මුල් ඇදපු දේශපාලනයක් අවශ්‍යයි'

-මහාචාර්ය සෝමරත්න බාලසූරිය 'මුක්ති' ගෙන එයි

කෘතිය: **මුක්ති**
කර්තෘ: **සෝමරත්න බාලසූරිය**
ප්‍රකාශනය: **සරසවි ප්‍රකාශකයෝ**
මිල: **රු 400**
විමසීම්: **071 4485344**

මහාචාර්ය සෝමරත්න බාලසූරිය සිය අලුත්ම නවකතාව වන "මුක්ති" පසුගිය දිනවල දී එළි දැක්වුයේ ය. නවකතාවක් වශයෙන් ගත් කල විශේෂයෙන්ම 70 දශකයේ දේශපාලනය පසුබිමේ හැසිරීම සමඟ එන චරිතයක් ඒ දේශපාලනය සම්බන්ධයෙන් ඇති කරගන්නා ස්වයං විවේචනයක් වැන්න. ඒ අනුව එහි ප්‍රධාන චරිතය නිරූපණය වන්නේ නව සංවර්ධනාත්මක සමාජ දේශපාලන ආකල්ප මත වුණත්, ඒ නිසාම ඔහු මුහුණපාන විරෝධය ඇතැම් විට ඔහු බලාපොරොත්තු වූ තත්වයටත් වඩා වැඩි තත්වයක් දෝ හෝ යි සිතේ. මෙම සංවාදය ඒ ගැන කළ විමසීමකි.

■ ඔබේ අලුත් නවකතාව "මුක්ති" එක්තරා ආකාරයකට සමාජ දේශපාලනික ස්වයං විවේචනයක් යැයි මා කීවොත් ඔබ ඊට එකඟවෙනවද?

"මේ කතාවේ කාල වකවානුව ගත්තම එය හැත්තෑව දශකයේ අවසන් කාලය යැයි කියන්න පුළුවන්. ඔබ කීවා වගේ එවකට පැවතුණ දේශපාලනයේ හිංසනවාදී මුහුණුවර සම්බන්ධයෙන් ඔහුට එනම් කතාවේ ප්‍රධාන චරිතයට විවේචනයක් තිබුණා. ඔහු කල්පනා කරනවා අද අපට අවශ්‍ය වන්නේ එවැනි හිංසනීය දේශපාලනයක් නොවේය කියලා.

ඒ මතයත් සමඟ ඔහු තමන්ගේ මූලිකත්වයෙන් නව දේශපාලන ක්‍රියාකාරකම් රැසක් සංවිධානය කරනවා. ඒවා සමඟ ක්‍රියාත්මක වෙනවා.

නමුත් ඒ තත්වය හිතන තරම් පහසු වෙන්නෙ නෑ. එක්තරා අවස්ථාවක දී ඔහු නොසිතන අවස්ථාවක දී මේ දේශපාලන ක්‍රියාකාරකම් නිසා ම ඔහු අත් අඩංගුවටත් පත් වෙනවා."

■ මේ ගැන තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍යයි. යම් අයෙක් හිංසනීය දේශපාලනයට එරෙහිව නව අදහස් අනුව කටයුතු කරද්දී අත් අඩංගුවට පත්වීම ඒක පිළිගන්න පුළුවන් දෙයක් ද?

"ඔව් ඒකම තමයි මෙතන තියෙන හිතන්න බැරි තත්වය. මෙහි එන ප්‍රධාන චරිතය ගමේ සිට නගරයට ඇවිත් නගරයේ මැද පාන්තිකයන්ගේ දරුවන් ඉගෙනගන්නා පාසලකට ඇතුළත් වෙනවා. ඔහු ඉගෙනීමට සමත්කම් දක්වන පසුබිමක විශ්ව විද්‍යාලයටත් යනවා. විශ්ව විද්‍යාලය කියන්නේ විශ්ව අධ්‍යාපනයක් ලැබෙන සම්මානනීය පිළිගැනීමක් ඇතිව තමයි ඔහු එහි යන්නෙ. ඒත් එහි දී සාම්ප්‍රදායික විදිහට සටහන් වනපොත් කරමින් සිදු කෙරෙන අධ්‍යාපනය ගැන ඔහුට ලොකු කලකිරීමක් ඇති වෙනවා. ඔහු බලාපොරොත්තු වූ සංවාදශීලි පරිසරය එහිදී ඔහු අත් විඳින්නේ නෑ. තවද දේශපාලනයේ ඇති අනුකාරකවාදී බව, නුදු සටන් පාඨ, උද්ඝෝෂණ මුල් කොටගත් දේශපාලන ක්‍රියාකාරකම්, යන මේ හැම දෙයක්ම නිසා ඔහු තුළ ඇති වන්නේ විඩාපත් බවක්. කලකිරීමක්. එහෙම උකටලී වෙලා ඉන්න අතරෙදි තමයි නව දේශපාලන සංස්කෘතියක් වෙනුවෙන් ඔහු තුළ අදහස් පහල වෙන්නෙ. හැබැයි එතනදි ඔහු කාගෙත් තරහකාරයෙක් එහෙම නැත්තං විරුද්ධවාදියෙක් වෙනවා. කවුරුත් ඔහුව සැක කරන තත්වයක් ඇති වෙනවා.

තමන්ගේ ම නව දේශපාලන අදහස් සමඟ යන දේශපාලන ක්‍රියාකාරකම් වගේ ම සංවිධාන ඇති කර ගනිමින් කටයුතු කරන ඔහු අර කිව විදිහට සැකය හා විරුද්ධවාදිකම් නිසා අවසානයේ දී අත් අඩංගුවට පත් වෙනවා. මේ කතාවේ ගලා යෑම තුළ පවතින සිද්ධිමය තත්වය තමයි ඒ."

■ ඔහු මොන වගේ තැනක ඉඳලද ඒ නව දේශපාලන සංස්කෘතිය ගැන අදහස් පළ කරන්නෙ. ඒ තත්වය තවත් විකල්ප දේශපාලන තත්වයක් හැටියට ගන්න පුළුවන් ද?

"ඇත්තෙන්ම ඔහු එහි දී බලාපොරොත්තු වෙන්නේ හිංසනයෙන් තොර දේශපාලන ක්‍රියාකාරීත්වයක්. හිංසනය, ප්‍රචණ්ඩත්වය තුළ සැබෑ දේශපාලනය වල්මත් වෙනවාය කියන හැඟීමකින් තමයි ඔහු කටයුතු කළේ. ඒ වගේ ම අනුන්ගේ ම අදහස්, න්‍යායන්, මතවාද මත යැපෙමින් පවත්වාගෙන යන දේශපාලන ක්‍රියාකාරකම් ඔහුගේ විවේචනයට හසු වෙනවා. එතන දී ඔහු පෙන්වා දෙන්නේ තමන්ගෙග් ම පොළවේ මුල් ඇදපු දේශපාලනයක් අපට අවශ්‍ය බව යි. ඒ අනුව සියලු සංවර්ධනීය තත්වයන් අපේය කියන ස්වායත්ත බව මත ගොඩ නැගිය යුතය යන්න තමයි ඔහුගේ පෙන්වා දීම වුණේ. මේ පෙන්වා දීම නිසා තමයි ඔහු දෙපැත්තම තරහ කරගන්න තැනකට යන්නෙ. නමුත් ඔහුව අත් අඩංගුවට ගෙන කරපු ප්‍රශ්න කිරීම් වල දී පවා ඔහු කීවේ මේ කතාව ම තමයි.

එතන දී ඒක විකල්පයක් ද, විසංවාදයක් ද කියන දේවල් මේ කතාව එක් එක් අය බාරගන්න විදිහ තමයි තීරණය වෙන්නෙ. අර මං මුලදිත් කිව්වා වගේ ඔහු ඔත්තුකාරයෙක්, විරුද්ධවාදියෙක්ය කියන ප්‍රතිවිරුද්ධ අදහස් ඔහුගේ මේ අදහස් පිළිනොගැනීම වගේම අවබෝධ කර නොගැනීම කියන කාරණා මත ඇති වන පිළිගැනීම් හැටියට තමයි මෙහිදී අපට දකින්න පුළුවන් වෙන්නෙ.

■ මෙතනදී ඔහු ව්‍යාජ ප්‍රතිරූප ප්‍රතික්ෂේප කරන තත්වයක් ද දකින්න ලැබෙනවා යැයි මම කිව්වොත්...?

පැහැදිලිවම එහෙම තත්වයක් තියෙනවා. උදාහරණයක් හැටියට එක තැනක දී ඔහු ප්‍රකාශ කරනවා දුකේ දි වහා පිහිට වන, අයුක්තියට එරෙහිව ලේ හලාගෙන සටන් වදින එසේ ජයග්‍රහණ ලබා දී කිසිවක් ම පෙරළා බලාපොරොත්තු නොවී අසුන් පිට නැගී කාන්තාර බිම් පසු කරමින් නොපෙනී යන ආශ්චර්යවත් මිනිස්සු තමන් දැක ඇත්තේ බටහිර ගොපලු චිත්‍රපටවල පමණයි කියලා.

ඒ විදිහට බැලුවම අපිට දැනෙනවා ඔහු ඉල්ලා සිටින්නෙ ප්‍රතිරූප වලින් හදපු දේශපාලනයක් නොව සැබෑ යථාර්තවාදී දේශපාලනයක්ය කියන එක.

දේශපාලන ජයග්‍රහණයක් සැමවිට ම අපේකමත් සමඟ බැඳුණ යථාවාදී දේශපාලන ජයග්‍රහණයක් විය යුතුය කියන තැන තමා ඔහු ඉන්නෙ."

■ මෙතන දී කෙනෙකුට මෙහෙම චෝදනාවක් ගේන්න පුළුවන්. ඒ අනුව ඔහු සිටින්නේ දූපත්වාදී මානසිකත්වයකය කියල කියන්න පුළුවන් නේද?

"නෑ, ඒක ඔහු තුළින් ම ප්‍රතික්ෂේප වෙනවනෙ. ඔහු ඉතා පැහැදිලිවම පෙන්වා දී තිබෙනවා, අප ජාත්‍යන්තර ජයග්‍රහණත් සමඟ ගනුදෙනු කළ යුතුයි කියලා. ඒ නව සංවර්ධනයත් සමඟ ඉදිරියට යා යුතුයි කියලා. නමුත් ඒ සෑම තැනකදී ම අපි "අපි වීම" අවශ්‍යයි කියලා."

■ වෙන විදිහකට කියනවා නම් අපි අපේ මුල් සිඳගෙන කුමන දේශපාලන ජයග්‍රහණයක් ලැබුවත්, එයට ස්ථිර පැවැත්මක් ලැබෙන්නෙ නැහැ. එහෙම නේද ?

"ඔව්, අපි නව සංවර්ධනයන් සමඟ ඉදිරියට යා යුතු යි. නමුත් ඒ සෑම තැනකදී ම අප කටයුතු කළ යුත්තේ අපේ පොළවේ මුල් ඇදපු තැනක ඉඳගෙනයි."

පාඨක විනිශ්චය යනු අවසාන නිගමනය ද?

කෘතිය: **පුත්තා වස්තු**
කර්තෘ: **යසවර්ධන රුද්රිගු**
ප්‍රකාශනය: **දයාවංශ ජයකොඩි සහ සමාගම**
විමසීම්: **077 311 2623**

"දරුවෝ මිනිසුන්ට පිහිට වෙත්.
බිරිය උතුම් යහළුවා ය.
පොළොවේ යම් ප්‍රාණියෙක් ජීවත් වෙත් ද,
ඒ සත්වයෝ
ජලය ඇසුරු එකට ජීවත් වෙත්."
(සංයුක්ත නිකායෙ වත්ථු සුත්‍රය)

මිනිස් වර්ගයා ශිෂ්ටාචාරයට පිවිසෙන්නේ ම මිනිස් බලය මුල් කරගනිමිනි. එතැන දී ශක්ති වන්තයා ජය ගැනීම මුල් තැනට එන අතර දුර්වලයාගේ අසරණ වීම නියතියක් ලෙසින් ම පැවතුණි. සත්ව ලොව දී අදටත් සිදු වන්නේ දුර්වලයා මිය යෑම ය.

ප්‍රබලයාගේ පැවැත්ම පවතින්නේ එවැනි පසුබිමක ය. කෙසේ වෙතත් ක්‍රමයෙන් බුද්ධිමය වශයෙන් ඉදිරියට එමින් ඒ තුළින් උපදවා ගන්නා මානව සංවේදිතාව හමුවේ තමන් අසල සිටින දුර්වලයා කෙරෙහි අනුකම්පාව වඩන හා රැකවරණය ලබා දෙන තැනකට මිනිසා පත් වෙයි.

ශාරීරික අංග විකලතාව යනු විශේෂ අවස්ථා අවශ්‍ය වන තත්වයක් ලෙසින් දියුණු ලෝකය අවබෝධ කරගන්නේ ඔවුන්ගේ මානව සංවර්ධනීය ආකල්පවල ප්‍රතිඵලයක් වශයෙනි.

අනිත් අතට කුඩා කල සිට ම ඔවුන්ගේ දරුවෝ අනුකම්පාව ලැබීමට නොව ධෛර්යෙන් ජීවත් වීමට උගැන්ම ලබන්නෝ වෙති. එතැන දී අනවශ්‍ය සංවේදිතාවන් ඉවත දමයි. ඒ වෙනුවෙන් සංවර්ධිත ක්‍රමෝපායන් ඔවුහු නිර්මාණය කරගෙන සිටිති.

යසවර්ධන රුද්රිගු "පුත්තා වස්තු" ලියන්නේ එවැනි විශේෂ අවස්ථා අවශ්‍ය කරන දරුවෙකු පසුබිම් කරගෙන ය. ඒ පිළිබඳව ඔහුගේ අදහස් දැක්වීම මෙසේ ය.

"දරුවන් දෙමාපියන්ට සම්පතක් වන බවට මතයක් පවතී. එහෙත් සෑම විට ම ඔවුන් සම්පතක් වේද යන්න විවාදාත්මක ය. තමා හැදූ වැඩූ දරුවන් තමන්ට ම විපතක් වන විට දෙමාපියන් ගත යුතු පියවර කුමක් ද? උණු හින්දා බොන්නත් බැහැ. කිරි හින්දා අහක දමන්නත් බැහැ.යැයි ගැමි වහරක් ඇත."

ඉහත පෙන්වා දීම තුළ ඉතා පැහැදිලිව මත කතුවරයා තමන් සිටින්නා වූ ආස්ථානය පිළිබඳව ඉගි- යක් සපය යි. පැරණි ගැමි ඉගැන්වීම් ම මතු කරමින් ඔහු ඒ තත්වය විස්තර කරයි. අනවශ්‍ය උණුසුම් බව නිවා කිරි සකස් කොට ගැනීමේ නව සංවර්ධනීය ක්‍රමෝපායන් වෙනුවෙන් සාම්ප්‍රදායික ආසියානු සමාජය සූදානම් නැති බව හා සූදානමක් නැති ආකාරය ඉන් ගම්‍ය වන්නේ දැයි විමසා බැලීම වටී.

"මෙහි කතා නායකයා වන මාතුපාල තුළ දරු කැක්කුම නොතිබුණා නොවේ. ඔහුගේ ක්‍රියා කලාපය අනුමත කරන්නට හෝ නොකරන්නට ඔබට අයිතියක් ඇත. මාතුපාල විවාහ ජීවිතයේ එක තැනක් වරද්දා ගත්තා ද? ඔහු ඒ තත්වයට පත් වුයේ මොන බලවේග නිසා ද? කුමන ආකාරයකින් හෝ උපන් දරුවකු පිළිබඳ දෙමාපියන් කවර වගකීමක් දැරිය යුතු ද යන්න සාකච්ඡාවට බඳුන් විය යුතු කරුණක් බව පෙනෙන්නට තිබේ."

ඉහත ප්‍රකාශයට අනුව කතුවරයා තමන් තෝරාගත් ප්‍රස්තුතය පිළිබඳව යම් විමසීමක යෙදෙන්නට ගන්නා උත්සාහයක් ද දැකිය හැක. කෙසේ වුවත් අවසාන වශයෙන් කෘතියේ විනිශ්චය සම්බන්ධ වගකීම පාඨකයාට ම පවරන පොදුවේ බොහෝ නවකතාකරුවන් විසින් සිදු කරනු ලබන කටයුත්තට ම ඔහු ද යොමු වී තිබේ.

මෙතන දී කතාකරුවාගේ වගකීම විනිශ්චයක් ඉදිරිපත් කිරීම නොව කතාව ඉදිරිපත් කිරීමය යන මහලු සාහිත්‍ය න්‍යාය මතක්වන බව ද කිව යුතු ය. ඉදින් එය එසේ වී නම් ලොව බොහෝ විශිෂ්ට නවකතා මෙන් ම කෙටි කතා අහක දැමීමට සිදු නොවන්නේ ද? ඒ මහලු මතවාද හමුවේ ඇත්තට ම ගිලිනී ගියේ ලේඛකයාගේ දෘෂ්ටිමය වටිනාකම යි.

අවසානයේ දී එය අප රටට අදාළව ගත් කළ වල්මත් වී හසරක් නොදුටිමී තත්වයෙන් ම ඉතිරි විය. විනිශ්චය තමන් බාර නොගත් අපූරු ස්වභාවවාදී ශෛලියකින් සිය කතා කලාව මෙහෙය වූ චෙකොෆ්ගේ "මනමාලි" (සිංහල පරිවර්තනය -පද්මහර්ෂ කුරුණගේ) වැනි කෙටි කතාවක් කියවා අවසන් කරන පාඨකයා මෙතෙක් තමන් නොවිඳි අත්දැකීමක් විඳින තරමට ම නව දැක්මකින් යුත් සුදානමකින් සන්නද්ධ වීමක් ද ඇති කර ගනී යි. පසුගාමී රුසියානු සමාජයේ වැඩවසම්වාදය ප්‍රතික්ෂේප කොට නව ආලෝකවත් සමාජයක් වෙනුවෙන් යොමු වෙනවා හැර වෙනත් විකල්පයක් නැතැයි යන තැන ට චෙකොෆ් සිය පාඨකයා ව ගෙන එයි. ඒ වෙනුවෙන් ම නිර්මාණය කළ චරිතයක් බවට "නාද්යා" පත් වේ.

යසවර්ධන රුද්රිගු නිර්මාණය කරන මාතුපාලගේ අසරණ වීම පසුගාමී මෙරට සමාජ දේශපාලනය තුළ කිනම් විනිශ්චයක් පාඨකයාට ලබා දෙනු ඇද්ද? එය කුමන විනිශ්චයක් වුණත් පාඨකයා තමන් විෂයයෙහි ම ඇති කරගන්නා (තම තම නැණ පමණින්) විනිශ්චයක් වන බවට සැක නැත.

ඉදින් එය මාතුපාලට එරෙහි වුණත් පක්ෂ වුණත් පොදුවේ ගත් කල සමාජීය වශයෙන් ලැබිය හැකි ආකල්පමය ප්‍රතිලාභය කුමක් ද? හුදු සංවේදිකම මත පිහිටා කතාවක් ඉදිරිපත් කිරීම තුළ පොදුවේ අප ලබන ජයග්‍රහනය කුමක් ද? "අනේ මෙවැන්නක් තවත් කෙනෙකුට නොවේවා" යන හිස් ප්‍රාර්ථනාව පමණක් ද? සාහිත්‍යකරුවෙකුගේ කාර්යභාරය යන්නෙහි සැබෑ අරුත වන්නේ මෙවැනි හිස් ප්‍රාර්ථනාවක් යැයි කතුවරයා විනිශ්චය කොට ඇති බවක් ඒ නිසා පාඨකයාට හැඟී නොයයි ද? එවැනි පසුබිමක පාඨකයා කුමක් නම් විනිශ්චය කරන්න ද?

වෂී 2021ක් වූ පෙබරවාරි මස 21 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

සිළුමිණ The Silumina JOBS රැකියා අතිරේකය

ලංකාවේ කම්කරු නීතියේ උපත - 2 නීතිඥ අශාන් ඉන්දික

ලංකාවේ කම්කරුවන්ට ජීවය දුන් සමසමාජ පක්ෂයේ ඉල්ලීම්

ලංකාවේ ප්‍රථම දීප ව්‍යප්ත වැඩවර්ජනය අපට හමුවන්නේ 1923 වර්ෂයේදී. මේ වැඩ වර්ජනයට හේතුව වූයේ වේල්ස් කුමාරයා ලංකාවට පැමිණෙන බවට කළ දැනුම් දීමක්. මේ ආගමනය සහ ඒ වෙනුවෙන් දරන්නට සූදානම් වන මහා වියදම මෙන්ම තමන්ගේ ජීවිතවල කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබීම හේතුවෙන් කම්කරුවන් මහා වැඩවර්ජනයක නිතර වූවා.

වතු කම්කරුවන්

මේ වැඩවර්ජනය සාර්ථක වීමට එක් ප්‍රධාන හේතුවක් බලපැවා. ඒ තමයි එයට හිමිවුණු දක්ෂ නායකත්වය. මේ කම්කරු නායකයා අන් කිසිවකු නොවෙයි. ඒ.ඒ. ගුණසිංහ මහතායි.

අදටත් ශ්‍රී ලංකාවේ කම්කරු නායකයන් අතර ඉහළම තැනක වැජඹෙන ඒ.ඒ.ගුණසිංහ ප්‍රථම වරට ලංකාවේ ජාතික රාජ්‍ය සභාවේ කම්කරුවන් නියෝජනය කළා. ඔහු පැවත ආවේ අපේ රටේ මධ්‍යම පාන්තික පවුලකින්. ඔහුගේ පවුල් පසුබිම මතාව තිබියදීත් ඔහු කම්කරුවන් නියෝජනය කළා. ඔහු කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියේ කම්කරුවන් දේශීය ධනපතියන්ගේ ජීඩනයට ලක්ව, ඉතා කණගාටුදායක ජීවිත ගෙවන අන්දම සම්බන්ධව ඔහු තුළ පැවති විරෝධය හේතුවෙන්.

එකල අති ප්‍රසිද්ධ වූ බද්දක් ලෙස ඉංග්‍රීසි අධිරාජ්‍යය විසින් පනවන ලද 'ඇඟ බද්ද' සඳහන් කළ හැකියි. මේ ඇඟ බද්ධ මුදලින් ගෙවිය යුතුයි. නැතහොත් එහි වටිනාකමට සමානව ශ්‍රමය කැප කළ යුතු වනවා. ඒ.ඒ.ගුණසිංහට කොතරම් වත්කම් තිබුණත් ඔහු මේ ඇඟ බද්ධ ගෙවීම ප්‍රතික්ෂේප කර සිටියා. එවිට අධිරාජ්‍ය පාලනය ඔහුට නියම කර සිටියේ ඇඟ බද්ධ ගෙවීමට වත්කම් නොතිබූ

කොල්වින් ආර්. ද සිල්වා

එන්. එම් පෙරේරා

සෙසු මිනිසුන් සමග මාර්ග ඉදිකිරීමේ කටයුතු සඳහා ශ්‍රමය ලබා දෙන ලෙසයි. ඒ.ඒ.ගුණසිංහ තමා සාමාන්‍යයෙන් අඳින පලඳින යුරෝපා ඇඳුම් කට්ටලයෙන් සැරසී මහ පාරේ වැඩට දායක වූවා. අදටත් පිටකොටුව ගුණසිංහ පුරය අසල දක්නට ලැබෙන ප්‍රතිමාවෙන් සිහිපත් කරන්නේ ඒ අවස්ථාවයි.

නමුත් පසුකාලීනව ඒ.ඒ. ගුණසිංහගේ කම්කරු නායකත්වය පිරිහීමට ලක් වූවා. ඔහුගේ නායකත්වය ඉතා සියුම් ලෙස අප්‍රසාදය පත් කිරීමට, දක්ෂ ධනවාදී මිනිසුන් කටයුතු කළා. ඒ වගේම ක්‍රමයෙන් සටන්කාමී පිළිවෙතින් බැහැරව පාලකයන් සමග සාකච්ඡා මාර්ගයෙන් ඉල්ලීම් දිනා ගැනීමේ පිළිවෙතට විතැන් වීම හේතුවෙන්ද ගුණසිංහ මහතා කම්කරුවන් අතර ක්‍රමයෙන් ජනප්‍රියත්වයෙන් හීන වීමට පටන් ගත්තා.

මේ අනුව ක්‍රමයෙන් ලංකාවේ කම්කරු නායකත්වයේ හිඩැසක් ඇති වූවා. ඒ හිඩැස පුරවනු ලැබුවේ ලංකාවේ වාමාංශික ව්‍යාපාරය විසින්. ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භකයන් වන්නේ ලංකාවේ ධනපති පන්තියේ දරු පිරිසයි. මේ දරුවන් ඔවුන්ගේ පවුල්වල මුදල් ලාභයෙන් පිටරටවල ගොස් අධ්‍යාපනය ලබා ලංකාවට පැමිණ සිටියා.

එන්.එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන වැනි පුද්ගලයන් මේ සඳහා උදාහරණ ලෙස දැක්විය හැකියි. මේ පිරිස බටහිර රටවල අධ්‍යාපනය ලැබීමේ ඒ රටවල සමකාලීනව පැතිර ගිය මාක්ස්වාදී අදහස්වලින් පෝෂණය වී සිටියා. ඒ වගේම ඔවුන් අධිරාජ්‍ය විරෝධී අදහස්වලින්ද පෝෂණය වී සිටියා.

අප රටේ ඉතා දරුණු ලෙස මැලේරියා වසංගතය පැතිරෙන්නේ මේ කාලයේදීයි. මේ වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූයේ කම්කරු ජනතාවයි.

ටිරෝනි වැවලගේ

34 පිටුවට

රියදුරු / රිය සහායක ඇබෑර්තු

ස්ටැසන් එක්ස්පෝර්ට්ස් (පුද්) සමාගමේ ප්‍රවාහන අංශයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් බඳවා ගනු ලැබේ.

රියදුරු - සැහැල්ලු සහ බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍ර සහිත, අවම වශයෙන් වසර 02ක දේශීය හෝ විදේශීය පළපුරුද්ද ඇති, මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුතු පුද්ගලයන් සඳහා රියදුරු පුරප්පාඩු පවතී.

රියදුරු සහායක - මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුතු, රියදුරු සහායක පුද්ගලයන් සඳහා පුරප්පාඩු පවතී.
පළපුරුද්ද තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

වයස අවු: 20 - 50ත් අතර දීර්ඝ සේවා මුරයන්හි යෙදීමේ හැකියාව ඇති කොළඹ හා ඒ අවට පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

පළපුරුද්ද සහ සුදුසුකම් අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් ඉතා ආකර්ෂණීය වැටුපකට හිමිකම් කියන අතර අනෙකුත් දීමනා ද හිමි වේ.

ඉහත සුදුසුකම් සනාථ කල හැකි සහතික පිටපත් හා ග්‍රාම නිළධාරී සහතිකය සමඟ තමාගැන සියළු විස්තර දන්නා තැනැත්තන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක ඇතුලත් සම්පූර්ණ අයදුම්පත සමග පැමිණෙන්න.

විමසීම්: ප්‍රවාහන කළමණාකරු
අසිත කොඩිතුවක්කු මහතා
දුරකථන: 011 2526696 / 0777 699375

Stassen GROUP

ස්ටැසන් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
නො: 833, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
E-mail: careers@stassengroup.com
Fax : 2540333, 2540662

UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

විශ්වවිද්‍යාල රෝහල
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

පුරප්පාඩු

හෙද සහායක
(පැයට ගෙවීමේ පදනම මත)

පුරප්පාඩු :

- **හෙද සහායක**

සුදුසුකම් :

- **www.kdu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් පසුව විස්තර ලබාගත හැකිය.**

වැටුප :

- **හෙද සහායක සඳහා පැයකට රු: 250.00 වශයෙන් ගෙවනු ලබයි.**

පොදු කොන්දේසි

1. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2021.03.03 දිනට පෙර **"විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කළයුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
2. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.
3. ප්‍රමාදවූ, අසම්පූර්ණ හෝ අදාළ ආකෘතියට පටහැනි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
4. www.kdu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් පසුව විස්තර ලබාගත හැකිය.

www.kdu.ac.lk

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් 2021 මාර්තු 20 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

කථිකාචාර්ය (පරිවාස) / කථිකාචාර්ය (ස්ථිර නොවන)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය

ක්ෂේත්‍ර :

ආයුර්වේද/ යුනානි/ සම සෞඛ්‍ය විද්‍යා

(මෞලික සිද්ධාන්ත සම්හිතා/ ශාලාක්‍ය/ ස්වස්ථවිරිතා හා යෝග/ අගධතන්ත්‍ර/ රසශාස්ත්‍ර හා භයිසජ්‍ය කල්පනා/ ශරීර රචනා/ ශරීර ක්‍රියා / දව සාසි (සයිඩ්ලා) / ඉල්මුල්ජරාහට්/ MBBS සමග අදාළ ක්ෂේත්‍රයේ PG සුදුසුකම් සහිත MD/Mphil/phd උපාධි සතු අයහට ප්‍රමුඛතාව හිමිවේ.)

වැටුප් පරිමාණය (2020.01.01 දිනට)

1. **U-AC3(IV) කථිකාචාර්ය (ආධුනික) :**
   රුපියල් 54,600-10X1,335 - 67,950/= (මසකට)
2. **U-AC 3 (III) : කථිකාචාර්ය (ස්ථිර නොකළ) :**
   රුපියල් 69,580 - 5X1,630 - 77,730/= (මසකට)
3. **U-AC 3 (II) : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය :**
   රුපියල් 79,360 - 11X1,630 - 97,290/= (මසකට)
4. **U-AC 3 (I) : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය :**
   රුපියල් 91,310 - 7X2,170 - 106,500/= (මසකට)

වෙනත් ප්‍රතිලාභ

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය / II ශ්‍රේණිය සඳහා වසර හතක සේවා සම්පූර්ණ කිරීමෙන් පසුව පූර්ණ වැටුප් සහිත වසර එකක කාලයක් සඳහා සප්ත වාර්ෂික නිවාඩු හිමිවේ.
2. විශ්‍රාම ගැනීමේදී/ සේවය අවසන් කිරීමේදී ලබා දෙනු ලබන පාරිතෝෂික දීමනාව, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතෙහි විධිවිධාන ප්‍රකාරව වේ.
3. සේවායෝජක විසින්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා විශ්‍රාම වැටුප් අරමුදලට සේවකයාගේ වැටුපට අදාළ 7% හා 8 % බැගින් වූ ලෙස දායකත්වයක් දරනු ලබයි.
4. එයට අමතරව සේවායෝජක විසින්, සේවක භාර අරමුදලටද සේවකයාගේ වැටුප ප්‍රකාරව 3% ක දායකත්වයක් ලබාදේ.

අයදුම්කිරීමේ ක්‍රමවේදය : අවශ්‍ය වැඩිදුර විස්තර, ආයතනයේ ආයතනික ශාඛාවේ සහකාර ලේඛකාධිකාරී වෙතින් (දුරකතනය - 0112687063) කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය. අදාළ අයදුම්පත් ලබාගැනීමත් තනතුරට අදාළ සුදුසුකම් අවශ්‍යතා බලාගැනීමත් ආයතනයේ වෙබ් අඩවිය වන www.iim.cmb.ac.lk වෙතින් බාගත කළ හැක.

යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, සහකාර ලේඛකාධිකාරී / ආයතනික ශාඛාව, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය යන ලිපිනයට එවීමෙන් හෝ ඊමේල් recruit@iim.cmb.ac.lk වෙත අයදුම්පතෙහි මෘදු පිටපතක් (PDF හා WORD) යොමු කිරීමෙන් 2021 මාර්තු 20 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අදාළ අයදුම්පත බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ සහතික පත්වල පිටපත් අමුණා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ සේවයේ සංස්ථාවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

සටහන : ඇබෑර්තු පවත්නා තනතුරු සංඛ්‍යාවට වැඩියෙන් අයදුම්පත් ලැබූ අවස්ථාවන්හිදී අවශ්‍ය මූලික සුදුසුකම් සහ / හෝ පළපුරුද්ද අපේක්ෂිත ප්‍රමාණයට හෝ ඉන් ඉහළට සතු අය කෙටි ලැයිස්තුගත කිරීමට ඇති අයිතිය ආයතනය සතුවේ.

අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
රාජගිරිය,
2021.02.16

සිළුමිණ சிழுமின The Silumina JOBS රැකියා අතිරේකය

ඔබේ රැකියාවත් ජීවිතයත් දිනවන ආකල්ප

අපි හැමෝම පාසල් ජීවිතය අවසන් කරලා කුමන හෝ රැකියාවලට සම්බන්ධ වෙනවා. ලැබුණු රැකියාව සතුටුදායක නැතිනම් තවත් අවස්ථාවලට යොමු වෙනවා. රැකියා මාරු කරනවා. එහෙම වුණත් බොහෝ දෙනාට තමන්ගේ රැකියාව සම්බන්ධව තිබෙන්නේ චෝදනා පමණයි.

'අපෝ මේක නම් ජයගන්න කවදාවත් බැහැ. මුළු ලෝකෙම ගැටලුවක පවතින වෙලාවක අපි විතරක් සාර්ථක වෙන්නේ කොහොමද?" මෙහෙම හිතනවා නම් ඔබත් සෘණාත්මක ආකල්ප දරන්නෙක්. වහාම ඔබේ සිතිවිලි වෙනස් කරන්න. ආත්ම විශ්වාසය ඇති කර ගන්න." කොහොම හරි මේ ප්‍රශ්නයෙන් ගොඩඑන්න මාර්ගයක් ඇති. මේ වගේ බලාපොරොත්තු ඇති කර ගන්න. මගේ ඉලක්ක වෙත මම කොහොමහරි යනවා. අමාරු අවස්ථාවල තමයි මගේ නියම දක්ෂතා පෙන්වන්න පුළුවන්"

'අපෝ ... මට නම් දැන් රස්සාව එපා වෙලා තියෙන්නේ. කරන්න දෙයක් නැති කමට යනවා'

ගොඩක් දෙනෙක් රැකියාව ගැන දරන්නේ මේ වගේ අදහසක්. එහෙත් ඔබ දන්නේ නැතිව ඇති ඔබේ රැකියාව කරදරයක් හෝ ආශිර්වාදයක් බවට පත් කර ගන්නේ ඔබම බව. එසේ කිරීමට ඔබට සහාය වන්නේ ඔබේ ආකල්ප. රැකියාව විතරක් නෙමෙයි, ජීවිතය සම්බන්ධයෙන් වුවත් තත්ත්වය මෙසේමයි. ඔබේ ආකල්ප ඔබේ දියුණුවටත්, පසුගාමීත්වයටත් බලපෑම් කරනවා.

මොනවද මේ ආකල්ප කියන්නේ. ආකල්ප කියන්නේ සරලවම ඔබ හිතන විදිය. ඔබ දැනටමත් දන්නවානේ ඔබේ සිතිවිලි තමයි ඔබේ ජීවිතයේ හැම දේටම ප්‍රධාන වෙන්නේ. ඔබ සතුටින්ද නැතිනම් දුකින්ද කියලා තීරණය කරන්නේ ඔබේ සිතිවිලි. ඒ වගේම තමයි ඔබ සාර්ථකද අසාර්ථකද කියලා තීරණය කරන්නෙත් ඔබේ සිතිවිලි. අන්න ඒ නිසයි ඔබේ සිතිවිලි මත සංවිධානය වන ආකල්ප වැදගත් වන්නේ.

බොහෝ දුරට මේ සම්බන්ධව ඔබ දැනුම්වත් නැහැ. සිදුවන්නේ ඔබත් නොදැනිම ඔබේ ආකල්ප ඔබේ මුළු ජීවිතයම පාලනය කිරීම. ඔබ ජීවිතයේ හැම දයෙක්ම දකින්නේ අයහපත් ආකල්ප මත පිහිටමින් නම්, අනිවාර්යයෙන්ම ඔබේ ජීවිතය ඔබට දුක් කන්දක් වගේ දැනෙනවා ඇති. ඒත් ඔබ ජීවිතය දෙස විශ්වාසය පිරි ඇසකින් බලනවා නම්, සැමදාම බලාපොරොත්තු මත ගොඩනැගනවා නම්, යහපත් අරමුණු ඔබේ සිතේ පවතිනවා නම් ඔබේ ජීවිතය ඔබට ශක්තියක් වනවාට සැක නැහැ.

දැන් අපි බලමු රැකියාවේ සාර්ථකත්වයට ආකල්ප බලපාන්නේ කොහොමද කියලා. බොහෝ දුරට රැකියා ස්ථානවල සමාන තනතුරුවල සේවකයන් දැනුම හෝ සුදුසුකම් අතින් සමානයන් වනවා. ඔවුන් එකිනෙකා වෙනස්වන එකම දේ තමයි ආකල්ප. ඉතින් ඔබ යහපත් ආකල්ප ඇති කර ගැනීමේ ප්‍රථම වැදගත්කම ඇතිවන්නේ අන්න එතනදී.

ඔබ තුළ ප්‍රථමයෙන්ම විශ්වාසය සහ බලාපොරොත්තු පැවතිය යුතුයි. ඔබ දේවල්වල සුභවාදී පාර්ශ්වය දැකීමට හුරු විය යුතුයි. මෙතනදී සර්ව සුබවාදියකු වීමට අවශ්‍ය නැහැ. ඔනෑම දෙයක් එහි තත්ත්වාකාරයෙන්ම වටහා ගැනීම වැදගත්. එහෙත් ඕනෑම අවස්ථාවක සුබවාදී පැත්තක්ද ඇතිබව අමතක කරන්නත් හොඳ නැහැ. සුබවාදීව සිතීමෙන් ඕනෑම බැරෑරුම් අවස්ථාවකින් ගොඩඒමටත්, ජය ගැනීමටත් හැකියාව ලැබෙනු ඇති. එහෙත් එහෙම වෙන්නේ ඔබේ සිතිවිලි ඔබත් සමග ශක්තිමත්ව පවතිනවා නම් පමණයි.

උදාහරණයක් විදියට මේ අවස්ථාව සලකමු. මුළු ලෝකයටම බලපෑම් කළ වසංගතය හේතුවෙන් අද ව්‍යාපාර බොහොමයක් පවතින්නේ ඉතා දුෂ්කර තත්ත්වයක. ඔබ රැකියාවේ සම්පූර්ණ කළ යුතු ඉලක්ක ඔබෙන් බොහෝ ඈතට ගිහින් තිබෙන්නට පුළුවන්. ඒත් ඔබ සුබවාදීව සිතිය යුතුයි. මේ අවස්ථාවේ බොහෝ රැකියා අවස්ථා අහිමි වී තිබෙනවා. ඇතැම් ව්‍යාපාර වැසී ගොස් තිබෙනවා. ඒත් ඔබ ආලාභ ලැබුවත් තවමත් පවතිනවා. ඉතින් ඔබ කළ යුත්තේ අනාගතය ගැන විශ්වාසය තැබීමයි. ඒ විශ්වාසය මත කටයුතු කිරීමයි.

එතැනදී ඔබට ඔබේ ආත්මාභිමානය විශේෂ සහායක් ලබා දෙනු ඇති.

'අපෝ මේක නම් ජයගන්න කවදාවත් බැහැ. මුළු ලෝකෙම ගැටලුවක පවතින වෙලාවක අපි විතරක් සාර්ථක වෙන්නේ කොහොමද?"

මෙහෙම හිතනවා නම් ඔබත් සෘණාත්මක ආකල්ප දරන්නෙක්. වහාම ඔබේ සිතිවිලි වෙනස් කරන්න. ආත්ම විශ්වාසය ඇති කර ගන්න." කොහොම හරි මේ ප්‍රශ්නයෙන් ගොඩඑන්න මාර්ගයක් ඇති. මේ වගේ බලාපොරොත්තු ඇති කර ගන්න. මගේ ඉලක්ක වෙත මම කොහොමහරි යනවා. අමාරු අවස්ථාවල තමයි මගේ නියම දක්ෂතා පෙන්වන්න පුළුවන්"

මෙවැනි සිතිවිලි මත කටයුතු කරන ඔබ කෙරෙහි ඔබේ ආයතනයේ ප්‍රධානීන් සතුටට පත් වනවා නොඅනුමානයි. මොකද මේ වගේ අවස්ථාවක ඔවුන් පසුවන්නේත් ඔබ හා සමානම මානසිකත්වයක වන නිසා. ඔවුන්ට ශක්තියක් වන ඔබ ඔවුන්ගේ මනසේ විශ්වසනීය සේවකයකු ලෙස තැන්පත් වන බව අමතක කරන්න එපා. ඉතින් ඔබට පුළුවන් ඔබට පහළ තනතුරක සිටින එවැනිම ධනාත්මක ආකල්පවලින් යුක්ත සේවකයන් හඳුනාගන්න. ඔවුන් සමග එක්ව කටයුතු කරන්න. ඒ වගේම ඔවුන්ගේ ඉදිරි දියුණුවට අත දෙන්න.ආයතනයක් කියන්නේ සාමූහික ක්‍රියාවක සාර්ථකත්වය අත් කරගන්නා ස්ථානයක්.

මේ සාමූහික ක්‍රියා වෙන් වෙන්ම සැලකුවාම තමයි රැකියා වෙන් කර හඳුනාගත හැකි වන්නේ. ඒත් ඔබේ කාර්යාල කාර්ය සහායකයාගේ සිට ආයතන ප්‍රධානියා දක්වා මේ සාමූහික ක්‍රියාවලියේ සාමාජිකයන්.

ඔබ සියලු දෙනාම එක වගේ තම උපරිමය ආයතනය වෙනුවෙන් තමයි සමස්ත ආයතනයක දියුණුව සැලසෙන්නේ. ඒ දියුණුව තුළින් තමයි පෞද්ගලිකව ඔබගේ රැකියාවේ දියුණුව ඇති වන්නේ. මෙන්න මේ දහම අමතක කරන්න එපා. රැකියාවේ ගැටලුකාරී අවස්ථාවලදී ශක්තිමත්ව එයට මුහුණ දිය හැකි නම්, එවැනි අවස්ථා ජය ගත හැකිනම් ඔබට ඔබේ පෞද්ගලික ජීවිතයේදීත් ජයගත නොහැකි ගැටලුවක් නොමැති තරම්. ඔබේ සිතිවිලි ශක්තිමත් කර ගන්න අමතක කරන්න එපා.

නිතර සතුටින් සිටින්න. කොපමණ ගැටුලුකාරී පුද්ගලයන් හමුවුණත්, කොතරම් ගැටලුවලට මුහුණ දීමට සිදුවුණත් සුබවාදී සිතිවිලි මත ක්‍රියාත්මක වන්න. ඔබේ අවස්ථාව එන තෙක් ඉවසිල්ලෙන් ඉන්න. ඔබේ ජීවිතයට ආදරය කරන්න. සමීපතමයන්නට ආදරය දෙන්න. ඔවුන්ගේ සතුට වෙනුවෙන් කැපවෙන්න. ඒ සඳහා ඔබට පහසුකම් සපයන ඔබේ රැකියාවටත් ආදරය කරන්න.මේ සියල්ල අවසානයේ ඔබේ ජීවිතයේ සාර්ථකත්වයට බලපාන බව අපි කිව්වට පිළිගන්න එපා. ඔබම අත් විඳින්න

ටිරෝනි වැවලගේ

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

තේ පර්යේෂණ මණ්ඩලය

පුරප්පාඩු

තලවකැලේ හි පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයෙහි පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

රැකියා විස්තරය :

අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් මත තේ පර්යේෂණ ආයතනයේ CF, CESS සහ වෙනත් දයක අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති වල සියලුම මූල්‍ය ක්‍රියා කටයුතු හා ක්‍රියාකාරිත්වයන් පිළිබඳ අධීක්ෂණ හා කළමනාකරණ කටයුතු පිළිබඳව වගකීම දැරිය යුතුය.

බාහිර :

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) හි අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම **සමග** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක අවම වශයෙන් වසර පහළොවක (15) ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද (සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද)

සටහන : පරිගණක ගත ගිණුම්කරණ වාතාවරණයක පළපුරුදු බව හා විවෘත බව විශිෂ්ට වාසියක් වනු ඇත.

අභ්‍යන්තර අපේක්ෂකයින් :

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) හි අන්තර් මාධ්‍ය මට්ටමේ සුදුසුකම

සහ

මධ්‍යම මට්ටමේ කළමනාකරුවෙකු ලෙස (M.M) 1 වන ශ්‍රේණියේ ගණකාධිකාරීවරයෙකු **හෝ** අභ්‍යන්තර විගණක ලෙස අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

වැටුප් පරිමාණය : HM 1-3 (2016) රු. 86,865 - 15 x 2,270 රු. 120,915/- (මාසිකව)

වයස : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ඇත.

තෝරා ගැනීමේ ක්‍රමවේදය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වෙනත් ප්‍රතිලාභ :

(i) තලවකැලේහි තේ පර්යේෂණ ආයතනයේදී කුලී රහිත හා ගෘහ භාණ්ඩ සහිත නිල නිවාසයක් සපයනු ලැබේ.

(ii) ආයතනයේ පවත්නා වෛද්‍ය යෝජනා ක්‍රමය යටතේ පවතින නීති රීති රේගුලාසිවලට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවනු ඇත.

(iii) ආයතනයේ මාර්ගෝපදේශ වලට අනුව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලේ ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ.

(iv) **අර්ථසාධක අරමුදල :** තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් තේ. ප. ආ. සේවක අර්ථ සාධක අරමුදලට සිය වැටුපෙන් 10% ක් වශයෙන් දයක විය යුතු අතර, ආයතනය විසින් එම අරමුදලට වැටුපෙන් 15% ක් වශයෙන් සිය දයකත්වය ලබාදෙනු ඇත. තවද ආයතනය විසින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) වැටුපෙන් 3% ලෙස දයක වනු ඇත.

(v) එක් ගෘහ සේවක කම්කරු ඒකකයක්ද සපයනු ලබනු ඇත.

(vi) තේ පර්යේෂණ ආයතනයේ (TRI) හි, සේවකයින්ට අදාළවන වෙනත් ආන්තික ප්‍රතිලාභ හිමිවනු ඇත.

මෙම තනතුර ස්ථිර එකකි. අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශය (CV) ඇතුළත් අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක් සහ අදාළ අධ්‍යාපනික සහ වෙනත් වෘත්තියවේදී සුදුසුකම් පිළිබඳ සහතිකපත්වල පිටපත් සහ සේවා සහතිකවල පිටපත් සහ අදාළ ක්ෂේත්‍රයෙහි අයදුම්කරුගේ කුසලතා හා දැනුම තක්සේරුකළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් හා ලිපිනද සමගින් 2021 මාර්තු මස 08 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත අත්සන් කරන අය වෙත ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වන්නේය.

රාජ්‍ය සේවයේ / රාජ්‍ය සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වන අතර, මෙම අවශ්‍යතාවයට පටහැනි හා අනුකූල නොවන අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතුය.

කරුණාකර වැඩිදුර තොරතුරු විස්තර සඳහා තේ පර්යේෂණායතනයේ (TRI) වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙන්න.

අධ්‍යක්ෂක,
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය (TRI),
ශාන්ත කුම්බස්, තලවකැලේ.

ලංකාවේ කම්කරුවන්ට...

33 පිටුවෙන්

අධිරාජ්‍යවාදී පාලකයන්ගෙන් සහ දේශීය වතු හිමි ධනපතියන්ගෙන් මේ පීඩිත ජනතාවට කිසිඳු සහනයක් අත්වුයේ නැහැ. ඉතිහාසයේ සඳහන් වන අන්දමට කෑගල්ල, යටියන්තොට වැනි ප්‍රදේශවල ගම්මානවල දිනකට පුද්ගලයන් පණහක් – හැටක් මැලේරියා වසංගතය හේතුවෙන් මිය ගිය බව සඳහන් වනවා.

මේ පිළිසරණක් නොමැති ජනතාවට උපකාර කිරීමට ඉදිරිපත් වන්නේ ලංකාවේ වාමාංශික ව්‍යාපාරයයි. ඔවුන් මේ ගම්මාන කරා ගොස් පරිප්පු සහ මැලේරියාවට තිබූ එකම ඖෂධය වන ක්විනීන් ගම් වැසියන්ට බෙදා දුන් බවට තොරතුරු පවතිනවා.

මේ කටයුතු වඩා විදිමත් ලෙස කිරීමට ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ සාමාජිකයන් සූරිය මල් ව්‍යාපාරය ආරම්භ කරනවා. මේ ලංකාවේ වාමාංශික දේශපාලන පක්ෂවල මුල් අවස්ථාව ලෙස හඳුන්වන්න පුළුවන්.

මේ සියල්ල අතර ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය බිහි වනවා. ඒ වර්ෂ 1935දී. ලංකා සමසමාජ පක්ෂය ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය ලෙස ආරම්භ කෙරෙනවා. මේ දේශපාලන පක්ෂය පිහිටුවීමේදී ප්‍රධාන අරමුණු දෙකක් සම්බන්ධව ප්‍රකාශ වෙනවා.

ඉන් පළමුවැන්න, ලංකාව නිදහස්, ස්වාධීන රාජ්‍යයක් විය යුතු බව. බ්‍රිතාන්‍යයෙන් සම්පූර්ණයෙන් නිදහස ලැබූ ස්වාධීන රාජ්‍යයක් බවට ලංකාව පත් කළ යුතු බව ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රධාන අරමුණක් ලෙස ප්‍රකාශයට පත් වනවා.

දෙවැනි අරමුණ ලෙස එහි සමාජිකයන් ප්‍රකාශ කරන්නේ ලංකාවේ සමාජවාදී අර්ථ ක්‍රමයක් ඇති කළ යුතු බවයි.

මේ වන විට ලංකාවේ නිදහස් සටනේ අයිතිය අමද්‍යප සංගමය, ලංකා ජාතික සංගමය තමන්ගේ තනි අයිතියට නතු කර ගෙන සිටි බවක් තමයි පෙනෙන්නේ.

ඒ ව්‍යාපාරවල ඉදිරි පෙළ නායකයන් වූ ඩී.එස් සේනානායක, ජෝන් කොතලාවල, සිද්ධි ලෙබ්බේ, එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක වැනි පුද්ගලයන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමග ඉතා සුහදශීලී පිළිවෙතක කටයුතු කළා. ඉන්දියාවේ මේ වන විට ඉතා බිහිසුණු සටන්කාමී නිදහස් අරගලයක් පැවතුණත් ලංකාවේ එසේ පැවතියේ නැහැ. ඔවුන්ගේ ඉල්ලීම වූයේ අධිරාජ්‍යයෙන් සම්පූර්ණ ස්වාධීන නොවන ඩොමීනියන් පාලනයක් ලංකාවට ලබා දිය යුතු බවයි.

එහෙත් එම අඩුව පිරවූ ලංකා සමසමාජ පක්ෂය ඒ වෙනුවට ප්‍රබල දේශපාලන ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටියා. ඒ සමගම ඔවුන් වැඩකරණ ජනතාවට ලබා දිය යුතු අයිතිවාසිකම් සම්බන්ධයෙන් කරුණු කිහිපයක්ද තම ඉල්ලීම් අතරට එක් කර තිබුණා.

එම ඉල්ලීම් මෙසේ සඳහන් කළ හැකියි.

1. ප්‍රමාණවත් වැටුපක් කම්කරුවන්ට ලබා දිය යුතුය.

2. සේවා වියුක්තිය විසඳීමට රජය වහාම රැකියා ලබා දිය යුතුය.

3. වැඩ කරන ජනතාවට කර්මාන්ත ශාලා සහ ගොවි බිම්වල රක්ෂණ ක්‍රමයක් ලබා දිය යුතුය.

4. පැය අටක වැඩ දිනයක් සැමට ලබා දිය යුතුය. (එවකට කොළඹ ඇතැම් ස්ථානවල වැඩ දිනය පැය 15ක් දක්වා වූ බවටද ඉතිහාස වාර්තා තිබෙනවා.)

5. කර්මාන්ත ශාලාවල පරිසරය සේවකයන්ට හිතකර පහසුකම්වලින් සමන්විත විය යුතුය. ඔවුන් සඳහා ආහාර ගැනීමට සුදුස් ස්ථාන, ඇඳුම් මාරු කිරීමේ ස්ථාන, වැසිකිළි පහසුකම්, පොත්පත් කියැවීමේ ස්ථාන ආදිය සකස් කර දිය යුතුය.

6. කොළඹ කම්කරු ජනතාවගෙන් බහුතරය ජීවත් වූ මුඩුක්කු නිවාස වෙනුවට වඩා පහසුකම්වලින් යුතු නේවාසිකාගාර ලබා දිය යුතුය.

ලංකා සමසමාජ පක්ෂය කම්කරුවන් වෙනුවෙන් සිදු කළ ඉල්ලීම් මෙසේ වන අතර, ගොවීන් වෙනුවෙන්ද ඉල්ලීම් කිහිපයක් සිදු කළා. ඒවා මෙසේයි.

1. බිත්තර වී පොළී රහිතව ලබා දිය යුතුය,

2. ගොවීන්ගේ ගවයන් සඳහා තණබිම් නිදහස් කර දිය යුතුය.

3. වාරිමාර්ග සඳහා ජලාශ නිදහස් කර දිය යුතුය.

4. දර කැඩීමට පවතින නීතිමය බාධාවන් ඉවත් කළ යුතුය.

ලංකාවේ කම්කරු ව්‍යාපාරවල කැපී පෙනෙන සිදුවීමක් ලෙස ඉතිහාස ගතවී ඇති බ්‍රේස්ගර්ඩ්ල් සිද්ධිය ලබන සතියේදී කියවන්න.

මිතුරාට සිටින හොඳම මිතුරා බුද්ධියයි - විලියම් ටෙම්පල්

හෙදියන් අවශ්‍යයි

කොළඹ දන්ත ශල්‍යාගාරයකට හෙදියන් අවශ්‍යයි. වයස අවුරුදු 21 ට අඩු තරුණියන් සඳහා මාසික දීමනාවක් සමග මාස 6 ක පුහුණුවකින් පසුව එම ශල්‍යාගාරයේම ස්ථිර රැකියාව ලැබේ. නේවාසික පහසුකම් නැත. දුරකථන අංකය ලිපිනය සහ අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් අදාළ කරුණු සමග අයදුම්පත්

දන්තශල්‍යාගාරය,
නො. 22, විජේරාම මාවත,
කොළඹ 07.

ලිපිනයට එවන්න.

ඇබෑර්තු ඇත
වඩු කාර්මික ශිල්පීන්

කළුතර නාගොඩ පිහිටි අප ආයතනය සඳහා වඩු කාර්මික ශිල්පීන් අවශ්‍යව ඇත.

අවශ්‍ය සුදුසුකම්

- වයස අවු.60 ට අඩු
- සුදුසුකම් හා පලපුරුද්ද මත වැටුප් තීරණය කරනු ලැබේ

2021 පෙබරවාරි මස 23 දින පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා පහත ලිපිනයට පැමිණෙන්න.

සී/ස. ඩබ්.එම්.ජේ. ප්‍රනාන්දු සමූහ ව්‍යාපාරය
නො: 576, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.

SLIIT INTERNATIONAL

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට අනුබද්ධ, SLIIT INTERNATIONAL ආයතනය, නවීන පන්නයේ යටිතල පහසුකම් සහිතව 2021 මාර්තු මස 01 දින සිට, නවම් මාවත කොළඹ 02 හි, ආරම්භවනු ඇත.

ඕස්ට්‍රේලියාවේ CURTIN UNIVERSITY වැනි සම්භවනීය විදේශ විශ්වවිද්‍යාලයන්හි අන්තර්ජාතිකව පිළිගත් ඉංජිනේරු උපාධි පාඨමාලා, SLIIT INTERNATIONAL ආයතනය මගින් පිරිනමනු ලබයි.

ඉංජිනේරු පර්යේෂණාගාර සහායක (Engineering Lab Assistant)

- උසස් පෙළ විෂයයන් 3 සමත්වීම සහ වෘත්තීමය සහතික පත්‍ර / සුදුසුකම්.
- අවම වශයෙන් වසර 2 පළපුරුද්ද.
- පර්යේෂණාගාර කටයුතු වලදී සහායවීමට හැකියාවක් තිබීම; එනම් සියළුම පහසුකම් සකසාදීම, උපකරණ නඩත්තුව, වාර්තා සටහන් තබා ගැනීම, සාමාන්‍ය දෛනික නඩත්තු කටයුතුවල යොමුවීම හා අවශ්‍ය අවස්ථාවලදී ඉහළ කළමණාකාරිත්වය දැනුවත් කිරීම.
- අන්තර්පුද්ගල සබඳතා හා සන්නිවේදන හැකියාවන් හි නිපුණතාවය.

නඩත්තු සහායක (Maintenance Assistant)

- උසස් පෙළ විෂයයන් 3 සමත්වීම සහ වෘත්තීමය සහතික පත්‍ර / සුදුසුකම්.
- අවම වශයෙන් වසර 2 පළපුරුද්ද; එනම් නඩත්තු කටයුතුවලදී සහායදීම සහ සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා සහායදීම.
- අන්තර්පුද්ගල සබඳතා හා සන්නිවේදන හැකියාවන් හි නිපුණතාවය.

අප ආයතනය හා එක්වීමට කැමැත්තක් දක්වන්නේ නම්, අදාල තනතුරු සඳහන් කර, ඔබගේ අයදුම් පත්‍රය විද්‍යුත් තැපෑලෙන් careers@sliit.lk වෙත හෝ මානව සම්පත් කළමණාකරු, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, නව නුවර පාර, මාලඹේ වෙත, දින 7ක් ඇතුලත ලැබෙන්න සලස්වන්න.

අධ්‍යක්ෂක තනතුර

පේව රසායන, අණුක පේවවේද හා පේව තාක්ෂණ ආයතනය
(IBMBB) කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ විශ්වවිද්‍යාලයේ පේව රසායන, අණුක පේවවේද සහ පේව තාක්ෂණ ආයතනය (IBMBB) හි අධ්‍යක්ෂක තනතුර සඳහා යථායෝග්‍ය පරිදි සුදුසුකම්ලත් අයවලුන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් / නම් කරනු ලැබූවන්, නාමිකයින්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු වන අතර, අයදුම්පත් භාරගත්තා අවසාන දින වන විට වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. කොළඹ විශ්වවිද්‍යාලයේ පේව රසායන අනුබ පේවවේද හා පේව තාක්ෂණ ආයතනය (IBMBB) **"ජාතික හා අන්තර්ජාතික සංවර්ධනය, සාක්ෂාත්කර ගැනීමේලා අනුක ජීව විද, ක්ෂේත්‍රයේ උසස්තම පර්යේෂණ කටයුතු හා මානව සම්පත් සංවර්ධනය සඳහා මූලපිරීම, මූලාරම්භය, ප්‍රවර්ධනය සහ පහසුකම් උත්පාදනය කිරීම"** හි අපේක්ෂා සහගත දැක්මක් සහ දෘෂ්ටියක් සමග මෙම කර්මාන්ත ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයෙහි හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් පුහුණු කරලීමේ තියැලී තියුක්තව සිටියි.

අධ්‍යක්ෂකවරයා ආයතනයේ ප්‍රධාන හා මූලික විධායක නිලධාරියා, ප්‍රධාන හා මූලික අධ්‍යයන/ ශාස්ත්‍රාලීය නිලධාරියා සහ ආයතනයේ ගිණුම්කරණ/ වගවීමේ නිලධාරියාද වනු ඇත. අධ්‍යක්ෂක තනතුර පූර්ණ කාලීන තනතුරක් වන අතර, අධ්‍යයන හා ශාස්ත්‍රාලීය කටයුතු සඳහා නායකත්වය සැපයීම උපදෙස් හා උපදේශන සූත්‍රගත කර සකස් කිරීම සහ මැනවින් පෙළ ගස්වන ලද අනාකුල ප්‍රධාහගත කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක කිරීම සහ කළමනාකාරිත්ව මණ්ඩලයේ තීන්දු තීරණ ක්‍රියාවට නැගීම, කෙරෙහි වගකීම භාරය දරිය යුතු වන්නේය. අධ්‍යක්ෂකවරයා පාරදෘශ්‍යභාවය, වගවීම සහ යහපාලනය පිළිබඳ මූලධර්ම හා ප්‍රතිපත්ති වලට දැඩිව එල්බ ගනිමින් ආයතනයේ පරිපාලනය කෙරෙහි සිය වගකීම් භාරය දැක්විය යුතුය.

අයදුම්කරු / නම් කරනු ලද්ද / නාමිකයා විශිෂ්ට හා අනර්ඝ සන්තිවේදන කුසලතා සහිත කැපී පෙනෙන ජයග්‍රහණ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ පෙර වාර්තා සහිත ඉහළ අධ්‍යයන හා ශාස්ත්‍රාලීය ශක්‍යතාවයෙන් හා ගුණාත්මකභාවයෙන් යුත් ආචාර්ය උපාධියක් හෝ සමාන අධ්‍යයන/ ශාස්ත්‍රාලීය සුදුසුකම් හා යෝග්‍යතාවයෙන් යුත් පේව රසායන අනුක පේවවේද, ජාන/ ප්‍රවේණි විද, පේව තාක්ෂණ, ප්‍රතිශක්තිවේද, ක්ෂුද්‍ර පේවවේද, කෘෂි තාක්ෂණවේද ක්ෂේත්‍රයන්හි හෝ අදාළ ක්ෂේත්‍රයක පර්යේෂණ කටයුතු සිදුකිරීම පිළිබඳ හිමිකාරිත්වයක් සතු අයෙකු විය යුතුයි. තවද අයදුම්කරු සතුව නූතන / නවීන කළමනාකරණ පද්ධති පිළිබඳ ICT (තොරතුරු, සන්නිවේදන, තාක්ෂණය) මත පදනම් තාක්ෂණවේද අනුකූලතාව සහිත කර්මාන්තමය පර්යේෂණ වැඩසටහන් හා විශ්වවිද්‍යාලය සමග සම්බන්ධතා පෝෂණය කර තංවාලීම සඳහා අන්තර් පුද්ගල දක්ෂතා/ කුසලතා සහ නායකත්ව ගුණාංග පිළිබඳ සාධනය කළ හැකියාවන් තිබිය යුතුය.

තනතුරේ සේවා කාලය

පත්වීමේ දින සිට වසර තුනක් (03) ක් සම්පූර්ණ වීමෙන් පසු හෝ ඔහු/ ඇය ඔහුගේ / ඇයගේ වයස අවුරුදු හැටපහක් (65) ක් සම්පූර්ණ වූ පසුව යන කරුණු දෙකින් (02) පළමුව සිදුවන අවස්ථාව වන විට, අඩුම තරමින් එක් (01) සම්පූර්ණ ධුර කාල සීමාවක් එම අධ්‍යක්ෂක තනතුරේ සේවය කළ හැකි අපේක්ෂකයින්හට ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ. ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු එම අධ්‍යක්ෂක තනතුරට පත් කරනු ලබන්නේ නම් ඔහු/ ඇය එම අධ්‍යක්ෂක තනතුරට අදළවන දීමනාද සමග ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරට අදළ වන අනෙකුත් දීමනාද සමග එම ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරේ වැටුප් වලට අඛණ්ඩව හිමිකරුවෙකු / හිමිකාරියක වනු ඇත.

අයදුම්කරු / නාමිකයා විසින්, තමන් විසින්ම පිළියෙල කරන ලද අයදුම්පත/ නාම යෝජනාපත (ආකෘතිපත්‍රය) සමග පහත දැක්වෙන ලිපිලේඛන ද ඉදිරිපත් කළ යුතුය.

- ❒ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ප්‍රකාශයක් (CV)
- ❒ ආයතනයේ සංවර්ධනය කෙරෙහි වන සිය දැක්ම/ දෘෂ්ඨි පථය පිළිබඳ ප්‍රකාශයක්
- ❒ IBMBB ආයතනය (පේව රසායන, අනුක පේවවේද සහ පේව තාක්ෂණ ආයතනය) හි සංවර්ධනය සඳහා වන ස්වකීය සැලැස්ම හා මූලෝපාය හා ක්‍රමෝපාය පිළිබඳ ලුහුඩු විස්තරයක්.
- ❒ තම් කරනු ලැබූවෙකු / නාමිකයෙකු නම් ඒ සඳහා සිය කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක් එම නාමිකයාගෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.
- ❒ උසස් අධ්‍යාපන සහ රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන්/ නාමිකයන්/ නාමයෝජිතයන් සිය අයදුම්පත්/ නාම යෝජනා අදළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන්නේය.

සියලුම අයදුම්පත් / නාමයෝජනා 2021 මාර්තු මස 20 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවතේ, අංක 90 හි කොළඹ විශ්වවිද්‍යාලයේ පේව රසායන, අණුක පේවවේද හා පේව තාක්ෂණ ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ලේඛනගත කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්/ නාමයෝජනා පත්‍ර බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂක තනතුර"** යනුවෙන් පැහැදිලිව සටහන් කරනු මැනවි.

සැ. යු. සුදුස්සන් තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය 2020.09.11 දනම හා අංක 7/2020 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා (UGC) චක්‍රලේඛය හි දක්වා ඇති විධිවිධාන හා ප්‍රතිපාදන අනුව සිදු කරනු ලැබේ. මෙම චක්‍රලේඛය www.ugc.ac.lk යන වෙබ් අඩවිය මගින් බාගත කර ගත හැකිය.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
පේව රසායන, අණුක පේවවේද හා පේව තාක්ෂණ ආයතනය (IBMBB),
කොළඹ විශ්වවිද්‍යාලය, අංක 90, කුමාරතුංග මුණිදාස මාවත,
කොළඹ 03.
2021.02.21

මුදල් අමාත්‍යාංශය
රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) ලේකම් කාර්යාලය,
නිලධාරීන් බඳවාගැනීම

මුදල් අමාත්‍යාංශයෙහි, රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන (e-GP) ලේකම් කාර්යාලයෙහි පහත සඳහන් තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීමට සුදුසුකම් සහ පළපුරුද්ද සහිත අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රසම්පාදන විශේෂඥ - තනතුරු 01

මාසික වැටුප :
රු. 100,000/- (සියලු දීමනා සහිතව)

වයස් සීමාව :
අවුරුදු 65 ට අඩු

සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් හෝ ඒ හා සමාන වෙනත් උපාධි සුදුසුකමක්. හෝ
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකමක්. සමග
කළමනාකරණ මට්ටමින් අවම වශයෙන් අවුරුදු 06 ක සුදුසුකම් තිබීම.

(දේශීය / විදේශීය) අරමුදල් මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල පළපුරුද්ද සමග රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරීන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

තෝරාගැනීමේ ක්‍රමවේදය :
මූලික සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තෝරාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

බඳවාගැනීමේ පදනම :
වසරක කාලයක් කොන්ත්‍රාත් පදනම මත

කොන්දේසි :

වසරක කාලයක් සඳහා සිදුකරනු ලබන පත්වීම් ප්‍රදනයෙන් අනතුරුව එම කාලය ඉක්මවා ගියපසු කාර්ය සාධනය අනුව සේවා කාලය දීර්ඝ කරනු ලැබේ. (සියලු කොන්දේසි 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ පත්වීම් සම්බන්ධව වූ ඉන්පසු නිකුත් කරන ලද චක්‍රලේඛ අනුව වේ)

අයදුම්පත් අධ්‍යාපන සහ වෘත්තීමය පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට 2021 මාර්තු 05 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අධ්‍යක්ෂ
රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය
දෙවන මහල, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01.

විද්‍යුත් ලිපිනය : egphr@promise.lk

අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

විද්‍යුත් ලිපිනයට එවනු ලබන අයදුම්පත්හි විද්‍යුත් ලිපිනයේ මාතෘකාව ලෙස අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ
රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය
17.02.2021

Hilton ලිය දිරිය

නිපුණතා වර්ධනය මගින් ශ්‍රී ලාංකික කාන්තාවන් දිරිගැන්වීම

වැඩසටහනේ අරමුණු

- නිපුණතා දියුණුව
- ගෞරවාන්විත ජීවනෝපායක්
- ඉහළ සමාජ තලයකට නැංවීම
- තිරසාර ප්‍රජා සත්කාරය

පාඨමාලාවේ සැකැස්ම

ගෘහ පාලන අංශයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව

න්‍යායාත්මක පුහුණුව (මාස 1)
ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය

ප්‍රායෝගික පුහුණුව (මාස 6)
හිල්ටන් ජාලය - ශ්‍රී ලංකාව

- ✔ නවාතැන් පහසුකම්
- ✔ දෛනික මූල්‍ය දීමනාව
- ✔ පළපුරුදු උපදේශිකාවන් යටතේ මග පෙන්වීම

පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසුව ශ්‍රී ලංකාව තුළ හෝ විදේශ රටක තෝරාගත් හිල්ටන් හෝටලයක රැකියා අවස්ථාව

සපුරාලිය යුතු සුදුසුකම්

- ✔ ආයතනයේ අගයන් හා අනුකූල වීම
- ✔ සාමාන්‍ය පෙළ විභාගය දක්වා අධ්‍යාපනය
- ✔ ඉංග්‍රීසි පිළිබඳ සාමාන්‍ය දැනුමක්
- ✔ වෘත්තීමය දියුණුවක් ලබා ගැනීමට ඇති අපේක්ෂාව

අයදුම් කළ යුත්තේ කෙසේද

උනන්දුවක් දක්වන අපේක්ෂිකාවන්, සම්මුඛ පරීක්ෂණයක් සඳහා සතියේ දිනවල පෙ.ව. 10.00 සිට ප.ව. 6.00 දක්වා, කොළඹ හිල්ටන් හෝටලයේ මානව සම්පත් අංශය වෙත පැමිණෙන්න.

එසේ නොමැතිනම් සම්පූර්ණ කළ අයදුම්පතක් (CV) colhi.hrd@hilton.com යන විද්‍යුත් තැපෑලට යොමු කරන්න. විද්‍යුත් තැපැල්පත් මාතෘකාව "හිල්ටන් ලිය දිරිය" (Hilton Liya Diriya) ලෙස සඳහන් කරන්න.

Hilton

සිළුමිණ JOBS
සිළුමිණ The Silumina
රැකියා අතිරේකය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

තනතුරු ඇබෑර්තු

"කළමනාකරණ සහකාර" - (තාක්ෂණ) සේවා ගණය
පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවාගැනීමට අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ "කළමනාකරණ සහකාර" - (තාක්ෂණ) සේවා ගණය පුස්තකාලයාධිපති තනතුර (01) සඳහා බඳවාගැනීම පිණිස ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. වැඩි විස්තර සඳහා www.judgesinstitute.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත්‍ර 2021.03.25 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පමණක් මතු සඳහන් ලිපිනයට එවිය යුතුය.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

තනතුරු පුරප්පාඩු

උතුරු පළාත් සභාවේ සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

01. "සාදු සේවිකා" III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2021
02. සමාජ සේවා නිලධාරී II වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2021
03. සංඥා භාෂා පරිවර්තක තනතුර (III) වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2021

දෙමළ හා සිංහල භාෂා මාධ්‍යයන් මඟින් ශිර්ෂගත තනතුරුවලට අදාළ තරඟ විභාගයට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් අයදුම්පත්‍ර කැඳවා ඇත. මෙම තනතුරු පුරප්පාඩු සඳහා විවෘත තරඟ විභාගය මඟින් පත්කරගනු ලැබේ. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 2021-03-05 වේ.

අයදුම්කරුවන් www.np.gov.lk → Recruitment and Exam → Advertisement යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය හා උතුරු පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන කාර්යාලයන්හි ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධ තොරතුරු ලබාගෙන සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව අයදුම් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

එස්. තිරුවාකරන්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත.
15-02-2021

1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල
පළවූ හා පළනොව ඡායාරූපවල දළ
සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත.
ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය
නම් පුවත්පතේ නම, දිනය සහ
ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා
හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491
LAKE HOUSE

කාර්ය මණ්ඩල බඳවාගැනීම

තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

වාරිමාර්ග අමාත්‍යාංශය

තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියේ පහත දැක්වෙන තනතුරු සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලබන අතර, අයදුම්කරුවන්හට තම ජීවදත්ත, අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සමග ඇතීත් නොවන නිර්දේශකයින් දෙදෙනකුගේ නම් හා විස්තර සහිත අයදුම්පත්, ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට 2021 මාර්තු 1 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

අනු අංකය	තනතුර	මට්ටම	සුදුසුකම්	තනතුරු සංඛ්‍යාව	රාජකාරී ස්ථානය
01	ජ්‍යෙෂ්ඨ සමාජ නිලධාරී	PS 5	01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික, වෘත්තීය සුදුසුකම් මට්ටම 7 නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 05 ක පළපුරුද්ද. 02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 10 ක පළපුරුද්ද. 03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 15 ක පළපුරුද්ද	01	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය PLU කන්දකැටිය
02	ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරී	PS 5		01	
03	සැළසුම් ශිල්පී	PS 6	01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් සුදුසුකම් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය/ සමාන වෘත්තීය සුදුසුකම් හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික, වෘත්තීය සුදුසුකම් මට්ටම 7 නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 03 ක පළපුරුද්ද. 02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 08 ක පළපුරුද්ද. 03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 13 ක පළපුරුද්ද	01	
04	ප්‍රසම්පාදන නිලධාරී	PS 6		01	
05	ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක	PS 6		01	
06	ප්‍රමාණ සමීක්ෂක		(පහත 1 හෝ 2 හෝ 3) 01. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික, වෘත්තීය සුදුසුකම් මට්ටම 7 නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 02 ක පළපුරුද්ද. 02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 6 ට නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 06 ක පළපුරුද්ද. 03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් තාක්ෂණික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5 ට නොඅඩු තාක්ෂණ ක්ෂේත්‍රයේ අදාළ තනතුරක් සඳහා ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සහ අවශ්‍ය විශේෂඥතා ශ්‍රේණියේ අඩුතරමින් වසර 11 ක පළපුරුද්ද	01	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය PLU කන්දකැටිය

රැකියාවේ කොන්දේසි

1. අයදුම්කරු වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.
2. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති/ සංවර්ධන ව්‍යාපෘති වල වැඩකිරීමේ පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.
3. ඉංග්‍රීසි භාෂා නිපුණත්වය, රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදු බව හා පරිගණක සාක්ෂරතාව මෙම තනතුරු සඳහා අත්‍යවශ්‍ය වේ.
4. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ ඉන්පසු සිදුවූ යම් ප්‍රතිශෝධන ප්‍රකාරව රජයේ අනුමත වැටුප් පරිමාණයන් හා දීමනා හිමිවේ. (පිවිසෙන්න. http//www.treasury.gov.lk)

ඉහළම සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටිලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, තෝරාගැනීම කුසලතා මත පදනම්ව සිදු කෙරේ. එසේ හෙයින්, බඳවා ගැනීමේ ක්‍රියාදමයට කවරාකාර හෝ පෙළඹවීමක් සිදු කිරීම හෝ නියෝජිතයක් සිදු කිරීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත. මූලික සුදුසුකම් සනාත කරලීම සඳහා සහතික පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුය. අසම්පූර්ණ සියලු අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. රාජ්‍ය සේවයේ/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ සංස්ථා හා වෙනත් රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අය තම අයදුම්පත් තමන් තෝරාගනු ලැබුවහොත් පූර්ත කාලීනව මුදවා හැරිය හැකි බව ප්‍රකාශ කරන අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉංජිනේරු බී.ජී.ටී. ලසන්ත ගුරුගේ,
ව්‍යාපෘති අධ්‍යක්ෂ,
තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය.

රැකියා ඇබෑර්තු

ලලංකා සමූහ ව්‍යාපාරයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා කඩිනමින් සේවකයන් අවශ්‍යව ඇත.

- අරක්කැමියන්/ සුපවේදීන්
- කාර්යාල කාර්ය සහායකයින්

ආහාර හා නවාතැන් පහසුකම් සහිතයි.

ලලංකා වෝටර් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම

නො:13/3, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන
දූ.ක: 011-2722486, 2728648



21වැනි සියවසට එළඹෙන යෞවනයට

නිරවුල් ගමන් මග

ඉදුසජණා

කොළඹ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩබිමක

පුරප්පාඩු

තාක්ෂණ නිලධාරී (පුරප්පාඩු 2)

NCT (සිවිල්) සහ ගොඩනැගිලි පිළිබඳ වසර 10 ක පළපුරුද්ද හෝ සමාන සුදුසුකම් සහිත. සම්මුඛ පරීක්ෂණ පෙරවරු 8.30 සිට දහවල් 12.00 දක්වා. වේලාවක් ලබාගෙන හමුවීම සඳහා අමතන්න.

දුරකථන : 0701-919199

A 4 පේපර් කටර් මැෂින් ඔපරේටර් සහ පෝලාර් පේපර් කටර් මැෂින් ඔපරේටර් සඳහා

පුරප්පාඩු

- අයදුම්කරු සෑම අංශයකම නිපුණ සහ සේවා වටපිටාවට හැඩගැසිය හැකි අයෙකු විය යුතුය.
- අවශ්‍ය වෙතොත් අමතර වේලාවන් වැඩ කිරීමට කැමති විය යුතුය. අදළ පරිදි ගෙවීම් කරනු ලැබේ.
- දිගුකාලීන කොන්ත්‍රාත් පදනමින් බඳවාගනු ලබන අතර, කාලසීමාව සම්මුඛ පරීක්ෂණයේදී සාකච්ඡා කරගත හැකිය.
- තෝරාගනු ලබන අයදුම්කරුට ඉහළ වැටුප් හා දීමනා හිමිවනු ඇත.

වැඩිදුර විස්තර සඳහා අමතන්න / ජීව දත්ත ඊමේල් කරන්න.

අහමඩ් මයා 0752279279
info@riomarketing.lk
සටහන : තනතුර සඳහා වහාම බඳවාගනු ලැබේ.

තනතුරු පුරප්පාඩු

සීමාසහිත ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මධ්‍යම සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 02/2019 චක්‍රලේඛ අනුව මූලික සුදුසුකම් සපුරා ඇති සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - II හා I තනතුරු සඳහා මධ්‍යම පළාත තුළත්, අභ්‍යන්තර විගණක II හා I තනතුරු සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළත් ස්ථිර පදිංචිය ඇති වයස අවුරුදු 18 - 45 අතර අයවලුන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ. (දැනට සමුපකාර සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව බලපානු නොලැබේ)

සියලුම අයදුම්කරුවන් 2021.03.08 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **ගරු සභාපති, සී/ස ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය, 1/78, නුවර පාර, ගම්පොල** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැකි අතර, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

මූලික සුදුසුකම්, සියලු විස්තර සමිති කාර්යාලයෙන් හෝ ආසන්න විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබාගත හැකිය.

01. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - II හා I

වැටුප් පරිමාණ අංකය - එස්.ඊ.එම්.එල්. 02 : 01

වැටුප් පරිමාණය - 22,000-470x10-570x10-720x10 = 39,600/-

02. අභ්‍යන්තර විගණක II හා I

වැටුප් පරිමාණ අංකය - එස්.ඊ.එම්.එල්. 02 : 05

වැටුප් පරිමාණය - 19,600-450x10-550x10-700x10 = 36,600/-

මෙයට අමතරව සියලුම තනතුරු සඳහා මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් අනුමත දීමනා හා විශ්‍රාම දායකත්වය වැටුප් හිමිකම්ද ලබා දෙනු ඇත. සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතික, උප්පැන්න සහතිකය, සේවා සහතිකය හා අනෙකුත් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ ඉල්ලුම්පත් නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙයට,
සභාපති.

ගරු සභාපති,
සී/ස ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය,
1/78, නුවර පාර, ගම්පොල.

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නියාමන) - එච්. එම්. 1-1 "ජ්‍යෙෂ්ඨ කළමනාකාර" තනතුරු 01කි

තනතුරට අදාළ සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

සමග

අදළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IESL) වරලත් ඉංජිනේරුවරයකු වීම.

සහ

රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක " කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදළ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
   හෝ
2. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර සාමාන්‍යාධිකාරී (නියාමන / මෙහෙයුම් තඩත්තු / තිති / වාස්තු විද්‍යඥ) තනතුරේ 1 වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස

වයස අවුරුදු 35ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප HM 1-1 රු.80,295- 15X 2,270 = රු. 114,345.00

- ඉන්ධන දීමනාව සමග නිලරථයක් පාවිච්චි කිරීම සඳහා හිමිකම් ලබනු ඇත.
- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

2. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්/ පරිපාලන) - එම්. එම්. 1-1 "කළමනාකාර" තනතුරු 01 කි

තනතුරට අදාළ සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එම ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
   හෝ
2. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයේ (JM) අදළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස

වයස අවු. 22 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප - MM 1-1- රු.53,175 - 10X1,375 - 15X1,910 = රු. 95,575/=

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

3. ලේකම් - ජේ. එම්. 1-1 "කනිෂ්ඨ කළමනාකාර" සේවා ගණය තනතුරු 01කි

තනතුරට අදාළ සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

1. ලේකම්වරුන්ගේ ක්ෂේත්‍රයට අදළ " වරලත් ලේකම්" පරිචය පිළිබඳ සහතිකයක් වරලත් ලේකම් ආයතනය මඟින් ලබා තිබීම

   සහ

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ලේකම් පරිචය පිළිබඳ වසර පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

   හෝ

2. වරලත් ආයතනික ලේකම් ආයතනයේ අවසන් විභාගය සම්පූර්ණ කර තිබීම.

   සහ

   රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ලේකම් පරිචය පිළිබඳ වසර පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

   සැලකිය යුතුය -: ලඝුලේඛනය සහ පරිගණක තාක්ෂණය පිළිබඳ දැනීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
   හෝ
2. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-1) II වන ශ්‍රේණියේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. පරිපාලන නිලධාරී - තනතුරු 01කි ජේ. එම්. 1-1 "කනිෂ්ඨ කළමනාකාර" සේවා ගණය

තනතුරට අදාළ සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

රාජ්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලන, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
   හෝ
2. සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ II වන ශ්‍රේණියේ අදළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස

වයස අවු. 22 ට නොඅඩු අවු. 45ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

අංක 3 සහ 4 සඳහන් තනතුරු වලට අදළ වැටුප - JM 1-1- රු.42,600 - 10X755- 18X1,135 = රු. 70,580/=

- ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

5. ඉංජිනේරු සහකාර (සිවිල් / සැලසුම් ශිල්පී / ප්‍රමාණ හා මිණුම් සමීක්ෂණ) "කළමනාකරණ සහකාර (තාක්ෂණික)" සේවා ගණය තනතුරු 01 කි

තනතුරට අදාළ සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) වැනි මට්ටමට නොඅඩු ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකය සම්පූර්ණ කර තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

වයස

වයස අවු. 18 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප - MA 2-2 රු.30,310 - 10 X 300 -7X 350 -4X 600 -20X710 = රු. 52,360/=

- ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

සියලු තනතුරුවලට අදාළ පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයින්තේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. මෙම තනතුර ස්ථිර වන අතර විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 12% ක්ද සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
5. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ.
6. අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
7. අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
8. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් බාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා නිබිය යුතුය.

අයදුම් කළ යුතු ආකාරය

මේ සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ පෞද්ගලික තොරතුරු යනාදිය ඇතුළත් ජීව දත්ත සටහන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කොට පහත සඳහන් ලිපිනයට 2021.03.01 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් කවරාකාරයෙන් හෝ බලපෑම් සිදුකිරීම නුසුදුසුකමක් සේ සලකනු ලැබේ. (Canvassing will be a Disqualification)

සභාපති,
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය,
1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ - 2.

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පරිපාලන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කාර්යශීලී, උද්‍යෝගිමත් හා විචක්ෂණශීලී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පරිපාලන නිලධාරී JM1-1 (II ශ්‍රේණිය)

රැකියා පිරිවිතරය :-

බලයලත් නිලධාරියෙකුගේ අධීක්ෂණයට යටත්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයතනික පරිපාලන සහ මානව සම්පත් කළමනාකරණයට අදළ රාජකාරී කටයුතු ඉටුකිරීම.

අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන්

ව්‍යාපාර පරිපාලන / රාජ්‍ය පරිපාලන /මානව සම්පත් කළමනාකරණය/ ආර්ථික විද්‍යාව හෝ නීති යන විෂයයන්ට ප්‍රමුඛත්වය ලබාදෙමින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදළ ක්ෂේත්‍රයේම අවම වශයෙන් වසරකට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 1 ශ්‍රේණිය තනතුරෙහි අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම සහ අ.පොස (උ. පෙ) විභාගයෙන් එක් වාරයක් තුළදී අවම වශයෙන් විෂයයන් 03 ක් සමත්ව තිබීම.

සිංහල ඉංග්‍රීසි භාෂාව සහ පරිගණක භාවිතය පිළිබඳ දැනුම අත්‍යාවශ්‍ය වේ.

වැටුප් පරිමාණය :

JM 1-1-02/2006 රු.42,600-10Xරු.755 - 18Xරු.1135 - රු. 70,580/=

කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2006 අනුව මාසික ආරම්භක වැටුප් පියවර රු. 42,600/= හා ජීවන වියදම් දීමනාව රු. 7,800/= රජයේ අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

තෝරා ගැනීම :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

පොදු කොන්දේසි

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවාගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- සියලුම තෝරාගනු ලබන බාහිර අයදුම්කරුවන් අදළ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටුවන අතර, අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයෙහි 04 ඡේදය ප්‍රකාරව පිහිටුවනු ලැබේ.

වෙනත් ප්‍රතිලාභ :

- මණ්ඩලයේ දැනට පවතින නිතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර, මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

අයදුම් කිරීම :

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **www.srilankateaboard.com** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග 2021 මාර්තු 10 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි. ප.තැ. එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574, ගාලුපාර, කොළඹ 03.

සීමාසහිත දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතිය

තනතුරු ඇබෑර්තු

සීමාසහිත දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති තනතුරු ඇබෑර්තු සඳහා සුදුසුකම්ලත් සමිති බල ප්‍රදේශයේ වසර 2 ක ස්ථිර පදිංචිය සහිත අයදුම්කරුවන්ගේ 2021.02.19 දින සිට 2021.03.05 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

අදළ තනතුරු සඳහා බස්නාහිර පළාත් සේවක කොමිෂන් සභාව අනුමත කරන ලද වැටුප් වැඩි කිරීම් හා දීමනා ගෙවනු ලැබේ. විශ්‍රාම වැටුප් දීමනා, අර්ථසාධක අරමුදල් හිමි වේ. තනතුරට අදළ සුදුසුකම් සහිත චක්‍ර ලේඛනය සී/ස දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතියෙන් ද, පළාතේ ඕනෑම සමුපකාර සමිතියකින් ද ලබාගත හැකි වේ.

1. තනතුර : කාමාන්‍යාධිකාරී (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 101:3
23454-39654
450X10 - 520X10 - 650X10
පුරප්පාඩු සංඛ්‍යාව : 01
වයස් සීමාව : අවු. 30 - 50 අතර

2. තනතුර : ලේකම් (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 102:6
18434-32534
260X10 - 320X10 - 380X10 - 450X10
පුරප්පාඩු සංඛ්‍යාව : 01
වයස් සීමාව : අවු. 24 - 45 අතර

3. තනතුර : කාමාපික හා ප්‍රජා පුහුණු (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 102:6
18434-32534
260X10 - 320X10 - 380X10 - 450X10
පුරප්පාඩු සංඛ්‍යාව : 01
වයස් සීමාව : අවු. 24 - 45 අතර

4. තනතුර : අභ්‍යන්තර විගණක- ග්‍රාමීය බැංකු (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 102:6
18434-32534
260X10 - 320X10 - 380X10 - 450X10
පුරප්පාඩු සංඛ්‍යාව : 01
වයස් සීමාව : අවු. 24 - 45 අතර

5. තනතුර : බැංකු සේවා කළමනාකරු (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 102:6
18434-32534
260X10 - 320X10 - 380X10 - 450X10
පුරප්පාඩු සංඛ්‍යාව : 01
වයස් සීමාව : අවු. 24 - 45 අතර

6. තනතුර : ග්‍රාමීය බැංකු කළමනාකරු (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 104:8
15724-25524
180X10 - 220X10 - 260X10 - 320X10
පුරප්පාඩු සංඛ්‍යාව : 11
වයස් සීමාව : අවු. 18 - 45 අතර

7. තනතුර : ප්‍රාදේශීය කළමනාකරු (III ශ්‍රේණිය)
වැටුප් පරිමාණය : 104:8
15724-25524
180X10 - 220X10 - 260X10 - 320X10
පුරප්පාඩු සංඛ්‍යාව : 08
වයස් සීමාව : අවු. 21 - 45 අතර

අයදුම්පත සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා සියලුම සහතිකවල ඡායා පිටපත් අමුණා 2021.03.05 දිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. (අතින් ගෙනවිත් භාරදීමට හැකියාව ඇත.) මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට ඉහත වයස් සීමාවන් බලපානු ඇත.

අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සී/ස දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතියේ ..... තනතුර සඳහා බඳවා ගැනීම"** යන්න සඳහන් කළ යුතුය.

සභාපතිනිය,
සී/ස දෙහිවල ගල්කිස්ස විවිධ සේවා සමුපකාර සමිතිය,
අංක 169, හයිලෙවල් පාර, නුගේගොඩ.
දූ. අ. 0112-826141 **දිනය : 2021.02.19**

සීමාසහිත මැණික්හින්න සමුපකාර ග්‍රාමීය මහජන බැංකුව - මැණික්හින්න

සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්) 11 සහ 1 තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත මැණික්හින්න සමුපකාර ග්‍රාමීය මහජන බැංකුවේ පුරප්පාඩු වී ඇති ඉහත තනතුර සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ පදිංචි පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පුරප්පාඩු සංඛ්‍යාව 01)

1. වැටුප් පරිමාණ අංකය : S.E.M.L. 02:04
2. වැටුප් පරිමාණය : 22000-470X10-570X10-720X10=39,600/-
   (මෙයට අමතරව සමිතියට අනුමත දීමනා ගෙවනු ලැබේ.)
3. වයස් සීමාව : 18 - 45
   (මෙම වයස් සීමාව දැනට සමුපකාර ක්ෂේත්‍රයේ නියුතු සේවකයින්ට අදාළ නොවේ.)
4. සුදුසුකම් (අ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක්
   හෝ
   (ආ) උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ / වාණිජ / මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව ලබා තිබීම.
   හෝ
   (ඇ) මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ව්‍යාපාර කළමනාකරණය / මානව සම්පත් කළමනාකරණය / සමාජ සංවර්ධනය / සමුපකාර සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමග S.E.M.L. 02:07 ලේකම් තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

ලිපිනය ලියූ 9X4 ප්‍රමාණයේ මුද්දර සහිත ලිපිකවරයක් පහත ලිපිනයට එවීමෙන් හෝ අයදුම්පත්‍ර ආකෘතිය ප්‍රධාන කාර්යාලයට පැමිණ ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර අදාළ ලියවිලි පිටපත් සමග 2021-03-11 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ගරු සභාපති, සී/ස මැණික්හින්න සමුපකාර ග්‍රාමීය මහජන බැංකුව, මැණික්හින්න" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලිපිකවරයේ ඉහළ වම් කෙළවර "සහකාර සාමාන්‍යාධිකාරී (පිරිස්)" යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පතෙහි ඇතුළත් කරුණු සනාථ කෙරෙන ලියවිලිවල ඡායාස්ථ පිටපත් ඇමිණිය යුතු අතර, සත්‍ය පිටපත් බව අයදුම්කරු විසින් තහවුරු කළ යුතුය.

ගරු සභාපති,
සී/ස මැණික්හින්න සමුපකාර ග්‍රාමීය මහජන බැංකුව,
මැණික්හින්න.

2021-02-16

ජල සම්පාදන අමාත්‍යාංශය
ජල සම්පත් මණ්ඩලය

පුරප්පාඩු

මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් තනතුරු පිරවීමට අදාළව සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධ තොරතුරු ආයතනයේ වෙබ් පිටුව පරිශීලනය කරන මෙන් කාරුණිකව දන්වමි. (www.wrb@gov.lk)

01.	**සාමාන්‍යාධිකාරී**	**(එච් එම් 2 - 1)**
02.	**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)**	**(එච් එම් 1 - 3)**
03.	**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සංවර්ධන)**	**(එච් එම් 1 - 3)**
04.	**සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු)**	**(එච් එම් 1 - 1)**
05.	**නීති නිලධාරී**	**(එම් එම් 1- 1)**

පොදු කොන්දේසි :

01. වැටුප් ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක MSD 02 / 2016 අනුකූල වේ. රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව හා අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.
02. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (එච් එම්) මට්ටමේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛණ අනුව නිල වාහනයක් හා ඉන්ධන දීමනා ගෙවනු ලැබේ.
03. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් සඳහා වයස් සීමාවන් බල නොපැවැත්වේ.
04. රජයේ හෝ රාජ්‍ය / සංස්ථා හෝ මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් අදාළ ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.
05. අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.
06. අයදුම්පත සම්පූර්ණ ජීවදත්ත සමග සහතිකවල පිටපත්ද සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමඟ සභාපති, ජල සම්පත් මණ්ඩලය, 2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 යන ලිපිනයට 2021.03.10 දින හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සභාපති,
ජල සම්පත් මණ්ඩලය,
2ඒ, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.
2021.02.19

BE BETTER INFORMED!

දිනමිණ Dinamina
Daily News
නිකරන් Thinakaran

News you can trust now free on your mobile phone.

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය

ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවේ අපේක්ෂකයන් වෙතින් 2021 මාර්තු 15 වෙනි දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. තාක්ෂණ නිලධාරී තනතුර (ICT) III වන ශ්‍රේණිය (ඇබෑර්තු 02 යි)

සුදුසුකම් :

(i) ඕනෑම ධාරාවකින් එක් වාරයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) සමත්ව තිබීම

සහ

(ii) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / තොරතුරු තාක්ෂණ හා සමාන ක්ෂේත්‍රයක තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන (NVQ Level 05) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව පළපුරුද්දක් සහිත අයවලුන්ට විශේෂත්වයක් දක්වනු ලැබේ.

02. තාක්ෂණ නිලධාරී තනතුර (ශ්‍රව්‍ය දෘෂ්‍ය) III වන ශ්‍රේණිය (ඇබෑර්තු 01 යි)

සුදුසුකම් :

(i) ඕනෑම ධාරාවකින් එක් වාරයකදී අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විෂයන් තුනකින් (03) සමත්ව තිබීම

සහ

(ii) (අ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ පාර්ලිමේන්තුව විසින් පනතක් සම්මත කිරීම මගින් පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් ඉලෙක්ට්‍රෝනික හා සන්නිවේදන / ඉලෙක්ට්‍රෝනික විද්‍යාව / බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන (NVQ Level 05) මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

හෝ

(ආ) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඉහත (ii) (අ) සඳහන් සුදුසුකමට සමාන යයි පිළිගනු ලබන ඉලෙක්ට්‍රෝනික හා සන්නිවේදන / ඉලෙක්ට්‍රෝනික විද්‍යාව / බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබාගැනීමෙන් පසුව පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳව වසරක පළපුරුද්දක් ලබා තිබීම.

- **තෝරාගනු ලබන ක්‍රමය :** ලිඛිත සහ / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්.
- වැටුප් පරිමාණය : 2020.01.01 දිනට රු. 31,625 - 7 x 300; 10 x 355 - 37,275 (මාසිකව) U-MT 1(IIIA)
- **වයස් සීමාව :** වයස අවුරුදු 18 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

ඉහත වැටුපට අමතරව, ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

අනෙකුත් ප්‍රතිලාභ

- විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල : සේවා යෝජකයා විසින් විශ්වවිද්‍යාල අර්ධ සාධක අරමුදල සඳහා මාසික මූලික වැටුපෙන් 7% කට සමාන මුදලක දායකත්වයක් ලබා දෙන අතර, විශ්වවිද්‍යාල අර්ධ සාධක අරමුදල සඳහා සේවකයා විසින් මාසික මූලික වැටුපෙන් 10% කට සමාන මුදලක දායකත්වයක් ලබා දිය යුතුය.
- විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය : විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සේවා යෝජකයාගේ දායකත්වය මාසික මූලික වැටුපෙන් 10% ට සමාන මුදලක්
- සේවක භාරකාර අරමුදල : සේවක භාරකාර අරමුදල සඳහා සේවා යෝජකයාගේ දායකත්වය මාසික මූලික වැටුපෙන් 3% ට සමාන මුදලක්

වැදගත්

- උසස් අධ්‍යාපන ආයතන / රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
- අදාළ සුදුසුකම් සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, නියමිත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් නොකළ අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ආයතනයේ www.iim.cmb.ac.lk යන වෙබ් අඩවියෙන් අයදුම්පත භාගත කරගත හැකිය.
- නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්, 2021.03.15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි "සහකාර ලේඛකාධිකාරී / ආයතන, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අයදුම්පතේ මෘදු පිටපතක් (PDF සහ WORD පිටපත්) recruit@iim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.
- අයදුම්කරන තනතුර අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය.
2021.02.15

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

රත්මලාන / මොරටුව අපජල බැහැර කරලීමේ ව්‍යාපෘතිය - පියවර 2 - අදියර 1

ඇබෑර්තු

(ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින්)

රත්මලාන / මොරටුව අපජල බැහැර කරලීමේ ව්‍යාපෘතිය - පියවර 2 - අදියර 1 හි පවත්නා පහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සහිත අය විය යුතුය.

ජ්‍යෙෂ්ඨ සමාජ විද්‍යාඥ තනතුර - (තනතුරු 01)

වැටුප් කේතය : PS 3

ව්‍යාපෘති වර්ගීකරණය : ඇමරිකන් ඩොලර් මිලියන 100 ට වැඩි හා ඇමරිකන් ඩොලර් මිලියන 250 ට අඩු

සුදුසුකම් හා පළපුරුද්ද : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ විශේෂ ප්‍රථම උපාධියක්,

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන බවට පිළිගත් වෙනත් සුදුසුකම්,

හෝ

පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

සහ

ජල හා සනීපාරක්ෂක අංශයේ, ජ්‍යෙෂ්ඨ තලයේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද. මලාපවහන ව්‍යාපෘතිවල / යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ප්‍රජා ඒකරාශි කිරීම් ක්‍රියාකරකම්වල පළපුරුද්ද සහිත අයවලුන්හට ප්‍රමුඛතාව හිමිවේ.

පොදු කොන්දේසි :

වයස් සීමාව :

අයදුම්පත් භාර ගැනීම අවසන් කරනු ලබන දිනය වන විට වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.

සේවා නියමයන් හා කොන්දේසි :

අදාළ පත්කිරීම්, මූලිකව, කොන්ත්‍රාත් පදනමින් එක් වසරක් සඳහා වන අතර, සතුටුදායක කාර්ය සාධන අගැයුම් මත වාර්ෂිකව අලුත් කළ හැක. අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි සඳහන් කොන්දේසි මෙම පත් කිරීමට අදාළවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, එහිදී දක්වනු ලබන කාර්ය සාධනය මත තෝරා ගැනීම සිදු කෙරේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් අයදුම්පත්, සියලුම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වල හා පෙර පළපුරුද්ද ආදිය සම්බන්ධව සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2021 මාර්තු 10 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රජයේ / ආයතනික අංශ සංවිධානවල අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ,
රත්මලාන / මොරටුව අපජල බැහැර කරලීමේ ව්‍යාපෘතිය,
පියවර 2 - අදියර 1,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
අංක 213ඒ, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.
දිනය : 2021.02.15

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

සිළුමිණ වටසිට
පල දරන්න - පළ කරන්න

මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...

දැන් වචන 15ක් රු. 560ක් පමණයි...

- වැඩි වන වචනයක් සඳහා රු. 23/-

චාමර - 0777 270 067 / අනූෂා - 0777 278 948

සිළුමිණ JOBS
සිළුමිණ The Silumina
රැකියා අතිරේකය

දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න
නුගේගොඩ
සවිසිරි වෙළඳ සංකීර්ණය
4 වන මහල, හයිලෙවල් පාර,
011 282 8114
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

ඇබෑර්තු

පළපුරුදු ජුකී මැෂින් ඔපරේටර්වරියන් සඳහා ඇබෑර්තු ඇත. වැටුප් රු. 36,000 සිට
ගාලු පාර, රත්මලාන.
විමසිම්:- 0776 215 404

බස් රථ, බර වාහන රියදුරන් සහ රිය සහයකයින් අවශ්‍යයි

කොළඹ පිහිටි ප්‍රසිද්ධ ප්‍රවාහන සමාගමකට STAFF TRANSPORT සේවාවක් සඳහා නැවතී සේවය කල හැකි බර වාහන, බස් රථ රියදුරන් සහ රිය සහයකයින් වහාම අවශ්‍ය කර තිබේ.
නවාතැන් නොමිලේ සැපයෙන අතර
රාජකාරී වේලාවේදී ආහාර නොමිලේ සැපයේ
පොලිස් සහතික සහ ග්‍රාමසේවා සහතික සමග පැමිණෙන්න
ECD Global (Pvt) Ltd
නො. 122, ශාන්ත මරියා පටුමග, මට්ටක්කුලිය, කොළඹ 15
0114384838

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
SRI LANKA EXPORT DEVELOPMENT BOARD
වෙළඳ අමාත්‍යාංශය

ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි උපාය මාර්ග සැලැස්මේ සඳහන්ව ඇති අපනයන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා දායකත්වය සැපයිය හැකි සනාථ වූ හැකියාවන් හා වෘත්තීය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පහත සඳහන් තනතුර පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

කළමනාකරණ සහකාර තනතුර (භාක්ෂණික නොවන) (MA 1 - 1)

රැකියා විස්තරය

- අදාළ අංශය මගින් කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වලට අයත් සියලුම ලිපි ලේඛන හා ලේකම් වැඩ කටයුතුවල නියැලීම.
- ලිපිගොනු නඩත්තු කිරීම.
- වාර්ෂික සහ කාර්තුවලට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම සහ අධීක්ෂණය කිරීම.

සුදුසුකම්

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය / අංක ගණිතය ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත් වී තිබීම.

සහ

අ.පො.ස (උ.පෙ.) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) කින් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම.

අතිරේක සුදුසුකම්

- යතුරු ලියන වේගය : විනාඩියකට වචන 30 - 40 (ඉංග්‍රීසි / සිංහල)
- ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව
- දුරකථන පද්ධතිය / PABX ක්‍රියාකිරීමේ හැකියාව
- පරිගණක දැනුම සහ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

වැටුප් පරිමාණය :

රු. 27,910/- 10 X 300 - 7 X 350 - 4 X 495 - 20 X 660 - රු. 48,540/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

තෝරා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

වයස : අවුරුදු 18 ට අඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන්ට සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

වෙනත් ප්‍රතිලාභ :

- ❖ අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ❖ ප්‍රවාහන පහසුකම්
- ❖ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
- ❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
- ❖ සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

අයදුම් කිරීමේ පිළිවෙළ :

අදාළ අයදුම්පත්‍රය අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබා ගත හැක.ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ තනතුරු නාමය සඳහන් කරමින් සම්පූර්ණ ජීව දත්ත සඳහන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2021.03.05 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. **නියමිත අයදුම්පත්‍රය (EDB අයදුම්පත්‍රය) හා අදාළ සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
NDB - EDB**ටවර්, අංක 42, නවම් මාවත, කොළඹ 02.**
දුර : 011 - 2300700, ෆැක්ස් : 011 - 2300715
වෙබ් : www.srilankabusiness.com

BE BETTER INFORMED!
Dinamina Daily News Thinakaran
News you can trust now free on your mobile phone.
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT Google play App Store Windows Store


LAKE HOUSE

පුරප්පාඩු

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය

පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය

ලෝක බැංකු ණය ආධාර මත වසර පහක කාලයකට ක්‍රියාත්මක වන පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 ට අනුව ව්‍යපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් වයස අවුරුදු 67 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව, රජයේ නීති රෙගුලාසි පිළිබඳ දැනුම සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවයන් වේ.

01. ජ්‍යෙෂ්ඨ සිවිල් ඉංජිනේරු - තනතුරු 01

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම සහ අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ වසර 08 ක පළපුරුද්දක් ලබා තිබීම සහ එයින් වසර 4 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමෙහි වීම.

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ පිළිගත් වෘත්තීමය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම සහ එම සුදුසුකම සැපිරීමෙන් අනතුරුව අවම වශයෙන් කළමනාකරණ මට්ටමෙහි අවුරුදු 07 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

රජයේ දීප ව්‍යාප්ත සේවාවන්හි පළමුවැනි ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයෙහි ඒ හා සමාන තත්ත්වයක් තිබීම සහ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ පළමුවැනි ශ්‍රේණියේ වසර 02 ක පළපුරුද්දක් තිබීම.

මාසික වැටුප - PS3 - රු. 125,000.00 - 140,000.00*

02. පරිසර හා සමාජ ආරක්ෂණ විශේෂඥ - තනතුරු 01

03. සන්නිවේදන විශේෂඥ - තනතුරු - 01

04. ප්‍රජා සංවර්ධන හා ජීවනෝපාය විශේෂඥ - තනතුරු 01

05. ව්‍යාපෘති ගණකාධිකාරී - තනතුරු - 01

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් විශ්වවිද්‍යාල උපාධියට සමාන යැයි පිළිගනු ලබන අධ්‍යාපන සුදුසුකම් මෙම විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා තිබීම හෝ එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ පිළිගත් වෘත්තීමය ආයතනයක අවසාන මට්ටමේ විභාගය සමත්වීම සහ එම අධ්‍යාපන සුදුසුකම් සපුරාලීමෙන් පසුව අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 06 ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

රජයේ දීප ව්‍යාප්ත සේවාවන්හි III/II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයක ඒ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම සහ අවම වශයෙන් III/II ශ්‍රේණියේ තනතුරක වසර 06 ක පළපුරුද්දක් ලබා තිබීම.

සන්නිවේදන විශේෂඥ තනතුර සඳහා අයදුම්කරුවන් සතුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන සන්නිවේදනය, පුවත්පත් කලාව සහ ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ උපාධියක් හෝ සන්නිවේදන විෂයය ඇතුළත් උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක සුදුසුකම් සපුරාලීමෙන් පසුව පළපුරුද්ද තිබිය යුතුය. මෙයින් වසර 03 ක් කළමනාකරණ මට්ටමේ විය යුතුය.

මාසික වැටුප - PS4 - රු. 100,000.00 - 115,000.00*

06. පරිසර නිලධාරී - තනතුරු - 02

07. සමාජ සංවර්ධන නිලධාරී - තනතුරු - 01

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් හත්වන (07) මට්ටමේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහතිකයක් ලබා තිබීම සහ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව වසරක (01) විශේෂ පළපුරුද්දක් ලබා තිබීම

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් හයවන (06) මට්ටමේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහතිකයක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයෙහි වසර 6 ක විශේෂ පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් පස්වන (05) මට්ටමේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) සහතිකයක් ලබා තිබීම සහ ප්‍රසම්පාදන කටයුතුවල අදාළව වසර 11 ක විශේෂ පළපුරුද්දක් ලබා තිබීම.

මාසික වැටුප - PS6 - රු. 58,000.00 - 63,000.00*

08. ව්‍යාපෘති ලේකම්

අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

අ.පො.ස. සා/පෙළ විභාගයෙන් ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂාවද ඇතුළුව විෂයයන් 3 කට සම්මාන සහිතව එකවර විෂයයන් 06 ක් සමත් වීම සහ පිළිගත් ආයතනයකින් ලේකම් පරිචය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම්කරණ පරීක්ෂණ සමත් වීම සහ අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 3 ක පළපුරුද්දක් ලබා තිබීම

හෝ

වරලත් ලේකම්වරයෙකු ලෙස අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම.

මාසික වැටුප - PS6 - රු. 58,000.00 - 63,000.00*

* MSD චක්‍රලේඛ අංක 01/2019 අනුව ඉහත සඳහන් වැටුපට අමතරව ජීවන වියදම් දීමනා ගෙවනු ලැබේ.

අයදුම් කිරීම :

අයදුම්කරුවන් විසින් ඥාතීන් නොවන ඔහු / ඇය පිළිබඳ නිර්දේශයන් ලබාගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන්ද ඇතුළත්ව තම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සඳහන් කරමින් සිය ජීව දත්ත පත්‍රිකාවන් අයදුම්පත සමග යොමු කළ යුතුය. සුදුසුකම් හා සේවා පළපුරුද්ද පදනම් කර ගනිමින් ඉහළම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් සිදුකරන අතර, අයදුම්කරුවන්ගේ කුසලතාවන්ගේ ප්‍රමුඛතාවය මත බඳවා ගැනීම් සිදු කරනු ලබයි. එබැවින්, බඳවා ගැනීමේ ක්‍රියාවලිය සඳහා කිසියම් බලපෑමක් හෝ නියෝජනයක් කිරීම මගින් අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. මූලික සුදුසුකම් තහවුරු කරගැනීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවීම අනිවාර්ය වන අතර, සියලුම අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා / ආයතන ප්‍රධානියා හරහා, සම්පූර්ණ කළ අයදුම්පත් 2021 **මාර්තු 08 වන දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කළ යුතුය.

තනතුරට අදාළ රාජකාරී විස්තරය සඳහා www.msdw.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ලේකම්,
වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.
2021 පෙබරවාරි 19 වන දින

වසර 11ක් සපුරන චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල

රෝහල් කාර්ය මණ්ඩලය

● **වෛද්‍ය චාමර ජයවර්ධන**

අ වි රශ්මියෙන් කර්කශ වූ හම්බන්තොට පොළොවට සිසිල් පොද වැස්සක් ඇද වැටෙන්නේ කලාතුරකිනි. එම පෙදෙස්හි ජනතාවගේ රෝග පීඩාවලට අරුණලු උදා කරමින් චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල ජනතා අයිතියට පත් වූයේ 2010 පෙබරවාරි මස 13 වැනිදාය.

එවකට වරාය හා ගුවන් සේවා ඇමැතිවරයා වූ චමල් රාජපක්ෂගේ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය තිස්ස කරල්ලියැද්දගේ ප්‍රධානත්වයෙන් මේ රෝහල ජනතා අයිතියට පත් කරන ලදී. හම්බන්තොට නගරයේ සිට ගොන්නොරුව මාර්ගය (හම්බන්තොට සිට මත්තල දක්වා මාර්ගය) ඔස්සේ කිලෝමීටර් 6ක් පමණ පැමිණි පසු හම්බන්තොට පරිපාලන සංකීර්ණය පෙනෙන මානයේ මෙම රෝහල පිහිටා ඇත. මධ්‍යම රජයට අයත් පර්යේෂණ රෝහල් සමූහයෙන් එකක් වන මෙය ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පාලනය වේ. 2007 වසරේ අග භාගයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සේවකයන් තුන් දෙනෙකු යොදාගෙන මෙම භූමිය ඔසු උයනක් වශයෙන් සංවර්ධනය කිරීම ආරම්භ කළ අතර 2008 මැයි මස 24 වැනිදා රෝහල සඳහා මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය සිදු කරන ලදී.

අක්කර 4ක භූමි භාගයක විසිරී ඇති මෙම රෝහල අක්කර 1 1/2ක විශාලත්වයකින් යුත් ඔසු උයනකින්ද සමන්විතය. ආරම්භක අධ්‍යක්ෂකවරයා වශයෙන් වෛද්‍ය වසන්ත කුමාර හෙට්ටිආරච්චි පත්වීම් ලද අතර ඒ වන විට රෝහලේ එකම වෛද්‍යවරයා වුයේද ඔහු ය. ආරම්භක සේවක බල ඇණිය තුන් දෙනෙකි. ආරම්භයේදී බාහිර රෝගී අංශය සහ ඔසු උයන පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. ගමනාගමනය ඉතා දුෂ්කර තත්ත්වයක පැවති එම අවදියේ හම්බන්තොට ගුවන් පාලම අසල සිට කිලෝමීටර් 2ක් පමණ පයින් ගමන් කිරීමට රෝගී ජනතාවට සහ රෝහල් කාර්ය මණ්ඩලයට සිදු විය. මාගම්පුර පරිපාලන සංකීර්ණය අසලට මගී බස් රථ ධාවනය ආරම්භ වීමත් සමගම එම දුර කිලෝමීටරයකින් අඩු වූ අතර අදද එම දුර පයින් ගමන් කරන පිරිස් දැක ගත හැකිය.

2012 වර්ෂයේ එවකට කථානායකවරයා වූ චමල් රාජපක්ෂගේ සහ එවකට දේශීය වෛද්‍ය ඇමති දිවංගත සාලින්ද දිසානායකගේ ප්‍රධානත්වයෙන් වාට්ටු සංකීර්ණය විවෘත කිරීමෙන් අනතුරුව පිරිමි වාට්ටුවක් සහ ගැහැනු වාට්ටුවක් පවත්වා ගෙන යන ලද අතර අද වන විට වාට්ටු 3ක්, පංචකර්ම

රෝහල් අධ්‍යක්ෂිකා ජ්‍යෙෂ්ඨ වෛද්‍ය ලක්ෂ්මි වරුෂවිතාන

ආයුර්වේද ප්‍රතිකාර ලබාදෙමින්

ඒකකයක්, ඖෂධ නිෂ්පාදනාගාරයක්, බාහිර රෝගී අංශය සහ ඔසු උයන දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

2015 වර්ෂයේ අග භාගයේ වෛද්‍ය වසන්ත කුමාර අධ්‍යක්ෂක ධුරයෙන් සමුගත් අතර 2015 වසරේ ඔක්තෝබර් 23 දින සිට වෛද්‍ය පී.බී. චන්ද්‍රිමරත්නයන් 2020 වර්ෂයේ අවසානය දක්වා එම තනතුරේ කටයුතු කළ අතර 2021 වර්ෂයේ ආරම්භක දින සිට ජ්‍යෙෂ්ඨ වෛද්‍ය ලක්ෂ්මි වරුෂවිතාන අධ්‍යක්ෂකවරිය වශයෙන් පත්වීම් ලබා දැනට කටයුතු කරනු ලබයි.

සේවා ලාභී ජනතාව වෙත විශාල සේවයක් සලසන බාහිර රෝගී අංශය තුළ සායනික අංශයක්ද ක්‍රියාත්මක වේ. සායනික අංශය තුළ පංචකර්ම සායනය, කායික රෝග සායනය, දියවැඩියාව හෘද රෝග රුධිරගත මේද සායනය, සන්ධි රෝග සායනය, කැඩුම් බිඳුම් සායනය, චර්මරෝග සායනය, ශිරා ග්‍රන්ථි (නහර ගැට ගැසීම) සායනය, ගුද ගත රෝග සායනය, ළමා රෝග සායනය, ශ්වීත්‍ර (සුදු කබර) රෝග සායනය, දන්ත රෝග සායනය, උගුර කන නාසය ආශ්‍රිත රෝග සායනය සහ ස්ත්‍රී රෝග සායනය යන සායන සතියේ දිනවල පැවැත්වේ.

2021 වර්ෂයේ ආරම්භයත් සමග මෙම සායන වඩාත් සංවිධානාත්මකව සහ විධිමත්ව කටයුතු ආරම්භ කරන ලදී. මීට අමතරව පාරම්පරික වෛද්‍ය දැනුම නව්‍ය පරපුරට උරුම කිරීමේ අරමුණින් පාරම්පරික කැඩුම් බිඳුම් විශේෂ සායනයක්ද සතියේ දින පහේම ක්‍රියාත්මක වේ. ඉන්දියානු විශ්ව විද්‍යාල වල M.D. උපාධිය හැදෑරූ විශේෂඥ වෛද්‍යවරියන් දෙදෙනකුගේ සේවය මෙම රෝහලේදී සේවා ලාභීන් වෙත හිමි වේ.

වාට්ටු අංශය ගැහැනු වාට්ටු දෙකක්ද පිරිමි වාට්ටුවක් සහ පංච කර්ම ඒකකයකින් සමන්විතව නේවාසික රෝගීන් 100ක් සඳහා පහසුකම් සහිතව ඉදි කර ඇත.

2012 වර්ෂයේ වාට්ටු ආරම්භයත් සමඟ ආයුර්වේද හෙද සේවයද රෝහලේ ආරම්භ විය. හෙද නිලධාරීන් 5 දෙනෙකුගෙන් ආරම්භ කළ හෙද සේවයේ මේ වන විට හෙද නිලධාරීන් සංඛ්‍යාව 8 දෙනෙකි.

පක්ෂඝාත, සන්ධි අබාධ, කොඳු ඇට පේළියේ ආබාධ, ශ්වසන ආබාධ සහ නොයෙක් විධ කාලීන ආබාධ ඇතුළු සියලුම සර්වාංග රෝගාබාධ සඳහා ප්‍රත්‍යක්ෂ ප්‍රතිකාර ලබාදීමට වෛද්‍ය කාර්ය මණ්ඩලය සමත්කම් දක්වයි. නස්‍ය, වස්ති රක්ත මෝක්ෂණ වමන විරේචන යන පංච කර්ම ප්‍රතිකාර නේවාසික අංශයෙන් ලබාදේ. ඖෂධ නිෂ්පාදනාගාරය මගින් නේවාසික අංශයට අවශ්‍ය කෂාය වර්ග ක්වාථවර්ග තැවිලි පොට්ටනි පත්තු වර්ග නිෂ්පාදනය කරන අතර බාහිර රෝගී අංශයට අවශ්‍ය කෂාය සහ සායන සඳහා අවශ්‍ය විශේෂ ඖෂධ ද නිෂ්පාදනය කරනු ලබයි. කොරෝනා රෝගය සඳහා ප්‍රතිශක්ති වර්ධක ඖෂධයක් වන සුව ධරණි පානය සහ දරුණු උණ රෝග සඳහා ප්‍රත්‍යක්ෂ ඖෂධ මෙම රෝහලේ නිෂ්පාදනය කර නොමිලේ ලබාදේ.

හැටඑක් දෙනෙකුගෙන් සමන්විත රෝහල් කාර්ය මණ්ඩලය රෝහල් රාජකාරියටම සීමා නොවී ජංගම සායන ලෝක දිය වැඩියා දින වැඩ සටහන සහ ලෝක හදවත් දින වැඩ සටහන සහ

කොරෝනා රෝගයෙන් ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ සටහන් මඟින් ජනතාව දැනුම්වත් කිරීමටත් සුවධරණි පානය ඇතුළු ප්‍රතිශක්ති වර්ධක ඖෂධ නොමිලේ ලබා දීමටත් මෙම රෝහල් කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදී.

තවත් නොයෙකුත් වැඩ සටහන් මඟින් සේවාලාභීන් දැනුම්වත් කිරීමටත් ඒ මඟින් රෝග වළක්වා ගැනීමටත් රෝහල් කාර්ය මණ්ඩලය ගන්නා උත්සාහය අගය කළ යුතුය. කොරෝනා රෝගයෙන් ජනතාව ආරක්ෂා කිරීම සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ සටහන් මඟින් ජනතාව දැනුම්වත් කිරීමටත් සුවධරණි පානය ඇතුළු ප්‍රතිශක්ති වර්ධක ඖෂධ නොමිලේ ලබා දීමටත් මෙම රෝහල් කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පමණක් නොව ගාල්ල, මාතර, බදුල්ල, වැල්ලවාය මොනරාගල කතරගම ආදී දුර බැහැර ප්‍රදේශවලින් පැමිණෙන දහස් ගණන් සේවා ලාභී ජනතාව නිරෝගී සුවය ලැබූ බවට සැකයක් නැත. ගමනාගමන ගැටලුව වැනි ප්‍රයෝගික ගැටලුද මෙම රෝහලටද බලපා ඇත. ඒ කෙසේ වෙතත් කොරෝනා අවදානම පවා නොසලකා සුවහසක් ජනතාව රෝහල වෙත ජනතාව ඇදී ඒමෙන් කියාපාන්නේ මෙම රෝහලෙන් ඉටුවන අමිල මෙහෙවර පිළිබඳ ජන මනස තුළ ඇති ලබැඳියාවයි.

ඉකුත් 13 වැනිදා 11 වස් සපුරන ලද රෝහලේ සියලු කාර්ය මණ්ඩලයටත් රෝග පීඩාදියෙන් පෙළෙන සියලු ලෝකවාසී ජනතාවටත් සෙත් පතා 12 වැනිදා පරිත්‍රාණ ධර්ම දේශනාවක් පවත්වා 13 වැනිදා උදැසන සංඝගත දක්ෂිණාවක් පැවැත්විණි.

එසේම 'චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල' සුවහසක් ජනතාවට සුව සෙත සලසන ශ්‍රී ලංකාවේ කීර්තිමත් රෝහලක් බවට පත් වේවාද ප්‍රාර්ථනා කරමු.

දැනට වැඩ නිම කර ඇති මාළු වෙළඳ සංකීර්ණය

මේවන විට මාර්ගය අවහිර වන පරිදි සිදුවන වෙළඳ කටයුතු

හදලත් පවරා නොදෙන මාදම්පේ මාළු වෙළඳ සංකීර්ණය

● **තුෂාර හෙට්ටිආරච්චි** - කහවත්ත

මහජන මුදල් රුපියල් කෝටි ගණනක් වැය කර ඉදිකළ අංගසම්පූර්ණ මාළු වෙළෙඳ සංකීර්ණය වෙළෙඳුන් වෙත පවරා නොදීම ගැන ප්‍රදේශවාසීන් හා වෙළෙඳ ප්‍රජාව දැඩි කලකිරීමට ලක්ව ඇත. එබැවින් මාදම්පෙ මාළු වෙළඳ පොළ නව වෙළෙඳ සංකීර්ණය වෙත ගෙනයන ලෙස මාදම්පෙ මාළු වෙළඳ ව්‍යාපාරිකයෝ බලධාරීන් ගෙන් ඉල්ලා සිටිති.

ඇඹිලිපිටිය - රත්නපුර ප්‍රධාන මාර්ගයේ මාදම්පේ හන්දිය යනු දසක හය හතකට එහා අතීතයක් සහිත මත්ස්‍ය වෙළෙඳ පොළක් පිහිටි ස්ථානයකි. දිනපතා අලුයම හතරේ සිට මෙහි වෙළඳ කටයුතු ක්‍රියාත්මක වෙයි. ප්‍රධාන මාළු ව්‍යාපාරිකයන් විස්සක් තිහක් මෙන්ම සුළු මාළු ව්‍යාපාරිකයන් සිය ගණනක් ද සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් ද මෙමගින් සැලසී ඇත. ඒ හරහා දහස් ගණනක පිරිසක් සිය යැපීම් මාර්ගය බවට පත් කර ගෙන ඇත්තේ මාදම්පෙ හන්දියේ මාළු වෙළඳපොළයි. එහෙත් මෙහි අවිධිමත්භාවය නිසා එමගින් පීඩා විඳින පිරිස ඊට වඩා වැඩි බව බැලූ බැල්මට පෙනේ. දිනකට මාර්ගයේ ගමන් ගන්නා වාහන සහ මගී ජනතාව මාදම්පෙ හන්දිය පසු කරන්නේ දැතින් නහය වසා ගෙනය. අවට පිරිස් සිය ජීවිතයේ සියලු අවස්ථා තුළ මාළු අපද්‍රව්‍ය නිසා වහනය වන දුර්ගන්ධය යටපත් කර ගෙන සිටින්නේ කර කියා ගතහැකි දෙයක් නැතිකමිනි. උදැසන පා ගමනින් මාදම්පෙ ඇතුළු පාසල් වලට ගමන් කරන දරුවෝ ද දැඩි අපහසුතාවට පත් වෙති. මාදම්පෙ හන්දිය ආසන්නයේ ජීවත් වන සමහරුන් පවසන්නේ තමන් පෙර ආත්මයක මහා අකුසලයක් සිදුකර මෙම ප්‍රදේශයේ ඉපදී ඇති බවයි. ඊට හේතුව අනෙකක් නොව තුන්සිය හැට පස් දවසේම මාළු කුණු ගඳත් සමඟ ජීවත් වීමට සිදු වීමයි. කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවා සඳහා පැමිණෙන සේවාලාභීන් ද මේ අතර වෙයි. මෙම තත්ත්ව පිළිබඳව අවධානය යොමු කළ පසුගිය යහපාලන ආණ්ඩුව මාදම්පෙ හන්දියේ මාළු වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී. ආණ්ඩු මාරුවත් සමඟ වත්මන් රජය මාළු වෙළඳ සංකීර්ණයේ පැවැති අඩු පාඩු සකස් කර ඇත. ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර මේ සඳහා නායකත්වය ගෙන ක්‍රියා කළේය. එහෙත් පහසුකම් සියල්ල සම්පූර්ණ කර මාස ගණනාවක් ගත වුවද මාදම්පෙ මාළු වෙළඳ සංකීර්ණය මෙතෙක් මහජන සේවය සඳහා විවෘත නොකිරීම සම්බන්ධයෙන් ඇත්තේ දැඩි කලකිරීමකි.

මාළු වෙළෙඳ ව්‍යාපාරික චමින්ද ප්‍රේමරත්න (මාවෝ) (39) මේ පිළිබඳ මෙසේ පැවසීය.

'මගේ මාළු වෙළඳ ව්‍යාපාරයට දැන් අවුරුදු විසිපහකට වැඩියි. එදා ඉඳලා මිනිස්සුන්ට සිදුවන අසීරුතාව පෙනි පෙනී මේ දුක තවත් විඳිනවා. අපේ ජීවිතය ගෙනියන්න තවත් පිරිසක් පීඩාවට ලක්වීම කනගාටුදායක තත්ත්වයක්. ලොරියක ගේන මාළු ටික ලෑල්ලට බාන්න විදිහක් නෑ. මාළුටික බාගන්න වෙන්නෙ අවස්ථා කිහිපයකින්. තනිකරම පාර අවහිරයි. මහජනතාවට හිරිහැර ගොඩයි. ඒ වගේම ඉතිරි මාළු තියාගන්න බෑ. ඒවා පාර අයිනෙ අනාරක්ෂිතයි. ඒ ගැන ලොකු අවධානමකුත් තියෙනවා. පාරට වැටෙන මාළු වතුර හෝදන්න විදිහක් නෑ. යන එන මිනිස්සු හිතින් බැණ බැණ යන බවත් අපි දන්නවා.

(වමේ සිට) ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර, චමින්ද ප්‍රේමරත්න (මාවෝ), මාළු වෙළඳ ව්‍යාපාරික නිලන්ත, ටී.පියතිලක

මේ තත්ත්වය ගැන කියලා කියලා හදා ගත්තු මාර්කට් එක තාම වහලා. දෙපැත්තේ කානු සුද්ද පවිත්‍ර කිරීම කරද්දී හරිම ප්‍රශ්නයක්. කහවත්ත ප්‍රාදේශීය සභාව සුද්ද කරන්නෙ එක පැත්තයි. පාරෙ අනිත් පැත්ත ගොඩකවෙලට ගොඩකවෙලින් ආවොත් සුදු ඉරෙන් එක පැත්තක් සුද්ද කරනවා. ඒකත් හරියට වෙන්නෙ නෑ. ගොඩකවෙල ප්‍රාදේශීය සභාවෙන් එන්නෙම නෑ. මේ තත්ත්වය නිසා ඉක්මනින් අපට විසඳුමක් දෙන්න.

මාළු වෙළඳ ව්‍යාපාරික ටී.පියතිලක (44) ගේ අදහස මෙසේය.

'මම අවුරුදු විසි පහක ඉඳලා මාළු විකුණනවා. දිනපතා දහස් ගණනක මිනිස්සු මාළු මිල දී ගන්න එනවා. ඔක්කොම මෙතනට එන්නෙ නහය වහගෙන කෙළ ගස ගසා. කොරෝනා වයිරසය තිබෙන කෙනෙකු ආවොත් ඔක්කොටම දෙවියන්ගේ පිහිටයි. පසුගිය කාලේ කොරෝනා නිසා මාළු වෙළඳපොළ වසා දැම්මා. නැවත විවෘත කරනවිට නව වෙළෙඳ සංකීර්ණය වෙත අපේ වෙළෙඳාම ගෙනියන බවට සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයා ප්‍රකාශ කරලා තිබුණා. පනමුත් එහෙම වුණේ නැහැ. නැවත ආණ්ඩුකාරවරයාගෙන් විමසුවා ම කිව්වෙ සතියකින් නව වෙළෙඳ සංකීර්ණය විවෘත කරන බවයි. නමුත් දැන් මාස ගාණක් ගියා.අපි එතනමයි. මේ ගොඩනැගිල්ල ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට බාර දීලා අවුරුදු තුනකටත් වැඩියි. ඒත් තාම විවෘත කර ගැනීමට බැරුව ළත වෙනවා.

මාළු වෙළඳ ව්‍යාපාරික නිලන්ත මෙසේ පැවසීය.

සම්පූර්ණ වැඩ ඉවර කරල මාස ගානක් වෙනවා. තාම මල් වවනවා. විවෘත කරන බවක් පේන්න නෑ. දිනපතා අලුයම පහට විතර මෙම ස්ථානය හරහා ආවොත් පසුකරන්න විනාඩි විස්සක් විතර ගත වෙනවා. මේ ස්ථානය හරහා යන එන මිනිස්සු දැඩි අපහසුතාවට පත්වෙනවා. හැකි ඉක්මනින් අපේ වෙළඳාමට ගෞරවයක් ලැබෙන විදිහට වැඩ කර ගෙන යන්න අවස්ථාව දෙන්න. රජයේ මුදල් කෝටි ගණනක් ගානක් වැය කරලා ඉදිකළ ගොඩනැගිලි අපරාදේ. අපේ මාළු ව්‍යාපාරිකයන් එක පයින් කැමතියි අලුත් තැනට යන්න.ඉදිරියට එන උත්සව සමයට කලින් මාළු වෙළඳ සංකීර්ණය විවෘත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.යටිතල පහසුකම් ඔක්කොම තියෙද්දිත් මේක තාම නොකර සිටීම ගැන අපට තියෙන්නෙ බලවත් කනගාටුවටක්.

මේ සම්බන්ධයෙන් ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර මෙසේ අදහස් දැක්වීය.

'මාදම්පෙ මාළු වෙළඳ පොළ තුළ පවතින අවිධිමත් බව නිසා ජනතාව විඳින පීඩාව අපට හොඳින් වැටහෙනවා. එය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම ප්‍රාදේශීය සභාවේ වගකීමක්. එහෙත් මෙම මාළු වෙළඳ සංකීර්ණය ගොඩකවෙල ප්‍රාදේශීය සභාවට බාර දෙන කොට තිබුණෙ වහල ගහල තිබුණු ගොඩනැගිල්ලක් විතරයි. මේක නිසි ප්‍රමිතියක් ඇතුව දීර්ඝ කාලයක් පවතින ආකාරයට ආරම්භ කිරීමට අපට විශාල වෙහෙසක් හා වියදමක් දැරීමට සිදුවුණා. ජලය විදුලිය ආරක්ෂිත වැට තිබුණෙ නැහැ. සබරගමුව පළාත් සභාවේ සහයෝගය ඇතිව රුපියල් ලක්ෂ හැටකට අධික මුදලක් වැය කරලා දැනට ජලය විදුලිය ගබඩා පහසුකම් සහ ආරක්ෂිත වැට කානු පද්ධතිය සකස් කර අවසානයි. ඊළඟට නිවැරදි මාළු ව්‍යාපාරිකයන් තෝරා ගෙන ඔවුන්ට වෙළඳාම් කිරීමට ඉතා ඉක්මනින් අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වෙනවා. පිටින් පේන ගොඩනැගිල්ල විතරක් නොවෙයි මාළු වෙළඳ සංකීර්ණයක් කියල කියන්නෙ; චෝදනා කරන්න පුළුවන් ඕන කෙනෙකුට.ඒත් පරිසර නීති රීතිවලට අනුව ක්‍රමවත්ව වැඩක් කරද්දි යම් කාලයක් අවශ්‍ය වෙනවා. තවත් මාසයක් ඉක්ම යන්නට කලින් නව වෙළඳ සංකීර්ණය විවෘත කිරීමට කටයුතු කරනවා.

සිළුමිණ
சிலுமின The Silumina

සිප්සයුර

අධ්‍යාපන අතිරේකය

silumina.advt@lakehouse.lk - 011 242 9351 - 071 782 9018

කෘෂිකර්ම ක්ෂේත්‍රයට විද්වතුන් තනන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

බදුල්ල-පස්සර මාර්ගයේ කි.මී. 3 පමණ දුර ගෙවා ගිය කල හමුවන, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය කාගේත් සිත් බැඳ ගන්නා මනරම් කඳුවළල්ලකින් වටව පිහිටා ඇති අතර, විශ්වවිද්‍යාලය නිර්මාණයේදී භාවිත කළ භූමි අලංකරණය නිසා එහි පැමිණෙන්නන්ගේ ආකර්ෂණයට තිබඳ ලක්වේ.

2005 වර්ෂයේ මුල්ගල් තබා 2006 වර්ෂයේදී පළමු ශිෂ්‍ය කණ්ඩායම බඳවාගෙන අධ්‍යාපන කටයුතු ආරම්භ කළ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ 14 වැනි ජාතික විශ්වවිද්‍යාලයයි. පීඨ තුනකින් සහ උපාධි පාඨමාලා පහකින් ආරම්භ කළ විශ්වවිද්‍යාලය අද වන විට, පීඨ හතරක් දක්වා සහ උපාධි පාඨමාලා 11 ක් දක්වා වර්ධනය වී ඇත.

කෙසේ වෙතත් නුදුරු අනාගතයේදී විශ්වවිද්‍යාලය තවදුරටත් පුළුල් වී වඩ වඩාත් උසස් අධ්‍යාපන අවස්ථා අප රටේ දරුවන් උදෙසා ලබාදීමට සූදානම් වෙමින් පවතී.

ආරම්භයේ සිටම අලුත් දිශානතියකට පියමං කිරීමට අදිටන් කරගත් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දැක්ම වන්නේ "ජාතික සම්පත්වලට අගය එකතු කිරීමේ විශිෂ්ටතම කේන්ද්‍රස්ථානය" බවට පත්වීමයි. මේ අතර, විශ්වවිද්‍යාලයේ මෙහෙවර ලෙස ගෙනහැර දක්වන්නේ, "ජාතික සංවර්ධනයට කැපීපෙනෙන දායකත්වයක් ලබාදිය හැකි, දැනුමින්, කුලසතාවයෙන් (නිපුණතාවයෙන්) සාරධර්ම සහ ආකල්පවලින් පිරිපුන්, අවශ්‍යතාවයට මනාව ගැළපු, රැකියාවල නියුක්ත, තාක්ෂණික-විශේෂඥ සහ ව්‍යවසායකත්ව ගති ලක්ෂණවලින් හෙබි උපාධිධාරීන් බිහිකිරීම සහ ජාතික සම්පත්වලට අගය එකතු කිරීම කෙරෙහි වඩාත් වැඩි අවධානයක් ලබාදෙමින් ඉගැන්වීම, ඉගෙනීම සහ පර්ය ෂණ කටයුතු වලින් විශිෂ්ටත්වය දැක්වීම" යන්නයි.

රටේ ආර්ථිකයට ඍජුව හෝ වක්‍රව දායක වන විද්‍යාර්ථයින් බිහිකිරීම උදෙසා වඩාත් ප්‍රායෝගික ලෙස උපාධිධාරීන් පෙළගැස්වීම සඳහා විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන සියලු උපාධි පාඨමාලා සඳහා විෂය නිර්දේශ සකස් කිරීමේදී "ජාතික සම්පත්වලට අගය එකතු කිරීම" සහ "ව්‍යවසායකත්වය"යන මූලධර්ම පදනම් කරගෙන ඇති අතර, සියලු උපාධි පාඨමාලාවල අන්තර්ගතය තුළ උපාධියට අවශ්‍ය විෂය කරුණු ලබාදෙන අතර පරිපූර්ණ උපාධිධාරියකු බිහිකිරීම උදෙසා අත්‍යවශ්‍ය කුලසතා (නිපුණතා) සංවර්ධනය සහ පුළුල් සාමාන්‍ය දැනුම ලබාදීමද සිදු කෙරේ. මෙබඳු සංයුතියකින් යුතු උපාධි පාඨමාලා නිර්මාණය කර ඇති නිසා විශ්වවිද්‍යාලයෙන් පිටවන උපාධිධාරීන් සඳහා රැකියා වෙළෙඳපොළ තුළ වඩා වැඩි පිළිගැනීමක් ඇති බව සනාථ කර ඇති අතර, උදාහරණයක් ලෙස රැකියා නියුක්ති ප්‍රතිශතය මුල් මාස කිහිපය තුළදී 80%ක් තරම් වීම ගෙනහැර දැක්විය හැක.

එදා මෙදා තුර වසර 15ක් තුළ විශ්වවිද්‍යාලයට නායකත්වය ලබාදීම සඳහා උපකුලපතිවරුන් සිව්දෙනකුගේ දායකත්වය ලබා ගෙන ඇති අතර, ඒ අනුව ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා සමාරම්භක උපකුලපතිවරයා ලෙසත්, මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා, ආචාර්ය ගාමණී චන්ද්‍රසේන සහ මහාචාර්ය ජයන්ත ලාල් රත්නසේකර යන මහත්වරු සෙසු උපකුලපතිවරු ලෙසත් සිය සේවය ලබා දී ඇත.

මහාචාර්ය සමන් කේ. හේරත්
පීඨාධිපති

අනෙකුත් විශ්වවිද්‍යාල හා සැසඳීමේදී වඩාත් ආවේණික ගති ලක්ෂණ කිහිපයක් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සතු වන අතර, ඒවා විශ්වවිද්‍යාලයේ ප්‍රගමනය සඳහා බෙහෙවින් පිටිවහල් වී ඇත. භෞතික සම්පත්වල කේන්ද්‍රිය පරිශීලනය, සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම, විෂය කේන්ද්‍රිය දැනුමට අමතරව පුළුල් සාමාන්‍ය දැනුම ලබාදීම සහ අත්‍යවශ්‍ය කුසලතා සංවර්ධනය කිරීම, පෝස්ටර් - කටවුට්වලින් තොර විශ්වවිද්‍යාල භූමියක් පවත්වා ගෙනයාම, ඇතැම් ප්‍රධාන සේවා බාහිර අංශ මගින් ලබාගැනීම හරහා වඩාත් කාර්යක්ෂම සේවයක් සපයා දීම ඉන් ප්‍රධාන කිහිපයකි. මේ සියල්ල ඔස්සේ වඩාත් ඵලදායී සේවාවක් මගින් වෙනස් ආරයක විද්‍යාර්ථයින් බිහිකිරීමට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය උත්සහ දරන අතර එය කාගේත් අවධානයට හා ප්‍රසාදයට ලක්වීමට තුඩුදී ඇත.

සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය

ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාවල කෘෂිකර්මය හා සම්බන්ධ පීඨ අට අතර ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ආරම්භයේ සිටම පවතින සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය විශ්වවිද්‍යාලයේ දැක්ම තුළ පිහිටමින් කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත සම්පත් සඳහා අගය එකතු කිරීමේ කාර්යයට දායකවීම සිදුකරනු ලබයි. ඒ අනුව, පීඨයේ මෙහෙවර දිශානත වන්නේ ඉගැන්වීම සහ ඉගෙනීම මෙන්ම පර්යෂණ කටයුතුවලදී කෘෂිකාර්මික සම්පත්වලට අගය එකතු කිරීම සඳහා විශිෂ්ටත්වය පෙන්වීමයි. කෘෂිකර්මය සහ ඒ ආශ්‍රිත සම්පත් ලෙස පශු සම්පත්, කෘෂි බෝග සහ ජලජ සම්පත් මූලික වශයෙන් හඳුනාගෙන ඇති අතර, නව විද්‍යාත්මක සහ තාක්ෂණික දැනුම විෂය කරුණු හා සංකලනය කිරීම හරහා මෙකී සම්පත් වලටඅගය එකතු කරමින් මෙහෙවර තුළ තියැළීම අරමුණ වේ. වඩාත් ප්‍රායෝගික සහ ඵලදායී මෙහෙවරක් උදෙසා, අපගේ උත්සාහය වන්නේ ඉගැන්වීම සහ ඉගෙනීම සඳහා උචිත පරිසරයක් නිර්මාණය කොට දී එමගින් දැනුම, කුලසතා (නිපුණතා) මෙන්ම සාරධර්ම සහ ආකල්පවලින් පිරිපුන් දරුවන් දැයට දායාද කිරීමට ඍජු දායකත්වයක් සැපයීමයි. මේ වෙනුවෙන් වසරකට නවක සිසුන් 300 ක් පමණ බඳවා ගනු ලබන අතර ඔවුන් සියලුදෙනා කෘෂිකර්ම ක්ෂේත්‍රයට අගය එකතු කිරීමට දායකවීම දැකීම පීඨයේ අභිලාශයයි.

අධ්‍යයනාංශ සහ උපාධි පාඨමාලා

සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය සතුව දැනට අධ්‍යයනාංශ දෙකක් පවතින අතර ඒවා නම් සත්ත්ව පාලන විද්‍යා අධ්‍යනාංශය සහ අපනයන කෘෂිකර්ම අධ්‍යායනාංශයයි. මෙකී අධ්‍යයනාංශ දෙක මූලික වශයෙන් පිහිටුවා ඇත්තේ එක් අතකින් සත්ත්ව නිෂ්පාදනයටත් අනෙක් අතින් කෘෂිබෝග සඳහාත් වැඩි අවධානයක් ලබාදෙමින් ඒ සඳහා අවශ්‍ය සුවිශේෂී වූ විද්‍යාර්ථයින් බිහිකිරීමට අවශ්‍ය දායකත්වය ලබාදීම සඳහාය. මෙහිදී සැලකිය යුතු වන්නේ මෙකී අංශ දෙක මගින් කෘෂිකර්ම ක්ෂේත්‍රය හරහා රටේ ආර්ථිකයට ලබා දිය හැකි ඍජු හා වක්‍ර දායකත්වය පිළිබඳව අවධානය යොමු කොට ඒ සඳහා උචිත විද්වතුන් බිහිකිරීමයි.

කෘෂිකර්ම ක්ෂේත්‍රය හරහා රටේ ආර්ථිකයට දායකවීම සඳහා සත්ත්ව නිෂ්පාදන අංශය මෙන්ම කෘෂිබෝග නිෂ්පාදන අංශය වඩාත් ඵලදායී ලෙස යොදාගැනීමට නම් එමගින් හැකි තරම් අගය එකතු කළ නිෂ්පාදන නිපදවා අපනයනය කිරීම ඉලක්ක කළ යුතු අතර එමගින් වඩාත් වැඩි විදේශ විනිමයක් ලබාගැනීම කළහැකි වේ. සත්ත්ව පාලන විද්‍යා සහ අපනයන කෘෂිකර්ම අධ්‍යනාංශ දෙක සිය පර්ය ෂණ හරහා මේ සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදීමට කටයුතු කරමින් සිටින අතර, ඒ අනුව වාර්ෂිකව සිසුන්ගේ සහ ආචාර්යවරුන්ගේ පර්ය ෂණ කෘෂි සම්පත් සඳහා අගය එකතු කිරීම හා ආශ්‍රිතව නාභිගත කර ඇත.

මේ වන විට සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය මගින් උපාධි පාඨමාලා පහක් පිරිනමන අතර, එකී පාඨමාලා අපටම ආවේණික වේ. කෘෂි සම්පත්වලට අගය එකතු කිරීම, ව්‍යවසායකත්වය ප්‍රගුණ කිරීම, අත්‍යාවශ්‍ය කුසලතා සංවර්ධනය සහ පුළුල් සාමාන්‍ය දැනුමක් ලබාදීම ඔස්සේ කෘෂි ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා දැනුමින්, කුසලතාවයෙන් පිරිපුන්, සාරධර්ම අගයන, ධනාත්මක ආකල්පයෙන් හෙබි පරපුරක් බිහිකිරීමට අවශ්‍ය අඩිතාලම ලබාදීම වෙනුවෙන් සියලු උපාධි පාඨමාලා පෙළගස්සවා ඇති අතර, එම උපාධි පාඨමාලා පහත පරිදි වේ.

1. සත්ත්ව පාලන විද්‍යාවේදී ගෞරව උපාධිය/ විද්‍යාවේදී ගෞරව (සත්ත්ව නිෂ්පාදනය සහ ආහාර තාක්ෂණය) උපාධිය
2. විද්‍යාවේදී ගෞරව (අපනයන කෘෂිකර්මය) උපාධිය
3. විද්‍යාවේදී ගෞරව (තේ තාක්ෂණය සහ අගය එකතු කිරීම) උපාධිය
4. විද්‍යාවේදී ගෞරව (ජලජ සම්පත් තාක්ෂණය) උපාධිය
5. විද්‍යාවේදී ගෞරව (තාල හා ක්ෂීර තාක්ෂණය සහ අගය එකතු කිරීම) උපාධිය

මෙම සියලු උපාධි පාඨමාලා සිව් අවුරුදු උපාධි පාඨමාලා වන අතර, සියලු දේශන සහ විභාග මෙන්ම අනෙකුත් අදාළ කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. එමෙන්ම මෙම පාඨමාලා ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (Sri Lanka Qualification Framework) අනුව එහි හය වන මට්ටමේ (SLQF 6) හි පවතින පාඨමාලා වේ. වඩාත් ප්‍රායෝගික අත්දැකීම් සහිත උපාධි පිරිනැමීම සඳහා අප පීඨයේ සියලු පාඨමාලාවලට ආයතනික පුහුණුව (Industrial Training), ක්ෂේත්‍ර පුහුණුව (Field Training) සහ පර්ය ෂණ ව්‍යාපෘතිය (Research Project) යන අංග අත්‍යාවශ්‍ය අංග ලෙස ඇතුළත් කොට ඇති අතර එමගින් උපාධි අපේක්ෂකයින් කෘෂිකර්මාන්තයේ හෙට දවස වෙනුවෙන් සක්‍රිය දායකත්වයක් ලබාදිය හැකි මානව සම්පතක් ලෙස වැඩි දියුණු කොට සමාජයට මුදාහැරීම ඒකායන බලාපොරොත්තුවයි.

පශ්චාත් උපාධි පාඨමාලා සහ බාහිර පාඨමාලා

සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය මගින් දැනට පර්ය ෂණ මගින් පමණක් සම්පූර්ණ කළ යුතු දර්ශණපති උපාධිය (MPhil)ආරම්භ කොට ඇති අතර, ඒ සඳහා අධ්‍යයන මණ්ඩල හතරක් ඔස්සේ සිසුන් ලියාපදිංචි කරවා ගැනීම සිදුකරයි. මෙකී අධ්‍යයන මණ්ඩල (Boards of Study) වන්නේ 1. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ සැකසීම, 2. කෘෂි ආර්ථික විද්‍යාව, ව්‍යාපෘතිය සහ කෘෂිව්‍යාපාර කළමනාකරණය, 3. ජලජීවි වගාව සහ ධීවර, 4. ආහාර විද්‍යාව හා තාක්ෂණය වේ.

ද අවුරුදු පූර්ණ කාලීන පාඨමාලා ලෙස ආරම්භ කොට ඇති මෙම පශ්චාත් උපාධිය වර්තමානයේ වඩාත් ආකර්ෂණයට ලක් වෙමින් පවතී.බාහිර පාඨමාලා ලෙස දැනට ශාක පටක රෝපණය, මල් සැරසිලි හා වියළි මල් නිෂ්පාදනය සහ කෘෂි ව්‍යාපාර කළමනාකරණය යන කෙටිකාලීන පාඨමාලා පවත්වනු ලැබේ.

ඉදිරි අපේක්ෂාවන්

ශ්‍රී ලංකාවේ ඇති කෘෂිකර්මය හා සම්බන්ධ පීඨ අතර ළා බාලම පීඨය ලෙස අප මේ දක්වා ලබා ඇති ජයග්‍රහණ ඔස්සේ පීඨයේ ඉදිරි උන්නතිය හරහා රටේ ප්‍රගමනයට දායකවීම අත්‍යවශ්‍ය කොට සලකන අතර පීඨය සතු මානව සහ භෞතික සම්පත් මේ සඳහා පෙළ ගැස්සවීම මගින් වඩාත් වැඩි දායකත්වයක් ලබා දීම අරමුණ වේ. විවිධ විෂය මූලික ක්ෂේත්‍ර ඔස්සේ ලබා ඇති ආචාර්ය උපාධි 22 ක් පමණ පීඨය සතුව දැනට ඇති අතර, ඉදිරි වසර කිපය තුළ ශීඝ්‍ර ලෙස තවත් වර්ධනය වනු ඇත. දැනට සේවය කරන මහාචාර්යවරු හතරදෙනාට අමතරව නුදුරු අනාගතයේදී තවත් මහාචාර්ය පදවි ලැබීමට සුදුසු ආචාර්යවරුන් පීඨය සතුව ඇත. ගෙවී ගිය කාලය තුළ, 2009, 2013, 2014, 2015, 2016 සහ 2017 වර්ෂවලදී සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයට අයත් ආචාර්යවරු ගණනාවක් සිය පර්ය ෂණ ලිපි අගයමින් ජනාධිපති සම්මානයට පාත්‍ර වී ඇත. එමෙන්ම, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ඇගැයීමට ලක්ව, ලැබූ සම්මාන/ ඇගැයීම් ප්‍රමාණය 50 ක් පමණ වේ. 2015 සහ 2016 වසර වලදී ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය හා සම්බන්ධ පීඨ අතර වැඩිම ඒක පුද්ගල පර්ය ෂණ ලිපි ප්‍රමාණයකට (ජාතික සහ ජාත්‍යන්තර වශයෙන්) දායක වූ පීඨය ලෙස ද සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය දත්ත ගත වී ඇත.

අධ්‍යයන සහ පර්ය ෂණ කටයුතුවලට යොදාගත හැකි ලෙස සංවර්ධනය වන විද්‍යාගාර/රසායනාගාර අපගේ ඉලක්ක කරා අනාගතයේදී ළඟාවීමට පිටිවහල් වන බව නොඅනුමානය. මේ සියල්ල හරහා, සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයමගින් නුදුරු අනාගතයේදී රටේ කෘෂිකර්ම ක්ෂේත්‍රයට වඩාත් ඵලදායී සේවාවක් ලබාදීමට අපේක්ෂා කෙරේ.

ඉගැන්වීම හා උපදේශනය පර්යෂණ කිරීම සහ සමාජ සේවා කටයුතුවල නියැළීම අපගේ තෙවැදෑරුම් සේවාවන් වන අතර, ඒ අනුව වඩාත් සුභවාදී හෙට දවසක් වෙනුවෙන්, බාහිර පාඨමාලා (දැනට පවත්වාගෙන යන පාඨමාලාවලට අමතරව), පශ්චාත් උපාධි පාඨමාලා සහ විවිධ පුහුණුවීම් (කෙටි සහ මධ්‍ය කාලීන), උපදේශන සේවා ඔස්සේ බාහිර සිසුන් සහ අනෙකුත් අවශ්‍ය පුද්ගලයින් සඳහා අධ්‍යයන සහ සේවා අවස්ථා පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. එමගින් අපගේ මූලික අරමුණ වන කෘෂි ක්ෂේත්‍රය හා සම්බන්ධ සම්පත් සඳහා අගය එකතු කොට ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක විය හැකි විද්වතුන් නිර්මාණය කිරීම වෙත ළඟාවීමට පහසු වනු ඇතැයි හුදෙක්ම විශ්වාස කරමු.

සත්ත්ව පාලන විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය.

ක්ෂුද්‍ර ප්ලාස්ටික්වල පාරිසරික හා සෞඛ්‍යමය බලපෑම් පිළිබඳ සම්මන්ත්‍රණය

ක්ෂුද්‍ර ප්ලාස්ටික්, පරිසරයේ විවිධ ස්වරූපයෙන් ඇති ඉතා කුඩා කැබලි ලෙස පිහිටයි. කැබලි, තන්තු සහ පෙණ, ප්ලාස්ටික්වලින් ජනනය වන ද්‍රව්‍ය ලෙස හැඳින්විය හැක. ස්වභාවික ලෙස ඇතුළු වන ක්ෂුද්‍ර ප්ලාස්ටික් ආලේපන, ඇඳුම් පැලඳුම්, කාර්මික වැනි විවිධ ප්‍රභවයන්ගෙන් පරිසර පද්ධතියේ මෙහෙයුම්, පරිසරය කෙරෙහි මෙන්ම ක්ෂුද්‍ර ප්ලාස්ටික් හි බණ්ඩනය හා විනිවිද යාමේ මට්ටම ඉහළ යාම හේතුවෙන් මිනිස් සෞඛ්‍යයට අහිතකර ලෙස බලපායි. එබැවින්, මූලාරම්භය විමර්ශනය කිරීම සහ ප්‍රධාන වශයෙන් සමුද්‍රිය හා මිරිදිය පරිසරවල විවිධ අංශුමාත්‍රිය ක්ෂුද්‍ර ප්ලාස්ටික් ව්‍යාප්තිය හා එහි අවසන් ප්‍රතිඵලය දැනගැනීම වැදගත් වේ.

ක්ෂුද්‍ර ප්ලාස්ටික් පුළුල් පරාසයකින් ඇතුළත් වීම හේතුවෙන් ක්ෂුද්‍ර ප්ලාස්ටික් නිසා සමුද්‍ර ජීවී විශේෂ, දූෂණය වීම ජෛව හා මානව දූෂණයට වඩා හානිකර විය හැකිය. තවද, විවිධ මිනිස් අවයවවල ක්ෂුද්‍ර ප්ලාස්ටික් ඇති බව දැනටමත් වාර්තා වී ඇත. පරීක්ෂණ වල ප්‍රතිඵලයක් ලෙස PolyChlorinated Biphenyls (PCB) වැනි අතිශයින්ම පිළිකා කාරක සංයෝග ක්ෂුද්‍ර ප්ලාස්ටික් වලට එකතු විය හැකි බව පෙන්වා දී ඇත. ඔවුන්ට ආහාර දාම හරහා ගමන් කළ හැකි අතර මිනිස් සෞඛ්‍යයට අහිතකර විය හැකිය.

මිනිසුන්ට සහ අනෙකුත් සත්වයන්ට ඇඩි සෞඛ්‍ය අවදානමක් ඇති බව විවිධ පාරිසරික මධ්‍යස්ථාන මර්ගයෙන් පෙන්වා දී ඇති අතර, මේවාහි සංවර්ධනයක් කළ යුතුය. ඒවා හඳුනා ගැනීම සඳහා භාවිතා කර ඇති තාක්ෂණයන්ට සණත්ව වෙත් කිරීම, රාමන් වර්ණාවලීක්ෂ ය (Raman Spectroscopy) සහ ෆූරියර් අධෝරක්ත වර්ණාවලීක්ෂය පරිවර්තනය (FTIR) භාවිත කරයි.

50
INSTITUTE OF CHEMISTRY CEYLON
Years of Annual Sessions
1971 – 2021
Golden Jubilee

මෙම සම්මන්ත්‍රණය මගින් ක්ෂුද්‍ර ප්ලාස්ටික්වල රසායන විද්‍යාව, පාරිසරික හා සෞඛ්‍යමය බලපෑම් පිළිබඳ අවධානය යොමු කෙරේ. මෙම සම්මන්ත්‍රණයේදී ඔබට ඒ පිළිබඳ සම්පූර්ණ දැනුමක් ලැබෙනු ඇත. මෙම නවීන ආපදාව, මිනිසාගේ, අනෙකුත් ජීවීන්ගේ සහ පරිසරයේ ඊළඟ මහා ව්‍යසනය විය හැකිය.

සම්බන්ධීකාරක : ලංකා රසායන විද්‍යා ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිසිර වැලිවේගමගේ වැඩි විස්තර සඳහා ලංකා රසායන විද්‍යා ආයතනය අමතන්න.

011-2861231. (Gwcsp84@gmail.com) www.ichemc.edu.lk

SLIM සහ VoiceD එකමුතුවෙන් කළ Certificate of Direct Sales & Network Marketing සාර්ථකව අවසන් !

ශ්‍රී ලංකාවේ ජාතික අලෙවිකරණ පද්ධතිය ලෙස ක්‍රියාත්මක ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) ශ්‍රී ලංකාවේ ඍජු අලෙවිකරණ (Direct Marketing) ක්ෂේත්‍රයේ දැවැන්තයකු වන VoiceD Marketing Services සමග එක්ව, VoiceD කාර්යය මණ්ඩලයේ අලෙවිකරණ කුසලතා වැඩිදියුණු කිරීමෙහිලා ආයතනික අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් ලෙස පවත්වනු ලැබූ "Certificate of Direct Sales & Network Marketing" සහතික පත්‍ර පාඨමාලාව පසුගියදා සාර්ථකව අවසන් කරන ලදී.

2020 නොවැම්බර් 19 වැනිදා පැවැති එම සහතිකපත්‍ර ප්‍රදාන උත්සවය සඳහා SLIM වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී / විධායක අධ්‍යක්ෂ සනත් සේනානායක, සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සංවර්ධන) මිහිරිනි ෆොන්සේකා, ආයතනික විකුණුම් කළමනාකාර අසංක සෙනෙවිරත්න යන මහත්ම මහත්මීන් සහභාගී වූ අතර VoiceD වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ නදීක හෙට්ටිආරච්චි, ප්‍රධාන වාණිජ නිලධාරී තරිඳු බණ්ඩාරනායක, සහකාර මානව සම්පත් කළමනාකාරිණී නිශාති සිල්වා යන මහත්ම මහත්මීන් එක්වූහ.

වසර 30කට ආසන්න Direct marketing ක්ෂේත්‍රයට අඩුපාඩුවක්ව පැවැති වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර පාඨමාලාවක් දිවයිනේ ප්‍රථම වතාවට VoiceD ආයතනය හා SLIM ආයතනය එකතුව හඳුන්වා දීමට කටයුතු කර ඇත. Certificate of Direct Sales & Network Marketing පාඨමාලාව Direct marketing ක්ෂේත්‍රය වෙනුවෙන්ම නිර්මාණය වූ සුවිශේෂී පාඨමාලාවකි. එම ක්ෂේත්‍රය තුළ එල්ලවන අභියෝග ජයගනිමින් අලෙවිකරණ ඉලක්ක සම්පූර්ණ කරගනිමින් ක්ෂේත්‍රයේ රැකියාවල නිරතවී සිටින්නන්ට මහගු අවස්ථාවක් ලෙස සැලකිය හැක. තවද මෙම පාඨමාලාව VoiceD Marketing Services (Pvt) Ltd ආයතනයෙන් පමණක් විශේෂයෙන් ලබාගත හැකි සහතික පත්‍රයක් වේ.

SLIM සභාපති රොෂාන් ප්‍රනාන්දු මහතා මෙම වැඩසටහන පිළිබඳ අදහස් දක්වමින් COVID-19 වසංගත තත්ත්වයත් සමග ශ්‍රී ලාංකීය ආර්ථිකයට එල්ල වූ අභියෝග ජයගැනීමට ශ්‍රී ලංකාවේ අලෙවිකරණ වෘත්තිකයන් සවිබලගැන්වීම ජාතික අවශ්‍යතාවක් බවට පත්ව ඇතැයි පැවසීය. වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා, "Restart Sri Lanka" ජාතික වැඩසටහන යටතේ ශ්‍රී ලාංකීය අලෙවිකරණ වෘත්තිකයන් හා ව්‍යාපාර ආයතන සවිබල ගැන්වීමෙහිලා මෙවැනි සුවිශේෂ ීකරණය වූ අලෙවිකරණ පුහුණු වැඩසටහන් රැසක් ඉදිරියේදීත් SLIM මෙහෙයවීමෙන් පවත්වන්නට සැලසුම් කොට ඇතැයි පැවසීය.

VoiceD වෙනුවෙන් අදහස් දැක්වූ එහි ප්‍රධාන විධායක නිලධාරී / අධ්‍යක්ෂ නදීක හෙට්ටිආරච්චි මහතා,"ඩිරෙක්ට් මාකටින් ක්ෂේත්‍රයේදී වෘත්තීය සුදුසුකම්ලත් කාර්යශූර කාර්යය මණ්ඩලයක් සිටීම ආයතනයකට ඉතාමත් වැදගත්. අලෙවිකරණ ක්ෂේත්‍රය අභියෝග පිරුණු වෘත්තීය ක්ෂේත්‍රයක්. නිරන්තරයෙන් වෙනස්වෙන ව්‍යාපාර ලෝකයේ සාර්ථක අලෙවිකරුවකු බවට පත්වෙමින් ආයතනය සාර්ථකත්වයට රැගෙන යාමේදී මෙවැනි පුහුණු වැඩසටහන්වලින් ලැබෙන පන්නරය බොහෝ උපකාරීවෙනවා. ශ්‍රී ලාංකිය අලෙවිකරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන SLIM සමග ඉදිරියේදීත් මෙවැනි වෘත්තීය අධ්‍යාපන අවස්ථා රැසක් අපේ කාර්ය මණ්ඩලයට ලබාදෙන්නට අප බලාපොරොත්තු වෙනවා..". යැයි පැවසීය.

SLIM උප සභාපති නුවන් ගමගේ මහතා අදහස් දක්වමින්, පසුගිය කාලය මුළුල්ලේම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළ ව්‍යාපාර ආයතන සමග අත්වැල් බැඳගනිමින් අලෙවිකරණ වෘත්තීය පුහුණුව එම ආයතනික කාර්ය මණ්ඩල වෙත ලබාදීම කෙරෙහි SLIM ක්‍රියාකාරී වූ බව පැවසීය. දිනෙන් දින වෙනස්වන ව්‍යාපාරික ලෝකයට ගැළපෙන ආකාරයෙන් අලෙවිකරණ වෘත්තිකයන් සවිබල ගැන්වීම උදෙසා නිරන්තර යාවත්කාල වන වෘත්තීයවේදී අලෙවිකරණ අධ්‍යාපන ක්‍රමවේදයක් පවත්වාගෙන යන්නට කැපව සිටින SLIM සමග අත්වැල් බැඳගත් VoiceD අලෙවිකරණ වෘත්තිකයන්, තරඟකාරී අනෙකුත් ආයතනයන්ට සාපේක්ෂව වෙනස් ආකාරයෙන් සිතන කාර්යශූර ආකාරයෙන් කටයුතු කරන කණ්ඩායමක් බවට පත්වනු ඇතැයි තමා විශ්වාස කරන බව ඒ මහතා වැඩිදුරටත් පැවසීය.

SLIM වෙනුවෙන් එහි ප්‍රධාන විධායක නිලධාරී / විධායක අධ්‍යක්ෂ සනත් සේනානායක මහතා, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ආයතන SLIM වෙතින් ලැබෙන අලෙවිකරණ වෘත්තියවේදී පුහුණුව පිළිබඳ විශ්වාසය තබා තිබෙන්නේ අපගේ අලෙවිකරණ අධ්‍යාපන ක්‍රමවේදය හරහා වෙනස්වන ව්‍යාපාර පරිසරයක අභියෝගයන්ට මුහුණදිය හැකි සාර්ථක අලෙවිකරණ වෘත්තිකයන් නිර්මාණය කෙරෙන නිසාවෙනි. අප විසින් ෂඩඑජඥවි ආයතනයේ අවශ්‍යතා අනුව විශේෂයෙන් සකස් කළ විෂය නිර්දේශයක් ඔස්සේ Certificate of Direct Sales & Network Marketing පාඨමාලාව සකස් කොට තිබෙනවා. SLIM සැමවිටම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයත් අදාළ ආයතනයේ ව්‍යාපාරික සමෘද්ධියත් යන දෙපාර්ශ්වයම පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් වෙමින් අලෙවිකරණ අධ්‍යාපන සේවාව ක්‍රියාත්මක කරනු ලබනවා යැයි පැවසීය.

දශක ගණනාවක් තිස්සේ ජාත්‍යන්තර ප්‍රමිතිගත අලෙවිකරණ අධ්‍යාපනයක් ශ්‍රී ලාංකිකයන්ට උරුම කරදෙමින් ගෝලීය අභියෝගයන්ට මුහුණදිය හැකි සාර්ථක අලෙවිකරණ වෘත්තිකයන් පිරිසක් ගොඩනැංවීමේ ජාතික මෙහෙවරෙහි නියැලි SLIM පසුගිය කාලයේ අප රටට බලපෑ COVID-19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලාංකිය ව්‍යාපාරික ප්‍රජාව ශක්තිමත් කිරීමේ ජාතික මෙහෙවරටද උරදී සිටියි.ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM)1970 වසරේ සිට ශ්‍රී ලාංකීය ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා වෘත්තියවේදී අලෙවිකරණ වෘත්තිකයන් බිහිකිරීමේ ජාතික ආයතනය ලෙස ක්‍රියාත්මක වේ. SLIM ආයතනය ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (NCCSL), ශ්‍රී ලංකා වෘත්තික සංගම් සංවිධානය (OPA), ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL), ලංකා සේවායෝජකයන්ගේ සංගමය (EFC) සහ ආසියානු අලෙවිකරණ සම්මේලනය (AMF) යන දෙස් විදෙස් ව්‍යාපාර සංගමයන්ගේ සාමාජිකත්වය ලබා ඇත. එමෙන්ම SLIM අලෙවි සමීක්ෂණ සඳහා ලොව ප්‍රකට ESOMAR සහ Federation of Marketing Research Industries ආයතනයන්ගේ සාමාජිකත්වයද ලබා ඇත. SLIM ආයතනික තත්ත්ව කළමනාකරණ ක්‍රියාවලිය වෙත ජාත්‍යන්තර ISO 9001:2015 තත්ත්ව සහතිකය හිමිව ඇති අතර, අධ්‍යාපන සේවා සැපයුම්කරුවෙකු (LSP)ලෙස අලෙවිකරණ ක්ෂේත්‍රය හා බැඳුණු වෘත්තීය අධ්‍යාපනික පාඨමාලා හා පුහුණු වැඩසටහන් උසස් තත්ත්වයෙන් පවත්වාගෙන යාම උදෙසා ISO 2990:2010 තත්ත්ව සහතිකය හිමිකරගැනීමට සමත්ව ඇත.

මනුසත් මෙහෙවර උදෙසා කොළඹ සරසවි විද්‍යාර්ථයින්ගෙන් ඇරැයුම්

කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ව්‍යාපාර පරිපාලනවේදී (Bachelor of Business Administration) උපාධි අපේක්ෂක සිසු සිසුවියන් විසින් සමාජ සවිබල ගැන්වීමේ අරමුණ පෙරදැරිව සිය අධ්‍යාපන ව්‍යාපෘතියක් වන ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය (BBA 110) යටතේ වසර ගණනාවක් මුළුල්ලේ විවිධ දුෂ්කරතා සහිත පාසල් දරුවන්ගේ අධ්‍යාත්මික කටයුතුවලට සවියක් වීම සඳහා පංතිකාමර, පාසල් විද්‍යාගාර නවීකරණය කිරීම, පුස්තකාල සඳහා පොත් පත් ලබාදීම, දුෂ්කර ප්‍රදේශවල පිහිටි රෝහල් වෙනුවෙන් උපකරණ ප්‍රදානය කිරීම, වැඩිහිටි නිවාස සඳහා උපකරණ ප්‍රදානය කිරීම, දිළිඳු පවුල් වෙත නිවාස සකස් කර දීම ආදී වූ විවිධ සමාජ සුබසාධන කටයුතු රාශියක් ඉටු කරන ලදී.

මෙවරද කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද අපගේ යුතුකම එලෙසින්ම ඉටු කිරීමට අප සූදානම්. කළමනාකරණ හා මූල්‍ය පීඨයේ දෙවැනි වසර ඉගෙනුම ලබන Team Hot Shots අප කණ්ඩායම විසින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රජිස්ත ද අල්විස් සෙනෙවිරත්න මහතාගේ මගපෙන්වීම් යටතේ ඒ සඳහා තෝරාගනු ලැබුවේ රෝගීන් 138 ක් පමණ නේවාසිකව ප්‍රතිකාර ලබන, සුවකළ නොහැකි රෝගී තත්ත්වයන් හේතුවෙන් පීඩාවට ලක්වූ විශේෂ අවශ්‍යතා සහිත වැඩිහිටියන් සිටින රාජගිරිය Victoria home for incurables නිවාසයයි.

මෙහි ප්‍රතිකාර ලබන අපේම වැඩිහිටියන් වෙනුවෙන් ඔවුන්ගේ එදිනෙදා වැඩකටයුතු යම්තාක් දුරට හෝ පහසු කර දීම උදෙසා රෝද පුටු පරිත්‍යාග කිරීමට අප විසින් සංවිධානය කරනු ලබන ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගතව රුපියල් 120,000 ක පමණ මුදලක් වැය වන අතර, මෙම සමාජ සත්කාරයට මූල්‍යමය මෙන්ම රෝද පුටු පරිත්‍යාගයන් මගින් ද දායක වීමට ඔබටත් ආරාධනා කර සිටිමි.

මේ ඔබගේ අත්වැල අපට අවැසිම මොහොතයි

වැඩි විස්තර සඳහා,
අපගේ ෆේස් බුක් පිටුව – elderly care (https://www.facebook.com/Elder/ycare2020/ අපගේ වෙබ් අඩවිය – http://bit.ly/uocelderlycare

යුනියන් ඇෂුවරන්ස් වෙතින් Clicklife Self Service App

යුනියන් ඇෂුවරන්ස් සමාගම සිය ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා Clicklife app හඳුන්වා දීමට පසුගිය දා කටයුතු කළේ ය. දුරස්ථ ක්‍රමයට තමන්ට පහසු ඕනෑම ස්ථානයක සිට රක්ෂණ සේවාවන් කඩිනමින් ලබාගැනීමේ අවස්ථාව මෙම Clicklife Self Service ඒනත හරහා පාරිභෝගිකයන්ට උදාකරදී ඇත. මෙය යුනියන් ඇෂුවරන්ස් විසින් හඳුන්වා දෙනු ලබන පරිපූර්ණ ඩිජිටල් රක්ෂණ විසඳුම් මාලාවේ එක් පියවරක් වන අතර, මෙමගින් ගනුදෙනුකරුවන්ට තම රක්ෂණ සැලසුම් වලට අදාළ ශේෂයන් විමසීම, ගෙවිය යුතු මුදල් සම්බන්ධ තොරතුරු පරීක්ෂා කිරීම, හිමිකම් මුදල් ඉල්ලීම් වල තත්ත්වය පරීක්ෂා කිරීම සහ ණය ඉල්ලීම් ඉදිරිපත් කිරීම වැනි සේවාවන් රාශියක් ලබාගත හැක.

Clicklife Self Service ඒනත මගින් ගනුදෙනුකරුවන්ට ඕනෑම මොහොතක, ඕනෑම ස්ථානයක සිට යුනියන් ඇෂුවරන්ස් හා සම්බන්ධ වී තම රක්ෂණ සැලසුම් කළමනාකරණය කිරීම, හිමිකම් මුදල් ඉල්ලීම් ඉදිරිපත් කිරීම සහ වාරික ගෙවීම වැනි කටයුතු ඉතාමත් පහසුවෙන්, කාර්යක්ෂම හා සුරක්ෂිත ලෙස සිදුකළ හැකි වේ. මීට අමතරව තවත් පියවරක් ඉදිරියට යමින්, ඩිජිටල් ක්‍රමයට රක්ෂණ ඔප්පු ණය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමටද අවස්ථාව ලබා දී ඇත. මීට පෙර මෙවැනි ණය ඉල්ලීම් ඉදිරිපත් කිරීමේදී කාලය වැයකරමින්, ලිපිලේඛන කටයුතුද සම්පූර්ණ කිරීම අවශ්‍ය වී තිබිණි.

නව හඳුන්වා දීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් යුනියන් ඇෂුවරන්ස් සමාගමේ තාක්ෂණික ප්‍රධානී, රමේෂ් මෝදරගේ මහතා මෙසේ පැවසී ය. "සාම්ප්‍රදායික ක්‍රමවේද වෙනස් කරමින් අපි ගනුදෙනු 100% ක් විනිවිදභාවයෙන් යුතුව සිදුකිරීම සඳහා අවස්ථාව ලබාදෙමින් සිටිනවා. දැන් රක්ෂණ හිමියන්ට තම ජංගම උපාංග භාවිතයෙන් ඕනෑම මොහොතක තම රක්ෂණ සැලසුම් සම්බන්ධ නවතම තොරතුරු ලබාගැනීමට පුළුවන්. සාමාන්‍යයෙන් මේ දක්වා රක්ෂණ සැලසුම්වල ලිපිනය ඇතුළු සම්බන්ධතා තොරතුරු වෙනස් කිරීම, හිමිකම් මුදල් ඉල්ලීම් ඉදිරිපත් කිරීම, ණය ඉල්ලීම් ඉදිරිපත් කිරීම සහ ශේෂ ප්‍රකාශයන් ඉල්ලීම වැනි කටයුතු සිදුකෙරුණේ ඇමතුම් මධ්‍යස්ථාන හෝ රක්ෂණ නියෝජිතයන් හරහා යි. එහෙත් දැන් මේ සියල්ල Clicklife Self Service ඒනත මගින් සිදුකළ හැකි නිසා තම රක්ෂණ සැලසුම් සම්බන්ධ කටයුතු කළමනාකරණය කිරීමේ හැකියාව ගනුදෙනුකරුවන්ටම ලැබී තිබෙනවා."

ClicklifeSelf Service ඒනත හි තවත් සුවිශේෂී අංගයක් වන්නේ ඊට 'Health Tracker' ක්‍රමයක් ඇතුළත් වී තිබීමයි. මෙමගින් ගනුදෙනුකරුවන්ට නිරෝගී ජීවිතයකට අවශ්‍ය උපදෙස් වලට අමතරව තැගි වවුචර හා වට්ටම් කූපන ආදියද පිරිනමන අතර, මේවා දිවයින පුරා විසිරුණු අලෙවිසැල් ජාලයකදී භාවිත කළ හැකි වේ.

"රක්ෂණ මිලදීගැනීමේ ක්‍රියාවලිය වඩාත් සරල කරමින් යුනියන් ඇෂුවරන්ස් සමාගම මේ වනවිට ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයේ ඩිජිටල්කරණයේ පෙරමුණ ගෙන සිටිනවා. ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වලට විසඳුම් ලබාදීමට අමතරව, ක්‍රියාවලි තුළ මෙතෙක් පැවති දුෂ්කරතා අවම කිරීමටත්, ලිපිලේඛන හා සාම්ප්‍රදායික ක්‍රමවේදයන් භාවිතය මුළුමනින්ම නැවැත්වීමටත් මෙහිදී අපගේ අවධානය යොමුවී තිබෙනවා." යුනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන අලෙවි නිලධාරිනී ලුසීල් ඩයස් මහත්මිය පැවසුවා ය.



Expack දෙවැනි වරටත් ආසියාවේ විශිෂ්ටතම සේවා ස්ථානයක් ලෙස නම් කෙරේ

Great Place to Work ආයතනය විසින් 2020 වර්ෂයේදී සේවය කිරීම සඳහා හොඳම සේවා ස්ථානයක් ලෙස Expack Corrugated cartoons Ltd ඇගැයීමට ලක්කර තිබේ. කුඩා හා මධ්‍ය පරිමාණ සේවා ස්ථාන අංශයන් Expack සමාගම මෙම ජයග්‍රහණය හිමිකර ගත්තේ දෙවැනි වරටයි. සිය කාර්යය මණ්ඩලයේ උනන්දුව හා කැපවීම අගය කරමින් ඔවුන් සවිබලගැන්වීමට හා නිසි පිළිගැනීමක් ලබා දෙන ආයතනික පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ගනු ලබන උත්සාහයන් අගයමින් Great Place to Work විසින්. මෙම නිර්දේශය ලබාදී ඇත.

මෙරට ප්‍රමුඛතම තිරසාර විඛාදන ඇසුරුම් විසඳුම් සපයන්නා

(premier sustainable corrugated packaging solutions provider) වශයෙන් ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සේවා ස්ථානයක් ලෙස Expack Corrugated Cartons සමාගම ඇගැයීමට ලක් වන්නේ, පිළිවෙළින් තුන් වැනි වර්ෂය සඳහා වීම වඩාත් විශේෂ කරුණකි. 2020 මින් පෙර අප මුහුණ දී නොමැති අර්බුදකාරීත්වයන් හා අභියෝගයන්ගෙන් පිරුණු වර්ෂයක් විය. එම අභියෝග සඳහා සාර්ථකව මුහුණ දෙමින් Expack සේවක පිරිස ශක්තිමත්ව සහ කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරමින් සමාගම සාර්ථකත්වය වෙත රැගෙන ගිය ගමනෙහි හිමිකරුවන් බවට නිතැතින්ම පත්ව සිටිති.

ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය නියෝජනය කරමින් විශිෂ්ටතම සේවා ස්ථානයක් බවට ඇගැයීමට ලක්වූ එකම සමාගම Expack Corrugated Cartoons ය. "පිළිවෙළින් වර්ෂ කිහිපයක් පුරාවට ශ්‍රී ලංකාව සහ ආසියානු කලාපය තුළ විශිෂ්ට සේවා ස්ථානයක් වශයෙන් ඇගයුම් ලැබීම මගින් පෙනී යන්නේ පුළුල් පරාසයක හැකියාවෙන් පරිපූර්ණ අපගේ ආදරණීය සේවක පිරිසෙහි මහත්සිය හා කැපවීමට ලැබුණු ඇගැයීමයි." යනුවෙන් අදහස් දක්වන්නේ Expack Corrugated Cartons සමාගමෙහි විධායක අධ්‍යක්ෂ - සුල්ෆිකාර් ගවුස් මහතාය.

"ඔවුන් සමාගම වෙත දක්වන බැඳීම සහ සේවයට දක්වන උනන්දුව සමාගමක් ලෙස අපව මෙතැනට රැගෙන විත් ඇති බව අපි නිතරම සිහිපත් කරනවා. ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කරගනිමින් ඉදිරියට යන්නට සුදුසු ආයතනික පරිසරයක් නිර්මාණය කරන්නට අපි සෑම විටම කැපවීමෙන් කටයුතු කරනවා. පුද්ගලික ජීවිතය හා වෘත්තීය ජීවිතය සමබරව පවත්වාගෙන යෑමට අවශ්‍ය පසුබිම අපි නිර්මාණය කර තිබෙනවා. විවෘත රාජකාරී පසුබිමක් තුළ අප සමග අවශ්‍ය ඕනෑම දෙයක් සාකච්ඡා කිරීමට අවස්ථාව තිබෙනවා." යනුවෙන් සුල්ෆිකාර් ගවුස් මහතා සිය අදහස් තවදුරටත් දක්වා සිටී. Expack සමාගම සෑම විටම විවිධත්වය අගය කරන අතර, එහි සේවය කරන 300කට අධික සේවක පිරිස විවිධ ආගම්, ජාතීන් හා වයස් මට්ටම නියෝජනය කරති. ඔවුන් සියලු දෙනා සාමූහික හැඟීමෙන් සමාගමේ ඉලක්ක සාර්ථක කරගැනීම සඳහා කැපවී සිටිති.

සුල්ෆිකාර් ගවුස් මහතා මෙසේද පවසා සිටියේය.

"පාරදෘශ්‍යභාවය, සංවේදනය (empathy), විවෘත සන්නිවේදනය, සවිබලගැන්වීම හා නිරන්තර අනුබලදීම Expack සමාගම පවත්වාගෙන යන සංස්කෘතියෙහි ප්‍රධාන අංගයන් වෙනවා. ශ්‍රී ලංකාවේ අංක එකේ තිරසාර විඛාදන ඇසුරුම් විසඳුම් සපයන්නා premier sustainable corrugated packaging solutions provider බවම පත්වීමට එම සාධක මූලික වශයෙන්ම බලපෑම් කර ඇති බව පැහැදිලිසි. එවැනි වෘත්තීය පසුබිමක් තුළ සියලුදෙනා ඇගයීමට හා සවිබල ගැන්වීමට ලක්වන අතර, විශිෂ්ට සේවා ස්ථානයක් බවට පත්වීම වඩාත් පහසු කරවනවා.

Expack යනු WRAP සහතිකකරණයට හිමිකම් කියූ මෙරට ප්‍රථම corrugated carton නිෂ්පාදන සමාගමයි. ISO 9001-2015 සහ ISO 14001-2015 යන සහතිකයන්ට හිමිකම් කීමටද ExpacK සමාගම සමත්වී සිටී. ව්‍යාපාර මෙහෙයුම්වල සෑම තැනකදීම තිරසාරභාවය වෙනුවෙන් මූලික තැනක් ලබා දෙන Expack සමාගම සෑම විටම පරිසර හිතකාමී පියවරයන් අනුගමනය කරයි. මනා සංවිධාන හැකියාවකින් යුක්තව සැලසුම් සහගත ආකාරයට ආයතනික සමාජ සත්කාර ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ඒවායේ ප්‍රතිලාභ ප්‍රජාවට හිමිකර දෙයි. විවිධ කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අයත් ව්‍යාපාරික ආයතනයන්ගෙන් Expack සමාගමේ පාරිභෝගික පදනම සවිබලගැන්වී තිබේ.

බිස්නස් නිවුස්

බේකරි ව්‍යවසායිකාවන් 14,000කට "ඇස්ට්‍රා වනිතා දිරිය" අත්වැල

ශ්‍රී ලාංකේය මව්වරුන්ගේ නොමද විශ්වාසය දිනාගත් ඇස්ට්‍රා, මෙරට කාන්තාවන්ට උසස් ජීවන තත්වයක් උරුම කර දීම වෙනුවෙන් පසුගියදා සමෘද්ධි වැඩසටහන සමග එක්ව 'ඇස්ට්‍රා දිරිය වනිතා වැඩසටහන' හඳුන්වා දෙන ලදී.ඒ, නිවසේ සිට තමන්ගේම කේක් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට එම මව්වරුන්ට දිරිය ශක්තිය ලබා දීම වෙනුවෙනි. ඒ යටතේ මව්වරුන්ට කේක් ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පුහුණුව, දැනුම සහ උපකරණ ලබාදීම වෙනුවෙන් සමෘද්ධි වැඩසටහන සමග එක්ව හැකියාව, අධිෂ්ඨානය සහ කැපවීමෙන් යුත් දිරිය මව්වරුන් හඳුනාගැනීමට මේ වන විටත් ඇස්ට්‍රා කටයුතු කර ඇත. මෙහි ප්‍රමුඛ අරමුණ වන්නේ තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හැකියාව ඇති කාන්තාවන්ට අවශ්‍ය පරිපූර්ණ පුහුණුවක් හා ඊට අවශ්‍ය උපකරණ ලබා දීමයි.

මෙම වැඩසටහන හඳුන්වාදීමේ උත්සවය පාර්ලිමේන්තු මන්ත්‍රී, ජගත් කුමාර මහතා, සමෘද්ධි නිලධාරීන්ගේ සංගමයේ සහ කෘෂිකර්ම පර්යේෂණ නිලධාරීන්ගේ සංගමයේ මහ ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී පසුගියදා පැවැත්විණි. ඊට අමතරව අප්ෆීල්ඩ් ශ්‍රී ලංකාහි ව්‍යාපාර ප්‍රධානී සහ පාරිභෝගික සංවර්ධන අධ්‍යක්ෂ අනුරුද්ධ අලුවිහාරේ, ජ්‍යෙෂ්ඨ දේශීය මූල්‍ය අධ්‍යක්ෂ ක්‍රිශාන් ප්‍රනාන්දු, වයිට් ෆ්ලවර් ඇකඩමි හි නිර්මාතෘ හා හිමිකරු සූපවේදී දුශාන්ති මදනායක යන මහත්ම මහත්මීන්, විශේෂ ආරාධිතයින් ඇතුළුව මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ පාර්ශ්වකරුවන් රැසක්ද ඊට එක්ව සිටියහ.

මෙම නවතම වැඩපිළිවෙළ සම්බන්ධයෙන් අදහස් දැක්වූ අප්ෆීල්ඩ් ශ්‍රී ලංකාහි අලෙවි කළමනාකාර ශෙහානි ලියනගේ මහත්මිය,

"කොවිඩ් 19 හේතුවෙන් මව්වරුන්ට විවිධ අභියෝගයන්ට මුහුණ දෙන්න සිදු වුණා. ඉන් ප්‍රධාන අභියෝගයක් ලෙස ආර්ථික දුෂ්කරතාවය සඳහන් කළ හැකියි. මව්වරුන් සමග දශක ගණනාවක විශ්වාසනීය සබඳතාවක් ගොඩනගාගෙන සිටින ඇස්ට්‍රා සමඟ එක් වෙමින් මෙම වැඩසටහන හරහා ශ්‍රී ලාංකේය මව්වරුන්ට ඔවුන්ගේ ආර්ථික දුෂ්කරතාවන් ජය ගැනීමටත්, මෙවන් අසීරු මොහොතක ඔවුන්ගේ දරුවන්ට සහ පවුල්වලට සහාය වීමටත් අපි බලාපොරොත්තු වෙනවා. මෙය පෝෂණයෙන් හා අධ්‍යාපනයෙන් සපිරි අනාගත පරපුරක් බිහිකිරීම සඳහා වන අපගේ මූලික අරමුණ, අපගේ ව්‍යාපාරික අරමුණු සමග මනාව ගැලපෙන බව සඳහන් කළ හැකියි. සමෘද්ධි වැඩසටහන සමග එක් වීම තුළින් අපගේ සහයෝගය අවශ්‍ය කාන්තාවන් හඳුනා ගැනීමටත්, නිවසේ සිට සාර්ථක කේක් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හා එය සාර්ථකව ඉදිරියට පවත්වාගෙන යාම වෙනුවෙන් ඔවුන් දිරි ගැන්වීමටත් අවස්ථාව උදා වනවා" යනුවෙන් පැවසුවාය.

කේක් සැකසීම පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා දෙනු ලබන මෙම ඇස්ට්‍රා නිවසේ සිට කේක් නිර්මාණය කිරීමේ වැඩසටහන සඳහා සෑම ග්‍රාම සේවා කොට්ඨාසයකින්ම අවම වශයෙන් එක් කාන්තාවක් හෝ මවක් තෝරා ගනිමින් ඒ සඳහා ඔවුන් සවිබල ගැන්වීම ඇස්ට්‍රාහි අරමුණයි. ඒ හරහා ශ්‍රී ලාංකේය පවුල් 14,000 කගේ පමණ ජීවන තත්වය ඉහළ නැංවීමට ද අපේක්ෂිතය. දීප ව්‍යාප්තව මෙවන් වැඩසටහනක් ක්‍රියාවට නංවා ඇත්තේ පළමු වරට වන අතර, ඒ සඳහා ප්‍රතිලාභීන් හා පාර්ශවකරුවන් රැසක් එකව සිටීමද විශේෂත්වයකි.1966 වසරේ සිට මෙරට මව්වරුන්ගේ විශ්වාසය දිනා ගෙන සිටින ඇස්ට්‍රා තත්වයෙන් උසස් නිෂ්පාදනයන් තුළින් දශක ගණනාවක් තිස්සේ දරුවන්ගේ දැනුම හා පෝෂණය ඉහළ නැංවීමට සුවිසල් කාර්යභාරයක් ඉටු කරමින් සිටියි.

මෙහිදී අදහස් දැක්වූ පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර මහතා,

"දැනට පවත්නා කොවිඩ් 19 වසංගතය සමාජය තුළ දුෂ්කර අභියෝග රැසක් නිර්මාණය කිරීමට හේතු වී තිබෙනවා. විශේෂයෙන් දරුවන් සිටින පවුල්වල ආදායම් අහිමිවීම හේතුවෙන් ඔවුන් දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් සිටිනවා. එවන් තත්වයක් තුළ මව්වරුන්ට තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කරමින් සැලකිය යුතු ආදායමක් උපයා ගැනීමට අවස්ථාව සලසාදීම සඳහා ඇස්ට්‍රා ගනු ලබන උත්සාහය ඉතා විශිෂ්ටයි." යනුවෙන් පැවසීය.

ආහාර හා පෝෂණ ක්ෂේත්‍රයේ වසර 40 කට වැඩි සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ඇස්ට්‍රා දරුවන්ගේ වර්ධනය සඳහා අවශ්‍ය ක්ෂුද්‍ර පෝෂක කොටස්වලින් සපිරි ප්‍රමුඛ ආහාරමය සන්නාමයක් වේ. වැඩි විස්තර සඳහා www.astrasrilanka.com වෙබ් අඩවියට හෝ @AstraSriLanka ෆේස් බුක් පිටුවට පිවිසෙන්න.

කාගිල්ස් 'ගමෙන් - ගෙදරට ' මෙවර රාවතාවත්තේ

තම භාණ්ඩ අලෙවි කර ගැනීමට වෙළෙඳපොළක් නැති කුඩා ව්‍යවසායකයින් නංවාලීම උදෙසා කාගිල්ස් ෆුඩ් සිටි විසින් ක්‍රියාත්මක නවතම සංකල්පය, 'ගමින් ගෙදරට...', පසුගිය දා රාවතාවත්ත කාගිල්ස් ෆුඩ් සිටි පරිශ්‍රයේදී යළි ආරම්භ විය.

මේ ඔස්සේ, ගමේ නිපැයෙන නැවුම් දේ එනම්, වට්ටි පෙට්ටි... පන් නිපැයුම්... මැටිවෙන් කළ වළං පිඟන්... හට්ටි මුට්ටි ගුරුලේත්තු... විස්මිත වේවැල් නිර්මාණ... පොල් කටුවෙන් කළ නිමැවුම්... ගමේ කෑම සහ රස කැවිලි... ඖෂධීය පාන වර්ග... අතරමැදියන් නැති වෙළෙඳපොළක දී එම නිර්මාණකරුවන්ගෙන් සෘජුවම නගරයේ පාරිභෝගිකයන් හට, මිලදී ගැනීමට අවස්ථාව සැලසේ.

මෙයින්,නිර්මාණකරුවාට සෘජුවම වෙළෙඳපොළක් නිර්මාණය වන අතර, නිෂ්පාදකයාගෙන් නැවුම් දේ මිලදී ගැනීමට පාරිභෝගිකයාට ද සෘජු අවස්ථාව උදා වේ.

තෝරා ගත් ඉඩකඩ ඇති කාගිල්ස් ෆුඩ් සිටි කාර් පාර්ක් හි පැවැත්වෙන මෙම 'ගමෙන් ගෙදරට...' පුංචි පොළේ එකම අරමුණ වී ඇත්තේ, දේශීය ගොවීන් සහ වෙළෙඳපොළක් සොයා ගැනීමට අසීරු කුඩා ව්‍යවසායකයින් හට නොමිලයේ දින දෙකක් පුරා සිය නිෂ්පාදන අලෙවි කර ගැනීමට අවස්ථාව උදා කර දීමයි. එසේම, වස විස හෝ කෘත්‍රිම දෙයින් ඇත් වූ ස්වභාවික දේ ඇසුරින් පමණක් නිපද වූ නිමැවුම් දෑ නගරයට අලෙවි කිරීමයි.

කාගිල්ස් සුපර්මාර්කට් නිර්මාතෘ සහ උප සභාපති, රංජිත් පේජ් මහතා ගේ සිතෙහි උපන් මේ සංකල්පය, පැළවත්ත ප්‍රදර්ශනාගාරයෙන් ආරම්භ වී, මේ වන විට කදාත, යළි පැළ වත්ත සහ මාලබේ ශාඛාවල පවත්වා, අනතුරුව පස් වැනි අවස්ථාව ලෙස රාවතාවත්ත ප්‍රදර්ශනාගාරයේ දී සංවිධානය කෙරිණි.

මෙම සංකල්පය ඔස්සේ ක්‍රියාත්මක උසස් අරමුණු පිළිබඳ, කාගිල්ස් ෆුඩ් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ අශෝක පීරිස් මහතා පැවසූයේ, මෙවැනි අදහසකි..

" මේ ව්‍යවසායකයින් හට කොළඹ නගරයේ තැනෙක, ලයිට් වතුර පහසුකම් සහිතව නොමිලේ දින දෙකක්,කිසිදු බාධාවකින් තොරව සිය වෙළෙඳම් කටයුතු කරගෙන යන්නට අප පහසුකම් සලසා තිබෙනවා. ඔවුන් උපයන ආදායමෙන් හෝ ලබන ලාභයෙන් එකදු සතයක් හෝ කාගිල්ස් වෙත ගෙවිය යුතු වන්නේ නැහැ. මෙය සම්පූර්ණයෙන්ම අප ඔවුන්ට ලබා දී තිබෙන අවස්ථාවක් පමණයි. ඒ වගේම, ඔවුන්ගේ මේ වෙළෙඳමේ දී ඔවුන්ගේ බඩු භාණ්ඩවල ඇසුරුම්... ඔවුන් අලෙවිය සිදු කරන ආකාරය...සහ අඩුපාඩු අප නිරීක්ෂණය කරනවා. ඒවා යහපත් වෙළෙඳපොළකට උචිත වන ආකාරයට හදා ගන්නටත් අප ඔවුන්ට උදව් කරනවා. අවශ්‍ය නම් මේ පියවරෙන් පසු, ඔවුන්ගේ නිෂ්පාදන වල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගන්නටත්, කුඩා යන්ත්‍රෝපකරණ සංවර්ධනය කර ගැනීම සඳහාත් අපේ සහාය ඔවුන්ට ලබා දෙනවා.මොකද, මේ පළමු පියවරෙන් පසු ඔවුන්, ජාත්‍යන්තර වෙළෙඳමට යා හැකි තරමට සිය නිෂ්පාදන සහ ආකල්පවලිනුත්, ගුණාත්මක භාවයෙනුත් සංවර්ධනය විය යුතුයි. ඇත්තටම, අප මෙය සලකන්නේ දවස් දෙකක වෙළෙඳමක් ලෙස නෙවෙයි. ඔවුන්ගේ වෙළෙඳ ලෝකය ජය ගන්නට අපට දිය හැකි එක් පියවරක් ලෙසයි .මෙතැනින් එහාට ඔවුන්ට විශාල ලෝකයක් නිර්මාණය විය යුතුයි. ඒ සඳහා, අවශ්‍ය සෑම කෙනකුටම කාගිල්ස් බැංකුව වෙතින් ණය පහසුකම් ලබා දීමටත් අප පියවර ගෙන තිබෙනවා..."

කළමනාකාර අධ්‍යක්ෂ අශෝක පීරිස්

ගල්ලැහැ පන්වලින් වට්ටි, පෙට්ටි, ඉදිආප්ප තට්ටු... ඇතුළු නිර්මාණ රැසක් නිපදවන, ස්වර්ණා සාගරී කමලසිරි මහත්මිය, තමන් ලද අවස්ථාව පිළිබඳ අදහස් දැක්වූයේ මෙලෙසින්.

" මම මතුගම, දෙඩන්ගොඩ. පාර අයිනේ කුඩයක් ඉහලාගෙන තමයි මං මගේ නිෂ්පාදන අලෙවි කරන්නේ. නමුත් මං ජාතික ශිල්ප සභාවේ ශිල්පිනියක්. ශිල්ප සභාව හරහා තමයි, කාගිල්ස් සමාගම මාව සම්බන්ධ කර ගත්තේ.අපි වගේ වෙළෙඳපොළක් නැති කුඩා ව්‍යවසායකයින්ට නොමිලේ ලබා දුන් මේ අවස්ථාව, කියා තිම කරන්න බැරි තරම් හයියක්. මින් පෙර කඳතේ පැවති අලෙවිසලටත් මට කාගිල්ස් සමාගමෙන් අවස්ථාව ලබා දුන්නා. ඇත්තටම දෙවැනි දවසේ මගේ භාණ්ඩ සියල්ල විකිණී අවසන් වුණා.කඩ කුලී ගෙවිවා නම් අපිට ලාභයක් ඉතිරි වන්නේ නැහැ. දවස් දෙකක්ම හිතේ හැටියට වෙළෙඳම කරගන්න ලබා දෙන මේ මහඟු අවස්ථාව නිසා, මට වගේම මට භාණ්ඩ නිර්මාණය කර දෙන අසල්වැසි කාන්තාවන්ටත් විශාල ආර්ථික හයියක් ලැබෙනවා..."

බියගම බණ්ඩාරවත්ත සිට මැටි ආශ්‍රිත නිර්මාණ රැසක් රැගෙන ආ වසන්ත රුවන් කුමාර, සිය අදහස් දැක්වූයේ මෙලෙසින්.

" මේ ගුරුලේත්තු, කෝප්ප, කැට, වතුර ෆිල්ටර්...ආදී මැටියෙන් කළ සෑම නිර්මාණයක් කරන්නේ අපිමයි. මැටි වළං, වෙනත් ශිල්පීන්ගෙන් මිලදී ගන්නවා. ගෙවල්වල සුළුවෙන් නිෂ්පාදනය කරන අප වැනි ශිල්පීන්ට, කාගිල්ස් සමාගමෙන් උදා කර දුන් මේ අවස්ථාව පිළිබඳ විශාල සතුටක් තිබෙනවා. මින් පෙර මා සහභාගී වූ කඳතේ අලෙවිසලේත් අපිට ඉතා හොඳ භාණ්ඩ අලෙවියක් තිබුණා. කැඩෙන්නේ බිඳෙන්නේ නැතිව, වළං ටික එක තැනක තියාගෙන මෙහෙම විකුණා ගන්න ලැබෙන එක ම අපි වගේ කුඩා වෙළෙඳුන්ට ලොකු හයියක්. මේ දවස් දෙකේ භාණ්ඩ හොඳින් අලෙවි වූ නිසා, අපිට තවත් භාණ්ඩ නිෂ්පාදනය කරන්න පුළුවන්. මෙවැනි අවස්ථා තව තවත් ඉදිරියට ලබාදෙනවා නම්, අප වැනි කුඩා ව්‍යවසායකයින්ටත් හිස ඔසවන්න පුළුවන්..."

රට ඉඳි ,එළගිතෙල්, කුරුඳු, මී පැණි... වැනි ඖෂධීය ගුණයෙන් යුතු දේ මුසු කර නිපදවන ඖෂධීය ආහාර වර්ග, 'හෙළ රස නිෂ්පාදන' නමින් අලෙවි කරන නයනා ප්‍රියංගනී මහත්මිය පැවසුවේ ද, පළමු වතාවට ඇයට උදා වූ මේ අවස්ථාව ඉතාමත් ප්‍රයෝජනවත් එකක් වූ බවයි.

වෙනත් වෘත්තිකයකු වුවද, විනෝදාංශයක් ලෙස, සිමෙන්තිවලින් කළ හැඩතල සහ නිර්මාණ ඔස්සේ කුඩා අලෙවි සලක් පවත්වන්නට අවස්ථාව ලද පසත් ඕෂධී නානායක්කාර ද, නිර්මාණකරුවකු ලෙස තමන්ට කල එළි දකින්නට නොමිලේ ලද මේ දින දෙකක මහඟු අවස්ථාව පිළිබඳ, කාගිල්ස් සමාගමට ස්තුති වන්ත වූයේ ය.

ඉනෝකා පෙරේරා බණ්ඩාර
ඡායාරූප - සාලිය රූපසිංහ

සිළුමිණ The Silumina

Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk

011 242 9351 - 071 782 9018

ලංසු ආරාධනය (IFB)

ආරක්ෂක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා පාවිච්චි කරන ලද BELL 206 JET RANGER B3 පුහුණුකිරීමේ හෙලිකොප්ටර් යානා 04 ක් මිලදී ගැනීම

ටෙන්ඩර් හඳුනාගැනීමේ අංකය : AHQ/20/FS/BEL/1064

(පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම පිළිබඳ දැනුම්දීම)

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා පාවිච්චි කරන ලද BELL 206 JET RANGER B3 පුහුණුකිරීමේ හෙලිකොප්ටර් යානා 04 ක් මිල දී ගැනීම සම්බන්ධව **2020 දෙසැම්බර් 13** වනදා **සිළුමිණ, වාරමංජරී සහ සන්ඩේ ඔබ්සර්වර්** යන පුවත්පත්වල පළවූ ප්‍රසම්පාදන දැන්වීම හා බැඳේ. මේ සම්බන්ධ පූර්ව ලංසු රැස්වීම **2021 පෙබරවාරි 24** දින පැවැත්වීමට කටයුතු යොදා ඇත. ලංසු ලේඛන ලබාගත් ලංසුකරුවන් සහ මෙම ප්‍රසම්පාදනයට සහභාගි වීමට කැමැත්ත දක්වන්නන්ට පූර්ව ලංසු කැඳවීමේ රැස්වීමට සහභාගි විය හැකි ය. වැඩි දුර තොරතුරු පහත පරිදි වේ.

විස්තරය	පූර්ව ලංසු රැස්වීමේ දිනය හා වේලාව	පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම පැවැත්වෙන ස්ථානය
පාවිච්චි කරන ලද BELL 206 JET RANGER B3 පුහුණුකිරීමේ හෙලිකොප්ටර් යානා 04 ක් මිල දී ගැනීම.	2021 පෙබරවාරි 24, පැය 1030	ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය අංක.140, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02

2. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩි දුර තොරතුරු සම්බන්ධව පහත නිලධාරියා විමසිය හැකි ය.

ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී
ප්‍රසම්පාදන අංශය
අංක 140, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
කොළඹ.

දුරකථනය : +94 112325468 ෆැක්ස් : +94 112347694/ 112441554, ඊමේල් : cpd@slaf.gov.lk, acpot@slaf.gov.lk

ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලාස්ථානය
තැ.පෙ. 1592
කොළඹ 02

ගුවන් හමුදාපති

වේලන ලද කජු (ලෙලි සහිත) අලෙවිය සඳහා ලංසු කැඳවීමයි

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

01. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් පහත දක්වා ඇති පරිදි කජු අස්වනු විකිණීම සඳහා සුදුසුකම්ලත් ගැණුම්කරුවන් වෙතින් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

අනු අංකය	ස්ථානය	ඉදිරිපත් කළ යුතු බැංකු ඇපකරය (දින 60 වලංගු විය යුතුය)	විකිණීම සඳහා සූදානම් කර ඇති කජු තොගය (කිලෝ ග්‍රෑම්)	තොරතුරු ලබාගත හැකි දුරකථන අංක
I	කොණ්ඩච්චිය කජු වගා ව්‍යාපෘතිය	400,000.00	100,000	077-2347909
II	විශ්වමඩු බලකාය	20,000.00	1,820	074-0165067
III	කැබිතිගොල්ලෑව බලකාය	10,000.00	947	074-0165075
IV	පොලොන්නරුව බලකාය	5,000.00	395	074-0165057

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමයට අනුව සිදු කරනු ලැබේ.

03. ඉහත ස්ථානයන් ඉදිරියෙන් දක්වා ඇති දුරකථන අංක මගින් වැඩි විස්තර ලබාගත හැකි අතර, කජු තොගයන් පෙ.ව. 0900 - 1600 පැය දක්වා (ඉරිදු දින හැර) පරීක්ෂා කර බැලිය හැක.

04. ඔබගේ මිල ගණන් 2021.03.09 දින පෙ.ව.1030 පැයට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ජය මාවත, කටුබැද්ද, මොරටුව යන ලිපිනයට මුදු, තබන ලද කවරයක බහා වම් පස ඉහළ කෙළවරේ "කජු අස්වනු මිලදී ගැනීම" සඳහා මිල ගණන් යනුවෙන් සඳහන් කර දින 60 ක් වලංගු බැංකු ඇපකර හෝ ඉහත දක්වා ඇති පරිදි මුදලින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මුදල්) වෙත හෝ ලංකා බැංකුවේ ගිණුම් අංක 7042755 දරන ගිණුම වෙත තැන්පත් කිරීමෙන් පසු එම රසිදුපත සමග ලියාපදිංචි තැපැල් මගින් හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම සිදුකළ හැක.

05. දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වන ලංසුවට නොපැමිණියහොත් විකිණීම තීරණය කිරීමේ පූර්ණ අයිතිය දෙපාර්තමේන්තුව සතුවේ.

06. සැම ගැණුම්කරුවකුම ඉහත සම්පූර්ණ තොග ප්‍රමාණයන් සඳහා පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර, අඩු ප්‍රමාණයක් සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලංසුපත් අවලංගු කරන බවද දැක්වේ.

07. ටෙන්ඩරය ලබාගැනීමෙන් පසු කජු (ලෙලි සහිත) ප්‍රමාණයන් රැගෙන යාමට පෙර සම්පූර්ණ මුදල ගෙවිය යුතුවේ.

08. ඉදිරිපත් කර ඇති ඉහළම අගයට විෂයන් ලබාදීමට දෙපාර්තමේන්තුව තීරණය කර ඇති අවස්ථාවකදී ගැණුම්කරු විසින් මිලදී ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ඉහත බැංකු ඇපකර රාජ්‍ය ආදායමට බැර කර ගැනීමටද කටයුතු කරන බව වැඩිදුරටත් දන්වේ.

09. ටෙන්ඩරය ලබාගන්නා ලංසුකරු විසින් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සමග තිල ගිවිසුමකට එළඹිය යුතුය. ඒ සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කරනු ලබන ටෙන්ඩරයේ මුළු වටිනාකමින් 10% ක කාර්ය සාධන ඇපකරයක්ද දින 07 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වේ.

විමසීම්
මාණ්ඩලික නිලධාරී ව්‍යාපෘති,
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,
ජය මාවත, කටුබැද්ද, මොරටුව.

මාණ්ඩලික නිලධාරී ව්‍යාපෘති : 0740165017
අධ්‍යක්ෂ ප්‍රසම්පාදන : 074-0165003/ 011-2044854

අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

ලංසු සඳහා ආරාධනයයි - IFB

ජාතික තරගකාරී ලංසුකරණය - NCB

රසායනාගාර මෙවලම් ප්‍රසම්පාදනය

අවසාන දිනය : 2021/03/16

1. ශ්‍රී ලංකාව, රත්මලාන, කඳවලවත්ත, සර් ජෝන් කොතලාවල මාවත, අංක 11, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් රසායනාගාර මෙවලම් සැපයීම, ස්ථාපනය සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සමග අදාළ පුහුණුව ලබාදීම සඳහා **2021.03.16 වෙනි දින පෙ.ව. 10.00 දක්වා** මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

2 .

ලංසු යොමුව	අයිතමයේ නම	ආපසු ගෙවනු නොලබන ගාස්තුව
SPMC/FD/05/2021	01 No. of Brand New Fully Automated High - Performance Liquid Chromatography (HPLC) System and Related Training	රු. 3,500.00
SPMC/FD/04/2021	01 No. of Brand New Fully Automated Pharmacopeial Dissolution Testing Apparatus with Auto Sampler and Fraction Collector and Related Training	රු. 3,500.00
SPMC/FD/03/2021	01 No. of Brand New Ultra - Pure water Purification System and Related Training	රු. 1,000.00

3. මුල් පිටපත හා අනු පිටපත ලෙස වෙන් වෙන් වශයෙන් ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයේ සකස් කරන ලද එක් එක් යත්ත්‍රය සඳහා වෙන් වෙන් වශයෙන් වූ මුදු, තබන ලද ලංසු, **"සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව, අංක 11, සර් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ ඉහත ලිපිනයේ බිම් මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය.

4. ලංසු ලිපිලේඛන ඉහත ලිපිනය වෙතින් 2021.02.22 **වෙනි දින සිට** 2021.03.15 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි **පෙ.ව. 9.00 හා ප.ව. 4.00 අතර,** පහත සඳහන් ලේඛන ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැකිය.

   - ශ්‍රී ලංකාව, රත්මලාන, කඳවලවත්ත, සර් ජෝන් කොතලාවල මාවත, අංක 11, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සැලසුම් හා ප්‍රසම්පාදන වෙත ලිඛිත අයදුම්පතක්.
   - ඉහත සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මුදලින් ගෙවීමෙන් අනතුරුව.

5. 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන මගින් ලංසු පාලනය වන බැවින් ලංසුකරු වෙනුවෙන් ඒජන්ත, උප ඒජන්ත, නියෝජිත, නම් කළ අයෙකු ලංසුකරු විසින් රඳවා ගන්නේ නම් ඔහු/ ඇය පොදු කොන්ත්‍රාත් පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි වී ලංසුකරණය පිළිබඳ ඕනෑම ගනුදෙනුවකදී හෝ ලංසුකරණ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක එවැනි වලංගු ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

6. ලංසු භාරගැනීම අවසන් වූ වහාම රත්මලාන රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේදී ලංසු විවෘත කිරීමට නියමිතයි. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

7. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

8. වැඩිදුර තොරතුරු රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩ බලන) - විධිමත් කිරීම සමග පර්යේෂණ හා සංවර්ධන වෙතින් ලබාගත හැකිය. (දුරකථනය : 5512950)

"ලංසු තොරතුරු" පිළිබඳ විස්තර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ (**www.spmclanka.lk**) වෙබ් අඩවියේ බලාගත හැකිය.

සභාපති - ප්‍රසම්පාදන කමිටුව
රාජ්‍ය ඖෂද නිෂ්පාදන සංස්ථාව
අංක 11, සර් ජෝන් කොතලාවල මාවත,
කඳවලවත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව.

දුරකථනය : (00)94-11-2635353
(00)94-11-2637574/ (00)94-11-2623298
ඊමේල් : spmclanka@sltnet.lk
වෙබ් අඩවිය : www.spmclanka.lk

අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ඉල්ලීමයි (උපදේශක සේවා ආයතන තෝරාගැනීම)

රට : ශ්‍රී ලංකාව

ව්‍යාපෘති නාමය : කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

ණය අරමුදල් අංක : L0081A

පැවරුමේ ශීර්ෂය : යළි පදිංචි කිරීමට නියමිත සහ / හෝ දැනටමත් යළි පදිංචි කොට ඇති පවුල්වල ප්‍රජා බලමුළු ගැන්වීම, ධාරිතා වැඩිදියුණු කිරීම හා ජීවනෝපාය ප්‍රතිස්ථාපනය හා සංවර්ධනය

යොමු අංකය : SCURP/2019/C3-S/003(i)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) වෙතින්, මුදල් යෙදවීමක් ලැබී ඇති අතර, ඉන් කොටසක්, යළි පදිංචි කිරීමට නියමිත සහ / හෝ දැනටමත් යළි පදිංචි කොට ඇති පවුල්වල ප්‍රජා බලමුළු ගැන්වීම, ධාරිතා වැඩිදියුණු කිරීම හා ජීවනෝපාය ප්‍රතිස්ථාපනය හා සංවර්ධනය මත කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහායවීම සඳහා වන උපදේශක සේවා ලබාගැනීම සඳහා යෙදවීමට අපේක්ෂිතය.

මෙම උපදේශක සේවය, පවත්නා ජීවනෝපායන් ඔවුන්ගේ ආර්ථික හා සමාජ සාධ්‍ය තත්ත්වයන් තිවැරදිව තහවුරු කරගැනීම විශ්ලේෂණය කිරීම සඳහා යෝග්‍ය සහභාගිත්ව ප්‍රජා පාදක ප්‍රවේශයක් භාවිත කරමින් ව්‍යාපෘති නිසා බලපෑම්වලට ලක්වූ ජනතාවගේ (PAP's) සමාජ ආර්ථික තත්ත්වය ඉහළට ඔසවා තැබීම සඳහා උපකාරී වෙනු ඇත. මෙය, ස්ත්‍රී පුරුෂභාව ප්‍රතිචාරගත ගෘහස්ථ ප්‍රවේශයක් මත එම සංවිධානයට අදාළව පදනම් වනු ඇති අතර, ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර සියලුම වයස් සීමා හා ස්ත්‍රී පුරුෂභාවයන්ට අදාළ අනෙකුත් සියලු අංශ සම්බන්ධයෙන්ද සැලකිලිමත් විය යුතුය.

අදාළ පැවරුම් කාලය වසර 3 ක් වේ.

සුදුසුකම්ලත් උපදේශක ආයතන වෙත අදාළ සේවා ලබාදීමට ඇති කැමැත්ත ප්‍රකාශ කරන ලෙසට ආරාධනා කෙරේ.

උපදේශකයන් විසින්, මෙම සේවය ලබාදීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා අදාළ පළපුරුද්ද තමන් සතු බවට ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත කිරීමේ නිර්ණායකයන් මෙසේය.

1) පසුගිය වසර තුන තුළ (2017 සිට 2019 දක්වා) පවත්වාගත් ශුද්ධ ලාභ තීරයේ සාමාන්‍ය ධනාත්මක විය යුතුය.
2) පසුගිය වසර 10 තුළ සමාන පැවරුම් අවම වශයෙන් 3 ක් ඉටුකොට තිබිය යුතුය. (ඒවාට, ප්‍රජා එක්රැස් කිරීම, ධාරිතා සංවර්ධනය හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් වර්ගයන් ඇතුළත් විය යුතු අතර, එයින් අවම වශයෙන් දෙකක් සඳහා IFI අරමුදල් යෙදවූ ව්‍යාපෘති කොටස් ඇතුළත් විය යුතුය.
3) නිවාස ව්‍යාපෘති වෙත යළි ස්ථානගත කළ ප්‍රජාවන් සමග කටයුතු කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය. (පසුගිය වසර 5 තුළ 2015 සිට 2019 දක්වා - ව්‍යාපෘති 3 ක පළපුරුද්ද)
4) භූගෝලීය පළපුරුද්ද (ඕනෑම දකුණු ආසියානු රටක අවම වශයෙන් සමාන පැවරුම් 3 ක කාර්ය පළපුරුද්ද.)
5) ආයතනයේ තාක්ෂණික හා කළමනාකරණ ප්‍රවීණතාවය.

ප්‍රධාන විශේෂඥයන්, කෙටි ලැයිස්තුගත කිරීමේ අදියරේදී අගැයුමට ලක් නොකෙරේ.

ලැදියාවන් අතර පිළිගැටුම හා සුදුසුකම් සම්බන්ධව AIIB ප්‍රතිපත්තියෙහි සඳහන්ව ඇති II කොටස, 4.4 ඡේදය හා 4.9 ඡේදය වෙත උනන්දුවක් දක්වන උපදේශකයන්ගේ අවධානය යොමු කෙරේ.

උපදේශකයන්හට, තමන්ගේ සුදුසුකම් වැඩිවර්ධනය කර ගැනීම සඳහා අනෙකුත් සංවිධාන සමග එක්ව කටයුතු කළ හැකි වුවද, එසේ එක්ව කටයුතු කිරීම බද්ධ ව්‍යාපාරයක්ද සහ / හෝ උප - උපදේශක ආයතනයක්ද යන්න සඳහන් කළ යුතුය. එය බද්ධ ව්‍යාපාරයක් වෙතොත් එහි සියලුම පාර්ශවකරුවන්, මේ සඳහා තෝරාගතහොත්, සම්පූර්ණ කොන්ත්‍රාත්තුව සඳහා එක්ව හා වෙන් වශයෙන් වගකීම දැරිය යුතුවේ.

අදාළ අයදුම්පත්‍රය හා TOR කෙටුම්පත, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන www.smoud.gov.lk වෙතින්ද නාගරික සංවර්ධන අධිකාරියෙහි වෙබ් අඩවිය වන www.uda.gov.lk වෙතින්ද, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ වෙබ් අඩවිය වන www.aiib.org වෙතින්ද, සහ UNDB මාර්ගගත වෙබ් අඩවිය වන devbusiness@un.org වෙතින්ද බාගත කළ හැක.

උපදේශකයකු තෝරාගැනීම, "ග්‍රාහකයන් සඳහා ප්‍රසම්පාදන උපදෙස්" හි නියම කොට ඇති තත්ත්ව හා පිරිවැය පාදක කොටස (QSBS) ප්‍රකාරව සිදුකෙරේ.

අවශ්‍ය වැඩිදුර තොරතුරු, කාර්යාල වේලාවන් තුළදී, (පෙරවරු 8.30 හා පස්වරු 4.15 අතර) පහත සඳහන් ලිපිනයේදී ලබා ගත හැක.

පැතිර පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ අභිලාෂය ප්‍රකාශ කිරීම්, පහත සඳහන් ඊමේල් ලිපිනය වන pmuurpcc@gmail.com මගින්, 2021 මාර්තු 8 වන දින පස්වරු 2.00 ට පෙර (දේශීය වේලාවෙන්) ලැබෙනසේ එවිය යුතුය.

ලේකම්,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 වන මහල,
"සුහුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
දුරකථනය : 0112073883
ෆැක්ස් : 0112074498
ඊමේල් : pmuurpcc@gmail.com

සිළුමිණ The Silumina

Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk

011 242 9351 - 071 782 9018

කොළඹ විශ්වවිද්‍යාලය

ලංසු සඳහා ආරාධනයයි

කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සපයා, ගෙනැවිත් භාරදී, ස්ථාපිත කිරීම - AHEAD/NCB/RA1/FOT/2021/01

සහ

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 12 ක් සපයා ගෙනැවිත් භාරදී ස්ථාපිත කොට, පරීක්ෂා කොට ක්‍රියාත්මක කිරීම - AHEAD/NCB/ELTAELSE/FOA/2021/02

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතනය වෙතින් AHEAD ව්‍යාපෘතියෙහි පිරිවැය සඳහා ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක්, කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සපයා, ගෙනැවිත් භාරදී, ස්ථාපිත කිරීම සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපීඨය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 12 ක් සපයා, ගෙනැවිත් භාරදී ස්ථාපිත කොට, පරීක්ෂා කොට, ක්‍රියාත්මක කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.
2. ඒ අනුව, කොළඹ 03, කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ (සුළු) සභාපති විසින්, කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පීඨය සඳහා විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සපයා, ගෙනැවිත් භාරදී, ස්ථාපිත කිරීම සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 12 ක් සපයා, ගෙනැවිත් භාරදී ස්ථාපිත කිරීම සඳහා සුදුසුකම්ලත් සැපයුම්කරුවන් වෙතින් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ.
3. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.
4. ලංසුකරු සතුව, ශ්‍රී ලංකාවේ අවම වශයෙන් වසර පහක, අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් තිබිය යුතුය.
5. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, AHEAD ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන වෙතින් (ඇමතුම් අංක 011-2595953/ 011-2559638) ලබාගත හැකි අතර, විශ්වවිද්‍යාලයේ OTS කාර්යාලයේදී, පෙරවරු 9.00 හා පස්වරු 3.30 අතර, කාලය තුළ, 2021.02.22 දින සිට 2021.03.17 දින දක්වා නොමිලයේ, අදාළ ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැකි අතර, විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.cmb.ac.lk වෙතින් ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.
6. ආපසු නොගෙවන ගාස්තු රුපියල් 5,000/= ගෙවීමෙන් හා කොළඹ විශ්වවිද්‍යාලයේ AHEAD ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රසම්පාදන වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. අදාළ ආපසු නොගෙවන ගාස්තු, ඕනෑම මහජන බැංකුවේ ශාඛාවක මගින්, ගිණුම් අංක 505,70600013 තුළින් විශ්වවිද්‍යාලයීය ප්‍රධාන එකතු කිරීමේ ගිණුමට ගෙවිය හැක. ලංසු ලේඛන 2021.02.22 දින සිට 2021.03.17 දින පස්වරු 2.00 දක්වා මිලදී ගත හැක.
7. සම්පූර්ණ කළ ලංසු, පිටපත් දෙකක් වශයෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2021.03.18 දින පස්වරු 2.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ ලංසු බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **"කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සපයා, ගෙනැවිත් භාරදී ස්ථාපිත කිරීම - AHEAD/NCB/RA1/FOT/2021/01" හෝ "කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය සඳහා වායු සමීකරණ යන්ත්‍ර 12 ක් සපයා ගෙනැවිත් භාරදී ස්ථාපිත කොට, පරීක්ෂා කොට ක්‍රියාත්මක කිරීම - AHEAD/NCB/ELTAELSE/FOA/2021/02"** යනුවෙන් අදාළ වන පරිදි සඳහන් කළ යුතුය.
8. සියලුම ලංසු සමග පහත සඳහන් වගුවේ නියමිත පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ඕනෑම වාණිජ බැංකුවකින් නිකුත් කළ කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති නමටගත්, 2021.07.16 දින දක්වා වලංගු, කොන්දේසි විරහිත හා ඒක්ෂණ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතු අතර, රුපියල් 5,000/= ට අඩු ලංසු ඇපකර, විශ්වවිද්‍යාලයීය එකතු කිරීමේ ගිණුමට බැර වන පරිදි, ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින්, ගිණුම් අංක 505170700003 වෙත ගෙවිය හැක.

ලංසු අංකය	වර්ගීකරණය	අයිතමය	ලංසු ඇපකරය - රුපියල් -
01	01	Robot Arm	72,000.00
		Sliding Rail kit for robot arm	
		Conveyor Belt kit for robot arm	
		Robot vision kit for robot arm	
	02	Turtlebot 2 with configurable options	10,000.00
	03	Benchtop Ultrasonic Cleaner	4,000.00
	04	Single Phase Asynchronous Motor Drive (Vaviable Speed Drive)	2,000.00
		Single Phase Induction Motor	
	05	Source Meter	12,000.00
		යම් ලංසුකරුවකු වර්ගීකරණ කිහිපයක් සඳහා ලංසු ඉදිරිපත් කරනුයේ නම්, එම ලංසු සමග, එක් එක් වර්ගීකරණයේ මුළු එකතුවේ වටිනාකමට අදාළ ලංසු ඇපකරය තිබිය යුතුය. යම් ලංසුකරුවෙකු විසින් සියලුම වර්ගීකරණයන් සඳහා ලංසු ඉදිරිපත් කරනුයේ නම් මුළු එකතුවට සමාන ලංසු ඇපකරයක් තිබිය යුතුය. (රුපියල් 100,000.00)	100,000.00
02		BTU/ Hr 34000 - 36000 සිවිලිමෙහි රඳවන වායු සමීකරණ යන්ත්‍ර 12 ක්	60,000.00
		අදාළ ලේඛන පරීක්ෂා කොට බැලීම සඳහා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය වන http://www.cmb.ac.lk වෙත යොමු වන්න.	

9. ලංසු, කොළඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියේ" බහාලීමෙන් හෝ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ අදාළ අවසන් දිනයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (සුළු),
කොළඹ විශ්වවිද්‍යාලය,
94 කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03.

නිවසක් විකිණීමට
කඩවත ගනේමුල්ල පාරේ පර්. 25 නිවසක් විකිණීමට. කඩවත නගරයට මී. 500.
0770350392

පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව SPMC

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය (ICB)

ලංසු යොමුව : SPMC/01/2021 අවසාන දිනය 2021 අප්‍රේල් 06 දින

ඖෂධ අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය

ශ්‍රී ලංකාව, රත්මලාන, කඳවල වත්ත, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, නො. 11, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ඖෂධ අමුද්‍රව්‍ය සැපයීම සඳහා 2021 අප්‍රේල් 06 දින පෙ.ව. 10.00 තෙක් මුදු, තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

	අයිතමය	ප්‍රමාණය (කි.ග්‍රෑ)	ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව (ශ්‍රී ලංකා රු.)
1	Ascorbic Acid BP	12,000	4,000.00
2	Carbamazepine BP	3,000	7,500.00
3	Cetirizine Dihydrochloride BP	200	500.00
4	Clooidoerel Bisulohate USP	8,000	15,000.00
5	Diethvl Carbamazine Citrate	300	500.00
6	Dried Aluminium Hydroxide Gel	1,000	500.00
7	Diltiazem Hydrochloride USP	500	2,500.00
8	Flucloxacillin Sodium BP	9,000	14,000.00
9	Folic Acid BP	125	2,500.00
10	Frusemide BP	1,000	3,000.00
11	Gliclazide BP	7,500	30,000.00
12	Losartan Potassium BP	5,000	12,000.00
13	Prednisolone BP	500	8,000.00
14	Propranolol Hydrochloride BP	600	1,000.00
15	Pyridoxine Hydrochloride BP	50	500.00
16	Riboflavin BP	100	1,000.00
17	Salbutamol Sulphate BP	150	1,000.00
18	Spironolactone USP	150	2,000.00
19	Thiamine Hydrochloride BP	100	500.00
20	Tolbutamide BP	3,000	3,000.00
21	Verapamil Hydrochloride BP	200	1,000.00
22	Crospovidone BP	1,000	500.00
23	Hudroxypropyl Cellulose - LJP	500	2,000.00
24	Hydroxpropyl methylcellulose - Pthalate	1,000	2,000.00
25	Lactose Monohydrate BP/USP (200 Mesh)	20,000	2,000.00
26	Maize Starch BP / USNF	27,000	1,000.00
27	Microcrystalline Cellulose USNF/BP	5,000	500.00
28	Povidone K-30 (Polyvinyl Pyrrolidone K-30) USP / BP	500	500.00
29	Pre-gelatinized Maize Starch	4,000	500.00
30	Sodium Starch Glycolate BP/USNF	2,500	1,000.00
31	Stearic Acid (D-grade) BP	300	500.00
32	Tartaric Acid BP / USNF	150	500.00

2. සම්පූර්ණ ලංසුකරණ කට්ටලයක සකස් කළ මුදු, තැබූ ලංසු අනු පිටපතකින් යුතුව, 'මුල් පිටපත' හා 'අනුපිටපත' වශයෙන් වෙන් වෙන්ව ශ්‍රී ලංකාව, රත්මලාන, කඳවල වත්ත, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, නො. 11, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත යොමුකොට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් ශ්‍රී ලංකාව, රත්මලාන, කඳවල වත්ත, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ, බිම් මහලේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.
3. ලංසු ලිපිලේඛන, පහත සඳහන් දෑ ඉදිරිපත් කිරීමෙන් ඉහත ලිපිනයේදී 2021 පෙබරවාරි 22 දින සිට 2021 අප්‍රේල් 05 වැනිදා තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය.
   - ශ්‍රී ලංකාව, රත්මලාන, කඳවල වත්ත, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සැලසුම් හා ප්‍රසම්පාදන වෙත ලිඛිත අයදුම්පතක්
   - ඉහත සඳහන් කළ ආපසු නොගෙවන ලංසු ලිපිලේඛන ගාස්තුව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මුදලින් ගෙවීම.
4. ලංසු 1987 අංක 3 දරන "පොදු කොන්ත්‍රාත් පනතේ" විධිවිධාන මගින් පරිපාලනය කෙරේ. එම නිසා ලංසුකරු තමන් සඳහා හෝ වෙනුවෙන් ඒජන්තවරයකු, උප ඒජන්තවරයකු, නියෝජිතයකු නම් කළ අයකු යොදවා ගන්නේ නම්, එවන් යම් ප්‍රසිද්ධ කොන්ත්‍රාත්තුවක් සඳහා තමන් විසින්ම ප්‍රසිද්ධ කොන්ත්‍රාත් පනතේ 10 වන වගන්තියට අනුකූලව ලියාපදිංචි විය යුතු අතර, එම වලංගු ලියාපදිංචිය පිළිබඳ සහතිකය ලංසුවට හෝ පනතට අදාළ ඕනෑම කටයුත්තක් අතරතුරදී හෝ ලංසුකරණය පවත්නා අතරතුර ඕනෑම අදියරකදී ඉදිරිපත් කළ යුතුය.
5. ලංසු භාරගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම රත්මලාන රා.ඖ.නි.සංස්ථාවේදී ලංසු විවෘත කෙරෙන අතර, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගිවීමට අවසරය ඇත.
6. ලංසු ලිපිලේඛන රා.ඖ.නි. සංස්ථාවේදී ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.
7. වැඩිමනත් තොරතුරු රා.ඖ.නි. සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සැලසුම් හා ප්‍රසම්පාදන වෙතින් (දුරකථන 2623298) ලබාගත හැකිය.

ලංසුවේ විස්තර www.spmclanka.lk යන අපගේ වෙබ් අඩවියෙන්ද නිරීක්ෂණය කළ හැකිය.

විදේශීය නියෝජිතයින්ට අපගේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය. (විදේශීය නියෝජිතයින් මගින් නියෝජනය නොවන අය තම ලංසු සමග, ඉහත සඳහන් ලංසු ලිපි ලේඛන ගාස්තුව වශයෙන් ඒ සමාන වටිනාකමැති ඇ.ඩොලර් ප්‍රමාණයක බැංකු අණකරයක් එවිය යුතුය.)

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,
නො. 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත, කඳවල වත්ත,
රත්මලාන, ශ්‍රී ලංකාව.
දුරකථන : (00) 94-11-2635353 / (00) 94-11-2637574 / (00) 94-11-2623298
විද්‍යුත් තැපෑල : spmclanka@sltnet.lk
වෙබ් අඩවිය : www.spmclanka.lk
ෆැක්ස් : (00) 94-11-2634771 / 2626621

ජා ඇල - ඒකල ඉඩමක් විකිණීමට - ප්‍රමාණය අක්කර 22

- මිනුවන්ගොඩ - ජා ඇල මාර්ගයට ඉතා ආසන්නව ඒකල ඔරලෝසු කණුවේ සිට ඉඩමට ඇති දුර - 1.2km
- මිනුවන්ගොඩ - ජා ඇල මාර්ගයේ සිට 400m, මිනුවන්ගොඩ ජා ඇල මාර්ගයට සෘජු ප්‍රවේශයක් ලබා ගැනීමට හැකියාව ඇත.
- ජා ඇල අධිවේගී මාර්ග පිවිසුමට 5km
- සංවර්ධනය කළ හැකි ගොඩ ඉඩම, ව්‍යාපාරික කටයුතු, මිශ්‍රසංවර්ධන කටයුතු, කර්මාන්ත, ගබඩා සඳහා යෝග්‍ය වේ.

Route Map



Shape of the land



- ඉඩම නිරීක්ෂණය සඳහා පෙර වේලා වෙන්කර ගැනීමට අමතන්න. 077 2557035 (වසන්ත)
- වැඩි විස්තර 077 2568116 (ජූඩ්)
- ඉඩම පිළිබඳ සියළු විස්තර, සැලසුම්, පිටපත් ඔබගේ තොරතුරු සනාත කිරීමෙන් අනතුරුව රු.1000/- පිටපත් ගාස්තුවක් ගෙවා ලබා ගත හැක. ඉඩමෙහි පිහිටි විකුණුම් කාර්යාලයෙන්
- ඉඩම විකිණීමට බලාපොරොත්තු වන කාලය, මුලික විකුණුම් කොන්දේසි මෙම ගොනුවෙහි අන්තර්ගත වේ.

සංශෝධනයයි

ලංසු සඳහා ආරාධනය

අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානයේ ඒකක 01 සඳහා සිවිලිං සැපයීම, සම්බන්ධීකරණය සහ ස්ථාපනය අධීක්ෂණය කිරීම

කොන්ත්‍රාත් අංකය : DHQC/CEILING 1/2020

1. ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2021.01.31 වෙනි දින සිඑමිණ පුවත්පතේ පළකරන ලද ලංසු කැඳවීම සඳහා වන දැන්වීම සබැඳේ.
2. ඉහත සඳහන් ලංසු කැඳවීමේ දැන්වීමේ පහත සඳහන් සංශෝධන සිදු කෙරේ.
   - ලංසු විවෘත කරන/ ලංසු භාරගැනීමේ අවසාන වේලාව 2021 මාර්තු 03 වෙනි දින 1400 පැය දක්වා දීර්ඝ කෙරේ.
   - ලංසු, 2021 ජූනි 30 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
   - ලංසු ඇපකරය 2021 ජූලි 28 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
3. පසුගිය ලංසු කැඳවීමේ දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2021 මාර්තු 02 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි 0900 පැය හා 1500 පැය අතර, කොළඹ 03, බාලදක්ෂ මාවත, අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙතින් වැඩිදුර තොරතුරු ලබාගැනීමට ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට සහ මිලදී ගැනීමට හැකිය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.
දුරකථන : 0094-11-2439381/ 0094-11-2390719
ෆැක්ස් : 0094-11-2390720
ඊමේල් : procurement@defence.lk

සංශෝධනයයි

ලංසු සඳහා ආරාධනය

අකුරේගොඩ ආරක්ෂක මූලස්ථානයේ ඒකක 02 සඳහා සිවිලිං සැපයීම, සම්බන්ධීකරණය සහ ස්ථාපනය අධීක්ෂණය කිරීම

කොන්ත්‍රාත් අංකය : DHQC/CEILING2/2020

1. ඉහත සඳහන් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2021.01.31 වෙනි දින සිඑමිණ පුවත්පතේ පළකරන ලද ලංසු කැඳවීම සඳහා වන දැන්වීම සබැඳේ.
2. ඉහත සඳහන් ලංසු කැඳවීමේ දැන්වීමේ පහත සඳහන් සංශෝධන සිදු කෙරේ.
   - ලංසු විවෘත කරන/ ලංසු භාරගැනීමේ අවසාන වේලාව 2021 මාර්තු 03 වෙනි දින 1500 පැය දක්වා දීර්ඝ කෙරේ.
   - ලංසු, 2021 ජූනි 30 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
   - ලංසු ඇපකරය 2021 ජූලි 28 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
3. පසුගිය ලංසු කැඳවීමේ දැන්වීමේ සඳහන් අනෙකුත් සියලු නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් 2021 මාර්තු 02 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි 0900 පැය හා 1500 පැය අතර, කොළඹ 03, බාලදක්ෂ මාවත, අංක 15/5, ආරක්ෂක අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙතින් වැඩිදුර තොරතුරු ලබාගැනීමට ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට සහ මිලදී ගැනීමට හැකිය.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03.
දුරකථන : 0094-11-2439381/ 0094-11-2390719
ෆැක්ස් : 0094-11-2390720
ඊමේල් : procurement@defence.lk

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

සිළුමිණ The Silumina

Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk

011 242 9351 - 071 782 9018

ආරක්ෂක අමාත්‍යාංශය
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ලංසු ආරාධනයයි

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ යෝජිත ශ්‍රවණාගාරයේ වහල සහ කැටිවෝක් පද්ධතිය ඉදි කිරීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

කොන්ත්‍රාත් අංකය : KDU/PRO/RP&SERVICE/ 2701/2021

01. රත්මලාන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා, විශ්ව විද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ යෝජිත ශ්‍රවණාගාරයේ වහල සහ කැටිවෝක් පද්ධතිය ඉදි කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

02. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021/02/22** සිට **2021/04/05** තෙක් **පැය 0900** සහ **පැය 1500** අතර කාලයේදී **රු. 12,500.00** ක නැවත ගෙවනු නොලබන ගාස්තුවක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ මූල්‍යාධිකාරී වෙත මුදලින් ගෙවා අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිල දී ගත හැකි ය.

03. ඉහත ලිපිනයේදී **2021/02/22** සිට **2021/04/05** දක්වා වැඩ කරන දිනවල දී **පැය 0900** සිට **පැය 1500** අතර කාලයේදී ගාස්තුවක් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය (දුරකථනය : 071-0219449 / 071-0219384 ෆැක්ස් : 011-2632430)

04. මුද්‍රා තබන ලද ලංසු, භාරගැනීමේ අවසන් දිනයට හා වේලාවට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු ය. නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ.

05. **2021/04/06** දින **පෙ.ව. 10.00** ට රත්මලාන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී ටෙන්ඩර් භාරගැනීම අවසන් කර විවෘත කරනු ලැබේ.

06. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අධ්‍යක්ෂ කාර්ය සම්පාදන, රත්මලාන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙතින් වැඩි විස්තර ලබාගත හැකි ය. (දුරකථනය : 011-2632430 / 071-0219384 ෆැක්ස් : 011-2632430 සහ www.kdu.ac.lk/ocls/tender-notices හි පල කර ඇති "ලංසු ආරාධනය")

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
රත්මලාන,
ශ්‍රී ලංකාව.

ලංසු සඳහා ආරාධනයයි (IFB)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA)

කොළඹ වරායේ CIW STORES, PHI AND STRESS BED STAFFS **සඳහා වන යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම**

(කොන්ත්‍රාත් අංකය : SLPA/CD/CIW/01)

1. **ශ්‍රී ලංකා වරාය අධිකාරිය** වෙනුවෙන්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) හි, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) හි, සභාපති, විසින් "**කොළඹ** වරායේ CIW ගබඩාව, PHI සහ STRESS BED STAFFS **සඳහා යෝජිත ගොඩනැගිල්ල (ඉදිකිරීම) (කොන්ත්‍රාත් අංකය** : SLPA/CD/CIW/01)" අරභයා, යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින්, මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වන කාර්ය කර්මාන්තයට ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන තිමාවන් හා සේවාවන් සහිතව සිවි (04) මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, අත්තර්ගත වන අතර, සමස්ත **හා මුළු බිම් ක්ෂේත්‍රඵලය වර්ග මීටර් 2000 (දෙදහසක්) වනු ඇත.**
2. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය වන යෝග්‍යතා අතරට පහත සඳහන් කරුණු ද ඇතුළත්ය.
   - ලංසුකරු CIDA (**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (අධිකාරිය) හි - (කලින් ICTAD (ඉක්ටැඩ්) යනුවෙන් හඳුන්වනු ලැබූ) ගොඩනැගිලි ඉදිකිරීම් විශේෂඥතා ක්ෂේත්‍රයේ C2 ශ්‍රේණිය හි හෝ C3 ශ්‍රේණියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු** ලෙස වලංගු ලියාපදිංචිය සහිත අයෙකු විය යුතුය.
   - ලංසුකරු විසින් eroc.drc.gov.lk වෙබ් අඩවිය තුළින් මාර්ගගතව (Online) ක්‍රමය යටතේ ඉල්ලුම්කිරීමෙන් අනතුරුව, ලබාගත හැකි පොදු කොන්ත්‍රාත් පනත (PCA) අංක 03 ට අනුකූලව කොන්ත්‍රාත්තුව ලියාපදිංචි කරවාගෙන තිබිය යුතුය.
3. පූර්ව ලංසු හමුවක්, **කොළඹ 01, ලේඩීන් බැස්ටියන් පාරේ, අංක 45 හි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ (SLPA) හි, තාක්ෂණ පුස්තකාලයේදී, 2021-03-05 වන දින පැය 10.30 ට** පැවැත්වෙන අතර, ඉන් අනතුරුව, **වැඩබිම් සංචාරයක්** (ස්ථානීය පරීක්ෂාවක්) ද පැවැත්වෙනු ඇත.
4. ලංසු ලිපිලේඛන නිකුත් කිරීම ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා **ආපසු ගෙවනු නොලබන රුපියල් 20,000.00 ක** (වැට් බදු ඇතුළුව) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, **කොළඹ 01, ලේඩීන් බැස්ටියන් පාරේ, අංක 45 හි, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කොන්ත්‍රාත් හා සැලසුම් අංශයෙහි, ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත්තු හා සැලසුම්)** විසින් 2021-02-23 වන දින සිට 2021-03-24 වන දින දක්වා (එම දින දෙකද ඇතුළුව), රාජකාරී දිනයන්හිදී **පැය 9.30 සිට පැය 14.00 දක්වා** අතරතුර, සිදුකරනු ලබනු ඇත. ලංසු ලිපිලේඛන එම කාර්යාලයේදී ගාස්තු ගෙවීමෙන් තොරව පරීක්ෂා කර බැලිය හැකි වනු ඇත.
5. ලංසු, 2021-07-23 **වන දින දක්වා** (එනම්, ලංසු භාරගත්තා **අවසාන දින සිට දින 120 ක් දක්වා**) වලංගු විය යුතුය.
6. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි, ආරක්ෂිතව මුද්‍රා, තබන ලද ලිපිකවරයක බහා එම ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, "**කොළඹ** වරායේ, CIW ගබඩාව, PHI සහ Stress Bed Staffs සඳහා, යෝජිත ගොඩනැගිල්ල - **(කොන්ත්‍රාත් අංක** : SLPA/CD/CIW/01)" යනුවෙන් පැහැදිලිව සටහන් කර, "**කොළඹ 01, ලේඩීන් බැස්ටියන් පාරේ, අංක 45 හි, බාරේ / ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්), ශ්‍රී ලංකා වරාය අධිකාරිය** (SLPA) **හි, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ** (DPC) හි, සභාපති" යන ලිපිනයට ලැබෙන සේ ලේඛනගත කළ තැපැලෙන් එවිය හෝ ඉහත ලිපිනයේ ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත් හා සැලසුම්) කාර්යාලයේ, මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතු වන්නේය.
7. සියලුම ලංසු සමග **රුපියල් 1,400,000.00 (රුපියල් ලක්ෂ 14 ක) වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක්ද** ඉදිරිපත් කළ යුතුවන අතර, එම ලංසු සුරක්ෂණ ඇපකරය, 2021-08-20 **වන දින දක්වාද** වලංගු විය **යුතුය.**
8. කාර්ය කර්මාන්තය සම්පූර්ණ කළ යුතු **කාල රාමුව, දින 300 ක් දක්වා වන කාලසීමාවක්** වනු ඇත.
9. ලංසු, අනු පිටපතකින්ද යුක්තව (පිටපත් 2), 2021-03-25 **වන දින පැය 14.00 ට හෝ ඊට පෙර,** ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුවන අතර, ලංසු, එම වේලාව අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්හට එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන්, ආරාධනය කරනු ලැබේ.
10. අවශ්‍ය වැඩිදුර තොරතුරු විස්තර ඉහත ලිපිනයේ **ප්‍රධාන ඉංජිනේරු (කොන්ත්‍රාත්තු හා සැලසුම්) වෙතින් (දුරකථන අංක** : 011-2380517) මගින් විමසා ලබාගත හැකිය.
    - ඉහත සඳහන් සියල්ල, eroc.drc.gov.lk යන වෙබ් අඩවිය තුළින් මාර්ග ගතව (Online) පිවිසීමෙන් ලබාගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (DPC),
ශ්‍රී ලංකා වරාය අධිකාරිය (SLPA),
අංක 45, ලේඩීන් බැස්ටියන් පාර, කොළඹ 01.

BE BETTER INFORMED!

Dinamina Daily News Thinakaran

AVAILABLE AT App Store Google play Windows Store

News you can trust now free on your mobile phone.

Visit - apps.lakehouse.lk

DOWNLOAD TODAY!

LAKE HOUSE

ටෙන්ඩර් දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

කර්මාන්ත අමාත්‍යාංශය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

කහටගහ ග්‍රැෆයිට් විකිණීම

ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණය

ටෙන්ඩර් යොමු අංකය : KGLL/MKT/TDR/2021/01

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකාවේ, දෙඩම්ගස්ලන්ද. මදුරාගොඩ, කහටගහ පතලේ ඇති පහත දැක්වෙන ග්‍රැෆයිට් මිලදී ගැනීමට කැමැත්තක් දක්වන දේශීය හා විදේශීය පාර්ශ්වයන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. නිෂ්පාදන මිලට ගෙන අපනයනය කිරීමට බලාපොරොත්තු වන දේශීය පාර්ශ්වයන්ටද තම ලංසු ඉදිරිපත් කළ හැකිය.

නිෂ්පාදන අපනයන පදනම මත විකිණීම සඳහා ඉදිරිපත් කෙරේ. කෙසේ වෙතත්, මෙරට තුළ නිෂ්පාදන වැඩිදුරටත් සකස් කොට නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමට බලාපොරොත්තු වන ගැනුම්කරුවන්ට වතු අපනයන මත මිලදී ගත හැකිය. ලංසුකරුවන්ට නිෂ්පාදන සම්පූර්ණ ප්‍රමාණයම හෝ නිෂ්පාදන ප්‍රමාණයෙන් කොටසක් හෝ ඔවුන්ගේ මනාපය පරිදි මිලදී ගැනීමට ලංසු ඉදිරිපත් කළ හැකිය.

නිෂ්පාදන පිළිබඳ විස්තර හා වෙනත් අදාළ විස්තර පහත සංක්ෂිප්තව දක්වා ඇත.

	නිෂ්පාදන	ප්‍රමාණය (මෙ.ටොන්)	ලංසු සුරක්ෂණ (ශ්‍රීලංරු හෝ ඇ.ඩො. මෙ.ටොන් 20 සඳහා)	ගෙනැවිත් භාරදීමේ පැකේජ කොන්දේසි	ටෙන්ඩර් භාර ගන්නා හා විවෘත කරන අවසාන දිනය හා වේලාව
1	92-95C% Graphite Powder (HS 25041090)	800 MT	LKR 376,000.00 හෝ USD 2035	1MT FIBC Bags (Jumbo bag)	06/04/2021 at 1400 පැය
2	92-95C% Graphite Chip (HS 25041090)		LKR 335,000.00 හෝ USD 1815		
3	92-92C% Graphite Powder (HS 25041090)		LKR 282,000.00 හෝ USD 1525		
4	92-92C% Graphite Chip (HS 25041090)		LKR 260,000.00 හෝ USD 1405		

සංලක්ෂ්‍යය

- ඉහත 01 වගුවෙහි සඳහන් ඕනෑම නිෂ්පාදන වර්ගයක් ප්‍රමාණය මෙ.ටොන් 800 සීමාව ඇතුළත නිෂ්පාදනය කිරීමේ හැකියාව කහටගහ ග්‍රැෆයිට් ලිමිටඩ් සතුය. එම නිසා, ලංසුකරුවන්ට ඉහත සඳහන් ප්‍රභේදයන්ගෙන් අවශ්‍ය ප්‍රමාණයට මෙ. ටොන් 800 ප්‍රමාණ සීමාව ඇතුළත මිල ගණන් ඉදිරිපත් කළ හැකිය.
- සැපයිය හැකි සම්පූර්ණ ග්‍රැෆයිට් ප්‍රමාණය මෙ. ටොන් 800 කි. එම නිසා, ටෙන්ඩරය ඇගැයීමේදී ප්‍රමාණ වෙන්කර තැබීම අධි මිල නිෂ්පාදන සිට පහළ මිල නිෂ්පාදන දක්වා වන පරිදි ආරම්භ වනු ඇත. කෙසේ වෙතත්, අවසාන තීරණය අමාත්‍යාංශ ටෙන්ඩර් කමිටුව මගින් ගනු ඇත.
- ලංසු සුරක්ෂණ මුදල නිෂ්පාදන විස්තරයේ (වගුව 01) පැහැදිලි කොට ඇති පරිදි ග්‍රැෆයිට් මෙ. ටොන් 20 ප්‍රමාණයන් සඳහා පමණි. ගැනුම්කරු මෙ. ටොන් 20 කට වැඩි ප්‍රමාණයකට මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම්, ලංසු සුරක්ෂණය ප්‍රමාණයේ වටිනාකම හා සමග අනුකූල විය යුතුය.

  උදා : ලංසුකරු 92-95 C% ග්‍රැෆයිට් පව්ඩර් මෙ.ටොන් 100 කට ලංසු ඉදිරිපත් කරන්නේ නම් ලංසු සුරක්ෂණ වටිනාකම ඇ.ඩොලර් 10175 (2035 x 5) විය යුතුය.
- පව්ඩර් ප්ලාන්ට් සහ චිප් ප්ලාන්ට් උපරිම ධාරිතාවය පිළිවෙළින් එක් මසකට ටොන් 300 ක් බැගින් වේ. එබැවින්, නිෂ්පාදනයට හා ප්‍රමාණය අනුව සැපයුම් කාල සීමාව වෙනස් වනු ඇත.

ටෙන්ඩරයේ සම්පූර්ණ ලංසුකරණ ලිපිලේඛන නිල වෙබ් අඩවි : http://www.industry.gov.lk සහ http://www.kgraphi te.lk වල ප්‍රසිද්ධ කොට ඇත. අභිලාෂී පාර්ශ්වයන්ට මෙම වෙබ් අඩවි වෙත පිවිස ලංසුකරණ ලිපිලේඛන නොමිලේ බාගත කර ගත හැකිය. විකුණුම්කරු විසින් සහතික කොට නිකුත් කළ නියමිත ලංසුකරණ ආකෘති පමණක් ලංසු ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත යුතුය. ලංසු ලිපි ලේඛන හා සමග ලංසුකරණ ආකෘතිපත්‍ර, 2021.02.22 දින සිට 2021.04.05 දින තෙක් සතියේ දිනයන්හි 0900 පැය සිට 1500 පැය දක්වා පිළිවෙළින් ආපසු නොගෙවන ශ්‍රීලංරු. 5,000.00 හෝ ඇ.ඩො. 25 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව, කොළඹ - 05, නාරාහේන්පිට, ඇල්විටිගල මාවත, නො. 561/3, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි සභාපති වෙතින් ලබාගත හැකිය. එසේම, ලංසුකරණ ආකෘති පත්‍ර සමග ලංසුකරණ ලිපිලේඛන, ලංකා බැංකුවේ, රිදීගම ශාඛාවේ, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් හි අංක 5359657 දරන ශ්‍රීලං රුපියල් ගිණුමට ආපසු නොගෙවන ශ්‍රී ලංරු. 5000.00 ක හෝ අංක DFC 86806514 (සීග්‍ර කේතය : BCEYLKLX) දරන ඇ. ඩොලර් ගිණුමට ඇ.ඩො. 25 ක ආපසු නොගෙවන ගාස්තුව ගෙවූ බව සනාථ කිරීමට ගෙවීම් තුණ්ඩුව හෝ ඕනෑම නෛතික ලියවිල්ලක් තැපැල් කිරීමෙන්ද, ලබාගත හැකිය.

ලංසු පිටපත් දෙකකින් යුතුව නිර්දේශිත ආකෘති පත්‍ර යථා පරිදි සම්පූර්ණ කොට, අවශ්‍ය ලිපිලේඛන සමග වෙන් වෙන්ව "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස ලකුණු කළ කවර දෙකක බහා එම කවර දෙකම එක් කවරයක බහා "**කහටගහ ග්‍රැෆයිට් විකිණීම - ටෙන්ඩර් අංක** : KGLL/MKT/TDR/2021/01" යනුවෙන් වම් ඉහළ කෙළවරේ සඳහන් කොට මුද්‍රා තබා, ශ්‍රී ලංකාව, කොළඹ - 03, ගාලු පාර, නො. 73/1, තැ.පෙ. 570, කර්මාන්ත අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ටෙන්ඩර් කමිටුව (විකිණීම්), සභාපති වෙත 2021.04.06 දින 1400 පැය ඉකුත්වීමට පෙර ලියාපදිංචි තැපැලෙන් / කුරියර් සේවාව මගින් ලැබෙන්නට සැලැස්විය යුතුය. නැතහොත් අතින් ගෙනැවිත් ඉහත අමාත්‍යාංශයේ, මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

2021.04.06 දින 1400 පැයට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම කර්මාන්ත අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී ටෙන්ඩර් විවෘත කෙරේ. ලංසුකරුවනට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වීමට අවසර ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

ඉහත සංලක්ෂයන් පිළිබඳ යම් පැහැදිලිකර ගැනීම් අවශ්‍ය වේ නම් පහත සඳහන් නිලධාරීන් වෙතින් ලබාගත හැකිය.

සභාපති / අලෙවි කිරීම් අංශය,
විද්‍යුත් තැපෑල : kgllho2019@gmail.com
දුරකථනය : +9411 2368738,
ෆැක්ස් : +9411 2058062

පතල් කළමනාකරු (ගහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්),
විද්‍යුත් තැපෑල : kgllmines@gmail.com
දුරකථනය : +94372252015

අමාත්‍යාංශ ටෙන්ඩර් කමිටුව (විකුණුම්),
කර්මාන්ත අමාත්‍යාංශය,
තැ.පෙ. 570, නො. 73/1, ගාලු පාර,
කොළඹ 03, ශ්‍රී ලංකාව.

SriLankan Airlines oneworld

ශ්‍රීලංකන් ගුවන් සේවය
2021 අප්‍රේල් 01 දින සිට 2022 මාර්තු 31 වන දින දක්වා කාලය සඳහා කොන්ත්‍රාත්කරුවන් සහ සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම.

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවය, 2021 අප්‍රේල් 01 දින සිට 2022 මාර්තු 31 දක්වා කාලය සඳහා කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන්, වැඩපල හිමිකරුවන්, නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවයි. අයදුම්කරුවන් අවම වශයෙන් පහත සඳහන් අංශවල සේවා සැපයීමේ දෙවසරක පළපුරුද්දක් තිබිය යුතුය.

01. සිවිල් ඉංජිනේරු
02. විදුලි සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු
03. යාන්ත්‍රික ඉංජිනේරු
04. යන්ත්‍රෝපකරණ සහ භාණ්ඩ කුලියට දීම
05. සාමාන්‍ය සේවා (අනෙකුත් සේවා)

2021 පෙබරවාරි 22 වන දින සිට 2021 මාර්තු මස 05 දක්වා සතියේ දිනවල පෙ.ව. 09:30 සිට පෙ.ව. 11:00 දක්වා සහ ප.ව. 01:00 සිට ප.ව. 03:00 දක්වා අයදුම්පත් ලබා ගත හැකි වන අතර, ඒ සමඟ ඉහත සඳහන් එක් අංශයක් සඳහා නැවත නොගෙවන රුපියල් එක් දහස් පන්සීයක මුදලක් ලේඛන ගාස්තු සඳහා ගෙවිය යුතු වේ. අයදුම්පත් භාර ගැනීම 2021 මාර්තු 08 වන දින ප.ව. 03:00ට අවසන් වේ.

වැඩි විස්තර සඳහා පහත දුරකථන අංක වලින් දේපළ සහ පහසුකම් කළමණාකරු අමතන්න.
019 733 2796 / 019 733 2795

ජ්‍යෙෂ්ඨ කළමණාකාරිනී ප්‍රසම්පාදන සහ දේපළ
සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සේවය

BE BETTER INFORMED!

News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT
apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

බලපිටිය මූලික රෝහල සුබසාධක සංගමය
ආපනශාලාව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම

බලපිටිය මූලික රෝහලේ සුබසාධක සංගමය මගින් පවත්වාගෙන යනු ලබන රෝහල් ආපන ශාලාව 2021.03.25 දින සිට 2022.03.24 දින දක්වා වසරක කාලයකට පවත්වාගෙන යාම සඳහා දකුණු පළාත තුළ පදිංචි පුද්ගලයන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසුපත් නිකුත් කිරීම :

2021.02.22 දින සිට 2021.03.08 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා

ලංසුපත් භාරගැනීම :

2021.02.22 දින සිට 2021.03.08 දින දක්වා සිදු කෙරෙන අතර, 2021.03.08 දින ප.ව. 2.00 ට ලංසුපත් භාරගැනීම අවසන් වේ.

ලංසුපත් විවෘත කිරීම : 2021.03.08 දින ප.ව. 2.30 වේ.

ආපසු නොගෙවන රු. 3,000/- ක මුදලක් සහ ලිපි ද්‍රව්‍ය ගාස්තු රු. 100/- ක් ගෙවා සුබසාධක සංගමයේ භාණ්ඩාගාරික එම්.කේ.එස්. චන්දන මහතා වෙතින් ලංසුපත් ලබාගත හැක.

ටෙන්ඩරයට අදාළ අතිකුත් ලේඛන සුබසාධක සංගම් කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමේ හැකියාව පවතී. මුද්‍ර, තැබූ ලංසුපත් භාරගැනීමේ වේලාව අවසන් වීමට පෙර ලියාපදිංචි තැපැල මගින් සභාපති, සුබසාධක සංගමය, මූලික රෝහල, බලපිටිය නමට හෝ අතින් ගෙනවිත් වෛද්‍ය අධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ හැක. මුද්‍ර, තැබූ ලංසුපත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි ආපන ශාලාව බදු දීම සඳහා ටෙන්ඩර් කැඳවීම 2021/2022 ලෙස සඳහන් කළ යුතුය.

ලංසුපත් භාර දෙන අවස්ථාවේදී ඔබ විසින් ඉදිරිපත් කරන මාසික ලංසු වටිනාකමින් 1% ක වටිනාකමක් සඳහා ලංසු සුරක්ෂණයක් ලෙස සුබසාධක සංගමය වෙත මුදලින් තැන්පත් කළ යුතුය.

ආපන ශාලාව බදුදීම සම්බන්ධයෙන් අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

වැඩිදුර විස්තර සඳහා දුරකථන අංකය මගින් ඇමතිය හැකිය. 0912256330

සභාපති,
සුබසාධක සංගමය,
මූලික රෝහල - බලපිටිය.

ලංකා බැංකුව
ලංසු කැඳවීම
වාහන විකිණීම : ලංසු අංක 01/2021

පහත සඳහන් වාහන තනි හෝ සමූහ වශයෙන් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ.

ලංකා බැංකුව කඩුවෙල වාහන අංගනය.

වාහන අංකය	වර්ගය	වර්ෂය
	Four Wheel Tractor	
EP RF 4851	TAFE 45DI	2017
UP RF 2210	VST MITSUBISHI SHAKTI VT224-1D	2015
EP RE 6843	KUBOTA L4508DT	2009
EP RF 4855	MASSEY FERGUSON MF-1540	2016
EP RF 4768	MASSEY FERGUSON MF-1540	2016
EP RF 5347	SONALIKA DI 50 RX	2017

වාහන අංකය	වර්ගය	වර්ෂය
	Motor Lorry	
WP DAF 9397	TATA SUPER ACE	2017
WP LI 3538	ISUZU PB-NKR81AR ELF	2006

වාහන අංකය	වර්ගය	වර්ෂය
	Motor Car	
NW CAS 1788	TOYOTA DAA-ZVW50 PRIUS	2016
WP CAR 8387	SUZUKI DAA-MH44S WAGON R	2015
SP CAK 7672	NISSAN LEAF ACENTA	2014

වාහන අංකය	වර්ගය	වර්ෂය
	Motor Bus	
SG NC 8776	NISSAN PDG-EJW41 CIVILIAN	2008
WP NB 2808	SUNLONG SLK 6802	2012
WP NB 3413	EICHER 2015	2011
SP NB 8118	LANKA ASHOK LEYLAND VIKING	2014

කල්මුනේ ලංකා බැංකු රථ පරිශ්‍රය

වාහන අංකය	වර්ගය	වර්ෂය
	Motor Lorry	
NC RD 9812	KUBOTA L4508	2015
NC RF 3643	PREET 4549-4WD	2017
EP RF 6363	MAHINDRA YUVO 575 DISPS	2017
EP RF 6246	SONALIKA DI 50RX	2017
EP RF 4029	MASSEY FERGUSON MF-1540	2016
EP RF 5777	NEW HOLLAND 4710	2017

01. වාහන පරීක්ෂා කිරීම 2021 මාර්තු මස 05, 06 සහ 07 යන දිනයන් හිදී පෙ.ව. 9.30 ත් ප.ව. 3.30 ත් අතර, කාලය තුළ අංක 46/2, ලැනරෝල් මාවත, පහළ බෝමිරිය, කඩුවෙල පිහිටි වාහන අංගනයේදී සහ කල්මුනේ ලංකා බැංකු රථ පරිශ්‍රයේදී සිදුකළ හැකිය. ආපසු නොගෙවනු ලබන රු. 2,160/- (රු. 2,000/- + රු. 160/- (වැට්) ගෙවීමෙන් පසුව අංගනයේ සිටින ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකරගැනීම් පළාත්) වෙතින් අදාළ ලංසු ලියකියවිලි ලබාගත හැකි අතර, එසේ නැතහොත්

ලංකා බැංකු ප්‍රධාන කාර්යාලයේ 03 වන මහලේ ප්‍රධාන කළමනාකරු (අයකරගැනීම් පළාත්) වෙතින් 2021 මාර්තු 05 සිට 2021 මාර්තු 16 යන දින දක්වා ද මුදල් තැන්පත් කිරීමෙන් අනතුරුව ලංසු ලියකියවිලි ලබාගත හැකිය.

02. **ලංසු ලියකියවිලි නිකුත් කරන අවසාන දිනය සහ වේලාව** : 2021.03.16 ප.ව. 3.00 ට

03. **ලංසු ලියකියවිලි භාරගන්නා අවසාන දිනය සහ වේලාව** : 2021.03.17 පෙ.ව. 10.00 ට

04. ඕනෑම වාහන සංඛ්‍යාවක් සඳහා ලංසු මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර, ඒවා එකම ලියවිල්ලක සටහන් කර ලියුම් කවරයක බහා ඉදිරිපත් කළ හැකිය. ලංසු අංකය සහ විවෘත කරන දිනය ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කළ යුතුය.

05. සෑම ලංසුවක් සඳහාම මුළු ලංසුවේ වටිනාකමින් 5% කට නොඅඩු බැංකු අණකරයක් (ආපසු ගෙවනු ලබන) ලංසු අයදුම්පතට අමුණා එවිය යුතුය.

06. මුද්‍ර, තැබූ ලංසු, ප්‍රධාන කළමනාකරු (දේපළ සහ ප්‍රසම්පාදන අංශය) 14 වන මහල, ලංකා බැංකු ප්‍රධාන කාර්යාලය, අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01 යන ලිපිනයට 2021.03.17 දින පෙ.ව. 10.00 (ලංසු භාරගන්නා අවසාන වේලාව) ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලෙහි තබා ඇති පෙට්ටියෙහි තැන්පත් කිරීම කළ යුතුය.

07. අසම්පූර්ණ හා ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර, එම ලංසු පත්‍ර විවෘත නොකර නැවත ලංසුකරු වෙත හරවා යවනු ඇත. තැපැලේදී සිදුවන ප්‍රමාදවීම් සඳහා ඉදිරිපත් කරන සාක්ෂි බැංකුව විසින් පිළිගනු නොලැබේ.

08. ලංසු භාරදීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීම සිදුකරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට (එක් ලංසුකරුවෙක් සඳහා එක් නියෝජිතයෙකු පමණක්) සහභාගි විය හැකිය.

09. සහකාර මහා කළමනාකරු (පරිපාලන සේවා) විසින් ලංසු විවෘත කළ දින සිට වැඩකරන දින 3 ක් ඇතුළත තෝරාගත් ලංසුකරුවන් වෙත දැනුම්දීම් සිදුකරනු ඇත.

10. තෝරාගත් ලංසුකරු / කරුවන් ලංසු දැනුම්දීම සිදුකළ දිනයේ සිට කැලැන්ඩර් දින 14 ක් ඇතුළත ඉතිරි මුදල (ලංසු මුදල - බැංකු අණකරයේ මුදල) ගෙවා අදාළ වාහන කඩුවෙල වාහන අංගනයෙන් / කල්මුනේ ලංකා බැංකු රථ පරිශ්‍රයෙන් ඉවත්කර ගත යුතුය.

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම ලංසු තැබීමක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලංකා බැංකුව සතුය.

ප්‍රධාන කළමනාකරු (අයකරගැනීම් පළාත් අංශය)
ලංකා බැංකුව, 3 වන මහල, මූලස්ථාන ගොඩනැගිල්ල,
"ලංකා බැංකු චතුරස්‍රය", අංක 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන : 011-2203436

ලංකා බැංකුව BOC

කොන්දේසි සහිතයි.

ලංකා සතොස LANKA SATHOSA அடුම මිලට ඔබේම තැන
අඩුම මිලට ඔබේම තැන

දේශයට මිල නියම කරන්නා

වෙළඳ අමාත්‍යාංශය

මිල ගණන් කැඳවීම
ලංකා සතොස ලිමිටඩ් තොග ගබඩා / ප්‍රධාන කාර්යාලය වෙත කම්කරු සේවා සැපයීම

ලංකා සතොස ලිමිටඩ් (ලසලි) බෙදාහැරීම් තොග ගබඩා/ ප්‍රධාන කාර්යාලය වෙත **බරඅත සහ වෙනත් වැඩ සඳහා කම්කරු සේවා සැපයිය හැකි සැපයුම්කරුවන් වෙතින්,** වසරක කාලසීමාවක් සඳහා සභාපති, ලංකා සතොස ලිමිටඩ් විසින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින්, බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම මගින් අදාල ලංසු ලේඛණ, **රු. 1,500.00ක මුදලක් (ආපසු නොගෙවන) ගෙවා 2021.02.22 වන දින සිට 2021.03.15 දින** දක්වා කාලය තුල, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් විදිය, කොළඹ 02 හි, පිහිටි ලංකා සතොස ප්‍රධාන කාර්යාලයේ, මිල දී ගැනීම් අංශයෙන් (3 වෙනි මහල) ලබා ගත යුතුය.

පූර්ව ලංසු සාකච්ඡාව **2021.03.04 වන දින පෙ.ව. 11.00ට** පැවැත්වේ.

ඉදිරිපත් කරන මිල ගණන් **2021.03.15 වෙනි දින ප.ව. 1.00 ට** හෝ ඊට පෙර, ලංකා සතොස ලිමිටඩ්, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් විදිය, කොළඹ 02 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම ලිපිනයෙහි, මිල දී ගැනීම් අංශයෙහි (3 වන මහල) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. මුද්‍රා තබන ලද මිල ගණන් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරෙහි **"ලංකා සතොස ලිමිටඩ් වෙත කම්කරු සේවා සැපයීම"** යනුවෙන් සඳහන් කල යුතුය.

සියලුම ලංසුකරුවන් විසින් ලංසු ලේඛණය සමග ඇති "ලංසු සුරක්ෂණ ප්‍රකාශය" සඳහා වූ ආකෘති පත්‍රය පැඳිලිව පුරවා ලංසුව සමග ඉදිරිපත් කල යුතුය.

මිල ගණන් භාරගැනීම **2021.03.15 වෙනි දින ප.ව. 1.00 ට** අවසන් වන අතර මිල ගණන් විවෘත කිරීම, මිලගණන් භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේ සිදු කරනු ඇත. **ජයග්‍රාහී ලංසුකරු විසිනු (ලියාපදිංචි සැපයම්කරුවන් හැර) ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 5,000/- ක මුදලක් සහ 8%ක වැට් මුදලක් (ආපසු නොගෙවන) ගෙවිය යුතු අතර** පළමු මසට අදාල ඉන්වොයිසි වටිනාකමින් 5%ක් කාර්ය සාධන සුරක්ෂණයක් ලෙස රඳවා තබා ගනු ලැබේ (ආපසු ගෙවන).

වැඩි විස්තර සඳහා පහත නිලධාරියා අමතන්න.
නියෝජ්‍ය සාමාන්‍යධිකාරි මිල දී ගැනීම්, ලසලි - 071 1506120

ටෙන්ඩරය / කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවසන් තීරණය, **ලංකා සතොස ලිමිටඩ් සභාපති සතු වේ.**

සභාපති,ලංකා සතොස ලිමිටඩ්,
සතොස මහලේකම් කාර්යාලය, අංක 27,
වොක්ෂෝල් වීදිය, කොළඹ 02

තරුණියන්ගේ කාන්තාවන්ගේ මවුවරුන්ගේ

හද බැඳි කාන්තා පත්තරය

සෑම බදාදාවකම

තරුණී



21 වැනි සියවසට එළඹෙන යෞවනයට

නිරවුල් ගමන් මග

බුදුසරණ

ලංකා සතොස LANKA SATHOSA
අඩුම මිලට ඔබේම තැන

වෙළඳ අමාත්‍යාංශය

ලංකා සතොස ලිමිටඩ් වෙත ගෙවීමේ කුලී පදනම මත ලොරි රථ සපයන්නන් ලියාපදිංචි කිරීම - 2021 / 2022

2021 / 2022 වසර සඳහා ලංකා සතොස ලිමිටඩ් වෙළඳසැල් ජාලයෙහි අලෙවි කටයුතු කිරීම වෙනුවෙන් වියළි සලාක, ග්‍රොසරි භාණ්ඩ සහ උපකරණ ප්‍රවාහනය කිරීම පිණිස ලංකා සතොස ලිමිටඩ් වෙනුවෙන්, සභාපති ලංකා සතොස ලිමිටඩ් විසින් පහත සඳහන් වර්ගයේ ලොරි රථ, කුලී ගෙවීමේ පදනම මත ලබා දීම සඳහා ලියාපදිංචි වීමට කැමති දේශීය ප්‍රවාහන පහසුකම් සපයන්නන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ලොරි රථයක් සඳහා ලියාපදිංචි ගාස්තු (ආපසු නොගෙවන)

ධාරිතාවය	ලියාපදිංචි ගාස්තු (රු.)
ටොන් 5 ට අඩු	5,000.00
ටොන් 10	10,000.00
ටොන් 15	15,000.00
ටොන් 20 හෝ ඊට වැඩි	20,000.00

ලොරි රථ පහත සඳහන් කර ඇති තත්වයෙන් තිබිය යුතුය.

ඩීසල්, නිෂ්පාදිත වර්ෂය 2011 නොඉක්මවූ, පිටුපස අගුලුදමා වැසිය හැකි දොරවල් සමග, ආරක්ෂිත සම්පූර්ණ බොඩිය සහිත (Full Body), මනා කාර්මික හා ක්‍රියාකාරී තත්වයෙන් යුතු, ධාවනයට සුදුසු ටයර් යෙදූ, සලාක ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට සුදුසු පිරිසිදු තත්වයෙන් යුතු ලොරි රථ

2021 පෙබරවාරි 22 දින සිට 2021 මාර්තු 08 දින දක්වා අයදුම්පත් හා අදාල ලිපි ලේඛණ, පහත සඳහන් වෙබ් අඩවියෙන් අයකිරීමකින් තොරව භාගත හැක. නැතහොත් රු.2,500.00ක් ගෙවා ලංකා සතොස ලිමිටඩ් ප්‍රධාන කාර්යාලයේ 3 වෙනි මහලේ මිල දී ගැනීම් අංශයෙන් ලබා ගත හැක.

www.lankasathosa.org

සම්පූර්ණ කරන ලද අයදුම්පත් හා අනෙකුත් ලිපි ලේඛණ, 2021 මාර්තු 08 දින හෝ ඊට පෙර පහත ලිපිනයට අතින් ගෙනවිත් භාර දිය යුතුය.

03 වන මහල
මිල දී ගැනීම් අංශය
ලංකා සතොස ලිමිටඩ්
නො.27,
සතොස මහ ලේකම් ගොඩනැගිල්ල,
වොක්ෂොල් වීදිය,
කොළඹ 02

වැඩි විස්තර සඳහා පහත නිලධාරියා අමතන්න.
ජ්‍යෙෂ්ඨ කළමණාකරු සැපයුම්, ලංකා සතොස ලිමිටඩ් - 070 1560768
අවසන් තීරණ ගැනීමේ බලය ලංකා සතොස ලිමිටඩ් හි සභාපති සතු වේ.

ලංකා සතොස ලිමිටඩ්,
සතොස මහලේකම් කාර්යාලය, අංක 27,
වොක්ෂෝල් වීදිය, කොළඹ 02

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

සිළුමිණ The Silumina

Tender/OTHER ADVERTISEMENTS

silumina.advt@lakehouse.lk

011 242 9351 - 071 782 9018

ලංකා බැංකුව

ලංකා බැංකුව සතු අගනා දේපළක් විකිණීම

දේපළ අංක	නගරය	දේපළ පිහිටි ස්ථානය	දේපළ වර්ගය	ප්‍රමාණය
404	කරන්දෙනිය	කුරුදුගහහැතැක්මවෙල කරන්දෙනිය	ඉඩම	රූඩ් 1

ඉහත දේපළ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට අදාළ පාර්ශ්ව (මුල් පාර්ශ්වය පමණක්) වෙත ඇරයුම් කරමු.

අයදුම්පත් 2021/03/12 දින තෙක් නිකුත් කරනු ලබන අතර, රු. 2,000.00 ආපසු නොගෙවෙන තැන්පතුවක් සහ රු. 50,000.00 ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් තැන්පත් කළ හැක.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ දේපළ අංකය සමග **"දේපළ / 02 / 2021"** ලෙස නම් කරන ලද සීල් තැබූ කවරයක බහා 2021/03/17 දින පෙ.ව. 10.00 ට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබීමට සලස්වන ලෙස දැනුම් දෙමු.

අයදුම්කරුවන් වෙත ටෙන්ඩරය විවෘත කරන දින එනම් 2021.03.17 පෙ. ව. 10.00 ට මෙහි පැමිණ සිටින මෙන් ඇරයුම් කරමු.

අයදුම්කරුවන්ගේ ලංසු පිළිගැනීම හෝ බැහැර කිරීමේ අයිතිය ලංකා බැංකුව සතු වේ.

ලංකා බැංකුව, දේපළ අත්පත්කර ගැනීමේ අංශය,
3 වන මහල, ප්‍රධාන කාර්යාලය, ලංකා බැංකු චතුරස්‍රය,
නො. 01, ලංකා බැංකු මාවත, කොළඹ 01.
දුරකථන : සහකාර මහා කළමනාකාරිණී,

ආයතනික අයකරගැනීම්	-	011-2386080 / 011-2203410
ප්‍රධාන කළමනාකාරිණී	-	011-2395640 / 011-2203404 / 071-7755501
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී	-	011-2321170 / 011-2203429 / 0769627068
සහකාර කළමනාකරු	-	011-2203470 / 071-8418898
විද්‍යුත් තැපෑල	-	mgrforeclosed@boc.lk,
ෆැක්ස්	-	011-2446816 / 2389130

www.boc.lk වෙබ් අඩවිය මඟින් ද ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

වෙළෙඳ අමාත්‍යාංශය

2021 වර්ෂය සඳහා වෙළෙඳපලේ පවතින මිලට වඩා අඩු මිලට කෘෂි පාරිභෝජන භාණ්ඩ සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයන් හෝ තොග සැපයුම් කරුවන් වෙතින් අභිලාෂ කැඳවීම.

වෙළෙඳ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ, ලංකා සතොස ලිමිටඩ් ආයතනය, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, Q - Shop සහ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ඇති අලෙවි සැල් ජාලය සඳහා සාධාරණ, තරඟකාරී ස්ථාවර මිලකට 2021 වර්ෂයේ **මාර්තු මස සිට අගෝස්තු මස දක්වා මාස 06 ක් පුරාවට පහත සඳහන් ද්‍රව්‍ය අත්පිට මුදලට** (දින 07 ක් තුළ ගෙවීම් පියවීම) සැපයිය හැකි දේශීය නිෂ්පාදකයින්ගෙන් හෝ තොග සැපයුම් කරුවන්ගෙන් අභිලාෂ දැක්වීම සඳහා මෙයින් යෝජනා කැඳවනු ලැබේ.

මුං ඇට	**කව්පි**
උදු	**කහ**
කුරක්කන්	**තල**
ගොරකා	**ගම්මිරිස්**
කුරුදු	**අබ**

අභිලාෂ යෝජනා ප්‍රකාශ කරනු ලබන අයදුම්කරුවන් විසින් පහත සඳහන් තොරතුරු ඇතුලත් තමා විසින්ම සකසා ගත් **අයදුම් පත්‍රයක් 2021.03.02 වන දින හෝ ඊට පෙර කොළඹ 02**, වොක්ෂෝල් වීදිය, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 05 වන මහලේ පාලන අංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ රජයේ වැඩ කරන දින වල පස්වරු 4.00 ට පෙර ගෙනැවිත් භාරදිය යුතු වේ.

ලියුම් කවරයේ ඉහල වම් කෙළෙවර පැහැදිළිවම **"2021 වර්ෂය සඳහා වෙළෙඳපලේ පවතින මිලට වඩා අඩු මිලට කෘෂි පාරිභෝජන භාණ්ඩ සැපයීම සඳහා අභිලාෂ කැඳවීම"** යනුවෙන් සඳහන් කල යුතු වේ.

i. අයදුම්කරුගේ නම/සමාගමේ නම :-
ii. ලිපිනය :-
iii. දුරකථන අංකය/ෆැක්ස් අංකය :-
iv. විද්‍යුත් ලිපිනය :-
v. අභිලාෂ ඉදිරිපත් කරනු ලබන අයිතම වර්ගය/වර්ගයන්, ප්‍රමාණයන් සහ මිල ගණන් ඇතුලත් යෝජනාව :-

නියමිත දිනට ලැබෙන යෝජනාවන් සහිත අයදුම්පත් **2021.03.03 දින ප.ව. 3.00 ට ඉහත ලිපිනයේ සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 09 වන මහලේ දී විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ.** මෙම අවස්ථාවට සෑම සැපයුම්කරුවෙකුටම සහභාගි විය හැක.

වැඩිදුර විමසීම් - සහකාර ලේකම් (පාලන) 011 2304078 / 076 2566047

ලේකම්
වෙළෙඳ අමාත්‍යාංශය,
05 වන මහල,
සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
අංක 27,
වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

දිනය - 2021.02.21

ආරක්ෂක අමාත්‍යාංශය

ලංසු කැඳවීම

හෘද සහ උරස් සංකටක දැඩි සත්කාරක වාට්ටු සංකීර්ණය ඉදිකිරීම

රිජ්වේ ආර්යා ළමා රෝහල - කොළඹ - 08

(වායු සමීකරණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය)

කොන්ත්‍රාත් අංකය : SB/G/179/53/2020

01. රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද සහ උරස් සංකටක සත්කාර සංකීර්ණයේ වායුසමීකරණ පද්ධතිය සැපයීම සහ ස්ථාපනය සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03හි ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු සභාපතිතුමා වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් මුදු, තබන ලද ලංසු සඳහා ආරාධනා නිකුත් කෙරේ. ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන දෙසිය අසූ හයකි (අවිනිශ්චිතතා සහ බදු හැර). නිමකිරීමේ කාලය ලිත් දින 182 කි. ඉදිකිරීම් පරිශ්‍රය කොළඹ 08, රිජ්වේ ආර්යා ළමා රෝහල පරිශ්‍රයේ පිහිටා ඇත.

02. ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටියට (NCB) අනුව ලංසු තැබීම සිදු කරනු ලැබේ.

03. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසුකරුවන් අසාදු ලේඛන ගත කර නොතිබිය යුතු අතර පහත සඳහන් සුදුසුකම් හා නිපුණතා නිර්ණායක සපුරාලිය යුතුය.

ඇ) ලංසුකරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කාර්මික වාතනය සහ වායුසමීකරණ කටයුතු සම්බන්ධයෙන් (MVAC) EM -1 ශ්‍රේණිය සඳහා ලියාපදිංචි වී තිබිය යුතුයි.

ආ) පසුගිය වසර පහ තුළ සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික පරිමාව අවම වශයෙන් රුපියල් මිලියන 450 ක් විය යුතුය.

ඇ) තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ව්‍යාපෘති තිශ්චිත ණය පහසුකම් ප්‍රමාණය වෙනත් කොන්ත්‍රාත්තුමය බැඳීම් හා මෙම කොන්ත්‍රාත්තුව යටතේ කරනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර රුපියල් මිලියන 143.3 ට විය යුතුය.

ඈ) පසුගිය වසර පහ තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස සමාන ස්වභාවයකින් හා සංකීර්ණත්වයකින් යුතු ගොඩනැගිලි ව්‍යාපෘතියක් ඉදිකිරීමේ පළපුරුද්ද.

ඉ) පහත සඳහන් කාර්ය මණ්ඩලය ද කොන්ත්‍රාත්කරු සතු විය යුතුය.

- යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - අර්ධකාලීන) - විද්‍යුවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 2 ක පළපුරුද්ද
- සහයක යාන්ත්‍රික ඉංජිනේරු (වැඩබිම - පූර්ණ කාලීන) - ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) / උසස් ජාතික ඩිප්ලෝමාව (HND) / පූර්ණකාලීන සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතික පාඨමාලාව (NDES) හෝ ඊට සමාන සුදුසුකමක් සපුරා තිබීම සහ වසර 3 ක පළපුරුද්ද.

05. අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් 2021/02/22 දින සිට 2021/03/14 දින දක්වා වැඩකරන දිනයන්හි පැය 0900 පැය 1500 දක්වා අතරතුර ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය (බිම් මහල), ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 හිදී ලිඛිත අයදුම්පත්‍රයක් සහ ආපසු නොගෙවන රුපියල් 35,000.00 ක (බදු රහිත) ගාස්තුවක් ගෙවීමෙන් මිලදී ගත හැකිය. මුදල් ගෙවීම මුදලින්ම කළ යුතුවේ.

06. ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැකි අතර සහ ලංසු කැඳවීමේ අදාළ ලේඛන ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය (බිම් මහල), ආරක්ෂක අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 3 යන ලිපිනයෙන් 2021/02/22 සිට 2021/03/14 දක්වා ඕනෑම වැඩ කරන දිනයක පැය 0900 සිට පැය 1500 දක්වා මුදල් ගෙවීමකින් තොරව ලබාගත හැකිය.

අධ්‍යක්ෂක ජෙනරාල් ඉංජිනේරු,
නාවික හමුදා මූලස්ථානය,
ධජ වීදිය, කොළඹ 01,

දුරකථන අංක - 0117194211
ෆැක්ස් - 0112441456
විද්‍යුත් තැපෑල - nhqdge@gmail.com

ලංසු 2021/07/12 දින දක්වා (ලංසු අවසන් වන දින සිට දින 119ක්) වලංගු විය යුතුය.

07. ලංසු ඇපකරය, රුපියල් 4,300,000.00 වටිනා ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් අනුමත ආකෘතියෙන් යුක්ත එකක් වියයුතුය.

08. අදාළ ලංසු ඇපකරය, ලංසු අවසාන වන දිනයේ සිට 2021/08/07 දින දක්වා (දින 147ක්) වලංගු විය යුතුය.

09. මේ සම්බන්ධව පෙර ලංසු හමුවක් 2021/03/09 වන දින පැය 1000ට කොළඹ 08 රිජ්වේ ආර්යා ළමා රෝහලේදී පැවැත්වේ.

10. ලංසු මුල් පිටපත හා දෙඩ පිටපත (Hard Copy) එකකින් (01) ඉංග්‍රීසි බසින් සම්පූර්ණ කර ලංසු භාරගන්නා අවසාන වේලාව වන 2021/03/15 වන දින 1400 පැයට හෝ ඉන් පෙර කොළඹ 03, බාලදක්ෂ මාවතේ, නො.15/05, ආරක්ෂක අමාත්‍යාංශයේ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ අතින් ගෙනවිත් භාරදීම හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ යුතුය. ලංසු ඇසුරුම්වල පිටත ලිපි කවරයේ ප්‍රසම්පාදනයේ යොමු අංක පැහැදිලිව සටහන් කල යුතුය.

11. නියමිත දිනට නොලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම ලංසු කැඳවීම අවසන් වූ වහාම 2021/03/11 දින පැය 1400ට පැමිණීමට බලාපොරොත්තු වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලැබේ. ලංසුකරු හැර ඔහුගේ නියෝජිතයකු සහභාගි වන්නේනම් ලංසුකරුගේ අනුමැතිය ලත් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. ලංසුකරු විසින් ටෙන්ඩර් විවෘත කිරීමට අවම වශයෙන් වැඩ කරන දින තුනකට පෙර ටෙන්ඩර් විවෘත කිරීම සඳහා සහභාගිවන පුද්ගලයාගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස ද ලංසුකරුට උපදෙස් දෙනු ලැබේ.

12. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද මිල ගණන් පත්‍රිකා හා ලිඛිත සාක්ෂි අවශ්‍ය පරිදි ඉදිරිපත් නොකරන ලද, ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම මිල ගණන් පතක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය සභාපති, කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) සතු වේ.

13. මෙම පුවත්පත් දැන්වීම ශ්‍රී ලංකා නාවික හමුදා වෙබ් අඩවිය www.navy.lk සහ ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය www.defence.lk මගින්ද නිරීක්ෂණය කළ හැක.

සභාපති,
අමාත්‍යාංශ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය (බිම් මහල),
ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03.

සිළුමිණ වට සිට | Sunday Observer ADZ it's what you want | තිනකරන් වාරමන්ජරි

ඔබගේ ලුහුඬු දැන්වීම් ලඟම ඇති අපගේ ශාඛා කාර්යාලය වෙත භාරදෙන්න

ලුහුඬු දැන්වීමක් සඳහා නවතම ගාස්තු... (වචන 15ක් සඳහා)

ඕනෑම එක් පුවත්පතක් සඳහා	ඕනෑම පුවත්පත් දෙකක් සඳහා	පුවත්පත් තුනම සඳහා
රු. 300/- * තිනකරන් වාරමන්ජරි හැර	රු. 500/- * තිනකරන් වාරමන්ජරි හැර	රු. 650/-

අනුරාධපුර - TEL : 025 22 22 370 FAX : 025 22 35 411 / මහනුවර - TEL : 081 22 34 200 FAX : 081 22 38 910
කතරගම - TEL : 047 22 35 291 FAX : 047 22 35 291 / මරදන - TEL : 011 2 429 336 FAX : 011 2 429 335
මාතර - TEL : 041 22 35 412 FAX : 041 22 29 728 / නුගේගොඩ - TEL : 011 2 828 114 FAX : 011 4300860 / යාපනය - TEL : 021 22 25 361 FAX : 021 22 25 361

සිළුමිණ

වෙළඳ

මැණික් ගෙවුඩ

පාෂාණ, ප්‍රදර්ශනාගාරයක් සඳහා මිලදී ගැනේ.

0717511011,
0766669715

දිගු කාලීන කුලී පදනම මත

කිලිනොච්චි, නුවරඑලිය, කෑගල්ල වැඩබිම් සඳහා

- J.C.B. යන්ත්‍ර
- Crew cab
- මහේන්ද්‍ර බොලෙරෝ/ටාටා සිංගල් CAB
- ඩබල් කැබ් රථ (A/C)

N & G Ads

ACWELL ENGINEERING (PVT) LTD.

No. 81/3A, 1st Lane, Koswatta Road, Rajagiriya.

070 4123625 / 011 2053341

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග

මංගල යෝජනා තීරයයි

සිළුමිණ The Silumina

කැමැත්ත පළ කිරීමේ ප්‍රකාශනය (E.O.I)

අප සමූහයේ 2021 - 23 වර්ෂ වලට අදාළව CRC ව්‍යාපෘතිය යටතේ ලංකාවේ වෙරළ ආශ්‍රිත පරිසර පද්ධතිය සංරක්ෂණය, කළමනාකරණය හා ඒ අවට ජීවත්වන කාන්තාවන්ගේ ජීවනෝපා ක්‍රම සවිබල ගැන්වීම වෙනුවෙන් වැඩසටහන් සකස් කෙරෙමින් පවතී.

මේ වැඩසටහනේ පාර්ශවකරුවන් වීමට කැමති ප්‍රාදේශීය ආයතන, රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන වෙතොත් ඒ සඳහා ඔවුන්ගේ කැමැත්ත පළ කෙරෙන ප්‍රකාශන ලබා ගැනීම 2021 මාර්තු 31 වන දින දක්වා අප ආයතනය විසින් භාර ගනු ලැබේ.

මේ සඳහා පහත සඳහන් කරුණු ඇතුළත් තොරතුරු අප වෙත යොමු කරන්න.

- ආයතනයේ හෝ සංවිධානයේ නම සහ ලිපිනය
- අවම වශයෙන් වසර 3 කට වඩා පරිසර සංරක්ෂණය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතු අතර පෞද්ගලික ආයතනයක් නම් ලියාපදිංචි සහතිකයක් ද තිබිය යුතුය.
- යෝජිත ප්‍රදේශයන් හා දැනට තෝරාගෙන ඇති ප්‍රදේශවල සම්පූර්ණ තොරතුරු e-mail පණිවිඩයක් එවීමෙන් ලබාගත හැකිය.
- ආයතන / නියෝජිත ආයතන / සංවිධානය පිළිබඳ තොරතුරු අවශ්‍ය අතර අදාළ වෙබ් අඩවියක් තිබේ නම් එය සඳහන් කරන්න.
- ඔබ ආයතනයේ මේ සඳහා සම්බන්ධ කරගත යුතු පුද්ගලයෙකු ඇතොත් ඔහුගේ දුරකථන අංකය සඳහන් කරන්න.
- වෙනත් විශේෂිත කරුණු ඇතොත් එයද සඳහන් කරන්න.
  - ➢ උදා : වෙනත් පළපුරුදු ක්ෂේත්‍රයන්

සපයනු ලබන මූලික තොරතුරු මත ආයතන 15 - 20 අතර සංඛ්‍යාවක් තෝරාගන්නා අතර විශේෂ සාකච්ඡාවකින් පසුව ගිවිසුම් ගත වීමට අපේක්ෂා කරනු ලැබේ. මේ සඳහා තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් පහත සඳහන් තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. තැපැල් පෙට්ටිය 96, මොරටුව, 10400

srilankawetlands@gmail.com

"අපි එක්ව දේශගුණික අර්බුදය අවම කරමු."

දහම් පිපාසිත ඔබේ දූ පුතුනට

ඉදුසරණ

දහම් පාසල

බෝසත් ළමා පරපුරක් උදෙසා

දහම් අධ්‍යාපනික මාසිකය පත්තර මහගෙදරින්

2021 ජනවාරි 1 දා සිට

LAKE HOUSE ලේක්හවුස් ප්‍රකාශනයක්

ඔබේ රැකියා බලාපොරොත්තුවට

නොවරදින මඟ

LAKE HOUSE

සිළුමිණ The Silumina

jobs අතිරේකය

විශේෂිත වූ මිල ගනන් සඳහා අමතන්න

චමිල - 071 782 9018, +94 112 429 351

කපිල - 077 789 6575, **ඉන්දික** - 076 960 3924

silumina.advt@lakehouse.lk

www.silumina.lk

දැන්වීම් කාර්යාල

සියලුම ලේක්හවුස් ප්‍රකාශන සඳහා දැන්වීම් බාරගැනීම, පුවත්පත් ඇනවුම් බාරගැනීම සහ කතරගම විශ්‍රාම ශාලාව වෙන්කරවා ගැනීමට.

මහනුවර ශාඛා කාර්යාලය

මහනුවර

නො 22,
දළදා වීදිය, මහනුවර

081 223 4200

අනුරාධපුර ශාඛා කාර්යාලය

අනුරාධපුර

හරිස්චන්ද්‍ර මාවත,
බැංකු පෙදෙස

025 222 2370

මාතර ශාඛා කාර්යාලය

මාතර

නො 29,
ප්‍රධාන බස් නැවතුම් පොළ උඩුමහල

041 223 5412

නුගේගොඩ ශාඛා කාර්යාලය

නුගේගොඩ

සව්සිරි වෙළඳ සංකීර්ණය
4 වන මහල, හයිලෙවල් පාර, නුගේගොඩ

011 282 8114

යාපනය ශාඛා කාර්යාලය

යාපනය

නො 06, සිරම්බියඩි මාවත,
ස්ටැන්ලි පාර

021 222 5361

මරදාන ශාඛා කාර්යාලය

මරදාන

නො 383,
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10

011 242 9336

කතරගම ශාඛා කාර්යාලය

කතරගම

ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිරිපිට
ථුස්සදේව මාවත, කතරගම

047 223 5291

LAKE HOUSE සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10

1949, 011 242 9342, 011 242 9333

සිළුමිණ The Silumina වටපිට

පල දරන්න - පළ කරන්න

මංගල යෝජනා

දශක ගණනාවක විශ්වසනීය සේවාව...

දැන් වචන 15ක් රු. 560ක් පමණයි...

- වැඩි වන වචනයක් සඳහා රු. 23/-

චාමර - 0777 270 067 / අනූෂා - 0777 278 948

වර්ෂ 2021ක් වූ පෙබරවාරි මස 21 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.